විදේශ සබඳතා අමාත්‍යාංශය

வெளிநாட்டு உறவுகள் அமைச்சு

# MINISTRY OF FOREIGN RELATIONS

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த முன்னேற்ற அறிக்கை

## ANNUAL PERFORMANCE REPORT

# 2019

# විදේශ සබඳතා අමාත්‍යාංශය
# ශ්‍රී ලංකාව

## වාර්ෂික කාර්යසාධන වාර්තාව
## 2019

# විදේශ සබඳතා අමාත්‍යාංශය


| අංකය | අන්තර්ගතය | පිටු අංකය |
|---|---|---|
| 1. | විදේශ සබඳතා අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර, විෂයය සහ කාර්ය කටයුතු | 01 |
| 2. | 2019 - සාරාංශයකින් | 02 -14 |
| 3. | විදේශ සබඳතා අමාත්‍යාංශයේ සංවිධාන සටහන | 15 - 16 |
| 4. | විදේශ සබඳතා අමාත්‍යාංශයේ අංශවල කාර්ය සාධන වාර්තා | |
| | I. මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු අංශය හා මාධ්‍ය ප්‍රකාශක | 17 - 24 |
| | II. ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය | 25 - 28 |
| | III. ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳ හා ත්‍රස්ත මර්දන අංශය | 29 - 32 |
| | IV. එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ මානව හිමිකම් අංශය | 33 - 44 |
| | V. සාගර කටයුතු, පරිසර සහ දේශගුණික විපර්යාස අංශය | 45 - 52 |
| | VI. යුරෝපා හා මධ්‍යම ආසියා, යුරෝපා සංගම් සහ පොදුරාජ්‍ය මණ්ඩලයීය අංශය | 53 - 116 |
| | VII. උතුරු ඇමරිකා අංශය | 117 -134 |
| | VIII. ලතින් ඇමරිකා සහ කැරිබියානු අංශය | 135 - 144 |
| | IX. දකුණු ආසියා සහ සාර්ක් අංශය | 145 - 160 |
| | X. නැගෙනහිර ආසියා සහ ඕෂනියා අංශය | 161 -190 |
| | XI. අග්නිදිග ආසියා අංශය | 191 - 206 |
| | XII. අප්‍රිකා අංශය | 207 - 222 |
| | XIII. මැද පෙරදිග අංශය | 223 - 258 |
| | XIV. ආර්ථික කටයුතු අංශය | 259 - 270 |
| | XV. මානව සම්පත් සහ දූත මණ්ඩල කළමණාකරණ අංශය | 271 - 276 |
| | XVI. විදේශ වත්කම් කළමණාකරණ සහ සංවර්ධන අංශය | 277 - 286 |
| | XVII. සංධාන අංශය | 287 - 298 |
| | XVIII. කොන්සියුලර් කටයුතු අංශය | 299 - 308 |
| | XIX. නීති අංශය | 309 - 316 |
| | XX. සාමාන්‍ය පාලන අංශය | 317 -322 |
| | XXI. මුදල් අංශය | 323 - 328 |
| | XXII. අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය | 329 - 331 |
| 5. | විදේශ රටවල පිහිටි රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/දූත කාර්යාල ජාලය | 332 |
| 6. | විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල මඟින් එකතු කරන ලද ආදායම -2019 | 333 - 336 |
| 7. | විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් ඉටුකරන ලද කොන්සියුලර් කටයුතු - 2019 | 337 -340 |
| 8. | විගණකාධිපතිවරයාගේ සාරාංශ වාර්තාව | 341 - 349 |

## දැක්ම

''ලොව සියලුම රටවල් සමඟ මිත්‍රශීලි සබඳතා පවත්වා ගනිමින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ වගකීම දරන රටක් බවට පත්වීම''

## මෙහෙවර ප්‍රකාශය

''ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම, විදහා දැක්වීම, සුරක්ෂා කිරීම සහ ශ්‍රී ලාංකේය ජාතික අභිලාෂයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම''

## විදේශ සබඳතා අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන්

''විදේශ කටයුතු පිළිබඳ දේශපාලනික සැලසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

විදේශ රටවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම,

ජාත්‍යන්තර ගිවිසුම් සහ සම්මුතිවලට එළඹීම,

විදේශ රටවල ආණ්ඩු සහ ජාත්‍යන්තර සංවිධාන ශ්‍රී ලංකාවේ දී නියෝජනය කිරීම,

විදේශ රටවලදී සිදුකරන ප්‍රචාරණ කටයුතු,

රාජ්‍යතාන්ත්‍රික විනිර්මුක්තීන් හා වරප්‍රසාද සහ

කොන්සියුලර් කටයුතු''

## 2019 - සාරාංශයකින්

ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතාවයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය, ප්‍රක්ෂේපණය සහ ඒවා ආරක්ෂා කිරීම යන දැක්ම සහ ප්‍රතිපත්තිමය අරමුණුවල පිහිටා කටයුතු කිරීම ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කාර්යභාරයයි. මෙම සමාලෝචනයට ලක් වන කාලසීමාව තුළදී, මෙම අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වීය, බහුපාර්ශ්වික, ආර්ථික, සමාජීය හා සංස්කෘතික සහ මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු අඛණ්ඩව ශක්තිමත් කිරීමේ කාර්යයෙහි නියැලුණි. ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය සහ ඒකීයත්වය පවත්වා ගන්නා අතරම, ජාත්‍යන්තර ප්‍රජාවේ වගකිවයුතු සාමාජිකයෙකු ලෙස සියලු රාජ්‍යයන් සමඟ පවත්නා මිත්‍රශීලී සබඳතා ද තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා විදේශ අමාත්‍යාංශය මෙම සමාලෝචනයට ලක් වන කාලසීමාව තුළදී කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාව 2019 අප්‍රේල් මාසයේ පාස්කු ඉරුදින අතිශය විනාශකාරී ත්‍රස්තවාදී ප්‍රහාරයකට මුහුණ දුනි. එම හේතුවෙන් ශ්‍රී ලංකාව මෙතෙක් පවත්වාගෙන පැමිණි, සියලු ආකාරයේ ත්‍රස්තවාදී කටයුතු සම්බන්ධ රාජ්‍ය  ප්‍රතිපත්ති, නැවතත් සළකාබැලීමට සිදුවූ අතර එම ත්‍රස්ත ප්‍රහාරවලින් අනතුරුව ආර්ථික පුනර්ජීවනයක් ඇති කිරීමට සඳහා රට නැවතත් දියුණුවේ මාවත වෙත පෙළගැස්වීමටද සිදුවිය. මෙම ප්‍රහාරවලින් අනතුරුව උද්ගතවූ යම් තත්ත්වයන් ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා සහ ප්‍රතිපත්තීන්ගේ සිදුවූ යම් වෙනස්කම් සඳහාද දායක විය.

'රට හඳුන සෞභාග්‍යයේ දැක්ම' යන ජාතික ප්‍රතිපත්ති රාමුව හරහා මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරන බවට ප්‍රතිඥා දෙමින් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2019 නොවැම්බර් මාසයේ දී සිය ධූරයේ වැඩභාරගැනීම සමඟින්, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සබඳතා නව මාවතක් කරා යොමු විය. විදේශ අමාත්‍යවරයා ලෙස ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සහ විදේශ රාජ්‍ය අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා පත් කිරීම මෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශය, විදේශ සබඳතා අමාත්‍යාංශය ලෙස නම් කිරීම හරහා නව රජය ජාත්‍යන්තරය හා මෙම අමාත්‍යංශය සම්බන්ධ කිරීම සඳහා නව දැක්මක් ලබාදුණි.

### ද්විපාර්ශ්වික සබඳතා

### ද්විපාර්ශ්වික සබඳතා අඛණ්ඩව පවත්වා ගැනීම සහ වඩාත් ශක්තිමත් කිරීම

විවිධ රාජ්‍යන් සමඟින් මෙන්ම එක්සත් ජාතීන්ගේ සංගමය, යුරෝපා සංගමය, දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමය, බහුආංශික තාක්ෂණ හා ආර්ථික සහයෝගිතාව පිළිබඳ බෙංගාල බොක්ක තදාශ්‍රිත රාජ්‍යන්ගේ මුල්පිරීම හෙවත් බිම්ස්ටෙක් සංගමය, ඉන්දියන් සාගර වටදේදර රටවල නොහොත් අයොරා සංගමය යනාදී ජාත්‍යන්තර හා කලාපීය සංසද සමඟද අප සමීපව කටයුතු කිරීම, ගෝලීය රාජ්‍යතාන්ත්‍රික වේදිකාවන්හි සියලු මට්ටම්වල කටයුතු කරන්නාවූ සාධනීය හවුල්කරුවෙකු ලෙස ශ්‍රී ලංකාව ස්ථාපිත කළේය.

අපගේ අසල්වැසි දකුණු ආසියානු රටවල් වන ඉන්දියාව, පාකිස්ථානය, බංගලාදේශය, නේපාලය, භූතානය, ඇෆ්ඝනිස්ථානය සහ මාලදිවයින සමඟින් අප පවත්වන්නාවූ ද්විපාර්ශ්වික සබඳතා සැලකිය යුතු අන්දමින් වැඩි දියුණු කරගැනීමට 2019 වසර තුළ දී ශ්‍රී ලංකාවට හැකිවිය. මෙම තත්ත්වය අප ලඟා කර ගත්තේ මෙම කලාපයේ උද්ගතවූ භූ-දේශපාලනික දෝලනයන්ට අනුගතවෙමින්, ඉන්දියානු සාගර කලාපයේ දේශපාලන, ආර්ථික සහයෝගිතාව සහ ආරක්ෂාව සහතික කරමිනි. මෙරට අභිනවයෙන් තේරී පත් වූ ජනාධිපතිවරයා ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2019 නොවැම්බර් 28-30 දිනවල දී ඉන්දියාවේ නිරත වූ රාජ්‍ය සංචාරය, පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු ඉන්දියානු අග්‍රාමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2019 ජූනි 09 වැනි දින ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය (තමන් අග්‍රාමාත්‍යවරයා ලෙස නැවතත් තේරී පත්වීමෙන් අනතුරුව සිදුකළ පළමු විදේශ සංචාරය), අතිගරු ජනාධිපතිතුමා ධූරය භාර ගත් වහාම 2019 නොවැම්බර් මාසයේ දී ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ගරු එස්. ජයිශංකර් මැතිතුමා ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය යනාදී  ඉහළ මට්ටමේ සංචාර තුළින් ඉන්දියාව සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යන රාජ්‍යතාන්ත්‍රික සබඳතාවයේ ශක්තිමත් බව පැහැදිළිව පිළිබිඹු විය.

අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සිය ධූරයේ වැඩභාරගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය වෙත වඩාත් සමබර ප්‍රවේශයක් සහතික කිරීමේ අරමුණින් ඉන්දියාව, චීනය, එක්සත්

ජනපදය, එක්සත් රාජධානිය, යුරෝපා සංගමය, රුසියාව සහ ජපානය සමඟින් ශ්‍රී ලංකාව පවත්වාගෙන යන්නාවූ රාජ්‍යතාන්ත්‍රික සබඳතා සම්බන්ධයෙන් සමාලෝචනයක යෙදීමට පියවර ගැණුනි. මෙය හරහා ප්‍රතිපත්ති ක්ෂේත්‍රයන්හි පැහැදිලිබවක් මෙන්ම ඉදිරි කටයුතු සම්බන්ධයෙන් මනා මඟපෙන්වීමක් ඇතිකර ගැනීමටද හැකිවිය.

2019 මුල් භාගයේ දී, එනම් 2019 පෙබරවාරි මස විදේශ ලේකම් රවිනාථ ආර්‍යසිංහ මහතාගේ නායකත්වයෙන් යුතුව බෙල්පියමේ බ්‍රසල්ස් නුවර පැවති 'යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසම' සහ 2019 මැයි මස ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් නුවරදී එවකට විදේශ අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමාගේ නායකත්වයෙන් යුතුව පැවති 'ශ්‍රී ලංකා-එක්සත් ජනපද හවුල්කාරිත්වයේ සංවාදය' ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා තීව්‍ර කරගැනීමට සහ එම සබඳතා වඩාත් සමබර පදනමක් වෙත ගෙන ඒම සඳහා මහෝපකාරී විය. එසේම ඉහළ මට්ටමේ නිල සංචාර හරහා ඇති කරගත් ශක්තිමත් පදනම් හරහා යුරෝපය සහ යුරෝපා සංගමය සමඟ පවත්වන්නාවූ රාජ්‍ය සහ පුද්ගලාන්තර සබඳතා තවත් ශක්තිමත් විය. යුරෝපා සංගමය සමග පැවති මෙම ඒකාබද්ධ කොමිසමේ සාකච්ඡාවේදී ත්‍රස්තවාදය මැඩපැවැත්වීම පිළිබඳ සංවාදයක් පැවැත්වීම සඳහා දෙපිරිස එකඟතාවයකට පැමිණි අතර එහි ප්‍රතිඵලයක් ලෙස ත්‍රස්තවාදය මැඩපැවැත්වීම පිළිබඳ පළමු යුරෝපා සංගම්-ශ්‍රී ලංකා සංවාදය 2019 ජුනි මස කොළඹ දී පැවැත්වුණි.

2019 වසරේ දී එක්සත් රාජධානිය යුරෝපා සංගමයෙන් ඉවත්වීමේ තීරණය ප්‍රකාශයවීම සමඟම එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය සහ විදේශ අමාත්‍යාංශයේ අදාළ දේශපාලන අංශය එම තීරණයෙන් ශ්‍රී ලංකාව කෙරෙහි වන ආර්ථික හා දේශපාලන බලපෑම පිළිබඳව දීර්ඝ අධ්‍යයනක් සිදු කෙරුණි. එසේම මෙම අමාත්‍යාංශය, යුරෝපයේ පවත්වා සිය රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල හරහා ඔවුන් හා සම්බන්ධවන්නාවූ රජ්‍ය හා රාජ්‍ය නොවන පිරිස් සමගින් නිරන්තර සංවාදයක නිරතවූ අතර එක්සත් රාජධානියේ වෙසෙන රැඩිකල් කොටස් ඇතුළුව එල්ටීටීඊ හිතවාදී ප්‍රචාරක යාන්ත්‍රණයට මුහුණ දීම හා ඔවුන්ගේ දුර්මත බිඳහෙලීම හරහා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සාධනීය ප්‍රතිරූපයක් ගොඩනැංවීමේ අරමුණින් යුතුව ඉතාමත් සක්‍රීය ලෙස කටයුතු කළහ.

සමාලෝචනයට භාජනයවන්නාවූ කාලසීමාව තුළ සාම්ප්‍රදායික ලෙස ශ්‍රී ලංකාව රුසියානු සමූහාණ්ඩුව හා අනෙකුත් මධ්‍යම ආසියානු රටවල් සමඟ පවත්වාගෙන යන්නාවූ සබඳතා තවදුරටත් වර්ධනය විය. දූත මණ්ඩලය හරහා රුසියානු රජය සමගින් සමීපව කටයුතු කිරීම සහ ඉහළ මට්ටමේ නිල නියෝජිත කණ්ඩායම් හුවමාරුව හරහා රුසියානු සමූහාණ්ඩුව සමඟ පැවති ද්විපාර්ශ්වික සබඳතා විශේෂයෙන් ශක්තිමත් විය.

ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ සංවර්ධන ආධාර යන අංශවලට ප්‍රමුඛතාවය දෙමින්, ශ්‍රී ලංකාව නැගෙනහිර ආසියානු රටවල් සමඟ සමීප සබඳතා තවදුරටත් ඉදිරියට පවත්වාගෙන ගියාය. හිටපු අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා 2019 මැයි 13-16 දිනවල මහජන චීන සමූහාණ්ඩුව වෙත සිදුකළ නිල සංචාරය හරහා චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති සමීප සබඳතානය තවත් ශක්තිමත් විය. එසේම ජපානයේ නව අධිරාජයා වන නරුහිතෝ රජතුමාගේ සිහසුන් ප්‍රාප්තිය සඳහා සහභාගී වීම පිණිස හිටපු ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2019 ඔක්තෝබර් 22-23 දිනවල දී නිරත වූ ජපාන සංචාරය මෙන්ම හිටපු විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමා 2019 දෙසැම්බර් 13 වැනි දිනවල පැවැත්වූ ජපාන සංචාරය ද ජපාන - ශ්‍රී ලංකා සබඳතාවයේ සන්ධිස්ථානයන්ය.

පලස්තීන රාජ්‍යයේ ස්ථාපිත කර ඇති සිය නියෝජිත කාර්යාලය සහ මැදපෙරදිග රාජ්‍යයන් 14 ක පිහිටා ඇති සිය දූත මණ්ඩල හරහා පසුගිය වසරේදී ශ්‍රී ලංකාව මැදපෙරදිග කලාපය සමඟින් පවත්වන රාජ්‍යතාන්ත්‍රික සබඳතා තවත් ශක්තිමත් කළේය. මැද පෙරදිග රාජ්‍යයන් සමඟ ශ්‍රී ලංකාවේ පවතින සබඳතා ප්‍රමුඛ වශයෙන් කේන්ද්‍රගතවී ඇත්තේ, විදේශ ශ්‍රමිකයින් සපයන ප්‍රධාන රාජ්‍යයක් ලෙස, සිය ආර්ථික අවශ්‍යතා මතිනි. ඉරානයට එරෙහිව යළි සම්බාධක පැනවීම තුළින් මතුවන ගැටලු ආදී කලාපීය දේශපාලන තත්ත්වයන් සම්බන්ධයෙන් මෙන්ම සංක්‍රමණික ශ්‍රමික සුරක්ෂිතතාවය හා වඩාත් නිපුණතා සහිත ශ්‍රමික කණ්ඩායම් සඳහා රැකියා අවස්ථා පුළුල් කිරීම වැනි ආර්ථික කරුණු සම්බන්ධයෙන්ද මෙම අමාත්‍යාංශය විවිධ පියවර ගෙන ඇත. මෙහිදී, ඉස්ලාමීය සහයෝගිතා සංවිධානය සමඟ පවත්නා සබඳතා සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කෙරුණි.

## නව භෞමික අංශ නිර්මාණය සහ කලාප-විශේෂිත ප්‍රතිපත්ති

රජ්‍යතාන්ත්‍රික වශයෙන් මෙතෙක් ප්‍රමාණවත් අවධානයක් නොලද රාජ්‍යන් හා කලාප සම්බන්ධයෙන් අමාත්‍යාංශය සමාලෝචනයක් සිදු කළ අතර ඒහා අනුරූපව මෙම රජ්‍යයන් හා කලාපයන්ට අදාළ රජ්‍යතාන්ත්‍රික උපායමාර්ග සහ ප්‍රතිපත්ති නැවතත් සැකසුණි. ලතින් ඇමරිකාව, කැරිබියානු කලාපය සහ අප්‍රිකානු රාජ්‍යන් සමගින් එම කලාපයන්හි පිහිටා ඇති ශ්‍රී ලංකා දූත මණ්ඩල සමගාමී අක්තගැන්වීම හරහා මෙම කලාප දෙක සමඟ පවත්නා සබඳතා ශක්තිමත් කිරීමත් ඉන් ශ්‍රී ලංකාවට ප්‍රවේශ විය හැකි ආර්ථික හා දේශපාලන තත්ත්වයන් සැළකිල්ලට ගෙන ප්‍රමුඛතාවයකින් යුතුව අප්‍රිකා කලාපය සහ ලතින් ඇමරිකා හා කැරිබියානු කලාපය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමටද මෙම සමාලෝචනයේදී තීරණය විය. එහි මූලික පියවරක් ලෙස මේ අනුව, ලතින් ඇමරිකාව හා කැරිබියානු කලාපය සහ අප්‍රිකාව යන අංශ වෙන් වෙන් වශයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරුන් යටතට පත් කෙරුණි. අදාළ ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් අදාළ දූත මණ්ඩලවල ශ්‍රී ලංකා තානාපතිවරුන්, රාජ්‍ය අංශයේ නියෝජිතායතන සහ කොළඹ සිටින එම රටවල තානාපතිවරුන් සහ නිර්වේතනික කොන්සල්වරුන්, ව්‍යාපාරික නායකයින් සහ මෙම කලාප පිළිබඳ පළපුරුද්දක් ඇති විද්වතුන් ඇතුළු පාර්ශ්වකරුවන් සමගින් පුළුල් වශයෙන් සාකච්ඡා පැවැත්වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ලතින් ඇමරිකාව, කැරිබියානු කලාපය සහ අප්‍රිකාව සමඟ පවත්වන්නාවූ විවිධ රජ්‍යතාන්ත්‍රික පැතිකඩ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය ලේඛනයක් 2019 නොවැම්බර් මාසයේ ප්‍රකාශයට පත් කෙරුණි.

මෙම ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමේ අභ්‍යාසය අතරතුර දී, අප්‍රිකාව තුළ වර්ධනය වෙමින් පවත්නා අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීම, මෙම කලාපය තුළ ශ්‍රී ලංකාවේ නියෝජනය ද්විපාර්ශ්වික වශයෙන් ඉහළ නැංවීම සහ රටවල 54 ක සාමාජිකත්වයකින් හෙබි අප්‍රිකානු සංගමය සමඟ පවත්නා සබඳතා තවත් පුළුල් කිරීමේ අවශ්‍යතාවයන් ආදිය හඳුනා ගැනුණි. මෙම 'යළි පණගැන්වූ අප්‍රිකානු ප්‍රතිපත්තිය' අරාබියානු ඊජිප්තු සමූහාණ්ඩුවේදී පැවති ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන අතරතුර දී, විදේශ සබඳතා ලේකම් රවිනාථ ආයර්සිංහ මහතාගේ සහභාගිත්වයෙන් යුතුව සංකේතාත්මකව දියත් කෙරුණි. මෙය මෙම කලාපය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික ප්‍රතිපත්තියෙහි පුනර්ජීවය සනිටුහන් කිරීමක්ද විය.

එසේම, විදේශ අමාත්‍යාංශයේ ලතින් ඇමරිකානු ප්‍රතිපත්තිය, මෙම කලාපය ඉලක්ක කර ගනිමින් පැහැදිලි අවධානයකින් සැලසුම්ක් සිදුකළ පළමු අවස්ථාව විය හැකිය. එහි කෙටිකාලීන අරමුණ අතර කලාපයේ ආර්ථික සබඳතා වැඩිදියුණු කිරීම ප්‍රධානය. කියුබානු ජනරජය සහ ශ්‍රී ලංකාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවා ගැනීමේ 60 වැනි සංවත්සරය සැමරීම සම්බන්ධයෙන් 2019 ජුනි 03 වැනි දින එවකට විදේශ කටයුතු ගරු රාජ්‍ය අමාත්‍ය වසන්ත සේනානායක මැතිතුමා නිරතවූ කියුබානු සංචාරය අතරතුරු මෙම 'ලතින් ඇමරිකානු ප්‍රතිපත්තිය' දියත් කෙරුණි.

කලාප සමඟ පවතින සබඳතා යළි සැකසීමේ මෙම ප්‍රයත්නයේ දී අග්නිදිග ආසියාව හා ආසියාන් සංවිධාන කලාපයේ නැගී එමින් පවතින වැදගත්කම හඳුනාගනිමින්, 'අග්නිදිග ආසියාව හා ආසියාන්' යනුවෙන් වෙනම අංශයක් නිර්මාණය කර එය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ යටතට පත් කෙරුණි. මෙම පියවර ශ්‍රී ලංකාව ආසියාන් කලාපයේ ආංශික සංවාද හවුල්කරුවෙකු බවට පත්වීම සඳහා අදාල කටයුතු කරගැනීම සඳහා අතිරේක පෙළඹවීමක් ලබාදෙන්නකි.

2019 වසරේ දී මධ්‍යම යුරෝපය, මධ්‍යම ආසියාව හා පැසිෆික් දූපත් සඳහා ද මීට සමාන ප්‍රතිපත්ති සකස් කිරීම පිළිබඳව අමාත්‍යාංශයෙන් අවධානය යොමුවිය. මේ අතර, ෂැංහයි සහයෝගීතා සංවාදය, ආසියාවේ අන්තර් ක්‍රියාකාරිත්වය හා විශ්වාසය ගොඩනැගීම පිළිබඳ සම්මන්ත්‍රණය (සීකා) සහ බාලි ක්‍රියාවලිය වැනි කලාපීය සංවිධාන සමඟ ශ්‍රී ලංකාව වඩාත් සමීපව කටයුතු කළාය.

## බහු පාර්ශ්වීය කටයුතු

ශ්‍රී ලංකාව නිව්යෝර්ක්, ජිනීවා, වියානා, පැරිස්, රෝමය,නයිරෝබි, බැංකොක් සහ හේග් නගරයෙන්හි පිහිටා ඇති සිය නිත්‍ය දූත මණ්ඩල හරහා බහු පාර්ශ්වීය රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාවලිය සඳහා තම දායකත්වය ලබාදුන්නාය.

සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ දී, මෙම අමාත්‍යාංශය අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන් සමගින් එක්ව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාරව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30/1 (2015),

34/1 (2017) යෝජනාවලට අදාලව රජය විසින් දියත් කළ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා සහාය ලබාදුණි. එනමුත් 2019 වර්ෂය තුළ දී සමබර ප්‍රවේශයක් ඇති කිරීමටද ශ්‍රී ලංකාව උත්සාහ දැරිය. 2019 මාර්තු මස පැවති මානව හිමිකම් කවුන්සිලයේ 40 වැනි සැසිය අතරතුර දී එවක ගරු විදේශ අමාත්‍ය තිලක් මාරපන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශය හරහා මානව හිමිකම් මහ කොමසාරිස්වරියගේ වාර්තාවේ අඩංගුවූ සාවද්‍ය කරුණු සම්බන්ධයෙන් නිවැරදි අර්ථකථන ලබාදුන් අතර, එහි දී 30/1 යෝජනාව යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් ඉටුකිරීම පිළිබඳ ස්ථාවරය, විශේෂයෙන්ම එම බැඳීම් ඉටුකිරීම විමසා බැලීම සඳහා විදේශීය විනිසුරුවන් සම්බන්ධ කර ගැනීමට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව අවසරයක් නොමැති බවත් මෙහිදී පැහැදිලි කෙරුණි. එසේම මෑත වසරවල දී ශ්‍රී ලංකාව මානව හිමිකම් ක්ෂේත්‍රයේ ලබා ඇති සැලකිය යුතු ප්‍රගතිය සම්බන්ධයෙන් වඩාත් පිළිගැනීමක් ලබා දිය යුතු බවද මෙහිදී ප්‍රකාශ කෙරුණි.

2019 සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 74 වැනි සැසිවාරය සඳහා විදේශ ලේකම් රවිනාථ ආර්යසිංහ මහතා ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් සහභාගි විය. ශ්‍රී ලංකාවේ විදේශ ලේකම්වරයෙකු එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ රාජ්‍ය නායක කථාවාරයේදී එය ඇමතූ පළමු අවස්ථාව මෙයයි. මෙහිදී හෙතෙම බහුපාර්ශ්වීය ක්‍රියාවලිය වෙනත් අයුතු මැදිහත්වීම් වලින් ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම, ත්‍රස්තවාදයට එරෙහිව සටන් කරන අතරතුර දී මානව හිමිකම් ආරක්ෂා කරමින් ප්‍රතිසන්ධානය සඳහා වන කැපවීම සහ නිරායුධකරණය පිළිබඳ සම්මේලනයේ 2018 වසරේ සභාපති ලෙස නිරායුධකරණය කිරීමේ අරමුණු තවදුරටත් ශ්‍රී ලංකාව ඉදිරියට ගෙන යාම යනාදිය පිළිබඳව ශ්‍රී ලංකාව සිය ස්ථාවරය ප්‍රකාශ කළේය. තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සහ සංක්‍රමණ පිළිබඳ ගෝලීය සංයුක්තය සඳහා ශ්‍රී ලංකාව තවදුරටත් කැප වී සිටින බවද මෙහිදී හෙතෙම ප්‍රකාශ කළේය. එසේම පලස්තීන අර්බුදය සඳහා විසඳුමක් ලබාදීමට ශ්‍රී ලංකාවේ ඇති ස්ථිර කැපවීම මෙම දේශනයේදී නැවතත් සනාථ කෙරුණි. එක්සත් ජාතීන්ගේ සාම සාධක කටයුතු සඳහා ශ්‍රී ලංකාවෙන් ලබා දෙන දීර්ඝ කාලීන දායකත්වයට බාධා නොකළ යුතු බවද හෙතෙම එහි දී අවධාරණය කෙරුණි.

එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්වෙත ශ්‍රී ලාංකික සන්නද්ධ හමුදා බන්ධ අනුයුක්ත කිරීම සඳහා අඛණ්ඩ අවස්ථා ලබා ගැනීම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ සමීපව කටයුතු කළේය. මෙය සිදුවූයේ සියලුම "අත්‍යවශ්‍ය නොවන" ශ්‍රී ලාංකික හමුදා බන්ධ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් වෙතින් ඉවත් කරන බවට 2019 අගෝස්තු මස ශ්‍රී ලංකාව වෙතට එල්ලවූ අභියෝගය මධ්‍යයේය.

නොබැඳි ව්‍යාපාරය සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනඵෙතිහාසික සම්බන්ධය අඛණ්ඩව ඉදිරියට ගෙන යමින්, "අද්‍යතන ලෝකය හමුවේ පවත්නා අභියෝගයන්ට සාමූහික හා ප්‍රමාණික ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා බැන්ඩුං මූලධර්ම මත පිහිටීම" මැයින් 2019 ඔක්තෝබර් 25-26 දිනවල දී අසර්බයිජානයේ බාකු නුවර දී පැවති නොබැඳි ව්‍යාපාරයේ රාජ්‍ය සහ ආණ්ඩු නායකයින්ගේ 18 වැනි සමුළුවට සහභාගී වූ ශ්‍රී ලාංකික දූත පිරිසට එවකට විදේශ අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමා නායකත්වය දුන්නේය.

2019 වසරේදී ශ්‍රී ලංකාව කලාපීය සංවිධාන සහ මූලාරම්භයන් කිහිපයකට නායකත්වය ලබා දුන්නේය. බහුආංශික තාක්ෂණ හා ආර්ථික සහයෝගිතාව පිළිබඳ බෙංගාල බොක්ක තදාශ්‍රිත රාජ්‍යන්ගේ මුල්පිරීම හෙවත් බිම්ස්ටෙක් සංගමයේ සභාපතිවරයා ලෙස එහි නිත්‍ය ක්‍රියාකාරී කමිටුවේ හමුවීම් දෙකක් කොළඹ දී පැවැත්වුණි. එම සංගමයේ ප්‍රඥප්ති කෙටුම්පත සකස් කිරීම සහ කලාපීය සහයෝගිතාවයේ විවිධ අංශයන්ගේ පැහැදිළි මෙන්ම ලඟාකර ගත හැකි නිගමනයන්ට එළැඹීම සම්බන්ධයෙන් සිදුකළ සාකච්ඡාවන් සඳහා ශ්‍රී ලංකාව නායකත්වය ලබා දුනි. මෙම නව තීරණයන්ට අනුව ශ්‍රී ලංකාව විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සඳහා ප්‍රමුඛ රාජ්‍ය බවට පත්වනු ඇත. මෙය වර්තමානයේ දැනුම පාදක කරගත් හා නවෝත්පාදන පාදක කරගත් සංවර්ධන ප්‍රවේශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ශ්‍රී ලංකා රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුරූපවෙයි. 2020 දී පැවැත්වීමට නියමිත මීළඟ බිම්ස්ටෙක් සමුළුව සඳහා ශ්‍රී ලංකාව සත්කාරක රාජ්‍ය ලෙස කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රමසම්පාදනයද මෙම අමාත්‍යාංශය සිදුකරනු ඇත.

ඉන්දියානු සාගර කලාපයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති බැඳියාව විදහා දක්වමින් 2021-2023 ද්විවර්ෂය තුළ ශ්‍රී ලංකාව ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ (අයොරා)

උප සභාපති ලෙස කටයුතු කිරීමේ ආධ්‍යාශයෙන් පසුවන බව 2019 නොවැම්බර් මස අබුඩාබි හි පැවති අයොරා 19 වැනි අමාත්‍ය සමුළුවේදී විදේශ ලේකම් රවිනාථ ආර්යසිංහ මහතා ප්‍රකාශ කළේය. එසේම මෙම සමුළුවේදී ශ්‍රී ලංකාවේ ආස්ථානය පැහැදිළි කරමින් හෙතෙම "වෙරළාසන්න රාජ්‍යයන්ට ප්‍රමුඛතාවය ලබා දෙමින් සහ නාවික කටයුතු සඳහා ඉන්දියන් සාගරය භාවිත කරන සියලුම දෙනාගේ අවශ්‍යතාවයන් කෙරෙහි සංවේදී වෙමින්, ඉන්දියන් සාගර කලාපයේ අභියෝග අවම කිරීම සඳහා එය සම්පූර්ණයෙන් ආවරණයවන්නාවූ ආරක්ෂක ව්‍යුහයක්" සකස් කළ යුතු බව අවධාරණය කළේය.

මෙම අමාත්‍යාංශයේ සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශයේ කාර්යභාරය හරහා මෙම විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වන ගැටලු විසඳීම සඳහා ශ්‍රී ලංකාව කටයුතු කර ඇත. මේ සම්බන්ධයෙන් කළ සමහර මැදිහත්වීම් අතර, පොදුරාජ්‍ය මණ්ඩලයීය නිල් ප්‍රඥප්තියේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කිරීම, ශ්‍රී ලංකාව විසින් පෙරමුණ ගන්නා ලද පොදුරාජ්‍ය මණ්ඩලයීය නිල් ප්‍රඥප්තියේ කඩොලාන පරිසර පද්ධති පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම සහ ඉන්දියන් සාගර වටදේදර රටවල සංගමයේ සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම ආදියෙහි ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කිරීම දැක්විය හැකිය. 2018 සිට ශ්‍රී ලංකාව ඉන්දියන් සාගර වටදේදර රටවල සංගමයේ, සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීමේ වගකීම භාරගෙන ඇති අතර, බෙදුම්වාදී ත්‍රස්තවාදී ගැටුම් සමයේ දී ශ්‍රී ලංකාව මුහුණ දුන් සමුද්‍රීය ආරක්ෂාව පිළිබඳ තර්ජන රැසක අත්දැකීම් එම කණ්ඩායම සමගින් බෙදාහැර ඇත. 2019 අගෝස්තු මාසයේ කොළඹ දී පැවති මෙම කණ්ඩායමේ පළමු හමුව සාමාජික රටවල සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය පිළිබඳ ක්ෂේත්‍රයේ පොදු ප්‍රමුඛතා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට වේදිකාවක් සැපයූ අතර, ඉන්දියන් සාගරයේ සමුද්‍රීය අපරාධ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පවත්නා සමුද්‍ර නීති පද්ධතිය සමඟ සමුද්‍රීය ආරක්ෂක අභියෝග සකස්කර ගැනීම, මත්ද්‍රව්‍ය ජාවාරම, ජාත්‍යන්තර අපරාධ හා ගෝලීය ධීවර කර්මාන්තය යන කරුණු සම්බන්ධයෙන් එහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කෙරුණි.

එසේම 2019 මාර්තු මාසයේ දී අතිශය වැදගත් රාජ්‍යතාන්ත්‍රික ප්‍රයත්නයක් වූ ථෙරවාද ත්‍රිපිටකය යුනෙස්කෝ ලෝක සිහිවටන දර්ශකයේ ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකාව සිය සහාය දුන් අතර, මෙම ප්‍රයත්නය සඳහා ලෝකයේ සියලුම බෞද්ධ රටවල සහය ලබා ගැනීමේ වගකීම දැරූ සම්බන්ධීකරණ කමිටුවට විදේශ ලේකම්වරයා සිය නායකත්වය දුන්නේය. ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වඩාත් උතුම් දිනය ලෙස වෙසක් දිනය ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල යෝජනා අංක 54/115 ට අනුකූලව, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ එහි දූත මණ්ඩල ජාත්‍යන්තර වශයෙන් 'වෙසක්' උත්සවය සැමරූහ.

**ඉහළම සේවාවක් සැපයීම සඳහා අංශ ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධ පොදු කරුණු**

**ජාත්‍යන්තර ආරක්ෂාව හා ත්‍රස්තවාදය මැඩපැවැත්වීම**

අතීතයේ තාවකාලික පදනමක් මත විවිධ අධ්‍යක්ෂවරුන් යටතේ තිබූ ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ ඒකකය, ජාත්‍යන්තර ආරක්ෂාව සහ ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ අංශය නමින් ඒ සඳහාම වෙන්වූ කාර්යාලයක් හා කාර්ය මණ්ඩලයක් සහිතව වෙනම අංශයක් ලෙස උසස් කෙරුණි. මෙම අංශය දැනට පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන අතර, ශ්‍රී ලංකාවේ පවත්නා බහුවිධ ආරක්ෂක සබඳතා අන්තර්ගතවූ පුළුල් විෂය පථයක් ඔස්සේ ක්‍රියාත්මක වෙමින්, දේශීය ආරක්ෂක හා බුද්ධි නියෝජිතායතන සමඟ සබඳතා යළි ප්‍රාණවත් කරමින් මෙහි කටයුතු සිදු කෙරෙමින් ඇත. විශේෂයෙන්ම, මත්ද්‍රව්‍ය හා මිනිස් ජාවාරම වැනි දේශසීමා ඉක්මවමින් සිදුකරන සංවිධානාත්මක අපරාධ පිළිබඳව කටයුතු කිරීම සහ එල්ටීටීඊ තහනම පවත්වා ගැනීම සම්බන්ධයෙන් ආරක්ෂක, නීතිය හා සාමය, අධිකරණ, ස්වදේශ කටයුතු යන අමාත්‍යාංශ, නීතිපති දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමගින් සැලකිය යුතු ලෙස ශක්තිමත් සම්බන්ධීකරණයකට පිවිසීමට මෙම අංශයට හැකි වී තිබේ. ත්‍රස්තවාදය මැඩපැවැත්වීම පිළිබඳ රාමුව ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාවේ නීතිය බලාත්මක කිරීමේ හා බුද්ධි අංශ බලධාරීන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා කලාපීය හා ජාත්‍යන්තර ආයතන සමඟ සංවාද සම්බන්ධීකරණය කිරීම පිණිස 2019 වසරේදී මෙම අංශය සක්‍රියව දායක වූ අතර, එල්ටීටීඊ සංවිධානය ලැයිස්තුගත කිරීම පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ඒ හා අදාල අංශයන්ට අඛණ්ඩව සැපයීමද සිදුකර ඇත. 2019 ජනවාරි මස පිහිටවූ මෙම අංශය හරහා පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් අනතුරුව, විදේශ අමාත්‍යාංශය සහ ආරක්ෂක බලධාරීන් අතර වඩාත් හොඳ

සම්බන්ධීකරණයක් ඇතිකර ගැනීමට හැකි විය. මීට අමතරව, පාස්කු ඉරුදින තුස්ත ප්‍රහාරයෙන් පසු යුරෝපා සංගමය, එක්සත් ජාතීන්ගේ සංවිධානය, එක්සත් ජනපදය හා ඕස්ට්‍රේලියාව මෙන්ම, මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය සහ ඉන්ටර්පොල් ඇතුළු සංවිධානවලින් ද ජාත්‍යන්තර වශයෙන් ලැබුණු සහාය වඩාත් හොඳින් සම්බන්ධීකරණය කිරීමට ද එය මහෝපකාරී විය.

**මහජන රාජ්‍යතාන්ත්‍රිකභාවය**

මෙම අමාත්‍යාංශයේ මහජන සන්නිවේදනය සහ මාධ්‍ය සම්බන්ධතා වැඩිදියුණු කිරීම හා විධිමත් කිරීම සඳහා, ජනමාධ්‍ය සම්බන්ධ සියලුම මෙහෙයුම් මධ්‍යගත කරමින්, මහජන සන්නිවේදන අංශය මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය ලෙස යළි නාමකරණය කරන ලද අතර, වඩාත් හොඳ සම්බන්ධීකරණයක් සහතික කිරීම සඳහා මෙම අංශයේ ප්‍රධානියා අමාත්‍යාංශයේ ප්‍රකාශක ලෙස නැවත පත් කෙරුණි. මෙම අංශය දැන් එහි සාම්ප්‍රදායික වගකීම්වලට අමතරව, ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ගෝලීය වශයෙන් ඉදිරියට ගෙන ඒම සම්බන්ධයෙන් වන පුළුල් කාර්යභාරයක් සියතට ගෙන තිබේ. මෙහිදී විදේශයන්හි ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් උද්ගත වන ගැටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරය ජාත්‍යන්තරයට සන්නිවේදනය කිරීම මෙම අංශයට අවස්ථාව සැළසී ඇත. එසේම මාධ්‍ය සබඳතා වැඩිදියුණු කිරීම මෙන්ම, මෙම අමාත්‍යාංශය සමාජ මාධ්‍ය ජාල තුළ ව්‍යාප්ත කිරීම කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස අමාත්‍යාංශය හා දූත මණ්ඩල විසින් සිදු කරන ලද කාර්යයන් වඩාත් හොඳින් ප්‍රක්ෂේපණය කිරීමට හැකිවී ඇති අතරම, අසාධාරණ විවේචන එල්ල වූ විට ඒවා පිළිබඳව පැහැදිලි කිරීම් ලබාදීම හෝ ඒවා ප්‍රතික්ෂේප කිරීම සඳහාද මෙය උපයුක්තවී ඇත.

ඉහත වෙනස්කම්වලට අමතරව, පවත්නා තාක්ෂණික වර්ධනයන් සමඟ කටයුතු කිරීම සහ වඩාත් පරිශීලක හිතකාමී අත්දැකීමක් ලබා දීම පිණිස විදේශ අමාත්‍යාංශයේ වෙබ් අඩවිය නවීකරණය කිරීම හා විදේශ අමාත්‍යාංශය සඳහා වඩාත් හොඳ සයිබර් ආරක්ෂාවක් ලබාදීමද සිදු කෙරුණි.

අමාත්‍යාංශයේ සියලුම රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් මාධ්‍ය පිළිබඳව දැනුවත් වී සිටීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය, ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ හා මානව සම්පත් ප්‍රවර්ධන අංශය සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව ශ්‍රී ලංකා විදේශ සේවයේ කොළඹ සිටින සියලුම නිලධාරීන්ට 'මහජන රාජ්‍යතාන්ත්‍රික පුහුණු වැඩසටහනක්' 2019 දෙසැම්බර් මාසයේ දී පැවැත්වුණි. මෙම වැඩසටහන පළමුව සකස් කරනු ලැබුවේ අභිනවයෙන් බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් සඳහාය 2018 දෙසැම්බර් මාසයේදීය.

**ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් ප්‍රවර්ධනය**

මෙම අමාත්‍යාංශ ගමන් කළ යුතු දිශානතිය සැලසුම් කිරීම සහ එය ඇගයීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැලසුම් සහ පර්යේෂණ කටයුතු සිදු කිරීම කිරීමේ අරමුණින් මෙය නව අංශයක් ලෙස 2018 නොවැම්බර් මාසයේදී පිහිටවනු ලැබුණි. පෙර විදේශ පරිපාලන අංශය යටතේ තිබූ මානව සම්පත් සංවර්ධන ඒකකය අවශ්‍ය විටෙක දී පමණක් සිදු කෙරුණු පුහුණු කටයුතු සඳහා පමණක් අවධානය යොමු කළ කර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විශේෂිත කුසලතා වර්ධනය කෙරෙහි අවධානයක් යොමු නොකෙරුණි. මෙයින් දුරස්ව වඩාත් පුළුල් පරාසයක නිපුණත්වයකින් යුතු ක්‍රියාශීලී සංවිධානයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු දියත් කිරීම සඳහා ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ හා මානව සම්පත් ප්‍රවර්ධන අංශය 2019 වසර තුළ දී ප්‍රයත්න දරා ඇත. ඒ අනුව, සෑම වසරකම අවසානයේදීම ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රියාවලියක් ඔස්සේ සිය කාර්ය සාධනය විෂයානුබද්ධව තක්සේරු කිරීමේ අරමුණින් යුතුව, 'ප්‍රමුඛතා, ඉලක්ක සහ ප්‍රධාන කාර්ය සාධක දර්ශක' හරහා සිය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම මගින් මෙම අමාත්‍යාංශය එහි විදේශ දූත මණ්ඩල හා අංශ වෙත සිය ක්‍රියාකාරකම් සකස් කිරීම සම්බන්ධයෙන් නව ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර තිබේ.

මානව සම්පත් ප්‍රවර්ධන දෘෂ්ටි කෝණයකින් බලන කල, අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී වඩාත් ඵලදායී ලෙස දායකවිය හැකි ලෙස වෘත්තිකයන් වඩාත් හොඳින් පුහුණු කිරීමට මෙම නව අංශය හරහා අමාත්‍යාංශයට හැකිවී ඇත. ශ්‍රී ලංකා විදේශ සේවයේ බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම සඳහා මෙම අංශය 2019 වසරේදී පියවර කිහිපයක්ම තැබූ අතර, අමාත්‍යාංශයේ මානව සම්පත් ක්‍රියාකාරකම් පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්ති විධිමත් කිරීමටද කටයුතු කළේය. ඊට අමතරව, සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ දී සියලු මට්ටම් ඉලක්ක කර ගනිමින් පුහුණු වැඩසටහන්

ද මෙම අංශය මගින් පවත්වා ඇත. මෙම අංශය, මානව සම්පත් කළමනාකරණ අංශය සහ සාමාන්‍ය පාලන අංශය සමඟ එක්ව, අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සහ මානව සම්පත් අවශ්‍යතා නැවත ස්ථානගත කිරීමේ අභ්‍යාසයක වර්තමානයේදී නිරත වෙයි.

පර්යේෂණ හා විශ්ලේෂණ කෙරෙහි නැඹුරුවක් නිර්මාණය කිරීම සඳහා, මෙම අමාත්‍යාංශය, 2018 දී බඳවා ගන්නා ලද නව ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ කණ්ඩායමෙන් ආරම්භ කරමින්, ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනයේද සහයෝගය ඇතිව, විදේශ ප්‍රතිපත්ති ආශ්‍රිත ප්‍රධාන මාතෘකා පිළිබඳ පර්යේෂණ පත්‍රිකා සකස් කිරීමේ ව්‍යාපෘතියක්ද සඳහා 2019 වසර ආරම්භයේ සිට ආරම්භක් ලබා ගැනුණි.

**විදේශ පරිපාලන අංශය කාර්යභාර අනුව කොටස් දෙකකට වෙන් කිරීම**

වර්තමානයේ පවත්නා ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල හා කොන්සල් ජනරාල් කාර්යාල සංඛ්‍යාව 67කි. මෙම දූත මණ්ඩල සඳහා වඩාත් ඵලදායී සහ කඩිනම් කළමනාකරණයක් සහතික කිරීම සඳහා මානව සම්පත් හා දූත මණ්ඩල කළමනාකරණ අංශය සහ විදේශ වත්කම් කළමනාකරණ හා සංවර්ධන අංශය යනුවෙන් විදේශ පරිපාලන අංශය කොටස් දෙකකට වෙන් කෙරුණි. මානව සම්පත් හා දූත මණ්ඩල කළමනාකරණ අංශය දූත මණ්ඩලවල නිලධාරීන්ගේ පිරිස් පාලන කටයුතු පිළිබඳව සොයා බලන අතර, විදේශ වත්කම් කළමනාකරණ හා සංවර්ධන අංශය නිලධාරීන්ගේ ගමනාගමනය (සංචාරක ඒකකය), රාජ්‍යතාන්ත්‍රික ලිපි නුවමාරු (ආරක්ෂක තැපෑල-රාජ්‍යතාන්ත්‍රික බෑගය, සයිෆර් ඒකක) සහ ශ්‍රී ලංකා රජයට අයත් විදේශීය වත්කම් හා ඒවායේ සංවර්ධනය පිළිබඳව අවධානය යොමු කරයි.

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රික ක්ෂේත්‍ර පුළුල් කිරීම**

විදේශ අමාත්‍යාංශයේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන 2019 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර ඒ හරහා අදාළ රජයේ නියෝජිතායතන හා ව්‍යාපාරික ආයතන සමඟ සමීප සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කරමින්, ජාත්‍යන්තර ව්‍යාපාරිකයන් හා ඔවුන්ගේ දේශීය හවුල්කරුවන් අතර ආර්ථික සහයෝගීතාවය සඳහා අවශ්‍ය පහසුකම් සැළසීමට විදේශ අමාත්‍යාංශයට හා එහි දූත මණ්ඩලවලට හැකිවිය. 2018 වසරේ සිට ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු සඳහාම වෙන්වුණු ප්‍රතිපාදන ලබා දීමෙන් අනතුරුව, දූත මණ්ඩලවල කාර්ය සාධනය තක්සේරු කිරීම සඳහා තමාට 'අත්කර ගත හැකි ඉලක්ක' වෙත ගමන් කිරීමේ වැඩපිළිවලක් සකස් කෙරුණි. ඒ සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය, ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු අදාළ රේඛීය නියෝජිතායතන සමඟ මෙම අමාත්‍යාංශය සාකච්ඡා කිරීමෙන් අනතුරුව පුළුල් අධ්‍යයනයකින් පසු වෙළඳ, සංචාරක, ආයෝජන සහ විදේශ රැකියා කටයුතු සම්බන්ධයෙන් විදේශ දූත මණ්ඩල/දූත කාර්යාල වෙත ඉලක්ක ලබාදුනි.

වෙනත් රටවල් සමඟ ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම හරහා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා ආර්ථික පුනර්ජීවන යාන්ත්‍රණය ශක්තිමත් කිරීමේ පහසුකම් සපයන්නෙකු ලෙස මෙම අමාත්‍යාංශය අඛණ්ඩව ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරයි. එසේම පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් අනතුරුව සංචාරක කර්මාන්තය යළි පණගැන්වීම සඳහා අවශ්‍ය උත්ප්‍රේරණය ලබාදීම සඳහා මෙම අමාත්‍යාංශය විශේෂ වැඩපිළිවලක් දියත් කෙරුණි.

ආකර්ශනීය ආයෝජන සහ සංචාරක ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව සහතික කිරීම, ශ්‍රී ලාංකික නිෂ්පාදන උසස් ලෙස ප්‍රවර්ධනය කිරීම, ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ප්‍රවේශය පුළුල් කිරීම සහ අපනයන භාණ්ඩ රැස විවිධාංගීකරණය කිරීම සඳහා අවශ්‍ය වෙළඳපොළ තොරතුරු සැපයීම, විදේශ රැකියා නියුක්තිය පුළුල් කිරීම හා එහි නිපුණතාවය වැඩිදියුණු කිරීම යනාදිය මෙම අමාත්‍යාංශය හා දූත මණ්ඩල ඍජුවම සිදු කරනු ලබන සමහර ක්‍රියාකාරකම් අතර වෙති.

**විදේශගත ශ්‍රී ලාංකිකයන් සමඟ සම්බන්ධ වීම**

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දායක වීම සහ එහි නිසි ප්‍රතිලාභ ලබාගැනීම සඳහා විදේශයන්හි ජීවත්වන ශ්‍රී ලාංකිකයන් සම්බන්ධ කර ගැනීමේ අරමුණින් යුතුව, මීට පෙර මහජන සන්නිවේදන අංශය යටතේ

පැවති විදේශගත ශ්‍රී ලාංකිකයන් පිළිබඳ අංශය ආර්ථික රාජ්‍යතාන්ත්‍රික අංශය යටතට ගනු ලැබුණි. විශේෂයෙන්ම ආර්ථික, දේශපාලන, මහජන හා සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය මෙන්ම, පුද්ගලාන්තර සබඳතා යන කාණ්ඩ යටතේ විදේශගත ශ්‍රී ලාංකිකයන් සංවර්ධනයේ හවුල්කරුවන් ලෙස සම්බන්ධ කර ගැනීම පිළිබඳ සංකල්ප පත්‍රිකාවක් ආර්ථික කටයුතු අංශය සකස් කෙරුණි. මෙම සංකල්ප පත්‍රය හරහා විදේශගත ශ්‍රී ලාංකිකයන් පමණක් අරමුණු කර ගනිමින් 'විදේශ ප්‍රතිපත්තිය හා ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය පිළිබඳ සංවාදයක්' පැවැත්වීමට මෙම අංශය කටයුතු කරමින් සිටියි. එසේම තොරතුරු තාක්ෂණය භාවිතයෙන් විදේශගත ශ්‍රී ලාංකිකයන් සමඟ සෘජුව සම්බන්ධ වීම පිළිබඳ කරුණු විශ්ලේෂණයක්ද මෙම අමාත්‍යාංශය විසින් සිදුකර ඇත.

**පුද්ගලාන්තර සබඳතා සහ පුරවැසි කේන්ද්‍රීය සේවා**

අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය, විදේශවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල හරහා සහ යාපනයේ පිහිටි ප්‍රාදේශීය කාර්යාලය හරහා සිය කොන්සියුලර් සේවා අබණ්ඩව සැපයූ අතර, මෙම අමාත්‍යාංශයේ කොන්සියුලර් සේවා විමධ්‍යගත කිරීමේ වැඩ පිළිවල අනුව නව ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලයක් 2019 පෙබරවාරි 16 වැනි දින මාතර දී විවෘත කෙරුණි.

2019 ජනවාරි 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අමාත්‍යාංශයේ ලේඛන සහතික කිරීමේ පද්ධතිය හරහා ලේඛන සත්‍යාපන සේවාව විදේශ දූත මණ්ඩල/දූත කාර්යාල විවෘත කර ඇති අතර අමාත්‍යාංශයේ විද්‍යුත් ලේඛන සහතික කිරීමේ පද්ධතිය හරහා අපනයන ආශ්‍රිත ලේඛන සහතික කිරීම සම්බන්ධයෙන් ලංකා වාණිජ මණ්ඩලය සහ අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමකටද අත්සන් තබා ඇත.

අම්පාර, මඩකලපුව, මුලතිව්, මොණරාගල, දිවුලපිටිය, මාතලේ සහ යාපනය වැනි රටේ විවිධ ප්‍රදේශවල දී ඒකාබද්ධ ජංගම කොන්සියුලර් සේවාවන්ද අමාත්‍යාංශය විසින් පවත්වන ලදී. මීට අමතරව, 2019 වසර තුළ දී අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය විදේශවල දී වාර්තා වූ ශ්‍රී ලාංකිකයන්ගේ මරණ 480 ක් සියරට ගෙන්වීම සහ විදේශයන්හි අතරමන්ව සිටි 208 පිරිසක් සියරට ගෙන්වීම සඳහා සිය සහය ලබා දී ඇති අතර, පවුල්/වින්දිතයන් 16 කට ආසන්න සංඛ්‍යාවකගේ වන්දි/ලේ වන්දි සහ වෙනත් හිඟ මුදල් ලෙස දළ වශයෙන් ශ්‍රී.ලං.රු. මිලියන 394 ක මුදලක් ලබා ගැනීම සඳහා පහසුකම් සලසා ඇත.

'විදේශවල ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය වැඩිදියුණු කිරීම' පිළිබඳ සම්මන්ත්‍රණයක් 2019 සැප්තැම්බර් මස විදේශ රැකියා අමාත්‍යාංශය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එක්ව මැලේසියාවේ ක්වාලාලම්පූර් හි දී පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණයේ දී ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු අංශ සඳහා වන 'මෙහෙයුම් අත්පොත' යාවත්කාලීන කිරීම තුළින් ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව හා සුභසාධනය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කෙරුණි. ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය, ජාත්‍යන්තර කම්කරු සංවිධානය, සංක්‍රමණිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය, එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධානය, තිරසාර සංවර්ධන කවුන්සිලය සහ අදාළ දේශීය නියෝජිතායතන සමඟ සාකච්ඡා කර ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා රැකියා අවස්ථා වැඩිදියුණු කිරීම, කුසලතා ඉහළ නැංවීම සහ ඔවුන්ගේ සුබසාධනය ශක්තිමත් කිරීම වෙත අමාත්‍යාංශය උත්සාහ දරා තිබේ.

අමාත්‍යාංශයේ නීති අංශය, පුළුල් පරාසයක ජාත්‍යන්තර ගැටලු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගණනාවක් සඳහා අබණ්ඩව නීති උපදෙස් ලබා දී ඇත. එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතන සහ වෙනත් ජාත්‍යන්තර සංවිධාන සමඟ තත්ත්ව ගිවිසුම්, ජාත්‍යන්තර මානුෂීය නීතිය, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා ක්‍රියාත්මක කිරීම, පිළිබඳ කාරණා සම්බන්ධ සෘජු මැදිහත්වීම්වලට අමතරව, ආයෝජනය හා අන්‍යෝන්‍ය ආරක්ෂණය පිළිබඳ ගිවිසුම, විදේශ ත්‍රස්තවාදී සටන්කරුවන් සහ ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහිව සටන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා ප්‍රසිද්ධ කිරීම, රටවල් කිහිපයක් සමඟ සංක්‍රමණය, සිරකරුවන් මාරු කිරීමේ ගිවිසුම්, ද්විත්ව බදුකරණය වැළැක්වීමේ හා රාජ්‍ය මූල්‍ය මගහැරීම වැළැක්වීම පිළිබඳ ගිවිසුම් යනාදිය සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශ නීති අංශය හා සම්බන්ධ විය. මෙම අංශය, නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා සඳහා ද සහභාගී වූ අතර, අමාත්‍යාංශයේ තොරතුරු දැන ගැනීමේ අයිතිය පනත අනුව කටයුතු කිරීමේ වගකීමද දරයි.

මෙම අමාත්‍යාංශයේ සංධාන අංශය 2019 වසර තුළ දී රාජ්‍ය, නිල හා වෙනත් ජාත්‍යන්තර නියෝජිත කණ්ඩායම් වෙත පහසුකම් සැලසූ අතර, ශ්‍රී ලංකාවේ විදේශීය සම්භාවනීය අමුත්තන් හා සම්බන්ධ සියලු උත්සව කටයුතු සඳහා සංධාන විධිවිධාන ලබාදුනි. මෙයට අමතරව, ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික බලකායට සහ අනේවාසික අක්ත ගැන්වීම්වලට රාජ්‍යතාන්ත්‍රික නිර්මුක්තිය සහ වරප්‍රසාද සඳහා පහසුකම් සැලසීම හා අධීක්ෂණය කිරීම මෙම අංශය මගින් අඛණ්ඩව සිදුකෙරුණි.

සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී, සාමාන්‍ය පාලන අංශය, මූල්‍ය අංශය සහ අමාත්‍යාංශයේ විගණන අංශය එක්ව, ආයතනයේ හා නඩත්තු කටයුතුවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම මෙන්ම, විගණන ක්‍රියාවලියේ අධීක්ෂණය යටතේ මූල්‍ය කළමනාකරණය සිදුකිරීමට කටයුතු කර ඇත. මෙම අංශ තුන ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ නිලධාරීන්ගෙන් සමන්විත වන අතර ඔවුහු ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම හරහා රටේ පරිපාලන හා මූල්‍ය පද්ධති ඉහළ නැංවීමේ සාමූහික නිලධාරී පාලන ක්‍රමයේ ශක්තිය පිළිබිඹු කර ඇති. ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුහු වෙනත් දේශපාලන හා මෙහෙයුම් අංශවලට මෙන්ම, විදේශ දූත මණ්ඩලවලට ද සිය සහාය ලබාදී ඇත.

### ආයතනික සංවර්ධනය: පිරිස් වැඩිදියුණු කිරීම, පරිපාලන ක්‍රියාවලි විධිමත් කිරීම සහ දූත මණ්ඩල සඳහා පත්කිරීම්

### ඉලක්ක, ප්‍රමුඛතා සහ ප්‍රධාන කාර්යසාධක දර්ශක සහිත ක්‍රියාකාරී සැලැස්මක් හරහා පැහැදිලි දිශානතියක් වෙත යොමුවීම

වෙනත් රටවල ක්‍රියාත්මක වන 'විශිෂ්ට පරිචයන්' හැදෑරීම සහ අමාත්‍යංශයේ අංශ සහ විදේශ දූත මණ්ඩල/දූත කාර්යාල සමඟ පැවැත්වූ උපදේශන වලින් අනතුරුව, මෙම අමාත්‍යාංශය සහ විදේශ දූත මණ්ඩල/දූත කාර්යාල සඳහා 'ප්‍රමුඛතා, ඉලක්ක සහ ප්‍රධාන කාර්ය සාධක දර්ශක' වලින් සමන්විත 2019 ක්‍රියාකාරී සැලැස්ම සකස් කෙරුණි. 'සාක්ෂාත් කරගත යුතු ඉලක්ක' සහ ප්‍රධාන කාර්යසාධක දර්ශක මත පදනම් වූ මෙම නව සැලැස්ම කාර්ය සාධනය පිළිබඳ වගකිවයුතු ජාතික බලධාරීන්ගේ අපේක්ෂාවන්ට අනුකූල වන පරිදි, විශ්වසනීය ඇගයීමේ ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මකවනු ඇත. මෙමගින් පරිපූර්ණ ඇගයීමේ ක්‍රියාවලියකට එමගින් ඉඩ සලසන අතර, දූත මණ්ඩලයේ/දූත කාර්යාලයේ ප්‍රධානීන් මෙන්ම අමාත්‍යාංශයේ අංශ ප්‍රධානීන් ද ඒ සඳහා වගකිව යුතු වෙති. එය 'කාර්ය සාධන විගණනයක්' ලෙස ද ක්‍රියා කරන අතරම, අමාත්‍යාංශයේ හා දූත මණ්ඩලවල සේවය කරන සියලුම තනි නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව තක්සේරු කිරීම සඳහා විෂයානුබද්ධ පදනමක් ද සපයයි.

### වඩා හොඳ සේවා පරිසරයක්: අවශ්‍ය භෞතික සම්පත් ලබා දීම

ඇතැම් අංශවල පවතින අතිශයින්ම අවහිර වූ ඉඩකඩ පිළිබඳව සලකා බලා, මෙම අංශ නැවත ස්ථානගත කිරීමට සහ අමාත්‍යාංශය තුළ වඩාත් හිතකර සේවා පරිසරයක් නිර්මාණය කිරීමට පියවර ගැණුනි. පවතින ඉඩකඩ උපරිම ලෙස භාවිත කරමින් ආර්ථික කටයුතු අංශය සහ තොරතුරු තාක්ෂණ අංශයේ ලේඛනාගාරය නැවත ස්ථානගත කිරීම සඳහා සෙලින්කෝ ගොඩනැගිල්ලෙන් ඉඩකඩ ලබා ගැණුනි. සිදු කෙරෙමින් පවතින වැඩකටයුතුවලට අවම බාධාවක් වන පරිදි, සාමාන්‍ය පාලන අංශයේ අධීක්ෂණය යටතේ මෙම වෙනස්කම් සිදු කෙරුණි.

### වඩාත් ගුණාත්මක හා ඵලදායී ශ්‍රම බලකායක්: පිරිස් වැඩිදියුණු කිරීම, පරිපාලන ක්‍රියාවලි සහ දූත මණ්ඩල සඳහා පත්කිරීම් විධිමත් කිරීම

රාජ්‍යතාන්ත්‍රික කාර්ය මණ්ඩලය - ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගේ වෘත්තීය ප්‍රගතිය සහ අපේක්ෂාවන් පිළිබඳ පැනවී ඇති යම් සීමාවන් නිරවුල් කිරීම සඳහා, සියලුම මට්ටම්වල විදේශ පත්වීම් පිළිබඳව මෙම අමාත්‍යාංශය සමාලෝචනයක යෙදුනි.

2018 ඔක්තෝබර් මාසය වන විට ශ්‍රී ලංකා විදේශ සේවයේ දූත මණ්ඩල ප්‍රධානීන්ගේ සංඛ්‍යාව ආසන්න වශයෙන් 37% කි. ඉන්පසු ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් 14 දෙනෙකු දූත මණ්ඩල ප්‍රධානී තනතුරු සඳහා පත් කිරීම පිණිස 2018 දෙසැම්බර් මාසයේ දී උසස් නිලතල සඳහා වූ පාර්ලිමේන්තු කමිටුවේ අනුමැතිය සඳහා නිර්දේශ කිරීමට පියවර ගන්නා ලද අතර, එම පිරිස 2019 මැද භාගයේ දී

රාජකාරී භාරගත්හ. පසුව, 2019 දී දූත මණ්ඩල සඳහා නම් කරන ලද තවත් ශ්‍රී ලංකා විදේශ සේවයේ අනෙකුත් නිලධාරීහු 9 දෙනෙකු සිය තනතුරු භාර ගත්හ. 2019 වසර අග භාගයේ දී ශ්‍රී ලංකා විදේශ සේවයේ තවත් නිලධාරීන් 2 දෙනෙකුට උසස් තනතුරු සඳහා වූ පාර්ලිමේන්තු කමිටුවේ අනුමැතිය ලැබුණු ඇති අතර, ඒ අනුව දූත මණ්ඩල ප්‍රධානී තනතුරු දරන ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ අනුපාතය මේ වන විට ආසන්න වශයෙන් 58% ක් දක්වා ඉහළ ගොස් ඇත. 2019 වසරේ දී පත්කරන ලද දූත මණ්ඩල ප්‍රධානීන් 29 දෙනා අතුරින් 25 දෙනෙක් ම (86%) ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් වීම මෙහිදී විශේෂත්වයකි.

මෙම කාලය තුළ සියලුම මට්ටම්වල රාජ්‍යතාන්ත්‍රික තනතුරු සම්බන්ධ මාරුවීම් සිදු කිරීම සිදුවූයේ වඩාත් ඉහළ වගවීමක් හා විනිවිදභාවයක් සහතිකවන්නාවූ අයදුම්පත් පරිපාටියක් අනුගමනය කිරීමෙන් හා ස්ථාන මාරු මණ්ඩලයක් හරහා සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙනි. ස්ථාන මාරු පුරෝකථනය කිරීමේ හැකියාව, කාර්යක්ෂමතාව සහ විධිමත් බව සහතික කිරීම සඳහා 2019 වසරේ සිට සෑම වර්ෂයකදීම ජූලි/අගෝස්තු සහ දෙසැම්බර් මාසවල දී දූත මණ්ඩලවලට සහ ඉන් පිටතට ස්ථාන මාරු සිදු කිරීමට මෙම අමාත්‍යාංශය තීරණය කර ඇති අතර එමඟින් සංක්‍රමණය/මාරුවීම්වල දී නිලධාරීන්ට හා දූත මන්ඩලයන්ගේ රාජකාරී සඳහා අවම බාධාවක් ඇති වේ.

රාජ්‍යතාන්ත්‍රික නොවන කාර්ය මණ්ඩලය - 2019 වසරේ දී, සියලුම මට්ටම්වල දූත මණ්ඩල සහායක කාර්ය මණ්ඩලය (එනම්, පුද්ගලික සහකාරවරුන්, රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන්, සංධාන සහකාරවරුන්, කොන්සියලර් සහකාරවරුන්, කාර්යාල කාර්ය සහායකවරුන් සහ රියදුරන්) සඳහා විනිවිද පෙනෙන, සාධාරණ හා තරඟකාරී ආකාරයකින් හා සම්මුඛ පරීක්ෂණ හරහා විදේශ දූත මණ්ඩලවලට මාරුවීම් සිදුකිරීම ආරම්භ කොට ක්‍රියාත්මක කරන ලදී. දූත මණ්ඩලවලට රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් හා පුද්ගලික සහකාරවරුන් තෝරාගැනීම සඳහා විවෘත තරඟ විභාග ද 2019 වසරේ දී පැවැත්වුණි.

තනතුරු විධිමත් කිරීම - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ වැටුප් හා සේවක කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර අමාත්‍යාංශයේ තනතුරු සඳහා සේවක සංඛ්‍යා තාර්කිකකරණ ක්‍රියාවලියක් ද මෙම අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද අතර, විදේශ සේවයේ ආයතනික අවශ්‍යතා සහ වෘත්තීය අවශ්‍යතා සපුරාලීම පිණිස ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ 'විශේෂ ශ්‍රේණිය' ආයතනිකකරණය කිරීම ද එයට ඇතුළත් වේ. ශ්‍රී ලංකාව හා සැසඳිය හැකි රටවල් හා සමගාමී වන පරිදි විදේශ දීමනා පිළිබඳව නැවත සලකා බැලීමද මෙහිදී සිදුවෙයි. මෙම උත්සාහයේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ අමාත්‍යංශයේ සහ දූත මණ්ඩලයන්හි කුඩා නමුත් කාර්යක්ෂමතාවයෙන් ඉහළ සේවක පිරිසක් ස්ථාපිත කිරීමයි.

ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව විධිමත් කිරීම - 'තානාපති නිලය' ප්‍රදානය කිරීම විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ අරමුණින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, වැටුප් හා සේවක කොමිෂන් සභාව සහ වෙනත් අදාළ ආයතන සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩලය සන්දේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබේ. එසේම ශ්‍රී ලංකා විදේශ සේවයේ 'විශේෂ ශ්‍රේණිය' සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදය සකස් කිරීම සඳහා අමාත්‍යාංශයේ අභ්‍යන්තර උපදේශන ක්‍රියාවලියක් සිදුකළ අතර එහිදී එළෙඹුණු තීරණ රේඛීය නියෝජිතායතනවල එකඟතාවය ලබාගැනීම සඳහා ඔවුන් වෙත ඉදිරිපත් කර ඇති. එම එකඟතාව සමඟ මෙම යෝජනා අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය වෙත ඉදිරිපත් කෙරණු ඇත. එසේම 2019 වසරේදී ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම සඳහා වන ගැසට් පත්‍රයද පළ කෙරුණි.

ශ්‍රී ලංකා විදේශ සේවය වෘත්තීයකරණය කිරීම - නව අභියෝගයන්ට සහ තානාපති වෘත්තියේ සිදුවන වෙනස් වන කාර්යභාරයට මුහුණ දීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම ප්‍රමුඛතාවයක් බවට පත් කෙරුණි. ආධුනිකයන් මෙන්ම තෝරාගත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය, මහජන රාජ්‍යතාන්ත්‍රිකභාවය, බහුපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ පරිපාලනමය ක්‍රියාවලි හා මූල්‍ය කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන්, සමාලෝචනයට භාජනය වූ කාලසීමාවේ දී පැවැත්වුණි. ශ්‍රී ලංකා විදේශ සේවයේ 2018 කණ්ඩායමේ නිලධාරීන් පිරිසකට විදේශ භාෂා පුහුණුව සඳහා ශිෂ්‍යත්වද මෙම අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් ලබාදුනි.

ශ්‍රී ලංකා විදේශ සේවයේ නව කණ්ඩායමක් බඳවා ගැනීම - නව කණ්ඩායම් බඳවා ගැනීමේ දී අනවශ්‍ය ප්‍රමාදයන් සිදුවීම සහ ආරම්භක වර්ෂයේ දී ශ්‍රී ලංකා විදේශ සේවය සඳහා තෝරා ගත්/බඳවා ගත් සංඛ්‍යාවෙන් දළවශයෙන් 20% ක අනුපාතයක් සේවයෙන් ඉවත්ව යාම නිසා කණ්ඩායම් අතර පුළුල් පරතරයක් ඇතිවීම මෙන්ම අමාත්‍යාංශයේ හා දූත මණ්ඩලවල සේවය කිරීම සඳහා නිලධාරීන් නොමැති වීමටද තුඩුදී ඇති වර්තමාන බඳවාගැනීමේ පටිපාටියේ දක්නල ලැබෙන අඩුපාඩු පිළිබඳ ප්‍රවේශමින් සිදුකළ අධ්‍යයනයකින් සහ වෙනත් අදාළ නියෝජිතායතන සමඟ සිදුකළ සාකච්ඡා වලින් අනතුරුව නව කණ්ඩායමක් බඳවා ගැනීම සඳහා සංශෝධිත කාර්ය පටිපාටියක් නිර්මාණය කෙරුනි. මෙම නව කණ්ඩායමක් බඳවා ගැනීම විධිමත් කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩලයීය සන්දේශය 2019 දී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරුනි.

අනුබද්ධිත ආයතන

2019 වසර තුළ දී මෙම අමාත්‍යාංශයේ විෂය පථය තුළට ගැනෙන ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය අමාත්‍යාංශය සමඟ මුලපිරීම් කිහිපයකට එක්විය. අලුතින් බඳවාගන්නා ලද විදේශ සේවා නිලධාරීන්ගේ පර්යේෂණ පත්‍රිකා අධීක්ෂණය කිරීම, ලතින් ඇමරිකාව හා අප්‍රිකාව පිළිබඳ ප්‍රතිපත්තිමය සංවාද සඳහා ලබා දෙන සහය හා සහයෝගීතාවය, දූත මණ්ඩල ප්‍රධානීන් හා රාජ්‍යතාන්ත්‍රිකයන් සඳහා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා ලබා දුන් සහය යනාදිය ඒ අතරින් සමහරකි. 2018 වසරේ දී ආර්ථික කටයුතු අංශය විසින් පවත්වන ලද විදේශ ප්‍රතිපත්ති සංවාදය මත පදනම්ව, 'ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකත්වයේ නිල වාර්තාව' සම්පාදනය කිරීමේදී ද මෙම ආයතනය අමාත්‍යාංශයට සහාය විය.

විදේශ සබඳතා අමාත්‍යාංශයේ පුහුණු කිරීමේ හස්තය වන බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා අන්තර්ගත සංවර්ධනය කිරීම තුළින් අමාත්‍යාංශයට සහය වෙයි. බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය තුළ පවත්වාගෙන යන බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයට පවත්වාගෙන යාම සඳහා වන කුලී වියදම් පියවා ගැනීමේ වගකීම 2019 වර්ෂයේ සිට එම ආයතනය වෙත පවරා තිබේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය රාජ්‍ය නිලධාරීන් සහ සාමාන්‍ය ජනතාව සඳහා ද ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පාඨමාලා කිහිපයක් පවත්වන අතරම, ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සහ සහායක කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා අඛණ්ඩව අමාත්‍යාංශයට සහාය වී ඇත.

**අමාත්‍යාංශයට පැවරී ඇති කාර්‍යභාරය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පවතින බාධක**

පාස්කු ඉරුදින එල්ල වූ බෝම්බ ප්‍රහාරය ඉන් පැන නැගුණු බලපෑම් සහිත පරිසරයක වුවද, ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම මෙන්ම විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතා සපුරාලීම මඟින් රජයේ විදේශ ප්‍රතිපත්තිය ප්‍රතිපෝෂණය කිරීමට මෙම අමාත්‍යාංශයට හා එහි විදේශ දූත මණ්ඩල/දූත කාර්යාලවලට 2019 වර්ෂයේ දී හැකිවිය. එනමුදු මෙම කාර්යයේදී උද්ගතවූ යම් හිඩැස් සහ අභියෝග කිහිපයක් ද අමාත්‍යාංශය හඳුනාගෙන ඇත. මේ අතර අමාත්‍යාංශය තුළ විවිධ අංශ අතර සහ සමහර දූත මණ්ඩල හා ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර ද සම්බන්ධීකරණයක් නොමැති වීම, ක්‍රියාකාරකම් සැලසුම් කිරීම පිළිබඳ ගැටලු, මානව සම්පත් ප්‍රමාණවත්භාවය හා ගුණාත්මකභාවය පිළිබඳ ගැටලු, අදාළ විශේෂඥභාවය සඳහා පුහුණුව නොමැති වීම, නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීමේ දැනුම පිළිබඳ ඌනතාවය සහ පර්යේෂණ කිරීම සඳහා හැකියාවක් නොමැති වීම යනාදිය විශේෂයෙන් සඳහන් කළ යුතුය.

මානව සම්පත්වලට අදාල ගැටලු සම්බන්ධයෙන්, ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා විදේශ සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලියේ සිදුවූ ප්‍රමාදයන් හා එහි ප්‍රතිඵලයක් ලෙස යටිකුරු කළමනාකරණ පිරමිඩයක් ඇතිවීම, අමාත්‍යාංශ කාර්ය ධූරාවලියෙහි විෂමතා සහ ආධුනිකයන් මත යැපීම, අඩුපාඩු ලෙස පවතී. ශ්‍රී ලංකා විදේශ සේවය සඳහා සහ සහායක මට්ටමේ නිලධාරීන් බඳවාගැනීමේදී දීර්ඝ කාලයක් ගතවීම මෙම අමාත්‍යාංශයේ සහ දූත මණ්ඩලවල කාර්යයන්ට බරපතල බාධාවක් වී තිබේ.

ශ්‍රී ලංකා විදේශ සේවය සඳහා බඳවාගැනීම වේගවත් කිරීම සිදු කිරීම අතරම එම සේවයට සහාය සපයන සේවාවන් 'සංවෘත සේවා' බවට පත් කිරීම ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය විදේශයන්හි දී ක්‍රියාත්මක කිරීම තවත් ශක්තිමත් කිරීම සඳහා ගත් තීරණාත්මක තීරණ වෙති. මේ අනුව මෙම

අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව බඳවා ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සහ සංවෘත සේවක සංඛ්‍යාවක් බිහිකිරීමේ යෝජනාවත් දැනටමත් ඉදිරිපත් කර ඇත.

2019 දී ක්‍රියාත්මක වූ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන වැනි නව ක්‍රියාකාරකම් සඳහා අරමුදල් වෙන් කරගැනීම පිළිබඳ පුරෝකථනය කිරීමට නොහැකි වීම හේතුවෙන්, මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වඩාත් දුෂ්කර වී ඇති බව පැහැදිළිය. ප්‍රතිඵල පෙන්වීම පදනම් කරගනිමින් දූත මණ්ඩල ප්‍රධානීන් වෙත විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වඩාත් නිදහසක් ලබා දීම පිළිබඳව ද සලකා බැලිය යුතුය.

මෙම දුර්වලතාවයන් සකසා ගැනීමට මෙන්ම දැනට ක්‍රියාත්මක වන ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීම අරමුණුකරගත් වඩාත් අර්ථකාරී මෙන්ම වැඩදායක පියවර මෙම අමාත්‍යාංශය සහ එහි විදේශ දූත මණ්ඩල/දූත කාර්යාල විසින් දිගින් දිගටම තබනු ඇත.

# විදේශ සබඳතා අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය



# මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු අංශය

## මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු අංශය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයුම් අංශයක් වන මහජන රාජ්‍ය තාන්ත්‍රික කටයුතු අංශය, ශ්‍රී ලංකාව පිළිබඳව විදේශයන්හි තොරතුරු ප්‍රචාරය කිරීම සහ එහි ප්‍රතිරූපය ප්‍රක්ෂේපණය කිරීම සඳහා රජය සහ බාහිර ක්‍රියාකාරීන් අතර අතරමැදියෙකු ලෙස ක්‍රියා කරයි. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හා ජාත්‍යන්තර සබඳතා සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ සහ පොදුවේ රට තුළ සිදුවන සිදුවීම් /උත්සව අවස්ථා මෙම අංශය ආවරණය කරයි.

### 1.1 ප්‍රධාන ක්‍රියාකාරකම්

I. ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විදේශයන්හි ප්‍රවර්ධනය කිරීම.

II. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත තොරතුරු / ප්‍රචාරක ද්‍රව්‍ය බෙදා හැරීම සහ මාධ්‍ය නිවේදන / රජයේ ප්‍රකාශ මගින් දූත මණ්ඩල සහ මහජනතාව පුළුල් ලෙස දැනුවත් කිරීම.

III. අමාත්‍යාංශයට අදාළ කරුණු සහ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය / ජාත්‍යන්තර සබඳතා සම්බන්ධ කරුණු පිළිබඳ මාධ්‍ය විමසීම්වලට ප්‍රතිචාර දැක්වීම.

IV. සංචාරක, වෙළඳ හා ආයෝජන පිළිබඳ ප්‍රවර්ධන ද්‍රව්‍ය දූත මණ්ඩල සහ අදාළ පාර්ශ්වකරුවන් වෙත බෙදා හැරීම.

V. දේශීය හා විදේශීය මාධ්‍ය අතර සම්බන්ධීකරණය

VI. අමාත්‍යාංශයේ අදාළ අංශ සමඟ එක්ව, මාධ්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ නිකුත් කිරීම.

VII. මෙරටට පැමිණෙන විදේශීය මාධ්‍යකරුවන් සඳහා මාධ්‍ය අවසරය නිකුත් කිරීම.

VIII. ශ්‍රී ලංකාවේ සිටින විදේශීය වාර්තාකරුවන් පිළිබඳ තොරතුරු ඔවුන්ගේ සහ ශ්‍රී ලංකාව පිළිබඳ සිදුකරන වාර්තා කිරීම් පවත්වාගෙන යාම.

IX. සියලුම දූත මණ්ඩල හා නිලධාරීන් අතර ප්‍රචාරණය කිරීම සඳහා දේශීය මුද්‍රිත මාධ්‍ය හරහා දේශීය පුවත් සම්පිණ්ඩනයක් සම්පාදනය කිරීම සහ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් විදේශ හා දේශීය මාධ්‍යවල පළවන වැදගත් ප්‍රවෘත්ති තෝරා ගෙන, අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කිරීම.

X. සමාජ මාධ්‍ය ගිණුම් (ෆෙස්බුක්, ට්විට්ර්, යූ ටියුබ්, ඉන්ස්ටග්‍රෑම්) ඇතුළු අමාත්‍යාංශ වෙබ් අඩවිය භාෂාත්‍රයෙන්ම පවත්වාගෙන යාම.

XI. ශ්‍රී ලංකාවේ පැවැත්වෙන චිත්‍රපට උළෙල, මාධ්‍ය වැඩමුළු සහ සම්මන්ත්‍රණ ප්‍රවර්ධනය හා ඒවාට අවශ්‍ය පහසුකම් සැලසීම.

XII. දේශීය, විදේශීය මාධ්‍ය සහ සමාජ මාධ්‍යවල ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානිවන අයුරින් පළවන ප්‍රවෘත්ති අධීක්ෂණයකර, ඒවාට එරෙහිව අවශ්‍ය පියවර ගැනීම.

XIII. අමාත්‍යාංශයේ අන්තර්ජාලය හා සම්බන්ධිත සියලුම පද්ධතිවල (වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය ගිණුම්, විද්‍යුත් තැපැල් සහ වෙනත් පද්ධති) ආරක්ෂාව සහතික කිරීම

XIV. අමාත්‍යාංශයේ මාධ්‍ය සම්මන්ත්‍රණ සහ මාධ්‍ය හමු සංවිධානය කිරීම

### 1.2 2019 වර්ෂය තුළ අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වල කාර්යසාධනය

#### I. දේශීය මාධ්‍ය, විදේශ මාධ්‍ය සහ වෙබ් ප්‍රවෘත්ති අධීක්ෂණය කිරීම

අ. අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාව පිළිබඳ වැදගත් ප්‍රවෘත්ති සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ සහ සියලුම දූත මණ්ඩල/කාර්යාලවල සියලුම නිලධාරීන් දෛනිකව දැනුවත් කිරීම

- දූත මණ්ඩල / කාර්යාලවල සියලුම නිලධාරීන් සඳහා (විදේශීය හා දේශීය මාධ්‍යවල පළවූ) දෛනික ප්‍රවෘත්ති සම්පිණ්ඩන වාර්තා 522 ක් සම්පාදනය කරන ලදි. සති අන්තයේ සහ රජයේ නිවාඩු දිනවල ප්‍රවෘත්ති අධීක්ෂණය කිරීම ද ඊට ඇතුළත් වේ.

ආ. දේශීය, විදේශීය මාධ්‍යවල පළවන අමාත්‍යාංශයේ සහ සමස්තයක් ලෙස රටේ ප්‍රතිරූපයට අගතිදායක ප්‍රවෘත්ති පිළිබඳව විදේශ කටයුතු ලේකම්තුමා දෛනිකව දැනුවත් කිරීම

- දෛනිකව පැන නගින ඕනෑම වැදගත් ප්‍රවෘත්තියක් පැය 24 පුරා අධීක්ෂණය කිරීම ද ඊට ඇතුළත් වේ
- අදාල සමාලෝචනය කළ කාල පරාසය ඇතුළත විදේශ කටයුතු ලේකම්තුමා ලේකම් සඳහා දෛනික පුවත් වාර්තා 730 ක් සකස් කිරීම
- මෙම වාර්තාව සති අන්තයේ සහ රජයේ නිවාඩු දිනවල ද සකස් කර ඇත - වසරේ දින 365 පුරා සිදුකෙරෙන ප්‍රවෘත්ති අධීක්ෂණය

ඇ. දේශීය, විදේශීය මාධ්‍ය සහ සමාජ මාධ්‍යවල අමාත්‍යාංශයට අහිතකරවන අයුරින් පළවන ප්‍රවෘත්ති අධීක්ෂණය කර, ඒවාට එරෙහිව අවශ්‍ය පියවර ගැනීම.

- සමාලෝචනය කාල පරාසය ඇතුළත අමාත්‍යාංශය / දූත මණ්ඩල විසින් එවැනි ප්‍රවෘත්ති ප්‍රතික්ෂේප කරමින් විවේදන 10 කට වඩා නිකුත්කර ඇත

## II. මාධ්‍ය නිවේදන, ප්‍රකාශන, දූත මණ්ඩල පිළිබඳ ප්‍රවෘත්ති, දැන්වීම් ආදිය දේශීය, මුද්‍රිත හා මාර්ගගත මාධ්‍ය වෙත සහ විදේශ මාධ්‍ය වාර්තාකරුවන් වෙත ලබා දීම

අ. ගරු ඇමතිතුමා විසින් කරනු ලබන වැදගත් චාරිකා සහ එතුමා සහභාගීවන උත්සව අවස්ථා ආදිය පිළිබඳව අමාත්‍ය අංශයෙන් යොමු කෙරෙන මාධ්‍ය නිවේදන දේශීය මාධ්‍ය ආයතන වෙත යැවීම.

- සමාලෝචනය කළ කාල පරාසය තුළ අමාත්‍යාංශයේ මාධ්‍ය නිවේදන 184ක් ප්‍රකාශයට පත් කිරීම සඳහා මාධ්‍ය වෙත නිකුත් කර ඇත

ආ. සමාලෝචනය කළ කාල පරාසය තුළ විදේශ දූත මණ්ඩලවලින් ලැබුණු මාධ්‍ය නිවේදන අවශ්‍ය වන පරිදි සංස්කරණය කොට, ඒවා ප්‍රකාශයට පත් කිරීම සඳහා දේශීය මාධ්‍ය ආයතන වෙත යැවීම.

එම මාධ්‍ය නිවේදන යෝග්‍ය පරිදි අමාත්‍යාංශයේ වෙබ් අඩවිය, ෆෙස්බුක් සහ ට්විටර් ගිණුම්වල ද පළ කරනු ලැබේ.

- සමාලෝචිත කාල පරාසය තුල දූත මණ්ඩලවලින් එසේ ලැබුණු මාධ්‍ය නිවේදන 1100 ක් ප්‍රකාශයට පත් කිරීම සඳහා යොමු කර ඇත

ඇ. සමාලෝචනය කළ කාල පරාසය තුළ මාධ්‍ය නිවේදන යෝග්‍ය පරිදි අමාත්‍යාංශයේ වෙබ් අඩවිය, ෆෙස්බුක් සහ ට්විටර් ගිණුම්වල ද භාෂාත්‍රයෙන්ම පළ කරනු ලැබේ.

- ෆෙස්බුක් සටහන් - 146
- ට්විටර් සටහන් - 500 ට වැඩි
- වෙබ් අඩවි ප්‍රකාශන - 1284

## III. ශ්‍රී ලංකාවේ විදේශ මාධ්‍ය ආවරණය කටයුතු සඳහා පහසුකම් සැලසීම (ජනමාධ්‍යවේදීන් සහ චිත්‍රපට කාර්ය මණ්ඩලවල ශ්‍රී ලංකා සංචාර සඳහා සහාය වීම)

අ. මෙම කාල පරාසය තුල, ශ්‍රී ලංකාව තුළ සිය මාධ්‍ය ආවරණ කටයුතු සිදු කිරීම පහසු කිරීම සඳහා මාධ්‍යවේදීන්ට මාධ්‍ය අවසර පත්‍ර ලබා දීම සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට මාධ්‍ය අවසර පත් ලිපි නිකුත් කිරීම.

- ශ්‍රී ලංකාවට පැමිණි විදේශීය මාධ්‍යවේදීන් 296 ක් සඳහා මාධ්‍ය අවසර පත් 296 ක් නිකුත් කර ඇත

ආ. ශ්‍රී ලංකාව තුළ සිය මාධ්‍ය ආවරණ කටයුතු සිදු කිරීම පහසු කිරීම සඳහා විදේශ මාධ්‍ය වාර්තාකරුවන්ගේ මාධ්‍ය උපකරණ නිෂ්කාශනය කිරීම සඳහා ඔවුන්ට සහාය වීම
- රේගු නිෂ්කාශනය සඳහා ලිපි 50 කට වැඩි ප්‍රමාණයක් නිකුත් කර ඇත

ඇ. චිත්‍රපට නිෂ්පාදන කාර්ය මණ්ඩල සඳහා ජාතික චිත්‍රපට සංස්ථාවේ / ජාතික වනජීවී දෙපාර්තමේන්තුවේ අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා සහාය වීම
- එසේ පැමිණි මාධ්‍යවේදීන් විසින් වාර්තා චිත්‍රපට සහ චිත්‍රපට 19 ක් නිෂ්පාදනය කරන ලදී

ඈ. විදේශීය මාධ්‍ය ආයතන සහ රේඛීය නියෝජිතායතන අතර සම්බන්ධීකරණය කිරීමේදී කේන්ද්‍රීය ස්ථානය ලෙස ක්‍රියා කිරීම
- ජනමාධ්‍යවේදීන්ගේ මාධ්‍ය ආවරණ කටයුතු සඳහා අදාළ රේඛීය ආයතනවල අනුමැතිය අවස්ථා 19 දී ලබා ගැනීමට කටයුතු කිරීම.

## IV. රාජ්‍ය නායකයන් / විශේෂ ප්‍රභූවරුන් ශ්‍රී ලංකාවේ සිදුකරන සංචාර සඳහා මාධ්‍ය ආවරණය ලබාදීම

අ. රාජ්‍ය නායකයන් / විශේෂ ප්‍රභූවරුන් කැටුව පැමිණෙන මාධ්‍යවේදීන්ට පහසුකම් සැපයීම සහ සහාය ලබා දීම (මාධ්‍ය අවසර පත්‍ර සහ ස්ථාන ප්‍රවේශයට පහසුකම් සැපයීම, මාධ්‍ය උපකරණ රේගු නිෂ්කාශනය සඳහා පහසුකම් සැලසීම)
- මෙම කාල පරාසය තුළ රාජ්‍ය නායකයන් / විශේෂ ප්‍රභූවරුන් 16 කගේ සංචාර සඳහා මාධ්‍ය ආවරණය පහසුකම් සැලසීය.

## V. අමාත්‍යාංශයේ මාධ්‍ය සම්බන්ධතා වැඩි දියුණු කිරීම

අ. දේශීය මුද්‍රිත හා මාර්ගගත මාධ්‍යයන්හි පළ කිරීම සඳහා අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන මාධ්‍ය නිවේදන සංඛ්‍යාව ඉහළ නැංවීම.
- නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන 1800 කට අධික ප්‍රමාණයක් දේශීය මුද්‍රිත සහ මාර්ගගත මාධ්‍යවල පළ වී තිබේ

ආ. මාධ්‍ය විමසීම්වලට එදිනම ප්‍රතිචාර දැක්වීම

ඇ. අමාත්‍යාංශයේ වෙබ් අඩවියට පිවිසෙන්නන් සංඛ්‍යාව වැඩි කිරීම
- මෙම වර්ෂය තුළ වෙබ් අඩවියට පිවිසි සංඛ්‍යාව 200,000 ඉක්මවිය

## VI. දේශීය හා විදේශීය මහජන සම්බන්ධතා ශක්තිමත් කිරීම

අමාත්‍යාංශයේ සමාජ මාධ්‍ය භාවිතා කරන්නන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවීම

අ.ට්විටර් ගිණුමේ අනුගාමිකයන් සහ අමාත්‍යාංශයේ ෆෙස්බුක් ගිණුමේ මනාපය (Likes) පළකරන්නන් සංඛ්‍යාව ඉහළ නැංවීම
- ට්විටර් අනුගාමිකයන්: 23,900 - ෆෙස්බුක් අනුගාමිකයන්: 25,166
- යූ ටියුබ් ග්‍රාහකයින්: 762 - ඉන්ස්ටග්‍රෑම් අනුගාමිකයන්: 238

**VII. අමාත්‍යාංශයේ අන්තර්ජාලය හා සම්බන්ධිත සියලුම පද්ධතිවල ආරක්ෂාව තහවුරු කිරීම (වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය ගිණුම්, විද්‍යුත් තැපැල් ආදිය)**
**අමාත්‍යාංශයේ අන්තර්ජාල පද්ධතියේ තිබූ අවදානම් සහිත තත්ත්ව 100% කින් ඉවත් කිරීම/ අඩු කිරීම**

### 1.3. අතිරේක ක්‍රියාකාරකම්

2019 වර්ෂයේ දී මෙම අංශය විසින් ඉහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් වලට අමතරව, පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කර ඇත:

**I. විදේශ සබඳතා අමාත්‍යාංශයේ නව වෙබ් අඩවිය**
විදේශ සබඳතා අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් හා අධීක්ෂණය මත අමාත්‍යාංශයේ වෙබ් අඩවිය අලුතින් නිර්මාණය කිරීම හා පරිශීලක හිතකරභාවය වර්ධනයට කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් කරමින් පවතී. විශේෂ වෙබ් අඩවි කමිටුවක් විසින් කරන ලද අධ්‍යයනයකින් අනතුරුව නව වෙබ් අඩවිය 2020 ජූලි මාසය වන විට දියත් කිරීමට අපේක්ෂා කෙරේ.

II. **ශ්‍රී ලංකාවේ හදිසි අවස්ථා වලදී නිවැරදි තොරතුරු දූත මණ්ඩල අතර බෙදා හැරීමට පහසුකම් සැලසීම**
පාස්කු ඉරිදා ප්‍රහාරයේදී ශ්‍රී ලංකාවේ විපතට පත් විදේශිකයන් පිළිබඳ තොරතුරු නිවැරදිව ලබා දීමට මෙන්ම අදාළ ආයතන සමඟ සම්බන්ධවෙමින් ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලවලට යාවත්කාලීන තොරතුරු ලබා දීමද රාජ්‍ය තාන්ත්‍රික අංශය විසින් සිදුකරන ලදී. එම කාල සීමාව තුළ පැය 24 පුරා මෙම අංශය ක්‍රියාත්මක වූ පරිද්දෙන්, ශ්‍රී ලංකාවේ ස්වාභාවික විපත් වැනි හදිසි අවස්ථා වලදී විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු ලබා දී සක්‍රීයව ක්‍රියාකර ඇත.

III. **ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් වෙනුවෙන් වූ රාජ්‍ය තාන්ත්‍රිකභාවය මහජන හා මාධ්‍ය සම්බන්ධතා පුහුණු වැඩසටහන සඳහා පහසුකම් සැලසීම**
මහජන රාජ්‍ය තාන්ත්‍රිකභාවය රාජ්‍ය තාන්ත්‍රිකයෙකුගේ වෘත්තීය ජීවිතයේ ප්‍රධාන අංගයක් වන බැවින්, මෙම අංශය විසින් ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ හා මානව සම්පත් සංවර්ධන අංශය සමඟ එක්ව ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ සහයෝගය මත කොළඹ සේවයේ නියුතු ශ්‍රී ලංකා විදේශ සේවයේ සියලුම නිලධාරීන් සඳහා 2019 දෙසැම්බරයේදී මහජන රාජ්‍ය තාන්ත්‍රික පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී. මාධ්‍යවේදීන් හා ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සහ මාධ්‍යවේදීන් අතර සබඳතා ගොඩනඟා ගැනීම අරමුණුකර ගනිමින් එකී පුහුණුව අතරතුර මාධ්‍යවේදීන් සමඟ සුහද හමුවක් ද සංවිධානය කරන ලදී.

**IV. සංස්කෘතික කටයුතු පිළිබඳ රාජ්‍ය තාන්ත්‍රිකභාවය යටතේ රාජ්‍ය තාන්ත්‍රික අංශයේ ක්‍රියාකාරකම්**
සංස්කෘතික කටයුතු පිළිබඳ රාජ්‍ය තාන්ත්‍රිකභාවට අදාළව විදේශ සබඳතා අමාත්‍යාංශය විසින් මුලපුරණ ලද ක්‍රියාකාරකම්වල මෙම අංශය නියැලී සිටී.

සංස්කෘතික කටයුතු පිළිබඳ රාජ්‍ය තාන්ත්‍රික විෂය යටතේ ගැනෙන, ප්‍රවර්ධනාත්මක හා සංස්කෘතික කටයුතු, අධ්‍යාපන හුවමාරු වැඩසටහන්, මාධ්‍ය සහ චිත්‍රපට ව්‍යාපෘති, ශිෂ්‍යත්ව හා පර්යේෂණ ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව සහ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම ආදී රාජ්‍ය තාන්ත්‍රික මුලපිරීම් සඳහා සහාය වීමට මෙම අංශය අපේක්ෂා කරයි.

වර්ෂය තුළ ප්‍රධාන ක්‍රියාකාරකම්:

- නියමිත කාල සීමාව තුළ ශ්‍රී ලංකා රූපවාහිනියේ "එතෙර මෙතෙර" වැඩසටහනේ ඉතාලිය, එක්සත් රාජධානිය, ලන්ඩන්, කුවේට්, කටාර්, ඇමරිකා එක්සත් ජනපදය, කොරියානු ජනරජය සහ බොට්ස්වානා යන රටවල රූගත කිරීම් කටයුතුවල යෙදුනු කාර්ය මණ්ඩලයට පහසුකම් සැලසීම.

1. කුවේට් - 2019 ජනවාරි 01-03
2. බොට්ස්වානා - 2019 පෙබරවාරි 04-10
3. කුවේට් - 2019 අප්‍රේල් 10 - 14
4. ඉතාලිය - 2019අප්‍රේල් 19 - මැයි 05
5. ලන්ඩන් - 2019 ජූලි 05 -16
6. දකුණු කොරියාව - 2019 ජූලි 19 -25
7. ඇමරිකා එක්සත් ජනපදය 2019 ජූලි 20 - අගෝස්තු 07
8. දෝහා - 2019 දෙසැම්බර් 10 -15

- ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ, ලිපිද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය ලබා දීමෙන් විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සංස්කෘතික කටයුතු පිළිබඳ රාජ්‍ය තාන්ත්‍රික අවස්ථා කිහිපයකට සහාය විය.

- 2019 මාර්තු 06 සහ 07 යන දිනවල පැවති කච්චතිවු දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය සඳහා මාධ්‍ය ආවරණයක් ලබා දීමට පැමිණි ඉන්දියානු රූපවාහිනී සේවාවන් 10 ක මාධ්‍යවේදීන්ගේ අදාළ නිෂ්කාශන කටයුතු සඳහා සහාය විය. (දේශීය හා විදේශීය පුවත් ඇතුලත්)

සමාලෝචනය බදුන්වන කාලය තුළදී, දෛනික ප්‍රවෘත්ති එකතුව වාර්තා (විදේශීය හා දේශීය මාධ්‍ය) 522 ක් මෙම අමාත්‍යංශයේ සහ සියලුම දූත මණ්ඩල/ දූත කාර්යාලවල සිටින සියලුම නිලධාරීන් වෙත යවා තිබේ.

# ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ හා මානව සම්පත් සංවර්ධන අංශය

## ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ හා මානව සම්පත් සංවර්ධන අංශය

ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශය හා මානව සම්පත් සංවර්ධන උප අංශය ඒකාබද්ධ කරමින් ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ හා මානව සම්පත් සංවර්ධන අංශය 2019 මැයි මාසයේදී පිහිටුවන ලදී.

මෙම අංශයේ ප්‍රධාන කාර්යය වනුයේ පර්යේෂණ සිදු කිරීම, කාලීන, ගෝලීය වශයෙන් අදාළත්වයක් ඇති කරුණු පිළිබඳ විශ්ලේෂණ ලබාදීම, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ විශේෂිත පැතිකඩවල් පිළිබඳ ප්‍රතිපත්තිමය වශයෙන් පැහැදිලි කිරීම් සකස් කිරීම සහ විදේශ අමාත්‍යාංශයේ දිගුකාලීන උපායමාර්ගික සැලසුම්කරණයට දායක වන පවත්නා ප්‍රතිපත්ති තක්සේරු කිරීමය. ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ සහ විදේශ රටවල පිහිටි දූත මණ්ඩලවල සේවය කිරීම සඳහා තෝරාගන්නා ලද නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා අමාත්‍යාංශය 'ඉගෙනුම් අවකාශයක්' බවට පත්කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම ද මෙම අංශයට පැවරී ඇත.

පහත දැක්වෙන්නේ 2019 වර්ෂය තුළ මෙම අංශය විසින් සිදුකරන ලද කැපී පෙනෙන ක්‍රියාකාරකම්ය.

### 1. අමාත්‍යාංශයේ සහ විදේශ රටවල පිහිටි දූත මණ්ඩලවල වාර්ෂික කාර්ය සැලැස්ම -2019

එක් එක් වර්ෂය අවසානයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන දෙඅංශයෙන්ම ආයතනයේ හා එක් එක් නිලධාරීන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා පදනමක් තිබෙන බව තහවුරුකරමින් ප්‍රමුඛතා, ඉලක්ක හා ප්‍රධාන කාර්ය සාධන දර්ශක පදනම් කරගනිමින් කාර්ය සාධනය ඇගයීමේ ක්‍රියාවලිය සංශෝධනය කිරීමේ අරමුණින් යුතුව ඉලක්ක ලබාදීමේ නව ප්‍රතිපත්තියක් හඳුන්වාදී තිබේ.

### 2. වාර්ෂික කාර්ය සාධනය ඇගයීම -2018

- 2018 අමාත්‍යාංශයේ කාර්ය සාධන ඇගයීම් වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

### 3. බඳවා ගැනීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ විභාග දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව, ප්‍රායෝගික ඇගයීමක් ඇතුළත් කරමින් ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සඳහා සියරට පේරු පදනමින් රාජ්‍ය කළමණාකරණ සහායකයින් සහ පුද්ගලික සහකාර වරුන් බඳවා ගැනීමේ ක්‍රම ප්‍රතිව්‍යුහගත කරන ලදී. මෙම ගැසට් පත්‍ර දෙකම මෙම අංශය විසින් නිකුත් කරන ලද අතර ප්‍රායෝගික පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලිය මානව සම්පත් හා දූත මණ්ඩල කළමණාකරණ අංශය හා සාමාන්‍ය පාලන අංශය සමඟ සහයෝගයෙන් සිදු කෙරේ.

- එසේම, ශ්‍රී ලංකා විදේශ සේවයේ බඳවා ගැනීමේ ක්‍රමය සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදී. ශ්‍රී ලංකා විදේශ සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය අදියර දෙකකින් විභාග දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව පැවැත්වීමට නියමිතව තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා විදේශ සේවා බඳවා ගැනීමේ ක්‍රියාවලිය සංශෝධනය සඳහා අනුමැතිය ඉල්ලා අමාත්‍ය මණ්ඩලයීය සංදේශයක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. කෙසේවෙතත්, අමාත්‍ය මණ්ඩලයේ සිදුවූ වෙනස්වීම් හේතුවෙන් මෙම සංදේශය සම්බන්ධයෙන් තීරණයක් ගෙන නැත.

### 4. ප්‍රතිපත්ති සංවර්ධනය

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ වෘත්තීය ප්‍රගතිය

- සේවා ව්‍යවස්ථාවෙන් නියමකර ඇති පරිදි ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගේ උසස්වීම් සඳහා අවශ්‍යවන පශ්චාත් උපාධි සුදුසුකම් පිළිබඳ සංචිතයක් හඳුනා ගැනීම සඳහා නිර්දේශ ලබාදීමට විදේශ කටයුතු ලේකම් විසින් කමිටුවක් පත්කරන ලදී. මෙම සුදුසුකම්වල ගුණාත්මක භාවය හා අමාත්‍යාංශයේ කාර්ය කටයුතුවලට එහි අදාළත්වය මෙන්ම රාජ්‍යතාන්ත්‍රිකයෙකුගේ කාර්යභාරය ද සැලකිල්ලට ගනිමින් මෙම අංශය විසින් මෙම කටයුත්ත සම්බන්ධීකරණය කරන ලදී.

- අමාත්‍යාංශයේ සිදුකෙරෙමින් පවතින සේවක සංඛ්‍යාව තාර්කිකරණ ක්‍රියාවලිය තුලින් ශ්‍රී ලංකා විදේශ සේවයේ විශේෂ ශ්‍රේණිය ආයතනිකරණය කිරීම සහ තානාපති නිලය විධිමත් කිරීම සඳහා උපදේශන පවත්වන ලදී.

- ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල වලට රියදුරන් සහ කාර්යාල සහායකයින් මාරුකිරීම විධිමත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය යෙදවුම් ලබාදෙන ලදී.

**5. පුහුණුව හා වෘත්තීය සංවර්ධනය**

සලකා බලන කාල සීමාව තුළදී, ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් 35 දෙනෙකු, විදේශ රාජ්‍යතාන්ත්‍රික පුහුණු වැඩසටහන් සඳහා යවන ලදී. ශිෂ්‍යත්ව ක්‍රමයක් යටතේ එක් ජපන් භාෂා පුහුණුවක් ජපාන රජය විසින් ලබාදෙන ලදී.

මෙම කාල සීමාව තුළදී පහත සඳහන් පුහුණු කිරීම් සිදුකරන ලදී.

-මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ මාධ්‍ය සම්බන්ධතා පුහුණු වැඩසටහන, හා ඊට සමගාමීව ශ්‍රී ලාංකික හා විදේශ මාධ්‍යවේදීන් සමඟ ජාලකරණ වැඩසටහනක් අමාත්‍යාංශයේ කණිෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ මාධ්‍ය හැසිරවීම පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා පවත්වන ලදී. නිලධාරීන් 19 දෙනෙකුට මෙම පුහුණුවෙන් ප්‍රතිලාභ ලැබුණි.

- එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනය (UNITAR) සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) සමඟ එක්ව අමාත්‍යාංශයේ රාජ්‍යතාන්ත්‍රික හා නීති නිලධාරීන් සඳහා නායකත්ව හා සාකච්ඡා පුහුණු වැඩසටහනක් පවත්වන ලද අතර ඒ සඳහා රේඛීය නියෝජිතායතන 08 ක මාණ්ඩලික නිලධාරීන් 32 දෙනෙකුට ආරාධනා කරන ලදී. නිලධාරීන් 42 දෙනෙකුට මෙම පුහුණුවෙන් ප්‍රතිලාභ ලැබුණි.

-විදේශ රටවල සේවය සඳහා පිටත්ව යන තානාපතිවරුන් 14 ක් සඳහා සහ මහකොමසාරිස්වරුන් 13ක් සඳහා ජුනි හා අගෝස්තු මාසවලදී ලක්ෂ්මන් කදිර්ගාමර් ක්‍රමෝපායික අධ්‍යයන ආයතනයේ (LKI) වැඩසටහන් දෙකක් සංවිධානය කරන ලදී.

-2019 අප්‍රේල් 3 සිට 6 දක්වා ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන අධ්‍යක්ෂ ජනරාල්වරුන් 13 දෙනෙකු සහ සහකාර අධ්‍යක්ෂවරුන් 19 දෙනෙකු සඳහා (32 දෙනෙකු සඳහා) බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) හා කැනේඩියානු විදේශ සේවා ඇකඩමිය සමඟ එක්ව පවත්වන ලදී.

-2018 දී බඳවාගත් ශ්‍රී ලංකා විදේශ සේවයේ පරිවාස කාලසීමාවේ පසුවන නිලධාරීන්ගේ ඉංග්‍රීසි භාෂාව හා වෘත්තීය කුසලතා වැඩිදියුණු කිරීම සඳහා බ්‍රිතාන්‍ය සභාව විසින් 2019 ජනවාරි සිට මාර්තු දක්වා ඉංග්‍රීසි භාෂා පාඨමාලා පවත්වන ලදී.

-ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගේ පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂා ප්‍රවීණතා විභාගය පැවැත්වීමේ ගැසට් නිවේදනය 2019 දී පළකරන ලදී.

-රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් පුහුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ සහයෝගීතාව පිළිබඳව එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම සඳහා සාකච්ඡා ආරම්භ කරන ලදී.

**ප්‍රතිපත්ති පර්යේෂණ**

මෙම අංශය, ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපාය අධ්‍යයන පිළිබඳ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය (LKI) සමඟ කටයුතු සම්බන්ධීකරණය කරමින් අලුතින් බඳවා ගත් විදේශ සේවා නිලධාරීන්ට එම ආයතනයේ අධීක්ෂණය යටතේ තෝරා ගත් මාතෘකා පිළිබඳ ප්‍රතිපත්ති පර්යේෂණ සිදුකිරීම සඳහා මග පෙන්වීමට සංකල්පයක් සකස් කරන ලදී.

# ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳ හා ත්‍රස්ත මර්දන අංශය

## ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳ හා ත්‍රස්ත මර්දන අංශය

**හැඳින්වීම:**

ජාත්‍යන්තර ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවට අදාළ ආරක්ෂක කටයුතු පිළිබඳව විදේශ සබඳතා අමාත්‍යාංශයේ කේන්ද්‍රස්ථානය වන්නේ ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳ හා ත්‍රස්ත මර්දන අංශයයි. මේ සම්බන්ධයෙන්, ත්‍රස්තවාදය, ප්‍රචණ්ඩ අන්තවාදය සහ මත්ද්‍රව්‍ය ජාවාරම ඇතුළුව ශ්‍රී ලංකාවට එල්ලවන තර්ජන මැඩපැවැත්වීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාව සමඟ සම්බන්ධීකරණය හා සහයෝගයෙන් කටයුතු කිරීමේ දී ආරක්ෂක කටයුතු පිළිබඳව ක්‍රියා කරන දේශීය ආයතනවලට මෙම අංශය සහාය දෙයි.

පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් මීට ඇතුළත් වේ:

- ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට තර්ජනයක් වන ත්‍රස්තවාදී කණ්ඩායම් තහනම් කිරීමේ ලැයිස්තුව නඩත්තු කිරීමට සහාය වීම.
- ආරක්ෂක සහයෝගිතාව පිළිබඳ කටයුතු හා මුලපිරීම්
- විදේශ රටවල් හා ආයතන සමඟ සිදුකළ යුතු සම්බන්ධයෙන් දේශීය ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
- අමාත්‍යාංශයේ අදාළ දේශපාලන අංශ හරහා, සාකච්ඡා කිරීම හා නිරත වීම පුළුල් කිරීම සඳහා වූ න්‍යාය පත්‍රයට දායක වීම.
- දේශීය තත්ත්වයන් පිළිබඳව විදේශවල පිහිටි අපගේ දූත මණ්ඩල යාවත්කාලීනව කිරීම සඳහා දේශීය ආරක්ෂක හා නීති බලධාරීන් සමඟ සම්බන්ධීකරණය වීම.
- ශ්‍රී ලංකාවේ ත්‍රස්ත ක්‍රියාකාරකම්වල යෙදී සිටින ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් විදේශයන් හි පවතින නඩු කටයුතු අධීක්ෂණය කිරීම හා අවශ්‍ය හා ඉල්ලීම් පරිදි සහාය ලබා දීම.
- විදේශවල ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව, දේශීය අධිකාරීන් හට අවශ්‍යව සිටින ශ්‍රී ලාංකිකයන් උද්ධරණය කිරීමේ මෙහෙයුම්වල දී සහාය වීම.
- හඳුනාගත් ක්ෂේත්‍රවල දී ආරක්ෂක හා නීතිය බලාත්මක කිරීමේ බලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා පුහුණු අවස්ථා සුරක්ෂිත කිරීම පිණිස විදේශීය ආයතන හා රටවල් සමඟ සම්බන්ධීකරණය කිරීම.

**2019 තුළ දී සිදුකළ ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- "ත්‍රස්තවාදී කටයුතු මැඩපැවැත්වීමේ අංශය" (CTU) 2008 වසරේ දී ආරම්භ කරන ලදී. පසුගිය වසර කිහිපය තුළ විවිධ කාලසීමාවල දී මෙම ඒකකය වෙනත් විවිධ අංශ යටතේ තබා තිබූ බැවින්, මෙම ඒකකය අභාවිතයට පත්ව, එහි ලිපි ලේඛන විවිධ අංශවල විසිරී ගොස් තිබුණි. 2019 පෙබරවාරි මස සිට මෙම අංශය වෙනම ස්වාධීන අංශයක් ලෙස පුනර්ජීවනය කරන ලද අතර, ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු ද පත් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ බහුවිධ ආරක්ෂක සබඳතා ඒකාබද්ධ කිරීම සඳහා "ජාත්‍යන්තර ආරක්ෂක හා ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ අංශය" ලෙස නම් කිරීමත් සමඟ මෙම අංශයේ විෂය පථය පුළුල් කරන ලදී.
- දේශීය ආරක්ෂක හා බුද්ධි අංශ සමඟ සබඳතා යළි ප්‍රාණවත් කිරීම සඳහා මූලික පියවර ගන්නා ලදී.
- භෞතික වශයෙන්, මෙම අංශය සඳහා වෙනම මැදිරියක් ලබා දී ඇති අතර, ලිපි ලේඛන එහි ගබඩා කොට ඇත.

**ත්‍රස්තවාදය:**

- 2019 අප්‍රේල් මස පාස්කු ඉරුදින එල්ල වූ ප්‍රහාරයෙන් අනතුරුව, මෙම අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා එම තත්ත්වය පිළිබඳ වර්ධනයන් අධීක්ෂණය කිරීම සඳහා මෙහෙයුම් මැදිරියට නායකත්වය දුන්නේය. එහි ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වූයේ ත්‍රස්ත ප්‍රහාරවලින් පීඩාවට පත් විදේශිකයන්ගේ තත්ත්වය නිරීක්ෂණය කිරීමයි.

- මෙම ත්‍රස්ත ප්‍රහාරයෙන් අනතුරුව, දේශසීමා කළමනාකරණය, අනාවරණය කර ගැනීම, නීතිය බලාත්මක කිරීමේ ප්‍රතිචාර වැඩිදියුණු කිරීම, ත්‍රස්තවාදී නඩු විභාග කිරීම සඳහා වූ නීතිමය ප්‍රයත්නවලට සහාය වීම හා නීති ප්‍රතිසංස්කරණ ඇතුළුව, ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ කටයුතුවල විවිධ අංශ සඳහා ආධාර පිරිනැමීම් සමඟ, ද්විපාර්ශ්වික මට්ටමින් සිදුකළ විදේශීය දූත පිරිස්වල සංචාර සම්බන්ධීකරණය කරන ලදී.
- ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ කටයුතු පිළිබඳ රාමුව සහ ශ්‍රී ලංකාවේ නීතිය බලාත්මක කිරීමේ හා බුද්ධි අංශවල ධාරිතාවන් ශක්තිමත් කිරීම සඳහා කලාපීය හා ජාත්‍යන්තර ආයතන සමඟ සංවාද සම්බන්ධීකරණය කිරීම.
- තම රටවල සිටින එල්.ටී.ටී.ඊ ක්‍රියාකාරීන් ලැයිස්තුගත කිරීම අඛණ්ඩව සිදුකිරීම සඳහා එම රටවලට ආඥා හා වාර්තා ලබා දෙන ලදී. එවැනි ලැයිස්තු 03 ක් 2019 දී තවත් කාල සීමාවක් සඳහා දීර්ඝ කරන ලදී.
- ත්‍රස්ත ප්‍රහාරවලට අදාළව, සම්බන්ධයක් ඇති හඳුනාගත් පුද්ගලයන් පිළිබඳව තොරතුරු ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් හට ලබා ගැනීම සඳහා මෙම අංශය සම්බන්ධීකරණය කළේය.
- හිටපු එල්ටීටීඊ සාමාජිකයන්ට එරෙහිව විදේශ රටවල පවතින නඩු කටයුතු සඳහා සහාය වීම පිණිස තොරතුරු ලිපි ලේඛන සැපයීම.
- එල්.ටී.ටී.ඊ ය ආශ්‍රිත හා වෙනත් සංවිධාන විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව දූත මණ්ඩල හරහා ලැබෙන තොරතුරු අධීක්ෂණය කිරීම හා සම්පාදනය කර අදාළ ආයතන සමඟ හුවමාරු කරගැනීම.
- උපදෙස් පරිදි, පාස්කු ඉරුදින එල්ල වූ ප්‍රහාර පිළිබඳ තොරතුරු ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**ප්‍රචණ්ඩ අන්තවාදය:**

- පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් අනතුරුව සහ අයිසිස් (ISIS) සංවිධානයේ දෘෂ්ටිවාදයට එහි ඇති සම්බන්ධතාවය මත, ආගමික අන්තවාදය තුළින් පැනනගින ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහි ගෝලීය ප්‍රයත්නවල කොටසක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඉටුකර ඇති කාර්යභාරය පිළිබිඹු කිරීම සම්බන්ධයෙන්, මෙම අංශයේ විෂය පථය හා සබඳතා පුළුල් වී තිබේ.
- මෙම අංශය, අදාළ එක්සත් ජාතීන්ගේ රෙගුලාසි යටතේ, ත්‍රස්තවාදී කටයුතු හා ප්‍රචණ්ඩ අන්තවාදයට සම්බන්ධ ආයතන හා පුද්ගලයන් දේශීය වශයෙන් තහනම් කිරීම බලාත්මක කිරීම සඳහා පත්කළ ආරක්ෂක අමාත්‍යාංශයේ නායකත්වයෙන් යුතු ක්‍රියාවලි කම්ටුවේ කොටසක් විය.
- ප්‍රචණ්ඩ අන්තවාදය මැඩපැවැත්වීම හා වැළැක්වීම යන ක්ෂේත්‍රවල කටයුතු කිරීම සඳහා ජාත්‍යන්තර සංවිධානවලින් ලැබෙන අරමුදල් සම්බන්ධීකරණය.
- ප්‍රචණ්ඩ අන්තවාදය මැඩපැවැත්වීම පිළිබඳ කටයුතුවල යෙදී සිටින ශ්‍රී ලාංකික නිලධාරීන් සඳහා, ත්‍රස්තවාදය මැඩපැවැත්වීම හා ප්‍රචණ්ඩ අන්තවාදය මැඩපැවැත්වීම පිළිබඳ ගැටලු, මාර්ගගත රැඩිකලීකරණය (online radicalization) යනාදිය සඳහා ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ මෙන්ම, ජාත්‍යන්තර ආයතන හරහා පුහුණුව ලබා දීම සම්බන්ධීකරණය කරන ලදී.

**මත්ද්‍රව්‍යවලට එරෙහිව සටන් කිරීම:**

- මාකඳුරේ මධුෂ් සහ තවත් 30 දෙනෙකු අත්අඩංගුවට ගැනීම අතරතුර දී, එම දූත මණ්ඩලය හා ශ්‍රී ලංකාවේ ආරක්ෂක නියෝජිතායතන අතර තොරතුරු මැනවින් සංසරණය සහතික කරමින්, සම්බන්ධීකරණය සිදු කරන ලද අතර, එමඟින් ඔවුන් 31 දෙනා ආපසු ශ්‍රී ලංකාව පැමිණි පසු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීම සඳහා පහසුකම් සලසන ලදී.
- අදාළ නිලධාරීන් සඳහා, මත්ද්‍රව්‍යවලට එරෙහිව සටන් කිරීම සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණු කටයුතු සම්බන්ධීකරණය කිරීම.

# එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ මානව හිමිකම් අංශය

## එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ මානව හිමිකම් අංශය

නිව්යෝර්ක්, ජිනීවා, වියානා, පැරිස්, රෝමය, නයිරෝබි, බැංකොක් සහ හේග් යන රටවල ශ්‍රී ලංකාවේ ස්ථිර දූත මණ්ඩල / මහ කොමසාරිස් / තානාපති කාර්යාල වලට අදාළ බහුපාර්ශ්වීය කාර්ය භාරයන් මෙම අංශයේ විෂය පථයට අයත් වේ. අදාළ රේඛීය අමාත්‍යාංශ, ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන, ජාත්‍යන්තර සහ දේශීය මානව හිමිකම් කණ්ඩායම් සහ සිවිල් සමාජය සහ මාධ්‍ය සමඟ කරන කටයුතු මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලබයි. 2019 වර්ෂය තුළ මෙම අංශයේ ප්‍රධාන වැඩ කටයුතු අතර පහත සඳහන් කාර්යයන් ඇතුළත් විය:

1. **එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 74 වන සැසිවාරය නිව්යෝක්, 2019 සැප්තැම්බර් 24 - සැප්තැම්බර් 30**

   2019 සැප්තැම්බර් මාසයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 74 වන සැසිවාරයේ ඉහළ පෙළේ හමුවෙ දී විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සහභාගීත්වය උදෙසා අමාත්‍යාංශය හරවත් මෙන්ම ප්‍රවර්ධනාත්මක කාර්යභාරයක් ඉටු කළේය. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා 2019 සැප්තැම්බර් 30 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය ඇමතූ අතර ඉහළ පෙළේ හමුව අතරතුර එම දූත පිරිස එක්සත් ජාතීන්ගේ ඉහළ පෙළේ නිලධාරීන් කිහිප දෙනෙකු හමුවී අදහස් හුවමාරු කරගත්හ.

2. **සංහිඳියාව සහ මානව හිමිකම්:**

**එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය:**

- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30/1 (2015), 34/1 (2017) යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහතික කිරීම සඳහා, රජය විසින් ගනු ලැබූ ක්‍රියාදාමය සම්බන්ධීකරණය හා ඊට සහාය ලබා දීම සඳහාත් මෙම අංශය සෙසු පාර්ශවකරුවන් සමඟ එක්ව අඛණ්ඩව කටයුතු කළේය.

  ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වැඩිදියුණු කිරීම, ප්‍රතිසන්ධානය සහ යහපාලනය යන අංශවල ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය නිරන්තරයෙන් යාවත්කාලීන කර විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල ඇතුළු අදාළ පාර්ශ්වකරුවන් දැනුම්වත් කරන ලදී.

- ජිනීවාහි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 2019 සැසිවාරය; 40 වන සැසිය (2019 පෙබරවාරි 25 - මාර්තු 22), 41 වන සැසිය (24 ජූනි - 12 ජූලි 2019) සහ 42 වන සැසිය (2019 සැප්තැම්බර් 09-27) යන සැසිවලට ශ්‍රී ලංකාව සහභාගී වීම සඳහා හරවත් මෙන්ම ප්‍රවර්ධනාත්මක කාර්යභාරයක් ඉටු කරන ලදී.

  - ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තාව ඉදිරිපත් කිරීමේ අවස්ථාවට සහභාගීවීම සඳහා ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා 2018 මාර්තු 18 සිට 24 දක්වා ජිනීවා නුවරට පැමිණියේය. එම දූත පිරිසට අයත්වූ සෙසු පිරිස අතර ආචාර්ය සුරේන් රාගවන් මැතිතුමා (උතුරු පළාත් ගරු ආණ්ඩුකාර) ආචාර්ය. සරත් අමුණුගම මැතිතුමා (ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී), රවිනාථ ආර්යසිංහ මැතිතුමා (විදේශ කටයුතු ලේකම්), නෙරින්පුල්ලේ මැතිතුමා (නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් / නීතිපති දෙපාර්තමේන්තුව) සහ ජිනීවාහි නිත්‍ය දූත මණ්ඩල නිලධාරීන් අයත් විය.
  - ශ්‍රී ලංකාව සම අනුග්‍රාහකයා ලෙස අත්සන් කළ "ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම" කෙටුම්පත් යෝජනාව 2019 මාර්තු 21 දින ජන්ද විමසීමකින් තොරව සම්මත විය. යෝජනාව සම්මත කර ගැනීමේදී ගරු විදේශ කටයුතු ඇමතිතුමා විසින් ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශය සිදු කරන ලදී.
  - 2019 මාර්තු 20 වන දින පැවති 40 වන සැසිවාරයේදී, මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් විසින් 2019 මාර්තු 20 වන දින න්‍යාය පත්‍ර අයිතමය 2 යටතේ ශ්‍රී ලංකාව

පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාව අදාළ රට වශයෙන් ඊට මැදිහත් විය.

- එම සංචාරය අතරතුර ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා දූත පිරිස මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්, ජිනීවාහි එක්සත් ජාතීන්ගේ කාර්යාලය භාර නියෝජ්‍ය මහලේකම් මයිකල් මොලර් මහතා, තානාපතිවරුන් සහ එක්සත් ජාතීන්ගේ ප්‍රධානීන් සහ නියෝජ්‍ය ප්‍රධානීන් සහ ජිනීවා නුවර පිහිටි අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන ප්‍රධානීන් හමුවිය.
- 2019 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව මැදිහත්වීම් 22 ක් සිදු කරමින් සභාව සමඟ සම්බන්ධව ක්‍රියාකළ අතර "ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම" යන යෝජනාව ඇතුළු තේමාත්මක යෝජනා 28 කට සහාය විය. මේ අනුව, විවිධ රටවල් විසින් යෝජනා කරන ලද ඒකාබද්ධ ප්‍රකාශ 06 කට ශ්‍රී ලංකාව සහාය දැක්වීය.

- ඊට අමතරව, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ පහත දැක්වෙන සැසිවාරයන්හිදී ශ්‍රී ලංකාව වෙනුවෙන් පහත සඳහන් ප්‍රකාශ / මැදිහත්වීම් සිදු කරන ලදී:
  - 2018 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ සිදුකළ සිය සංචාරයේදී මානව හිමිකම්, විශේෂයෙන් සමාජ, ආර්ථික හා සංස්කෘතික අයිතිවාසිකම් පූර්ණ ලෙස බුක්ති විඳීම සඳහා විදේශ ණය සහ සියලු රාජයයන්හි අදාළ අනෙකුත් ජාත්‍යන්තර මූල්‍ය බැඳීම් පිළිබඳ IE වාර්තාව පිළිබඳ 2019 පෙබරවාරි 28 වන දින මානව හිමිකම් කවුන්සිලයේ 40 වන සැසියේදී අදාළ රට වශයෙන් කරන ලද ප්‍රකාශය.
  - පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් පසු ශ්‍රී ලංකාවේ ඇතිවූ තත්ත්වය පිළිබඳව මහ කොමසාරිස්වරියගේ වාචික යාවත්කාලීන කිරීම් වලදී මෙන්ම අනෙකුත් රාජ්‍යයන් විසින් මානව හිමිකම් කවුන්සිලයේ 41 වන න්‍යාය පත්‍රය 2 යටතේ වන පොදු විවාදයේදී මතුකළ කරුණුවලට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා දූත පිරිස කරුණු පැහැදිලි කරමින් / ප්‍රතිචාර දක්වමින් මැදිහත්වීම් කරන ලදී.
  - ප්‍රධාන කණ්ඩායම (එක්සත් රාජධානිය, ජර්මනිය, කැනඩාව, උතුරු මැසිඩෝනියාව සහ මොන්ටිනිග්‍රෝ) වෙනුවෙන් එක්සත් රාජධානිය විසින් ශ්‍රී ලංකාව පිළිබඳව කරන ලද ප්‍රකාශයකට ප්‍රතිචාර දක්වමින් මානව හිමිකම් කවුන්සිලයේ 42 වන සැසියේ න්‍යාය පත්‍රයේ අංක 2 යටතේ වන පොදු විවාදයේ දී සිදුකළ ප්‍රකාශය.
  - 2019 සැප්තැම්බර් 11 වන දින පේරු සහ ශ්‍රී ලංකාවේ සිදුකළ සංචාරයන්හිදී බලාත්කාරයෙන් හෝ ස්වේච්ඡාවෙන් අතුරුදහන් වීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද පසු විපරම් වාර්තාව සම්බන්දයෙන් වූ ඉදිරිපත් කිරීමෙන් පසුව කරන ලද මැදිහත් වීම්.
- 2018 සමාජ සංසදයේ සභාපති ලෙස ශ්‍රී ලංකාව රජය විසින් නිගමන සහ නිර්දේශ ඇතුළත් වාර්තාව 2019 මාර්තු 13 දින ඉදිරිපත් කරන ලදී.

**එක්සත් ජාතීන්ගේ විශේෂ ක්‍රියා පටිපාටි පිළිබඳ බලධාරීන්:**

- 2015 දෙසැම්බර් මාසයේ සිට විශේෂ ක්‍රියා පටිපාටි බලධාරීන් සඳහා ශ්‍රී ලංකා රජය විසින් කරන ලද නිත්‍ය ආරාධනයට සමගාමීව, වධහිංසා වැළැක්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අනු කමිටුව (2019 අප්‍රේල් 2 -12), සාමකාමීව රැස්වීමේ සහ එකතුව කටයුතු කිරීමේ නිදහස සඳහා අයිතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු (2019 ජූලි 15 - 26), ආගමික හෝ විශ්වාස ඇදහීමේ නිදහස පිළිබඳ විශේෂ වාර්තාකරු (2019 අගෝස්තු 15 -26) ආදීන් මෙරටේ සංචාරයන්හි නිරත වූ අතර එම සංචාරය පහසු කිරීම සඳහා ස්වාධීන විශේෂඥයන් පිළිබඳ මහලේකම් කාර්යාලය, එක්සත් ජාතීන්ගේ සඳහා වූ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය/ජිනීවා හා අදාළ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය විසින් ඉටු කරන ලදී.

**3. එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ අරමුදල:**

- 2019 වසරේ දී මෙම අංශය පහත සඳහන් ක්‍රියාකාරකම් තුළින් එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ අරමුදල සමඟ සම්බන්ධව කටයුතු කළේය:

  - 2019 මාර්තු මස සමස්ත අයවැය වැඩි කිරීමක් / බලපෑමක් නොමැතිව (පිරිවැය රහිත දිගුවක් ලෙස) සාමය ගොඩනැංවීමේ ප්‍රමුඛතා සැලැස්ම (PPP) 2019 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කිරීම.
  - 2019 අප්‍රේල් 15 සිට 17 දක්වා නිව්යෝක් නුවර පැවති එක්සත් ජාතීන්ගේ සාම සාධක කොමිෂන් සභා රැස්වීම සඳහා ගරු මුදල් ඇමති මංගල සමරවීර මැතිතුමා සහ ඔහුගේ දූත පිරිසේ සහභාගිත්වය වෙනුවෙන් මෙම අංශය විසින් අවශ්‍ය පහසුකම් සලසන ලදී.
  - පැවති මුදල් අමාත්‍යාංශයේ සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම සභාපතිත්වයෙන් 2019 සැප්තැම්බර් 23 වන දින මුදල් අමාත්‍යාංශයේ පැවති 10 වන සාමය ගොඩනැගීමේ මණ්ඩල රැස්වීමේදී මෙම අංශය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරන ලදී.

**4. විශ්ව වාර සමාලෝචනය (UPR) :**

- ශ්‍රී ලංකාව පිළිවෙලින් 2019 ජනවාරි, 2019 මැයි සහ 2019 නොවැම්බර් මාසවල පිනීවාහි පැවති විශ්ව ආවර්තිතා සමාලෝචනයෙහි ක්‍රියාකාරී කණ්ඩායමේ 32, 33 සහ 34 වන සැසිවාරවලදී රටවල් 17 ක් සඳහා මැදිහත්වීම් ලබා දෙමින් අනෙකුත් රටවල විශ්ව වාර සමාලෝචන සමඟ සම්බන්ධව කටයුතු කළේය.

**5. නිරායුධකරණය:**

බහුපාර්ශ්වීය නිරායුධකරණ ප්‍රයත්නයන් සඳහා ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන කැපවීමට අනුව යමින්, මෙම අංශය අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ අඛණ්ඩව කටයුතු කරමින්, 2019 වර්ෂයේ පැවති පහත සඳහන් රැස්වීම්වල ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සම්බන්ධයෙන් මෙන්ම එහිදී නිරායුධකරණය පිළිබඳ රැස්වීම් සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය පැහැදිලි කිරීමටද කටයුතු කළේය:

- 2019 මාර්තු 25 සිට 29 දක්වා ස්විට්සර්ලන්තයේ පිනීවා නුවර පැවති මාරාන්තික ස්වයංක්‍රිය ආයුධ පද්ධති ක්ෂේත්‍රයේ නැගී එන තාක්ෂණයන් පිළිබඳව සාම්ප්‍රදායික ආයුධ පිළිබඳ සම්මුතියේ ඉහළ ක්‍රියාකාරී පාර්ශ්වයන්ගේ රජයේ විශේෂඥයින්ගේ කණ්ඩායම් රැස්වීම
- 2019 පෙබරවාරි 5 සිට 8 දක්වා බෝම්බ පිළිබඳ ජාතික ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන්ගේ සහ විශේෂඥයන්ගේ ජාත්‍යන්තර රැස්වීම සහ 2019 මැයි 22 සිට 24 දක්වා ස්විට්සර්ලන්තයේ පිනීවා නුවරදී පැවැත් වූ පුද්ගල නාශක බෝම්බ තහනම් කිරීමේ සම්මුතියේ අන්තර් සැසිවාර රැස්වීම.
- 2019 සැප්තැම්බර් 2 සිට 4 දක්වා ස්විට්සර්ලන්තයේ පිනීවා නුවරදී ශ්‍රී ලංකාවේ සභාපතිත්වය යටතේ පැවැති පොකුරු ආයුධ පිළිබඳ සම්මුතිය සඳහා වන රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ 9 වන රැස්වීම.
- 2019 නොවැම්බර් 25 සිට 29 දක්වා නෝර්වේ ඔස්ලෝ නුවර පැවති පුද්ගල නාශක බෝම්බ තහනම් කිරීමේ සම්මුතියේ සිව්වන සමාලෝචන සමුළුව.
- 2019 නොවැම්බර් 25 සිට 29 දක්වා හේග් හි පැවති රසායනික අවි සම්මුතිය සඳහා වූ රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ සමුළුවේ 24 වන සැසිය.
- තායිලන්තයේ බැංකොක්හි පැවැත්වීමට නියමිත 2020 න්‍යෂ්ටික අවි ව්‍යාප්ත නොකිරීම පිළිබඳ සම්මුතියේ සමාලෝචන සමුළුවට සූදානම් වීම සඳහා එකී සම්මුතියට අයත් ආසියා-පැසිෆික් රාජ්‍යයන් සඳහා ආසියා-පැසිෆික් කලාපීය රැස්වීම. 2019 දෙසැම්බර් 3 -4

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 74 වන සැසිවාරයේ නිරායුධකරණය සහ ජාත්‍යන්තර ආරක්ෂාව සම්බන්ධව කටයුතු කරන පළමු කමිටුව යටතේ ශ්‍රී ලංකාවේ සහභාගිත්වය මෙම අංශය විසින්

සම්බන්ධීකරණය කරන ලද අතර, 2019 ඔක්තෝබර් 7 වන දින ඒ පිළිබඳව පැවති විවාදය අතරතුර විශේෂ ප්‍රකාශයක් ඉදිරිපත් කළ විදේශ ලේකම්වරයා නිරායුධකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ඉහළ පෙළේ නියෝජිතයා වන ඉසුමි නකාමිට්සු සමඟ ද සාකච්ඡා පැවැත්විය. තේමාත්මක විවාදවලදී ශ්‍රී ලංකාව ද ප්‍රකාශ සිදු කළ අතර ඊජිප්තුව සමඟ එක්ව "අභ්‍යවකාශයේ අවි තරඟය වැළැක්වීම" පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කිරීමට ද පෙරමුණ ගත් අතර එය නොවැම්බර් 5 වන දින වාර්තාගත ඡන්ද 175 කින් සම්මත විය. කාරක සභාව විසින් යෝජනා 61 ක් සම්මත කරන ලද අතර, ඉන් 56 ක් සඳහා ශ්‍රී ලංකාව සහාය පළකළ අතර යෝජනා 20 ක් සඳහා සම අනුග්‍රහය දැක්විය.

නිරායුධකරණ සම්මුතීන්ට අදාළ ජාතික බැඳීම් ක්‍රියාවට නැංවීමට ද මෙම අංශය පහසුකම් සලසයි. 2019 දී ශ්‍රී ලංකාව විසින් පොකුරු ආයුධ පිළිබඳ සම්මුතිය හා පුද්ගල නාශක බෝම්බ තහනම් කිරීමේ සම්මුතිය යටතේ වන විනිවිදභාවය පිළිබඳ වාර්තා සහ සාම්ප්‍රදායික ආයුධ පිළිබඳ සම්මුතියේ සංශෝධිත II වන කෙටුම්පත යටතේ ශ්‍රී ලංකාවේ ජාතික වාර්තාව ඉදිරිපත් කරන ලදී. 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලද පොකුරු අවි පිළිබඳ සම්මුතිය බලාත්මක කිරීමට දේශීයව නීති සම්පාදනය කිරීම සඳහා 2019 මාර්තු 19 වන දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ද ලබා ගන්නා ලදී. පොකුරු අවි පිළිබඳ සම්මුතිය ජාතික නීතය තුළ ස්ථාපිත කිරීම සඳහා අන්තර්ජාතික රතුකුරුස කමිටුව සමඟ එක්ව මෙම අංශය විසින් 2019 ජනවාරි 31 සියලු රේඛීය නියෝජිත ආයතනවල සහභාගීත්වයෙන් තාක්ෂණික වැඩමුළුවක් සංවිධානය කරන ලදී. රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස 2019 දී පවත්වන ලද රැස්වීම්වලට සහභාගී වූ මෙම අංශය විසින් හේග් හි රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා අවශ්‍ය සහය ද ලබා දෙන ලදී.

### 6. එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස්:

- දේශපාලන රැකවරණ පතන්නන් සහ සරණාගතයින් ලියාපදිංචි කිරීම සහ සරණාගතයින් නැවත පදිංචි කරවීම සහ ඒ හා සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් (UNHCR) සහ අදාළ රජයේ ආයතන අතර මෙම අංශය අඛණ්ඩව සහයෝගයෙන් කටයුතු කළේය.
- 2019 දෙසැම්බර් 31 වන විට ශ්‍රී ලංකාවේ දේශපාලන රැකවරණ පතන්නන් ලෙස පුද්ගලයින් 361 කට අදාළව නඩු 221 ක් සහ සරණාගතයින් ලෙස පුද්ගලයින් 1,045කට අදාළව නඩු 522 ක් වාර්තා වී තිබේ. සරණාගතයින් සහ දේශපාලන රැකවරණ පතන්නන් ලෙස ශ්‍රී ලංකාවට වැඩිම පිරිසක් පකිස්ථානයෙන් පැමිණේ. (2019 දෙසැම්බර් 31 වන විට දේශපාලන රැකවරණ පතන්නන් 283 ක් වාර්තා වූ අතර 2019 දෙසැම්බර් 30 වන විට වාර්තා වූ සරණාගතයින් සංඛ්‍යාව 800ක් විය)
- 2019 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය යටතේ සරණාගතයින් 160 ක් (නඩු 81 ක්) පිටත්ව ගොස් ඇත (නඩු 60 ක් / පුද්ගලයන් 100 ක් ඇමරිකා එක්සත් ජනපදයට, සහ නඩු 05 ක් / පුද්ගලයින් 22 ක් කැනඩාවට, නඩු 05 ක් / පුද්ගලයන් 16 ක් ස්වීඩනයට, සහ නඩු 02 ක් / පුද්ගලයින් 02 ක් නෙදර්ලන්තයට සහ නඩු 04 ක් / පුද්ගලයින් 15 ක් එක්සත් රාජධානියට, නඩු 03 ක් / පුද්ගලයින් 03 ක් ෆින්ලන්තයට සහ නඩු 02 ක් / පුද්ගලයින් 02 ක් ප්‍රංශයට)
- 2019 අප්‍රේල් මාසයේ පාස්කු ප්‍රහාරයෙන් ඉක්බිතිව දේශපාලන රැකවරණ පතන්නන් සහ සරණාගතයින් 112 දෙනෙකු නැවත වවුනියාවේ පූන්තම් නැවත පදිංචි කරවීමේ ස්ථානයේ ස්ථානගත කිරීම සඳහා මෙම අංශය විසින් එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය වෙත අවශ්‍ය පහසුකම් සපයන ලදී. රජයේ අනෙකුත් ආයතන සමඟ සහයෝගයෙන් යුතුව කටයුතු කරමින් මෙම අංශය විසින් දේශපාලන රැකවරණ පතන්නන් සහ සරණාගතයින්ගේ පූන්තෝට්ටම් නැවත පදිංචි කරවීමේ මධ්‍යස්ථානයේ සිට කොළඹ සහ මීගමුවේ ඔවුන්ගේ කුලී නවාතැන් ස්ථාන වෙත නැවත යොමු කිරීම් 12 ක් සම්බන්ධීකරණය කරන ලදී.

**7. අපේක්ෂකත්වයන්:**

- ඡන්ද විමසීම් / අපේක්ෂකත්වය සඳහා ශ්‍රී ලංකාවේ ඡන්දය ලබාදීමෙන් බහුපාර්ශ්වික ආයතන ව්‍යුහයන් තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සෙසු සාමාජික රටවල් වලට සහය දැක්වීමෙන් එම රටවල් සමඟ වන ශ්‍රී ලංකාවේ සබඳතා වැඩි දියුණු කිරීමට මෙම අංශය දායක විය.
- එක්සත් ජාතීන්ගේ ආයතන සඳහා පැවැත්වෙන ඡන්ද විමසීම්වලදී ශ්‍රී ලංකාව ඡන්දය ප්‍රකාශකර ඇති රටාව පිළිබඳ දත්ත සමුදායක් මෙම අංශය විසින් පවත්වාගෙන යනු ලැබේ.
- 2019 වසරේ පැවති පහත දැක්වෙන ඡන්ද විමසීම්වලදී ශ්‍රී ලංකාවේ ඡන්දය ප්‍රකාශකිරීමට අදාළ කටයුතු මෙම අංශය විසින් මෙහෙයවන ලදී.

i. ජාත්‍යන්තර පුනර්ජනනීය බලශක්ති ඒජන්සියේ (IRENA) අධ්‍යක්ෂ ජනරාල් තනතුර
ii. අපරාධ විනිශ්චය සභාවේ අනුශාය යාන්ත්‍රණය සඳහා විනිසුරුවන්ගේ ලැයිස්තුව
iii. ආසියාවේ නැව් වලට එරෙහිව මුහුදු කොල්ලකෑම් සහ සන්නද්ධ මංකොල්ලකෑම් මැඩපැවැත්වීමේ කලාපීය සහයෝගිතා ගිවිසුමේ 5 වන විධායක අධ්‍යක්ෂ ධුරය (ReCAAP)
iv. ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) බාහිර විගණක තනතුර
v. විවෘත රාජ්‍ය හවුල්කාරිත්ව මෙහෙයුම් කමිටුව (OGP SC)
vi. එක්සත් ජාතීන්ගේ ජනාවාස වැඩසටහනේ විධායක සභාව
vii. සියලුම සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කමිටුව (CMW)
viii. ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) අධ්‍යක්ෂ ජනරාල්
ix. යුනෙස්කෝවේ අන්තර් රාජ්‍ය සාගර විද්‍යා කොමිෂන් සභාවේ විධායක සභාව (IOC)
x. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ (UNSC) ස්ථිර නොවන ආසනය
xi. එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලය (ECOSOC)
xii. බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම පිළිබඳ කමිටුව (CED)
xiii. සංක්‍රමණ සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයේ (IOM) නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර
xiv. වාර්ගික වෙනස්කම් කිරීම තුරන් කිරීමේ කමිටුව (CERD)
xv. එක්සත් ජාතීන්ගේ 74 වන මහ සභාවේ සභාපති
xvi. ලෝක රේගු සංවිධානයේ (WCO) මැතිවරණය
xvii. ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ (WMO) මැතිවරණ
xviii. වධහිංසාවට එරෙහි කමිටුව (CAT)
xix. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ (IAEA) මැතිවරණය
xx. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයේ (UNWTO) මැතිවරණය
xxi. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ කවුන්සිලය (ICAO)
xxii. ජාත්‍යන්තර ප්‍රමිතිකරණ සංවිධානයේ කවුන්සිලය (ISO)
xxiii. එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ (UNIDO) බාහිර විගණක තනතුර
xxiv. පරිපාලන හා අයවැය ගටලු පිළිබඳ උපදේශක කමිටුව (ACABQ)
xxv. ජාත්‍යන්තර අපරාධ පොලිස් සංවිධානයේ (INTERPOL) ඡන්ද විමිසීම්
xxvi. යුනෙස්කෝ ලෝක උරුම කමිටුව (WHC)
xxvii. මානව හිමිකම් කවුන්සිලය (HRC)
xxviii. යුනෙස්කෝවේ විධායක මණ්ඩලය
xxix. යුනෙස්කෝ පරිපාලිත සංවිධානවල මැතිවරණ
xxx. එක්සත් ජාතීන්ගේ විගණන මණ්ඩලය (UNBOA)
xxxi. ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ කවුන්සිලය (IMO)
xxxii. රතු කුරුස හා රතු ක්‍රෙසන්ට් ව්‍යාපාරයේ (ICRC) ජාත්‍යන්තර සමුළුවේ ස්ථාවර කොමිෂන් සභාවේ ඡන්ද විමසීම

## 8. සමාජ-ආර්ථික ක්ෂේත්‍රයේ බහුපාර්ශ්වීය මැදිහත්වීම

මෙම අංශය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මෙන්ම එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනවලට අදාළ සමාජ ආර්ථික මූලාරම්භයන් හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කළේය.

එක්සත් ජාතීන්ගේ ආර්ථික, මූල්‍ය හා දේශගුණික විපර්යාස පිළිබඳ දෙවන කමිටුව සහ එක්සත් ජාතීන්ගේ නියෝජිත කාර්යාලය/නිව්යෝක් අතර සම්බන්ධීකරණය කටයුතු මෙම අංශය විසින් ඉටු කරන ලදී. මෙම කමිටුව විසින් යෝජනා 52 ක් සහ තීරණ 3 ක් සම්මත කරන ලදී. ජී-77 සහ තනි තනි රටවල් විසින් සභාගත කරන ලද මෙම යෝජනා අතරින් 50 ක් සඳහා ශ්‍රී ලංකාව සම අනුග්‍රහකත්වය දැක්වීය.

තවද, ඊට අදාළ උත්සව අවස්ථා හා සංසදවලට ශ්‍රී ලංකා රජයේ නියෝජිත පිරිසට සහභාගී වීම සම්බන්ධයෙන් පහසුකම් සැලසූ මෙම අංශය පහත ලැයිස්තුගත කර ඇති ඉදිරියේදී සිදු කිරීමට නියමිත චාරිකා සම්බන්ධයෙන් අදාළ සම්බන්ධීකරණ කාර්යයන් ද ඉටු කළේය.

### නොබැඳි ව්‍යාපාරය (NAM)

### 2019 ඔක්තෝබර් 25-26 අසර්බයිජානයේ බකු නුවර පැවති,නොබැඳි ව්‍යාපාරයේ රාජ්‍ය නායකයින්ගේ සහ රජයේ ප්‍රධානීන්ගේ 18 වන සමුළුව

- ‘‘සමකාලීන ගෝලීය අභියෝගයන්ට සාමූහික හා ප්‍රමාණවත් ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම සඳහා වන බැන්දුං මූලධර්ම ආරක්ෂා කිරීම’’ යන තේමාව යටතේ 2019 ඔක්තෝබර් 25 සිට 26 දක්වා අසර්බයිජානයේ බකු නුවර පැවති නොබැඳි ව්‍යාපාරයේ රාජ්‍ය නායකයින්ගේ සහ රජයේ ප්‍රධානීන්ගේ 18 වන සමුළුවට සහභාගී වූ ශ්‍රී ලංකා දූත පිරිසේ නායකත්වය ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා ඉසිළීය.
- 2019 ඔක්තෝබර් 25 සිට 26 දක්වා පැවති නොබැඳි ව්‍යාපාරයේ අසර්බයිජාන නව සභාපතිත්වය යටතේ නොබැඳි සමුළුවට සූදානම් වීමේ අමාත්‍ය රැස්වීමට ගරු අමාත්‍යවරයා සහභාගී විය. එකී පෙර සූදානම් කිරීමේ අමාත්‍ය රැස්වීමට පසුව ඔක්තෝබර් 21 සිට 22 දක්වා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම පැවති අතර මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමේදී ශ්‍රී ලංකා දූත පිරිසට නායකත්වය දුන්නේ අධ්‍යක්ෂ ජනරාල් / එක්සත් ජාතීන් හා මානව සම්පත් විසිනි.

### එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන UNDP

- ශ්‍රී ලාංකික සම්භවයක් ඇති එක්සත් ජාතීන්ගේ ඉහළම නිලධාරිනියක ලෙස දැනට සේවය කරන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ආසියාවේ කලාපීය කාර්යාංශයේ සහකාර ලේකම් සහ සාමාන්‍යාධිකාරී කනි විග්නරාජා මහත්මිය සහ ගරු විදේශ කටයුතු ඇමතිතුමා අතර හමුවක් මෙම අංශය විසින් සංවිධානය කරන ලදී.

### යුනෙස්කෝව UNESCO

- නොවැම්බර් 12 සිට 27 දක්වා ප්‍රංශයේ පැරිස් නුවර පැවති එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා හා සංස්කෘතික සංවිධානයේ (යුනෙස්කෝ) 40 වන සැසිවාරයට සහභාගී වූ ශ්‍රී ලංකා දූත පිරිසට පහසුකම් සැපයීම මෙම අංශය විසින් සිදු කරන ලද අතර ඊට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ ප්‍රධානියා ලෙස ගරු තානාපති සහ යුනෙස්කෝවේ නිත්‍ය නියෝජිත දයා එස්. පැල්පොල මැතිතුමා කටයුතු කළේය.
- 2019 දෙසැම්බර් 09-14 දක්වා කොලොම්බියාවේ බොගෝටා හි දී පැවැත්වූ අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා වන අන්තර් රාජ්‍ය කමිටුවේ 14 වන සැසිවාරය

ප්‍රංශ තානාපති කාර්යාලය සහ බුද්ධසාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව මෙම අංශය සම්බන්ධීකරණය කළ අතර ඒ සඳහා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සහභාගීත්වය වෙනුවෙන් පහසුකම් සැලසීම ද සිදු කරන ලදී. ශ්‍රී ලංකාව 2018 - 2022 කාලය සඳහා අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා වන අන්තර් රාජ්‍ය කමිටුවේ සාමාජිකයෙක් ලෙස කටයුතු කරයි.

**ලෝක සෞඛ්‍ය සංවිධානය WHO**

- ලෝක සෞඛ්‍ය සංවිධානයේ පහත සඳහන් වැදගත් අවස්ථා සඳහා ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සහභාගීත්වය වෙනුවෙන් පහසුකම් සැලසීම සිදු කරන ලදී:
    - 2019 ජනවාරි 24 සිට පෙබරවාරි 1 දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවරදී පැවැති ලෝක සෞඛ්‍ය සංවිධානයේ විධායක මණ්ඩලයේ 144 වන සැසිය
    - 2019 මැයි 20 සිට 28 දක්වා ජිනීවා නුවරදී පැවැති 72 වන ලෝක සෞඛ්‍ය සමුළුව
    - 2020 මැයි 29 සිට 30 දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පැවති ලෝක සෞඛ්‍ය සංවිධානයේ විධායක මණ්ඩලයේ 145 වන සැසිය

**ජාත්‍යන්තර කම්කරු සංවිධානය ILO**

- 2019 ජුනි 10 සිට 21 දක්වා පැවති ජාත්‍යන්තර කම්කරු සමුළුවේ 108 වන සැසිවාරයේදී කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, ගරු රවීන්ද්‍ර සමරවීර මැතිතුමා ශ්‍රී ලංකා දූත පිරිසට නායකත්වය ලබාදුනි.
- ශ්‍රී ලංකාව විසින් 2019 අප්‍රේල් 10 වන දින 2014 (P29) දරන බලහත්කාර කම්කරු සම්මුතියට කෙටුම්පත අපරානුමත කරන ලදී.

**ජාත්‍යන්තර සන්නිවේදන සංගමය ITU**

- තොරතුරු සංගමයේ ජගත් සමුළුව (WSIS) 2019 අප්‍රේල් 8 -12 දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවරදී පැවැත්විණි. මෙම අවස්ථාවට ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍ය ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා සහභාගී විය.

**වෙළඳ හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව UNCTAD**

- සංවර්ධනය සඳහා විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 22 වන සැසිය 2019 මැයි 13 සිට 17 දක්වා ජිනීවා නුවරදී පැවැත්විණි. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු. සුජීව සේනසිංහ මැතිතුමා මෙම අවස්ථාවට සහභාගී විය.
- වෙළඳ හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේ තාක්ෂණ හා සැපයුම් අංශයේ අධ්‍යක්ෂිකා ශාමිකා සිරිමාන්න මහත්මිය ශ්‍රී ලංකාවට පැමිණ විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපාන මැතිතුමා සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා හා කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධනය හා වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා, හමුවී සාකච්ඡා පැවිත්වීය.

**එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල UNFPA**

- ''ICPD 25: පොරොන්දුව කඩිනම් කිරීම'' පිළිබඳ
- නයිරෝබි සමුළුව 2019 නොවැම්බර් 12 සිට 14 දක්වා කෙන්යාවේ නයිරෝබි හිදී පැවැත්විණි. මෙම අංශය එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ කොළඹ කාර්යාලය සහ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව එම කටයුතු සම්බන්ධීකරණය කළේය.

## 9. තිරසර සංවර්ධන ඉලක්ක (SDGs)

- මෙම අංශය එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන හා රේඛීය අමාත්‍යාංශ සමඟ එක්ව තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කළේය.
- එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සාමාජීය කවුන්සිලයේ ඉහළ මට්ටමේ දේශපාලන සංසදය 2019 ජූලි 9 සිට 18 දක්වා නිව්යෝක් නුවරදී ''ජනතාව සවිබල ගැන්වීම සහ සියලු දෙනාගේ සමානාත්මතාවය සහතික කිරීම'' යන තේමාව යටතේ පවත්වන ලදී. ජනාධිපති ලේකම් උදය ආර් එන් සෙනෙවිත්ත්න මහතා සහ තිරසර සංවර්ධන කවුන්සිලයේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය එම්.එම්.එස්.බී. යාලේගම මහතා මෙම සමුළුවට දූත මණ්ඩල නිලධාරීන් සමඟ සහභාගී විය.

## 10. ත්‍රස්තවාදය මැඩලීම පිළිබඳ සහයෝගීතාව

රටේ ප්‍රමුඛතාව සැලකිල්ලට ගනිමින් මෙම අංශය එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ ත්‍රස්ත විරෝධී මර්දන සහයෝගිතා ක්‍රියාමාර්ග රැසකට පහසුකම් සපයයි.

- 2019 මැයි මාසයේදී වැඩිදියුණු කළ මගී තොරතුරු (ඒපීඅයි) පද්ධතිය පිළිබඳ ධාරිතා වර්ධන වැඩසටහනක් සඳහා ජාතික නියෝජිතායතන සහ එක්සත් ජාතීන්ගේ ත්‍රස්ත මර්දන නියෝජිත ආයතන අතර සංවාදයට පහසුකම් සලසන ලදී. පැමිණි නියෝජිත පිරිසට ත්‍රස්තවාදී මර්දන කමිටුවේ විධායක අධ්‍යක්ෂවරුන්, මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය, එක්සත් ජාතීන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කාර්යාලය, එක්සත් ජාතීන්ගේ ත්‍රස්තවාදී සංචරන මර්දන වැඩසටහන මෙන්ම ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය සහ ඉන්ටර්පෝල් ආයතනයේ නියෝජිතයන් ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන රැසක් නියෝජනය කරමින් පැමිණි පිරිස් ඇතුළත් විය.
- 2019 ජූලි මාසයේදී නයිරෝබි නුවර එක්සත් ජාතීන්ගේ ත්‍රස්තවාදයට එරෙහි කාර්යාලය සහ කෙන්යානු රජය විසින් සංවිධානය කරන ලද "ත්‍රස්තවාදයට එරෙහි සහ ත්‍රස්තවාදයට අනුබලදෙන ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම පිළිබඳ අප්‍රිකානු කලාපීය ඉහළ මට්ටමේ සම්මේලනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය. මෙම අවස්ථාවට ජාතික බුද්ධි අංශ ප්‍රධානී සහ නාවික බුද්ධි අංශයේ වැඩබලන අධ්‍යක්ෂවරයා සහභාගී විය.
- පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව 2019 අප්‍රේල් 30 වන දින එක්සත් ජාතීන්ගේ ජගත් ශිෂ්ටාචාර සන්ධානයේ එක්සත් ජාතීන්ගේ ඉහළ නියෝජිත මිගෙල් ඒන්ජල් මොරටිනෝස් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර මොරටිනෝස් මහතා රජයේ සහ ආගමික නායකයින් හමුවී මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් සිය ශෝකය පළ කළේය.

## 11. එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්

වසර 50 කට වැඩි කාලයක් තිස්සේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකාව දායක වී ඇති අතර, සාම සාධක මෙහෙයුම්වලට අදාළ ඉහළම ප්‍රමිතීන් පවත්වාගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සාම සාධක භටයින් සඳහා හැකි උපරිම පුහුණුව හා ඇගයීම සහතික කිරීම සඳහා දැඩි ලෙස කැපවී සිටී. මෙම කැපවීමට අනුකූලව ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ සමීපව කටයුතු කරන අතර ශ්‍රී ලංකා නිලධාරීන්ට එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්වල අඛණ්ඩව සේවය කිරීමට අවස්ථාව ලබා දීම සහතික කරයි.

2019 දී ශ්‍රී ලංකා නිලධාරීන් සඳහා තනතුරු ලබා ගැනීමේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ශ්‍රී ලංකාවේ නියෝජනයන් සිදු කිරීම සම්බන්ධීකරණය මෙම අංශය විසින් ඉටු කරන ලද අතර ශ්‍රී ලංකා හමුදා භටයන් එක්සත් ජාතීන්ගේ දූත මණ්ඩලවලට යෙදවීමට එරෙහිව එල්ල වී ඇති චෝදනාවන්ට එරෙහිව එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක සහ එක්සත් ජාතීන්ගේ සාම

මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මහලේකම්වරයා සමඟ අතිගරු ජනාධිපතිතුමා සහ ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා මෙන්ම විදේශ කටයුතු ලේකම්තුමා ද ඇතුළු ඉහළපෙළේ මැදිහත්ව සිදු කිරීමට ද කටයුතු කරනු ලැබේ. එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ මෙන්ම ක්ෂේත්‍ර දූත මණ්ඩලවල ශ්‍රී ලාංකික නිලධාරීන්ගේ නියෝජනය පුළුල් කිරීම පිණිස එක්සත් ජාතීන්ගේ සාම මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමඟ කෙරෙන සංවාදය අඛණ්ඩව පවත්වා ගෙන යනු ඇත.

**12. මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC)**

මත්ද්‍රව්‍ය ජාවාරම, අපරාධ වැළැක්වීම, දූෂණයට එරෙහිව කටයුතු කිරීම, සමුද්‍රීය සහයෝගීතාව වැනි ක්ෂේත්‍රවල එක්සත් ජාතීන්ගේ සංවිධානයේ රැස්වීම්වලට රේඛීය නියෝජිතායතන සහභාගී වීමට පහසුකම් සැලසීම මෙම අංශය විසින් සිදු කරන ලදී. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන ගිවිසුම්වල විධිවිධානවලට ශ්‍රී ලංකාවේ අනුකූලතාව අධීක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම පිණිස ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලයේ නියෝජිත පිරිසක් 2019 මාර්තු 25 සිට 28 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක් සිදු කළේය. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලයේ දූත පිරිස අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ , ආරක්ෂක, විදේශ කටයුතු, හා සෞඛ්‍ය සේවා යන අමාත්‍යාංශ සහ පොලිස්පති, ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලය, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, රේගු, ආනයන හා අපනයන පාලන යන දෙපාර්තමේන්තු සහ බන්ධනාගාර හා සුරාබදු බලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීය. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලයේ දූත පිරිස විසින් සිය සොයාගැනීම් සමාලෝචනය කර, සිය නිගමන සහ නිර්දේශ 2019 ජූලි මාසයේදී ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා වෙත පිළිගන්වන ලදී.

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලයේ මෙහෙයුම් අධ්‍යක්ෂ මිවා කැටෝ මහත්මිය 2019 නොවැම්බර් 28 සිට 30 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක් ආරම්භ කළාය. සිය සංචාරයේදී කැටෝ මහත්මිය කලාපයේ මත්ද්‍රව්‍ය ජාවාරම සහ ත්‍රස්තවාදය මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකාව සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය අතර සහයෝගීතාව කෙරෙහි අවධානය යොමු කරමින් ගරු විදේශ සබඳතා අමාත්‍ය, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සහ අනෙකුත් රේඛීය ආයතන සමඟ සාකච්ඡා පැවැත්වූවාය.

**13. බහුපාර්ශ්වීය සංසදවල දී ශ්‍රී ලංකා රජයේ නියෝජනය සඳහා අක්ත පත්‍ර නිකුත් කිරීම:**

- 2019 2019 දී මෙම අංශය විසින් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ රැස්වීම්වලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට නියෝජිතයින්ට අවස්ථාව ලබා දීම සඳහා අක්ත පත්‍ර 55 ක් සකස් කරන ලදී.

**14. වීසා බලපත්‍ර පහසුකම් සැපයීම:**

- 2019 වසර පුරා ශ්‍රී ලංකාවේ පැවැත්වූ සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම්, සම්මන්ත්‍රණ සඳහා වීසා බලපත්‍ර නිකුත් කිරීම සඳහා පහසුකම් සැපයන ලදී. 2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා නිකුත්කළ වීසා බලපත්‍ර සංඛ්‍යාව 1132 කි.

**15. එක්සත් ජාතීන්ගේ සංවිධානයට සහ ඒ ආශ්‍රිත ආයතනවලට ශ්‍රී ලංකාවේ දායකත්වය:**

- මෙම සංවිධාන, සමුළු සහ සාම සාධක දූත මණ්ඩලවල ශ්‍රී ලංකාවේ සාමාජිකත්වය සඳහා එක්සත් ජාතීන්ගේ සහ එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනවලට ගෙවිය යුතු ගෙවීම් සැකසීම හා සම්බන්ධීකරණය මෙම අංශය විසින් සිදු කරන ලදී.

# සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස පිළිබඳ අංශය

## සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස පිළිබඳ අංශය

සාගර කටයුතු, පරිසරය හා දේශගුණික විපර්යාසවලට අදාළ ශ්‍රී ලංකාවේ කටයුතු ; ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම, සම්බන්ධීකරණය හා ගැලපීම, සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශයට (OA, E & CC අංශය) පැවරී තිබේ. වෙනත් රටවල් හා සංවිධාන සහ සමඟ හා ශ්‍රී ලංකාවේ අදාළ බලධාරීන් සමඟ ශ්‍රී ලංකාව අන්‍යොන්‍ය වශයෙන් සිදුකරන සමස්ත කටයුතු වර්ධනය කිරීම සඳහා මෙම අංශය ව්‍යාපෘති හා සම්බන්ධීකරණය කරයි. සාගර කටයුතු හා දේශගුණික විපර්යාසවලට අදාළ සංවාද/සමුළු/වැඩමුළු සඳහා ශ්‍රී ලංකාව වේදිකාවක් ලෙස ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාව සඳහා සාගර ප්‍රතිපත්තියක් සැකසීමෙහිලා සහායවීම මෙම අංශයේ විෂය පථයට අයත් වෙයි.

වෙනත් රජයේ අමාත්‍යාංශ, රේඛීය නියෝජිතායතන සහ පාර්ශ්වකරුවන් සමඟ සමීපව කටයුතු කරන මෙම අංශය ජාත්‍යන්තර, කලාපීය හා ජාතික මට්ටම්වලින් අමාත්‍යාංශය නියෝජනය කරන අතර වගකීම්වලට බැඳී සිටිමින්, ජාත්‍යන්තර, පාරිසරික වැඩකටයුතු වලින් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ අත්වන බව සහතික කරලීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී හා අවශ්‍ය පරිදි වෙනත් අදාළ රජයේ නියෝජිතායතන සමඟ සමීපව කටයුතු සම්බන්ධීකරණය කරයි. අදාළ රේඛීය නියෝජිතායතන සමඟ කටයුතු සම්බන්ධීකරණය කරමින් ජාතික අවශ්‍යතාවලට ගලපමින් ශ්‍රී ලංකාවට අවශ්‍ය තාක්ෂණික හා වෙනත් ආකාරයේ සහාය හඳුනාගැනීමට සහ ඒවා ලබාගැනීමට ඇති ඉඩප්‍රස්ථා පිළිබඳ ක්‍රියාකාරීව සොයාබලයි. එසේ කිරීමේදී, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සැළකිලිමත් විය යුතු කරුණු පිළිබඳව අනලස්ව සලකා බලයි. තවද සමුද්‍රීය විද්‍යාත්මක පර්යේෂණ (MSR) සඳහා, ශ්‍රී ලංකාවට අයත් මුහුදට, අනන්‍යතා ආර්ථික කලාපයට (EEZ) සහ මහද්වීපික තටකයට ඇතුල්වන විදේශීය යාත්‍රා සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලියට පහසුකම් සැපයීමේ සැපයීමේ වගකීමද මෙම අංශය සතුවෙයි.

පොදුරාජ්‍ය මණ්ඩලයීය නිල් ප්‍රඥප්තිය (CBC) සහ ශ්‍රී ලංකාව නමින් මෙහෙයවනු ලබන පරිසර පද්ධති හා ජීවනෝපාය පිළිබඳ පොදුරාජ්‍ය මණ්ඩලයීය නිල් ප්‍රඥප්ති ක්‍රියාකාරී කණ්ඩායම සඳහා කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාකරනුයේ ද මෙම අංශයයි. මෙම සමුද්‍රීය පරිසර පද්ධති හා ජීවනෝපාය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම ඉතා කෙටි කාලයක් තුළදී ඉතාමත්ම ක්‍රියාකාරී හා ඵලදායී ක්‍රියාකාරී කණ්ඩායමක් බවට පත්කිරීමේ ශ්‍රී ලංකාවේ නායකත්ව භූමිකාව ඉටුකිරීම සඳහා මෙම අංශය කටයුතු කරමින් සිටියි.

මීට අමතරව, සමුද්‍රීය සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පිළිබඳ ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමයේ (IORA) ක්‍රියාකාරී කණ්ඩායම සඳහා කේන්ද්‍රස්ථානය වන්නේ ද මෙම අංශයයි.

සමාලෝචිත වර්ෂය තුළ මෙම අංශය විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් පහත දැක්වෙන පරිදි වේ:

### ද්විපාර්ශ්වික සබඳතා

1. ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර සමුද්‍රීය කටයුතු පිළිබඳ පළමු සංවාදය සැප්තැම්බර් 16 වන දින (සැප්තැම්බර් 17 වන දින පැවති ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ තුන්වන වටයේ සාකච්ඡාවන්ට පෙර) කොළඹදී පැවැත්වූ අතර මෙම අංශය එම සංවාදයට අදාළ සංවිධානය කටයුතු ඉටු කළේය. සමුද්‍රීය සුරක්ෂිතතාව සහ ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා එක්ව වැඩ කිරීමේ වැදගත්කම සහ නීල ආර්ථිකය පිළිබඳ මූලාරම්භයන් සම්බන්ධයෙන් සහයෝගයෙන් යුතුව කටයුතු කිරීමේ වැදගත්කම මෙම සංවාදය මඟින් අවධාරණය කෙරුණි. සමුද්‍රීය සුරක්ෂිතතාව සහ ආරක්ෂාව, සංක්‍රමණික අපරාධ, ආරක්ෂාව සහ නීල ආර්ථිකය ආදී ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඉන්දීය සාගර වටද්දර රටවල සංගමය සහ ඉන්දීය සාගර නාවික සාකච්ඡා සමුළුව ආදී කලාපීය වශයෙන් ඇතිකරගත් සම්මුතීන් ශක්තිමත් කිරීම සඳහා වන ප්‍රායෝගික මූලාරම්භයන් ක්‍රියාවට නැංවීමේ ක්‍රමවේදයන් පිළිබඳව සොයා බලා කටයුතු කිරීමට දෙරටේම නියෝජිතයෝ මෙහිදී පොරොන්දු වූහ.

2. 2019 ඔක්තෝම්බර් මාසයේදී ජපානය සමඟ 4 වන සාගර සංවාදය පැවැත්වීම පිළිබඳව ජපාන තානාපති කාර්යාලයේ නිලධාරීන් සමඟ මූලික සාකච්ඡා පැවැත්වීය. (නමුත් එය කල් දමනු ලැබීය).

3. විශේෂයෙන් චීනය, ජපානය, දකුණු කොරියාව, නෝර්වේ, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව සහ ප්‍රංශය යන තානාපති කාර්යාල සමඟ සාගර කටයුතු පිළිබඳ ද්විපාර්ශ්වික සහයෝගිතාව සම්බන්ධයෙන් සමීපව කටයුතු කරන ලදී.

**බහුපාර්ශ්වික සම්බන්ධතා**

1. සමුද්‍ර විද්‍යා පර්යේෂණ පිළිබඳ මාර්ගෝපදේශ හා රෙගුලාසි කෙටුම්පත්කොට අවසන් කිරීම සඳහා සහ සාගර විද්‍යාත්මක පර්යේෂණ කමිටුව පිහිටුවීම සඳහා 2019 මැයි මාසයේ දී පැවැත්වූ පාර්ශ්වකරුවන්ගේ වැඩමුළුව:

   - ශ්‍රී ලංකාවට අයත් මුහුදු තීරයේ, සුවිශේෂී ආර්ථික කලාපයේ සහ ශ්‍රී ලංකාවේ මහද්වීපික තටාකයේ සමුද්‍ර විද්‍යා පර්යේෂණ පැවැත්වීම සඳහා විදේශ රාජ්‍යයන් / නිසි බලය සහිත ජාත්‍යන්තර සංවිධාන විසින් ඉදිරිපත් කරන අයදුම්පත් සලකා බැලීම සහ අනුමැතිය ලබා දීම මෙම වැඩමුළුවේ අරමුණ විය. සමුද්‍ර විද්‍යා පර්යේෂණ සඳහා මාර්ගෝපදේශ සහ නීර්ණය විෂයයන් වසර අවසන් වන විට කෙටුම්පත් කර අවසන් කරන ලදී.

2. ඉන්දීය සාගර වටද්දර රටවල සංගමයේ සමුද්‍රාරක්ෂක හා ආරක්ෂක ක්‍රියාකාරී කණ්ඩායමේ පළමු රැස්වීම, අගෝස්තු 7-9, කොළඹ:

   - ඉන්දීය සාගර වටද්දර රටවල සංගමයේ සමුද්‍රාරක්ෂක හා ආරක්ෂක ක්‍රියාකාරී කණ්ඩායම සම්බන්ධයෙන් අමාත්‍යාංශය තුළ ප්‍රධාන කාර්යභාරය ඉටුකරන අංශය සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශය වේ.
   - ඒ අනුව, ඉන්දීය සාගර නිම්වළලු සංගමයේ විශේෂ අරමුදල, ඕස්ට්‍රේලියානු රජය සහ (එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ සංවිධානය, යන ආයතනවල සහයෝගය මත මෙම අංශය විසින් ඉන්දීය සාගර වටද්දර රටවල සංගමයේ සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ ප්‍රමුඛ රාජ්‍යය ලෙස 2017 - 2021 කාල සීමාව සඳහා ඉන්දීය සාගර වටද්දර රටවල සංගමයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සිය වගකීම් පූර්ණ ලෙස ඉටුකරමින් මෙම රැස්වීම සංවිධානය කරන ලදී. සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මූලික වශයෙන් වසර දෙකක කාලයක් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද සාකච්ඡා සඳහා නායකත්වය දෙන ලදී.
   - ප්‍රධාන රැස්වීම පැවැත්වීමට පෙර ‘‘ඉන්දියන් සාගරයේ සුරක්ෂිතතාව හා ආරක්ෂාව සම්බන්ධයෙන් මතුවන ගැටලු’’ පිළිබඳව කමිටු සාකච්ඡාවක් පැවැත්විණි. මෙම රැස්වීමට ඉන්දීය සාගර වටද්දර රටවල සංගමයේ සාමාජික රටවල් 16 එනම් (ඉරානය, ඕස්ට්‍රේලියාව, බංග්ලාදේශය, ඉන්දියාව, ඉන්දුනීසියාව, කෙන්යාව, මැඩගස්කරය, මැලේසියාව, මාලදිවයින, මුරුසිය, ඕමානය, සීෂෙල්ස්, සෝමාලියාව, දකුණු අප්‍රිකාව, ශ්‍රී ලංකාව සහ ටැන්සානියාව) නියෝජනය කරමින් සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ කටයුතු කරන නිලධාරීන් සහ විශේෂඥයින් සහභාගී වූහ.

3. පොදුරාජ්‍ය මණ්ඩලීය නීල ප්‍රඥප්තිය යටතේ සමුද්‍ර පරිසර පද්ධති හා ජීවනෝපාය ක්‍රියාකාරී කණ්ඩායමේ පළමු රැස්වීම, 2020 ඔක්තෝබර් 07 - 09, මීගමුව, ශ්‍රී ලංකාව
   - මේ සම්බන්ධයෙන් පවතින තත්ත්වය හඳුනා ගැනීම, ලෝකයේ විවිධ ප්‍රදේශවල ඇති ශක්තීන් හා දුර්වලතා සංසන්දනය කරමින්, සහභාගී වන රටවල වෙරළබඩ ප්‍රජාවන්ගේ ජීවනෝපායන් සඳහා සහාය වන තිරසාර කඩොලාන පරිසර පද්ධති සාක්ෂාත් කර ගැනීමේ හිඩැස් හඳුනාගැනීම සඳහා මෙම අංශය විසින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ සහයෝගය ද ඇතිව ඉහත රැස්වීම සංවිධානය කරන ලදී. පොදු ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම මෙහි අරමුණ විය. මෙම රැස්වීම පම්බල ප්‍රදේශයේ කඩොලාන කෞතුකාගාරය, කඩොලාන තවාන් සහ කඩොලාන නැවත

රෝපණය කරන ලද ස්ථාන නැරඹීමේ ක්ෂේත්‍ර චාරිකාවකින් ද සමන්විත වූ අතර කඩොලාන පැළ සිටුවීමේ කටයුතුවල ද ඊට සහභාගී වුවන් නිරත විය.

- මෙම රැස්වීමට ඕස්ට්‍රේලියාවේ පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලය සහ පොදුරාජ්‍ය මණ්ඩලීය විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ සංවිධානය සිය සහයෝගය ලබා දී තිබුණි.

4. ඉන්දියානු සාගර වටදඩර රටවල සංවිධානයේ සාමාජිකරටවල් සඳහා සාගර විද්‍යාව හා පරිසරය පිළිබඳ ඉන්දියානු සාගර වටදඩර රටවල සංගම් විශිෂ්ටතා මධ්‍යස්ථානය
    - ශ්‍රී ලංකාව වර්ෂ 2010 දී පමණ ඉන්දියානු සාගර වටදඩර රටවල සංගමයේ රටවල් සඳහා සාගර විද්‍යාව හා පරිසරය පිළිබඳ ඉන්දියානු සාගර වටදඩර රටවල සංගමයේ විශිෂ්ටතා මධ්‍යස්ථානයක් පිහිටුවීමට එකඟ වී ඇති අතර පසුව ඒ සඳහා 2014 දී කැබිනට් සංදේශයක් ඉදිරිපත් කර ඇත: විශිෂ්ටතා මධ්‍යස්ථානය පිහිටුවීම පහසු කිරීම සඳහා රේඛීය නියෝජිත ආයතන සමඟ වැඩමුළු කිහිපයක් සංවිධානය කිරීමට මෙම අංශය ආර්ථික කටයුතු අංශයට සහාය වී ඇත. කෙසේවෙතත්, අදාළ වගකීම් පැවරුණු දේශීය ආයතන ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට සමත් වී නොමැත.

**සහසම්බන්ධවූ / සහාය දක්වන ලද වෙනත් මූලාරම්භණයන්**

1. 2019 ඔක්තෝබර් 23-24 දිනවල ශ්‍රී ලංකාවේ කොළඹ දී තිරසාර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ගෝලීය ව්‍යාපාරය දියත් කිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට මඟපෙන්වීම ලබාදෙන ලදී. මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව ජාත්‍යන්තර නයිට්‍රජන් කළමනාකරණ පද්ධතිය, එක්සත් ජාතීන්ගේ පරිසර පද්ධතිය සහ එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) සමඟ සහයෝගයෙන් කටයුතු කළ අතර ඊට අදාළව ඉහළ මට්ටමේ සැසිවාරයක් සහ විද්‍යාව - ප්‍රතිපත්ති - දේශපාලනය පිළිබඳ සංවාදයක් කොළඹදී පැවැත්විය.
2. මෙම සමුළුවේ කුඨප්‍රාත්තිය ලෙස 2030 වන විට පරිසරයට නයිට්‍රජන් අධික ලෙස මුදා හැරීමේ ක්‍රියාවලීන් අඩකින් අඩුකිරීම මගින් නයිට්‍රජන් අධික ලෙස භාවිත කිරීමේ ගැටලුව විසඳාලීම සඳහා කොළඹ ප්‍රකාශය සම්මත කිරීම ද සිදු විය.
3. පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම්වරියගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර කෙටි දැනුම්දීමක් මත 2019 නොවැම්බර් 4 වන දින ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධානයක් සමඟ එක්ව පෞද්ගලික අංශයේ සිමෙන්ති නිෂ්පාදන සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන කඩොලාන නැවත සිටුවීමේ ස්ථානයක් නැරඹීමට ඇය කැටුවයාම මෙම අංශය විසින් සංවිධානය කරන ලදී.
4. පොදුරාජ්‍ය මණ්ඩලීය නීල ප්‍රඥප්තියේ ක්‍රියාකාරී කණ්ඩායම්වලට සම්බන්ධ වීමෙන් පොදුරාජ්‍ය මණ්ඩලීය නීල ප්‍රඥප්තියේ මුලපිරීම් වලින් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අදාළ රේඛීය ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම. ඒ අනුව 2019 දී ශ්‍රී ලංකාව කොරල් පර, සමුද්‍ර ආරක්ෂිත ප්‍රදේශ, ජලජීවී වගාව සහ නිල් ආර්ථිකය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම් සමඟ සම්බන්ධ විය. (ශ්‍රී ලංකාව කඩොලාන පරිසර පද්ධති සහ ජීවනෝපාය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ සහ පොදුරාජ්‍ය මණ්ඩලීය පිරිසිදු සාගර සන්ධානයට - ප්ලාස්ටික් සමුද්‍ර අපද්‍රව්‍ය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම, 2018 දී එක්විය).
5. ජාත්‍යන්තර සූර්ය සන්ධානයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සමඟ සමීපව කටයුතු කිරීම.
6. ජාත්‍යන්තර මුහුදු පත්ල අධිකාරිය සඳහා වගකීම් දැරීමට/ප්‍රමුඛ ආයතනය ලෙස ක්‍රියා කිරීමට ශ්‍රී ලංකා රජයේ ආයතනයක් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම.
7. හරිත දේශගුණික අරමුදල, කෘෂි වන වගා පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය සහ ජාත්‍යන්තර කොරල් පරයේ මූලාරම්භණය සහ පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය අතර යෝජිත ගිවිසුම්වලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම. ශ්‍රී ලංකාව විසින් 2018 දෙසැම්බර් මාසයේදී ගෝලීය හරිත වර්ධන ආයතනයේ සාමාජිකත්වය ලබා ගැනීමේ අභිප්‍රාය ලිපියක් ඉදිරිපත් කරන ලදී. 2019 ජනවාරි මාසයේදී එහි සාමාජිකත්වය ලබා දී ඇත. මෙම ක්‍රියාවලිය සඳහා අංශය පහසුකම් සැලසීය.

8. ආසියාවේ නැව් වලට එරෙහිව මුහුදු කොල්ලකෑම් සහ සන්නද්ධ මංකොල්ලකෑම් වලට එරෙහි කලාපීය සහයෝගිතා ගිවිසුමට අදාළ කටයුතු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට සහ ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායට සහාය වීම.
9. සාගර, පරිසරය සහ දේශගුණය ආශ්‍රිත ගැටලු පිළිබඳ විවිධ ද්විපාර්ශ්වික එකඟතාවන්ට අවශ්‍ය යෙදවුම් සැපයීම.
10. පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලය සහ ද්විපාර්ශ්වික හවුල්කරුවන් හරහා ව්‍යාපෘති සම්බන්ධ මූල්‍යකරණය / තාක්ෂණික සහයෝගිතාව / පරිසරය ආශ්‍රිත (සාගර ආශ්‍රිත හා දේශගුණික විපර්යාස ඇතුළුව) මූලාරම්භයන් සඳහා අවස්ථා පිළිබඳව දැනුවත් කිරීම.
11. මහවැලි සංවර්ධන අමාත්‍යාංශය සහ ඕස්ට්‍රේලියාවේ CSIRO ආයතනය විසින් 2019 ඔක්තෝබර් 3 - 4 දක්වා සංවිධානය කරන ලද ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා නිල් කාබන් තාක්ෂණික විෂය පථය පිළිබඳ වැඩමුළුවේ එක් සැසියක සම කැඳවුම්කරුවෙකු ලෙස සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශයේ අධ්‍යක්ෂ ජනරාල් තුමා කටයුතු කළේය.

**වැඩමුළු / සම්මන්ත්‍රණ / සමුළු**

1. **පොදුරාජ්‍ය මණ්ඩලීය නිල් ප්‍රඥප්තිය සියලුම පුරෝගාමීන්ගේ රැස්වීම, ලන්ඩන්, 2019 ජූනි: 17-21**

   සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා මෙම රැස්වීම සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත පිරිසට නායකත්වය ලබාදුන් අතර කඩොලාන සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අත්කරගත් ප්‍රගතිය පිළිබඳවත්, කඩොලාන පරිසර පද්ධති සහ ජීවනෝපාය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ ඉදිරි කටයුතු පිළිබඳවත් රැස්වීමට කරුණු ඉදිරිපත් කළේය. මෙම රැස්වීමේදී පරිත්‍යාගශීලීන් සමඟ ජාලගත වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇලන් කොරල් ඇට්ලස් ආයතනය සහ පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය අතර සහයෝගිතාවය ඇති කරගන්නා ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව අවට කොරල් පරවල සිදුවන වෙනස්කම් නිතිපතා අධීක්ෂණය කිරීම සඳහා නුදුරු අනාගතයේ දී ශ්‍රී ලංකාවට චන්ද්‍රිකා දත්ත සඳහා නොමිලේ ප්‍රවේශය ලබා ගැනීම පිණිස අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමේ ක්‍රියාවලියක් සිදු විය. (සහයෝගිතාවයේ වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 100 ඉක්මවනු ඇත).

2. ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ 9 වැනි ද්වි වාර්ෂික කමිටුව, ඩර්බන්, දකුණු අප්‍රිකාව, 2019 ජූනි 19-20 සහකාර අධ්‍යක්ෂවරයෙකු විසින් මෙම අංශය නියෝජනය කරන ලදී. (නියෝජිත කණ්ඩායම හොබවන ලද්දේ අධ්‍යක්ෂ/ ආර්ථික කටයුතු විසිනි.)

3. **2019 සැප්තැම්බර් 4 සිට 5 දක්වා ඩකා හි පැවති ඉන්දීය සාගර වටදේදර රටවල සංගමයේ තෙවන නීල ආර්ථික අමාත්‍ය සමුළුව:**

   බංග්ලාදේශ රජය සහ ඉන්දීය සාගර නිම්වළලු සංගමයේ මහලේකම් කාර්යාලය විසින් මෙම සමුළුව කැඳවන ලදී. ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ නායකත්වයෙන් යුතු මෙම සමුළුවට සහභාගීවූ දූත පිරිසට ආර්ථික කටයුතු අතිරේක ලේකම්තුමා සහ සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා සාමාජිකයන් ලෙස සහභාගී වූහ. සංචාරය සඳහා අවශ්‍ය ලිපිලේඛන කටයුතු සඳහා සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශය සහාය විය.

4. **දෙවැනි යුරෝපා සංගම් -ඉන්දියා සමුද්‍රීය ආරක්ෂක වැඩමුළුව**

   "සමුද්‍රීය පොදු සම්පත් ලබාගැනීම" : ඉන්දියාව, යුරෝපා සංගමය සහ ඉන්දියානු සාගර සමුද්‍රීය ආරක්ෂාව , බ්‍රසල්ස් , බෙල්ජියම, 2019 සැප්තැම්බර් 18-19 : මෙම අංශයේ අධ්‍යක්ෂකවරයා සහභාගී විය.

5. **සාගර සමුළුව - 2019, ඔස්ලෝ, නෝර්වේ 23 -24 ඔක්තෝබර්:**

සාගර ආරක්ෂාකර ගැනීම, සාගර සම්පත් වගකිවයුතු අයුරින් කළමනාකරණය සහ තිරසාර ආර්ථික වර්ධනය තහවුරු කිරීම සඳහා වන ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් රටවල් ස්වේච්ඡාවෙන් කැපවීම දිරිමත් කිරීමත්, එවන් කැපවීම් ඉටුකිරීම පිණිස ඉවහල් වන සහාය ක්‍රියාදාමයන් ස්ථාපිත කිරීමත් වෙනුවෙන් සැකසූ සුවිශේෂී ක්‍රමවේදයක් මෙම ඉහළ මට්ටමේ සමුළුව සතුව ඇත. සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා මෙම සමුළුවට සහභාගීවූ නියෝජිත කණ්ඩායමේ සාමාජිකයෙකි.

6. **නීල ආර්ථිකය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ පළමු රැස්වීම, පෝර්ට් ලූවී, මුරුසිය 2019 දෙසැම්බර් 5 - 6**

ජර්මනියේ සහයෝගය මත දකුණු අප්‍රිකානු ජනරජය සහ ඉන්දීය සාගර වටදඳුර රටවල සංගමයේ මහලේකම් කාර්යාලය විසින් මෙම රැස්වීම කැඳවන ලදී. මෙම අංශයේ අධ්‍යක්ෂවරයා ඒ සඳහා සහභාගී විය.

7. **6 වන ඉන්දියානු සාගර සංවාදය, 25 වන ඉන්දීය සාගර වටදඳුර රටවල සංගමයේ විද්වත් කණ්ඩායම් හමුව සහ 1 වන ඉන්දීය සාගර වටදඳුර රටවල සංගමයේ අධ්‍යයන, විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාව පිළිබඳ විශේෂඥ කණ්ඩායම් රැස්වීම, නවදිල්ලිය, 2020 දෙසැම්බර් 12 - 13:**

ඉන්දීය සාගර වටදඳුර රටවල සංගමයේ මහලේකම් කාර්යාලයේ සහාය ඇතිව ඉන්දියානු රජය විසින් මෙම රැස්වීම කැඳවන ලදී. ඊට සහභාගී වූ ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපාය අධ්‍යයන පිළිබඳ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ නිලධාරීන්ගෙන් සමන්විත ශ්‍රී ලංකාවේ නියෝජිත කණ්ඩායම සඳහා මෙම අංශය විසින් අවශ්‍ය පහසුකම් සපයන ලදී. සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශයේ අධ්‍යක්ෂවරයා විසින් මෙම නියෝජිත පිරිසට නායකත්වය දෙන ලදී.

8. **2019 දෙසැම්බර් 2 සිට 13 දක්වා ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නුවර පැවති පාරිසරික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති රාමුවේ (UNFCCC) පාර්ශ්වකාර සමුළුව-25 වන සැසිවාරය:**

මෙම සැසිවාරයට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත පිරිසට නායකත්වය දුන් පරිසර හා දේශගුණික විපර්යාස අංශයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා මෙම පාර්ශ්වකාර සමුළුවේ ඉහළ පෙළේ සැසිය අමතා ශ්‍රී ලංකාවේ ප්‍රකාශය ඉදිරිපත් කළේය. අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් ශ්‍රී ලංකාවේ අදාළ නියෝජිතායතන වල අදහස් හා යෝජනා ලබාගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රකාශය සකස් කරන ලදී. එම වකවානුව තුළ සමුද්‍රීය ප්ලාස්ටික් අපද්‍රව්‍ය ගැටලුව විසඳාලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඉදිරි වැඩපිළිවෙල පිලිබඳව 25 වන පාර්ශ්වකාර සමුළුවේ ජපන් රජයේ මණ්ඩපයේ දී දේශනයක් කිරීමටත්, කඩොලාන ප්‍රතිස්ථාපනය හා ආරක්ෂාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයන් පිළිබඳව 2019 දෙසැම්බර් මාසයේ පැවති 25 වන පාර්ශ්වකාර සමුළුවේ WWF මණ්ඩපයේදී දේශනයක් කිරීමටත්, කඩොලාන පරිසර පද්ධති සහ ජීවනෝපාය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමට නායකත්වය ලබාදීමටත් අධ්‍යක්ෂ ජනරාල්තුමාට ආරාධනා ලැබුණි.

# යුරෝපා, මධ්‍යම ආසියා, යුරෝපා සංගමය සහ පොදු රාජ්‍ය මණ්ඩලයීය අංශය

## යුරෝපා, මධ්‍යම ආසියා, යුරෝපා සංගමය සහ පොදු රාජ්‍ය මණ්ඩලයීය අංශය

යුරෝපා, මධ්‍යම ආසියා, යුරෝපා සංගමය සහ පොදු රාජ්‍ය මණ්ඩලයීය අංශය භූගෝලීය කලාප දෙකකින් සමන්විත අතර, යුරෝපය සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍යයන් සහ අන්තර් රාජ්‍ය ස්ථිති; (යුරෝපා සංගමය සහ පොදු රාජ්‍ය මණ්ඩලය) හා සමඟ පවත්නා ශ්‍රී ලාංකේය ද්විපාර්ශ්වික සබඳතා එමගින් ආවරණය කෙරේ. මෙම අංශයෙහි කාර්යභාරය මෙහි පහත පුළුල් ලෙස දක්වා ඇති, ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තිමය අරමුණුවලින් නියාමනය වේ.

- දේශපාලන, ආර්ථික, සමාජීය, ආරක්ෂා සහ සංස්කෘතික සහයෝගිතාවයන් ආවරණය කෙරෙන්නාවූ ද්විපාර්ශික සබඳතාවයන් ප්‍රවර්ධනය, වැඩිදියුණු කිරීම සහ විවිධාංගීකරණය
- ෂංචාරක කර්මාන්තය ඇතුළු ද්වි-මාර්ගික වෙළඳ ප්‍රවාහයන් සහ සෘජු විදේශ ආයෝජන ඉහළ නැංවීම පිණිස ආර්ථිකමය රාජ්‍යෝපාය මෙහෙයුම් ප්‍රවර්ධනය
- ශ්‍රී ලාංකේය ආර්ථිකයේ ප්‍රමුඛ අංශයන් සඳහා සංවර්ධන සහාය ලබා ගැනීම
- යුරෝපයේ පදිංචි ශ්‍රී ලාංකේය සම්භවයකින් යුත් ඩයස්පෝරා ප්‍රජාවන් සමඟ යහ සබඳතාවයන් ප්‍රවර්ධනය
- යුරෝපයෙහි සහ මධ්‍යම ආසියාවෙහි ශ්‍රී ලාංකේය ප්‍රතිරූපය සහ ලැදියාවන් ප්‍රවර්ධනය
- යුරෝපා සංගමයෙහි සහ අනෙකුත් බහුපාර්ශ්වීය හා කලාපීය සංසද (යුරෝපා සංගමය, එක්සත් ජාතීන්ගේ සංවිධානය ආදී) තුළ ශ්‍රී ලාංකේය ලැදියාවන් ප්‍රවර්ධනයෙහි ලා උත්තෝලන ද්විපාර්ශ්වික සහාය
- දක්ෂිණ සහයෝගිතාව ඇතුළු හවුල් ලැදියාවන් ප්‍රවර්ධනයට සහ දරිද්‍රතාවය, දේශගුණික විපර්යාස, වෙළඳ අසමතුලිතතා සහ ආහාර සුරක්ෂිතතාවය වැනි පොදු අභියෝගයන් කෙරෙහි අවධානය යොමු කිරීම පිණිස නොබැඳි ව්‍යාපාරයෙහි, පොදු රාජ්‍ය මණ්ඩලය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ජී77+ චීනයෙහි සාමාජිකයන් වන යුරෝපීය සහ මධ්‍යම ආසියානු රටවල් සමඟ සහයෝගිතාව

### ඒ. යුරෝපය:

**භූගෝලීය වශයෙන් ආවරණය වන රටවල්: 43**

ඇල්බේනියාව, ඇන්ඩෝරා, ඔස්ට්‍රියාව, බෙල්ජියම, බොස්නියා හා හර්ස්ගොවිනා, බල්ගේරියාව, චෙක් ජනරජය, ඩෙන්මාර්කය, එස්ටෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජෝර්ජියාව, ජර්මනිය, ග්‍රීසිය, රෝම පාප් සභාව, හන්ගේරියාව, අයිස්ලන්තය, අයර්ලන්තය, ඉතාලිය, ලැට්වියාව, ලීචෙන්ස්ටීනය, ලිතුවේනියාව, ලක්ෂම්බර්ග්, මැසිඩෝනියා, මෝල්ටාව, මොනාකෝව, මොන්ටෙනිග්‍රෝ, නෙදර්ලන්තය, නෝර්වේ, පෝලන්තය, රුමේනියාව, පෘතුගාලය, ශාන්ත මැරිනෝ, සර්බියා, ස්ලෝවැකියා, ස්ලෝවේනියා, ස්පාඤ්ඤය, ස්වීඩනය, ස්විට්සර්ලන්තය, එක්සත් රාජධානිය සහ තුර්කිය.

**නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව: 14**

ඔස්ට්‍රියාව, බෙල්ජියම, ප්‍රංශය, ජර්මනිය, (බර්ලින් හා ෆෑන්ක්ෆර්ට්) ඉතාලිය (රෝමය සහ මිලාන්), සයිප්‍රසය, නෝර්වේ, පෝලන්තය, ස්වීඩනය, නෙදර්ලන්තය, එක්සත් රාජධානිය, තුර්කිය.

**සහගාමී අක්තගන්වන ලද රටවල් සංඛ්‍යාව: 23**

බොස්නියා සහ හර්ස්ගොවිනා, සර්බියා, ස්ලෝවැකියා, වියානාව ඔස්සේ ස්ලෝවේනියා, බ්‍රසල්ස් ඔස්සේ ලක්ෂම්බර්ග්, පැරිස් ඔස්සේ ස්පාඤ්ඤය, ස්විට්සර්ලන්තය, ක්‍රොඒෂියා, මැසඩෝනියා, බර්ලිනය ඔස්සේ මොන්ටෙනිග්‍රෝ, ශුද්ධ වූ දේශය පිනීවා වෙත, ඇල්බේනියා, ග්‍රීසිය, මෝල්ටාව, රෝමය ඔස්සේ ශාන්ත මැරිනෝ, වෝෂෝ ඔස්සේ රුමේනියාව, ඩෙන්මාර්ක්, එස්ටෝනියා, ලැට්වියා, ස්ටොක්හෝල්ම් ඔස්සේ ලිතුවේනියා, ඔස්ලෝ ඔස්සේ ෆින්ලන්තය සහ අයිස්ලන්තය, අංකාරා ඔස්සේ ජෝර්ජියාව

## ඔස්ට්‍රියාව

### ඔස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්

ඔස්ට්‍රියාවේ ප්‍රභූ පන්තිය හා සමඟ ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් වර්ධනය කරගැනීම පිණිස අප දූත මණ්ඩලය විසින් ස්වකීය නිමග්නවීමේ ප්‍රතිපත්තිය ශක්තිමත් කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා තානාපතිතුමන් විසින් අක්ත පත්‍ර භාර දෙන ලද අවස්ථාවේ දී, 2019 ජූලි මස 10 වන දින වියානාවේ හොෆ්බර්ග් මාලිගාවේදී ඔස්ට්‍රියා ජන රජයේ, සමූහාණ්ඩු ජනාධිපති, අතිගරු ආචාර්ය ඇලෙක්සැන්ඩර් වැන් ඩ බෙලන් මැතිතුමන් හමුවීම. ඔස්ට්‍රියා- ශ්‍රී ලංකා සබඳතා වැඩි දියුණු කර ගැනීම සහ වැඩිමනත් සහයෝගිතාවන් සාකච්ඡාවට භාජනය කෙරිණ. ශ්‍රී ලංකාවේ වෙළඳපොල ප්‍රවේශය, භෞමික වශයෙන් උපායමාර්ගික පිහිටීම, ආනුෂංගික සේවා සැපයුම සහ යටිතල ව්‍යුහ සැළකිල්ලට ගැනීමේදී ආසියානු කලාපයේ පිවිසුම ලෙස ශ්‍රී ලංකාව හඳුන්වා දෙන ලදී.

- 2019 ජූලි මස 30 වන දින, ඔස්ට්‍රියානු ජනරජයේ, යුරෝපා, ඒකාග්‍රතා සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ, ආසියා- ශාන්තිකර අංශයෙහි අධ්‍යක්ෂිකා, ගේබ්‍රියෙල් මිඔන්- ෂූර්ට්ස් මිය. හමුවීම
- 2020 වසරේදී, යුරෝපීය අධ්‍යක්ෂ මට්ටමේ ද්විපාර්ශ්වික දේශපාලනික උපදේශනයන් පැවැත්වීමේ හැකියාව ගැන විමසා බැලිණ.
- 2019 අගෝස්තු 1 වන දින යුරෝපීය සහ ආරක්ෂක ප්‍රතිපත්ති සඳහා වන ඔස්ට්‍රියානු ආයතනයේ සභාපති, ආචාර්ය වර්නර් ෆස්ලාබෙන්ඩ් මහතා හමුවීම. ආරක්ෂක අංශය සහ බුද්ධි මණ්ඩල සමඟ සම්බන්ධතා නිර්මාණය කර ගැනීම සාකච්ඡා කෙරිණ. බෝල්කන් අර්ධද්වීපයෙහි මිනිස් ජාවාරම, නීති විරෝධී සංක්‍රමණික ප්‍රවාහනය සහ නීති විරෝධී ගිනිඅවි ප්‍රවාහනය සහ ඉහළ යන අන්තවාදී ක්‍රියාකාරකම් ඔස්සේ එමඟින් දකුණු ආසියාව කෙරෙහි එල්ල වන බලපෑම සාකච්ඡාවට භාජනය විය. ආරක්ෂක අංශ විශේෂඥයින් සඳහා පුහුණු අවස්ථා ලබා ගැනීම මත සාකච්ඡාව දැනට සිදු කෙරෙමින් පවතී.
- යුරෝපා, ඒකාග්‍රතාව සහ විදේශ කටයුතු සමූහාණ්ඩු අමාත්‍යාංශයේ දකුණු ආසියානු අංශය, සන්ධාන හා කොන්සියුලර් දෙපාර්තමේන්තු, රේඛීය ආයතන සහ වෙනත් සමූහාණ්ඩු නියෝජිතායතන හා සමග ක්‍රමික අන්තර් ක්‍රියා.
- ශ්‍රී ලාංකේය සංක්‍රමණ ශ්‍රමිකයන්, සරණාගතයින් සහ ශ්‍රී ලාංකිකයින්ගේ උදර්පණයට අදාළ කරුණු සම්බන්ධයෙන් සමූහාණ්ඩු අධිකරණ අමාත්‍යාංශය හා සමග නිරන්තර අන්තර් ක්‍රියා

## බහුපාර්ශ්වීය සබඳතා

### ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනය

2019 වසරේ පැවැති ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනයේ ප්‍රධානතම සම්මන්ත්‍රණ, අන්තර්-රාජ්‍ය විශේෂඥ කමිටු සහ රැස්වීම්වලදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින්, ශ්‍රී ලාංකේය නියෝජිත සහභාගිත්වය සුසාධ්‍යකරණය කෙරිණ. අන්‍යොන්‍ය ලැදියාවක් සහිත කරුණු කාරණා සම්බන්ධයෙන්, සමරුචික රටවල්, ජී-77 චීනය, නොබැඳි ව්‍යාපාරය සහ මැද පෙරදිග හා දකුණු ආසියානු කණ්ඩායම සමග රැස්වීම් පැවැත්විණ.

- ශ්‍රී ලංකාව සඳහා ධාරිතා වර්ධන, තාක්ෂණ සහයෝගිතා අවස්ථා උදා කරගැනීම පිණිස, ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනයේ සම්මන්ත්‍රණ කළමණාකරණ සේවා, න්‍යෂ්ටික සුරක්ෂිතතා, ආරක්ෂා සහ නිරුපද්‍රිතතා දෙපාර්තමේන්තුවල ඉහළ පෙළ නිලධාරීන් සහ වෙනත් වැදගත් නිලධාරීන් හා සමග ක්‍රමික අන්තර් ක්‍රියාකාරකම්.
- 2019 අගෝස්තු මස 23 වන දින තානාපති අක්තපත්‍ර ප්‍රදානයට පරිබාහිරව, ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනයේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් කෝර්නෙල් ෆෙරූටා මහතා හමුවීම
- ශ්‍රී ලංකාවේ හදුනාගත් ක්ෂේත්‍රවල, විශේෂයෙන් ගිවිසුම් ආශ්‍රිත කාර්යන්හිදී ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනයේ නීති සහාය ලබා ගන්නා ලදී.
- න්‍යෂ්ටික අංශයෙහි ලා ශ්‍රී ලංකාවේ මෑතකාලීන මස්තක ප්‍රාප්තීන් සම්බන්ධයෙන් වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලද අතර, 2020-2021 කාල වකවානුව

සඳහා වන ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනයේ තාක්ෂණික සහයෝගිතා වැඩ සටහන හරහා තවදුරටත් සහාය ඉල්ලා සිටින ලදී.

- 2019 ඔක්තොම්බර් මස 28 - නොවැම්බර් දක්වා පැවැති පිළිකා රෝග චිකිත්සා සමාලෝචන මෙහෙවරෙහි ක්‍රියාකාරී වැඩසටහන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනයේ නිලධාරීන් හමුවීම
- දිවයින පුරා ඇති න්‍යෂ්ටික වෛද්‍ය පහසුකම් විමධ්‍යගත කිරීමෙහි ලා රජයේ ප්‍රයත්නයන්ට සහ පවත්නා විකිරණ සම්පත් සහ උපකරණ අධිශ්‍රේණිගත කිරීමට සහායවීම පිණිස ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනයේ සහාය ලබාගන්නා ලදී.
- 2019 සැප්තැම්බර් මස 16-20 දක්වා පැවැති ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනයේ 63 වන ක්‍රමික සැසියට, විදුලිබල සහ බලශක්ති රාජ්‍ය අමාත්‍ය, ගරු චම්පික ප්‍රේමදාස මහතාගේ ප්‍රධානත්වයෙන් වූ ශ්‍රී ලංකා නියෝජනය සුසාධ්‍යකරණය කෙරිණ.
- ගරු අමාත්‍යතුමාගේ සහභාගිත්වය නොකඩවා සුසාධ්‍යකරණය කරණ ලද අතර, සංවාදකයින් සහ වෙනත් නියෝජිතයින් හා සමඟ පැවති රැස්වීම් සම්බන්ධීකරණය කෙරිණ.

**වියානාහි එක්සත් ජාතීන්ගේ කාර්යාලය/ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය**

අප දූත මණ්ඩලය විසින්, සියළුම ප්‍රධාන සම්මන්ත්‍රණ, කොමිෂන් සභා (එනම්: නීතිවිරෝධී මත්ද්‍රව්‍ය කමිටුව සහ ජාත්‍යන්තර නීතිවිරෝධී මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය), අන්තර් රාජ්‍ය ක්‍රියාකාරී කමිටු, මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් හා වැඩමුළුවලදී, ශ්‍රී ලංකාවේ ස්ථාවරය නියෝජනය කරන ලද අතර, මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ ප්‍රධාන අංශ හා සමග නිරන්තරයෙන් අන්තර්-ක්‍රියාවන්හි යෙදෙන ලදී.

i. මෙහෙයුම් අංශය
ii. ගිවිසුම් කටයුතු අංශය
iii. ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ පොදු කටයුතු අංශය
iv. කළමනාකරණ අංශය

**එක්සත් ජාතීන්ගේ තානාපති සහ නිත්‍ය නියෝජිතතුමාගේ අක්තපත්‍ර ප්‍රදානෝත්සවයේදී, 2019 සැප්තැම්බර් මස 19 වන දින, එක්සත් ජාතීන්ගේ මහ ලේකම් ඇන්ටෝනියෝ ගුටරස් මහතා වෙනුවෙන් සපැමිණි, වියානාහි එක්සත් ජාතීන්ගේ කාර්යාලයෙහි අධ්‍යක්ෂ ජෙනරාල් සහ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලයේ විධායක අධ්‍යක්ෂ, යූරි ෆෙඩෝටොව් මහතා හමුවීම**

- එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ කාර්යාලීය කලාප මහ ලේකම් කාර්යාලය හරහා, අන්තරායකාර ඖෂධ සහ මිනිස් ජාවාරම්, සාමුද්‍රීය අපරාධ සහ මුහුදු මංකොල්ලයන් වැළැක්වීම් ක්ෂේත්‍රයන්හි සාමාජික රාජ්‍යයන් සමග සක්‍රීයව සම්බන්ධීකරණයෙහි යෙදීමෙහිලා ඉන්දියන් සාගරයෙහි මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ භූමිකාව සහ ඉදිරි ගමන්මග සාකච්ඡාවට භාජනය කෙරිණ.
- ධාරිතා වර්ධනය, තාක්ෂණික සහයෝගිතාව සහ තොරතුරු බෙදාහදා ගැනීම සහ යහ වත්පිළිවෙත්වලට අදාලව එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ කාර්යාලයෙන් වැඩිමනත් ආධාර සහ සහාය ලබා ගැනීමට හැකිවිය. සාමාජික- ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය කරලීම උදෙසා දේශාතික්‍රාන්ත සංවිධානාත්මක අපරාධවලට එරෙහිව සටන් කිරීම පිණිස සාමූහික ප්‍රයත්නයක් යෙදීමේ අවශ්‍යතාවය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැහැදිලි කෙරිණ.
- 2019 නොවැම්බර් මස 27-30 දක්වා, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ කාර්යාලීය මෙහෙයුම් අංශයේ අධ්‍යක්ෂවරයාගේ ශ්‍රී ලංකා සංචාරය
- එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ කාර්යාලයේ මෙහෙයුම් අංශයේ අධ්‍යක්ෂිකා, මයිවා කැටෝ මහත්මියගේ 2019 නොවැම්බර් මස 27-30 දක්වා වූ ශ්‍රී ලංකා සංචාරය අදාල රේඛීය නියෝජිතායතන හා සමග සම්බන්ධීකරණයෙන්, සුසාධ්‍යකරණය කෙරිණ.

- එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ කාර්යාලීය සම්මන්ත්‍රණ, වැඩමුළු සහ අන්තර්-රාජ්‍ය ක්‍රියාකාරී කණ්ඩායම්/කමිටුවල පහත දැක්වෙන ශ්‍රී ලංකා නියෝජනයන් සඳහා සුසාධ්‍යකරණ කටයුතු දීර්ඝ කෙරිණ;
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණය කිරීමේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, ජාත්‍යන්තර දූෂණ විරෝධී අධිකාරී සංගමයේ 10 වන වාර්ෂික සම්මන්ත්‍රණයට සහ මහා සභා රැස්වීමට සහභාගිවීම;
- 2019 මැයි මස 20-24 දක්වා වියානාහි පැවැති අපරාධ වැළැක්වීම සහ සාපරාධී නඩු විනිශ්චය පිළිබඳ කොමිෂන් සභාවේ 28 වන සැසියේදී නීතිපති දෙපාර්තමේන්තුවේ, ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥවරයෙකු තීරක මඩුළු සාමාජිකයෙකු ලෙස සහභාගිවීම;
- 2019 සැප්තැම්බර් මස 9-13 දක්වා, දේශාතික්‍රාන්ත සංවිධානාත්මක අපරාධ විරෝධී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 9 වන සැසියට : නීති විරෝධී මිනිස් ජාවාරම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම; සහ 6 වන සැසියට : නීති විරෝධී සංක්‍රමණිකයින් ජාවාරම; සහභාගිවීම
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණය කිරීමේ සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, 2019 සැප්තැම්බර් මස 4-6 දක්වා, දූෂණ වළක්වාලීමේ විවෘත අන්තර්-රාජ්‍ය ක්‍රියාකාරී කණ්ඩායමේ 10 වන සැසියේදී තීරක මඩුළු සාමාජිකයෙකු ලෙස සහභාගි වීම.
- දූෂණ මැඩලීමෙහි ලා ශ්‍රී ලංකාවේ ප්‍රවේශය සහ උපාය මාර්ග විදහා දැක්වීමේ රැස්වීමක් සංවිධානය කරන ලද අතර, එයට අපරාධ විරෝධී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ පාර්ශ්වයන් වන රාජ්‍යයන් 17ක් සහභාගී වූහ. දූෂණ වළැක්වීම පිණිස ශ්‍රී ලංකාව විසින් ගෙන ඇති පියවර මනාව විස්තර කර දෙන ලදී.
- ජාතික අන්තරායකාරී ඖෂධ පාලක මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂිකා, පබසරා වීරසිංහ මහත්මිය, 2019 ඔක්තොම්බර් මස 16-18 දක්වා, 62 වන මත්ද්‍රව්‍ය කොමිෂන් සභාවේ, 6 වන ජාත්‍යන්තර සම්මේලනය සඳහා විශේෂඥවරියක ලෙස සහභාගි වීම
- 2019 දෙසැම්බර් මස 16-20 දක්වා අබුඩාබිහිදී පවත්වන ලද එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියෙහි රාජ්‍ය පාර්ශ්වරුවන්ගේ සම්මේලනයේ 8 වන සැසියේ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සහභාගිත්වය.
- ජී 77 සහ චීනය, නොබැඳි සමුළුව සහ ආසියානු ශාන්තිකර කණ්ඩායමේ රැස්වීම් සහ උපදේශනයන්හිදී ශ්‍රී ලංකාව නියෝජනය කෙරිණ.
- ගෝලීය හා කලාපීය ගැටළු කොන්දේ කොටගත් ජී77, නොබැඳි ව්‍යාපාරය සහ ආසියා ශාන්තිකර කණ්ඩායම්වල විචාරණ ක්‍රියාදාමයට සක්‍රීයව සහභාගී වෙමින්, ශ්‍රී ලංකාවේ ලැදියාවන් ප්‍රවර්ධනය කර ගන්නා ලදී.

**ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂන් සභාව**

- ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂන් සභා සම්මන්ත්‍රණ සහ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් වලදී වැදගත් තොරතුරු එක්රැස් කරගැනීම සහ ජාතික යහපත සුරක්ෂිත කරගැනීම උදෙසා, එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ කොමිෂන් සභාව ව්‍යාප්ත කරලීම සහ අන්තර්-රාජ්‍ය ආරාවුල් සමථකරණ යාන්ත්‍රණ ප්‍රතිසංස්කරණය වැනි ගැටළු සම්බන්ධයෙන් සම-රුචික රටවල ජ්‍යෙෂ්ඨ රාජතාන්ත්‍රිකයින් හා සමග රැස්වීම් ගණනාවක්ම පවත්වන ලදී.
- ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂන් සභා අන්තර්-රාජ්‍ය ක්‍රියාකාරී කණ්ඩායම්/කමිටු රැස්වීම් වලදී පහත දැක්වෙන ශ්‍රී ලාංකේය නියෝජිතයන් සුසාධ්‍යකරණය කෙරිණ;
- නීතිපති දෙපාර්තමේන්තුවේ, ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ, සුසන්ත බාලපටබැඳි මහතා, අන්තර්-රාජ්‍ය ආරාවුල් සමථකරණ-ක්‍රියාකාරී කණ්ඩායම් III - 38 වන සැසියට සහභාගිවීම
- ක්‍රියාකාරී කණ්ඩායම් VI - අධිකරණමය නෞකා අලෙවිය - රැස්වීමේදී නීතිපති දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ, වික්‍රම් ආබෘ මහතාගේ සහභාගිත්වය

**ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂන් සභා මහ ලේකම් කාර්යාලයේ ප්‍රධානතම ක්‍රියාකාරී කණ්ඩායම් හයෙහි සම්බන්ධීකාරකයින් හා සමග සමීපස්ථ අන්තර් ක්‍රියා. එනම්:**

ක්‍රියාකාරී කණ්ඩායම් I - ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

ක්‍රියාකාරී කණ්ඩායම් II - බේරුම්කරණය හා සමථකරණය /ආරාවුල් නිරාකරණය

ක්‍රියාකාරී කණ්ඩායම් III- ආයෝජක රාජ්‍ය ආරාවුල් සමථකරණ ප්‍රතිසංස්කරණය

ක්‍රියාකාරී කණ්ඩායම් IV- විද්‍යුත් වාණිජ්‍යය

ක්‍රියාකාරී කණ්ඩායම් V - වස්තු භංගත්ව නීතිය

ක්‍රියාකාරී කණ්ඩායම් VI- අධිකරණමය නෞකා අලෙවිය

**එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය**

- 2019 සැප්තැම්බර් මස 17 වන දින, නිත්‍ය නියෝජිත අක්තපත්‍ර ප්‍රදානෝත්සවයේදී, එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ අධ්‍යක්ෂ ජෙනරාල්, ලී යොං මහතා හමුවීම.
- ශ්‍රී ලංකාවේ මෙම සංවිධානය විසින් අරමුදල් යොදවනු ලබන ව්‍යාපෘතිවල සාර්ථකත්වය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර, ධාරිතා වර්ධනය, සම්ප්‍රදායික ආහාර සැකසීම සහ රසායනික අපද්‍රව්‍ය පිළිබඳ පරිසර හිතකාමී කළමණාකරණය වැනි ක්ෂේත්‍ර ආවරණය කෙරෙන නව සහ දැනට ක්‍රියාත්මක වන විශාල පරිමාණයේ ව්‍යාපෘති සඳහා සහාය ඉදිරියටත් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.
- එක්සත් ජාතීන්ගේ වියානා කාර්යාලයේ සිද්ධි දින දර්ශනයෙහි ලැයිස්තු ගත කර ඇති එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ සම්මන්ත්‍රණ සහ රැස්වීම්වලටද සහභාගීවීම.

**බෙල්ජියම**

**බෙල්ජියම සමග ද්විපාර්ශ්වීය සබඳතා**

- අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගරු තලතා අතුකෝරළ මැතිතුමිය 2019 පෙබරවාරි 27-මාර්තු 01 දක්වා, බෙල්ජියමෙහි පැවැති මරණීය දණ්ඩනයට එරෙහි ලෝක බලමුළුවේ 7 වන සැසියට සහභාගි වූවාය. මෙම සංචාරයේදී එතුමිය දෙරට බන්ධනාගාර ක්‍රමවේද සම්බන්ධයෙන් බෙල්ජියමෙ අධිකරණ අමාත්‍ය, ගරු කුන් ගීන්ස් මහතා සමඟ අදහස් හුවමාරු කරගත් අතර, ශ්‍රී ලංකාවේ බන්ධනාගාර සඳහා තාක්ෂණවේදී සහාය ඉල්ලා සිටියාය.
- දූත මණ්ඩල ප්‍රධානී, 2019 ජූලි මස 19 වන දින, විදේශ කටයුතු අමාත්‍යාංශයේ, ආසියා හා ශාන්තිකර අංශයේ අධ්‍යක්ෂිකා, රෙපින් වෑන්ඩ්‍රයිෂ් මහත්මිය හමුවූ අතර, ද්විපාර්ශ්වීය උපදේශන ආරම්භ කිරීම, බෙල්ජියමෙන් ප්‍රභූ සංචාර හුවමාරුව සහ බෙල්ජියම හා සමඟ අත්සන් තබා ඇති පවත්නා ගිවිසුම් ප්‍රතිසංශෝධනය ඇතුළුව ද්විපාර්ශ්වීය සබඳතා තවදුරටත් ශක්තිමත් කරගැනීමට අදාල කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.
- දූත මණ්ඩල ප්‍රධානී, 2019 අගෝස්තු මස 28 වන දින බෙල්ජියම් විදේශ කටයුතු අමාත්‍යාංශයේ මහ ලේකම් බෘනෝ වැන්ඩ ප්ලම් මහතා හමුවූ අතර, ද්විපාර්ශ්වීය උපදේශන මාලාවෙහි පළමුවන වටය ආරම්භ කිරීම, ශ්‍රී ලංකාවෙහි ආයෝජන වැඩි කිරීම සහ ශ්‍රී ලංකාවෙහි යටිතල සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබා දෙමින් පවතින බෙල්ජියම් විදේශ කටයුතු අමාත්‍යාංශයීය අපනයන මුල්‍ය සහාය ආයතනයේ ප්‍රදාන සහාය වැඩි කිරීම සාකච්ඡාවට භාජනය කෙරිණ.
- 2019 සැප්තැම්බර් මස 19 වන දින, ද්විපාර්ශ්වීය දේශපාලන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් ඇනික් වැන් ක්ලැස්ටර් මහත්මිය සමග පැවැති රැස්වීමේදී, උපදේශන යාන්ත්‍රණයේ මෙහෙයුම් ක්‍රියාත්මකකරණය, බෙල්ජියම විසින් රාජතාන්ත්‍රිකයින් වෙත ප්‍රදානය කෙරෙණ, පුහුණු වැඩ සටහන් මෙන්ම මත් ද්‍රව්‍ය නිරාවරණය කර ගැනීම වැනි ක්ෂේත්‍රයන්හි ඇන්ට්වර්ප් වරාය ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩ සටහන් සහ ඇනට්වර්ප් ඩයමන්ඩ් මධ්‍යස්ථානය විසින් ලබාදෙනු ලබන වෘත්තීය පුහුණුව වැනි තාක්ෂණික සහයෝගිතා

වැඩසටහන් සහ බෙල්පියම වෙත කුසලතා පූර්ණ සංක්‍රමණිකයින් යැවීම ඇතුළුව සමස්ත ද්විපාර්ශ්වීය සබඳතා, දූත මණ්ඩල ප්‍රධානී විසින් සමාලෝචනයට භාජනය කෙරිණ.

- එක් එක් රටෙහි තරුණ රාජතාන්ත්‍රිකයින් සඳහා රාජතාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථාන යටතේ අන්‍යොන්‍ය පදනමින් ස්ථානගතකිරීම් ලබාදියයුතු බව බෙල්පියම් විදේශ කටයුතු අමාත්‍යාංශයේදී පැවැති සාකච්ඡාවේදී නිගමනය විය. බෙල්පියම් පුහුණු මධ්‍යස්ථානය යටතේ ලබාගත හැකිව ඇති ඩිජිටල් රාජ්‍යෝපාය, පාරිසරික හා දේශගුණික රාජ්‍යෝපාය, සහ ආශ්‍රිත පාරිභෝගීකරණිත පාඨමාලාවල පුහුණු අවස්ථා ශ්‍රී ලංකා විදේශ සබඳතා අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටින ලදී.
- දූත මණ්ඩල ප්‍රධානී, 2019 නොවැම්බර් මස 07 වන දින ඇන්ට්වර්ප් ප්‍රාන්ත ආණ්ඩුකාර කැති බර්ක්ස් මහත්මිය හමුවී ශ්‍රී ලංකාව සහ බෙල්පියම අතර වෙළඳාම සහ ආයෝජනයට ඇති අවස්ථා සාකච්ඡා කරණ ලදී
- අප දූත මණ්ඩල ප්‍රධානී, ඇන්ට්වර්ප් වරාය පුහුණු මධ්‍යස්ථානයෙහි කළමණාකරණ අධ්‍යක්ෂිකා කැතී බර්ක්ස් මහත්මිය හමුවූ අතර, පුහුණු වැඩසටහන සඳහා ඇන්ට්වර්ප් වරාය පුහුණු මධ්‍යස්ථානය විසින් ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව ලබා ගැනීමේ හැකියාව සහ යෝජිත සහයෝගිතාව තවදුරටත් සාකච්ඡා කිරීම පිණිස කාර්යභාර නිලධාරීන්, කුන් කෝනිල මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදීමේ හැකියාව ගැන විමසා බැලිණ.
- බෙල්පියමෙහි සහ ශ්‍රී ලංකාවෙහි දේශපාලන තත්ත්වය සහ බෙල්පියම්-ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායම පුනර්ජීවන කරලීමෙහි හැකියාව සහ ශ්‍රී ලාංකීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අනුපූරක බෙල්පියම් සංචාරය ඇතුළු ගිවිස ගත් වැඩ සටහන් ක්‍රියාත්මක කරවීම සාකච්ඡා කිරීම පිණිස 2019 ඔක්තොම්බර් මස 22 වන දින බෙල්පියම්- ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායමේ MEP සමඟ අන්‍යොන්‍ය ක්‍රියාදාමයක නියැලිණ.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

- තානාපති කාර්යාලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා එක්ව, 2019 මැයි මස 07-09 දක්වා බ්‍රස්ල්ස්හි පැවැති ගෝලීය මුහුදු ආහාර ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලද අතර, ශ්‍රී ලාංකික මුහුදු ආහාර අපනයනකරුවන් හය දෙනෙකු සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ නියෝජිතයෝ එයට සහභාගී වූහ. මෙහිදී ආසන්න වශයෙන් ඇ.ඒ.ඩොලර් 345,000 ක ස්ථිර ඇණවුම් ලබා ගැනීමට ශ්‍රී ලාංකික සමාගම් සමත්වූහ.
- 2019 ඔක්තෝම්බර් මස 11 වන දින බ්‍රස්ල්ස්හි පැවැති බෙල්පියම් සාධාරණ වෙළඳ සතියේදී, තානාපති කාර්යාලය විසින් අපනයන සංවර්ධන මණ්ඩලයේ සහයෝගය ඇතිව බෙල්පියමේදී පැවැත්වුණ ශ්‍රී ලංකාවේ ප්‍රථම සාධාරණ වෙළඳ සහ කාබනික සහතික ලත් කුළුබඩු, පොල් නිෂ්පාදන, සැකසූ පළතුරු සහ එළවුළු සහ තේ අපනයනයෙහි නියැලෙන ශ්‍රී ලාංකික අපනයනකරුවන් පස් දෙනෙකු සහභාගී වූ ප්‍රවර්ධන උත්සවයට ශ්‍රී ලාංකේය සාධාරණ වෙළඳ නිපැයුම් ප්‍රදර්ශනයක්, පුද්ගල සබඳතා ප්‍රවර්ධන දිවා භෝජනයක් සහ ව්‍යාපාරික සබඳතා ගොඩනැගීමේ රැස්වීම් ඇතුළත් විය. තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකා නියෝජිත පිරිස සඳහා එවැනි ව්‍යාපාරික සබඳතා ගොඩනැගීමේ රැස්වීම් හතළිස් නවයක් (49) සංවිධානය කරන ලදී.
- තානාපති කාර්යාලය විසින්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහයෝගය ඇතිව, ප්‍රථම වරට සිලෝන් ටී බෙල්පියමෙහි ප්‍රවර්ධනය කිරීම පිණිස 2019 නොවැම්බර් මස 17-21 දක්වා ජෙන්ට් නගරයෙහි පැවැති හොරෙකා ප්‍රදර්ශනභූමියේ ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලාංකික තේ අපනයනකරුවන් තිදෙනෙකු සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නියෝජිතයෝ එයට සහභාගී වූහ. තානාපති කාර්යාලය විසින් ඇන්ට්වර්ප් සහ බ්‍රස්ල්ස්හි ප්‍රසිද්ධ බෙදාහරින්නන් සහ ශ්‍රී ලාංකික නියෝජිතයන් අතර ව්‍යාපාරික සබඳතා ගොඩනැංවීමේ රැස්වීම් තුනක් (3) සංවිධානය කරන ලදී. අගය එකතු කරන ලද තේ අපනයන ඇණවුම් ලබාගැනීමට ශ්‍රී ලාංකික අපනයනකරුවෝ සමත්වූහ.
- තානාපති කාර්යාලය ව්‍යාපාරික මණ්ඩල, සම්මේලන, නිපැයුම් පාදක කොට ගත් සමිති සමාගම්වල නිලධාරීන් සහ විභව්‍ය ආනයනකරුවන් හමුවී, ශ්‍රී ලංකාවේ පවත්නා ආයෝජන ඉඩ ප්‍රස්ථා ඔවුන්ගේ අවධානයට යොමු කරවන ලදී.

## සංචාරක ප්‍රවර්ධනය

- 2017 වර්ෂයට සාපේක්ෂව, ශ්‍රී ලංකාවට සම්ප්‍රාප්ත වූ සංචාරකයන්ගේ සංඛ්‍යාවේ ඉහළයාමක් 2018 වසරේදී දක්නට ලැබිණ. 2017 වර්ෂයේදී 14,616 ක් වූ සංඛ්‍යාව 2018 වසරේදී 17,519 ක් විය. මෙය 2019 වසරේදී තවදුරටත් ඉහළයාම අපේක්ෂා කරන ලද්දේ වී නමුදු, පාස්කු ඉරිදා ප්‍රහාරය නිසා එය 14,948 කට සීමා විය.
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් අනුග්‍රහය දක්වන ලද පරිදි, තානාපති කාර්යාලය විසින් 2019 පෙබරවාරි මස 07-10 දින දක්වා වූ බ්‍රස්ල්ස් ප්‍රදර්ශනයේ, 2019- බ්‍රස්ල්ස් නිවාඩු සැණකෙළියේ 61 වන වාරයේදී පවත්වන ලද ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියට සහභාගී වන ලදී. චාරිකා සමාගම් 6ක් මෙයට සහභාගී වූහ.
- ශ්‍රී ලංකාවේ අනන්‍යතාවූ සංචාරක ආකර්ෂණයන් නිරූපණය කරමින්, "සෝ ශ්‍රී ලංකා" නමින් ඡායාරූප ප්‍රදර්ශනයක් 2019 පෙබරවාරි මස 03 හා 04 දින බ්‍රස්ල්ස් පුවත්පත් සමාජයෙහි ප්‍රදර්ශනාගාරයෙහිදී පැවැත්විණ.
- 2019 අගෝස්තු මස 07 වන දින පැවැති වාර්ෂික විවෘත බෙල්ජියම් ජලතරණ ශූරතා තරඟාවලි සමයේදී බෙල්ජියමේ ඌස්ටෙන්ඩ්හි රාජකීය උත්තර සමුද්‍ර යාත්‍රාකරණ ක්‍රීඩා සමාජයෙහි දී සංචාරණ ප්‍රවර්ධන උත්සවයක් පවත්වන ලදී.
- 2019 ඔක්තොම්බර් මාසයේදී, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහයෝගය ඇතිව, බෙල්ජියමේ චාරිකා සංවිධානකරුවන්ගේ සංගමයේ අග්‍රගණ්‍ය නියෝජිත පිරිසක් සඳහා දැන හඳුනාගැනීමේ චාරිකාවක් සුසාධ්‍යකරණය කෙරිණ.
- 2019 ඔක්තෝම්බර් මස 04 වන දින, රාජකීය බෙල්ජියම් ගොල්ෆ් ක්‍රීඩා සමාජයේදී සංචාරක ප්‍රවර්ධන උත්සවයක් පවත්වන ලදී. 150 ඉක්මවූ අමුත්තන් සංඛ්‍යාවක් සහභාගී වූහ.

තානාපති කාර්යාලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා එක්ව, බෙල්ජියමේ සංචාරකයින්ගේ සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම පිණිස බ්‍රස්ල්ස්හිදී (2019 නොවැම්බර් 14), ඇන්ට්වර්ප් හිදී (2019 නොවැම්බර් මස 28) සහ ෆ්ලෙමිස් භාෂාව භාවිතා කරන්නා වූ ෆ්ලැන්ඩර්ස් කලාපයෙහි ඡෙන්ට්හිදී (2019 දෙසැම්බර් 04) වැඩමුළු සංවිධානය කරන ලදී.

## අධ්‍යාපනය

- අධ්‍යයන සහ සංස්කෘතික සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, 2019 ජූලි මස 25 වන දින, බෙල්ජියමේ ලියුවන් ලිම්බර්ග් විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ ජාතික සමාජ අධ්‍යයන ආයතනය යන සංවිධාන ද්විත්වය අතර ළමා සත්කාරය සහ ළමා සංවර්ධන අධ්‍යයනයන් මත අවබෝධතා ගිවිසුමක් ශ්‍රී ලංකාවේ දී අත්සන් තැබිණ.
- කේයූ ලියුවන් සහ ශ්‍රී ලාංකික විශ්ව විද්‍යාල අතර ශිෂ්‍ය හුවමාරු වැඩ සටහන් හඳුන්වා දීම පිණිස කේයූ ලියුවන් විශ්ව විද්‍යාලයෙහි ජාත්‍යන්තර දෙපාර්තමේන්තුව හා සමග සාකච්ඡා ආරම්භ කෙරිණ. තානාපති කාර්යාලය විසින් කොළඹ විශ්ව විද්‍යාලයට සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට අවශ්‍ය තොරතුරු සපයන ලදී.
- කෘෂි-පෙව-තාක්ෂණ විශ්ව විද්‍යාලය සහ ලීප් විද්‍යාලය (පේම්බිලවුක්ස් මණ්ඩපය) අතර සහයෝගිතාවය සපුරා ගැනීමේ හැකියාව විමසා බැලිණ. තානාපති කාර්යාලය විසින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ, කෘෂිකර්ම පීඨයට අවශ්‍ය තොරතුරු ලබාදෙන ලදී.

## සංස්කෘතික සබඳතා

- 2019 ජනවාරි මස තෙපොන්ගල්, 2019 පෙබරවාරි 04 දින නිදහස් දිනය, 2019 මැයි මස වෙසක් සිල් සමාදන්වීමේ වැඩ සටහන සහ 2019 දෙසැම්බර් මස නත්තල සැමරීම පිණිස ශ්‍රී ලාංකික ප්‍රජාව හා එක්ව උත්සව සංවිධානය කෙරිණ.
- ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රජාවන්ගේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහා ඒ ඒ ප්‍රජාවන් විසින් සංවිධානය කරන ලද සංස්කෘතික හා ආගමික උත්සවවලට සහභාගී වන ලදී.

**බහුපාර්ශ්වීය සබඳතා - යුරෝපා සංගමය**

**ඒකාබද්ධ කොමිෂන් සභා සහ  ක්‍රියාකාරී කණ්ඩායම්**

- යුරෝපා සංගම-ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිෂන් සභාවේ 22 වන රැස්වීම 2019 පෙබරවාරි මස 14 වන දින බ්‍රසල්ස්හිදී පැවැත්විණ. දෙපාර්ශ්වය විසින් සංගත ග්‍රාමීය සංවර්ධනය, ප්‍රජාතාන්ත්‍රික පාලනය, තිරසාර ආර්ථික සංවර්ධනය, වර්ධනය, වෙළඳාම සහ ආයෝජන මත පවත්නා සහයෝගිතාවය සාකච්ඡාවට භාජනය කරන ලද අතර, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිවල සමස්ත කාර්ය සාධනය ගැන තෘප්තිය ප්‍රකාශ කළහ. ආපදා සූදානම සහ පූර්ව අනතුරු හැඟවීම් ක්‍රමවේදයන්හිලා ශ්‍රී ලංකාවේ ධාරිතා සංවර්ධනය, IOTC සමග සහයෝගිතාව ප්‍රතිසාධනය, සංක්‍රමණ ගැටළු, හොරයිසන් 2020 ප්‍රත්‍යුත්ක්‍රමයෙහි ශ්‍රී ලාංකික පර්යේෂකයින්ගේ සහ නවෝත්පාදකයින්ගේ සහභාගිත්වය, දේශගුණය සමනය කරගැනීමේ ව්‍යාපෘති සඳහා යුරෝපා සංගම සහයෝගය ලබා ගැනීම වැනි ක්ෂේත්‍රයන් ගණනාවක් පසු විපරම් කටයුතු සඳහා හඳුනා ගැණින.

- සංවර්ධන සහයෝගිතාවය පිළිබඳ යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම 2019 අගෝස්තු 30 වන දින බ්‍රසල්ස්හිදී පැවැත්විණ. ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් හඳුනා ගන්නා ලද සහයෝගිතා  විභව්‍ය ක්ෂේත්‍රයන්  දෙපාර්ශ්වයේම විචාරණයට භාජනය විය. 2021 න් එළඹෙන ඊලඟ බහු වාර්ෂික මුල්‍ය ක්‍රියාරාමුව සඳහා මුඛ්‍ය නියාමන මූලධර්මයන්ට අදාල තොරතුරු යුරෝපා සංගමය විසින් බෙදා හදා ගන්නා ලදී.

  ආණ්ඩුකරණය, නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් පිළිබඳ  ක්‍රියාකාරී කණ්ඩායමේ 4 වන රැස්වීම 2019 අගොස්තු මස 30 වන දින කොළඹදී පැවැත්විණ. සුළුජාතීන්ට අදාල කරුණු සහ රැඩිකල්කරණය සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදය මෙන්ම වෛරී කථනය කෙරෙහි අවධානය යොමු කිරීමේ පියවර සාකච්ඡා කෙරිණ. හිංසනයේ ශූන්‍ය- ඉවසීම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කෙරිණ.

- වෙළඳ සහ ආර්ථික සබඳතා සහයෝගිතාවය පිළිබඳ යුරෝපා සංගම-ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම 2019 ඔක්තෝබර් මස 24 වන දින බ්‍රසල්ස්හිදී පැවැත්විණ. විශේෂයෙන්ම ඊ.වාණිජ්‍යය, සේවා ගෘහස්ත නියාමනය, තොරතුරු තාක්ෂණ ගිවිසුම සහ රජයේ ප්‍රසම්පාදන ගිවිසුම පිළිබඳ ප්‍රමන්ත්‍රණයන්ට සම්බන්ධවීම ශ්‍රී ලංකාව විසින් සළකා  බැලීම මෙම රැස්වීමේදී යෝජනා විය. ශ්‍රී ලංකා ඉහළ මැදි ආදායම් මට්ටමට එළඹීමේ ප්‍රස්තුතය  සහ  ජීඑස්පී + ක්‍රමවේදයේ අදාල විධිවිධාන සාකච්ඡාවට භාජනය වූ අතර, ශ්‍රී ලංකාව පවත්නා ආදායම් මට්ටම අනුක්‍රමික වර්ෂ තුනකදී දරා සිටියහොත් 2023  ජනවාරි

  මස 1  වන දින වන විට ජීඑස්පී ප්‍රතිලාභී තරාතිරම  අහිමි වන බව තහවුරු කෙරිණ. ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව විසින් ඉදිරිපත් කරන ලදුව දීර්ඝ කාලයක් තිස්සේ අවිනිශ්චිතව පවත්නා තිරස් කලාපීය සමුච්චයන ඒකාබද්ධ අයදුම්පත සහ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙමින් පවතින යුරෝපා සංගම්- වෙළඳාම ආශ්‍රිත සහාය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර, ශ්‍රී ලංකාව විසින් යුරෝපා සංගමයේ සළකා බැලීම පිණිස නව ව්‍යාපෘති පහක් ඉදිරිපත් කරන ලදී.

- දූත මණ්ඩල ප්‍රධානී, 2019 ජූලි මස 03 වන දින, යුරෝපා සංගම ප්‍රති-ත්‍රස්තවාද සම්බන්ධීකාරක, ගිලස් ද කර්චොව් මහතා හමුවූ අතර, යුරෝපා සංගම- ශ්‍රී ලංකා ප්‍රති-ත්‍රස්තවාද සංවාදයට අදාල ගැටළු සාකච්ඡාවට භාජනය කරන ලදී. යුරෝපා සංගම- ශ්‍රී ලංකා  ප්‍රති-ත්‍රස්තවාද සංවාදය 2019 ජූලි මස 12-15 දක්වා කොළඹදී පැවැත්විණ. පවත්නා ප්‍රති ත්‍රස්තවාද පියවර, රැඩිකල්කරණය සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදය වළක්වාලීම, ආරක්ෂා සහයෝගිතාවය, ධාරිතා වර්ධනය සහ යුරෝපා සංගමය විසින් එල්ටීටීඊ සංවිධානය ලැයිස්තුගත කිරීම මෙම අවස්ථාවෝචිත සංවාදයෙන් ආවරණය විය.

- දූත මණ්ඩල ප්‍රධානියා, සංක්‍රමණ සහ පෙරළා පැමිණීමේ ප්‍රතිපත්ති අංශයේ (සංක්‍රමණ හා ස්වදේශ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය) වැඩ බලන ප්‍රධානී සහ යුරෝපා සංගම් සම සභාපති, ඩෑන් රූටන්බර්ග් මහතා හමුවුණ අතර, යාවත්කාලීන කරණ ලද ප්‍රති-ප්‍රවේශ සිද්ධි කළමණාකරණ ක්‍රමවේදය සක්‍රීය කිරීම පිළිබඳව සාකච්ඡා කෙරිණ.

- යුරෝපා සංගම්- ශ්‍රී ලංකා ඒකාබද්ධ ප්‍රතිප්‍රවේශ කමිටුවේ 5 වන රැස්වීම 2019 මාර්තු මස 11 වන දින කොළඹදී පැවැත්විණ. ප්‍රති-ප්‍රවේශ සිද්ධි කළමණාකරණ ක්‍රමවේදය පරිශීලනය ආශ්‍රිත ගැටළු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරණ ලද අතර, ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය විසින් සම්බන්ධීකරණය කෙරෙන්නාවූ වැඩ සටහන් හරහා පෙරළා සියරට පැමිණෙන්නන්ට සහායවීමට යුරෝපා සංගමය ප්‍රතිඥා දෙන ලදී.

- ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය, සංක්‍රමණ හා ස්වදේශ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය සහ යුරෝපා සංගම් ප්‍රති ප්‍රවේශ ධාරිතා වර්ධන අභියෝග්‍යතාව ආයතනය විසින් 2019 ඔක්තෝබර් 16-17 දෙදින කොළඹදී පවත්වන ලද ඊ.ප්‍රති-ප්‍රවේශ සිද්ධි කළමණාකරණ ක්‍රමවේද පුහුණු වැඩමුළුවට, ශ්‍රී ලංකාවේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාව සහ තානාපති කාර්යාලය සහභාගී වූහ. ප්‍රති-ප්‍රවේශ සිද්ධි කළමණාකරණ ක්‍රමවේදයේ නව අනුවර්තනය 2019.11.01 දින නිකුත් කෙරිණ.

- ජාත්‍යන්තර වෙළඳ කමිටුව, විදේශ කටයුතු කමිටුව, මානව හිමිකම් කමිටුව වැනි යුරෝපීය පාර්ලිමේන්තු කමිටු සහ දකුණු ආසියා නියෝජනය සමඟ සමීපතම සම්බන්ධතා පවත්වා ගැනීම තානාපති කාර්යාලය විසින් අඛණ්ඩව සිදු කෙරිණ.

- දූත මණ්ඩල ප්‍රත්‍යුත්ක්‍රමයන් සහ නිමග්නවීම් ශක්තිමත් කර ගැනීම පිණිස, ද්විපාර්ශ්වික මට්ටමේ සම්බන්ධතාවයක් ලෙස, යුරෝපා සංගම් පාර්ලිමේන්තු කණ්ඩායම් සහ කමිටුවල දේශපාලන කණ්ඩායම්වල දේශපාලන උපදේශකයින් සහ ඔවුන්ගේ සහකාර නිලධාරීන් සමඟ ක්‍රමික අන්තර් ක්‍රියා අඛණ්ඩව පවත්වා ගෙනයාමටද තානාපති කාර්යාලය උත්සුක විය.

**යුරෝපා සංගමය විසින් ත්‍රස්තවාදී සංවිධාන තහනම් කිරීම**

- දූත මණ්ඩල ප්‍රධානියා, යුරෝපීය බාහිර ක්‍රියාකාරකම් සේවාවේ, ත්‍රස්තවාද සම්බාධක ප්‍රතිපත්ති අංශයෙහි අදාල නිලධාරීන් හමුවූ අතර, එල්ටීටීඊ සංවිධානයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කරමින්, අවශ්‍ය යාවත්කාලීනවූ විස්තර නිරන්තරයෙන් සපයන ලදී.

- යුරෝපීය කවුන්සිලය, යුරෝපා සංගමයේ නිල පුවත්පතෙහි පළකරණ ලද 2019.08.08 දින අංක: සීඑෆ්එසපී/2019/25 දරණ කවුන්සිල තීරණය ප්‍රකාර, එල්ටීටීඊ තහනම තවදුරටත් මාස 6 ක කාලසීමාවක් සඳහා දීර්ඝ කරන ලදී.

- දූත මණ්ඩල ප්‍රධානියා, 2019 ජූලි මස 18 වන දින, , යුරෝපීය බාහිර ක්‍රියාකාරකම් සේවාවේ, ත්‍රස්තවාද සම්බාධක ප්‍රතිපත්ති අංශ ප්‍රධානී, ඩේවිඩ් ගීර් මහතා සමුවී, යුරෝපා සංගමයේ එල්ටීටීඊ තහනම අඛණ්ඩව පවත්වා ගෙන යාමේ කාරණය සාකච්ඡාවට භාජනය කරන ලදී.

- දූත මණ්ඩල ප්‍රධානියා, 2019 ඔක්තෝබර් මස 09 වන දින, හේග් නුවර යුරෝජස්ට් සංවිධානයේ සභාපති, ලැඩිස්ලව් හම්රාන් මහතා හමුවී, යුරෝජස්ට් සංවිධානය සමඟ ශක්තිමත් සහයෝගිතාවය සඳහා සම්බන්ධතා ස්ථාපිත කර ගැනීමට අදාල කරුණු සාකච්ඡා කරන ලදී.

- දූත මණ්ඩල ප්‍රධානියා, 2019 ජූලි මස 15 වන දින, යුරෝපා සංගමයේ ජාත්‍යන්තර පොලිස් කොමිසමෙහි විශේෂ නියෝජිත, පියරේ සෙන්ට්.හිලයිරේ මහතා හමුවී, ශ්‍රී ලංකාවේ ප්‍රති ත්‍රස්ත ප්‍රයත්නයන්හි ලා ජාත්‍යන්තර පොලිස් කොමිසමෙහි දායකත්වය සහ මැදිහත්වීම සාකච්ඡාවට භාජනය කරන ලදී.

- යුරෝපීය බාහිර ක්‍රියාකාරකම් සේවාවේ, ආසියා සහ ශාන්තිකර කළමණාකාර අධ්‍යක්ෂ, ගනර් වයිගෑන්ඩ් මහතා සමග පැවැති රැස්වීමේදී යෝජිත පරිදි, ශ්‍රී ලංකාව විසින් යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකාව අතර හමුදාමය සහයෝගිතාවය මත කෙටුම්පත් සටහනක් යුරෝපීය බාහිර ක්‍රියාකාරකම් සේවාවේ, සුරක්ෂිතතා හා ආරක්ෂා ප්‍රතිපත්ති අංශයේ සළකා බැලීම පිණිස ඉදිරිපත් කරණ ලදී.

**යුරෝපා සංගමය හා සමඟ ආර්ථික සබඳතා**

- යුරෝපීය කොමිසමෙහි බදුකරණ සහ රේගු සංගම් අධ්‍යක්ෂ මණ්ඩලය හා සමඟ විචාරණයෙන් සහ ප්‍රමන්ත්‍රණයෙන්, ලියාපදිංචි අපනයනකාර ක්‍රමවේදය යටතේ ශ්‍රී ලංකාවට බලපානා ගැටළු සම්බන්ධයෙන් විග්‍රහයන් ලබා ගැනීම තානාපති කාර්යාලය විසින් සුසාධ්‍යකරණය කෙරිණ.

- යුරෝපා සංගම් ප්‍රමිතීන්ට අනුගත නොවීම නිසා ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රේෂණ රඳවා ගැනීම සහ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන්, යුරෝපීය කොමිසම විසින් නිකුත් කර ඇති, කඩිනම් යුහුසුළු ක්‍රමවේද දැනුම්දීම් සහ ශාක සෞඛ්‍ය අන්තර්-ප්‍රතිග්‍රහණයන් පිළිබඳ දැනුම්දීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා බලධාරීන් අධීක්ෂණය හා උපදෙස් දීම තානාපති කාර්යාලය විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

- තානාපති කාර්යාලය මෙම දැනුම්දීම් සම්බන්ධයෙන් විශ්ලේෂණයක් කර, අවශ්‍ය කටයුතු යෝජනා කරමින්, ජාතික ශාක නිරෝධායන සේවයට, වාණිජ දෙපාර්තමේන්තුවට සහ අපනයන සංවර්ධන මණ්ඩලයට සවිස්තරාත්මක වාර්තාවක් යවන ලදී. කඩිනම් යුහුසුළු ක්‍රමවේද දැනුම්දීම් සංඛ්‍යාව 29 (2018) සිට 15(2019) දක්වා අඩුවීමක් නිරීක්ෂණය විය. කෙසේවුවද, ශාක සෞඛ්‍ය අන්තර්-ප්‍රතිග්‍රහණයන් පිළිබඳ දැනුම්දීම් 29(2018) සිට 49(2019) දක්වා වැඩිවී ඇත.

- තානාපති කාර්යාලය, අගෝස්තු මාසයේදී (19-23) සහ නොවැම්බර් මාසයේදී (18-22) ධරණිත පුහුණු සැසි දෙකක් (02) සංවිධානය කිරීම සම්බන්ධීකරණය හා සුසාධ්‍යකරණය කරණ ලදී. සංගත කෘමි කළමණාකරණය, අධීක්ෂණ පාලනය, ආනයන අවශ්‍යතා, නියැදීම, පරීක්ෂණ සහ අනෙකුත් අදාල ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජාතික ශාක නිරෝධායන නිලධාරීන් පුහුණු කිරීම පිණිස, වඩාත් ආරක්ෂාකාරී ආහාර ප්‍රත්‍යුත්ක්‍රමයන් අරමුණු කොටගත් වඩාත් හොඳ පුහුණුව යටතේ මෙම සැසි පවත්වන ලද්දේ සෞඛ්‍යය සහ ආහාර ආරක්ෂාව පිළිබඳ යුරෝපීය සංගම් අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.

- දූතමණ්ඩල ප්‍රධානී සහ ශ්‍රී ලාංකික වෙළඳ නියෝජිතයෝ, බෙල්ජියමේ සාධාරණ වෙළඳ සතියේදී 2019 ඔක්තෝබර් මස 10 වන දින යුරෝපා පාර්ලිමේන්තුවේ පැවැති චාර්ෂික සාධාරණ වෙළඳාම පිළිබඳ පාතරාස රැස්වීමට සහභාගී වූහ. සාධාරණ වෙළඳ කර්මාන්තය ශ්‍රී ලංකාවේ සංවර්ධනය කිරීම මත අදහස් ප්‍රකාශ කරමින් රැස්වීම ඇමතූ දූත මණ්ඩල ප්‍රධානියා, යුරෝපීය කලාපයට සාධාරණ වෙළඳ නිෂ්පාදන අපනයනය වර්ධනය කර ගැනීම පිණිස යුරෝපා සංගමයේ සහාය ඉල්ලා සිටියේය.

- තානාපති කාර්යාලය විසින්, සාධාරණ වෙළඳ උපදෙශක කාර්යාලය, ආසියාවේ ලෝක ආහාර සහ වෙළඳ සංවිධානය, වාණිජ දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ජාතික සක්‍රීයතා වෘත්තිකයින්ගේ සංගමය සහ අපනයන කෘෂි දෙපාර්තමේන්තුව සමග දුරකථන සම්මන්ත්‍රණ 5 ක් පවත්වන ලදී. සාධාරණ වෙළඳාම සඳහා සහයෝගිතා කාර්යරාමු පාඨය සහ ශ්‍රී ලංකාවේ සාධාරණ වෙළඳ නිෂ්පාදන කර්මාන්තය සංවර්ධනය කිරීම පිණිස යුරෝපා සංගම් තාක්ෂණික සහාය ලබා ගැනීම මත ව්‍යාපෘති යෝජනාවක් මෙම සම්මන්ත්‍රණාවලදී නිම කර ගන්නා ලද අතර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම පිණිස මෙම සහයෝගිතා කාර්ය රාමුව සකස් කෙරෙමින් පවතී.

- 2019 ඔක්තෝබර් මස 24 වන දින බ්‍රසල්ස්හි පැවැති වෙළඳ සහ ආර්ථික සබඳතා සහයෝගිතාවය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමේදී, යුරෝපා සංගම් තාක්ෂණික සහාය ලබා ගැනීම පිළිබඳ ව්‍යාපෘති යෝජනාවක් ශ්‍රී ලංකා දූත මණ්ඩලය විසින් යුරෝපා කොමිසමේ සංවර්ධන සහයෝගිතා අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජිතයින් වෙත ඉදිරිපත් කරන ලදී.

- තානාපති කාර්යාලය, ජීඑස්පී+ සහන පරිශීලනය විග්‍රහ කොට ගෙන, ජීඑස්පී රෙජීමය ප්‍රකාරව, ඉහළ මනාප අන්තරයන් සහිත නිෂ්පාදනවල ලැයිස්තුවක් පිළියෙළ කර, අවශ්‍ය කටයුතු සඳහා අදාල අපනයනකරුවන් අතර දැනුවත්බව නිර්මාණය කිරීම පිණිස මෙම තොරතුරු අපනයන සංවර්ධන මණ්ඩලය, වාණිජ දෙපාර්තමේන්තුව සහ ආයෝජන මණ්ඩලය අතර බෙදාහදා ගන්නා ලදී. ජීඑස්පී+ සහන පරිශීලනය 2019 වර්ෂයේදී 58% සිට 63% දක්වා වැඩි විය.

**යුරෝපීය පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායම**

- ශ්‍රී ලංකා මිත්‍රත්ව කණඩායම් ප්‍රධානී සහ යුරෝපා පාර්ලිමේන්තු සභික පේෆ්රි වැන් ඔර්ඩන් සහ යුරෝපා පාර්ලිමේන්තු සභික විලියම ඩාට්මවුත් 2019 ජනවාරි මස 3-7 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලුණාහ. මෙම පස්දින තුළ, මෙම පාර්ලිමේන්තු සභිකයන් දෙදෙනා රජයේ, විරුද්ධ පක්ෂයේ සහ දේශපාලන පක්ෂවල නියෝජිතයින් මෙන්ම නිලධාරීන් සමගද විචාරණයෙහි නිරතවූහ. වෙනත් කරුණු කාරණා අතර ජීඑස්පී+, කලාපීය ගැටළු, ආණ්ඩුකරණය සහ නීතියේ ආධිපත්‍යය, සිවිල් සමාජ ගැටළු සහ මානව හිමිකම් වැනි ක්ෂේත්‍රයන් ගණනාවක යුරෝපා සංගම්-ශ්‍රී ලංකා සහයෝගිතාවයට අදාල වන්නාවූ පොදු ලැදියාවන්ගේ ගැටළු සාකච්ඡා කිරීම පිණිස සංසදයක් මෙම රැස්වීම් තුළින් නිර්මාණය විය.
- දූත මණ්ඩල ප්‍රධානී, 2019 ජූලි මස 17 වන දින, ස්ට්‍රැස්බර්ග්හිදී ශ්‍රී ලංකා මිත්‍රත්ව කණඩායම් ප්‍රධානී සහ යුරෝපා පාර්ලිමේන්තු සභික පේෆ්රි වැන් ඔර්ඩන් හමුවූ අතර, යුරෝපා සංගම් පාර්ලිමේන්තුවේ නව සභිකයන් සමඟ මිත්‍රත්ව කණ්ඩායම යළි ක්‍රියාශීලි බවට පත් කිරීමේ ඉඩප්‍රස්තා විමසා බලන ලදී.
- දූත මණ්ඩල ප්‍රධානී, 2019 ජූලි මස 18 වන දින නව ශ්‍රී ලංකා මිත්‍රත්ව කණ්ඩායම සමඟ දිවා භෝජනයකට සහභාගී වී, ශ්‍රී ලංකාවේ වර්තමානයෙහි ඉස්මතුව ඇති තත්ත්වයන් පිළිබඳව කණ්ඩායම දැනුවත් කර, යුරෝපා සංගමය තුළ ශ්‍රී ලංකා ලැදියාවන් ප්‍රවර්ධනය කිරීම උදෙසා පාර්ලිමේන්තු සභිකයින් හා සමඟ අඛණ්ඩ අන්තර්ක්‍රියා පවත්වා ගැනීමේ අවශ්‍යතාවය උදක්ම පෙන්වා දෙන ලදී. බ්‍රෙක්සිට් යටතේ එක්සත් රාජධානි පාර්ලිමේන්තු සභිකයින් ඉවත්ව යාමෙන් පසු, ශ්‍රී ලංකා මිත්‍රත්ව කණ්ඩායමට පරිණත සභාපතිවරයෙකු පත් කරගැනීම සහ නව සාමාජිකයින් බඳවා ගැනීම වැනි, මිත්‍රත්ව කණ්ඩායම ශක්තිමත් කිරීමට අදාල කරුණු සාකච්ඡා කෙරිණ.

**යුරෝපීය සංගම් කොමිසම සහ අනෙකුත් යුරෝපී සංගම් ආයතන හා සමඟ ද්විපාර්ශ්වික අන්තර්ක්‍රියා**

- තානාපති කාර්යාලය විසින්, දැනට ඉටු වෙමින් පවතින ව්‍යාපෘති හා ගැටළු සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු ඉටු කිරීම සහ දැනට ඇති වැඩ සටහන් යටතේ නව ප්‍රස්තාවන් විමසා බැලීම පිණිස, යුරෝපීය කොමිසම යටතේ ඇති, යුරෝපීය බාහිර ක්‍රියාකාරිත්ව සේවය, ජාත්‍යන්තර සහයෝගිතා සහ සංවර්ධන අධ්‍යක්ෂ මණ්ඩලය, මානුෂීය සහාය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය, සංක්‍රමණ හා ස්වදේශ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වැනි අදාල අංශය සමඟ ක්‍රමික අන්තර්ක්‍රියා පවත්වා ගෙනයන ලදී.

**සයිප්‍රසය**

**ද්විපාර්ශ්වීය සබඳතා**

- සයිප්‍රසයේ ශ්‍රී ලංකා කොන්සල් ජනරල් කාර්යාලය එවකට ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍ය, ගරු තිලක් මාරපන මහතා සහ සයිප්‍රසයේ ස්වදේශ කටයුතු අමාත්‍ය, ගරු නිකොස් ක්‍රිස්ටෝඩව්ලිඩිස් මහතා විසින්, 2019 පෙබරවාරි මස 28 වන දින, සයිප්‍රසයේ නිකෝෂියා හිදී

නිල වශයෙන් විවෘත කෙරිණ. 2019 පෙබරවාරි මස 25-28 දක්වා හිටපු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ සයිප්‍රස් සංචාරයේදී, දෙරට අතර ද්විපාර්ශ්වීය, දේශපාලනික, සංස්කෘතිකමය සහ ආර්ථික සහයෝගිතාවය තවදුරටත් ශක්තිමත් කරලීම පිණිස, සයිප්‍රසයේ ජනාධිපතිතුමන්, විදේශ කටයුතු අමාත්‍යතුමන්, කම්කරු, සුබසාධන හා සමාජ ආරක්ෂණ අමාත්‍යතුමන් සහ ව්‍යාපාරික ප්‍රජාව සමග සාකච්ඡා මාලාවක් පවත්වන ලදී.

- නිකෝෂියා පුරපති, ලිමාසොල් පුරපති, සයිප්‍රසයේ පොලිස් ප්‍රධානී, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ කම්කරු, සුබසාධන සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය ඇතුළු රාජ්‍ය බලාධිකාරවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග ස්ථාපිත කර ගන්නා ලද සමීපස්ථ සම්බන්ධතා හරහා සහයෝගිතාවයේ ප්‍රධානතම ක්ෂේත්‍ර මෙන්ම ශ්‍රී ලාංකික ප්‍රජාව විසින් මුහුණ දෙනු ලබන ගැටළු හඳුණා ගැනීමට කොන්සල් ජෙනරාල් කාර්යාලය සමත්වී ඇත.

**ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන**

- ආර්ථික සහ ආයෝජන අභිමුඛයෙහි ප්‍රධානතම සහයෝගිතා ක්ෂේත්‍රයන් ලෙස, සමුද්‍රීය සහ සංචාරක අංශ හඳුනා ගෙන ඇත.
- සයිප්‍රස් නැව් හිමියන්ගේ සංගමයේ උප සභාපති ක්‍රිස්ටෝස් ක්‍රිසන්තෝ මහතා අප්‍රියෙල් මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ අතර, ඉදිරි වර්ෂවලදී ඒ හා සමාන සංචාර හුවමාරුව සැලසුම්ගතව ඇත. තවද, ප්‍රථම වරට 2019 ඔක්තෝබර් 6-9 දක්වා සයිප්‍රසයේ පැවැති 2019- සමුද්‍රීය සයිප්‍රස් ජාත්‍යන්තර සමුළුවට ශ්‍රී ලංකාවට ආරාධනය කෙරිණ. මෙය සයිප්‍රස් රජය විසින් සත්කාරය සලසනු ලබන සහ අර්ධ වාර්ෂිකව පවත්වනු ලබන මුඛ්‍යතම ජාත්‍යන්තර/කලාපීය සමුළුවකි.
- ශ්‍රී ලංකාව සයිප්‍රසයේ සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම වසර තුළ ඇරඹුණි. සයිප්‍රසයේ ප්‍රධානතම චාරිකා නියෝජිතායතනයන් තුනක් වන ටොප් කිනිසිස්, ක්සෙනොස් සහ ලූයී ට්‍රැවල් යන සමාගම් ශ්‍රී ලංකාවේ චාරිකා සමාගම් සමග සහයෝගිතාවය ස්ථාපිත කර ගත් අතර, 2019 සහ 2020 වසරවල රටින් බැහැර සංචාර ඉලක්ක කර ගනිමින් ස්වකීය ප්‍රවර්ධන නාමාවලි/ ස්ථානවල ශ්‍රී ලංකාව ප්‍රචාරය කිරීමට සයිප්‍රස් ජාතික සමාගම් පියවර ගත්හ.
- සයිප්‍රසයේ ශ්‍රී ලංකා සංචාර ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සයිප්‍රසයේ විශේෂඥ මහජන සම්බන්ධතා සමාගම් තුනකින් වාර්තා ලබා ගන්නා ලද අතර, ඉන් හොඳම උපායමාර්ග/යෝජනා ශ්‍රී ලංකාවේ සහ සයිප්‍රසයේ අදාල රාජ්‍ය සහ පෞද්ගලික පාර්ශ්වකරුවන්ගේ සහයෝගයෙන් ක්‍රියාත්මක කෙරෙනු ඇත.
- සයිප්‍රස් මුදල් අමාත්‍යාංශයේ ආරාධනය මත, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් යුත් සිවි සාමාජික නියෝජිත පිරිසක් ඔක්තෝබර් මස 29-31 කාලය තුළ නිකොෂියාහිදී, දෙරට අතර ද්විත්ව බදුකරණය වළක්වාලීමේ ගිවිසුම පිළිබඳ ප්‍රමන්ත්‍රණයේ දෙවන වටය සාර්ථකව නිම කළහ.

**සංස්කෘතික සහයෝගිතාවය**

- සයිප්‍රසය පුරා විසිරී තිබූ ශ්‍රී ලාංකික සංස්කෘතික සමිති සමාගම් සහ කණ්ඩායම් එක පියසක් යටතේ ප්‍රතිසංවිධානය කිරීමෙන් පසු, සම්ප්‍රදායික සංස්කෘතික ප්‍රසංග කිහිපයක්ම, සයිප්‍රසයෙ නගර සභා, පොලිසිය සහ රාජ්‍ය නොවන ආයතනවල සහයෝගයෙන් සයිප්‍රසයේ ප්‍රධාන නගර කිහිපයක සාර්ථකව පැවැත්විණ.

  බෞද්ධ සහ කතෝලික සංගම් සමග ස්ථාපිත කරන ලද සමීපස්ථ සහයෝගිතාවය නිසා ශ්‍රී ලංකාවේ සාරවත සංස්කෘතික උරුමය සහ සංචාරක ආකර්ෂණයන් ප්‍රදර්ශනය කරමින් ආගමික සහ සංස්කෘතික උත්සව ගණනාවක්ම සංවිධානය කිරීමට හැකිවිය.

**ශ්‍රමික සුබසාධනය**

- දේශීය සංඛ්‍යාලේඛන අනුව, 6500 ක් පමණ වන ශ්‍රී ලාංකිකයන් පිරිසක් දැනට සයිප්‍රසයේ ගෘහස්ථ, කම්කරු සහ අර්ධ පුහුණු කම්කරු අංශවල සේවය කරති. 2019 පෙබරවාරි මාසයේදී ගරු ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යතුමන් සහ සයිප්‍රසයේ කම්කරු, සුබසාධන සහ

සමාජ ආරක්ෂණ ගරු අමාත්‍යතුමන් අතර පැවැති මූලික සාකච්ඡාවලදී, ශ්‍රී ලාංකිකයින් විධිමත්ව සහ සදාචාර සම්පන්නව බඳවා ගැනීමේ ක්‍රියාදාමය ශක්තිමත් කිරීම පිණිස, ශ්‍රී ලාංකික මිනිස් ශ්‍රමය සේවයේ යෙදවුම් ක්ෂේත්‍රයට අදාල ශ්‍රී ලංකාව සහ සයිප්‍රසය අතර ද්විපාර්ශ්වීය ගිවිසුම කඩිනමින් පරිසමාප්ත කරලීම පිණිස සමීපස්ථ උපදේශනය අඛණ්ඩව පවත්වා ගෙන යාමට දෙපාර්ශවයම එකඟ වන ලදී. වත්මන් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය යටතේ, අඩු වැටුප් ලබන සංක්‍රමණ ශ්‍රමිකයින් විසින් මුහුණ පා ඇති දුෂ්කරතා අදාල බලධාරීන්ගේ අවධානයට ලක් කරන ලද අතර, මේ සම්බන්ධයෙන් වැඩිමනත් විචාරණයන් අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

- ශ්‍රී ලාංකික සේවකයින් මුහුණ පා ඇති දුෂ්කරතා අවම කිරීම පිණිස සේවක දුක්ගැනවිලි හැසිරවීමේ ක්‍රමවේදය ධනාත්මකව හා කාර්යක්ෂමව වැඩි දියුණු කර ඇත. දේශීය නීති/රෙගුලාසි, සුබ සාධන ප්‍රතිලාභ, සෞඛ්‍යය හා සුරක්ෂිතභාවය පිළිබඳ හෝඩුවාවන්, කොන්සියුලර් කරුණු ආදියට අදාල සියළුම තොරතුරු සමාජ මාධ්‍ය, තොරතුරු පත්‍රිකා සහ විසි හතර පැය පුරා ක්‍රියාත්මක ඇපකැපවූ සහායක දුරකථන මාර්ග ඔස්සේ කලට වේලාවට බෙදා හැරීම නිසා ශ්‍රී ලාංකික සංක්‍රමණ ශ්‍රමිකයින්ගේ ජීවන/සේවා තත්ත්වයන් ඉතා ඉහළ මට්ටමකට වැඩි දියුණු කිරීමට හැකිවිය. සදාචාරාත්මක බඳවා ගැනීම්, ශ්‍රමික/සුබසාධන රෙගුලාසි සහ සේවක දුක්ගැනවිලි සක්‍රීයව හැසිරවීම සම්බන්ධයෙන් දැනුම ලබාදීම පිණිස සයිප්‍රසයේ සහ ශ්‍රී ලංකාවේ කොටස්කාර සංවිධානයන් හා සමග සමීපස්ථ සම්බන්ධවෙමින්, ප්‍රධානතම සේවා නියුක්ති නියෝජිතයින් 35 දෙනෙකු සහ ඔවුන්ගේ සම-පාර්ශ්වකරුවන් උදෙසා කේවල උපදේශන පවත්වා ඇත.
- ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය හා සමඟ ස්ථාපිත කර ගත් සමීපස්ථ සහයෝගය යටතේ දැඩි ලෙස රෝගාතුර වූ හා ආබාධිතත්වයට පත් ශ්‍රී ලාංකික සංක්‍රමණ ශ්‍රමිකයින් ගණනාවක් සියරට ගෙන්වා ගන්නා ලදී.

**චෙකොස්ලෝවැකියා ජනරජය**

දැනට චෙකොස්ලෝවැකියා ජනරජයට ප්‍රතිනතය කර ඇති ඔස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සපුරා ගත් ක්‍රියාකාරකම්

- ශ්‍රී ලංකාවේ දේශපාලනමය ලැදියාවන් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කර ගැනීම පිණිස චෙක් බලාධිකාරවල ඉහළ පෙළ නිලධාරීන් හා සමග පවත්වා ගෙන යනු ලබන සමීපස්ථ අන්තර්ක්‍රියා. ශ්‍රී ලංකාවේ ගරු කොන්සල්වරයාගේ සහාය ඇතිව ප්‍රේග් හි ශ්‍රී ලාංකිකයන්ට අදාල කරුණු වලදී මැදිහත්වීම.

**සංස්කෘතික ක්‍රියාකාරකම්**

- ශ්‍රී ලංකාවේ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිතයින්ට ගෞරව වශයෙන්, "ශ්‍රී ලංකාව වෙනුවෙන් චෙක් වාසින්" නම් වූ ආධාර පිණිස වූ ප්‍රසංගයට සහභාගී වීම.
- 2019 ජූනි මස 01 වන දින, ප්‍රේග් හි පැවති, මාර්ටිනු ෆිල්හාමෝනික් ෂින් සහ මැසෝසොප්‍රානිස්ට් මාසෙලා කුකරෝවා ප්‍රසංගයට සහභාගී වීම

**ප්‍රංශය**

**ද්විපාර්ශ්වීය සබඳතා**

**සම්මන්ත්‍රණ /සමුළු**

- 2019 ජනවාරි මාසයේදී පැවැති, අයිඑස්අයිඑස් සංවිධානය පැරදවීමේ ගෝලීය සන්ධාන රැස්වීමට සහභාගිවීම පිණිස ශ්‍රී ලංකා දූත පිරිසකගේ සංචාරය
- විදේශ සබඳතා අමාත්‍යාංශයේ හා ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් මෙන්ම පැරිසියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිලධාරීන්ගෙන් සමන්විත දූත පිරිසක්, මෙම රැස්වීමෙන් පරිබාහිරව ප්‍රංශයේ ස්වකීය ප්‍රතිපූරකයින් හමුවිය.

**ද්විපාර්ශ්වීය සම්මුති/ගිවිසුම්**

- විදේශ සබඳතා අමාත්‍යාංශයේ, ආගමන දෙපාර්තමේනතුවේ සහ පැරිසියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිලධාරීන්ගෙන් සමන්විත දූත පිරිසක් යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ප්‍රතිප්‍රවේශ සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම් කෙටුම්පත සම්බන්ධයෙන් 2019 ජනවාරි මස ප්‍රංශය හා සමඟ ප්‍රමන්ත්‍රණයෙහි යෙදුණි.
- මිනිස් ජාවාරම්, සරණාගත ක්‍රමවේද අපහරණය, ත්‍රස්තවාදය සහ මායිම් අතික්‍රමණ සංවිධානාත්මක අපරාධ මර්දනය කිරීම පිණිස මෙම ප්‍රමන්ත්‍රණයන් අතිශයින් වැදගත්ය.

**ද්විපාර්ශ්වීය රැස්වීම්**

- ශ්‍රී ලංකා-ප්‍රංශ මිත්‍රත්ව කණ්ඩායමේ (ප්‍රංශ ජාතික මන්ත්‍රණ සභාවේ සාමාජිකයින් සහ අතිගරු තානාපති, බී.කේ. අතාවුද මහතාගේ ප්‍රධානත්වයෙන්, ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිලධාරීන්) පාතරාස රැස්වීම 2019 ජූනි මස 26 වන දින ජාතික මන්ත්‍රණ සභාවේ, පෙටිට් හෝටලයේදී පැවැත්විණ.
- ශ්‍රී ලංකා- ප්‍රංශ මිත්‍රත්ව කණ්ඩායම ස්ථාපිත කිරීමට අදාල ආරම්භක වැඩ කටයුතු ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී පැවැත්විණ.

**සංවර්ධනය සඳහා වූ ප්‍රංශ නියෝජිතායතනය**

- සංවර්ධනය සඳහා වූ ප්‍රංශ නියෝජිතායතනය සහ ශ්‍රී ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුව අතර සංවාදය 2019 මාර්තු මස, ප්‍රංශයේදී.
- ණය ගිවිසුම සකස්කිරීම නිම කෙරිණ.

**බහුපාර්ශ්වීය සබඳතා**

**යුනෙස්කො විධායක මණ්ඩලය**

2019 අප්‍රියෙල් මාසයේදී, ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලය, 206 වන යුනෙස්කො විධායක මණ්ඩල සැසියේදී, විධායක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකා රජය නියෝජනය කරන ලදී.

- මහා සම්මේලනයෙදී ලත් අධිකාරී බලය යටතේ ක්‍රියා කරමින්, මණ්ඩලය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කරන ලද සංවිධාන කටයුතු සඳහා වන වැඩ සටහන සහ අනුරූපී අයවැය ඇස්තමේන්තු විභාග කරයි.
- යුනෙස්කො සංවිධානයේදී, ගෝලීය වැඩ සටහන පිළිබඳ මතකය
- යුනෙස්කො සංවිධානය විසින්, අදාල සවිස්තරාත්මක සමාලෝචනයෙන් පසු, ගෝලීය වැඩ සටහන ආරම්භ කළ වහාම, එම වැඩසටහනෙහි "ත්‍රිපිටකය" ලේඛනගත කිරීම පිණිස ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලය කටයුතු කරමින් සිටී.
- 2019 නොවැම්බර් මාසයේදී පැවැති යුනෙස්කො මහා සම්මේලනය, ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලය විසින් නියෝජනය කෙරිණ.

**යුනෙස්කො අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් පිළිබඳ අන්තර-රාජ්‍ය කමිටු රැස්වීම**

- ජාත්‍යන්තර විවරණ කාර්යාංශය

**පෝර්ජියාව**

**ද්විපාර්ශ්වීය සබඳතා**

- තානාපතිතුමා, 2019 මැයි මස 27 වන දින, පෝර්ජියාවේ විදේශ කටයුතු අමාත්‍ය, අතිගරු ඩේවිඩ් ෂල්කාලියානි මහතා හමු වී, ශ්‍රී ලාංකික ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකිරීම සහ නීති විරෝධී ශ්‍රී ලාංකික සංක්‍රමණිකයින්ට අදාල ගැටළු සාකච්ඡාවට භාජනය කරන ලදී.

- තානාපතිතුමා, අක්ත පත්‍ර ප්‍රදාන උත්සවයේදී, දෙරට අතර වෙළඳාමට සහ සංචාරයට අදාල නොවිසඳී ඇති දේශපාලනමය උපදේශනයන් හා සහයෝගිතාවයන් පැවැත්වීමේ ක්‍රම සහ විධි කඩිනම් කිරීම සම්බන්ධයෙන් ජෝර්ජියා ජනාධිපති, අතිගරු සලෝම් ෂුවර්බිච්විලි මහතා සමග සාකච්ඡා පැවැත්විය.
- තානාපතිතුමා, වැඩබලන විදේශ කටයුතු අමාත්‍ය, බාටුනා ටොටියාඩිෂෙක් මහත්මිය, සන්ධාන ප්‍රධානී, තියා වස්ද්සේ මහත්මිය, සහ ආසියා හා ශාන්තිකර අධ්‍යක්ෂ ජනරාල්, ඩේවිඩ් කෙරෙෂෙලිඩ්ශේ මහතා සමුවී, ජෝර්ජියාවේ පැවැත්විය යුතුව ඇති දේශපාලනමය උපදේශනය, දැනටමත් කටයුතු අවසන් කර ඇති ගිවිසුම් සහ අවබොධතා ගිවිසුම් අත්සන් තැබීම, නිශ්චය කර නොමැති ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් කඩිනම් කිරීම ගැන අදහස් හුවමාරු කර ගත්හ. තවද, අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ, ආගමන මායිම් මුර සංචාරක පොලිසිය සහ විනිසුරු මන්දිරයේ නිලධාරීන් හා සමඟ පැවැති විස්තරාත්මක සාකච්ඡාවලදී, ජෝර්ජියාවේ අධ්‍යාපනය ලබන ශිෂ්‍යයින්ට අදාල ආගමන ගැටළු නිරාකරණය කර ගැනීමටද සමත් විය.

**අධ්‍යාපනය**

- තානාපතිතුමා, ටිබිලෂි රාජ්‍ය වෛද්‍ය විශ්ව විද්‍යාල ප්‍රධානී, මහාචාර්ය ෂුරාබ් වඩච්කොරියා මහතා සමුවී, ශිෂ්‍යයින්ගේ සුබසාධනය සහ වීසා ලබා ගැනීමේදී සිදුවන දීර්ඝ ප්‍රමාදය නිසා ඔවුන් මුහුණ පා ඇති දුෂ්කරතා සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගත්තේය. එසේම, ශ්‍රී ලාංකික හා ජෝර්ජියානු විශ්ව විද්‍යාල අතර සහයෝගිතාවය ශක්තිමත් කිරීම පිණිස යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීමද සාකච්ඡාවට භාජනය විය.

**ස්ලෝවැකියාව**

සමගාමීව ස්ලෝවැකියාවට ප්‍රතීතනය කර ඇති ඔස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සපුරාගත් ක්‍රියාකාරකම්

දූතමණ්ඩලය, ස්ලෝවැකියා රජයේ මෙන්ම විදේශ සහ යුරෝපීය කටයුතු අමාත්‍යාංශයේ, විශේෂයෙන්ම ආසියා සහ ශාන්තිකර සහ සන්ධාන දෙපාර්තමේන්තුවල නිලධාරීන් සමග සමීපස්ථ සබඳතා පවත්වා ගෙන ඇත.

- 2019 දෙසැම්බර් මස 17 වන දින, තානාපති අක්තපත්‍ර ප්‍රදානයෙදී, ස්ලෝවැක් ජනරජයේ ජනාධිපති, අතිගරු සුසානා කැපුටෝවා මහත්මිය සමග රැස්වීම
- 2019 දෙසැම්බර් මස 16 වන දින, ස්ලෝවැක් විදේශ කටයුතු අමාත්‍යාංශයේ, දේශපාලන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් තානාපති රෝමන් බ්‍රුසෙක් මහතා සමග රැස්වීම. දෙරට අතර ද්විපාර්ශ්වීය දේශපාලන උපදේශනයන් යළි ඇරඹීම සාකච්ඡා කෙරිණ.
- ශ්‍රී ලංකාවට අදාල කරුණු කාරණා සම්බන්ධයෙන්, ආසියා සහ ශාන්තිකර දෙපාර්තමේන්තුවේ ටොමස් කුඩිලකැක් මහතා සහ සන්ධාන දෙපාර්තමේන්තුවේ, ඇලෙක්සැන්ද්‍රා පෙන්කෝවා මහත්මිය සමග ක්‍රමික අන්තර් ක්‍රියා.

**සංස්කෘතික සබඳතා/සංචාරණය**

- 2019 වසරේදී, ස්ලෝවැකියාවේ නිට්‍රා හි, 46 වන ජාත්‍යන්තර කෘෂිකර්ම සහ ආහාර ප්‍රදර්ශනයේදී, ශ්‍රී ලංකාව නියෝජනය කෙරිණ.
- උසස් තත්ත්වයෙන් යුත් ශ්‍රී ලාංකික කෘෂිකර්ම නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලද අතර, වෙළඳපළ ක්‍රියාකාරීන් සමඟ ප්‍රතිලෝම බන්ධකයන් (backward linkages) ස්ථාපිත කර ගැණින.

දෙසැම්බර් මස 17 වන දින, ස්ලොවැක් වෙළඳ මණ්ඩලයේ (ආහාර, කෘෂිකර්ම හා වන සම්පත් කළමණාකරණය) අධ්‍යක්ෂ සහ බ්‍රැටිස්ලාවාහි ශ්‍රී ලංකා කොන්සල් ජෙනරාල් පීටර් ගබාලෙක් මහතා සමග රැස්වීම. ආහාර සහ කෘෂිකර්ම අංශයන්හි සම්පූර්ණ වෙළඳ සම්භාව්‍යතාවය සාක්ෂාත් කර ගැනීම සහ 'ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට' සහ 'ව්‍යාපාරයෙන් පාරිභෝගිකයාට' සම්බන්ධතා සාකච්ඡාවට ගැණින

- 2019 දෙසැම්බර්මස 17 වන දින, ස්ලොවැක් වෙළඳ මණ්ඩලයේ (චාරිකා සහ සංචාරක) අධ්‍යක්ෂ සමග රැස්වීම
- ශ්‍රී ලංකාවේ චාරිකා, විවේක සහ සංචාරණ අංශවල ආයෝජන ඉඩ ප්‍රස්තා සහ 'ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට' සහ 'ව්‍යාපාරයෙන් පාරිභෝගිකයාට'සම්බන්ධතා සාකච්ඡාවට භාජනය කෙරිණ.

**ජර්මනිය - බර්ලින්, ස්විට්සර්ලන්තය, ක්‍රෝෂියාව, උතුරු මැසඩෝනියාව සහ මොන්ටිනෙග්‍රෝ වෙත සමගාමීව අක්ත ගන්වා ඇත**

**ද්විපාර්ශ්වීය සබඳතා**

දූත මණ්ඩලය, ශ්‍රී ලංකාව සහ සත්කාරක රට/ සමගාමීව අක්ත ගන්වා ඇති රටවල් අතර ද්විපාර්ශ්වීය සබඳතා ශක්තිමත් කිරීමේ අරමුණින්, පහත දැක්වෙන සංචාර ඇතුළු ඉහළ පෙළ සංචාර ගණනාවක්ම අරඹා සුසාධ්‍යකරණය කෙරිණ

1. ජාත්‍යන්තර චාරිකා වෙළඳ ප්‍රදර්ශණයකට (අයිටීබී) සහභාගීවීම පිණිස සංචාරක හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය, ගරු ජෝන් අමරතුංග මහතාගේ ජර්මන් සංචාරය
2. 4 වන ජර්මාණු-ආසියානු ව්‍යාපාරික සංවාදයට සහභාගී වීම පිණිස අග්‍රාමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ වරාය හා නාවික සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මහතාගේ සංචාරය
3. ජර්මාණු- දකුණු ආසියා පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායමෙන් ලද ආරාධනයකට අනුව, ගරු කුමාර වෙල්ගම මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් පාර්ලිමේන්තු නියෝජිත පිරිසක් බර්ලිනයේ සංචාරයක යෙදීම
4. "කාන්තා අයිතිවාසිකම්, අනුස්මරණ සංස්කෘතිය සහ සංහිඳියාව" මත ආරාධිත වැඩසටහනකට අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගරු තලතා අතුකෝරළ මහත්මියගේ චාරිකාව
5. 2019 - අනුගා වැඩ සටහනට සහභාගීවීම පිණිස සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍ය, ගරු නලින් බණ්ඩාර මහතාගේ චාරිකාව
6. ශ්‍රී ලංකාවේ ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය විසින් අධ්‍යයන චාරිකාවක යෙදීම
7. 2019 අගොස්තු මස 29 වන දින කොළඹදී පැවැති ශ්‍රී ලංකා-ජර්මන් ආනුෂංගික සේවා සම්මන්ත්‍රණයට සහභාගී වීම පිණිස, ප්‍රවාහන සහ ඩිජිටල් යටිතල ව්‍යුහ සමූහාණ්ඩු අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය සහ පාර්ලිමේන්තු රාජ්‍ය ලේකම්, ස්ටෙෆන් බිල්ගර් මහතා දිවයිනට පැමිණීම

**ස්විට්සර්ලන්තය**

- 2019 මැයි මස 09 වන දින, බර්ලින් හි පැවති, ස්විට්සර්ලන්තය හා සමඟ 2 වන විදේශ කාර්යාලීය උපදේශනය සම්බන්ධීකරණය කෙරිණ.
- සත්කාරක රට සහ සමගාමීව අක්ත ගන්වා ඇති රටවල් අතර ද්විපාර්ශ්වීය සබඳතා ශක්තිමත් කිරීම පිණිස අදාල සමූහාණ්ඩු අමාත්‍යාංශ සහ අනෙකුත් වැදගත් ආයතනවල ජ්‍යෙෂඨ නිලධාරීන් ගණනාවක් හා සමඟ රැස්වීම් පවත්වන ලදී.
- ශ්‍රී ලංකාවේ ස්විස් තානාපති කාර්යාල මණ්ඩල සාමාජිකයා සම්බන්ධයෙන් ඇතිවූ බව කියැවෙන සිද්ධිය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම පිණිස ස්විට්සර්ලන්ත විදේශ කටයුතු රාජ්‍ය ලේකම්, පී.බාරිස්විල් මහතා සමග රැස්වීම. ශ්‍රී ලංකාව උනන්දුවක් දක්වන ගැටළු සම්බන්ධයෙන් සත්කාරක/ප්‍රතීතන රටවලින් සහයෝගය ඉල්ලා සිටීම.
- හිටපු විදේශ අමාත්‍ය, ගරු ලක්ෂ්මන් කදිර්ගාමර් මහතාගේ ඝාතනයට අදාල අධිකරණ නඩු විභාගය සම්බන්ධයෙන් ස්ටට්ගාට් කලාපීය මහාධිකරණය, අභිචෝදක ජනරාල් කාර්යාලය, විදේශ කාර්යාලය සහ අධිකරණ අමාත්‍යාංශය සමග පසුවිපරම් කටයුතු.

එල්ටීටීඊ සංවිධානය සහ ඒ හා අනුබද්ධිත සංවිධාන යුරෝපා සංගම් ලයිස්තුගත, කිරීම අබණ්ඩව පවත්වාගෙන යන ලෙස සත්කාරක / සමගාමීව අක්ත ගන්වා ඇති රටවල්වල රජයන්ගෙන් සහය ඉල්ලා පෙළඹවීම සිදු කෙරිණ. සත්කාරක /ප්‍රතීතන රටවල්වල ක්‍රියාත්මක වන එල්ටීටීඊ හිතවාදී කණ්ඩායම්වල ප්‍රචාරක කටයුතු අධීක්ෂණය කරමින් ප්‍රතිපක්ෂව කටයුතු කිරීම.

- ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නියෝජිත පිරිස් සහ වැදගත් සමූහාණ්ඩු අමාත්‍යාංශ/ආයතන අතර රැස්වීම් සංවිධානය කිරීම
- 2019 මැයි මස 7 වන දින සහ නොවැම්බර් මස 29 වන දින පිළිවෙළින් එසන් හා මියුනිච් නගරවලදී ජර්මනියේ / සවිට්සර්ලන්තයේ ශ්‍රී ලංකා ගරු කොන්සල් ජනරාල්වරුන්ගේ සහභාගිත්වය ඇතිව කොන්සල් ජනරාල් රැස්වීම් පවත්වන ලදී.
- ෆ්‍රෙයිබර්ග් සහ ටුබින්පෙන් රාජ්‍ය දිස්ත්‍රික් ආවරණය වන අධිකරණ පාත්‍රතාවය සහිතව රඩොල්ෆසල් හි ශ්‍රී ලංකාව සඳහා නව කොන්සල් ජනරාල්වරයෙකු පත් කෙරිණ.
- ක්‍රෝෂියා, මැසඩෝනියා සහ මොන්ටෙනෙග්‍රෝහි ශ්‍රී ලංකාව සඳහා ගරු කොන්සල් ජනරාල්වරුන් පත්කිරීමේ ක්‍රියාදාමය ආරම්භ කෙරිණ.
- ජර්මන් පත්‍ර කලාවේදියෙකු විසින් බර්ලින්හි සංවිධානය කරණ ලද, සිංහළ චිත්‍රපට 3 ක් තිරගත කිරීමට සහභාගි වන ලද අතර, ශ්‍රී ලංකාවේ පවතින අර්බුදය සම්බන්ධයෙන් වර්ගවාදී අර්ථ නිරූපණයක් නිර්මාණය වන අන්දමේ මත/කරුණු අවනිදේශනය සම්බන්ධයෙන් මැදිහත්වීමක් සිදු කරන ලදී.

**බහුපාර්ශ්වීය සබඳතා**

- බොහෝ ලෝක/ජාත්‍යන්තර සංවිධානවල හෝ ආයතනවල ශ්‍රී ලංකා අපේක්ෂකත්වය සඳහා සත්කාරක/ සමගාමීව අක්ත ගන්වා ඇති රටවල සහාය ඉල්ලා පෙළඹවීම් කෙරිණ.
- බොහෝ ලෝක/ජාත්‍යන්තර සංවිධානවල හෝ ආයතනවල ස්වකීය අපේක්ෂකත්වය සඳහා සහාය ඉල්ලමින් සත්කාරක/ සමගාමී අක්ත ගන්වා ඇති රටවල් වලින් කෙරෙන විවිධ ඉල්ලීම් යොමු කෙරිණ.
- සත්කාරක/ප්‍රතීතන රටවල එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන හෝ වෙනත් බහුපාර්ශ්වීය ආයතනවල ශ්‍රී ලංකා සහභාගිත්වය සහ නියෝජනය සම්බන්ධීකරණය කෙරිණ.
- 2019 ඔක්තෝබර් මස 15 වන දින, ජර්මනියේ පරිසර, සොබාදම් සංරක්ෂණය සහ න්‍යෂ්ටික සුරක්ෂිතතා සමූහාණ්ඩු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද, ගෝලීය ප්ලාස්ටික් දූෂණය පිටුදැකීම - ජාත්‍යන්තර ප්‍රඥප්තියක් කරා ගමන් මග පිළිබඳ සාකච්ජාවේදී ශ්‍රී ලංකාව නියෝජනය කෙරිණ.
- බොන් හි, දේශගුණික විපර්යාශ මහ ලේකම් කාර්යාලය හා සම්බන්ධීකරණයෙන්, ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් හි පවත්වන ලද එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සම්මන්ත්‍රණයේ 25 වන සැසියේ සහභාගිත්වය සුසාධ්‍යකරණය කෙරිණ.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

- 14 වන ආසියා ශාන්තිකර සතියේ තානාපති දින උත්සවයට සහභාගීවීම සහ සම්භාව්‍ය ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව මත ව්‍යාපාරික සම්මන්ත්‍රණයකට සත්කාරය දක්වන ලදී.
- 2019-අනුග ප්‍රදර්ශනය ඇතුළු ඉලක්කගත වෙළඳ ප්‍රදර්ශනවල සහභාගිත්වය හරහා අපනයන ප්‍රවර්ධනයෙහි, සම්භාව්‍ය වෙළඳ සහ සේවා අංශ ප්‍රවර්ධනයෙහි, අංශ-විශේෂිත ප්‍රවර්ධන ඉසව් සංවිධානයෙහි සහ ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට රැස්වීම් සඳහා අන්තර්නමය සහ බහිර්ගාමී නියෝජන සංවිධානයෙහි නියැලෙන ලදී.
- 2019 ජූනි මස 4-7 දකවා මියුනිච්හි පැවති ප්‍ර 2019- වාහන ආනුෂංගික සේවා ප්‍රදර්ශනයේ සහභාගිත්වය සුසාධ්‍යකරණය සහ සම්බන්ධීකරණය කෙරිණ.
- 2019 නොවැම්බර් මස 12-15 දක්වා මියුනිච් හි පැවැති නවොත්පාදන විසඳුම්වලට අදාල විද්‍යුත් සහ විදුලි නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි ලොව විශාලතම අර්ධ වාර්ෂික වෙළඳ ප්‍රදර්ශනයක්

වන 2019- ප්‍රඩක්ට්‍රොනිකා ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා සහභාගිත්වය සම්බන්ධීකරණය හා සුසාධ්‍යකරණය කෙරිණ.

- 2019 ඔක්තෝබර් 16-19 දක්වා, මියුනිච්හි පැවැති 'ජෙම් වර්ල්ඩ්' - මැණික් හා ස්වරණාභරණ වෙළඳ ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා සහභාගිත්වය සුසාධ්‍යකරණය සහ සම්බන්ධීකරණය කෙරිණ.
- 2019 නොවැම්බර් 16-19 දක්වා ඩස්ල්ඩෝර්ෆ්හි පැවැති ලොව විශාලතම වෛද්‍ය වෙළඳ ප්‍රදර්ශනය වන 'මෙඩිකා' ප්‍රදර්ශනයේදී, 'මෙඩිකා' 2019 රාජතාන්ත්‍රික සංචාර ඉසව්වෙහි සහභාගිත්වය
- බර්ලිනයෙහි පැවැති ලෝකයේ විශාලතම ආහාර සහ කෘෂිකාර්මික වෙළඳ ප්‍රදර්ශනයන්ගෙන් එකක් වන 2019- ග්‍රීන් වීක් ප්‍රදර්ශනයෙහි ශ්‍රී ලාංකික සමාගම්වල සහභාගිත්වය සුසාධ්‍යකරණය කෙරිණ.
- සම්භාව්‍ය ආනයනකරුවන් හමුවීමට සහ තම නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට හැකිවන හමුවීම් වේදිකාවක් වන පරිදි, ශ්‍රී ලංකා අපනයනකරුවන් සඳහා ඩිජිටල් වේදිකාවක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කෙරිණ.
- නත්තල් සමයේදී, 4 වන ජර්මාණු-ආසියානු ව්‍යාපාරික සංවාදයෙහි සහ ස්ටෙගලිට්ස් හි අතිශයින් ආකර්ෂණීය සාප්පු සංකීර්ණයක් වන 'ඩාස් ස්ච්ලොස් 'හි තේ ප්‍රවර්ධන ඉසව් සංවිධානය කෙරිණ.
- පහත දැක්වෙන ඉසව් ඇතුළු ආර්ථික සහ වෙළඳ අන්තර්ක්‍රියා ප්‍රවර්ධනය සඳහා ජර්මනියේ කලාපවල සහ ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාරික ප්‍රජාවන් හා සමඟ පැවැත්වෙන රැස්වීම්වලට තානාපතිතුමන්/ රාජ තාන්ත්‍රික නිලධාරීන් නිතර සහභාගී වෙති;

- ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන සමූහාණ්ඩු අමාත්‍ය, ආචාර්ය ජර්ඩ් මුලර් සමග දිවා භෝජනය
- ජර්මනිය හා ශ්‍රීලංකාව අතර වෙළඳ සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ මාර්ග සම්බන්ධයෙන්, ජර්මන් වාණිජ හා කර්මාන්ත වෙළඳ මණ්ඩල සංගමයේ, ඇන්ඩ්‍රියස් හර්පෙන්රොදර් මහතා සමග රැස්වීම
- ජර්මනියේ සහ අනෙකුත් ප්‍රතීතන රාජ්‍යවල වාණිජ වෙළඳ මණ්ඩල සමග රැස්වීම්
- ජර්මනියේ, ශ්‍රී ලංකන් ගුවන් සේවයේ නියෝජිතයින් සමග රැස්වීම
- ජර්මනියේ චාරිකා මෙහෙයුම්කරුවන් සමග රැස්වීම

- බර්ලින් බලශක්ති සංක්‍රාන්ති සංවාදයේදී තානාපතිතුමන්ගේ උපදේශනයට සහභාගී වීම
- 2019- බර්ලින් මෝස්තර සතියේදී ශ්‍රී ලාංකික මෝස්තර නිර්මාණශිල්පී, අමේශ් විජේසේකර මහතාගේ සහභාගිත්වය සුසාධ්‍යකරණය කෙරිණ.
- ජාත්‍යන්තර අයිටිබී - ජාත්‍යන්තර චාරිකා වෙළඳ ප්‍රදර්ශනය, ජර්මනියේ සීඑම්ටී ප්‍රදර්ශනය සහ සවිට්සර්ලන්තයේ, ෂුරිච්හි ෆෙස්පෝ ප්‍රදර්ශනය ඇතුළු ජර්මනියේ සහ ප්‍රතීතන රටවල ප්‍රධානතම වෙළඳ ප්‍රදර්ශනවල ශ්‍රී ලංකා සහභාගිතවය දූත මණ්ඩලය විසින් සම්බන්ධීකරණය කෙරිණ.
- 2019 ඔක්තෝබර් මස 7 වන දින බර්ලින් හි පැවති තරුක් සංචාරක මාර්ග ප්‍රදර්ශනයට සහභාගී වන ලදී.

**සංස්කෘතික සබඳතා**

- බර්ලින්හිදී, පෙබරවාරි 6 සහ 4 දින වල පිළිවෙළින් රාජතාන්ත්‍රික දූත මණ්ඩල සහ ශ්‍රී ලාංකික ඩයස්පෝරාව සඳහා වෙන වෙනම උත්සව සහිතව නිදහස් දිනය සැමරීම දූත මණ්ඩලය විසින් සිදු කෙරිණ.
- ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහභාගිත්වය ඇතිව සිංහළ හා දමිළ නව වසර, වෙසක්, රාමදාන්, දීපාවලි සහ නත්තල ඇතුළු ජාතික, සංස්කෘතික සහ ආගමික ඉසව් සංවිධානය කිරීමෙහි සහ සහභාගීවීමෙහි ලා දූත මණ්ඩලය විසින් මූලාරම්භය ගනු ලැබිණ.
- පාස්කු ඉරිදා ප්‍රහාරයේදී මියගිය පුද්ගලයින් සමරා අනුස්මරණ ඉසව් ගණාණාවක්ම, එනම්: ඉටිපහන් ආලෝක සාමකාමී සභාය, යාඥා කිරීම්, ශෝක ප්‍රකාශ පොත් විවෘතකර තැබීම ආදිය, පවත්වන ලදී.

- 2019 සැප්තැම්බර් මස 19 සහ 20 දින, පිළිවෙළින් සම්බෝධි බෞද්ධ විහාරයෙදී සහ ද්‍රොනෝ හි, දස් බුඩස්ටිස්ච් හොස් විහාරස්ථානයෙහිදී, කඨින පින්කම සංවිධානය කර, සහභාගී වන ලදී.
- ජය ශ්‍රී මහා බෝධියේ පූජනීය බෝ අංකුරයක් වැඩම කරවා, ද්‍රොනෝ විහාරස්ථානයේ පොට්ස්ඩෑම් උද්භිද උද්‍යානයෙහි රෝපණය කරවීමෙහි ලා ආනුෂංගික සේවාවන් සැපයීම පිණිස බර්ලින් හි ශ්‍රී ලංකා සංගමය හා ප්‍රමන්ත්‍රණයෙහි නියැලෙන ලදී.
- ශ්‍රී ලංකාවෙන් වැඩම කරවන ලද බුද්ධ ප්‍රතිමා දෙකක්, බර්ලිනයේ කාම්බෝජ තානාපතිවරයා වෙත පිරිනමන ලදී.
- බර්ලිනයේ ශ්‍රී ලංකා සංගමය හා සමග සම්බන්ධීකරණයෙන්, ජර්මනියේ වාසය කරනු ලබන ශ්‍රී ලාංකිකයන් සඳහා කැපවූ සංස්කෘතික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම පිණිස ජර්මන් බලධාරීන් හා ප්‍රමන්ත්‍රණයන් ආරම්භ කෙරිණ.

දූත මණ්ඩලය, බර්ලිනයේ ශ්‍රී ලංකා සංගමය හා සම්බන්ධීකරණයෙන්, බර්ලිනයේ පැවැති වාර්ෂික සංස්කෘතික උත්සවයට සහභාගී වන ලදී.

- ජිම්නාසියම් අයිසන්හේගන් ආයතනය සමග ශිෂ්‍ය හුවමාරු වැඩ සටහන යටතේ බර්ලිනයට පැමිණි කාන්තා විද්‍යාලයේ සහ ශාන්ත තෝමස් විදුහලෙහි ශිෂ්‍යයින්ට සත්කාරක සේවා සැපයිණ.
- තානාපති කාර්යාලයේ නිල වෙබ් අඩවිය වඩාත් පරිශීලක හිතකාමී අංගයන් සහිතව අධිශ්‍රේණිගත කරන ලද අතර, දූත මණ්ඩල ක්‍රියාකාරකම්වලට අදාලව සමාජ මාධ්‍ය වේදිකා වඩාත් ආකර්ෂණීය සංනිවේදන මාධ්‍යයක් බවට පරිවර්තනය කෙරිණ.

**ශ්‍රමික සුබසාධනය**

- ශ්‍රී ලාංකිකයන් උදෙසා ආගන්තුක සත්කාර අංශයෙහි සේවා නියුක්ති ඉඩප්‍රස්තා සම්බන්ධයෙන් කරුණු විමසා බැලීම ආරම්භ කෙරිණ.

**ජර්මනිය - ෆ්‍රැන්ක්ෆර්ට්**

**ද්විපාර්ශ්වීය සබඳතා**

- ෆ්‍රැන්ක්ෆර්ට් සහ කොළඹ නගර අතර සමීපස්ථ සහයෝගිතාවය සාකච්ඡා කිරීම පිණිස, කොන්සල් ජනරාල්වරයා 2019 සැප්තැම්බර් මස 30 වන දින, ෆ්‍රැන්ක්ෆර්ට් නගර ශාලාවෙහි, පුරපති පීටර් ෆෙල්ඩ්මාන් මහතා සමග රැස්වීමකට සහභාගිවිය.

**පොදු රාජ්‍යෝපාය**

- ස්ථානගත කොන්සියුලර් සේවාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින් ගැටළු සාකච්ඡා කර ඔවුන්ගේ අදහස් ලබා ගැනීම පිණිස ශ්‍රී ලාංකික ප්‍රජාව සමග තෙමසකට වරක් අන්තර් ක්‍රියාවන්හි යෙදුණි.
- ඩයස්පෝරාව මත දත්ත ජාලයක් හඳුන්වාදී. යාවත්කාලීන කෙරේ.
- ශ්‍රී ලංකාවේ සිදුවන වැදගත් සිද්ධීන් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කර තැබීම පිණිස දූත මණ්ඩල වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාල විස්තෘතව භාවිතයට ගැනේ.
- ජර්මනියේ සමූහාණ්ඩු ප්‍රාන්ත හයෙහි වාසය කරනු ලබන ශ්‍රී ලාංකිකයින්ගේ සහභාගිත්වය ඇතිව, ශ්‍රී ලංකාවට නිදහස ලැබීමේ 71 වන සංවත්සරය දූත මණ්ඩල පරිශ්‍රයේදී සමරනු ලැබීය.
- සංහිඳියාව ප්‍රවර්ධනයෙහි ලා, 2019 මාර්තු මස 30 වන දින ෆ්‍රැන්ක්ෆර්ට් නගරයෙහිදී පවත්වන ලද 'අපේ ලංකා' වැඩ සටහන, ජර්මනියේ වාසය කරනු ලබන ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත සමීපවීමේ අවස්ථාව උදාකර ගැනීමට හේතු භූත විය.
- කොන්සියුලර් සේවා පිරිස් සහ ශ්‍රී ලාංකික ප්‍රජාව ඇතුළු හෙසන් රාජ්‍යයේ රාජ්‍ය නිලධාරීන්, පාස්කු ඉරිදා ප්‍රහාර ස්මරණය කරමින් දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද අනුස්මරණ දේව මෙහෙයට සහභාගි වූහ.

**සංස්කෘතික රාජෙස්පාය**

- 2019 මැයි මස 25 වන දින, ෆ්‍රැන්ක්ෆර්ට් හි 'මහමෙව්නා' විහාරස්ථානයෙහි පවත්වන ලද වෙසක් උත්සවය, දූත මණ්ඩලය විසින් සුසාධ්‍යකරණය කෙරිණ.
- 2019 ජූනි මස 16 වන දින, පොසොන් දින උත්සවය දූත මණ්ඩල පරිශ්‍රයේදී පැවැත්විණ.
- ෆ්‍රැන්ක්ෆර්ට් හි ශ්‍රී නාගපූසානි අම්මාන් ශ්‍රී ලංකා හින්දු කෝවිලෙහි භාරකාර මණ්ඩලය සහ සභාපතිගෙන් ලද ආරාධනය පරිදි, කොන්සල් ජනරාල්තුමා 2019 අගොස්තු මස 15 වන දින කෝවිලෙහි පැවැති වාර ලක්ෂමී පූජාවට සහභාගී විය.
- 2019 ඔක්තෝබර් මස 27 වන දින ෆ්‍රැන්කෆර්ට් හි ශ්‍රී කට්පග විනායර් හින්දු කෝවිලෙහි පැවැති දීපාවලී උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වූ කොන්සල් ජනරාල්තුමා සහභාගීවී සිටි බැතිමතුන් ඇමතීය.
- 2019 දෙසැම්බර මස 11 වන දින, ෆ්‍රැන්කෆර්ට් හි ජාත්‍යන්තර කාන්තා සමාජය විසින් කරන ලද ආරාධනය පරිදි, දූත මණ්ඩලය සම්ප්‍රදායික 'නත්තල් තේ' උත්සවයට සහභාගි විය.

**වෙළඳාම් හා ආයෝජන**

- ජර්මනිය ශ්‍රී ලංකාවේ 3 වන වැදගත්ම අපනයන වෙළඳපොලයි. ශ්‍රී ලංකාවෙන් ආනයනය කරනු ලබන ප්‍රධාන වෙළඳ ද්‍රව්‍ය වන්නේ රෙදිපිළි, රබර් සහ තේ ය. ජර්මනියෙන් ශ්‍රී ලංකාවට අපනයනය කරනු ලබන ප්‍රධානතම ද්‍රව්‍යයන් වන්නේ, යන්ත්‍රෝපකරණ, විදුලි භාණ්ඩ, රසායනික ද්‍රව්‍ය සහ මෝටර් වාහන ය. දැනටමත් වර්ෂ ගණනාවක් තිස්සේ ජර්මනිය විසින් ශ්‍රී ලංකාව හා සමඟ වෙළඳ හිඟයක් වාර්තා කර ඇත.

  කොන්සල් ජෙනරාල්වරයා ජර්මනියේ පැවති පහත විස්තර කෙරෙන වෙළඳ ප්‍රදර්ශනයන්ට සහභාගී විය:
- 2019 පෙබරවාරි මස 8 - 12 දක්වා ෆ්‍රැන්ක්ෆර්ට් හි ෆ්‍රැන්ක්ෆර්ට් ප්‍රදර්ශන භූමියෙහි පැවැති, 2019 - ඇම්බියන්ටේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශණයට (තෑග භාණ්ඩ, කෑම මේස උපකරණ සහ අභ්‍යන්තර සැරසිලි අයිතම) ශ්‍රී ලංකාවද සහභාගී විය. රටවල් 95 කින් 4,815 කට අධික ප්‍රදර්ශකයින් සහභාගී වූහ.
- නියුරම්බර්ග්හි බයෝ-ෆැක් වෙළඳ ප්‍රදර්ශනය 2019 පෙබරවාරි මස 13 - 16 දක්වා පැවැත්විණ. ශ්‍රී ලංකා පැවිලියම සංවිධානය කිරීමෙහි ලා දූත මණ්ඩලය විසින් අපනයන සංවර්ධන මණ්ඩලයට සහාය දක්වන ලදී.
- 2019 ජූනි මස 4-7 දක්වා, මියුනිච් හි පැවැති 2019- ප්‍රවාහන සහ ආනුෂංගික සේවා ප්‍රදර්ශනයට ශ්‍රී ලංකාව සහභාගී විය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ ජර්මන් කර්මාන්ත සහ වාණිජ නියෝජිතයින්, බර්ලිනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ෆ්‍රැන්ක්ෆර්ට් හි ශ්‍රී ලංකා කොන්සල් කාර්යාලයේ සම්බන්ධීකරණයෙන්, මෙම ප්‍රදර්ශන භූමියේ, මණ්ඩපයක් සංවිධානය කරන ලදී.
- අනුග ප්‍රදර්ශනය 2019 ඔක්තෝබර් මස 5 - 9 දක්වා පැවැත්විණ.
- 2019 ඔක්තෝබර් මස 16-19 දක්වා ඩස්ල්ඩෝෆ් හි පැවැති කේ-ෆෙයා ප්‍රදර්ශනයේ ශ්‍රී ලාංකික රබර් නිෂ්පාදන අපනයනකරුවන්ගේ සහභාගිත්වය සම්බන්ධීකරණය කෙරිණ.
- විද්‍යුත් භාණ්ඩ සංවර්ධනය හා නිෂ්පාදන සඳහා වන ලෝකයේ ප්‍රමුඛතම වෙළඳ ප්‍රදර්ශණය වන ප්‍රඩක්ට්‍රෝනියා -2019 ට ශ්‍රී ලංකාව සහභාගී විය. ජර්මනියේ, මියුනිච්හි, මෙසේ මන්චන් ප්‍රදර්ශන භූමියෙහිදී, 2019 නොවැම්බර් මස 12-15 දක්වා එය පැවැත්විණ.
- ජර්මන්-ශ්‍රී ලංකා ව්‍යාපාර කවුන්සිලය, 2019 ඔක්තෝබර් මස 04 වන දින නව පිටුවක් පෙරළමින්, තානාපතිතුමා, කොන්සල් ජනරාල්වරයා සහ කවුන්සිලයේ සභාපතිගේ සහභාගිත්වයෙන්, ස්වකීය නව වෙබ් අඩවිය (www.gslbc.com) දියත් කරන ලදී.

**සංචාරක ප්‍රවර්ධනය**

- ජර්මනිය, සම්ප්‍රදායිකව සංචාරය සඳහා ශ්‍රී ලංකාවේ අතිශයින් වැදගත් ප්‍රභව වෙළඳපොලවලින් එකකි. ගෙවී ගිය වසර කිහිපයේදී, ශ්‍රී ලංකාවට සපැමිණි ජර්මන්

සංචාරකයින්ගේ සංඛ්‍යාව, කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇති අතර, 2019 දී එය 150,000 ක් විය.

කොන්සියුලර් කාර්යාලය පහත දැක්වෙන සංචාරක වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගී විය:

- අයිටීබී ප්‍රදර්ශනයෙහි ශ්‍රී ලංකා පැවිලියම උත්සවාකාරයෙන් ආරම්භ කරන ලද්දේ සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානු ආගමික කටයුතු අමාත්‍ය, ගරු ජෝන් අමරතුංග මහතා විසිනි. ලොව ප්‍රමුඛතම චාරිකා සහ සංචාරක වෙළඳ ප්‍රදර්ශනය වන මෙයට 75 කට අධික ශ්‍රී ලාංකික සමාගම් සහභාගී වූහ. 2019 මැයි මාසයේදී ෆ්‍රැන්ක්ෆර්ට් හි පැවැති, අයි එම් ඊ එක්ස් වෙළඳ ප්‍රදර්ශනය සංවිධානය කිරීමට සහ සහභාගීවීමට, කොන්සියුලර් කාර්යාලයේ සහාය ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය වෙත ලබා දෙන ලදී. මෙම ප්‍රදර්ශනය ප්‍රොත්සාහන චාරිකා, රැස්වීම් සහ උත්සව සඳහා වාර්ෂිකව පැවැත්වෙන්නකි.

  ශ්‍රී ලංකා සංචාරණ හා තේ ප්‍රවර්ධන උත්සවය, 2019 ඔක්තෝබර් මස 16-20 දක්වා ෆ්‍රැන්ක්ෆර්ට් ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී පැවැත්විණ.

**හංගේරියාව**

හංගේරියාවට ප්‍රතිනතය කොට ඇති ඔස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සපුරාගත් ක්‍රියාකාරකම්

- 2019 ජූනි මස 14-15, විදේශ කටයුතු අමාත්‍ය, ජනාධිපති නීතිඥ, ගරු තිලක් මාරපන මහතාගේ සංචාරය

  ගරු අමාත්‍යතුමාගේ හංගේරියානු සංචාරය සුසාධ්‍යකරණය කර, 2019 ජූනි මස 14-15 දින, හංගේරියාවේ විදේශ කටයුතු හා වෙළඳ අමාත්‍යවරයා සහ ඉහළ පෙළ නිලධාරීන් සමග ද්විපාර්ශ්වීය සාකච්ඡා සම්බන්ධීකරණය කෙරිණ.

  මිත්‍රශීලි සබඳතා වර්ධනය සහ සහයෝගිතාවයේ සම්භාව්‍ය ක්ෂේත්‍රයන් විමසා බැලීම සාකච්ඡාවට භාජනය විය. ශ්‍රී ලංකා සහ හංගේරියානු අමාත්‍යාංශ අතර අත්සන් තබන ලද (2012 ජූනි) දේශපාලන උපදේශන හා සහයෝගිතා අවබෝධතා ගිවිසුම 2020 මුල් භාගයේදී සක්‍රීය කිරීමට පොදු එකඟතාවය පළවිය.

- මධ්‍යම අප්‍රිකා ජනරජයෙහි ශ්‍රී ලංකා සාම හමුදා පරිශ්‍රයෙහි නවතා ඇති එම්අයි-17 එස්එච් හෙලිකොප්ටරය, හංගේරියාවේ විදේශ කටයුතු සහ වෙළඳ අමාත්‍යාංශය හරහා, අළුත්වැඩියා කර ආපසු ලබාගැනීමෙහි ලා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහ ආරක්ෂක අමාත්‍යාශයේ ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කෙරිණ.(ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා හංගේරියාවේ ජාතික ප්‍රසම්පාදන කමිටුවෙහි වැදගත් තත්ත්වයක් උසුලයි)

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

- විදේශ කටයුතු අමාත්‍ය, රාජ නීතිඥ, ගරු තිලක් මාරපන මහතාගේ හංගේරියා සංචාරය
- දෙරට අතර පිරිපුන් වෙළඳ සහ ආයෝජන සම්භාව්‍යථාව සපුරා ගැනීම පිණිස ද්විපාර්ශ්වීය " ආර්ථික සහයෝගිතාව" ගිවිසුම අත්සන් තැබීමට එකඟතාවයට එළඹිණ. (හංගේරියානු එක්සිම් බැංකුවෙන් ලබා දෙන ඇ.එ.ප.ඩොලර් මිලියන 58.8 ක ණය ආධාර මාලාවෙන් හංගේරියා-ශ්‍රී ලංකා ආර්ථික සහ වෙළඳ සහයෝගිතාවය සුසාධ්‍යකරණය වනු ඇත.)
- සුවතාව සංචාරණය සහ ආයුර්වේද අංශයෙහි පවතින අනාගත සහයෝගිතා ක්ෂේත්‍රයන් විමසා බැලිණ.
- 2019 අප්‍රියෙල් මස 23-24 දින, බුඩාපෙස්ට් හි පැවැති, හංගේරි - ශ්‍රී ලංකා ඒකාබද්ධ ආර්ථික කමිටුවේ පළමුවන සැසියට සහභාගී වීම
- හංගේරියාවේ ව්‍යාපාරික ගනුදෙනු හා සමඟ සමීපස්ථ සබඳතා වර්ධනය කරගැනීම සහ දෙරට රේගුව හරහා නිදහස් භාණ්ඩ ප්‍රවාහයක් සුසාධ්‍යකරණය කර ගැනීම
- දෙරට අතර වෙළඳ ගනුදෙනු වැඩි දියුණු කර ගැනීමට ඇති බාධා හඳුනා ගන්නා ලද අතර, උපදේශන දෙවන වටයේදී තවදුරටත් අවධානයට භාජනය කෙරෙනු ඇත.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

- 2019 පෙබරවාරි 11-12 දක්වා, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ සංචාරය

  2019 පෙබරවාරි 11-12 දක්වා, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ ඔස්ට්‍රියා සංචාරය සුසාධ්‍යකරණය කරන ලද අතර, ඔස්ට්‍රියා මෘදු ණය ආධාර යටතේ, කොළඹ මහ නගර සභාව සඳහා ගිනිනිවන වාහන/උපකරණ සැපයීම් ව්‍යාපෘතියේ ණය ගිවිසුම අත්සන් තැබීම සඳහා යුනික්‍රෙඩිට් බෑන්ක් ඔස්ට්‍රියා ඒජී සමඟ කටයුතු සම්බන්ධීකරණය කෙරිණ.
- ඔස්ට්‍රියාව සමග ද්විපාර්ශ්වීය ආර්ථික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස ඔස්ට්‍රියානු බලධාරීන් සමග පහත දැක්වෙන රැස්වීම් සම්බන්ධීකරණය කෙරිණ:
- 2019 අගොස්තු මස 01 වන දින, ඔස්ට්‍රියාවේ, ඩිජිටල් සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ, කර්මාන්ත ස්ථාපනය, නවෝත්පාදනය සහ ජාත්‍යන්තරකරණ අංශයෙහි, අධ්‍යක්ෂ ජනරාල්, ෆ්ලෝරියන් ෆ්‍රොස්චර් මහතා හමුවීම. දෙරට අතර ආර්ථික සබඳතා වැඩිදියුණු කර ගැනීම, නවෝත්පාදක ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා ඔස්ට්‍රියානු වෙළඳපොළෙහි අනාගත ඉඩ ප්‍රස්ථා සහ ඔස්ට්‍රියානු ආයෝජකයින්ට ශ්‍රී ලංකාවේ අනාගත ඉඩ ප්‍රස්ථා සාකච්ඡාවට භාජනය කෙරිණ. අනාගතයේදී 'ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට' සහ 'ව්‍යාපාරයෙන් පාරිභෝගිකයාට' රැස්වීම් ක්‍රමිකව පවැත්වීමටද යෝජනා විය.
- 2019 දෙසැම්බර් මස 12 වන දින, තානාපති කාර්යාල පරිශ්‍රයේදී, ඔස්ට්‍රියාවේ සමූහාණ්ඩු ආර්ථික වෙළඳ මණ්ඩලයේ ආසියා / ශාන්තිකර කලාපීය කළමණාකාර, කලෙමන්ස් මචාල් මහතා සමග රැස්වීමක් පැවැත්විණ. ඉහළ මිළකින් යුත් ශ්‍රී ලංකා නිෂ්පාදන සඳහා ඔස්ට්‍රියානු වෙළඳපොළ අවස්ථා සහ ඔස්ට්‍රියානු ආයෝජකයින්ට ශ්‍රී ලංකාවේ අළුතින් දියත් කරන ලද යටිතල ව්‍යුහ ව්‍යාපෘතිවල ඉඩ ප්‍රස්ථා සාකච්ඡා විය.
- සමූහාණ්ඩු මණ්ඩලයෙහිදී, 2020 ජනවාරි මාසයේදී පවැත්වීමට නියමිතව ඇති "ඒෂියා තින්කින් සට්‍රැපිකලි - 2020 " ආයෝජන ප්‍රවර්ධන ඉසව්වට සහභාගිවීමේ අවස්ථාව උදා කර ගන්නා ලදී. ශ්‍රී ලංකාව මෙම ඉසව්වට සහභාගී වන රටවල් 12 න් ඒකකි.
- ක්‍රමික පදනමින් රැස්වීම පවත්වන ලද අතර, ශ්‍රී ලංකාව සඳහා වෙළඳ ඉඩප්‍රස්ථා ලබා ගනු පිණිස ඔස්ට්‍රියානු සමූහාණ්ඩු ආර්ථික මණ්ඩල (WKO) සහ පළාත් මණ්ඩල සමග නිරන්තරයෙන් සන්නිවේදනයෙහි යෙදේ.
- ශ්‍රී ලංකා තේ, පොල්,සහ රබර් නිෂ්පාදන ඔස්ට්‍රියානු වෙළඳපොළට හඳුන්වා දෙන ලදී.
- ශ්‍රී ලංකාවේ උසස් තත්ත්වයේ තේ, පොල් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන හඳුන්වාදීම පිණිස ඔස්ට්‍රියානු සමූහාණ්ඩු ආර්ථික මණ්ඩලය සහ ඔස්ට්‍රියානු ව්‍යාපාරික ප්‍රජාව සමග රැස්වීම් ගණනාවක්ම පවත්වන ලදී. ශ්‍රී ලංකා තේ සමාගම් වලට ඔස්ට්‍රියාවේ ඉඩ ප්‍රස්ථා කිහිපයක් ලබා ගන්නා ලදී.

**සංස්කෘතික සබඳතා / සංචාරක ප්‍රවර්ධනය**

- 2019 ජනවාරි මස 10-13 දක්වා වියානා හි පවත්වන ලද නිවාඩු, චාරිකා සහ විවේකය අරමුණු කොට ගත් ෆෙරියන් මෙසේ වියන් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වන ලදී.
- ආගන්තුක සත්කාරය, චාරිකා සහ සුවතාව කර්මාන්ත අංශවල ශ්‍රී ලාංකික සමාගම් හයක් (06) ශ්‍රී ලංකා පැවිලියම යටතේ එක්වූහ. චාරිකා සිනමා ප්‍රදර්ශනයේදී, "ශ්‍රී ලංකා - ඉන්දියන් සාගරයේ මුතු ඇටය" නමින් සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ගැන සමර්පණයක් ඉදිරිපත් කෙරිණ.
- 2019 ජනවාරි මස 19 වන දින, වියානා දමිළ සංගමය විසින් සංවිධානය කරන ලද පොන්ගල් උත්සවයට සහභාගී විය.
- ශ්‍රී ලංකාවේ පාස්කු ඉරිදා ප්‍රහාරයේ වින්දිතයින්ට ගරු කිරීමක් ලෙස 2019 අප්‍රියෙල් මස 27 වන දින වියානාවේ ශාන්ත ස්ටීඵන්ස් ප්‍රධාන දේවස්ථානයේදී, අතිරේක බිෂොප්තුමන් සහ වියානාවේ අනුබිෂොප්තුමන් විසින් පවත්වන ලද අනුස්මරණ දේව මෙහෙයට සහභාගී වන ලදී.

- ඔස්ට්‍රියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාව හා සම්බන්ධීකරණයෙන් වෙසක් වැඩ සටහනක් සංවිධානය කෙරිණ.

  ඔස්ට්‍රියානු -ශ්‍රී ලාංකික ප්‍රජාව සඳහා 2019 මැයි මස 11 සහ 12 දින චිත්‍ර තරඟයක් සංවිධානය කෙරිණ.
- 2019 සිංහළ සහ දමිළ නව වසර වෙනුවෙන් ග්‍රාස්ට් හි ගරු කොන්සල් ජෙනරාල්වරයා විසින් සංවිධානය කරන ලද සංස්කෘතික සැඳෑවකට සහභාගී වන ලදී.
- 2019 දෙසැම්බර් මස 21 සහ 25 දින වියානා දමිළ සංගමය සහ වියානාහි ශ්‍රී ලංකා කතෝලික ප්‍රජාව විසින් සංවිධානය කරන ලද නත්තල් උත්සවයකට සහභාගී වන ලදී.
- 2019 දෙසැම්බර් පැවැති පුණ්‍යධාර වැඩ සටහනක් වන "එක්සත් ජාතීන්ගේ කාන්තා සංසදයේ කඩ විදිය" වැඩ සටහනට සහභාගී විය. ශ්‍රී ලංකා විශේෂ ආහාර, ලංකා තේ සහ පරිසර හිතකාමී අත්කම් ප්‍රවර්ධනය කෙරිණ.

**ඉතාලිය**

**ඉතාලිය සහ අක්තගන්වන ලද රටවල් (ග්‍රීසිය, මෝලටා, ඇල්බේනියා සහ සැන් මැරිනෝ) සමඟ**

**ද්විපාර්ශ්වීය සබඳතා**

- අදාල අනුරූපී කාල වකවානුව තුළ දූත මණ්ඩලය විසින් ඉතාලියේ සහ අක්ත ගන්වා ඇති රටවල රාජ්‍යයන් සමඟ සුහද ද්විපාර්ශ්වීය සබඳතා පවත්වා ඇත. එ.ල්.ටී.ටී.ඊ සංවිධානය යුරෝපා සංගමයේ ත්‍රස්වාද සංවිධාන ලැයිස්තුවෙහි පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් යුරෝපා සංගමයේ බලවත් සාමාජිකයෙකු වන ඉතාලියේ රජය සමඟ නිරන්තර සංවාදයෙහි යෙදෙන ලදී. 2016 වසරේදී ශ්‍රී ලංකාවෙන් යුරෝපයට මත්ස්‍ය අපනයන තහනම ඉවත්කර ගැනීමට; 2017 මැයි මාසයේදී ශ්‍රී ලංකාවට ජීඑස්පී+ සහන ක්‍රමවේදය විධිමත්ව ප්‍රති-ස්ථාපනය කර ගැනීමට ; ආදී වශයෙන්, යුරෝපා සංගමයේ සාමාජික රටක් ලෙස ඉතාලිය සෑම කල්හිම ශ්‍රී ලංකාවට සහාය දක්වා ඇත. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය තුළ යුරෝපා සංගමයේ තත්ත්වය සූත්‍රගත කිරීම සඳහා ඉතාලිය ප්‍රමුඛ භූමිකාවක පිහිටා කටයුතු කර ඇත.
- හිටපු විදේශ කටයුත්ත අමාත්‍ය, ගරු තිලක් මාරපන මහතා 2019 මාර්තු මස 01-03 දක්වාද, 2019 ඔක්තෝබර් 09-11 දක්වාද ඉතාලියේ සංචාරයක යෙදී ඇත. එතුමා, ඉතාලියේ විදේශ කටයුතු රාජ්‍ය ලේකම් වන, ගරු මැන්ලියො ඩි ස්ටෙෆානෝ මහතා සමඟ රැස්වීමකට සහභාගී විය.
- සයිප්‍රසයේ, නිකෝසියා නුවර, ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය 2019 පෙබරවාරි මස 28 වන දින නිල වශයෙන් විවෘත කෙරිණ.
- ඉතාලි සංවර්ධන සහයෝගිතාව යටතේ යුරෝ මිලියන 20 ක මෘදු ණයක් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය සඳහා ලබාදීමට ඉතාලි රජය කැමැත්ත ප්‍රකාශ කර ඇත. අනුරූපී කාල වකවානුව තුළ, අදාල රේඛීය අමාත්‍යාංශද සමඟ දෙපාර්ශවය අතර සාකච්ඡා පැවැත්විණ.
- ශ්‍රී ලංකාව සහ ඉතාලිය අතර අත්සන් තබා අපරානුමත වියයුතු ද්විපාර්ශ්වීය සහ බහු පාර්ශ්වීය ගිවිසුම්, සම්මුති සහ ප්‍රඥප්ති, එනම්; ඉතාලිය සමඟ ද්විපාර්ශ්වීය ගුවන් සේවා සම්මුතිය, ප්‍රති-ප්‍රවේශ සම්මුතිය යුරෝපා සංගමය හා සමඟ ක්‍රියාත්මක කිරීමට අදාල ඉතාලි ගිවිසුම මූල ලේඛය, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල යටතේ සත්කාරක රටේ සම්මුතිය, සංස්කෘතික හා විද්‍යාත්මක සහයෝගිතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුම, 2007 වසරේදී අත්සන් තබා ඇති අතර, මේ දක්වාම ඉතාලිය විසින් අපරානුමත වියයුතුව ඇත.

**මිලාන්**

**ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් - මිලාන්**

- මිලාන් නුවර ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය 2016.02.01 වන දින නිල වශයෙන් විවෘත කරන ලද අතර, උතුරු ඉතාලියේ ප්‍රාන්ත 07 ක (ලොම්බාර්ඩි, ෆෑයිසි වෙනෙසියා

ගියුලියා, ලිගුරියා,පියඩ්මොන්ට්, ට්‍රනේටිනෝ- ඇල්ටෝ අඩිගේ, වැලෙ ඩි ඔස්ටා සහ වෙනෙටෝ) කොන්සියුලර් අධිකාරි බලය එය සතුවේ.

වර්තමානයෙහි කොන්සියුලර් ජනරාල් කාර්යාලය සතු ප්‍රධාන වගකීම වන්නේ උතුරු ඉතාලියෙහි එකී ප්‍රාන්තවල පදිංචි ශ්‍රී ලාකිකයන් සඳහා කොන්සියුලර් සේවා සැපයීමයි.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

2019 වසර තුළ විදේශීය ආයෝජනවලට අදාල පහත දැක්වෙන කටයුතු දූත මණ්ඩලය විසින් සුසාධ්‍යකරණය කෙරිණ.

- ඉතාලියේ, මිලාන් හි, ෆියරාමිලානෝ නුවරදී, 2019 පෙබරවාරි 10 - 12 දක්වා බොර්සා ඉන්ටනැෂනලේ ඩෙල් ටුරිස්මෝ (BIT) ජාත්‍යන්තර චාරිකා ප්‍රදර්ශනය පැවැත්විණ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අනුග්‍රහයෙන් ශ්‍රී ලංකා මණ්ඩපය සැකසිණ.
- 2019.02.08 දින මිලාන් හි, මයිකල් ඈන්ජිලො හෝටලයෙදී පවත්වන ලද "ශ්‍රී ලංකා සංචාරණ ප්‍රවර්ධන ප්‍රදර්ශනය සහ 'ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට' රැස්වීම් සහ 2019.02.12 දින මිලාන් හිදී පවත්වන සංචාරක ප්‍රවර්ධන උත්සවය සම්බන්ධයෙන් සක්‍රීයව සහායවීමට සහ සහභාගීවීමට කොන්සල් ජනරාල් කාර්යාලය කටයුතු කරන ලදී. ශ්‍රී ලංකාව සහ ඉතාලිය අතර ව්‍යාපාර සබඳතා තවදුරටත් ප්‍රවර්ධනය කරලීම සම්බන්ධයෙන් ඉතාලි වෙළඳ පාර්ශ්වකරුවන් හා සමග දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමේ අවස්ථාවද මෙහිදී උදාවිය.
- 2019 මැයි මස 03 - 09 දක්වා මිලාන් නුවර, පැලසෝ බොවාරා හිදී, පවත්වන ලද මිලානො ෆුඩ් සිටි ප්‍රදර්ශනයට කොන්සියුලර් කාර්යාලය සහභාගී විය.
- 2019.05.25 වන දින, ට්‍රියනාලේ ඩි මිලානො හි, නව්‍ය කලා කෞතුකාගාරයෙහි පවත්වන ලද මිලානෝ වාස්තු විද්‍යා සතියේ ශ්‍රී ලංකා දිනය වෙනුවෙන් පොදු වැඩ සටහනකට දූත මණ්ඩලය සහභාගී විය.
- 2019 මාර්තු මස 01 වන දින සිට 2019 සැප්තැම්බර් 01 වන දින දක්වා, ට්‍රියනාලේ ඩි මිලානෝ හි, නව්‍ය කලා කෞතුකාගාරයෙහිදී, 'බ්‍රෝකන් නේචර්' යන තේමාව යටතේ පවත්වන ලද 22 වන ජාත්‍යන්තර වාස්තු විද්‍යා සහ රටා ප්‍රදර්ශනයේදී ශ්‍රී ලාංකික මණ්ඩපය ප්‍රදර්ශනය විය.
- ආයෝජන ඉඩ ප්‍රස්ථා විමසා බැලීමේ අරමුණින්, කොන්සල් ජෙනරාල්වරයා, 2019 ජූලි මස 27 වන දින කෝමෝ හි, දැව කර්මාන්තශාලාවක (ටාබු) නිරීක්ෂණ චාරිකාවක යෙදුණේය. මෙම සමාගම ශ්‍රී ලංකාවේ යන්ත්‍රාගාරයක් විවෘත කිරීමට උනන්දුව දක්වා ඇත.
- "විදේශගත ශ්‍රී ලාංකිකයින් සංවර්ධන හවුල්කරුවන් ලෙස මැදහත්වී ක්‍රියාකිරීම" යන වැඩ සටහන සම්බන්ධයෙන් අදහස් ලබා ගැනීම පිණිස, ශ්‍රී ලංකා ප්‍රජාවෙන් තෝරාගත් නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් රැස්වීමක් 2019 නොවැම්බර් මස 09 වන දින කොන්සියුලර් කාර්යාල පරිශ්‍රයේදී පැවැත්විණ.

**සංස්කෘතික සබඳතා**

- 2018.02.04 වන දින, කොන්සියුලර් කාර්යාල පරිශ්‍රයේදී, 71 වන නිදහස් සමරු උළෙල පැවැත්විණ.
- 2019.05.11 වන දින කොන්සියුලර් ජනරාල් කාර්යාල පරිශ්‍රයේදී, එකී කාර්යාලීය අධිකාරි පාත්‍රතාවය පවතින ප්‍රාන්තවල ඇති සියළුම පාහේ විහාරස්ථානවල විහාරාධිපතීන් වහන්සේලාගේ සහ මහා සංඝරතනයේ සහභාගිත්වයෙන් වෙසක් දානමය පුණ්‍යකර්මයක් සිදු කෙරිණ.
- ශ්‍රී ලාංකික ප්‍රජාව අතර ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, මිලානෝ හි පවත්වන ලද 2019 පාපන්දු ලෝක ශූරතා තරඟාවලියේදී (US ALCI) ශ්‍රී ලංකා කණ්ඩායමේ සහභාගිත්වයට සහාය දක්වන ලදී.

2019 දෙසැම්බර් මස 15 වන දින, කොන්සියුලර් කාර්යාලය විසින්, 'මිලාන් කිතුණු සංඝ' සමඟ සහයෝගයෙන්, වාර්ෂික නත්තල් උත්සව පවත්වන ලදී.

**කොන්සියුලර් කාර්යාලය විසින් දරණ ලද ප්‍රයතන්යන්ගේ ප්‍රධානතම ප්‍රතිඵල**

- එදිනෙදා සේවය සැලසීමේ ක්‍රියාදාමයේදී, මහජනයා වෙත සලසන ලද කොන්සියුලර් සේවාවන්හි ගුණාත්මකභාවය සහ කාල කළමණාකරණයෙහි ලා කැපී පෙනෙන වර්ධනය.
- අදාල ශ්‍රී ලංකා බලධාරීන් විචාරණයෙන්, කලට වේලාවට ගමන් බලපත්‍ර, හදිසි බලපත්‍ර, උප්පැන්න, මරණ සහ විවාහ සහතික, පොලිස් චාර්තා සහ CITs නිකුතුව විධිමත් කිරීම සහ කඩිනම් කිරීම
- විවිධ කොන්සියුලර් කරුණු සම්බන්ධයෙන් සහාය අපේක්ෂා කරනු ලබන ශ්‍රී ලාංකිකයින්ට ප්‍රමාණවත් සහ නිවැරදි තොරතුරු සහ ලිපිලේඛණ ලබා දීම

**මෝල්ටා**

- 2019 ජනවාරි මස 09-12 දක්වා, ගරු කථානායක, කරු ජයසූරිය මහතාගේ මෝල්ටා නිල සංචාරය දූත මණ්ඩලය විසින් සුසාධ්‍යකරණය කෙරිණ.
- තානාපති කාර්යාලය විසින්, ශ්‍රී ලංකාව සහ මෝල්ටාව අතර ද්විත්ව බදුකරණය වළක්වාලීමේ ගිවිසුම සහ ශ්‍රී ලංකාවේ සහ මෝල්ටාවේ විදේශ කටයුතු අමාත්‍යවරුන් අතර ද්විපාර්ශ්වීය සහයෝගිතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුම සම්බන්ධයෙන් පසු විපරම.

**හෝලි සී**

- 2019 මාර්තු 02 වන දින, විදේශ කටයුතු අමාත්‍ය, ගරු තිලක් මාරපන මහතාගේ සංචාරය සහ හෝලි සී රාජ්‍යයේ සබඳතා පිළිබඳ ලේකම්, පෝල් රිචර්ඩ් ගැලඝර්, අගරදගුරු ප්‍රසාදින් වහන්සේ හමුවීම දූත මණ්ඩලය විසින් සුසාධ්‍යකරණය කෙරිණ. තවද, අමාත්‍යතුමා අතිගරු ෆ්‍රැන්සිස් පාප් වහන්සේ විසින් වන්දනාකරුවන්ට සහ අමුත්තන්ට ප්‍රදානය කරනු ලබන බැහැදැකීමේ අවස්ථාවටද සහභාගී වූ අතර, ශ්‍රී ලංකා ජනාධිපතිතුමන් වෙනුවෙන් විශේෂ ආශීර්වාද ජූජාවකටද සහභාගී විය.

**ග්‍රීසිය**

- ශ්‍රී ලංකාව සහ ග්‍රීසිය අතර අත්සන් තැබීමට නියමිත ද්විපාර්ශ්වීය ගුවන් සේවා ගිවිසුම සම්බන්ධයෙන් පසු විපරම

**ඇල්බේනියා**

- ශ්‍රී ලංකාව සහ ඇල්බේනියාව අතර අන්‍යොන්‍ය වීසා අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමේ ගිවිසුම සම්බන්ධයෙන් පසු විපරම.

**බහු පාර්ශ්වීය සබඳතා**

රෝම පුරවරයේ ස්ථාපිත නියෝජිතායතන : ආහාර සහ කෘෂි සංවිධානය, ලෝක ආහාර වැඩ සටහන, ජාත්‍යන්තර සංස්කෘතික දේපළ සංරක්ෂණ සහ ප්‍රතිසංස්කරණ අධ්‍යයනය සහ ජාත්‍යන්තර ආහාර සහ කෘෂිකර්ම සංවර්ධනය

- ආහාර සහ කෘෂි සංවිධානය (FAO), ලෝක ආහාර වැඩ සටහන, ජාත්‍යන්තර සංස්කෘතික දේපළ සංරක්ෂණ සහ ප්‍රතිසංස්කරණ අධ්‍යයනය සහ ජාත්‍යන්තර ආහාර සහ කෘෂිකර්ම සංවර්ධනය හා සම්බන්ධ රැස්වීම්, කමිටු, අන්තර්- රාජ්‍ය කණ්ඩායම්, සම්මන්ත්‍රණ සහ කවුන්සිල රැස්වීම් 60 කට වැඩි සංඛ්‍යාවකට දූත මණ්ඩලයේ නියෝජනය / සහභාගිත්වය ලබා ඇත. මෙම වකවානුව තුළ, ජාත්‍යන්තර ආහාර සහ කෘෂිකර්ම සංවර්ධනයේ ශ්‍රී ලංකා රාෂ්ට්‍ර මූලෝපාය සහ වැඩ සටහන සමාලෝචනයට භාජනය කෙරිණ. 1977 වසරේදී ශ්‍රී ලංකාව මෙම සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු, ව්‍යාපෘති 18 කට ලබා දෙන ලද ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 302 ක මුල්‍යමය ආධාරයෙන් මිලියන 2.9 ක ජනතාවකට සහ පවුල් 64,000 කට සෙත සැලසිණ. මෙම සංවිධානයේ ශ්‍රී ලංකාව පිළිබඳ පාලක මණ්ඩල ප්‍රධානත්වය රෝමයේ පිහිටි එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවල දූතමණ්ඩලවල ප්‍රධානීන්

විසින් හෝ නිත්‍ය නියෝජිතවරයා විසින් හෝ දරන ලදී. "සේනා කැටපිලර්" නමින් දන්නා දළඹු වසංගතය මැඩලීම පිණිස ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ශ්‍රී ලංකාවේ අදාල නියෝජිතායතන වෙත තාක්ෂණික සහාය ලබා දී ඇති අතර, මෙම කෘමියාගේ පැතිරීම වළක්වාලීම පිණිස අබණ්ඩ තත්ත්ව අධීක්ෂණයෙහි නියැලී සිටී. ශ්‍රී ලංකා නියෝජිත පිරිස් කිහිපයක්, දූත මණ්ඩලය විසින් සුසාධ්‍යකරණය කරණ ලද ආ.කෘ.සං. (FAO) රැස්වීම්වලට සහභාගී වූහ. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතාගත පළතුරු අගය දාමයන්ගේ නිෂ්පාදනය සහ වාණිජ්‍යකරණය වැඩි දියුණු කිරීම පිණිස ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 1.1 කට වැඩි චීන අරමුදල් සහිතව ආ.කෘ.සං. - චීන දකුණු-දකුණු සහයෝගිතාවය යටතේ අරමුදල් සහ තාක්ෂණික සහාය ලැබූ දෙවන රට ශ්‍රී ලංකාවයි. ව්‍යාපෘතියේ අනාගත අපේක්ෂාව වන්නේ කුඩා ගොවියන්ගේ  ජීවනෝපායයන් වැඩි දියුණු කිරීම සහ  ජාතික ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කරලීමයි.

- තොරතුරු බෙදා හදා ගැනීමෙහි සහ පෝෂ්‍යදායක පාසල් ආහාර වේල සහ සහල් සුරක්ෂිත කිරීමේ වැඩ සටහන් වලට සලසන ලද මුල්‍ය සහ තාක්ෂණික සහායට සහ ස්වාභාවික ව්‍යසනයන්හි බලපෑම සහ දේශගුණික කම්පනයන්ට විරුද්ධව ප්‍රජාවන්ගේ ප්‍රත්‍යාස්ථීය ගොඩ නගනු ලබන ව්‍යාපෘතීන්ට සහායට අදාලවූ ලෝ.ආ.සං. සහාය වැඩ සටහන්වලට  අවශ්‍ය ආදාන සැපයීමෙහි ලා  දූත මණ්ඩලය සක්‍රීයව සහභාගී විය. වඩාත් පෝෂ්‍යදායක පාසල් ආහාර වේලක් ලබාදීමේ නියමු ව්‍යාපෘතියට අදාල ගෝලීය සන්ධානයේ සම-නියමු ලෙස බ්‍රසීලය සමග  සේවය කිරීමේ ස්වකීය අභිලාෂය ශ්‍රී ලංකාව (අධ්‍යාපන අමාත්‍යාශය) විසින් ජර්මනියේ ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාශය වෙත තහවුරු කර සිටින ලදී.  දූත මණ්ඩලය, ශ්‍රී ලංකාවේ  ලෝක ආහාර සංවිධානයේ ශ්‍රී ලංකාවේ නියෝජිත සමග මෙම සහයෝගිතා ප්‍රත්‍යුත්ක්‍රමය සුසාධ්‍යකරණයෙහි යෙදී සිටී.
- ජාත්‍යන්තර සංස්කෘතික දේපළ සංරක්ෂණ සහ ප්‍රතිසංස්කරණ අධ්‍යයනයේ 31 වන මහා සම්මේලනය 2019 ඔක්තෝබර් මස 30 - 31 දිනවල  රෝමයේදී පවත්වන ලද අතර, දූත මණ්ඩල නිලධාරීන්,  ශ්‍රී ලංකාවෙන් සපැමිණි  ත්‍රි-පුද්ගල නියෝජිත පිරිසක් සමග මෙම සම්මන්ත්‍රණයට සහභාගී වූහ.

**සංස්කෘතිය සහ පොදු රාජ්‍යෝපාය**

- රෝමයේ පවත්නා සියළුම සංගම්වල නියෝජිතයින්ගෙන් සමන්විත එක් ශ්‍රී ලංකා සංගමයක් ස්ථාපිත කිරීමට  දූත මණ්ඩලය විසින් ගනු ලැබූ මූලාරම්භයට තදනන්තරව, අනාගත සංස්කෘතික හා ප්‍රජා-මූල උත්සව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම පිණිස දූත මණ්ඩලය විසින් 2019 ජනවාරි මස 23 වන දින සියළුම නියෝජිතයින්ගේ ඒකාබද්ධ රැස්වීමක් පවත්වන ලදී.
- ජාතික / සංස්කෘතික උරුමයක පිළිබඳ  ප්‍රත්‍යාභිඥාණය ලබා ගැනීම පිණිස ථෙරවාද ත්‍රිපිටකය පිළිබඳ ධර්ම සාකච්ඡාවක්, යුනෙස්කෝ ලෝක උරුමයක්,  2019 මාර්තු මස 24 වන දින පැවැත්විණ.
- දූත මණ්ඩලය, ඉතාලියේ ශ්‍රී ලංකා සංගමය හා සමග ඒකාබද්ධව සංවිධානය කරන ලද නව අවුරුදු /නත්තල් උත්සව 2019 ජනවාරි මස 06 වන දින පැවැත්විණ.
- 'රාජ්‍යෝපාය අධ්‍යාපනය' වැඩසටහනෙහි එක් වැඩසටහනක්, සහ ශ්‍රී ලංකාව ගැන අධ්‍යයනයෙහි යෙදීමට අදහස් කරනු ලබන  උසස් පාඨශාලා ශිෂ්‍යයින්ගේ  ඉතාලි පංතිය අනුමත කර ගැනීම,  2019 අප්‍රියෙල් මස 05 වන දින  දූත මණ්ඩල පරිශ්‍රයේදී සිදුවිය.
- පොසොන් උත්සවය සැමරීමේ සහ  අප්‍රියෙල් 21 පාස්කු දින බෝම්බ ප්‍රහාරයේ වින්දිතයින් සැමරීමේ විශේෂ ආගමික උත්සවයක්, බෞද්ධ සහ ක්‍රිස්තියානි ලබ්ධිකයින්ගේ සහභාගිත්වයෙන් 2019.06.29 වන දින දූත මණ්ඩල පරිශ්‍රයෙහිදී පවත්වන ලදී.
- අප්‍රියෙල් 21 පාස්කු දින බෝම්බ ප්‍රහාරයේ වින්දිතයින් සැමරීමේ විශේෂ උත්සවයක්,2019.05.28 වන දින රෝමයේ, ලා ස්ටෝර්ටා දේවස්ථානයෙහි වයා කැසියාහිදී පවත්වන ලදී.  තවද, පාස්කු ඉරිදා ප්‍රහාරයේ වින්දතයින් සැමරීම පිණිස විශේෂ දේව මෙහෙයක්, කොළඹ අගරදගුරු, අතිපූජ්‍ය මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ සහභාගිත්වයෙන් , 2019.07.07 වන දින,  රෝමයේ ලෝරන්තිනා දේවස්ථානයේදී පවත්වන ලදී.  අතිගරු තානාපතිතුමා, කාර්ය මණ්ඩලය සමඟ සහභාගී විය.

- 2009- ඒසියාටිකා චිත්‍රපට උළෙල - 20 වන සංස්කරණය 2019 ඔක්තෝබර් මස 01-10 දක්වා රෝමයේදී පැවැත්විණ. වෙනත් ජාත්‍යන්තර චිත්‍රපට 07 ක් සමග ශ්‍රී ලංකාව නියෝජනය කරමින් තරඟකාරී අංශයෙහි, 'අසන්ධිමිත්තා' නම් ශ්‍රී ලාංකික චිත්‍රපටය තිරගත විය. දූත මණ්ඩල කාර්ය මණ්ඩල සාමාජිකයෝ උත්සවය සම්බන්ධීකරණය කර, සහභාගී වූහ.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

- 2019 වසරේදී ඉතාලිය ශ්‍රී ලංකාවේ 5වන විශාලතම අපනයන වෙළඳ කොටස්කරුවා (අපනයන පංගුව 4.4%) විය. 2018 සමස්ත අපනයන ආදායම ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 526 ක් වූ අතර, 2018 වසරේ ආදායම සාපේක්ෂව ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 577.68 කි. එය අපනයන ආදායමෙහි 7.6% ක, එනම් ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 44 ක අඩුවීමකි. ඉහළතම අපනයන අයිතමයන් වන්නේ ඇඟළුම් ( 80%), රබර් නිෂ්පාදන ( 9%), මුහුදු මාළු (6%) සහ වටිනා/අර්ධ වටිනාකමකින් යුත් මැණික් (3.6%) ය. ශ්‍රී ලංකාව ඉතාලියෙන් 2019 දී ආනයනය කරණ ලද ද්‍රව්‍යවල වටිනාකම ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 307ක් වන අතර, 2018 ආනයන වටිනාකම වන ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 318 ට සාපේක්ෂව එය 3.5% ක (ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 11) අඩුවීමකි. ඉතාලියෙන් ආනයනය කරන ලද ප්‍රධාන තම ද්‍රව්‍ය වන්නේ යන්ත්‍රෝපකරණ, රෙදිපිළි සහ ප්ලාස්ටික් භාණ්ඩය. වෙළඳ ශේෂය සෑම කල්හිම ශ්‍රී ලංකාවට වාසි සහගව පැවතිණ.
- දූත මණ්ඩලය විසින් ශ්‍රී ලාංකික වෙළඳ ප්‍රදර්ශන/සම්මන්ත්‍රණ හයක් සහ ඉතාලි වෙළඳ ප්‍රදර්ශන අටක් සම්භාව්‍ය මිළදී ගන්නන්/අපනයනකරුවන් අතර ප්‍රවර්ධනය කර ඇත. ශ්‍රී ලංකාව ප්‍රදර්ශකයින් 45 දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන්, වෙළඳ සහ සංචාරක අංශයෙහි වෙළඳ ප්‍රදර්ශන 3 කට සහභාගී වී ඇත. 2019 සැප්තැම්බර් මාසයේදී පේනෝආ බෝට්ටු ප්‍රදර්ශනයේදී අපයනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කිරීම දූත මණ්ඩලය විසින් සුසාධ්‍යකරණය කරණ ලද අතර, එයට ප්‍රදර්ශකයින් තිදෙනෙක් සහභාගී වූහ. සම්භාව්‍ය මිලදී ගන්නන්, වෙළඳ සංගම් සහ වෙළඳ මණ්ඩල සමග 'ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට' රැස්වීම් කිහිපයක්ද සංවිධානය කෙරිණ.
- 2019 වර්ෂයේදී, වෙළඳ විමසීම් 39 කට අධික සංඛ්‍යාවකට සේවය සලසන ලද අතර, ටෙන්ඩර් ලේඛණ 72 ක් සංසරණයෙහි යොදවා, වෙළඳ මණ්ඩල අතර ප්‍රචාරණය සිදු කරන ලදී. එක් වෙළඳපොළ අධ්‍යයන වාර්තාවක් සකස් කෙරිණ. කේවල මිල දී ගන්නන් 04 කගේ ශ්‍රී ලංකා සංචාරයට අමතරව, ඉතාලියෙන් බහිර්ගාමී නියෝජනයන් දෙකක් සහ ශ්‍රී ලංකාවෙන් අන්තර්නම්‍ය නියෝජන පහක් සුසාධ්‍යකරණය කෙරිණ.

**සංචාරක ප්‍රවර්ධනය**

- අප්‍රියෙල් මාසයේ පාස්කු ඉරිදා ප්‍රහාරය නොතකා, 2019 අවසාන වන විට සංචාරකයින් 1,913,702 ක් දිවයිනේ සංචාරයේ නිරත වූ අතර, ඉන් 36,147 ක් ඉතාලියෙනි. 2018 වර්ෂයේ පැමිණි 2,333,796 න්, 38,379 ක් ඉතාලියෙනි. 2019 වසරේ සමස්ත ආගමනයෙන් අඩුවීම වන 19.6% ට සාපෙක්ෂව ඉතාලියෙන් පැමිණි සංඛ්‍යාවේ අඩුවීම 5.8 % කි. මෙයට හේතු පාදක වූයේ ශ්‍රී ලංකා සංචාරය විසින් ඉතාලියෙහි ඉටු කරන ලද විස්තෘත ප්‍රවර්ධනයයි. (ඉතාලිය විසින් අනවශ්‍ය ලෙස ශ්‍රී ලංකාවේ සංචාරයෙහි යෙදීමෙන් වළකන ලෙස 2019 අප්‍රියෙල් මස 29 වන දින ස්වකීය පුරවැසියනට නිකුත් කරන ලද චාරිකා විරෝධී උපදේශය, සංචාර තුළදී සුපරීක්ෂකාරී වන ලෙස දන්වමින් 2019 මැයි මස 29 වන දින සංශෝධනය කරන ලදී).
- දූත මණ්ඩලය විසින්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහාය ද ඇතිව 2019 වසරේදී ප්‍රවර්ධන වැඩ සටහන් 02 ක් සංවිධානය කරන ලද අතර, කාර්යාංශය මිලාන් හි සහ බොලොන්ගා හි පිහිටීම පාදක කර ගත් ප්‍රවර්ධන වැඩ සටහන් 02 ක් සංවිධානය කර, මිලාන් හි නාගරික සහ උමං මං දුම්රිය ස්ථානවල, ඩිජිටල් තිර 36 ක් සහිතව විශාල ප්‍රමාණයේ බාහිර පාරිභෝගික ප්‍රවර්ධන වැඩ සටහන් දියත් කළහ.
- මෙයට අමතරව, මිලාන් හි බීඅයිටී නම් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයක්ද, රිමනි හි, ටිටිජී ඉන්කොන්ට්‍රි නම් ප්‍රදර්ශනයක්ද සංවිධානය කරන ලද අතර, එක් එක් උත්සවයට ප්‍රදර්ශකයින්/අමුත්තන් 20 දෙනෙකුට වඩා සහභාගී වූහ. එසේම, ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට රැස්වීම් 2 ක්ද, පුවත්පත් සාකච්ඡාවක්ද පවත්වන ලද අතර, එයට මාධ්‍ය, චාරිකා සහ

පෞද්ගලික වෙබ් අඩවිකරුවන් 40 කට වැඩි පිරිසක් සහභාගී වූහ. මෙම වකවානුව තුළ පුවත්පත් කලාවේදීන් 03 දෙනෙකුට දැනහඳුනා ගැනීමේ චාරිකා සංවිධානය කරන ලද අතර, චාරිකා ප්‍රචාරක දැන්වීම් දෙකක් ඉතාලි චාරිකා සඟරාවල පළ කෙරිණ.

**ආයෝජන ප්‍රවර්ධනය**

- එය ශ්‍රී ලංකාවේ 17 වන විශාලතම විදේශ ආයෝජකයාය. ඉතාලියෙන් ලත් සෘජු විදේශ ආයෝජනය යුරෝ මිලියන 9.1 ක් වූ අතර, පවත්නා ආයොජකයා වන ඔමෙගාලයින් වූ කළී ඉතාලියේ ප්‍රධානතම ලැංශ්රී නිෂ්පාදකයෙකු මෙන්ම කැල්ෂෙ ඩෝනියා සමාගම් සමූහයෙහි උපයෝගී සමාගමකි. යුරෝපය, ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය, චීනය සහ කොරියාව ඇතුළු රටවල් 42 ක සාප්පු 4,600 ක හිමිකරුවෙකි. 2017 වසරේදී යුරෝ මිලියන 7.5 ක් ආයෝජනය කර ඇති අතර, සඳලංකාවේ දැනට ඇති කර්මාන්ත ශාලාව අධිශ්‍රේණිගත කිරීම පිණිස 2019 ඔක්තෝබර් මාසයේදී, තවත් ඇ.ඒ.ප.ඩොලර් මිලියන 24 ක ආයෝජනයක් සඳහා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹී ඇත. ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධානතම ඉතාලි ආයොජනයන් කර ඇත්තේ රෙදිපිළි, පාවහන් සහ විවේකය සැපයීම සහ ස්වර්ණාභරණ අංශයන්හිය. මෙයට, කැල්ෂේඩෝනියා ස්පා (ඇඟළුම්), ඩයිෆෙගිස්පා (පාවහන්), එච්කියුඑල් ඉටැලියා (පාවහන්), කැල්ෂේ ෆිසියෝ සබිනෝ ස්‍රල්ලා (පිරිමි මේස්), කොසියාඩි ඕරෝ (ස්වර්ණාභරණ) සහ දකුණු පළාතේ ඉතාලි ආපනශාලා සහ අමුත්තන්ගේ නිවාස කිහිපයක්ද ඇතුළත්ය.

**සේවා නියුක්ති ප්‍රවර්ධනය සහ ශ්‍රමික සුබසාධනය**

- 2011 වසරේදී දෙරට අතර අත්සන් තබන ලද ද්විපාර්ශ්වීය ගිවිසුමට අනුව, ඉතාලියේ ශ්‍රමිකයින් බඳවාගන්නා නියෝජිතායතනයන් අතරින් ශ්‍රී ලාංකිකයින් සඳහා රැකියා ප්‍රස්ථාවන් ලබා ගැනීමෙහිලා දූත මණ්ඩලය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට සහාය විය. ඉතාලි රජයේ කම්කරු සහ සමාජ ප්‍රතිපත්ති අමාත්‍යාංශය, 2014 වසරේ පුනුණුව ලත් ශ්‍රී ලංකා ශ්‍රමිකයින්ගේ විස්තර වහාම බඳවා ගැනීම පිණිස උඩුගත කිරීම මඟින් ඔවුන් නිෂ්කාෂණය කිරීමෙන් දූත මණඩලයට සහාය දැක්වීය. කෙසේ වුවද, අනුග්‍රාහකත්වය නොමැතිකමින් මෙම ව්‍යාපෘතිය අත්හිටුවා ඇති අතර, 2020 මුල් භාගයේදී අවසර ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන් දූත මණ්ඩලය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග පසු විපරමෙහි යෙදී සිටී.
- විශාල වෘත්තිය සමිති/රාජ්‍ය නොවන සංවිධාන දෙකක්, නිදහස් නීති උපදෙස් සහ වෙනත් සමාජ සුබසාධනයන් සැලසීමෙන්, ඉතාලියේ ශ්‍රී ලාංකික ප්‍රජාවට ලබා දෙන සහාය පුළුල් කර ඇත. සීපීඅයි එල් : ඉතාලි මහා ශ්‍රමික සන්ධානය වූ කළී ඉතාලියේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයකි. එසීඑල්අයි: 1945 සිට ක්‍රියාත්මක ලාභ නොලබන රාජ්‍ය සේවයක් වන පැට්‍රෝනාටෝ ඒසීඑල්අයි යනු පෞද්ගලික නීති සංවිධානයකි. එහ ව්‍යුහය නිර්මාණය කර ඇත්තේ ඒසීඑල්අයි හෙවත් ඉතාලි ශ්‍රමිකයින්ගේ කතෝලික සංගමයයි.

**කොන්සියුලර් ජංගම සේවා**

- ප්‍රජා සාමාජිකයින්ගේ කොන්සියුලර් සේවාවන් විධිමත් කිරීමට සහ කඩිනම් කිරීම සඳහා ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත විහිදී යාමේ කොටසක් ලෙස, තානාපති කාර්යාලය විසින් ඉතාලියේ දුර බැහැර හුදකලාවූ කලාපවල ජංගම කොන්සියුලර් සේවාවක් දියත් කර ඇත. මෙම ජංගම සේවාව ඉතාලියේ දුරබැහැර කලාපවල ජීවත්වන ශ්‍රී ලාංකිකයින් විශාල සංඛ්‍යාවකට බෙහෙවින් ප්‍රයොජනවත් විය. 2019 වසරේදී, බාරි, මෙසිනා, ෆ්ලොරන්ස් සහ පැලර්මෝ යන ප්‍රදේශවල ජංගම සේවාවන් 04 ක් දියත් කරන ලද අතර, එකී පළාත්වල ජීවත්වන 1,500 කට අධික ශ්‍රී ලාංකිකයිනට පෞද්ගලිකවම සේවය ලබා දෙන ලදී.

**ලක්ෂම්බර්ග්**

**ලක්ෂම්බර්ග් සමග ද්විපාර්ශ්වීය සබඳතා**

- 2019 ජූලි මස 12-13 දින, ලක්ෂම්බර්ග්හි පැවැති අරාබි අප්‍රිකානු ජාත්‍යන්තර බැංකු රැස්වීම්වලට සහභාගී වීම පිණිස පැමිණි මුදල් අමාත්‍ය, ගරු මංගල සමරවීර මහතාගේ සංචාරයේ ආනුෂංගික සේවා තානාපති කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරන ලදී.
- තානාපතිතුමා ස්වකීය අක්ත පත්‍ර ප්‍රදානය සඳහා රාජ්‍යාත්තම ආදිපාදිවරයා බැහැ දුටු අවස්ථාවේදී, ලක්ෂම්බර්ග් තානාපති කාර්යාලය නවදිල්ලියේ සිට කොළඹට අක්ත ගන්වා, ලක්ෂම්බර්ග් ශ්‍රී ලංකාවට අක්ත ගන්වන ලෙස කර ඇති ඉල්ලීම සිහිපත් කරවන ලද අතර, ඒ අනුව අක්ත ගැන්වීම 2019 ඔක්තෝබර් මස 31 වන දින ප්‍රකාශයට පත් කෙරිණ.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

- තානාපති කාර්යාලය ලක්ෂම්බර්ග් වෙළඳ මණ්ඩලය සමග අන්තර්-ක්‍රියා කොට සාමාජිකයින් අතර සංසරණය සඳහා ශ්‍රී ලංකාවේ ඇති ආයෝජන සම්භාව්‍යතාවයන් පිළිබඳ විස්තර බෙදා හදා ගන්නා ලදී.
- තානාපති කාර්යාලය සක්‍රීයව ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට සබඳතා සුසාධ්‍යකරණය කරණ ලදී. අපගේ අපනයනයන් 2018 වසරේ යුරෝ 10,753 සිට 2019 දී යුරෝ 61,519 දක්වා වැඩි වී ඇත. විශේෂයෙන් අපගේ ඇඟළුම්, මැණික් සහ සවර්ණාභරණ අපනයනයන් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

**ලක්ෂම්බර්ග් හි සංචාරක ප්‍රවර්ධනය**

- ලක්ෂම්බර්ග් සිට සංචාරක ආගමනය 2017 වසරේ 616 ට සාපේක්ෂව 2019 වසරේදී 761 දක්වා වැඩිවී ඇත.
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් අනුග්‍රහය දක්වන ලද පරිදි, තානාපති කාර්යාලය විසින් 2019 ජනවාරි මස 18-20 දක්වා ලක්ෂම්බර්ග්හිදී පවත්වන ලද වකාන්ස් සංචාරණ වෙළඳ ප්‍රදර්ශනයෙහි 27 වන සංස්කරණයේදී ශ්‍රී ලංකා මණ්ඩපයක් සංවිධානය කරන ලදී. ලක්ෂම්බර්ග් වැසියන් විශාල සංඛ්‍යාවක් මෙම මණ්ඩපයට අනුග්‍රහය දක්වන ලද අතර, ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලීමේ උනන්දුව ප්‍රකාශ කරන ලදී.
- තානාපති කාර්යාලය විසින්, 2019 ජූනි මස 27 වන දින ලක්ෂම්බර්ග්හි බිට්බෑන්ග් ටෙනිස් ක්‍රීඩා සමාජයේදී "විසිට් ශ්‍රී ලංකා" සන්ධ්‍යා සාදය සමඟ සංචාරක ප්‍රවර්ධන ව්‍යාපාරයක් දියත් කරන ලදී. මෙම සාදය සංවිධානය කරන ලද්දේ ලක්ෂම්බර්ග්හි චාරිකා සහ සංචාර මෙහෙයවන්නන් සහ තුර්කි ගුවන් සේවයේ සහයෝගයෙනි. 150 කට අධික ලක්ෂම්බර්ග් වාසීන් සහභාගී වූ අතර, යහපත් ප්‍රතිචාරයක් හා පිළිගැනීමක් ලැබුණි.

**නෝර්වේ**

නෝර්වේහි, ඔස්ලෝ නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ෆින්ලන්තයට සහ අයිස්ලන්තයට අක්ත ගන්වා ඇත.

**ද්විපාර්ශ්වීය සබඳතා**

- ඔස්ලෝ නගරයේ නියෝජ්‍ය නගරාධිපතිනි, බාමිසපිනි ගුණාරත්නම් මහත්මියගේ ශ්‍රී ලංකා නිල සංචාරයට දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලද අතර, ඇය 2019.06.04 දින ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බැහැ දුටුවාය.
- නෝර්වේ රාජ්‍යයෙහි විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම් මේරියන් හේගන් මහත්මිය 2019.03.05 වන දින ගරු අග්‍රාමාත්‍යතුමා බැහැ දක්නා ලද අවස්ථාවේදී, බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා නෝර්වේජියන් ක්‍රෝන් මිලියන 60 ක (රුපි.මිලියන 1,242) නෝර්වේජියානු දායකත්වය ප්‍රකාශයට පත් කළාය.
- විදේශ කටයුතු අමාත්‍ය, ගරු තිලක් මාරපන මහතා 2019 මැයි මස 23-26 දක්වා ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සම්මන්ත්‍රණයකට සහභාගිවීම

පිණිස නෝර්වේ සංචාරයක යෙදුණි. ඔහු ස්වකීය නෝර්වීජියානු ප්‍රතිපූරකයා සමඟ ද්විපාර්ශ්වීය රැස්වීමකට සහභාගී විය.

- දූත මණ්ඩලය විසින්, 2019 අප්‍රියෙල් මස 17-20 දක්වා ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ නියෝජිත පිරිසේ නෝර්වේ සංචාරයට පහසුකම් සලසන ලද අතර, නෝර්වේහි ධීවර අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සමග ඵලදායී සාකච්ඡාවන්හි නිරත විය.
- ශ්‍රී ලංකාවේ උමා ඔය ව්‍යාපෘතියේ විශේෂඥ ඇගයීමක් සකස් කරමින් නෝර්වේ රාජ්‍යය විසින් කරන ලද මැදිහත්වීම මත පිහිටා, මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් අනුර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් නියෝජිත පිරිසකගේ නෝර්වේ සංචාරය සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී.

**ෆින්ලන්තය**

- දූත මණ්ඩලය විසින්, 2019.2.24 වන දින ඩිජිටල් යටිතල ව්‍යුහ අමාත්‍ය, අජිත් පෙරේරා මහතාගේ ෆින්ලන්ත නිල සංචාරය සඳහා පහසුකම් සලසන ලදී.
- දූත මණ්ඩලය විසින්, 2019 ජූනි මස 23-29 දක්වා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්, වසන්තා පෙරේරා මියගේ ප්‍රදානත්වයෙන් යුත් නියෝජිත පිරිසකගේ ෆින්ලන්ත සංචාරය සඳහා පහසුකම් සලසන ලදී.

**බහුපාර්ශ්වීය සබඳතා**

- විදේශ කටයුතු අමාත්‍ය, ගරු තිලක් මාරපන මහතා සහ යුරෝපා සහ මධ්‍යම ආසියා වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්, ධම්මිකා සේමසිංහ මහත්මිය, මානුෂීය අර්බුද මැද ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහභාගී වීම පිණිස නෝර්වේ රාජ්‍යයෙහි නිල සංචාරයක නියැලුණි.
- ගරු අග්‍රාමාත්‍යතුමාගේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශිකා, ජනාධිපති නීතිඥ බිම්බා තිලකරත්න මහත්මිය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ, සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශයේ අධ්‍යක්ෂ ජනරාල් හසන්ති දිසානායක මහත්මිය, 2019 ඔක්තෝබර් මස 23-24 දින පැවැති 'අපේ සාගරය -2019' ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සහභාගී වීම පිණිස ඔස්ලෝ සංචාරයක යෙදුණාහ.
- ජිනීවාහි, තානාපති/නිත්‍ය නියෝජිත සහ කොන්සල් ජෙනරාල්, ඒ.එල්.ඒ. අසීස් මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් දූත පිරිසක්, 2019 නොවැම්බර් මස 25-29 දක්වා ඔස්ලෝහි පැවැති පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීමේ සම්මුතියට සහභාගී වූහ.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

- ශ්‍රී ලංකාවේ මෘදුකාංග සහ සේවා සමාගම් සම්මේලනය සහ නෝර්වීජියානු විදේශ කටයුතු අමාත්‍යාංශය, අනාගතයේදී තිරසාර රැකියා උත්පාදනය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය වැඩිදියුණු කිරීමෙහි ලා තවදුරටත් සහයෝගිතාවය දැක්වීමට සහ එමගින් දැනුම මාරුකිරීමේ වැඩ සටහන් හරහා නවෝත්පාදන මතු කර ගැනීමේ ස්වකීය අපේක්ෂාව ප්‍රකාශයට පත් කර ඇත.
- ශ්‍රී ලංකාවේ මෘදුකාංග සහ සේවා සමාගම් සම්මේලනය සහ නෝර්වේජියානු විදේශ කටයුතු අමාත්‍යාංශය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයෙහි සහයෝගිතාවය පෝෂණය කිරීම පිණිස දෙවසරක ගිවිසුමකට එළඹී ඇත.
- ශ්‍රී ලංකාවේ මෘදුකාංග සහ සේවා සමාගම් සම්මේලනයයේ නියෝජිත පිරිසකගේ 2019 ජූනි මස 28 වන දින ෆින්ලන්තයේ, හෙල්සින්කි සංචාරය සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සපයා ඇත.
- ශ්‍රී ලංකාවේ ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලයේ ලේකම් ජනරාල් ෂිහාම් මරිකාර් මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් වෙළඳ නියෝජිත පිරිසක් 2019 ජූනි මස 13-16 දක්වා ඔස්ලෝහි සංචාරය සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සපයා ඇත. මෙම නියෝජිත

පිරිසට තොරතුරු තාක්ෂණ, පොල්, පළතුරු, එළවළු, කුළුබඩු, උද්‍යාන විද්‍යා, කුකුළන් ඇති කිරීම, සත්ව පාලනය සහ පුනර්ජනනීය කොහු අංශ ව්‍යාපාර හිමිකරුවන් අයත් වේ.

- නැගෙනහිර සමුද්‍ර ද්‍රෝණියෙහි දෙවසරක තෙල් සහ ගෑස් ගවේෂණයක යෙදීම පිණිස ශ්‍රී ලංකා රජය නෝර්වේහි සහ ප්‍රංශයෙහි බලශක්ති සමාගම් දෙකක් සමග ගිවිසුමකට එළඹී ඇත.
- ව්‍යාපාරික නියෝජනයක් සඳහා 31 ක් දෙනෙකුගෙන් යුත් තරුණ ශ්‍රී ලාංකික ව්‍යවසායකයන් පිරිසකගේ 2019 සැප්තැම්බර් 07 - 09 දක්වා හෙල්සින්කි සංචාරය දූත මණ්ඩලය විසින් පහසුකම් සපයන ලදී.

**සංචාරක ප්‍රවර්ධනය**

- තානාපති කාර්යාලය, 2019 ජනවාරි මස 11-13 දක්වා ඔස්ලෝහි පැවති වාර්ෂික සංචාරක චාරිකා වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී විය.
- තානාපතිතුමා ක්‍රිස්ටියන්සෑන්ඩ්හි පැවැති ජාත්‍යන්තර සංචාරක / සංස්කෘතික උත්සවයකට සහභාගී විය.
- පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති පියවර සම්බන්ධයෙන් චාරිකා සමාගම් යාවත්කාලීන කිරීම පිණිස නෝර්වේ එමිරේට්ස් විසින් සංවිධානය කරන ලද රැස්වීමකට තානාපති කාර්යාලය සහභාගී වන ලදී.
- තානාපති කාර්යාලය, එල්ඕටී පෝලන්ත ගුවන් සේවය සමග එක්ව, 2019 නොවැම්බර් මාසයේදී වෝර්සෝ සිට කොළඹ දක්වා සෘජු ගුවන් සේවය ආරම්භ කිරීම උත්සවාකාරයෙන් සමරන ලදී.
- 2015 වසරේදී, ඔස්ලෝහි, සාමය උදෙසා ව්‍යාපාර - ත්‍යාග ප්‍රදානයේ ජයග්‍රාහකයෙකු වූ මෙරිල් ප්‍රනානදු මහතාගේ චාරිකාවට සමගාමීව තානාපති කාර්යාලය විසින් රැස්වීමක් සංවිධානය කරන ලදී. මෙම උත්සවයට චාරිකා සමාගම්, චාරිකා ලේඛකයෝ, තානාපතිවරු සහ ගුවන් සේවා නියෝජිතයෝ සහභාගී වූහ.

**සංස්කෘතික සබඳතා**

- තෙපොන්ගල් උත්සවය වෙනුවෙන් ඔස්ලෝහි, හින්දු කෝවිලෙහි 2019.01.15 වන දින පවත්වන ලද විශේෂ පූජාවට තානාපතිතුමා සහ කාර්ය මණ්ඩලය සහභාගී වූහ.
- ශ්‍රී ලංකා නිදහස් දිනය සැමරීමේ 71 වන සංවත්සරය 2019 පෙබරවාරි 04 වන දින ඔස්ලෝහි, තානාපති කාර්යාලයේදී පැවත්විණ.
- ශ්‍රී ලංකාවේ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිතයින් සැමරීම පිණිස ඔස්ලෝහි බිෂොප්තුමන්ගේ ප්‍රධානත්වයෙන් 2019 අප්‍රියෙල් මස 26 වන දින පැවැති අනුස්මරණ දේව මෙහෙයට, නෝර්වේහි හැරල්ඩ් V රාජ්‍යාත්තමයානන්, නොර්වේ අග්‍රාමාත්‍ය, ගරු අර්නා සොල්බර්ග් මහත්මිය, අනෙකුත් බිෂොප්තුමන්ලා, සියළුම ආගම්වල පූජක පක්ෂ, නෝර්වේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සාමාජිකයන් සහ තානාපතිවරුන් සහභාගී වූහ.

**පෝලන්තය**

**ද්විපාර්ශ්වීය සබඳතා**

- ශ්‍රී ලංකාව සහ පෝලන්තය, දේශපාලන සම්බන්ධතා සහ ආර්ථික හා සංස්කෘතික නිමග්නයනගෙන් සනිටුහන් වන දීර්ඝකාලීන මිත්‍ර සන්ථවයක හිමිකරුවෝ වෙති. 1999 වර්ෂයේදී වෝර්සෝහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විවෘත කිරීමට මග පාදමින් රාජතාන්ත්‍රික සබඳතා ආරම්භ කරන ලදදේ 1957 වර්ෂයේය.
- 2019 ජනවාරි මස 09 වන දින, නව තානාපතිවරයා විසින් අක්තපත්‍ර ප්‍රදානයෙන් පසු පැවැති රැස්වීමේදී, පෝලන්තය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සබඳතා ප්‍රවර්ධනයට, සංචාරක කර්මාන්තය හා අධ්‍යාපනය ආශ්‍රිත සහයෝගිතාවයට සහ දේශපාලන සහ සංස්කෘතික සහයෝගිතාවයට තම රජයේ සම්පූර්ණ සහාය ලබා දෙන බවට ජනාධිපති ඩුඩා සහතික විය.

**පෝලන්තයේ නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය, ගරු මසීජ් ලැං මහතාගේ ශ්‍රී ලංකා සංචාරය (2019 සැප්තැම්බර් 04-07)**

- සංචාරය තුළ ද්විපාර්ශ්ව දේශපාලන උපදේශනයන් කැඳවිණ.
- වෝර්සෝ- කොළඹ අතර සතියකට තෙවරක් එල්ඕටී පෝලන්ත ගුවන් සේවයේ ගුවන් ගමන් සබැඳිය දියත් කෙරිණ.
- පෝලන්තයේ ජාතික වාණිජ සංගමය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරණ ලද පෝලන්ත - ශ්‍රී ලංකා ව්‍යාපාර සංසදය (2019 නොවැම්බර් 05)
- ශ්‍රී ලංකා ජාතික වෙළඳ සංගමය සහ පෝලන්ත වෙළඳ සංගමය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබිණ.
- කොළඹ සහ වෝර්සෝ විශ්ව විද්‍යාල විසින් සංවිධානය කරණ ලද "මධ්‍යම යුරෝපය සහ ආසියා ශාන්තිකරය සොයා ගනිමින් " සම්මන්ත්‍රණය - කොළඹ විශ්ව විද්‍යාලයේ, උපාධි අධ්‍යයන පීඨයේදී, (2019 නොවැම්බර් 06)

**දේශපාලන උපදේශනය මත අවබෝධතා ගිවිසුම අත්සන තැබීම**

- උපදේශනයන් අතරතුර, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරුන් දෙදෙනා විසින්, ශ්‍රී ලංකා සහ පෝලන්ත විදේශ කටයුතු අමාත්‍යාංශ අතර දේශපාලන උපදේශන යාන්ත්‍රණයක් ස්ථාපිත කරමින්, අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී. මෙම අවබෝධතා ගිවිසුම අනාගත ද්විපාර්ශ්වීය සබඳතාවන් වර්ධනය කර ගැනීමේ භව්‍යතාවයන් මත නාභිගත වේ.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

- දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලද, 2019 අප්‍රියෙල් මස 25-26 දින දක්වා සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්, එස්.ටී. කොඩිකාර මහතාගේ සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිනි, ඉන්දිරා මල්වත්ත මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලාංකික වෙළඳ නියෝජිත පිරිසකගේ පෝලන්ත සංචාරය, ශ්‍රී ලංකාව සහ කලාපය අතර වෙළඳ සබඳතා ශක්තිමත් කර ගැනීමට ඉවහල් විය. 2019 වසර තුළ, මධ්‍යම යුරෝපීය රටවල සමස්ත අපනයන වටිනාකම ඇ.එ.ජ.ඩොලර් මිලියන 388 ක් සහ ආනයන වටිනාකම ඇ.එ.ජ.ඩොලර් මිලියන 422 ක් වීම අනුව, සමස්ත ද්විපාර්ශ්වීය වෙළඳ වටිනාකම ඇ.එ.ජ.ඩොලර් මිලියන 810 ක් විය.

**වෝර්සෝ හි, ව්‍යාපාර සංසද සහ 'ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට' රැස්වීම්**

- වෝර්සෝ තානාපති කාර්යාලය සහ පෝලන්ත වෙළඳ මණ්ඩලය විසින්, 2019 අප්‍රියෙල් 25 සහ 26 දෙදින වෝර්සෝහිදී ව්‍යාපාර සංසද සහ ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට රැස්වීම් සංවිධානය කරන ලදී.
- පෝලන්ත සමාගම 40 කට අධික සංඛ්‍යාවක් ව්‍යාපාර සංසදයට සහභාගී වූ අතර, ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට රැස්වීම් 40 කට අධික සංඛ්‍යාවක් පැවැත්විණ

මධ්‍යම යුරෝපීය වෙළඳපොළ ශ්‍රී ලංකාවට වඩාත් දැරිය හැකි සහ සමීප විය හැකි වෙළඳපොළක් බවට හඳුනා ගන්නා ලද අතර, නියෝජිත පිරිසට දෙරටෙහිම ව්‍යාපාර අලෙවිකරණය, හවුල් ව්‍යාපාර සහ විභාජන අයිතිය වර්ධනය කර ගැනීමේ ඉඩ ප්‍රස්ථාව උදා විය.

පහත දැක්වෙන ආර්ථික ක්‍රියාකාරකම්ද සහිත වේ :

- ශ්‍රී ලංකා වෙළඳ සමාගම් සඳහා 2019 මාර්තු මස 22-23 දෙදින යුරෝ ගැස්ට්‍රෝ ප්‍රදර්ශනයට සහභාගී වීමේ අවස්ථාව සුසාධ්‍යකරණය කර, අවශ්‍ය සහාය ලබා දෙන ලදී.
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා එක්ව, 2019 අප්‍රියෙල් මස පැවති ලෝක ආහාරපාන වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වන ලදී.

**සංචාරක ප්‍රවර්ධනය**

- මැයි මාසයේදී පෝලන්තයේ සංචාරක පාරිභෝගික ප්‍රවර්ධන ඉසව් - සංචාරක අමාත්‍යාංශයේ, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් තානාපති කාර්යාලයේ සම්බන්ධීකරණයෙන්, යෝධ සංචාරක ප්‍රවර්ධන ඉසව්වක් ක්‍රියාත්මක කරන ලද අතර, එයට විස්තරාත්මක හා දැනුම දනවන සමර්පණ සහ වැඩමුළු, ශ්‍රී ලාංකික හා පෝලන්ත චාරිකා/සංචාර නියෝජිතයින් අතර ප්‍රතික්‍රීය අන්තර්-ක්‍රියාකාරිත්වය, ප්‍රශ්න හා පිළිතුරු සැසි, ලොතරැයි සහ සංස්කෘතික ප්‍රසංගයන් ඇතුළත් විය. මෙම උත්සවය මැයි මස 31 වන දින සිට ජූනි 02 දක්වා පැවැත්වුණ අතර, දින තුනකට අධික කාලයක් පුරා දස දහසක පමණ පිරිසක් සහභාගිවිය.
- තානාපති කාර්යාලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා එක්ව, නොවැම්බර් මස 21-23 දක්වා, වෝර්සෝහි සංස්කෘතික හා විද්‍යා මන්දිරයෙහි පැවැති, 27 වන ජාත්‍යන්තර චාරිකා ප්‍රදර්ශනයට සහභාගී විය. ප්‍රධානතම සංචාරක සමාගම 15කින්, ශ්‍රී ලංකාව නියෝජනය විය.

**සංස්කෘතික සබඳතා**

- තානාපති කාර්යාලය, 2019 ජනවාරි මස 15 වන දින, වෝර්සෝ විශ්ව විද්‍යාලයේ ප්‍රාචීන අධ්‍යයන දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යයන්ගේ වාර්ෂික සභා රැස්වීමට සහභාගි විය. නිදහස් දින සැමරුම - තානාපති කාර්යාලය, රාජතාන්ත්‍රික ප්‍රජාව සහ ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහභාගිත්වය ඇතිව, පොලෝනියා පැලස් හොටලයේදී, ශ්‍රී ලංකාවේ නිදහස් දින 71 වන සංවත්සරය සමරන ලදී. 2019 අප්‍රියෙල් මස 01 දින, තානාපති කාර්යාලය විසින්, විශ්වවිද්‍යාල චාන්සරියේදී, පෝලන්ත විශ්ව විද්‍යාලයේ දක්ෂතම ශිෂ්‍යයින් අතර රාජ්‍යෝපාය, ව්‍යාපාර සහ භූ දේශපාලන විද්‍යාව පිළිබඳ දැනුම ව්‍යාප්ත කරලීමට ඇපකැපවී ක්‍රියා කරන්නාවූ වෝර්සෝ විශ්ව විද්‍යාලයේ, ආර්ථික විද්‍යා අධ්‍යාපනාංශයෙහි, විදේශ කටයුතු සමාජය විසින් සංවිධානය කරණ ලද 'ක්‍රියාබද්ධ රාජ්‍යෝපාය ව්‍යාපෘතියේ විශ්වවිද්‍යාලීය ශිෂ්‍යයින් 17 දෙනෙකුගේ කණ්ඩායමක් පිළිගෙන, ආගන්තුක සත්කාර පිරිනමන ලදී.
- පෝලන්තයේ ශ්‍රී ලාංකික ප්‍රජාව හා සමඟ, මැයි මාසයේදී වෙසක් උත්සවය සැමරීමටද තානාපති කාර්යාලය විසින් කටයුතු කරන ලදී.
- සමාජ විද්‍යා සහ මානව විද්‍යා විශ්ව විද්‍යාල ජාත්‍යන්තර දිනය සැමරීමටද තානාපති කාර්යාලය එක්විය.
- තානාපති කාර්යාලය, 2019 සැප්තැම්බර් මස 26 වන දින, 'අපේ ධරණීතල පදනම' විසින් සංවිධානය කරන ලද, 'ලෝකය පිරිසිදු කරමු' වැඩ සටහනට සහභාගීවිය.
- තානාපති කාර්යාලය, 2019 ඔක්තෝබර් මස 26 වන දින, චාන්සරියේදී, පෝලන්තයේ ශ්‍රී ලාංකිකයින් හා එක්ව, දීපවාලි උත්සවය පවත්වන ලදී.

**ශ්‍රමික සුබසාධනය**

- පෝලන්තයේ සිටි රැඳවියෙකු, ප්‍රති-ප්‍රවේශ ගිවිසුම යටතේ සිය රට ගෙන්වා ගැනීම පිණිස සම්බන්ධීකරණය සහ අවශ්‍ය විධිවිධාන සලසන ලදී.
- පෝලන්ත හා රොමේනියානු බලධාරීන් විසින් දෙරට පදිංචි ශ්‍රී ලාංකික ප්‍රජාවගේ නෛතිකමය ලිපි ලේඛණ සහතික කිරීම/සත්‍යතාවය තහවුරු කිරීම/බලය දීම සම්බන්ධයෙන් කොන්සියුලර් සහාය ලබා දෙන ලදී.
- පෝලන්ත හා රොමේනියානු රැකියා ඇණවුම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ඉදිරිපත් කරන ලදී.

**රොමේනියාව**

**ද්විපාර්ශ්වීය සබඳතා**

**ගරු තිලක් මාරපන මහතාගේ රොමේනියානු සංචාරය - 2019 සැප්තැම්බර් 8-10**

- විදේශ කටයුතු අමාත්‍ය, ගරු තිලක් මාරපන මහතා, ස්වකීය රොමේනියානු සංචාරයේදී, ශ්‍රී ලංකා-රොමේනියානු ද්විපාර්ශ්වීය සබඳතාවයන් වැඩිදියුණු කර, තහවුරු කිරීමෙහි ලා රජය වග කියන බවට සහ කැපවන බවට යළි ප්‍රතිඥා දෙනු ලැබිණ.
- ගරු තිලක් මාරපන මහතා 2019 සැප්තැම්බර් මස 8-10 තුළ රොමේනියානු සංචාරයේ යෙදිණ. සැප්තැම්බර් මස 09 වන දින, රොමේනියාවේ දවිපාර්ශ්වීය ගෝලීය කටයුතු පිළිබඳ රාජ්‍ය ලේකම්, මොනිකා පොර්පිටා මහත්මිය හමුවූ අවස්ථාවේදී, දීර්ඝ කාලයක් තිස්සේ රොමේනියාව හා සමඟ පවතින ද්විපාර්ශ්වීය සබඳතා වැඩිදියුණු කර, තහවුරු කිරීමෙහි ලා රජය කැපවන බවට යළිත් සහතික විය.
- දේශපාලන,ආර්ථික, අධ්‍යාපනික, සංස්කෘතික, ආරක්ෂාව, කලාපීය හා බහුපාර්ශ්වීය විෂය ක්ෂේත්‍රයන්හි ද්විපාර්ශ්වීය ලැදියාවන් සාකච්ඡා අතරතුර සමාලෝචනයට භාජනය විය. බුචාරෙස්ට් හි දූත මණ්ඩල කාර්යාලයක් විවෘත කිරීම මගින් ඔවුන්ගේ රාජතාන්ත්‍රික ක්‍රියාවට අන්‍යොන්‍ය ලෙස ප්‍රතිචාර දක්වන මෙන් රොමේනියානු රාජ්‍ය අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා රජයෙන් කරන ලද ඉල්ලීම ධනාත්මකව සළකා බලන බව ගරු තිලක් මාරපන මහතා සඳහන් කර සිටියේය.

**බහුපාර්ශ්වීය සබඳතා**

- ද්විපාර්ශ්වීය වශයෙන් සහ ජාත්‍යන්තර සංසදයන්හි ලා, රොමේනියාව සහ ශ්‍රී ලංකාව සතුව පෝෂිත සහයෝගිතාවයක් පවතී. මෙම රාජ්‍යයන් දෙක, එක්සත් ජාතීන්ගේ කාර්ය රාමුව තුළ මෙන්ම අනෙකුත් ජාත්‍යන්තර සංවිධානයන තුළදී ද, එකිනෙකා විචාරමින් හා අන්‍යොන්‍ය උපකාරී වෙමින්, එකිනෙකාගේ අපේක්ෂත්වයන්ට සහාය වෙමින් කටයුතු කරති.

**ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු සංවිධානය (CIS)**

**භූගෝලීය වශයෙන් ආවරණය වන ප්‍රදේශ : 11**

ආමේනියාව, අසර්බයිජානය, බෙලාරුස්, කසකස්තානය, කිර්ජිස්තානය, මොල්ඩෝවා, රුසියාව, ටජිකිස්තානය, යුක්රේනය, උස්බෙකිස්තානය

**නේවාසික දූත මණ්ඩල : 01**

**රුසියාව**

**සමගාමී අක්ත ගැන්වීම් : 09**

මොස්කව් මගින් ආමේනියාව, බෙලාරුස්, මොල්ඩෝවා, උස්බෙකිස්තානය / ටෙහරාන් මගින් අසර්බයිජානය, ටර්ක්මෙනිස්තානය/ ඉස්ලාමාබාද් මගින් කිර්ජිස්තානය, ටජිකිස්තානය සහ අන්කාරා මගින් යුක්රේනය

**රුසියානු සමූහාණ්ඩුව**

රුසියාව සහ ප්‍රතිනත රටවල් 04 ක් (ආමේනියාව, බෙලාරුස්, මොල්ඩෝවා,උස්බෙකිස්තානය)

**ද්විපාර්ශ්වීය සබඳතා**

**අතිගරු තානාපතිතුමාගේ රැස්වීම් සහ නිල නිමග්නවීම්:**

- 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල වකවානුව තුළ, හිටපු තානාපති, ආචාර්ය දයාන් ජයතිලක මහතා ද්විපාර්ශ්වීය ස්වරූපයෙන් හෝ ප්‍රධාන බහුපාර්ශ්වීය සිද්ධි කාර්ය රාමුව

තුළ, පහත දැක්වෙන රැස්වීම් (ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, රැසියාව හෝ වෙනත් රාජ්‍යයන්හි ඉහළ පෙළ නිලධාරීන්ගේ රැස්වීම්) මෙන්ම විශ්ව විද්‍යාල රුසියාවේ ඉහළම හමුදා ඇකඩමිය සහ ප්‍රතිපත්ති පර්යේෂණ ආයතන කිහිපයක විශාල ග්‍රාහක පිරිසකට විහිදී යන්නාවූ අධ්‍යයන දේශන ගණනාවක් පවත්වන ලදී. මෙම රැස්වීම්, දේශන සහ විවිධ ඉසව්වල සහභාගිත්වය, රුසියාව සමග, වඩාත් බලවත් යුරේෂියානු රටවල් සමඟ, සහ කලාපීය ව්‍යුහයන්හි (සාක් වැනි) සහ අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය සමඟ අන්තර්-ක්‍රියාකාරකම්වලදී ද්විපාර්ශ්වීය සබඳතා වර්ධනය සඳහා ශ්‍රී ලංකාව සතු සම්භාව්‍යතාවය ඉස්මතුකර පෙන්වා දෙමින්,

දකුණු ආසියාවේ සහ ගෝලීය කාර්ය රාමුව තුළ ප්‍රධානතම කලාපීය ක්‍රියාධරයෙකු ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා දායක විය. ශ්‍රී ලංකාවේ පශ්චාත් - පාස්කු ඉරිදා ප්‍රහාර සමයේදී, හිටපු තානාපති ජයතිලක මහතාගේ ද්විපාර්ශ්වීය අන්තර්ක්‍රියා වන්හි නහ්‍යයනය, මෙම විෂය ක්ෂෙත්‍රයෙහිදී, ප්‍රධානතම රුසියානු රාජ්‍ය කොටස්කරුවන් සමග ආරක්ෂාව, යුද හමුදාමය සහ හමුදාමය තාක්ෂණික සහයෝගිතාවයන්හි ද්විපාර්ශ්වීය සහයෝගිතාවය වෙත මුඛ්‍ය ලෙස විස්ථාපනය වීමක් සිදුව ඇත. ශාස්ත්‍රීය විහිදුම බොහෝ සෙයින් කලාපීය ප්‍රතිපත්ති සහ ගෝලීය ආරක්ෂාව පිළිබඳ අධ්‍යයනයන් මත කේන්ද්‍රගත වීමද සිදුවිය.

**රැස්වීම් ලැයිස්තුව**

- විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරුන් සමග රැස්වීම් (04)
- භූගෝලීය සහ කාර්යබද්ධ දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂවරුන් (10)
- වි.ක.අ.ප්‍රකාශක/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ සහ ප්‍රකාශන දෙපා. (01)
- අධ්‍යක්ෂ මට්ටම යටතේ වෙනත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය තාන්ත්‍රිකයින් (03)
- හිටපු විදේශ කටයුතු අමාත්‍ය (01)
- හිටපු විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය (01)
- ශ්‍රී ලංකාවේ හිටපු තානාපතිවරුන් (03)

සමස්ත රැස්වීම් සංඛ්‍යාව 23 කි.

**OGD සහ පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග රැස්වීම්:**

- ගරු සෙනෙට් සභික - සමූහාණ්ඩු සභාවේ සභාපති, අභ්‍යන්තර කටයුතු කමිටුව (1)
- ගරු සෙනෙට් සභික - සමූහාණ්ඩු සභාවේ උප සභාපති, අභ්‍යන්තර කටයුතු කමිටුව (1)
- ගරු සෙනේට් සභික- 1 වන නි.සභාපති, ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ සමූහාණ්ඩු සභා කමිටුව (1)
- ගරු සෙනේට් සභික - තොරතුරු ප්‍රතිපත්ති සහ මාධ්‍ය අන්තර්-ක්‍රියා පිළිබඳ සමූහාණ්ඩු සභා කමිටුව (1)
- ගරු මන්ත්‍රී - සභාපති, අධ්‍යාපනය හා විද්‍යා පිළිබඳ ඩුමා කමිටුව: සභාපති, පොලිටි පදනම (1)
- ගරු මන්ත්‍රී - ඩුමා සාමාජික, අභ්‍යන්තර කටයුතු කමිටුව (1)
- ආරක්ෂක 1 වන නියෝජ්‍ය අමාත්‍ය -කාර්ය මණ්ඩල ප්‍රධානි (1)
- ජාත්‍යන්තර සහයෝගිතා භාර ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය (වර්ෂය පුරා විවිධ ස්වරූපවල රැසවීම කිහිපයක්)
- රුසියානු ගොඩබිම් හමුදා ප්‍රධාන ආඥාපති (1)
- සමූහාණ්ඩු සේවා අධ්‍යක්ෂ, හමුදා තාක්ෂණික සහයෝගිතාවය (1)
- නියෝජ්‍ය ලේකම් - රුසියානු සමූහාණ්ඩුවෙ සභාපති යටතේ ගැනෙන රුසියානු ආරක්ෂක කවුන්සිලයේ නියෝජ්‍ය ලේකම් (1)
- රුසියාවේ හිටපු අග්‍රාමාත්‍ය (1)
- විදේශ බුද්ධි සේවා හිටපු අධ්‍යක්ෂ(1)

සමස්තයක් වශයෙන්, රැස්වීම් 12

- ජ්‍යෙෂ්ඨ දේශපාලන පක්ෂ සාමාජිකයින් සමග රැස්වීම් (2)
- ජ්‍යෙෂ්ඨ මාධ්‍ය/ ප්‍රධාන කර්තෘ, රසියා ටුඩේ - (1)

සමස්තයක් වශයෙන්, රැස්වීම් 03

- දේශපාලන සහ සාර්ව ආර්ථික පර්යේෂණ බුද්ධි මණ්ඩල අධ්‍යක්ෂවරුන් සමග රැස්වීම් - එකතුව- 28
- උසස් අධ්‍යයන (විශ්ව විද්‍යාල)සහ ප්‍රමුඛ පර්යේෂණ ආයතන (ජාත්‍යන්තර කටයුතු, හමුදා උපාය මාර්ග, කලාපීය අධ්‍යයන) කරන ලද දේශන මෙන්ම ඉහළ පෙළ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලදී කරන ලද කථා) - එකතුව - දේශන/කථා 15
- වෙනත් තානාපතිවරුන් සමග ද්විපාර්ශ්වීය රැස්වීම් - එකතුව 33.
- රුසියානු සගරාවල පළකල ලිපි - ප්‍රධාන ලිපි - 06 (කෙටි මාධ්‍ය සම්මුඛ පරීක්ෂණ/ප්‍රකාශ හැර)

සමස්ත එකතුව - රැස්වීම් 114 + ප්‍රධාන ලිපි 06)

**ද්විපාර්ශ්වීය සංචාර:**

- තානාපති කාර්යාලය, රුසියානු බලධාරීන්, ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අදාල ශ්‍රී ලංකා රේඛීය අමාත්‍යාංශ සමග සම්බන්ධීකරණයෙන්, 2019 වසරේදී අමාත්‍යාංශයීය රැස්වීම් ගණනාවක් සංවිධානය කරන ලද අතර, චාරිත්‍ර වාරිත්‍ර, අනුෂංගික සේවා සහ වෙනත් වින්‍යාසයන් විස්තර පහත පරිදි වේ.
- තානාපති කාර්යාලය විසින්, ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදංචි කිරීම්, සහ පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍ය ගරු නිරෝෂන් පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් අමාත්‍යාංශයීය ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමක් සුසාධ්‍යකරණය කරන ලද අතර, ඔවුහු 2019 ජූනි මස 04 - 09 දක්වා ස්ටාව්රොපොල් හි පවත්වන ලද තුන්වන BRICS සහ ෂැංහයි සහයෝගිතා සංවිධානයේ, ශිෂ්‍ය වසන්ත ජාත්‍යන්තර උත්සවයට සහ අධ්‍යාපන සංසදයට සහභාගී වූහ. පුවත්පත් කලාවේදීන්ගේ කණ්ඩායමේ සාමාජිකයින් 04 දෙනෙක්, BRICS සහ ෂැංහයි සහයෝගිතා සංවිධානයේ රටවල තරුණ පුවත්පත් කලාවේදීන්ගේ සංසද (II) ට සහභාගී වූහ. එක් ශ්‍රී ලාංකික නියෝජිතයෙකු " ශිෂ්‍යා රැජිණ-2019" XXVIII වන ජාත්‍යන්තර සුන්දරත්ව සහ සහජ කුසලතා තරඟයට සහභාගී වූ අතර, එක් නියෝජිතයෙකු "සාර්වත්‍රිකභාවය" - ජාත්‍යන්තර සංගීත තරඟයට සහභාගී විය. පස් සාමාජික නාට්‍ය කණ්ඩායම, "කලාගාරය" - ජාත්‍යන්තර නිර්මාණශීලී ව්‍යාපෘතියේදී සහ සමාප්ති උත්සවයෙදී, තම සම්ප්‍රදායික ශ්‍රී ලාංකික රංගනයෙන් ප්‍රේක්ෂකයින් වෙත විනෝදාස්වාදය ලබා දුන්හ. සහභාගී වූ සියළුම ශ්‍රී ලාංකිකයන්ට ඩිප්ලෝමා පිරිනැමිණ.
- තානාපති කාර්යාලය විසින්, පාර්ලිමේන්තු නියෝජිත පිරිස සඳහා, රුසියාවේ, මොස්කව්හි, 2019 ජූලි මස 01-02 දෙදින පැවැති " පාර්ලිමේන්තු සංවර්ධනය" -II වන ජාත්‍යන්තර සංසදයට සහභාගී වීමේ අවස්ථාව සලසා දෙන ලදී. ඒ අනුව, ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය, ගරු අර්ජුන රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිමල් ද සිල්වා ගෙන් හා පාර්ලිමේන්තු මහ ලේකම්, ධම්මික දසනායක මහතාගෙන් සමන්විත ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායම එයට සහභාගී වූහ. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු නාමල් රාජපක්ෂ මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කාංචන විජේසේකර මහතා සහ සබරගමු පළාත් සභා සභාපති කාංචන ජයරත්න මහතාද මෙම සංසදයට සහභාගී වූහ.
- දෙරට අතර ද්විපාර්ශ්වික සහයෝගිතාවය වැඩි දියුණු කිරීම පිණිස දූත මණ්ඩලය සහ රුසියානු සමූහාණ්ඩු අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් අතර පැවැති සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන්, රුසියානු සමූහාණ්ඩු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යවරයාට ආරාධනයක් යැවිණ. ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යවරයා වෙනුවෙන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ, අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැළසුම්) ආචාර්ය ඩී.එම්. ජයන්ත බාලසූරිය මහතා, 2019 අගෝස්තු 22-24 දක්වා රුසියාවේ, ටාටර්ස්ථාන් ජනරජයේ, කසාන් හි, 2019- ලෝක කුසලතා පිළිබඳ අමාත්‍යාංශයීය සමුළුවට සහභාගී විය. අවශ්‍ය සන්ධාන කාර්යයන්, ආනුෂංගික සේවා සහ අනෙකුත් වින්‍යාසයන් ඉටු කිරීම, රුසියානු බලධාරීන්, ශ්‍රී

ලංකා අධ්‍යපන අමාත්‍යාංශ නිලධාරීන් සහ "2019- ලෝක කුසලතා සම්මන්ත්‍රණයේ" සංවිධායකයින් හා සම්බන්ධීකරණයෙන්, දූත මණ්ඩලීය කාර්ය මණ්ඩලය විසින් සිදු කෙරිණ.

- ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයෙහි විනිසුරු, ජනාධිපති නීතිඥ, විනිසුරු ගරු ඒ.පී. අළුවිහාරේ මහතා, 2019 ජූලි මස 31 - අගෝස්තු මස 03 දක්වා, රුසියාවේ මොස්කව් නුවර පැවැති 'අනිවාර්ය මරණ දණ්ඩනය' බලාත්මක කිරීම : වර්තමාන රජය සහ සංවර්ධන වාහකයින්- ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සහභාගී වීම පිණිස රුසියාවට සම්ප්‍රාප්ත විය. අවශ්‍ය සන්ධාන කාර්යයන්, ආනුෂංගික සේවා සහ අනෙකුත් වින්‍යාසයන් ඉටු කිරීම, රුසියානු බලධාරීන්, ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය, ඉසව් සංවිධායකයින් සහ වෙනත් අදාල බලධාරීන් සමග සම්බන්ධීකරණයෙන් දූත මණ්ඩලීය නිලධාරීන් විසින් සිදු කෙරිණ.
- 2019 සැප්තැම්බර් මස 19-22 දක්වා රුසියාවේ, මොස්කව්හිදී පැවැති "ජාත්‍යන්තර සමුපකාර කවුන්සිල සංසදය" ට සහභාගී වීම පිණිස, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ජාතික සමුපකාර මණ්ඩලයේ නියෝජිත පිරිසක් සහ වයඹ පළාතේ සංස්කෘතික හා කලා කටයුතු, සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සම්මේලනයේ නියෝජිත පිරිසක් රුසියාවට පැමිණියහ. අවශ්‍ය සන්ධාන කාර්යයන්, ආනුෂංගික සේවා සහ අනෙකුත් වින්‍යාසයන් ඉටු කිරීම, රුසියානු බලධාරීන්, ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය, ඉසව් සංවිධායකයින් හා වෙනත් අදාල බලධාරීන් සමග සම්බන්ධීකරණයෙන් දූත මණ්ඩලීය කාර්ය මණ්ඩලය විසින් සිදු කෙරිණ.
- සැප්තැම්බර් මස 25 වන දින, රුසියානු සමූහාණ්ඩුවේ 25 වන ජනාධිපති ව්ලැඩිමීර් පුටින් මහතා, උත්තරීතර විගණන ආයතන ජාත්‍යන්තර සංවිධාන (XXIII) ඉතිහාසයේ ප්‍රථම වරට, මොස්කව්හිදී පවත්වන ලද, සංවිධාන කොන්ග්‍රසය අමතන ලදී. ලෝකය පුරා විගණන ආයතන 168 නියෝජනය කරමින් 600 කට අධික නියෝජිතයින් පිරිසක් උත්සවයට සහභාගී වූහ. ඔවුන් රැස්වන ලද්දේ, රාජ්‍ය පරිපාලන සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණයෙහි වැදගත්කම සහ ජාතික ප්‍රමුඛතා සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමෙහි ලා උත්තරීතර විගණන ආයතනයන්ගේ භූමිකාව සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගැනීම පිණිසය. සංවිධානයේ 23 වන සැසියේදී, ශ්‍රී ලංකාව උසස්ම මටටමේ පිරිසකගෙන් නියෝජනය වූ අතර, එකී නියෝජිතයින් වූයේ ශ්‍රී ලංකා විගණකාධිපති ඩබ්.පී.සී. වික්‍රමරත්න මහතා සහ නියෝජ්‍ය විගණකාධිපති පී.එල්.කේ. පෙරේරා මහතාය. ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ අවශ්‍ය සන්ධාන සහාය ලබා දෙන ලද්දේ තානාපති කාර්යාලීය නිලධාරීන් විසිනි.

**කොන්සල්වරුන්ගේ සේවය දීර්ඝ කිරීම**

කර්ස්ක් - රුසියාවේ, කර්ස්ක් හි, ශ්‍රී ලංකාවේ ගරු කොන්සල් ලෙස මොහොමඩ් චහින් මහතාගේ සේවය තවදුරටත් වසර දෙකක කාලයකට දීර්ඝ කිරීම පිණිස අවශ්‍ය කටයුතු 2019 අගෝස්තු මස 29 වන දින සිදු කෙරිණ.

ආර්මේනියා - ආර්මේනියාවේ ශ්‍රී ලංකා ගරු කොන්සල් ලෙස සර්ගිස් ටාර්වර්ඩයන් මහතාගේ සේවය තවදුරටත් වසර දෙකකට දීර්ඝ කරන ලෙස ඉල්ලීම යැවීමට අවශ්‍ය කටයුතු 2019 සැප්තැම්බර් මස 12 වන දින සිදු කෙරිණ.

**අධ්‍යාපන කටයුතු**

- අප දෙරට අතර ද්විපාර්ශ්වීය සබඳතා වැඩි දියුණු කිරීමට සහයෝගිතාවය තවදුරටත් ලබා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් තානාපති කාර්යාලය රුසියානු සමූහාණ්ඩු රජය අමතන ලදී.
- ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ශ්‍රී ලංකා ජනරජයේ විද්‍යා, තාක්ෂණවේද සහ පර්යේෂණ අමාත්‍යාංශය සහ රුසියානු සමූහාණ්ඩුවේ විද්‍යා සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය අතර, විද්‍යා, තාක්ෂණවේද සහ නවොත්පාදන පිළිබඳ අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සුනිශ්චිතව සාකච්ඡා කිරීම පිණිස දූත මණ්ඩලය රුසියානු සමූහාණ්ඩුවේ විද්‍යා සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් හමුවන ලදී.

- දූතමණ්ඩලය විසින් අදාල රුසියන් බලධාරීන් සමග සම්බන්ධීකරණයහි යෙදීමේ ප්‍රතිඵලයක් ලෙස, විදේශිකයින් ඇතුළත් කර ගැනීමේ සැලසුමෙහි මෙතෙක් ඉල්ලීමක් නොකර ශේෂිතව ඇති වෙන් කිරීම් ඇතුළත ශ්‍රී ලාංකික ශිෂ්‍යයින්ගේ පුහුණුව සඳහා ශිෂ්‍යත්ව වෙන් කර දීමේ කාරණය සළකා බැලීමට රුසියන් පාර්ශ්වයේ සූදානම ගැන රුසියන් සමූහාණ්ඩුවේ විදේශ කටයුතු අමාත්‍යාංශය දැනුම් දී ඇත.
- දෙරට අතර තෘතීයික/වෘත්තීය අධ්‍යාපන අංශවල සහයෝගිතාවය තවදුරටත් දීර්ඝ කිරීමේ ඉඩප්‍රස්ථා සාකච්ඡා කිරීම පිණිස තානාපති කාර්යාලයේ නිලධාරීහු රුසියන් සමූහාණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් හමුවූහ.
- තවද, දූත මණ්ඩලය විසින්, දෙරට අතර සහයෝගිතාවයට ඉවහල් කර ගත හැකි අදාල ක්ෂේත්‍රයන්හි අනාගත සංසද /ඉසව් වලට අදාල තොරතුරු ලබා දෙන ලෙස සංස්කෘතික අමාත්‍යාශය, සෞඛ්‍ය සත්කාරය, හදිසි අවස්ථා සහ ස්වාභාවික ආපදාවල විපාක ඉවත් කිරීමේ අමාත්‍යාංශය, ස්වාභාවික සම්පත් සහ පරිසර අමාත්‍යාංශය, ක්‍රීඩා අමාත්‍යාංශය ආදී අමාත්‍යාංශ වලින් ඉල්ලා ඇත. රුසියන් පාර්ශවය විසින් සපයා ඇති, ශ්‍රී ලංකාවටද සහභාගී විය හැකි යම් යම් ඉසව්වල යම් යම් තොරතුරු ශ්‍රී ලංකා බලධාරීන් වෙත සපයන ලදී.
- 2019 අප්‍රියෙල් මස 10-13 දක්වා, අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි විශාලතම ඉසව්ව වන මොස්කව් ජාත්‍යන්තර අධ්‍යාපන ප්‍රදර්ශනයට, ගෝලීය සංසදයට සහ රුසියාවේ නව අධ්‍යාපන තාක්ෂණ විද්‍යාව පිළිබඳ විශාලතම ප්‍රදර්ශනයට තානාපති කාර්යාල නිලධාරීහු සහභාගී වූහ.
- තානාපති කාර්යාලීය නිලධාරීන් සහ රුසියානු සමූහාණ්ඩුවේ දකුණු උරාල් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සහයෝගිතා දෙපාර්තමේන්තුවේ ප්‍රධානි අතර රැස්වීමක් පවත්වන ලද අතර, දකුණු උරාල් රාජ්‍ය විශ්වවිද්‍යාලය සමග අධ්‍යාපන සහයෝගිතාවය වර්ධනය කර ගැනීමේ හැකියාවන් සාකච්ඡාවට භාජනය කෙරිණ.
- මොස්කව් මෝටර් රථ සහ මාර්ග ඉදිකිරීමේ රාජ්‍ය තාක්ෂණ විශ්ව විද්‍යාලයෙහි විදේශීය ශිෂ්‍යයින්ගේ උපාධි පිරිනැමීමේ උත්සවයට තානාපති නිලධාරීහු සහභාගී වූහ.

**සංස්කෘතික සබඳතා**

- සමස්ත ලෝකය පුරා ශ්‍රී ලාංකිකයින් විසින් අප්‍රියෙල් මස 14 වන දින සමරනු ලබන සිංහල හා දමිළ නව වසර එළඹීම, රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් අප්‍රියෙල් මස 16 වන දින සමරන ලදී.
- 2019 මැයි මස 18 වන දින, රුසියානු සමූහාණ්ඩුවේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තානාපති කාර්යාලය, මොස්කව්හි ශ්‍රී ලාංකික ශිෂ්‍ය ප්‍රජාව සමග වෙසක් උත්සවය පවත්වන ලදී.
- ශ්‍රී ලාංකික සංස්කෘතිය ප්‍රදර්ශනය කිරීම පිණිස විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් විසින් සංවිධානය කරන ලද පහත දැක්වෙන උත්සව වලට තානාපති කාර්යාලය විසින් සහාය දක්වා, සහභාගී වන ලදී.
- 2019 අප්‍රියෙල් මස 03 වන දින, ශ්‍රී ලාංකික ශිෂ්‍යයෝ කර්ස්ක් රාජ්‍ය වෛද්‍ය විශ්ව විද්‍යාලයෙහිදී "ශ්‍රී ලංකා රාත්‍රිය-2019" සංවිධානය කළහ.
- 2019 අප්‍රියෙල් මස 16 වන දින, ජාතික පර්යේෂණ මොස්කව් රාජ්‍ය ඉදිකිරීම් විශ්ව විද්‍යාලය " ජාතිකත්ව දිනය" පැවත්වීමට සත්කාරකත්වය දැක්විය.
- 2019 අගෝස්තු මස 08 වන දින මිත්‍රත්ව මන්දිරයෙහිදී, ශ්‍රී ලංකා සංස්කෘතික දිනය සමරන ලදී.
- ක්‍රෙමිලින් මන්දිරයෙහිදී, ජනතා මිත්‍රත්ව විශ්ව විද්‍යාලයෙහි 59 වන ජන්ම දින සංවත්සරය පැවැත්විණ. ශ්‍රී ලාංකික ශිෂ්‍යයෝ රංගනයෙන්ද දායක වූහ.
- ශ්‍රී ලංකා නිදහස් දිනයේ 71 වන සංවත්සරය සැමරීම පිණිස, මොස්කව්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය සහ මඟපෙන්වීම ඇතිව, ජනතා මිත්‍රත්ව විශ්ව විද්‍යාලයේදී ශ්‍රී ලංකා සංස්කෘතික සතිය පැවැත්විණ.
- ශ්‍රී ලාංකික සංස්කෘතිය සහ ආහාර ප්‍රදර්ශනය කිරීම පිණිස මොස්කව්හි පවත්වන ලද 2019 ජාත්‍යන්තර හමුදා ක්‍රීඩා සංස්කෘතික ඉසව්ව පැවැත්වීම පිණිස අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරිණ.

- 2019 නොවැම්බර් මස 30 වන දින, මොස්කව්හි ජාත්‍යන්තර කාන්තා සමාජය විසින් සංවිධානය කරන ලද ශීත ඍතු සල්පිලෙහි ශ්‍රී ලාංකික ආහාර ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරිණ.

**රාජ්‍යාරක්ෂක සබඳතා**

- 2019 වසරේ, රුසියාව සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වීය හමුදා සහයෝගිතාවයට අදාල රාජ්‍යාරක්ෂක අංශයෙහි ප්‍රධානතම විශේෂිත අවස්ථා
- හමුදා සබඳතා ප්‍රවර්ධනයට අදාල නිල චාරිකා මත මෙන්ම විවිධ ඉසව් සහ සම්මන්ත්‍රණවලට සහභාගී වීමට ශ්‍රී ලංකාවෙන් සපැමිණි පිරිස සංඛ්‍යාව 10 කි.
- 2019 වසරේ ශ්‍රී ලංකා යුදහමුදා පිරිස් 35 දෙනෙක් රුසියානු සමූහාණ්ඩුවෙහි පුහුණුව ලැබූහ.
- ශ්‍රී ලංකා යුද හමුදාවේ නියෝජ්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානී ඇතුළු හමුදා පිරිස් 20 දෙනෙක් රුසියන් සමූහාණ්ඩු වල පවත්වන ලද ජාත්‍යන්තර යුද හමුදා ක්‍රීඩා ඉසව්වලට සහභාගී වූහ.
- ශ්‍රී ලංකා යුද හමුදාවේ නියෝජ්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානී ඇතුළු හමුදා පිරිස් 09 දෙනෙක් රුසියන් සමූහාණ්ඩු බෙලාරුස්වල පවත්වන ලද ජාත්‍යන්තර යුද හමුදා ක්‍රීඩා ඉසව්වලට සහභාගී වූහ.
- උපදේශක (ආරක්ෂක) මෙන්ම අනෙකුත් තානාපති කාර්යාලීය නිලධාරීන් සහ අනෙකුත් ශ්‍රී ලාංකික දූත පිරිස් අතර (රුසියාවට දූත පිරිස් පැමිණි සිටි අවස්ථාවල) පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව 32 කි.
- ශ්‍රී ලංකා යුද හමුදාවට ප්‍රයෝජනවත් විය හැකි යුද හමුදා උපකරණ පිළිබඳ වෙළඳ දැන්වීම් 20 ක් පමණ ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත් කෙරිණ.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

**ද්විපාර්ශ්වීය ආර්ථික සබඳතා**

- ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කර තිබූ සංචාර ප්‍රතිවිරෝධී ප්‍රකාශය ඉවත් කරන ලෙස ඉල්ලමින් රුසියාවේ සංචාරය පිළිබඳ සමූහාණ්ඩු නියෝජිතායතනය හා අන්තර්-ක්‍රියාවල නිරත විය.
- රුසියානු සමූහාණ්ඩුව වෙත ආනයනය කෙරෙන ශාක සහ ශාක නිරෝධායන නිෂ්පාදන සම්බන්ධයෙන් වූ "කපරා බීට්ල්" ගැටළුවෙන් පසු පනවන ලද ධූමායනය ක්‍රියාදාමය ඉවත් කිරීම සමබන්ධයෙන් පශු වෛද්‍ය වේදී සහ ශාක සෞඛ්‍ය ආවේක්ෂණය සඳහා වන සමූහාණ්ඩු සේවය සමග ප්‍රමන්ත්‍රණයෙහි යෙදිණ.
- 2017 වර්ෂයේදී අතිගරු ජනාධිපතිතුමා රුසියාවේ නිල සංචාරයකට පැමිණි සිටි අවස්ථාවේදී අත්සන් තබන ලද, ශ්‍රී ලංකාව සහ රුසියාව අතර සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගිතාවය මත අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා සමඟ අන්තර්-ක්‍රියා.

**වෙළඳ ප්‍රදර්ශණවල ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කිරීම**

- සීමාසහිත යුනිට්‍රේඩස් (ප්‍ර), සීමාසහිත ඒ.එෆ්.ජෝන්ස් එක්ස්පෝටර්ස් සිලෝන් (ප්‍ර), සීමාසහිත සිලෝන් ෆ්‍රෙස් ටී (ප්‍ර), සීමාසහිත යූ.එච්.ඊ. එක්ස්පෝර්ට්ස් (ප්‍ර) සහ සීමාසහිත සිලෝන් ටී ලෑන්ඩ් (ප්‍ර) යන තේ වෙළඳ සමාගම් 5, 2019 පෙබරවාරි මස 11 - 15 දක්වා පවත්වන ලද ප්‍රොඩ්එක්ස්පෝ-2019 යන ප්‍රදර්ශනයට සහභාගී වූහ.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තේ ප්‍රවර්ධන ඒකකය, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහාය ඇතිව, 2019 මාර්තු මස 11-15 දක්වා කෝපි සහ තේ රුසියානු එක්ස්පො -2019 ට සහභාගී විය.

- ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තේ ප්‍රවර්ධන ඒකකය, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහාය ඇතිව, 2019 අගෝස්තු මස 24-25 දින මොස්කව්හි, සොකොල්නිකි උද්‍යානයේ පැවැති කෝපි තේ චොක්ලට් උත්සවයේදී, ශ්‍රී ලංකා තේ මණ්ඩල ප්‍රදර්ශන කුටිය සංවිධානය කරන ලදී. මෙම ඉසව්වේදී, මොස්කව් තේ ප්‍රවර්ධන ඒකකයේ, තේ ප්‍රවර්ධන සහකාර, ඇනස්ටාසියා කොවලෙන්කෝ මිය. ප්‍රදර්ශනයේ සමුළු කාමරයේදී විසැරියන් සඳහා
"සිලෝන් ටී - පියෝ එන්චාන්ටිමන්ට් ඉන් අ කප් " නමින් නිපුණ කාර්යයක් එළි දැක්විණ.
- 2019 අගොස්තු මස 3 -17 දක්වා පැවති හමුදා ක්‍රීඩා වලට සමගාමීව සංවිධානය කරණ ලද ශ්‍රී ලංකා සංස්කෘතිය, නිෂ්පාදන හා සංචාරණය ප්‍රදර්ශනයේදී, ශ්‍රී ලංකා නිෂ්පාදන සහ සංස්කෘතික අයිතමයන් ප්‍රදර්ශනය කරණ ලද අතර, සංචාරණ සහ තේ තොරතුරු පත්‍රිකා බෙදා දී, තේ පැන් සංග්‍රහයක්ද පවත්වන ලදී.
- 2019 සැප්තැම්බර් මස 24-27 දක්වා මොස්කව් හිදී පවත්වන ලද ලෝක ආහාර මොස්කව් 2019 ප්‍රදර්ශයට ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග ශ්‍රී ලාංකික තේ සමාගම් 5 ක් සහභාගී වූහ.
- 2019 නොවැම්බර් මස 19-21 දින සෙන්ට්. පීටර්ස්බර්ග් හිදී පවත්වන ලද පීටර් ෆුඩ්-2019 ප්‍රදර්ශනයට, ප්‍රථම වරට, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ ශ්‍රී ලාංකික තේ සමාගම් 2 ක් සහභාගී වූහ.
- 2019 නොවැම්බර් මස 30 දින, මොස්කව් හි, ජාත්‍යන්තර කාන්තා සමාජය විසින් සංවිධානය කරන ලද, ශීත සෘතු සල්පිලට - පුණ්‍යාධාර ඉසව්වක් - ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහභාගී විය. ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, සම්ප්‍රදායික සහිවටන, ආයුර්වේද සුවඳ විලවුන් සහ සිලෝන් ටී සඳහා එක් ප්‍රදර්ශන කුටියක්ද, සම්ප්‍රදායික ශ්‍රී ලංකා ආහාර ද්‍රව්‍ය වෙනුවෙන් තවත් කුටියක්ද සංවිධානය කළහ.

**වෙනත් ඉසව්වල ශ්‍රී ලංකාවේ සහභාගිත්වය**

- 2019 සැප්තැම්බර් මස 25 වන දින මොස්කව් හි පැවැති ශ්‍රී ලංකා තේ ගෝලීය වශයෙන් ප්‍රචාරණය දියත් කිරීම සඳහා, රුසියානු සමුහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපතිතුමා, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ උපදේශක (ප්‍රවර්ධන), ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) සහ කොළඹ තේ වෙළඳුන්ගේ සංගමයේ සභාපතිගේ සහභාගිත්වය ඇතිව පුවත්පත් සාකච්ඡාවක් පැවැත්විණ. මාධ්‍ය සමාගම් 45 ක් සාකච්ඡාවට සහභාගී වූහ.
- 2019 සැප්තැම්බර් 25 වන දින ශ්‍රී ලංකා තේ ගෝලීය වශයෙන් ප්‍රචාරණය දියත් කිරීමේ ප්‍රීතිය භුක්ති විඳීම පිණිස සැඳෑ සාදයක් පවත්වන්නට යෙදුණු අතර, ශ්‍රී ලංකාවේ සහ රුසියාවේ ඉහළ මට්ටමේ නිලධාරීන් සහ දෙරට තේ වෙළඳුන් සහභාගී වූහ.
- 2019 සැප්තැම්බර් මස 26-27, රුසියාවේ උෆා හිදී, BRICS රටවල් සහ ෂැංහයි සහයෝගිතා සංවිධානයේ රටවල් වල 5 වන කුඩා ව්‍යාපාර සංසදයට, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ, අතිරේක ලේකම් (කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ රෙදිපිළි සංවර්ධන) එම්.ඒ. තාජුදීන් මහතා සහභාගී වූ අතර, ඔහුගේ සහභාගිත්වය සඳහා, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පහසුකම් සැලසීය.
- ඔක්තෝබර් මස 11වන දින, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු පී.හැරිසන් මහතා, තම ප්‍රතිපූරකයා වන රුසියානු සමූහාණ්ඩුවේ, කෘෂිකර්ම අමාත්‍යවරයා සහ රුසියානු සමූහාණ්ඩුවේ කර්මාන්ත සහ වෙළඳ

නියොජ්‍ය අමාත්‍යවරයාද හමුවිය. තවද, ගරු අමාත්‍යවරයා ඔක්තෝබර් මස 9 - 12 දක්වා සමස්ත ලංකා ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ පැවැති "2019- ස්වර්ණ ගිම්හානය"- 21 වන රුසියානු කෘෂිකර්මාන්ත ප්‍රදර්ශනය ඔක්තෝබර් මස 12 වන දින නරඹා, රුසියානු පොහොර සහ කෘෂි නාශක සමාගම් නියෝජිතයන් ද හමුවිය.

- උසස් ගණයේ වෙළඳ පොළවල ඇති සිලෝන් ටී සන්නාමයන් ප්‍රචලිත කිරීමට මෙන්ම සිංහ සංකේතය ගැන පොදු මහ ජනතාව අතර දැනුවත්වීමක් නිර්මාණය කිරීම පිණිස, මොස්කව් සහ පීටර්ස්බර්ග් ලෙන්ටා සුපිරි වෙළඳපොළවල තේ රස බැලීමේ සැසි පවත්වන ලදී.
- විදේශ සබඳතා අමාත්‍යාංශයේ ආර්ථික රාජ්‍යෝපාය වැඩ සටහන යටතේ, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය අපනයන සංවර්ධන මණ්ඩලය, රුසියානු සමූහාණ්ඩුවේ රේගු සේවය සහ සනීපාරක්ෂක හා ශාක සෞඛ්‍ය ආවේක්ෂණ සේවය සමග එක්ව, 2019 දෙසැම්බර් මස 10 වන දින වෙබ් අඩවි පදනම කොටගත් සම්මන්ත්‍රණයක් (Webinar) සංවිධානය කරණ ලදී. මෙහි ප්‍රමුඛතම අරමුණ වන්නේ, ශාක සහ ශාක පදනම් කොටගත් නිෂ්පාදන සහ මත්ස්‍ය නිෂ්පාදන රුසියානු සමූහාණ්ඩුවට ආනයනය කිරීමට අදාල රේගු ක්‍රියා පරිපාටිය, නීති හා රෙගුලාසි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අපනයනකරුවන් දැනුවත් කිරීමය.

**සංචාරක ප්‍රවර්ධනය සහ උත්සව**

- රුසියාවේ ජනතා මිත්‍රත්ව විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින් විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා සංස්කෘතික සතියට සමගාමීව, රන්ජන සේනසිංහ මහතා විසින් එකී විශ්ව විද්‍යාලයේ හොටල් ව්‍යාපාර සහ සංචාරක ආයතනයේ පශ්චාත් උපාධි හදාරන ශිෂ්‍යයින් උදෙසා "ශ්‍රී ලංකාවේ සංචාරක විභවය: සංවර්ධනය සඳහා ඇති විභවය" යන මැයෙන් සමර්පනයක් රුසියන් භාෂාවෙන් ඉදිරිපත් කරන ලදී. මෙම සමර්පනය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා සම්බන්ධීකරණයෙන්, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ලබා ගන්නා ලද තොරතුරු මත පදනම් වූවකි.
- 2019 මාර්තු මස 12-14 දක්වා පවත්වන ලද මැනිටෝබා වෙළඳ සහ තාක්ෂණ ආයතනය (MITT) විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනයේදී, ශ්‍රී ලංකා සංචාරණ ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ (අලෙවි) මධුභානි පෙරේරා මහත්මිය සහ සහකාර අධ්‍යක්ෂ (අලෙවි) සසිකා ජයවීර මහත්මිය සමග සමාගම් 13 ක නියොජිතයින් විසින් ශ්‍රී ලංකා සංචාරක සහ චාරිකා අංශය නියෝජනය කෙරිණ.
- 2019 මාර්තු මස 15 සහ 18, රුසියානු වෙළඳපොළෙහි ප්‍රමුඛතම සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම පිණිස රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය ඇතිව, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මොස්කව්හි සහ සෙන්ට්. පීටර්ස්බර්ග්හි පිහිටීම පදනම් කොටගත් සංචාරක ප්‍රවර්ධන ප්‍රදර්ශනයක් (roadshow) සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ නිලධාරීන් විසින් ප්‍රවර්ධන සමර්පණයක් ඉදිරිපත් කරන ලද අතර, මෙම ඉසව්වට පරිබාහිරව " ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට" රැස්වීම් කිහිපයක්ද පවත්වන ලදී.
- 2019 මාර්තු මස 18 වන දින පීටර්ස්බර්ගි පවත්වන ලද පිහිටීම පදනම් කොටගත් සංචාරක ප්‍රවර්ධන ප්‍රදර්ශනයද, ශ්‍රී ලාංකික සමාගම් 15 ක සහ රුසියානු චාරිකා මෙහෙයුම්කරුවන් සහ නියෝජිතායතනයන් 30 ක පමණ සහභාගිත්වයෙන් සමානම ව්‍යුහයක් මත සංවිධානය කරන ලදී.
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ නායකත්වය යටතේ තානාපති කාර්යාලය විසින් සංවිධානය කර සහාය ලබා දෙන ලද, OTDHK විශ්‍රාන්ති ප්‍රදර්ශනය 2019 සැප්තැම්බර් මස 10-12 දක්වා පැවැත්විණ.

- 2019 සැප්තැම්බර් මස 11-14 දක්වා ආයෝජන ප්‍රවර්ධනය සඳහා සෙන්ට්. පීටර්ස්බර්ග් වෙත පැමිණෙන අමාත්‍යාංශයීය නියෝජිත පිරිස සඳහා ආනුෂාංගික සේවා කටයුතු, එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයේ 23 වන මහා සභා රැස්වීමේදී සම්පාදනය කෙරිණ.
- කොන්ප්‍රෝ එල්එල්සී හි ප්‍රධාන විධායක නිලධාරිනී, වැලෙන්ටිනා මකීවා මහත්මියගේ ආරාධනයෙන්, "ශ්‍රී ලංකාවේ ආයෝජන ආකර්ෂණය" සමුළුවෙහි සංවිධායක විසින්, දිවයින සහ එහි විවිධ ක්ෂේත්‍රයන්හි ආයෝජන ඉඩ ප්‍රස්ථා සම්බන්ධයෙන් සැළකිය යුතු සමර්පණයක් 2019 මාර්තු මස 20 දින ඉදිරිපත් කරණ ලදී. ශ්‍රී ලංකාවෙහි ආයෝජනය කිරීමට උනන්දුවක් දක්වන රුසියානු ආයෝජකයින් 06 දෙනෙක් මෙම සාකච්ඡාවට සහභාගී වූහ.

**ස්වීඩනය**

ඩෙන්මාර්කයට, එස්තෝනියාවට, ලිතුවේනියාවට සහ ලැට්වියාවට සමගාමීව අක්ත ගන්වා ඇති ස්වීඩනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ක්‍රියාකාරකම්

**ද්විපාර්ශ්වීය සබඳතා**

- ස්වකීය අක්තපත්‍ර ප්‍රදානය කිරීම පිණිස අතිගරු තානාපතිතුමා සංචාරය කළ පහත දැක්වෙන අක්ත ගන්වන ලද රටවලදී ඉහළ පෙළ ප්‍රභූන් සමග අදාල රාජ්‍ය නායකයින්ද සමුවිය. සාකච්ඡාවලදී, ද්විපාර්ශ්වීය වැදගත්කමකින් යුත් කරුණු කාරණා සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගත් අතර, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති පිළිබඳ අළුත්ම තත්ත්වයන් පිළිබඳව යාවත්කාලීන කෙරිණ. දූත මණ්ඩලයට අක්ත ගන්වා ඇති සියළුම රටවල් සමග දේශපාලන උපදේශනය මත අවබෝධතා ගිවිසුම්වලට එළඹීම තානාපතිතුමන් විසින් මෙම සාකච්ඡාවලදී යෝජනා කර සිටින ලදී.

i. එස්තෝනියා ජනරජය - 2019 මැයි - එස්තෝනියා ජනරජයේ ජනාධිපති, අතිගරු කර්ස්ටි කල්ජුලේඩ්, විදේශ ප්‍රතිපත්ති පිළිබඳ ජනාධිපති උපදේශක, ලෝරි කුසිං, විදේශ කටයුතු අමාත්‍යාංශයේ මහ ලේකම්, රේනර් සැක්ස්, දේශපාලන කටයුතු යටත් ලේකම්, පෝල් ටීසළු සහ ආසියානු අංශයේ අධ්‍යක්ෂ, ඉන්ග්‍රිඩ් අමේර් යන මහත්ම මහත්මීන්.

ii. ලිතුවේනියා ජනරජය - 2019 මැයි - අතිගරු ජනාධිපතිනී, ඩේලියා ග්‍රිබෝස්කයිට්, විදේශ කටයුතු උප අමාත්‍ය, නේරිස් ජර්මනාස්, ආසියා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා, ඩයනා මික්විසියන් යන මහත්ම මහත්මීන්.

iii. ලැට්වියා ජනරජය -2019 සැප්තැම්බර් -ජනාධිපති, අතිගරු ඉගිලිස් ලෙවිට්ස්, නියෝජ්‍ය කථානායක, ඩැග්මාරා බේට්නියර් ලේ ගල්ලා සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්, ඇන්ඩ්‍රිස් පෙල්ස් යන මහත්ම මහත්මීන්.

iv. ඩෙන්මාර්ක් ජනරජය -2019 ඔක්තෝබර් -මාග්‍රෙත් II රාජෝත්තමිය, විදේශ ප්‍රතිපත්ති රාජ්‍ය ලේකම්, පෙස්පර් මොලර් සහ ආසියා අශයේ ප්‍රධානි, තෝමස් ලේමන් යන මහත්වරු

2. අතිගරු තානාපතිතුමා, සුහද සම්බන්ධතාවයන් පවත්වා ගෙන යාම සහ ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීම පිණිස පහත දැක්වෙන ඉහළ පෙළ ප්‍රභූන් වෙත නියෝජනයන් ඉදිරිපත් කර සිටියේය.

i. ස්වීඩන රාජධානියේ විදේශ කටයුතු අමාත්‍ය, මාගෝ වෝල්ස්ට්‍රොම් මිය.
ii. රාජ සභාවේ උත්සව භාර විධායක සහ තානාපති, ජෝන් මොලනඩර් මහතා
iii. ඔස්ටෙගොට්ලන්ඩ් පළාත් ආණ්ඩුකාර, අතිගරු කාල් පෙෆ්‍රඩරික් ග්‍රාෆ් මහතා
iv. නෝර්බොටින් පළාත් ආණ්ඩුකාර, අතිගරු ජෝන් ඕ නිල්සන් මහා
v. නෝර්බොටින් නගරාධිපති, ගරු නෝර්ඩිස්ට්‍රොම් මහතා
vi. ලිංකොපින් නගරාධිපති, ගරු ලාස් විකිංගේ මහතා

vii. ස්වීඩන විදේශ කටයුතු අමාත්‍යාංශයේ, ප්‍රතිත්‍රස්ත ඒකකයේ සම්බන්ධීකාරක, තානාපති ෆ්‍රෙඩ්රිකා ඕර්න්බ්‍රෑන්ඩ් මිය.

viii. පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ආසා කූරේන්ඩිස් - ශ්‍රී ලංකා - ස්වීඩන පාර්ලිමේනතු මිත්‍රත්ව කණ්ඩායම ස්ථාපිත කිරීම ගැන සාකච්ඡා කරන ලදී.

ix. අතිගරු තානාපතිතුමා සහ රාජතාන්ත්‍රික නිලධාරීන් ස්වීඩනයෙහි දී සහ ප්‍රතීතන රටවලදී

x. රාජතාන්ත්‍රිකයින් සහ අනෙකුත් සංවිධාන වෙත දළ වශයෙන් නියෝජන 15 ක් පමණ ඉදිරිපත් කර ඇතස්ටොක්හොල්මිහි රාජතාන්ත්‍රික ප්‍රජාව අතර ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම පිණිස අතිගරු තානාපතිතුමා, ස්ටොක්හොල්මිහි ස්ථානගත පහත දැක්වෙන තානාපතිවරුන් සහ රාජතාන්ත්‍රික නියෝජිතයින් හමුවිය.

xi. ඊජිප්තුව, ඔස්ට්‍රේලියාව, ලැට්වියා, දකුණු කොරියාව, වියට්නාමය, තායිලන්තය, ඉන්දුනීසියාව, ඇල්ජීරියාව, චෙක් ජනරජය, ඉන්දියාව, ස්විට්සර්ලන්තය, ඉතාලිය, ඊශ්‍රායලය, යුක්රේනය, සයිප්‍රස්, ක්‍රොඒෂියා, චීනය, මැලේසියාව, එස්තෝනියාව, ග්‍රීසිය, ලිතුවේනියාව සහ රුසියාව

3. මැල්මෝහි ලෝක සමුද්‍රීය විශ්ව විද්‍යාලයෙහි පැවැත්වෙන පුහුණු වැඩ සටහනක් සඳහා නාවික හමුදා නිලධාරීන් දෙදෙනෙකුගේ සහභාගිත්වය සඳහා තානාපති කාර්යාලය විසින් පහසුකම් සපයන ලදී.

4. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා, ශ්‍රී ලාංකික විශ්ව විද්‍යාල ශාස්ත්‍රඥයින් සඳහා උප්සලා හි ස්වීඩිස් කෘෂිකර්ම විශ්ව විද්‍යාලයෙහි උසස් අධ්‍යාපන අවස්ථා සලසා ගැනීම සඳහා තානාපති කාර්යාලය විසින් පහසුකම් සපයන ලදී.

5. ඊ. පාලන ව්‍යාපෘති කළමනාකරණයෙහි නියැලෙන ජ්‍යෙෂ්ඨ රාජ්‍ය අංශ නිලධාරීන් සඳහා ඒකාබද්ධ ශාස්ත්‍රීය හා වෘත්තිමය වැඩ සටහන් සලසා ගැනීම පිණිස ස්ටොක්හොල්ම් විශ්ව විද්‍යාලය සමග සාකච්ඡා ආරම්භ කර ඇත.

6. ශ්‍රී ලාකික සම්භවයකින් යුත් ශාස්ත්‍රීය හා වෘත්තීමය ප්‍රජා සාමාජිකයින් වැඩි පිරිසක් සමග ස්වීඩනයෙහි ශ්‍රී ලාංකික ශාස්ත්‍රීය සහ වෘත්තීමය සංසදයක් ස්ථාපත කිරීමට තානාපති කාර්යාලය විසින් කටයුතු කරන ලදී.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

**ඉසව් (වෙළඳ සහ ආයෝජන)**

- තානාපති කාර්යාලය විසින්, ස්වීඩනයේ, ලියුලියාහි, නෝර්බොටින් වාණිජ මණ්ඩලය හා සමග එක්ව වෙළඳ සහ ආයෝජන ප්‍රවර්ධන වැඩ සටහනක් මාර්තු මස 02 වන දින සංවිධානය කරන ලදී. තොරතුරු තාක්ෂණ, ඇඟළුම් සහ ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රවල ස්වීඩන සමාගම් මෙයට සහභාගී වූහ.
- තානාපති කාර්යාලය විසින්, එස්කිල්ස්ටුනාහි, මුක්ටෙල් විද්‍යා උද්‍යානයෙහි සමාගම් නියොජිතයින්ගේ සහභාගිත්වයෙන්, අප්‍රියෙල් මස 03 වන දින පාතරාස ව්‍යාපාරික සමුළුවක් සංවිධානය කරන ලදී. ඉන් අනතුරුව එස්කිල්ස්ටුනාහි, ස්වීඩන ව්‍යාපාරික නියෝජිතයින්ගේ රැස්වීමක්ද පැවැත්විණ.
- තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ අංශය ප්‍රවර්ධනය කරනු පිණිස මැයි මස 28 වනදින ස්වීඩන් - ශ්‍රී ලංකා ව්‍යාපාර මණ්ඩලය සමග එක්ව පාතරාස ව්‍යාපාර සමුළුවක් සංවිධානය කරන ලදී. දළ වශයෙ ස්වීඩන ව්‍යවසායකයින් 15 ක් පමණ සහභාගීවූහ.
- ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ව්‍යාපාරිකයින් මුණගස්වාලීමේ වැඩ සටහනක් මැයි මස 21 වන දින පැවැත්විණ. එකී වැඩසටහන් 84 කට ශ්‍රී ලාංකික තොරතුරු තාක්ෂණ සමාගම් 07 ක් සහභාගී වූහ. අතිගරු තානාපතිතුමා සභාව අමතන ලදී.
- ශ්‍රී ලංකාවේ ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලයේ ප්‍රධනත්වයෙන් ශ්‍රී ලාංකික අපනයනකරුවන් 5 කින් යුත් නියෝජිත පිරිසක් ජූනි මස 11 වන දින ස්වීඩනයේ සංචාරයක නිරත වූහ. තානාපති කාර්යාලය අදාල ස්වීඩන සමාගම්වලට ආරාධනය කරමින් ව්‍යාපාරිකයින් මුණගස්වාලීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

- ශ්‍රී ලාංකික අපනයන සමාගම් 04ක සැකසූ ආහාර නිෂ්පාදන හඳුන්වාදීම පිණිස තානාපති කාර්යාලය විසින් සැප්තැම්බර් මස 19 වන දින ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට වෙළඳ ඉසව්වක් සංවිධානය කරන ලදී. උනන්දුවක් දකවන ස්වීඩන සමාගම් සහභාගී වූහ
- තානාපති කාර්යාලය ශ්‍රී ලංකා මෘදුකාංග සහ සේවා සමාගම් සංගමය හා එක්ව, ඔකතෝබර් මස 1 හා 2 දිනවල, ස්වීඩනයට පැමිණෙන ශ්‍රී ලාංකික තොරතුරු තාක්ෂණ වෙළඳ සමාගම් වෙනුවෙන් ව්‍යාපාර පද්ධතිකරණ ඉසව් ස්ටොක්හොල්ම් සහ ලිනකෝපින් හි සංවිධානය කරන ලදී.

### i. කොළඹ ක්‍රියාදාමය

- කොළඹ ක්‍රියාදාමයෙහි, නේපාල සභාපතිත්වය යටතේ 2019 පෙබරවාරි මස 1 වන දින 13 වන තානාපති මට්ටමේ රැස්වීමට සහ 2019 සැප්තැම්බර් 30 වන දින 14 වන තානාපති මට්ටමේ රැස්වීමට දූත මණ්ඩලය සක්‍රීව සහභාගී විය.
- සංක්‍රමණය පිළිබඳ ගෝලීය ගිවිසුම කොළඹ ක්‍රියාමය තුළට ගෙන එම වැදගත් බවත්, එවිට සුපෝෂිතවූද, ගෝලීය අනුමතව ඇත්තාවූද ශ්‍රමික සංක්‍රමණ පර්යාලෝකයන්ගෙන් පෝෂණය වන කොළඹ ක්‍රියාදාමය තවදුරටත් ශක්තිමත් වන බවත් විශේෂයෙන් අවධාරණය කරමින්, සංක්‍රමණය සඳහා වූ ගෝලීය ගිවිසුම තුළ, කොළඹ ක්‍රියාදාමයේ අඛණ්ඩ නිමග්නතාවයට එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජනය විසින් සහාය පළ කර සිටින ලදී. ඒ හා සමානවම, කොළඹ ක්‍රියාදාමය ජාත්‍යන්තර සංක්‍රමණ සමාලෝචන සංසදයට දායක විය යුතුවාක් මෙන්ම එහි ප්‍රතිලාභවලටද හිමිකම ලැබිය යුත්තේය. කොළඹ ක්‍රියාදාමය ගෝලීය කාර්ය රාමුවෙහි නිමග්න වීම සංක්‍රමණයට සහ ඊලඟ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමට අදාල විය.
- සංක්‍රමණයෙහි නව අභියෝග සහ ඉඩ ප්‍රස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම පිණිස " තාරුණ්‍යයෙහි සම්භාව්‍යතාවය මුදා හැරීම යන තේමාව" මත 2019 ඔක්තෝබර් 16-17 සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවාද සැසියට දූත මණ්ඩලය සහභාගී විය.

### ii. සංක්‍රමණ ක්ෂේත්‍රයෙහි ද්විපාර්ශ්වීය උපදේශන

- දූත මණ්ඩලය ස්විස් සංවර්ධන සහයෝගිතාවය හා සම්බන්ධතාවය පවත්වමින් සිටි අතර, බර්න් හි ස්විස් සංවර්ධන සහයෝගිතා නියෝජිතයින් හමුවී ද්විපාර්ශ්වීය උපදේශනයන්හි යෙදී ඇත.

## බුද්ධිමය දේපළ

- ලෝක ජාත්‍යන්තර දේපළ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ෆ්‍රැන්සිස් ගරී මහතාගේ නොවැම්බර් 23 ශ්‍රී ලංකා සංචාරයට පෙර, දූත මණ්ඩලය විසින් ලෝක ජාත්‍යන්තර දේපළ සංවිධානය හා සමග ප්‍රමන්ත්‍රණයෙහි යෙදුණුවූ ශ්‍රී ලංකා රජයේ-දේපළ සංවිධානයේ කරුණු 10 යේ ක්‍රියාකාරී සැලැස්ම ඔස්සේ සැළකිය යුතු ප්‍රතිලාභ උපචිත වෙමින් තිබුණි. රැස්වීම් සංවිධානය කර, කරුණු 10 යේ ක්‍රියාකාරී සැලැස්ම සක්‍රීයව ක්‍රියාත්මක කිරීම් වස් කොටස්කරුවන් අතර සහයෝගිතාවය තහවුරු කර ගැනීම සඳහා දූත මණ්ඩලය 2019 වසර පුරා කොටස්කරුවන් හා සමග සක්‍රීයව කටයුතු කරමින් සිටියේය.
- 2019 මාර්තු මස බුද්ධිමය දෙපළ සහ ජානමය සම්පත්, සම්ප්‍රදායික දැනුම සහ ජනශ්‍රැති පිළිබඳ අන්තර්-රාජ්‍ය කමිටුවේ 39 වන සැසිය සහ වෙළඳ සන්නාම නීතිය, කාර්මික නිෂ්පාදන කලා සහ භූගෝලාත්මක දර්ශක පිළිබඳ ස්ථාවර කමිටුවේ 41 වන සැසිය ඇතුළු ජාත්‍යන්තර දේපළ සංවිධාන රැස්වීම්වල ශ්‍රී ලාංකික විශේෂඥයින් සහභාගිත්වය සඳහා අරමුදල් සපයා ගැනීමෙහි ලා දූත මණ්ඩලය හේතුභූත විය.
- මෙයට අමතරව, ජාත්‍යන්තර දේපළ සංවිධානයේ මහ ලේකම් කාර්යාලයේ ආසියා හා ශාන්තිකර කලාපීය කාර්යාංශය සහ ජාත්‍යන්තර දේපළ සංවිධානයේ සාමාජික රටවල ආසියා සහ ශාන්තිකර කලාපීය කණ්ඩායම් සමග ප්‍රතික්‍රීය නිමග්නයන් හරහා, 2019 සැප්තැම්බර් මස බලාත්මක කිරීමේ උපදෙශක කමිටුවේ 14 වන සැසියේ සහ 2019 නොවැම්බර් මස

ජිනීවාහිදී, දෙවන ජාත්‍යන්තර දේපළ සංවිධාන බුද්ධිමය දේපළ විනිසුරුවන්ගේ සංසදයේ ශ්‍රී ලාංකික සහභාගිත්වය සඳහා අරමුදල් දූත මණ්ඩල විසින් සපයා ගන්නා ලදී.

- 2019 සැප්තැම්බර් 30 සිට පැවැති ජාත්‍යන්තර දේපළ සංවිධානයේ මහා පර්ෂදයන්හි 59 වන සැසියේ ශ්‍රී ලංකා නියෝජනයේ ප්‍රධානත්වය දැරූ තානාපති ඒ. එල්. ඒ. අසීස් මහතා, එදිනම ශ්‍රී ලංකා රජය වෙනුවෙන් පොදු ප්‍රකාශනය ප්‍රකාශයට පත් කරණ ලදී.
- 2019 නොවැම්බර් මස 18-22, සංවර්ධන සහ බුද්ධිමය දේපළ කමිටුවේ 24 වන සැසියේදී, ජාත්‍යන්තර දේපළ සංවිධානයේ මහ ලේකම් කාර්යාලය විසින් බුද්ධිමය දේපළ, සංචාරක හා සංස්කෘතික ව්‍යාපෘතියෙහි ඇඟයීම් වාර්තාව ඉදිරිපත් කෙරිණ. ශ්‍රී ලංකාවේ ආචාර්ය සම්පත් පුංචිහේවා මහතා, ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ, සංචාරක හා සංස්කෘතියට අදාල අධ්‍යයනයේ සාරාංශ වාර්තාව ඉදිරිපත් කරන ලදී. සමර්පණයෙන් පසු දූත මණ්ඩලය විසින් අවශ්‍ය විනිශ්චයන් සහ යෝග්‍ය මැදිහත්වීම් සිදු කරනු ලැබිය.
- බුද්ධිමය දේපළ සහ සංචාරණ ව්‍යාපෘතිය දීර්ඝ කිරීමට දේපළ සංවිධානයේ ඉදිරිපත් වීමට ප්‍රතිචාරයක් ලෙස සාධනීය සහතික කිරීමේ ලකුණු ක්‍රමයක් හරහා සුවතාව සංචාරක අංශය සන්නාම ගත කිරීමේ යෝජනාවට ජාත්‍යන්තර සංවිධානයෙන් මූල්‍යමය හා තාක්ෂණික සහාය ලබාදීම මගින් බුද්ධිමය දේපළ සහ සංචාරක ව්‍යාපෘතිය දීර්ඝ කරන ලෙස, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ඉල්ලීමක් අනුව දූත මණ්ඩලය විසින් 2019 මාර්තු මස 18 වන දින ජාත්‍යන්තර බුද්ධිමය දේපළ සංවිධානයෙන් ඉල්ලා සිටින ලදී.
- අදාල නිලධාරීන් හමුවී, මැඩ්‍රිඩ් ගිවිසුමට එකඟවීමේ ශ්‍රී ලංකා ප්‍රත්‍යුත් ක්‍රමය ගැන පසුවිපරමින් කිරීමට දූත මණ්ඩලය විසින් අඛණ්ඩව ක්‍රියා කරන ලදී.

**විද්‍යාව සහ තාක්ෂණවේදය**

ජිනීවාහි, 2019 මැයි මස 13-17 දක්වා පවත්වන ලද, සංවර්ධනය සඳහා විද්‍යාව සහ තාක්ෂණවේදය කොමිෂන් සභාවේ 22 වන සැසියේ විද්‍යා, තාක්ෂණවේද සහ පර්යේෂණ අමාත්‍ය, ගරු සුජීව සේනසිංහ මැතිතුමාගේ සහභාගිත්වය දූත මණ්ඩලය විසින් සම්බන්ධීකරණය කර පහසුකම් සලසන ලදී. සැසිය තුළදී, ගරු අමාත්‍යතුමා "තිරසාර සංවර්ධනය කෙරෙහි සීඝ්‍ර තාක්ෂණ විද්‍යාත්මක විපර්යාසයන්ගේ බලපෑම" පිළිබඳ ඉහළ පෙළ වටමේස සාකච්ඡාව අමතන ලදී. සංචාරය අතරතුර, ගරු අමාත්‍යතුමා වෙළඳාම් සහ සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂන් සභාවේ, තාක්ෂණවේදය සහ සම්පාදන හා කාර්ය සංවිධාන අංශයේ, අධ්‍යක්ෂිකා සිරිමාන්න මහත්මිය හමුවිය.

2015 ජූනි මස 25 වන දින මනාපය පළ කිරීමේ ගිවිසුම සහ 2017 පෙබරවාරි මස 08 වන දින ජාත්‍යන්තර සහයෝගතා ගිවිසුම අත්සන් තැබීමෙන් පසු, ද්විපාර්ශ්වීය සබඳතා තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා න්‍යෂ්ඨික පර්යේෂණය සඳහා වූ යුරෝපා සංවිධානය සමග සමීපස්ථව කටයුතු කිරීමට අඛණ්ඩව ක්‍රියා කරණ ලදී.

- දූත මණ්ඩලය, විද්‍යා, තාක්ෂණවේද සහ පර්යේෂණ අමාත්‍යතුමාගේ පැමිණීම ප්‍රයෝජනයට ගනිමින්, න්‍යෂ්ඨික පර්යේෂණ සඳහා වූ යුරෝපීය සංවිධානයේ සහ එහි පර්යේෂණාත්මක අංශයේ චාරිකාවක් සංවිධානය කරණ ලදී. එම චාරිකාවේදී, ගරු අමාත්‍යතුමා, න්‍යෂ්ඨික පර්යේෂණ සඳහා වූ යුරෝපීය සංවිධානයේ ජාත්‍යන්තර සබඳතා අධ්‍යක්ෂිකා, චාලට් වරකාඋල්ල මහත්මිය සමග ද්විපාර්ශ්වීය සාකච්ඡාවක් පවත්වන ලද අතර, සංවිධානය සමග තවදුරටත් සහයෝගීතාවය සාකච්ඡා කිරීමට එයින් අවස්ථාව සැලසිණ. ඉදිරි වර්ෂවලදී, අනෙකුත් තාක්ෂණ විශ්ව විද්‍යාල ඉංජිනේරු සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයන්හි අතුළත් කිරීම මගින් දැනට පවත්නා ශ්‍රී ලංකා - න්‍යෂ්ඨික පර්යේෂණ පිළිබඳ යුරෝපීය සංවිධානය අතර සහයෝගිතාවය තවදුරටත් වැඩි කර ගත හැකි බවට එකඟත්වය පළවිය.
- 2019 පෙබරවාරි මස 20-21 දෙදින, දකුණු ආසියානු භෞතික විද්‍යා උපයෝගී වැඩමුළුවට පැවැත්වීමට ශ්‍රී ලංකාව සත්කාරය දක්වන ලද අතර, දූත මණ්ඩලය, සමීපස්ථ සම්බන්ධීකරණයෙන් මෙම වැඩමුළුව සංවිධානය කිරීමෙහි ලා සංවිධාන කමිටුවට (විද්‍යා, තාක්ෂණවේද සහ පර්යේෂණ අමාත්‍යාංශය, කොළඹ විශ්ව විද්‍යාලය සහ රුහුණ විශ්ව විද්‍යාලය) සහ න්‍යෂ්ඨික පර්යේෂණ සඳහා වූ යුරෝපීය සංවිධානයට සහාය වන ලදී.
- වර්ෂ ගණනාවක් තිස්සේ වර්ධනය වූ සමීස්ථ නිමග්නයන්හි ප්‍රතිඵලය ලෙස, අනුක්‍රමික 4 වන වසර සඳහාද, භෞතික විද්‍යා අංශයෙහි විශේෂීකරණයෙහි නියුතු උපාධි අපේක්ෂකයින් 4

දෙනෙකු (යාපනය, කොළඹ, රුහුණු හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල වල) 2019 වසරේදී, " සුප්‍රසිද්ධ ගිමිහාන ශිෂ්‍ය වැඩසටහන" ට සහභාගිවීමේ අවස්ථාව ශ්‍රී ලංකාවට උදා විය.

- තාක්ෂණවේද අනාවරණය සහ භාවිතය පිළිබඳ දකුණු ආසියානු අධි බලශක්ති භෞතික උපයෝගී වැඩමුළුවට (SAHEPI-2) අදාලව, 2019 සැප්තැම්බර් මස 13 වන දින පැවති, දකුණු ආසියානු රාජ්‍ය තාන්ත්‍රික ප්‍රජාව මත න්‍යෂ්ඨික පර්යේෂණ පිළිබඳ යුරෝපා සංවිධානයේ පසුවිපරමට නිත්‍ය දූත මණ්ඩලය සහභාගී විය. පසු විපරම් සැසියේදී, ජාත්‍යන්තර සබඨතා අධ්‍යක්ෂිකා, චාලට් වරකාදල්ල මහත්මිය, 2019 පෙබරවාරි මස 20 සහ 21, ශ්‍රී ලංකාවේ, කොළඹදී සාර්ථකව නිමවූ, තාක්ෂණවේද අනාවරණය සහ භාවිතය පිළිබඳ දකුණු ආසියානු අධි බලශක්ති භෞතික උපයෝගී වැඩමුළුව සම්බන්ධයෙන් නිත්‍ය දූත මණ්ඩලය දනුවත් කර, මෙම ඉසව්ව කැඳවීමෙහි ලා උත්සුක වූ ශ්‍රී ලංකා රජයට සහ වෙනත් විවිධාකාර වූ පාර්ශ්වයන්ට ස්තුතිය පළකළාය.

**සෞඛ්‍යය**

ලෝක සෞඛ්‍ය සංවිධානයට අදාල තාක්ෂණික සහයෝගිතා කරුණු කාරණා සම්බන්ධයෙන් සෘජුවම ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඒ ඒ රටවල කාර්යාල සහ කලාපීය කාර්යාල හරහා කටයුතු කෙරෙන අතරතුර, නිත්‍ය දූත මණ්ඩලය, ප්‍රධාන වශයෙන් ගෝලීය සෞඛ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට අදාල සාකච්ඡා සමග, විශේෂයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි ලා ශ්‍රී ලංකාවේ සාර්ථකත්වයට ප්‍රසිද්ධිය ලබාදීම පිණිස ක්‍රමිකව මූලස්ථාන මට්ටමින් වැඩසටහන් හා සම්බන්ධ වේ. මෑතක අපගේ එවන් නිමග්නයන් අතර :

- නිත්‍ය දූත මණ්ඩලය, ලෝක සෞඛ්‍ය සංවිධානයේ විධායක මණ්ඩල සාමාජිකයෙකු වන අතර, 2019 ජනවාරි 24- පෙබරවාරි 01 දක්වා සහ 2019 මැයි මස 29-30 දෙදින පිළිවෙළින් ජිනීවාහි පැවති 144 සහ 145 වන විධායක මණ්ඩල රැස්වීම් සඳහා ගරු අමාත්‍යතුමාගේ සහ නියෝජිත පිරිසේ සහභාගිත්වය සඳහා පහසුකම් සලසන ලදී. ශ්‍රී ලංකාව, 2018 මැයි මාසයේදී එක් වර්ෂයක වාරයක් සඳහා තෝරා ගන්නා ලදුව, විධායක මණ්ඩලයේ උප සභාපතිවරුන් තිදෙනාගෙන් එක් අයකු ලෙස, අග්නිදිග ආසියා කලාපය නියෝජනය කරමින්, අඛණ්ඩව ක්‍රියා කරයි.
- 2019 මැයි මස 20-28 ජිනවාහි පැවැති ලෝක සෞඛ්‍ය පර්ෂදයේ 72 වන සැසිය, 2019 මැයි 19 පැවැති පොදු රාජ්‍ය මණ්ඩලීය සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ රැස්වීම සහ 2019 මැයි මස 21 වන දින 12 වන නොබැඳි සමුළුවේ සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ රැස්වීමට ගරු අමාත්‍යතුමාගේ සහ දූත පිරිසේ සහභාගිත්වය සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී
- ජිනීවාහි පැවති, ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජෙනරාල්, වෛද්‍ය. ටෙඩ්රෝස් සපැමිණි, 72 ලෝක සෞඛ්‍ය පර්ෂද රැස්වීමට පරිබාහිරව 2019 මැයි 21 වන දින පැවැති, "හදිසි අවස්ථා හමුවේ සහ අතිශයන් බරපතළ අසීරුතාවයකදී රෝගීන්ගේ සුරක්ෂිතතාවය සහ සත්කාරයේ ගුණාත්මකභාවය : විශ්ව සෞඛ්‍ය ආවරණය සාක්ෂාත් කර ගැනීම සඳහා පූර්ව අවශ්‍යතාවක්" බාහිර ඉසව්ව, ශ්‍රී ලංකාව විසින් කටාර් සහ එක්සත් රාජධානි රාජ්‍යයන් හා සමග සම-සංවිධානය කරන ලදී.

  ජිනීවාහි පැවැති, ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජෙනරාල්, වෛද්‍ය. ටෙඩ්රෝස් සපැමිණි, 72 ලෝක සෞඛ්‍ය පර්ෂද රැස්වීමට පරිබාහිරව 2019 මැයි 20 වන දින පැවති "බෝ නොවන රෝගවල අවදානම් සාධක සහ නිර්ණායකයන්" පරිබාහිර ඉසව්ව ශ්‍රී ලංකාව විසින් උරුගුවේ, ෆින්ලන්ත සහ රුසියා රාජ්‍යයන් හා සමග සම-සංවිධානය කරන ලදී.
- 2019 සැප්තැම්බර් මස මහා මණ්ඩල රැස්වීම අතරතුර, විශ්ව සෞඛ්‍ය ආවරණය මත ඉහළ පෙළ රැස්වීමක් නිව්යෝර්ක් නුවරදී පැවැත්විණ. මෙම රැස්වීම සම්බන්ධයෙන් ජිනීවා හි පැවැති තනු දැන්වීමේ රැස්වීම්වලදී ප්‍රතිඵල හෙළි කරනු ලැබිණ.
- බෝ නොවන රෝග පිළිබඳ ඉහළ පෙළ කොමිසමෙහි දෙවන පියවර සම්බන්ධයෙන් රැස්වීම් සඳහා විශේෂඥයින්ගේ ජිනීවා චාරිකා සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී, අතිගරු ජනාධිපතිතුමා මෙම කොමිසමෙහි සම සභාපතිවරයෙකු ලෙස කටයුතු කර ඇත.

  බෝ නොවන රෝග පිළිබඳ ඉහළ පෙළ කොමිෂමෙහි එකී සම සභාපතිත්වය පවත්වා ගෙන යමින් සිටියදී, කොමිසමෙහි කාර්ය භාරයෙහි දෙවන පියවරෙහි කොටසක් ලෙස 2019 දී, "

විශ්ව සෞඛ්‍ය ආවරණය කරා ගෝලීය තෙරපුම ක්‍රියාත්මක කරමින්" නමින් ක්‍රියාකාරී කණ්ඩායම II හි සම-සභාපතිත්වය ශ්‍රී ලංකාවට පවරා අත.

**ශ්‍රමය**

- ජාත්‍යන්තර කම්කරු සම්මන්ත්‍රණයේ 108 වන සැසිය 2019 ජූනි මස 10-21 දක්වා පැවැත්විණ. ජිනීවාහි පවත්වන ලද ජාත්‍යන්තර කම්කරු සම්මන්ත්‍රණයේ 108 වන සැසිය සඳහා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මහතා සහ ඔහුගේ නියෝජිත කණ්ඩායමේ සහභාගිත්වය සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී. දූත මණ්ඩලය ගරු අමාත්‍යතුමාගේ වැඩ සටහන සම්බන්ධීකරණය කරන ලද අතර, ජාත්‍යන්තර කම්කරු සම්මන්ත්‍රණයට සමගාමීව පවත්වන ලද පහත දැක්වෙන ඉසව්වල දී කම්කරු අමාත්‍යාංශය සහ කම්කරු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන්, මැදිහත්වීම් සම්බන්ධීකරණය කෙරිණ.:

    - 2019 ජූනි මස 17 වන දින ගරු අමාත්‍යතුමා විසින් ජාතික ප්‍රකාශණය ප්‍රකාශයට පත් කිරීම.
    - 2019 ජූනි මස 17 වන දින නොබැඳි සමුළු රටවල කම්කරු අමාත්‍යවරුන්ගේ රැස්වීම
- ජාත්‍යන්තර කම්කරු සම්මේලනයට පරිබාහිරව, කම්කරු අමාත්‍යතුමා සඳහා ලිබියාවේ කම්කරු හා ධාරිතා ගොඩනැගීමේ අමාත්‍ය, අල්මහ්දි ඩබ්.ඒ. ගුඩිනෝ මහතා සමග ද්විපාර්ශ්වීය සාකච්ඡාවක් සංවිධානය කිරීම සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී.
- ජාත්‍යන්තර කම්කරු සම්මේලනය සමග ද්විපාර්ශ්වීය සහයෝගිතාවය තවදුරටත් ශක්තිමත් කිරීම සාකච්ඡා කිරීම පිණිස කම්කරු අමාත්‍යාශයේ ලේකම්වරයා ජාත්‍යන්තර කම්කරු සම්මේලනයේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් සහ ආසියා හා ශාන්තිකර කලාපීය අධ්‍යක්ෂ ටොමෝකො මහත්මිය හමුවීම සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී.
- ශ්‍රී ලංකාව විසින් 1947 (අංක: 81) කම්කරු පිරික්සුම් ප්‍රඥප්තිය සහ 1949( අංක: 95) දරණ වේතන ආරක්ෂා කිරීමේ ප්‍රඥප්තිය නොපිළිපදින බවට චෝදනා කරමින්, ජාත්‍යන්තර කම්කරු සම්මේලනයේ ව්‍යවස්ථාවෙහි ව්‍යවස්ථා අංක: 24 යටතේ, ගුවන් සේවක සංගමය විසින් කරන ලද නියෝජනය සම්බන්ධයෙන්, කම්කරු කොමසාරිස් ජනරාල් ඒ. විමලවීර සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් බී. වසන්තන් මහත්වරුන් සහ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිති දෙපාර්තමේන්තුවේ, නීති විශාරද, වෙරෝනික් බැසෝ මහත්මිය සහ ප්‍රමිති භාවිත අධ්‍යක්ෂ හොරෙෂියෝ ගයිඩෝ මහතා අතර රැස්වීමක්ද දූත මණ්ඩලය විසින් සම්බන්ධීකරණය කෙරිණ.
- අංක: 29 දරණ මූල ලේඛය බලයෙන් ශ්‍රමය ලබා ගැනීමේ ප්‍රඥප්තියට යා කිරීම 2019 අප්‍රියෙල් මස 10 දින ශ්‍රී ලංකාව විසින් අපරානුමත කෙරිණ.

**විදුලිසංදේශ / තොරතුරු තාක්ෂණය**

- ජිනීවාහි, ජාත්‍යන්තර විදුලිසංදේශ සංගමය සහ ජාතික කේන්ද්‍රීය ලක්ෂ්‍යයන් වන විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ඩිජිටල් යටිතල ව්‍යුහ සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය අතර ක්‍රමික සම්බන්ධීකරණයට අමතරව, 2019 අප්‍රියෙල් මස 08 - 12 දක්වා පැවති තොරතුරු සමාජ ලෝක සමුළුව සමගද දූත මණ්ඩලය කටයුතු කරන ලදී.

**අවිහරණය**

- වර්ෂයේ කැපී පෙනෙන සිද්ධිය වූයේ, 2019 සැප්තැම්බර් මස ජිනීවාහිදී ස්වකීය ප්‍රකල්පනයන් අවසන කළ පොකුරු යුද්ධායුධ ප්‍රඥප්තියෙහි 9 වන රාජ්‍ය පාර්ශ්වයන්ගේ රැස්වීමේ ශ්‍රී ලංකා සභාපතිත්වයයි. පොකුරු යුද්ධායුධ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ වසර පුරා පැවැති අධීක්ෂණය සහ සමාලෝචන ක්‍රියාදාමයක; ප්‍රඥප්තිය සහ එහි සම්මතයන් සාර්වත්‍රිකකරණය සඳහා නියාමනය සහ උපදේශනයක; සහ පොකුරු යුද්ධායුධ භාවිතය, නිෂ්පාදනය, ගබඩා කිරීම සහ මාරුකිරීම තහනම් කිරීමක කූටප්‍රාප්තිය ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත විසින් සභාපතිත්වය දරන ලද රාජ්‍ය පාර්ශ්වයන්ගේ රැස්වීමෙන් සනිටුහන් විය. ශ්‍රී ලංකාව 9 වන රාජ්‍ය පාර්ශ්වයන්ගේ රැස්වීමේ සභාපතිත්වයට තෝරා ගැනීම

සුසාධ්‍යකරණය වන ලද්දේ, 2017 වසරේදී සහ 2018 වසරේදී පිළිවෙළින් පොකුරු යුද්ධායුධ ප්‍රඥප්තියේ සහ පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීමේ ප්‍රඥප්තියේ පදවිප්‍රාප්තයෙන් ප්‍රත්‍යක්ෂ වූ පරිදි, මානව හිතවාදී අවිහරණයට ශ්‍රී ලංකාවේ බලගතු කැපවීම ජාත්‍යන්තර ප්‍රජාව අතර පුළුල් පිළිගැනීමකට ලක්වීම හේතු පාදක වීමෙනි. ශ්‍රී ලංකාවේ සභාපතිත්ව කාල වකවානුව තුළ, ප්‍රඥප්තියේ ප්‍රධානතම අරමුණු දියුණු කිරීම පිණිස ප්‍රගතිශීලි පියවර ගණනාවක්ම ගනු ලැබිණ. රාජ්‍ය පාර්ශ්වයන් මෙන්ම රාජ්‍ය නොවන පාර්ශ්වයන් සමගද ශ්‍රී ලංකාවේ ගනුදෙනුව, මානව හිතවාදී අවිහරණ ක්ෂේත්‍රයෙහි තීරණාත්මක ගැටළු ගණනාවක් මත පොදු එකඟතාවයක් ගොඩනැගීමට දායක විය. රාජ්‍ය පාර්ශ්වයන් සහ නිරීක්ෂණ මට්ටමේ රාජ්‍යයන් විසින්, 2018 දී ප්‍රඥප්තියෙහි පදවි ප්‍රාප්තිය සිදුවූ වහාම, බහුපාර්ශ්වීය සංසදයන්හි අවිහරණ ක්‍රියාදාමයන් මෙහෙයවීමෙහි ලා දීර්ඝ-කාලීන ශ්‍රී ලංකා සම්ප්‍රදායය මෙනෙහි කරමින්, ප්‍රඥප්ති ක්‍රියාදාමයන්හි ලා ශ්‍රී ලාංකික නායකත්වය ස්වකීය ජාතික ප්‍රකාශනයන්හි ඇගයීමට ලක් කරන ලදී.

- අවිහරණ සම්මන්ත්‍රණයෙහි සාකච්ඡාවන්ට, එහි මහා මණ්ඩල රැස්වීම්වලදී මෙන්ම විවිධ කාර්යයන්ට අදාල වැඩ සටහන් සහ විවිධ සභාපතිත්වයන් විසින් යෝජිත කෙටුම්පත් තීරණ මත නොනිල උපදේශනයන්හිදී ද, වර්ෂය පුරාම දූත මණ්ඩලය සක්‍රීයව සහභාගි විය. ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතයා, ජිනීවාහි, අවිහරණ සම්මන්ත්‍රණයෙහිදී, මඩුළු සාකච්ඡා අමතන ලද අතර, නෘෂ්ඨික අවිහරණයෙහි දැඩි ප්‍රගතියක් සාක්ෂාත් කර ගැනීමෙහි ලා, පවත්නා අවිහරණ සාමූහික නිර්මාණ ශෛලිය සුරක්ෂණය කිරීම ඔස්සේ අධිෂ්ඨානශීලී ප්‍රයත්නයන් දැරීමේ අවශ්‍යතාවය ; සහ විවිධ කාර්යයන්ට අදාල වැඩ සටහන්වලට අනුගතවීම කඩිනම් කිරීම හා අවිහරණ සම්මන්ත්‍රණයෙහි න්‍යාය පත්‍රගත විෂයයන් වලට අදාල සාධනපත්‍රවල සැළකියයුතු ප්‍රමන්ත්‍රණය හා සමාප්තිය වැදගත් සේ දැඩිව අවධාරණය කෙරිණ. 2018 දී ශ්‍රී ලංකා සභාපතිත්වයෙන් ඇරඹී, අවිහරණ සම්මන්ත්‍රණය විසින් සාක්ෂාත් කර ගන්නා ලද ප්‍රවසම්පන්න ගම්‍යතාවය මත ක්‍රමයෙන් ස්ථාපනයවීමේ වැදගත්කම මතුකර දැක්වීම පිණිස ශ්‍රී ලංකාව සම්මන්ත්‍රණයේ ඉහළ පෙළ බණ්ඩයන්ටද ආමන්ත්‍රණය කරණ ලදී.

නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයේ පළමුවන කමිටුවේදී ශ්‍රී ලංකාවේ නිමග්නවීම සඳහා ආදාන සහ නිර්දෙශයන් නිත්‍ය නියෝජනය සහ දූත මණ්ඩලය විසින් සපයන ලදී.

- 21 වන කණ්ඩායමේදී (අවිහරණ සම්මේලනයේ නොබැඳි සමුළු රාජ්‍යයන්) ශ්‍රී ලංකාව නියෝජනය කෙරිණ.
- පොකුර අවිආයුධ ප්‍රඥප්තිය සහ පුද්ගල නාශක බිම්බෝම්බ තහනම් කිරීමේ ප්‍රඥප්තිය යටතේ ශ්‍රී ලංකා පාරදෘශ්‍ය වාර්තා කලට වේලාවට ඉදිරිපත් කිරීම දූත මණඩලය විසින් සුසාධ්‍යකරණය කෙරිණ. ශ්‍රී ලංකාවද පාර්ශ්වයක් වන අනෙකුත් අවිහරණ ප්‍රඥප්තීන් යටතේ වාර්තාකරණ අවශ්‍යතාවයන්ට අනුගතවීම සම්බන්ධයෙන්ද දූත මණ්ඩලය විසින් අමාත්‍යශය සමග සම්බන්ධීකරණයෙහි යෙදෙන ලදී.
- ජිනීවා හි එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජනය,
- 2020 දෙසැම්බර් 06 වන දින පෙව ආයුධ ප්‍රඥප්තියේ 2020 රාජ්‍ය පාර්ශ්ව රැස්වීමේ සභාපතිත්වය.
- ජාත්‍යන්තර බිම්බෝම්බ ක්‍රියා ජාතික අධ්‍යක්ෂවරුන්ගේ සහ විශේෂඥයින්ගේ රැස්වීමේ (2019 පෙබරවාරි 5 - 8 දක්වා පැවැති) සහ පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීමේ ප්‍රඥප්තියේ අන්තර්-සැසි රැස්වීමෙහි (2019 මැයි මස 22 -24) ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සහභාගිත්වය සුසාධ්‍යකරණය කෙරිණ.
- 2019 නොවැම්බර් මස 25-29 දක්වා ඔස්ලෝ හි පවත්වන ලද පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීමේ ප්‍රඥප්තියේ සමාලෝචන සම්මන්ත්‍රණයේ ශ්‍රී ලංකා නියෝජනය එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජනය විසින් මෙහෙයවන ලදී.
- 2019 මැයි මස 22-24 දක්වා පවත්වන ලද පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීමේ ප්‍රඥප්තියේ අන්තර්-සැසි රැස්වීමට පරිබාහිරව "2020 දී බිම් බෝම්බවලින් තොර ශ්‍රී ලංකාවක් කරා : සහභාගිත්වයේ අභියෝග සහ සම්භාව්‍යතා" නමින් බාහිර ඉසව්වක් දූත මණ්ඩලය විසින් සංවිධානය කෙරිණ. මෙම ඉසව්වේදී, බිම් බෝම්බ ක්‍රියා, මානව හිතවාදී අවිහරණය සහ මානව හිමිකම් විශේෂඥයෝ, බිම් බෝම්බ ඉවත් කිරීම, බිම් බෝම්බ අවදානම් අධ්‍යයනය සහ වින්දිත සහාය යන ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකාව සාක්ෂාත් කර ගෙන ඇති ප්‍රගතිය ඇගයීමට

ලක් කළාහ. බිම් බෝම්බ ක්‍රියා විශේෂඥයින්, විද්වතුන් සහ රාජ්‍ය තාන්ත්‍රිකයින් කිහිප දෙනෙකුට අමතරව, ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයින්, ක්‍රියාත්මක කිරීමේ පාර්ශ්වකරුවන් සහ ප්‍රදායක ප්‍රජාවන් මෙම ඉසව්වට ඇඳී ආහ.

- 2019 නොවැම්බර් මස 13-15 දක්වා පැවැති, ප්‍රඥප්තියේ ඉහළපෙළ ගිවිසුම්ගත පාර්ශ්වයන්ගේ රැස්වීමේදී නිත්‍ය නියෝජනය විසින් යම් යම් සම්ප්‍රදායික ආයුධ ගැන ප්‍රකාශයක් සිදු කෙරිණ. මාරක ස්වායත්ත ආයුධ ක්‍රම ක්ෂේත්‍රයෙහි ඉස්මතු වෙමින් පවතින තාක්ෂණවේදයන් ගැන ප්‍රඥප්තියේ ඉහළපෙළ ගිවිසුම්ගත පාර්ශ්වයන්ගේ රාජ්‍ය විශේෂඥ කණ්ඩායම්වල රැස්වීමටද (2019 මාර්තු 25-29) ශ්‍රී ලංකාව සහභාගී විය.

**එක්සත් ජාතීන්ගේ වෙළඳ සහ සංවර්ධන සම්මන්ත්‍රණය**

- දූත මණ්ඩලය විසින්, විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්, චින්තක ලොකුහෙට්ටි මහතා සහ එක්සත් ජාතීන්ගේ වෙළඳ සහ සංවර්ධන සම්මන්ත්‍රණයේ, තාක්ෂණ සහ සම්පාදන හා කාර්ය සංවිධාන අංශයෙහි, තාක්ෂණවේදය සහ තොරතුරු තාක්ෂණ ශාඛා ප්‍රධානී, ඇන්ජල් ගොන්සාල්ස් සැන්ස් මහතා අතර, එක්සත් ජාතීන්ගේ වෙළඳ සහ සංවර්ධන සම්මන්ත්‍රණය විසින් ශ්‍රී ලංකාවේ පැවැත්වීමට යෝජිත විද්‍යා, තාක්ෂණවේද සහ නවෝත්පාදන ප්‍රතිපත්ති සමාලෝචනය සම්බන්ධයෙන් රැස්වීමක් සම්බන්ධීකරණය කර 2019 ජූනි මස 17 වන දින, සංවිධානය කරන ලදී.

**එක්සත් ජාතීන්ගේ පුහුණුව සහ පර්යේෂණය සඳහා වන ආයතනය**

එක්සත් ජාතීන්ගේ පුහුණුව සහ පර්යේෂණ සඳහා වන ආයතනය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයෙහි පවත්වන ලද "බහුපාර්ශ්වීය රාජෝපායෙහි සාධනීය නායකත්වය සහ ප්‍රමන්ත්‍රණය" ගැන පළමුවන පුහුණු වැඩ සටහන ප්‍රමන්ත්‍රණය සහ සුසාධ්‍යකරණයෙහි ලා සක්‍රීය ක්‍රියාදාමයක් දූත මණ්ඩලය විසින් ඉටු කරන ලදී. ප්‍රමන්ත්‍රණ කුසලතා මොඩ්‍යුලය 2019 නොවැම්බර් මස 27-28 ද, නායකත්ව කුසලතා මොඩ්‍යුලය 2019 නොවැම්බර් 28-30 ද පැවැත්විණ. නායකත්වය සහ ප්‍රමන්ත්‍රණය නාභිගත කොටගත් බහුපාර්ශ්වීය රාජෝපාය මත විඩම්බන අභ්‍යාසවලින් සමන්විත මෙම පුහුණු වැඩ සටහනට, ශ්‍රී ලංකා විදේශ සේවයෙහි සාමාජිකයින් තිස් දෙනෙක් සහභාගී වූහ.

දූත මණ්ඩලය, රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා සහයෝගිතාවය, පුහුණු අවස්ථා, කුසලතා සංවර්ධන අධ්‍යයන චාරිකා සහ පුහුණුව වැඩිදියුණු කිරීම පිණිස එක්සත් ජාතීන්ගේ පුහුණුව සහ පර්යේෂණය සඳහා වන ආයතනය සහ ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය අතර අවබෝධනා ගිවිසුමක් සමාප්ත කර ගැනීමේ සාකච්ඡාවලද නිරත විය.

මේ සම්බන්ධයෙන්, බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජතාන්ත්‍රික පුහුණු ආයතනයෙහි අධ්‍යක්ෂ ජනරාල් පැමෙලා ඩීන් මහත්මියගේ ජිනීවා සංචාරයද දූත මණ්ඩලය විසින් සුසාධ්‍යකරණය කෙරිණ.

**පරිසර සහ දේශගුණික විපර්යාශ**

ජිනීවා නාභිය ලක්ෂ්‍යය ලෙස, ධාරිතා වර්ධනයෙන්, තාක්ෂණික සහාය සහ පුහුණු අවස්ථාවලින් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ අත්පත් කර ගැනීමේ මාර්ග සාකච්ඡා කිරීම පිණිස, ශ්‍රී ලංකා රාජ්‍ය බලධාරීන් සහ එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන, එක්සත් ජාතීන්ගේ ආපදා අවදානම අඩුකිරීමේ කාර්යාලය, හරිත ආර්ථිකයකට සහයෝගිතාවය, දේශගුණික අනාරක්ෂිත සංසදය ඇතුළු ජිනීවාහි ස්ථානගත පරිසර සහ ආපදා අවදානම් කළමණාකරණය ආශ්‍රිත සංවිධාන අතර සහයෝගිතාවය සුසාධ්‍යකරණය කරණ ලදී.

- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේදී , බේසල්, ස්ටොක්හොල්ම්, රොටර්ඩෑම් සහ මිනමාටා ප්‍රඥප්තීන්, සාධනපත්‍රවලට ශ්‍රී ලංකාව අනුගතවීම මත, එකී ප්‍රඥප්තීන්ගේ මහ ලේකම් කාර්යාල හා සමග සම්බන්ධීකරණය කිරීම දූත මණ්ඩලය විසින් සුසාධ්‍යකරණය කෙරිණ.
- දූත මණ්ඩලය, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ, අධ්‍යක්ෂිකා එස්.එල්.ඩී.කේ.

විජයසිංහ මහත්මියගේ සහභාගිත්වය සුසාධ්‍යකරණය කරමින්, 2019 අප්‍රියෙල් මස 29 සිට මැයි 10 දක්වා, ජිනීවාහි එකින් එක පවත්වන ලද, බේසල් ප්‍රඥප්තියේ පාර්ශ්වකරුවන්ගේ 14 වන සම්මන්ත්‍රණය, රොටර්ඩෑම් ප්‍රඥප්තියේ පාර්ශ්වකරුවන්ගේ 09 වන සම්මන්ත්‍රණය, සහ ස්ටොක්හොල්ම් ප්‍රඥප්තියේ පාර්ශ්වකරුවන්ගේ 09 වන සම්මන්ත්‍රණය සම්බන්ධීකරණය කරණ ලදී.

- 2019 අගෝස්තු මස 25-29 දක්වා, ජිනීවා හි පවත්වන ලද පාර්ශ්වකරුවන්ගේ සම්මන්ත්‍රණයේ 18 වන රැස්වීමට සහභාගීවීමට හැකිවන පරිදි, දූත මණ්ඩලය විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී සන්දිත් සමරසිංහ මහතාගේ සහ නියෝජිත පිරිසේ සංචාරය සුසාධ්‍යකරණය කෙරිණ.
- 2019 නොවැම්බර් මස 25-29 පවත්වන ලද රසදිය පිළිබඳ මිනමාටා ප්‍රඥප්තියේ පාර්ශ්වකරුවන්ගේ සම්මන්ත්‍රණයේ 03 වන රැස්වීමට සහභාගී වූ දූත මණ්ඩලය, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂිකා, එස්.එල්.ඩී.කේ. විජයසිංහ මහත්මියගේ සහභාගිත්වය සුසාධ්‍යකරණය කරණ ලදී.

**ප්‍රති ත්‍රස්තවාදය, උපායමාර්ග සහ ආරක්ෂා ප්‍රතිපත්තිය**

දූත මණ්ඩලය, ආරක්ෂක ප්‍රතිපත්තිය සඳහා වන ජිනීවා මධ්‍යස්ථානය සමග සම්බන්ධතාව පවත්වා ගෙන යයි. ආරක්ෂක ප්‍රතිපත්තිය සඳහා වන ජිනීවා මධ්‍යස්ථානය ශ්‍රී ලාංකික සහභාගීවන්නන්ට ශිෂ්‍යත්ව ප්‍රදානයෙහි අඛණ්ඩව යෙදී සිටී.

ගෝලීය ප්‍රජා නිමග්න සහ ප්‍රත්‍යාස්ථී අරමුදලේ විධායක අධ්‍යක්ෂ, ආචාර්ය කාලිඩ් කෝසර් මහතාගේ 2019 අගෝස්තු මස 27-30 දක්වා ශ්‍රී ලංකා සංචාරය දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී. ආචාර්ය කෝසර් මහතා 2019 අගෝස්තු මස 29 වන දින විදේශ කටයුතු අමාත්‍ය, ගරු තිලක් මාරපන මහතා හමුවිය. ප්‍රචණ්ඩකාරී අන්තවාදය වළක්වාලීම පිණිස ගෝලීය ප්‍රජා නිමග්න සහ ප්‍රත්‍යාස්ථී අරමුදලේ විශෙෂඥ ඥාණය ලබා ගැනීමේ හැකියාව මෙම සංචාරයේදී අදාල පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කරන ලදී.

දූත මණ්ඩලය ආරක්ෂක ප්‍රතිපත්තිය සඳහා වන ජිනීවා මධ්‍යස්ථානය සමග සම්බන්ධවෙමින්, ශ්‍රී ලංකාව ආරක්ෂක ප්‍රතිපත්තිය සඳහා වන ජිනීවා මධ්‍යස්ථානයේ පාර්ශ්ව රටක් ලෙස අනුමැතිය ලබා ගැනීම සුසාධ්‍යකරණය කරණ ලදී. අමාත්‍යාංශයේ, ජාත්‍යන්තර ආරක්ෂා සහ ප්‍රතිත්‍රස්තවාදය පිළිබඳ වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ, මහේෂා ජයවර්ධන මහත්මිය 2019 නොවැම්බර් මස 21 වන දින ආරක්ෂක ප්‍රතිපත්තිය සඳහා වන ජිනීවා මධ්‍යස්ථානයේ පාලන මණ්ඩල රැස්වීමට සහභාගී වූවාය.

**අන්තර් පාර්ලිමේන්තු සංගමය**

ප්‍රජාතාන්ත්‍රික පාර්ලිමේන්තුවල දර්ශක සම්පාදනයට සහායවීම පිණිස 2019 සැප්තැම්බර් මාසයේදී ජිනීවා හි, අන්තර් පාර්ලිමේන්තු සංගමයෙහි විශේෂඥ උපදේශනයක ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාගේ සහභාගිත්වය දූත මණ්ඩලය විසින් සුසාධ්‍යකරණය කෙරිණ.

**අපේක්ෂකත්වය**

දූත මණඩලය, ශ්‍රී ලංකා රජයේ සහාය ලැබීමට නියමිත පහත දැක්වෙන තෝරා ගැනීම්/ අපේක්ෂකත්වයන් ට අදාලව කටයුතු කරන ලදී.

- සර්බියාවේ, බෙල්ග්‍රේඩ් හි, 141 වන අන්තර්-පාර්ලිමේන්තු සංගම් සම්මේලනයට සමගාමීව 2019 ඔක්තෝබර් මස 17 වන දින, සංගමයේ විධායක කමිටුවට තෝරා ගැනීම
- ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ, 2019-2023 වාරය සඳහා 2019 ජූනි 03-14 දක්වා පහත දැක්වෙන තනතුරු සඳහා තෝරා ගැනීම
    - මහ ලේකම්
    - සභාපති සහ උපසභාපතිවරුන් තිදෙනෙකු
    - විධායක සභාවේ සාමාජිකයෝ
- 2019 දෙසැම්බර් මස 11 වන දින, ජිනීවාහි දී, රතු කුරුස සංගමයේ සහ රෙඩ් ක්‍රෙසන්ට් සංගමයේ ස්ථාවර කමිටුවේ සාමාජිකයින් තෝරා ගැනීම

- සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට තෝරා ගැනීම, සංවිධාන කවුන්සිලයේ විශේෂ සැසියකදී.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන්ගේ චාරිකා**

2019 අගෝස්තු මස 12-15 දක්වා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් 6 දෙනෙකුගේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් 06 කගේ ජිනීවා සංචාරය දූත මණ්ඩලය විසින් සුසාධ්‍යකරණය කර, ජිනීවාහි මධ්‍යගත ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණයන්හි ප්‍රායෝගික අංශ දැන හැඳින ගැනීමේ අවස්ථාව සංවිධානය කර දෙන ලදී.

**සංස්කෘතික රාජෝත්සවය**

දූත මණ්ඩලය, ජිනීවා හි, ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේදී, ලෝක උරුමයක් ලෙස ත්‍රිපිටකයේ වැදගත්කම පිළිඹඳ විද්වත් සාකච්ඡාවක් සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා නිදහස් දින 71 වන සංවත්සරය 2019 පෙබරවාරි 09 වන දින, ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේදී උත්සවශ්‍රීයෙන් සමරණ ලද අතර, ස්විට්සර්ලන්තයේ ශ්‍රී ලාංකික ප්‍රජාවේ 250 කට අධික පිරිසක් සහභාගී වූහ.

ශ්‍රී ලංකාවේ පාස්කු ඉරිදා ප්‍රහාරයේ වින්දිතයින් සමරා, උපහාර පුදා, ගෞරවය දක්වා, දේවාශීර්වාද පැතීමේ සර්ව-ආගමික උත්සවයක් 2019 අප්‍රියෙල් මස 28 වන දින, බර්න් හිදී පැවැත්විණ.

එක්සත් ජාතීන්ගේ කාන්තා සංසදය විසින් 2019 දෙසැම්බර් 09 වන දින ජිනීවා හිදී සංවිධාය කරන ලද වාර්ෂික සල්පිලට දූත මණ්ඩලය සහභාගී විය.

**තුර්කිය**

දැනට ජෝර්ජියාවට සහ යුක්‍රේනයට අක්ත ගන්වා ඇති තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ක්‍රියාකාරකම්

**ද්විපාර්ශ්වීය සබඳතා**

ශ්‍රී ලංකාවේ ලැදියාවන් ප්‍රවර්ධනය කරණු පිණිස සහ ශ්‍රී ලංකාව සහ තුර්කිය අතර ද්විපාර්ශ්වික සබඳතාවයන් වැඩිදියුණු කිරීම සඳහා දූත මණඩලය විසින් ප්‍රත්‍යුත්ක්‍රමයන් කිහිපයක් ගනු ලැබිණ. ඒ හැරත්, ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා රැස්වීමේ ඒකාබද්ධ කමිටුව කොළඹදී පැවැත්වීම කඩිනම් කිරීම අරමුණු කොට ගෙන, තානාපතිතුමන් විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය, වෙළඳ අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන අමාත්‍යාංශය (ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා රැස්වීමේ ඒකාබද්ධ කමිටුවේ තුර්කි සභාපති) සහ අනෙකුත් රජයේ අමාත්‍යාංශ සහ නියෝජිතායතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග ක්‍රමික අන්තර්ක්‍රියාවන්හි නියැලෙමින්, ජාතික අධ්‍යාපන අමාත්‍ය, ගරු ෂියා සෙල්කක් (ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා රැස්වීමේ ඒකාබද්ධ කමිටුවේ තුර්කි සභාපති), විදේශ කටයුතු අමාත්‍ය, ගරු මෙව්ලට් කවුසොග්ලු, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය, ගරු යාවුස් සෙලිම් කිරාන්, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය, ගරු සෙදට් ඔනාල් සහ වෙළඳ නියෝජ්‍ය අමාත්‍ය ගරු ගොන්කා යිල්මාස් බතූර් සමග රැස්වීම් මාලාවක් පැවැත්විය. ප්‍රධාන වශයෙන්, ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා රැස්වීමේ ඒකාබද්ධ කමිටුව පැවැත්වීම සඳහා 2020 අප්‍රියෙල් පශ්චිම භාගයේ හෝ මැයි මුල් භාගයේ දින යෝජනා කිරීමට සළකා බලන ලදී. (කෙසේවුවද, කොවිඩ් 19 වසංගතය නිසා අවිනිශ්චිතව කල් තබන ලදී) තවද, තුර්කි පාර්ලිමේන්තුවේ, තුර්කි-ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය සමග සහයෝගිතාවය වැඩිදියුණු කර ගැනීමට දූත මණ්ඩලය යාන්ත්‍රණයක් ආරම්භ කරන ලදී. තානාපතිතුමා, තුර්කි-ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපති, ගරු අහමත් හම්ඩි කමිලි මහතා (තුර්කි ආණ්ඩු පක්ෂයේ-සාධාරණත්ව සහ සංවර්ධන පක්ෂය - පා.ම.) සමග රැස්වීම් කිහිපයක් පවත්වා, දෙරට අතර මිත්‍රශීලී ද්විපාර්ශ්වීය සබඳතා වැඩිදියුණු කිරීම පිණිස ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් ස්ථාපිත කර ගන්නා ලදී.

### ද්විපාර්ශ්වීය දේශපාලන උපදේශන

ශ්‍රී ලංකාව සහ තුර්කිය අතර ප්‍රමුඛතාගත අංශවල සහයෝගිතාවය වැඩිදියුණු කිරීම පිණිස නව මාර්ග සිතියමක් ලෙස 2019 මැයි මස 10 වන දින, දේශපාලන උපදේශනයෙහි පළමුවන සැසිය කැඳවන ලදී. උපදේශනය නාහිගත වූයේ සංචාරක, වෙළඳ සහ ආයෝජනය, ආරක්ෂාව, විද්‍යාව සහ තාක්ෂණවේදය, සංස්කෘතිය සහ උසස් අධ්‍යාපනය මතය. ශ්‍රී ලංකාව සහ තුර්කිය හවුල් ආර්ථික ලැදියාවන් අනුගමනය කරගෙන යාම සහ, ත්‍රස්තවාදය වැනි පොදු අභියෝග සම්බන්ධයෙන් කලාපීය හා බහුපාර්ශ්වීය වේදිකාවලදී අවධානය යොමුකිරීම මතත් උපදේශණය තවදුරටත් නාහිගත විය.

### අධ්‍යාපනය සහ ජාත්‍යන්තර සහයෝගිතාවය

තුර්කිය හා ශ්‍රී ලංකාව අතර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සහයෝගිතාවය ස්ථාපිත කර ගැනීමට සහ ඒකාබද්ධ පර්යේෂණ සහ ශිෂ්‍ය හා ශාස්ත්‍රීය පර්යේෂණ සඳහා උසස් අධ්‍යාපන කවුන්සිලයේ සභාපති, මහාචාර්ය. වෛද්‍ය.එම්.ඒ. යෙක්ටා සරක් මහතා සමග, මාරිත් පදනමේ සභාපති, තුර්කි ප්‍රධාන විශ්ව විද්‍යාලවල කුලපතීන් හා විශ්ව විද්‍යාල ප්‍රධානීන් සමග සාකච්ඡා මාලාවක් පවත්වන ලදී.

### සංස්කෘතික සබඳතා

### ශ්‍රී ලාංකික ප්‍රජාව සමග ඉසව් සහ අන්තර්ක්‍රියා

- ශ්‍රී ලංකා නිදහස් දිනයට සමගාමීව, 2019 පෙබරවාරි 04-09 දක්වා, දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලාංකික ආහාර උත්සවය - අන්කාරා, හිල්ටන් හෝටලය
- තානාපතිතුමාගේ නිල නිවාසයේ, ශ්‍රී ලාංකික සූපවේද ප්‍රදර්ශනය
- තුර්කියේ, කේල්චික් හි, සැප්තැම්බර් මාසයේ පවත්වනු ලබන මිදි අස්වනු නෙලීම් මංගල්‍යය, දූත මණ්ඩලය, ලෝක ආහාර -ඉස්තාන්බුල් 2019 ප්‍රදර්ශනයට සක්‍රීව සහභාගී විය
- අන්කාරා, චන්කයා, 03 වන ඇක්මෙක් (පාන) උත්සවය - යිල්ඩිරිම් බෙයාසිට් විශ්ව විද්‍යාලයේ, ජාත්‍යන්තර සබඳතා දෙපාර්තමේන්තුව විසින් නොවැම්බර් මාසයේ සංවිධානය කරණ ලද තුර්කි-ආසියා සබඳතා ප්‍රදර්ශනය.
- තුර්කියේ, විදේශ කටයුතු අමාත්‍යාංශයීය කලත්‍ර සහයෝගිතා සංගමය විසින් සංවිධානය කරන ලද 28 වන **DMEDD** වාර්ෂික පුණ්‍ය කඩවීදිය
- එක්ස්පෝ ට්‍රැවල් අන්කාරා ප්‍රදර්ශනයට සමගාමීව, දූත මණ්ඩලය විසින් 2019 නොවැම්බර් 14-17 දක්වා, ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කරණු පිණිස අන්කාරාහි සුප්‍රසිද්ධ සාප්පු සංකීර්ණයක, "ශ්‍රී ලංකා නර්තන නිකේතනය" නාට්‍ය කණ්ඩායම යොදවා ශ්‍රී ලංකා සංස්කෘතික ප්‍රසංග මාලාවක් සංවිධානය කරන ලදී.
- 2019 ඔක්තෝබර් මාසයේදී, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශයක පාසල් සිසුන් කණ්ඩායමක් තුර්කියේ, අන්කාරාහි, 2019 ජාත්‍යන්තර මුතායි සම්මේලනයේ තරුණ ශූරතා තරඟාවලියකට සහභාගී කරවන ලදී.

### ජෝර්ජියාව

### ශ්‍රී ලාංකික ප්‍රජාව සමග ඉසව් සහ අන්තර්ක්‍රියා

- ට්බිලිශි රාජ්‍ය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලාකික ශිෂ්‍ය සමමේලනයට 2019 දෙසැම්බර් මස 07 වන දින, වාර්ෂික "සිලොන් බෝල්-2019" සංස්කෘතික සහ සංගීත සංදර්ශණය පැවැත්වීම පිණිස දූතමණ්ඩලය විසින් සහාය දෙන ලදී.

### යුක්රේන්

### ශ්‍රී ලාංකික ප්‍රජාව සමග ඉසව් සහ අන්තර්ක්‍රියා

- දෙවන ලේකම් සහ කොන්සියුලර් නිලධාරියාගේ සංචාරයේදී, යුක්රේනයේ පදංචිව සිටින ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සුබසාධනය සහ මුහුණ පා ඇති දුෂ්කරතා සම්බන්ධයෙන් විමසා බැලීම

පිණිස ඔවුන් හා අන්තර්ක්‍රියා රැස්වීමක් පවත්වන ලදී. ඔවුන් සඳහා 2019 ඔක්තෝබර් මස 12 වන දින පළමුවන ජංගම සේවය පවත්වන ලදී.

**කම්කරු සුබසාධනය**

- තුර්කියේ සහ අක්න ගන්වා ඇති රටවල් වන ජෝර්ජියාව සහ යුක්‍රේනයේ වාසය කරන සියළුම ශ්‍රී ලාංකිකයින්ගේ (සංක්‍රමණ ශ්‍රමිකයින් ඇතුළුව) සවිස්තරාත්මක දත්ත පදනමක් සම්පාදනය කෙරිණ.

**ද්විපාර්ශ්වීය සබඳතා**

- පසුගිය කාර්තුව තුළ දූත මණ්ඩලයේ සක්‍රීය ප්‍රයතන්යන් නිසා, ශ්‍රී ලංකාවෙන් යුක්‍රේනයට සත්ව නිෂ්පාදන ආනයන මත පනවා තබූ ඒකපාර්ශ්වීය පියවර යළි සළකා බැලීමට යුක්‍රේන බලධාරීන් එකඟ වී ඇත. මෙම වසර තුළ සාගර සබඳතා ගොඩ නැගී ඇත. ශ්‍රී ලංකාවේ මිනිස් ජාවාරම සහ යුක්‍රේනයට කෙරෙණ නීතිවිරෝධී සංක්‍රමණය නිසා ඉස්මතුව ඇති ගැටළු නිරාකරණය කර ගැනීම පිණිස සුමට අන්තර්ක්‍රියා අවශ්‍ය වේ.

**ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්**

- දෙරට අතර ද්විපාර්ශ්වීය සබඳතා වැඩිදියුණු කිරීමට සහ රාජතාන්ත්‍රික සහ නිල ගමන් බලපත්‍ර දරන්නන්ට රටට ඇතුළුවීම පහසුවීම පිණිස 2019 සැප්තැම්බර් මස 29 වන දින, රාජතාන්ත්‍රික සහ නිල ගමන් බලපත්‍ර දරන්නන් වීසා අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමට ගිවිසුමකට එළඹෙන ලදී.

**තුර්කිය**

- පවුල් ශ්‍රමික සහ සමාජ සේවා නියෝජ්‍ය අමාත්‍ය ගරු අයිසෙ කරදාස් අර්පෙන්සන් මහතා හමුවීමෙන් පසු, ශ්‍රී ලාංකිකයින්ට තුර්කියේ ඇති රැකියා අවස්ථා ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට හා නීතිවිරෝධී සංක්‍රමණිකයින්ගේ ගැටළුව විසඳා ගැනීමටද තානාපතිතුමාට හැකිවිය. නීති විරෝධී සංක්‍රමණිකයින්ගේ ගැටළුව සහ මිනිස් ජාවාරම් ගැන ආගමන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, තුර්කියේ පොලිස් ප්‍රධානියා සහ පොලිස් බුද්ධි අංශයේ ප්‍රධානියා සමග තවදුරටත් සාකච්ඡා පවත්වන ලදී. අනම්‍ය කාර්යාල පිළිවෙත් සහ නීති විරෝධී සංක්‍රමණය වළැක්වීම සඳහා දූත මණ්ඩලයේ රාජතාන්ත්‍රික නිලධාරීන්ගෙන් සහ තුර්කියේ ආගමන නිලධාරීන්ගෙන් සමන්විත ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපිත කර ඇත. බඳවා ගැනීම් පිළිවෙත් විධිමත් කිරීමට, ශ්‍රී ලංකාවේ ප්‍රතිපූරක නිලධාරීන්ගේ නිවැරදි තොතුරු ලබා ගැනීමට සහ ශ්‍රී ලංකා විදේශ සේව නියුක්ති කාර්යාංශයේ ක්‍රියා පරිපාටි සහ මාර්ගෝපදේශ ගැන දැනුවත්වීමට, දූත මණ්ඩලය විසින් රැස්වීම් ගණනාවක්ම පවත්වන ලදී.

**යුක්‍රේනය**

- යුක්‍රේනයේ, කීව් ප්‍රදේශයේ, ජංගම සේවයක් සඳහා පැමිණි දෙවන ලේකම්ට සහ කොන්සියුලර් නිලධාරයාට යුක්‍රේනයේ රඳවා ගෙන සිටිනු ලබන නීති විරෝධී සංක්‍රමණිකයෙකුට අදාල ගැටළුව නිරාකරණය කර ගැනීමට හැකිවී ඇත. රඳවා ගෙන සිටින ශ්‍රී ලාංකිකයින් ආපසු එවීම සම්බන්ධයෙන් ඇති පරිපාලනමය ගැටළු විසඳීම සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇත. මෙමගින් නීති විරෝධී සංක්‍රමණයන් තදින්ම අවම කිරීමටද හැකියාව ලැබී ඇත.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

**සංචාරක**

- තුර්කියෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව 16.7 % කින් වැඩිවී ඇත. එයට සාපේක්ෂව, 2018 වසරේදී පැමිණි සංඛ්‍යාව 4,972 කි. එසේම තුර්කියේ සංචාරයට යන ශ්‍රී

ලාංකිකයින්ගේ සංඛ්‍යාව 47 % කින් වැඩිවී ඇත. එයට සාපේක්ෂව, 2018 වසරේදී පිටත්ව ගිය සංඛ්‍යාව 7,530 කි. තුර්කි සංචාරකයින් සංඛ්‍යාව වැඩි කිරීම පිණිස හේතුවූ ප්‍රධාන කාරණා පහත දක්වා ඇත. 2019 නොවැම්බර් මස 14-17 , 04 වන එක්ස්පෝ ට්‍රැවල් අන්කාරා චාරිකා සහ සංචාරක ප්‍රදර්ශනයට ශ්‍රී ලංකාව සහභාගී වීම ඇතුළු සංචාරක ප්‍රවර්ධන ඉසව් සංවිධානය කිරීම; ශ්‍රී ලංකා චාරිකා වෙළඳ සමාගම් 07 ක් සහභාගී වූ අතර, දූත මණ්ඩලය විසින් ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට රැස්වීම් පවත්වන ලද තර, සුප්‍රිසිද්ධ තුර්කි ජාතික චාරිකා වෙළඳ සමාගම්/සමාගම්/පුවත්පත් කලාවේදීන්ගේ සහභාගිත්වයෙන් තානාපති කාර්යාලයේදී, ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට රැස්වීම් පවත්වන ලදී. තුර්කි ගුවන් සේවයේ සහායෙන් සහ සංචාරක වෙළඳ සමාගම්වල සහභාගිත්වයෙන් " කලම්බු මීට්ස් ඉස්තාන්බුල් "වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාව තුර්කියෙහි ප්‍රවර්ධනය කිරීමට සහ ශ්‍රී ලංකාව ජනප්‍රිය නිවාඩු ගමනාන්තයක් ලෙස ඔවුන්ගේ ප්‍රවර්ධන පත්‍රිකා ආදියෙහි ඇතුළත් කිරීමට බිලාල් එක්සි මහතා,ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරි, තුර්කි එයාර් ලයින්ස්, ප්‍රසිද්ධ තුර්කි චාරිකා වෙළඳ සමාගම, කටාර් එයාවේස්, තුර්කි ට්‍රැවල් සමාගම් සමග අන්තර්ක්‍රියාවල ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමට අඛණ්ඩව ක්‍රියා කර ඇත. තවද, මාධ්‍ය දැනහැඳින ගැනීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කෙරිණ. සුප්‍රසිද්ධ පුවත්පත් කලාවේදිනයක වන ඉබෘ අර්ක් මහත්මිය මිල්යෙට් තුර්කි පුවත්පත නියෝජනය කරමින්, තානාපති කාර්යාලයේ සහාය ඇතිව ශ්‍රී ලංකාවට පැමිණ, විද්‍යුත් සහ මුද්‍රිතමාධ්‍ය ඇතුළු විවිධ මාර්ගවලින් සිලෝන් තේ, කුරුඳු සහ ශ්‍රී ලංකාවේ සුන්දරත්වය ප්‍රවර්ධනය කළාය. වර්ෂයේ 4 වන කාර්තුව තුළ තුර්කි රූපවාහිණී නාලිකා, මුද්‍රිත මාධ්‍ය, සමාජ මාධ්‍ය වේදිකා, එනම්: ඉනස්ටග්‍රෑම්, ට්විටර්, ෆේස් බුක්, විවිධ මාර්ගවලින්, ශ්‍රී ලංකා ප්‍රතිරූපය ගොඩ නැගීම පිණිස පියවර ගැණින. සංචාරක කර්මාන්තයට අදාල ප්‍රසිද්ධ තුර්කි මාධ්‍ය පිරිස්වලට ශ්‍රී ලංකාවට පැමිණ, සිලෝන් ටී ඇතුළු සංචාරක වැදගත් කමක් ඇති සෑම ස්ථානයකටම ප්‍රසිද්ධිය ලබා දීමට දූත මණ්ඩලය සහාය ලබා දෙන ලදී.

**වෙළඳාම**

- 2018 වර්ෂය සහ සැසඳීමේදී තුර්කිය වෙත ශ්‍රී ලංකා අපනයනයන් ආන්තරික වශයෙන් 2% කින් අඩුවී ඇත. කෙසේ වුවද, පසුගිය කාර්තුව ප්‍රධානතම අපනයනකරුවන්, වෙළඳ මණ්ඩල හා ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ සංගමය සමඟ ගන්නා ලද ශක්තිමත් ක්‍රියාමාර්ග හේතුවෙන්, දෙරට අතර වෙළඳාම ඉහළ ගොස් ඇත. තුර්කි රේගු දත්ත අනුව, 2019 ශ්‍රී ලංකා අපනයන්ගේ වටිනාකම ඇ.එ.ජ.ඩොලර් මිලියන 87.84 කි. තවද, සමාලෝචිත වර්ෂය ඇතුළත තේ හා රබර් අපනයනයන් පිළිවෙළින් 20 % කින් හා 14% කින් ඉහළ ගොස් ඇත. (තුර්කි රේගු දත්ත අනුව, පසුගිය කාර්තුව ඇතුළත තේ අපනයන වටිනාකම ඇ.එ.ජ. 10,894,614. කි) 03 වන 04 වන කාර්තුවලදී, දූත මණ්ඩලය විසින් තුර්කි බලධාරීන් හා ප්‍රමන්ත්‍රණයෙන්, තුර්කි වරායයන්හි ශ්‍රී ලාංකික ප්‍රේෂණයන් නිෂ්කාෂණ ප්‍රමාදයන් අවම කිරීමට හැකිවිය. තුර්කියෙහි ශ්‍රී ලාංකික වෙළඳාම ප්‍රවර්ධනය කිරීම පිණිස දූත මණ්ඩලය විසින් පහත දැක්වෙන ක්‍රියා මාර්ගයන් ගන්නා ලදී. 2019 සැප්තැම්බර් මාසයේදී පවත්වන ලද ලෝක ආහාර ඉස්තාන්බුල් ප්‍රදර්ශනයට, ශ්‍රී ලංකා අපනයන සමාගම් 07 ක් සමග සහභාගිවී, සහභාගීවන්නන් සඳහා ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට රැස්වීම් සංවිධානය කෙරිණ; ව්‍යාපාර මණ්ඩලය "තුර්කිය- ශ්‍රී ලංකා ව්‍යාපාර කවුන්සිලය යළිත් පුනරුදයට භාජනය කර, තුර්කියේ විදේශ ආර්ථික සංවර්ධන මණ්ඩලය යටතේ සාමාජිකයින් සංඛ්‍යාව වැඩිකිරීම; (අළුතින් සාමාජිකයින් 04 දෙනෙකු) 2019 සැප්තැම්බර් මාසයේදී, එවකට කර්මාන්ත සහ වාණිජ නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ සහභාගිත්වය ඇතිව, 88 දෙනෙකු ඉස්මිර ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වීම, තුර්කියේ ඉස්තාන්බුල්, ඩෙනිසලි, එස්කිෂර්, මනසා, රයිස්, ට්‍රැබිසෝන්, ඉස්මීර් වැනි නගරවල ව්‍යාපාරික පද්ධතිකරණය ආරම්භ කර, වෙළඳ/ආයෝජන ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම,රේගු සහයෝගිතාව, ද්විත්ව බදුකරණය, ආයෝජන ප්‍රවර්ධනය, කෘෂිකර්ම සහයෝගිතාව, ප්‍රමිතිකරණය, වැනි ක්ෂේත්‍රයන්හි ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් සැකසීම කඩිනමින් අවසන් කර 2020 මුල් භාගයේදී අත්සන් තැබීමට පියවර ගැනීම, කුඩා හා මධ්‍යම ව්‍යාපාර ප්‍රවර්ධන නියෝජිතායතන අතර සහයෝගිතාවය, වෙළඳ මණ්ඩල, අදාල රාජ්‍ය නියොජිතායතන සහ ව්‍යාපාරික ප්‍රජාව අතර ක්‍රමික අන්තර්ක්‍රියා.

**ආයෝජන**

- 2010 සිට 2019 දක්වා ශ්‍රී ලංකාවේ සමස්ත තුර්කි ආයෝජනය ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 2.91ක් වන අතර, නව ආයෝජන වාර්තා වී ඇත. කෙසේවුවද, ශ්‍රී ලංකාවේ ආයෝජන ලැදියාවන් ප්‍රවර්ධනය කිරීමට දූත මණ්ඩලය කටයුතු ආරම්භ කර ඇත. නිෂේධාත්මක ප්‍රවණතාවයකට හේතුව වශයෙන් දක්විය හැක්කේ, ද්විත්ව බදුකරණය ඉවත් කිරීමක් නොතිබීම සහ ආදායම සහ දේපළ මත බදු මග හැරීම සහ අපනයන ප්‍රවර්ධනයන් නොමැති කමයි.

**යුක්‍රේනය**

**සංචාරක**

- යුක්‍රේනයේ සිට සංචාරකයින්ගේ පැමිණීමේ අඩුවීම ප්‍රතිශතයක් වශයෙන් 4% ක් ලෙස වාර්තාවී ඇත. (2018 වසරේදී 36,515 ක වූ එය 2019 දී 35,051 කි) කෙසේ වුවද, සංචාරක පැමිණීම වැඩි කිරීම පිණිස පහත දැක්වෙන ප්‍රධානතම ක්‍රියාකාරකම් සිදු කර ඇත. ශ්‍රී ලාංකික චාරිකා වෙළඳ සමාගම් 05 ක සහභාගිත්වයෙන්, 2019 මාර්තු මාසයේදී යුක්‍රේන ජාත්‍යන්තර චාරිකා සහ සංචාර ප්‍රදර්ශනයේ 25 වන සංස්කරණයට සහභාගී වීම සංවිධානය කර, ප්‍රසිද්ධ යුක්‍රේන ක්‍රියාකාරීන් හා සමඟ ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට රැස්වීම් සංවිධානය කරන ලදී. කැපී පෙනෙන චාරිකා, වෙළඳ, ගුවන් සේවා සමාගම් සහ සංචාර නියෝජිතායතන සම්මේලන සමඟ ක්‍රමික අන්තර්ක්‍රියා සංවිධානය කෙරිණ.

**වෙළඳාම**

- යුක්‍රේනයට ශ්‍රී ලංකා අපනයනය 8.3% කින් වැඩිවී ඇත. (ඇ.ඒ.ජ.ඩොලර් මිලයන 25.26 සිට 27.36 දක්වා) දූත මණ්ඩලයේ සක්‍රීය ප්‍රයත්නයන් නිසා, වෙළඳ සහ ආර්ථික සහයෝගිතාවය මත අන්තර්-රාජ්‍ය ඒකාබද්ධ කොමිසමක් ස්ථාපිත කිරීමට ගිවිසුමකට එළඹීමට සහ ද්විත්ව බදුකරණය සහ ආදායම සහ දේපළ මත බදු නොගෙවීම වළක්වාලීමට එකඟවීම මත ගිවිසුමකට එළඹීමට තුර්කි බලධාරීන් කැමැත්ත ප්‍රකාශ කර ඇත. යුක්‍රේනයේ ශ්‍රී ලාංකික වෙලඳ ලැදියාවන් ප්‍රවර්ධනය සඳහා දූත මණ්ඩලය නිරන්තරයෙන් පෞද්ගලික අංශය හා රාජ්‍ය නිලධාරීන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කරයි.

**ආයෝජන**

- යුක්‍රේනයෙන් ශ්‍රී ලංකාවේ නව ආයෝජන වාර්තා වී නැත. මූලික හේතුව වශයෙන් දැක්විය හැක්කේ ද්විත්ව බදුකරණය නොවැළැක්වීමත්, ආදායම, දේපළ හෝ ආයෝජන මත බදු ගෙවීම පැහැර හැරීම නොවැළැක්වීමත්ය. එම නිසා, වෙළඳ සහ ආර්ථික සහයෝගිතාවය මත ඒකාබද්ධ කොමිසමක් ස්ථාපිත කිරීම සඳහා ගිවිසුම සහ ද්විත්ව බදුකරණය හා ආදායම, දේපළ හෝ ආයෝජන මත බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීමේ ගිවිසුමත් අත්සන් කිරීම කඩිනම් කිරීම කළයුතුවෙයි.

**ජෝර්ජියාව**

**සංචාරක**

- ජෝර්ජියාවේ සිට ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීම 18% කින් අඩු වී ඇත (2018 දී 697 ක් ද, 2019 දී 565 ක්ද වාර්තා වී ඇත). ශ්‍රී ලංකාව ජෝර්ජියාවේ ප්‍රවර්ධනය කිරීම පිණිස, චාරිකා, වෙළඳ සමාගම, චාරිකා නියෝජිතායතනයන්, ගුවන් සේවා සහ චාරිකා නියෝජිතායතන සංගම් සමඟ ක්‍රමික අන්තර්ක්‍රියා සිදු කරනු ලැබීය.

**වෙළඳාම**

- තුර්කිය සහ යුක්‍රේනය හා සංසන්දනාත්මකව සළකා බැලීමේදී, ශ්‍රී ලංකාව සහ ජෝර්ජියාව

අතර වෙළඳ, අපනයන සහ ආනයන සැළකිය යුතු ලෙස අවම මට්ටමක පවතී. 2018 වසර හා සසඳා බැලීමෙදී, ජෝර්ජියාවට ශ්‍රී ලංකා අපනයනයන් 10% කින් අඩු වී ඇත. ඇ.ඒ.ජ.ඩොලර් මිලයන 5.10 සිට 4.58 දක්වා) ද්විපාර්ශ්වික ආර්ථික සබඳතාවයන් වැඩි කිරීම පිණිස තානාපතිතුමා සහ ජෝර්ජියානු ජනාධිපතිතුමන් අතර විස්තරාත්මක සාකච්ඡා පවත්වන ලද අතර, දෙරට අතර වෙළඳාම වර්ධනය කිරීමේ සහයෝගිතාවය සඳහා යාන්ත්‍රණයක් විමසා බැලීමට තීරණය විය. තවද, සම්භාව්‍යතාවයකින් යුත් විශේෂිත අංශ සහ නිෂ්පාදන හඳුනාගැනීම පිණිස වෙළඳ සංවර්ධන හා ජාත්‍යන්තර ආර්ථික සබඳතා සහ ව්‍යාපාර අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, වෙළඳ මණ්ඩලවල සභාපතිවරුන්, ප්‍රමුඛ ජෝර්ජියානු ආනයනකයින් සමග ද්විපාර්ශ්වික සාකච්ඡා සිදු කරනු ලැබීය. දූත මණ්ඩලය නිරන්තරයෙන් පෞද්ගලික අංශය, රාජ්‍ය නිලධාරීන් හා සමග ජෝර්ජියාවේ ශ්‍රී ලාංකික වෙළඳාම ප්‍රවර්ධනයෙහි නියැලී සිටී.

**ආයෝජන**

- ජෝර්ජියානු රජය ජෝර්ජියාව හැර වෙනත් රාජ්‍යයන්හි ආයෝජන කිරීම අධෛර්යමත් කරවන හෙයින්, ජෝර්ජියාවෙන් ශ්‍රී ලංකාවේ ආයෝජන වාර්තා වී නැත. කෙසේවුවද, අදාල බලධාරීන් සහ පෞද්ගලික අංශය සමග ශ්‍රී ලංකා ලැදියාවන් ප්‍රවර්ධනය සඳහා දූත මණ්ඩලය අඛණ්ඩව ක්‍රියා කරමින් සිටී.
-

**එක්සත් රාජධානිය**

**ද්විපාර්ශ්වික සබඳතා**

- සමාලෝචිත කාල වකවානුව තුළ, මහ කොමසාරිස් කාර්යාලය එක්සත් රාජධානිය සමග සුහද සබඳතා පවත්වා ගන්නා ලදී.
- සමාලෝචිත කාලවකවානුව තුළ එක්සත් රාජධානියේ, බ්‍රෙක්සිට් ඇතුළු දේශපාලන සහ ආර්ථික ක්ෂේත්‍රයන්හි අළුතින් මතුවන තත්ත්වයන් පිළිබඳව සමීපස්ථ අවධානයෙන් සිට, දේශපාලන වාර්තාවලට වලට අමතරව කොළඹ අදාල බලධාරීන්ට අළුතින් සැකසූ දත්ත/සංක්ෂිප්ත විස්තර වාර්තා ක්‍රමිකව එවීමට පියවර ගන්නා ලදී.

**ශ්‍රී ලංකා දූත පිරිස් විසින් එක්සත් රාජධානියේ ඉහළපෙළ චාරිකා**

- පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු අජිත් පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන්, ආංශික අධීක්ෂණ කමිටුවෙහි සාමාජිකයින් 08 දෙනෙක් සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකු පුහුණු සැසියක් සඳහා 2019 ජූලි මස 2-4 දක්වා එක්සත් රාජධානියෙහි විසැරියක නිරත වූහ.
- 2019 ජූලි මස 10-11,එක්සත් රාජධානිය සහ කැනඩාව සම- සත්කාරය දක්වන ලද, ලන්ඩන් පුරවරයේ පැවැත්වුණ මාධ්‍ය නිදහස සඳහා වූ ගෝලීය සම්මන්ත්‍රණයට සහභාගි වීම පිණිස විදේශ කටයුතු / ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් දූත පිරිසක් එක්සත් රාජධානියට පැමිණියාහ.
- කථානායක, ගරු කරු ජයසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් පාර්ලිමේන්තු දූත පිරිසක් 2019 ජනවාරි මස 07-09 සහ 12-15 එක්සත් රාජධානියේ චාරිකාවක නිරත වූහ. මෙම චාරිකාවේදී, කථානායකවරයා, විදේශ සහ පොදු රාජ්‍ය මණ්ඩලීය කාර්යාලයේදී ආසියා හා ශාන්තිකර රාජ්‍ය අමාත්‍යවරයා හමුවුණ අතර, සාමි මණ්ඩලය සහ පොදු මන්ත්‍රණ සභාව ඇමතීය.
- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, ගරු මංගල සමරවීර මහතා 2019 ජනවාරි මස 18-21 එක්සත් රාජධානියේ නිරත වූ චාරිකාවේදී, විදේශ හා පොදු රාජ්‍ය මණ්ඩලීය කාර්යාලයේ, පොදු රාජ්‍ය මණඩලය සහ එක්සත් ජාතීන් සඳහා වන රාජ්‍ය අමාත්‍ය, විම්බල්ඩන්හි, අහමඩ් සාමිවරයා සහ පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම්වරයා හමුවිය.
- අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය, විජයකලා මහේෂ්වරන් මහත්මිය 2019 ජනවාරි මස 20-24, ලන්ඩන්හි, ලෝක අධ්‍යපන සංසදයට සහ පොදු රාජ්‍ය මණ්ඩලීය අධ්‍යාපන අමාත්‍යාංශයීය

ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමට සහභාගීවීම පිණිස එක්සත් රාජධානියේ චාරිකාවක නිරත වූවාය.

**එක්සත් රාජධානියේ දූත පිරිස් විසින් ශ්‍රී ලංකාවේ ඉහළ පෙළ චාරිකා**

- ආරක්ෂක හා ආර්ථික අමාත්‍ය, ගරු බෙන් වොලස් මහතා, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු, 2019 මැයි මස 03 වන දින ශ්‍රී ලංකාවට පැමිණි අතර, චාරිකාවේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා හමුවිය.
- දකුණු ආසියා, පොදු රාජ්‍ය මණ්ඩලය සහ එක්සත් ජාතීන් සඳහා වන රාජ්‍ය අමාත්‍ය, විම්බල්ඩන්හි, අහමඩ් සාමිවරයා 2019 ඔක්තෝබර් මස 01-03 දක්වා, ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදී, විදේශ කටයුතු අමාත්‍ය, ගරු තිලක් මාරපන සහ දමිළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී, ආර්. සම්බන්ධන් යන මහත්වරුන් සහ ආගමික නායකයින් සමුවිය.

**පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් වෙත තොරතුරු සැපයීම**

- දූත මණ්ඩලය, ශ්‍රී ලංකාව සඳහා වන සර්ව-පාක්ෂික පාර්ලිමේන්තු කණ්ඩායමෙහි සාමාජිකයන් ඇතුළු පොදු මන්ත්‍රණ සභාවෙහි සහ සාමි මණ්ඩල යන දෙකෙහිම එක්සත් රාජධානි පාර්ලිමේන්තු සාමාජිකයින්ද, විදේශ කටයුතු සහ පොදු රාජ්‍ය මණ්ඩලීය කාර්යාලයෙහි, දකුණු ආසියා අංශ නිලධාරීන්ද සමග කාර්යාලීය ගනුදෙනුවල නිරත විය.

**එක්සත් රාජධානියෙහි ප්‍රධාන දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති කෙරෙහි අවධානය**

- දූත මණ්ඩලය, 2019 වර්ෂයේ පැවැති කම්කරු පක්ෂ සහ කොන්සවේටිව් පක්ෂ සම්මන්ත්‍රණවලට සහභාගී වී අමත්‍යාංශයට වාර්තා කර සිටින ලදී.
- මහ කොමසාරිස් කාර්යාලය, විවිධ ශ්‍රී ලාංකික ඩයස්පෝරා ප්‍රජා සංවිධාන සහ වෘත්තීයමය සංවිධාන සමග නිල ගනුදෙනුවල නිරතවී, අන්තර් ක්‍රියා සිදු කරන ලදී.

**බහුපාර්ශ්වීය සබඳතා**

- විදේශ සහ පොදු රාජ්‍ය මණ්ඩලයීය කාර්යාලය මෙන්ම, බහුපාර්ශ්වීය ගැටළු මත සහයෝගිතාවය සම්බන්ධයෙන් එක්සත් රාජධානියෙහි ස්ථානගත, ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය සහ පොදු රාජ්‍ය මණ්ඩලයීය මහ ලේකම් කාර්යාලය වැනි බහුපාර්ශ්වීය ආයතන සමඟද සම්බන්ධීකරණයෙහි යෙදුණේය.

**පොදු රාජ්‍ය මණ්ඩලය**

**චෝගම් 2020**

- මහ කොමසාරිස් කාර්යාලය, දැනට කල්තබා ඇති, 2020 පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක රැස්වීමේ ප්‍රධාන විධායක සමග සහ රුවන්ඩා පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක රැස්වීම් කාර්යාලයේ සහ කගාලි හි, පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක රැස්වීම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලයෙහි නිලධාරීන් සමග අඛණ්ඩ සම්බන්ධීකරණය පවත්වා ගෙනයන ලදී.

**කඩොලාන ප්‍රතිසංස්කරණය සඳහා වන පොදුරාජ්‍ය මණ්ඩලීය සමුද්‍රාශිත ප්‍රඥප්ති ක්‍රියාකාරිත්ව කණ්ඩායම**

- පොදු රාජ්‍ය මණ්ඩලය සහ යටෝක්ත ක්‍රියාකාරිත්ව කණ්ඩායමේ සාමාජික රාජ්‍යයන් සමඟද දූත මණ්ඩලය විසින් සම්බන්ධතාවය පවත්වා ගෙන යන ලදී. කඩොලාන පරිසර පද්ධති සහ ජීවනෝපායෙහි ලා ජගත් රාජ්‍යයක් වන හෙයින්, කඩොලාන පරිසර පද්ධති සහ ජීවනෝපාය සංවිධානයෙහි සාමාජික රටවල සහභාගිත්වයෙන් ඉතාම හොඳ පරිචයන් බෙදා හදා ගැනීම පිණිස 2019 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාවේදී යම් ඉසව්වක් සංවිධානය කිරීම පිණිස දූතමණ්ඩලය විසින් අමාත්‍යාංශයට සහාය පළ කරන ලදුව, ක්‍රියාකාරී සැලැස්මක් සහ විෂයය නිර්දේශ මාලාව සකස් කරන ලදී.

**පොදුරාජ්‍ය මණ්ඩලයීය විදේශ කටයුතු රැස්වීම**

- 2019 ජූලි මස 10 වන ලන්ඩන් නුවර පොදු රාජ්‍ය මණ්ඩලයීය මහ ලේකම් කාර්යාලයේදී පවත්වන ලද 19 වන පොදු රාජ්‍ය මණ්ඩලයීය විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ රැස්වීමට විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා සහභාගී විය.

**කොළඹදී පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලයීය නීති අමාත්‍යවරුන්ගේ රැස්වීම**

- යථෝක්ත රැස්වීම 2019 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ සංවිධානය කිරීම පිණිස දූත මණ්ඩලය විසින් පොදු රාජ්‍ය මණ්ඩලයීය මහලේකම් කාර්යාලය සහ අධිකරණ අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණයෙහි නියැලිණ.

**ලන්ඩන් නුවර පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලයීය වෙළඳ අමාත්‍යවරුන්ගේ රැස්වීම**

- 2019 ඔක්තෝබර් මස මස 10 වන දින ලන්ඩන් නුවර පවත්වන ලදපොදු රාජ්‍ය මණ්ඩලයීය වෙළඳ අමාත්‍යවරුන්ගේ රැස්වීමට සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලංකා දූත පිරිසේ සහභාගිත්වයට දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී.

**පොදු රාජ්‍ය මණ්ඩලයීය මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම**

- මැතිවරණ කොමිෂන් සභාවේ ආරාධනය මත, ශ්‍රී ලංකාවේ ජනාධිපති මැතිවරණය නිරීක්ෂණය කිරීම පිණිස ඝානාවේ හිටපු අභ්‍යන්තර කටයුතු අමාත්‍ය ප්‍රොස්පර් බානි මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් නිරීක්ෂණ කණ්ඩායමක් 2019 නොවැම්බර් මස 10-21 දක්වා ශ්‍රී ලංකාවේ චාරිකාවක යෙදීමට දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී.

**ප්‍රචණ්ඩකාරී අන්තවාදය වැළැක්වීමේ කලාපීය වැඩමුළුව.**

- 2019 ජූලි මාසයේදී පවත්වන ලද 'අධ්‍යාපන ඔස්සේ ප්‍රචණ්ඩකාරී අන්තවාදය වැළැක්වීම් පිළිබඳ කලාපීය ධාරිතා වර්ධන වැඩමුළුවක්' මහකොමසාරිස් කාර්යාලය විසින් විසින් පොදු රාජ්‍ය මණ්ඩලය සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය සමග එක්ව සුසාධ්‍යකරණය කෙරිණ.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

**රටවල් අතර වෙළඳාම**

**සංවිධානය කරන ලද වෙළඳ/ආයෝජන ප්‍රවර්ධන ඉසව්**

- ශ්‍රී ලංකාව 2019 වසර සඳහා ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 998 ක අපනයන මිළක් සාක්ෂාත් කර ගන්නා ලදී. පසුගිය වර්ෂය හා සංසන්දනාත්මකව එය ශ්‍රී ලංකා අපනයනයන්ගේ 2% ක වැඩිවීමකි. 80% ක් රෙදි නිෂ්පාදන වන ඇඟලුම් වන අතර, ඊලඟට පාවහන්, රබර් නිමි නිෂ්පාදන, විද්‍යුත් හා විදුලි නිෂ්පාදන, ආහාරයට ගන්නා මත්ස්‍ය නිෂ්පාදන, තේ, පොල් ආශ්‍රිත නිෂ්පාදන ආදියයි. 2019 වසරේදී එක්සත් රාජධානි ආයෝජනය ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 157.30 ක් වූ අතර, පසුගිය වසර හා සංසන්දනාත්මකව 126% ක වැඩිවීමකි. වැඩිවීමට හේතු පාදකවූයේ දේපළ සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ලබා ගන්නා ලද විදේශීය ණයකි.
- 2019 සැප්තැම්බර් මස 02 දින, බ්‍රිතාන්‍ය- ශ්‍රී ලාංකික ව්‍යාපාර ප්‍රජාව සඳහා වූ "ශ්‍රී ලංකාවේ ආයෝජන සහ වෙළඳ ඉඩප්‍රස්ථා" වටමේස සමර්පණය වූ කළී, මෙතෙක් දූත මණ්ඩලය හා සමග ගනුදෙනුවක් නොතිබූ ඩයස්පෝරාව සමග සම්බන්ධතා ගොඩ නැගීමට හේතු පාදක වූ විහිදුම් වැඩ සටහනකි. 2019 ඔක්තෝබර් මස 09 වන දින, ලන්ඩන් කොටස් වෙළඳපොළෙහි පවත්වන ලදුව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ඖෂධ, මුල්‍ය සේවා, ඇඟලුම්, අධ්‍යාපන හා වෘත්තීය පුහුණු සහ අගය එකතු කරන ලද නිෂ්පාදනයන් යන ක්ෂේත්‍රයන්හි නියැලෙන 70 කට අධික එක්සත් රාජධානි සමාගම්වල සහභාගිත්වයෙන් පැවති "ශ්‍රී ලංකා ආයෝජන සංසදය" සහ 2019 ඔක්තෝබර් මස 10 වන දින මැන්චෙස්ටර් පුරවරයේ පැවැති " ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේද ප්‍රවර්ධන වටමේස සාකච්ඡාව" මෙම දූත

මණ්ඩලයේ වාණිජ අංශය විසින් සංවිධානය කරන ලද ප්‍රධානතම ඉසව්වලින් කිහිපයකි. එක්සත් රාජධානියෙහි ශ්‍රී ලංකා ප්‍රජාව අතර ශ්‍රී ලාංකික ඉඩකඩම් දේපළ වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීම පිණිස 2019 ජූනි මස 27 වන ලන්ඩනයේදී ඉසව්වක් සංවිධානය කිරීමට දූත මණ්ඩලය විසින් පර්යේෂණ බුද්ධි ඒකකයට සහාය වන ලද අතර, සංචාරක ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ජින් සහ අරක්කු රසබැලීමේ ඉසව්වක් මහ කොමසාරිස් කාර්යාලයෙහි සංවිධානය කිරීමට එක්සත් රාජධානියේ 'ශ්‍රී ලංකාවේ මිත්‍රයෝ" සන්ධානයට සහාය වන ලදී.

- වාණිජ අංශය විසින්, බොහෝ මිළදී ගන්නන් සහ සම්භාව්‍ය ආයෝජකයින් හමුවී, එක්සත් රාජධානි සහ ශ්‍රී ලාංකික යන දෙපාර්ශ්වයේම වෙළඳ විමසීම් 200 කට අධික සංඛ්‍යාවකට සේවා කර, ශ්‍රී ලාංකික අපනයනකරුවන් විශාල සංඛ්‍යාවක් එක්සත් රාජධානියේ සම්භාව්‍ය මිළදී ගන්නන් වෙත සම්බන්ධ කරවා දෙන ලදී. එසේම, ශ්‍රී ලංකාවෙහි ආයෝජනය කිරීමට උනන්දුවක් දක්වන එක්සත් රාජධානි පාර්ශ්වයන්ගේ ආයෝජන යෝජනා විශාල සංඛ්‍යාවක් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලදී.
- තවද, 2019 මාර්තු මස 17-20 ලන්ඩන් නුවර එක්සෙල්හි පවත්වන ලද 2019-ජාත්‍යන්තර ආහාරපාන ඉසව්වෙහි සහ ලන්ඩන් නුවර ඔලිම්පියාහි පවත්වන ලද 'ජාත්‍යන්තර සවර්ණාභරණී' ඉසව්වෙහි සහභාගිත්වය සුසාධ්‍යකරණය කරන ලද අතර, රාජතාන්ත්‍රික 71 වන නිදහස් දින සමරු උළෙලට සමගාමීව ශ්‍රී ලංකා වෙළඳ ප්‍රවර්ධන ඉසව්වක්ද සංවිධනය කරන ලදී.
- විශේෂයෙන්ම, එක්සත් රාජධානිය යුරෝපා සංගමය අත්හැර යන මෙම තත්ත්වය යටතේ, ද්විපාර්ශ්වීය වෙළඳ සහ ආයෝජන බැඳීම් ශක්තිමත් කරලීම සාකච්ඡාවට භාජනය කිරීම පිණිස, සංචාරයෙහි යෙදෙන්නාවූ ශ්‍රී ලාංකික අමාත්‍යවරුන්ට සහ ප්‍රභූන්ට ස්වකීය එක්සත් රාජධානි ප්‍රතිපූරකයින් හා රැස්වීම් සංවිධානය කරන ලද අතර, පශ්චාත් බ්‍රෙක්සිට් වෙළඳ සබඳතා සම්බන්ධයෙන් එක්සත් රාජධානියෙහි ජාත්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව හා සමග සංවාදයක්ද ගොඩනගා, ඇතිවන නව ප්‍රවණතාව සම්බන්ධයෙන් අගනුවරට වාර්තා කිරීම/ යාවත්කාලීන කිරීම සිදු කරනු ලැබීය.
- පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් කාර්යාලය, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය, ජාත්‍යන්තර තෙල් අපවිත්‍රණ වන්දි අරමුදල සහ ජාත්‍යන්තර ජංගම චන්ද්‍රිකා සංවිධානය ආදී සංවිධානවල පර්ෂදයන්හි සහ රැස්වීම්වල ශ්‍රී ලංකා සහභාගිත්වය/ නියෝජනය සුසාධ්‍යකරණය වාණිජ අංශය විසින් ඉටු කරන ලදී.

**සංචාරක ප්‍රවර්ධනය**

- 2019 වසරේදී එක්සත් රාජධානි සංචාරකයින් 198,776 දෙනෙකු ශ්‍රී ලංකාවට පැමිණි අතර, 2018 වර්ෂය හා සාපේක්ෂව එය එක්සත් රාජධානියේ තථ්‍ය සංචාරක ආගමනයේ 21.8% ක බිඳවැටීමකි. මෙයට ප්‍රධානතම හේතුවක් වූයේ 2019 අප්‍රියෙල් මස පාස්කු ඉරිදා ප්‍රහාරයන්ය. මෙම සිද්ධියට තදනන්තරව, එක්සත් රාජධානි රජය විසින් පනවන ලද සංචාරක සීමා කිරීම් ලිහිල් කර ගැනීමේ ප්‍රයත්නයක යෙදෙමින් මහ කොමසාරිස් කාර්යාලය විසින් එක්සත් රාජධානි රජය වෙත නියෝජනයන් කරන ලද අතර, එක්සත් රාජධානියේ සංචාරක සමාගම් සමගද නිමගනයන්හි යෙදුණි. එක්සත් රාජධානි රජය 2020 ජූනි මස 06 වන දින සංචාරක උපදෙස් ලිහිල් කරන ලදී.
- අහිතකර චාරිකා උපදෙස් ලිහිල් කළ වහාම, සංචාරක ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම සළකා බලා, ලන්ඩනයේ, ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය 2019 ජූලි මස 16 වන දින, ලන්ඩනයේදී "ශ්‍රී ලංකා පුනරුදය" සංචාරක දියත් කිරීම සුසාධ්‍යකරණය කරන ලද අතර, එය ස්වාධීන චාරිකා මෙහෙයවන්නන්ගේ සංගමයේ සහ එහි සාමාජිකයින් වන සංචාරක කලාගාරය සහ පළපුරුදු චාරිකා කණ්ඩායමේ සම්බන්ධීකරණයෙන් සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහයෝගයෙන් සාක්ෂාත් කර ගන්නා ලද්දකි.
- 2019 ජනවාරි 31- පෙබරවාරි 02 දක්වා, ලන්ඩනයේදී. 'ඩෙස්ටිනේෂන්ස් ලන්ඩන් චාරිකා ප්‍රදර්ශනය සහ 2019 මාර්තු මස 01-03 දක්වා, ජාතික විවාහ මංගල්‍ය ප්‍රදර්ශනය- බර්මිංහැම් ප්‍රදර්ශනය සඳහා වාණිජ අංශයේ සහයෝගය ලද අතර, 2019- ලෝක චාරිකා වෙළඳපොළ ප්‍රදර්ශනයේදී, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සහභාගිත්වයේ කොටසක් ලෙස, හිටපු ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ නායක සහ මෙල්බෝර්න් ක්‍රිකට් සමාජයෙහි සභාපති, කුමාර් සංගක්කාර මහතාගේ ගුවන් විදුලි සම්මුඛ සාකච්ඡාව සහ 2019 නොවැම්බර් මස 04-06 දක්වා ලන්ඩන්හි,

ලෝක චාරිකා වෙළඳපොළ ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා සහභාගිත්වය වාණිජ අංශය විසින් සුසාධ්‍යකරණය විය.

- ලෝක චාරිකා වෙළඳපොල ඉතිහාසයෙහි ප්‍රථම වරට, ශ්‍රී ලංකාව සුවතාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කෙරිණ. දූත මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා එක්ව, සුවතාව සමුද්ග ප්‍රවර්ධනයයෙහි නියැලුණ සමාගම් 05 ක සහභාගිත්වය සුසාධ්‍යකරණය කෙරිණ.

**සංස්කෘතික සබඳතා**

- ශ්‍රී ලාංකික සංස්කෘතිය එක්සත් රාජධානියෙහි ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, බෞද්ධ විහාරස්ථාන සහ අනෙකුත් ආගමික ආයතනයන් සහ සමිති සමාගම් සමග සම්බන්ධතාවයන් පවත්වා ගෙනයාම දූත මණ්ඩලය විසින් අඛණ්ඩව සිදු කරන ලදී.
- දූත මණ්ඩලය, 2019 මැයි මස 16-17 පිරිත් සජ්ජායනය සහ හීල දානය ද, 2019 මැයි මස 22 දින වාර්ෂික ඉෆ්තාර් උත්සවයද, 2019 ඔක්තෝබර් මස 25 වන දින දීපවාලි උත්සවයද, 2019 දෙසැම්බර් මස 16 වන දින වාර්ෂික නත්තල් උත්සවයද, මහ කොමසාරිස් කාර්යාලයේ සංවිධානය කරන ලදී.
- ශ්‍රී ලංකාවෙන් රැගෙන ගොස් ලන්ඩනයේ බ්‍රිතාන්‍ය පුස්තකාලයෙහි තැන්පත් කර ඇති ත්‍රිපිටක අත්පිටපත් ඩිජිටල්කරණයෙහි ලා ඉදිරි සහයෝගිත්වය සම්බන්ධයෙන්, දූත මණ්ඩලය බ්‍රිතාන්‍ය පුස්තකාල බලධාරීන් හා සාකච්ඡා කරන ලදී.

**මාධ්‍ය නිමග්නයන් සහ සමාජ හා වෙබ් මාධ්‍ය හරහා ධනාත්මක ප්‍රතිරූප ගොඩනැගීම**

- ඉසව්, වෙළඳ, ආයෝජන, සංස්කෘතිය සහ සංචාරක කර්මාන්තය පිළිබඳ තොරතුරු, කොන්සියුලර් තොරතුරු සහ ශ්‍රී ලංකාවේ නවතම වැදගත් තත්ත්වයන් පිළිබඳ තොරතුරු දූත මණ්ඩලය විසින් ස්වකීය සමාජ මාධ්‍ය වාර්තාවල ප්‍රචලිත කෙරේ. 2019 වර්ෂයේදී, දූත මණ්ඩලය විසින් පණිවුඩ 341 ක් ට්විටර් යටතේද, ඇතුළත් කිරීම්/බෙදා ගැනීම් 139 ෆේස්බුක් හිද, වෙබ් පිටුවෙහි උඩුගත කිරීම් 100 ක්ද ප්‍රචාරණයට එක් කර ඇත.
- ශ්‍රී ලංකාවට අදාල එක්සත් රාජධානි මාධ්‍ය වාර්තාකරණය (ඒ.රා. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය) දිනපතා දූත මණ්ඩල අධීක්ෂණයට භාජනය කෙරෙන අතර, එදිනෙදා මාධ්‍ය වාර්තා අමාත්‍යාංශයට මෙන්ම අනෙකුත් අදාල දූත මණ්ඩලවලට සහ යෝග්‍ය පරිදි රේඛීය නියෝජිතායතනවලට යවනු ලබයි.

**අධ්‍යාපනික සබඳතා**

- දූත මණ්ඩලය, ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර, ද්විපාර්ශ්වීය අධ්‍යාපනික සබඳතා වැඩිදියුණු කිරීමේ වැදගත්කම සැළකිල්ලට ගෙන, එක්සත් රාජධානියේ, අධ්‍යාපනික ආයතන සහ බලධාරීන් විසින් සංවිධානය කරන ලද විවිධ අධ්‍යාපනික ඉසව්, ප්‍රදර්ශන හා රැස්වීම්වලට සහභාගී විය.
- ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් අතර, ස්වකීය උසස් අධ්‍යාපනය හැදෑරීම පිණිස අතිශයන් ජනප්‍රියතම ගමනාන්තය එක්සත් රාජධානිය වන හෙයින්, එක්සත් රාජධානිය තුළ විශාල ශිෂ්‍ය ප්‍රජාවක් ඇත. දූත මණ්ඩලය, විවිධ කොටස්කරුවන්ගේ සහයෝගයෙන්, එක්සත් රාජධානියේ ශ්‍රී ලාංකික ශිෂ්‍ය ප්‍රජාවට සහාය වීම පිණිස පියවර ගෙන ඇත.
- වුල්වර්හැම්ප්ටන් සහ ලව්බරෝ විශ්ව විද්‍යාලවල බලධාරීන් සමග පැවැති සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් දෙපළකට ශිෂ්‍යත්ව ලබා ගැනීමට ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සමත්විය.

**ආරක්ෂක සබඳතා**

- ආරක්ෂක සබඳතා මත නහ්‍යයනය වන්නේ එක්සත් රාජධානිය සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වීය ආරක්ෂක සබඳතා ප්‍රවර්ධනය සහ වැඩිදියුණු කර, එක්සත් රාජධානියේ ආරක්ෂක බලධාරීන් සමග නිමග්නවීම ඔස්සේ බ්‍රිතාන්‍ය රෙජිමේන්තු හා සමග අපගේ අනුබද්ධතා වැඩිදියුණු කර ගැනීමයි. මෙය සාක්ෂාත් කර ගන්නා ලද්දේ පුහුණු අවස්ථා,

පාඨමාලා සහ ක්ෂේත්‍ර අභ්‍යාස, ආරක්ෂක චාරිකා සහ සම්මන්ත්‍රණ හුවමාරුවෙනි. ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා විසින් පවත්වන ලද පුහුණු/ඉසව් ප්‍රවර්ධනයද ක්‍රියාත්මක කරන ලද්දේ මෙම දැනුම බෙදාගැනීමේ ක්‍රියාදාමයේ කොටසක් වශයෙනි.

- සමාලෝචිත කාලවකවානුව තුළ ආරක්ෂක අමාත්‍යාංශයේ දකුණු ආසියා අංශය සමග මාසික රැස්වීම පවත්වන ලද අතර, එක්සත් රාජධානියෙහි ශ්‍රී ලාංකිකයින් සඳහා පහත දැක්වෙන පරිදි පුහුණු අවස්ථා ලබා ගැනීමට හැකිවිය.

| | | | |
|---|---|---|---|
| I. | 2018 ශ්‍රී ලංකා යුදහමුදාව | - | 05 |
| | ශ්‍රී ලංකා නාවික හමුදාව | - | 10 |
| | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | - | 04 |
| | එකතුව | - | 19 |
| II. | 2019 ශ්‍රී ලංකා යුදහමුදාව | - | 12 |
| | ශ්‍රී ලංකා නාවික හමුදාව | - | 07 |
| | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | - | 12 |
| | එකතුව | - | 31 |

III. මෙයට අමතරව, නිලධාරීන් 04 ක් සමුළු/චාරිකා සඳහා එක්සත් රාජධානියට පැමිණියහ.

- 2019 වසරේදී, ශ්‍රී ලංකා යුධ හමුදාව ප්‍රථම වරට එක්සසයිස් කෙම්බ්‍රියන් පැට්‍රල් නමින් දන්නා හමුදා තරඟයට ඉදිරිපත් වන ලද අතර, හොඳින් තරඟ කළ ඔවුහු ලෝකඩ පදක්කම දිනා ගත්හ. රාජකීය නාවික හමුදාවෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ ගෝල් ඩයලොග් ඉසව්වට සහභාගී වූහ.
- කොළඹ ස්ථානගත බ්‍රිතාන්‍ය හමුදා විශේෂ බලධාරි, ශ්‍රී ලංකාවෙහි එක්සත් රාජධානි ආරක්ෂක වැඩ සටහන් ගණනාවකම පැවැත්වීය. සමාලෝචිත කාල වකවානුව තුළ ශ්‍රී ලංකාව විසින් ඉල්ලා සිටින ලද පාඨමාලා ගණනාවක්ම ලබා ගැනීමට ඔහුගේ සහාය ලැබුණි. ඔහු පහත දැක්වෙන වැඩ සටහන් ශ්‍රී ලංකාවේ පැවැත්වීය.

| | |
|---|---|
| විසැරි 2 | - ආරක්ෂක උපකරණ අලෙවි අධිකාරියේ සභාපති සහ එ.රා. අන්තර්ජාල ආරක්ෂණ තානාපති |
| නැව් විසැරි 1 | - එච්එම්එස් මොන්ට්‍රොස් නැව |
| අභ්‍යාස 2 | - එක්ස.බරසමා-2019. එක්ස් ස්පියර් ආපදා |
| කළමනාකරණ අභ්‍යාස පාඨමාලා 2 | - පුළුල් ආරක්ෂා සන්දර්භයෙහි ලා රැකවරණ කළමණාකරණය, සුවිශේෂී කලාප පාඨමාලාව |

**ශ්‍රී ලංකාවේ ධනාත්මක ප්‍රතිරූප ගෙඩනැගීම සහ එක්සත් රාජධානියෙහි එල්ටීටීඊ හිතවාදී ප්‍රචාරක ක්‍රියාකාරකම් විරෝධය**

- එල් ටී ටී ඊ කොඩිය සහ අනෙකුත් ලාංඡන එක්සත් රාජධානි භූමියෙහි ප්‍රදර්ශනය කිරීම ගැන සහ එය 2000 වසරේ එක්සත් රාජධානි ප්‍රති-ත්‍රස්ත පණත උල්ලංඝණය කරනු ලබන්නේ කෙසේද යන්න පෙන්වා දෙමින් විදේශ සහ පොදු රාජ්‍ය මණ්ඩලීය කාර්යාලයට සහ විදේශ ලේකම් කාර්යාලයට කරුණු දක්වන ලදී.
- ආරක්ෂාව සහ ආර්ථික අපරාධ රාජ්‍ය අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී, ශ්‍රීමත් බෙන් වොලස් මහතා 2019 මැයි මාසයේදී, මහකොමසාරිස්තුමා හමුවී 2000 වසරේ එක්සත් රාජධානි ප්‍රති-ත්‍රස්ත පණතට අවධානය යොමු කරමින්, එල්ටීටීඊ ප්‍රචාරක ක්‍රියාකාරකම් සහ කොඩිය භාවිතයට ගැනීම ගැන විස්තර සහිත ගොනුවක් ඉදිරිපත් කර සිටියේය.
- 2019 ජූලි මස 22 දින, ජ්‍යෙෂ්ඨ ජාතික සම්බන්ධීකාරක (ප්‍රති ත්‍රස්තවාදී නීතිය හා සාමය ආරක්ෂාව) සහ නියෝජ්‍ය සහකාර කොමසාරිස්, රාජ පොලිස් පදක්කම්ලාභී, ඩීන් හේඩන් මහතා හමුවී, එල්ටීටීඊ කොඩිය ගැන විස්තර ගොනුවක් භාරදී, එක්සත් රාජධානියේ එල්ටීටීඊ හිතවාදී සංවිධානවල ක්‍රියාකාරකම් ගැන විස්තර කරන ලදී.

- ලන්ඩනයේ එල්ටීටීඊ හිතවාදී ඩයස්පෝරා ක්‍රියාකාරකම්, දූත මණ්ඩලය විසින් අබණ්ඩව අධීක්ෂණය කර, කොළඹට වාර්තා කිරීම සිදු කෙරේ. 2019 වසරේදී, විරෝධතා 22ක්, අභ්‍යන්තර රැස්වීම්/ඉසව්/සමරු උත්සව 30 ක්, පෙත්සම් හා ලිපි 05 ක් සහ චිත්‍රපට තිරගත කිරීම් 01 ක් ලන්ඩනයේ සහ එක්සත් රාජධානියේ සිදුව ඇත.
- එක්සත් රාජධානි ප්‍රති-ත්‍රස්ත පණත උල්ලංඝණය කරමින්, එල් ටී ටී ඊ ලාංඡන ප්‍රදර්ශනය සහ එල්ටීටීඊ හිතවාදී කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පැමිණිලි 16 කට අධික සඛ්‍යාවක් වසර තුළ නගර පොලිසිය වෙත ඉදිරිපත් කර ඇත.
- මහ කොමසාරිස් කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද පෙත්සමට වැඩිමනත්ව, එල්ටීටීඊ හිතවාදී ක්‍රියාකාරකම් සිදුවීම වළක්වාලීමට/ නවතා දැමීමට පොලිසියට සහ පළාත් පාලන බලධාරීන්ට පැමිණිලි කිරීමට ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහායද ලබා ගන්නා ලදී.
- එල්ටීටීඊ හිතවාදී ක්‍රියාකාරකම් ගැන එක්සත් රාජධානි ප්‍රති-ත්‍රස්ත පොලිස් නිලධාරීන් (එස්ඕ 15), මෙට්‍රෝ පොලිසිය සහ රාජතාන්ත්‍රික පොලිසිය වාර ගණනාවකදී හමුවී ඇත.

**එක්සත් රාජධානියේ රැඩිකල් මූලිකාංග ඇතුළු අන්තවාදී ක්‍රියාකාරකම් අධීක්ෂණය**

- ශ්‍රී ලංකාවට අදාල කරුණු කාරණා සම්බන්ධයෙන්, එක්සත් රාජධානියේ ප්‍රති ත්‍රස්ත පොලිසිය (එස්ඕ 15) සහ මෙට්‍රෝ පොලිසියේ, ජාත්‍යන්තර අපරාධ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සමග සම්බන්ධතා පවත්වා ගෙන යන ලදී. කෙසේවුවද, පෞද්ගලිකත්ව නීති සහ බ්‍රිතාන්‍ය බුද්ධි සේවා ක්‍රවේදයට විධිමත් ප්‍රතිතනයක් නෙමැතිකම යම් යම් තොරතුරු වෙත ප්‍රවේශ ලබා ගැනීම වළක්වාලයි.

**එක්සත් රාජධානියේ ප්‍රධානතම බුද්ධි මණ්ඩල සමග නිමග්නවීම**

- උපදේශක අමාත්‍ය/ ආරක්ෂාව, චැතම් හවුස් සහ රාජකීය එක්සත් සේවා ආයතනයේ සාමාජිකත්වය ලබා ගෙන, ජාත්‍යන්තර උපායමාර්ග අධ්‍යයන ආයතයෙහි සාමාජිකයෙකු ලෙස ලියාපදිංචි ඇත. ශ්‍රී ලංකාවට යොමුව/අදාලත්වය ඇති ලන්ඩන් ආර්ථික විද්‍යාලයේ සහ ලන්ඩන් කින්ස් විද්‍යාලයෙහි පවත්වන ලද ඉසව්වලට සහභාගී වී ඇති අතර, ප්‍රශ්ණ හා පිළිතුරු සැසිවලට සහභාගී වී ඇත.

# උතුරු ඇමරිකා අංශය

## උතුරු ඇමරිකා අංශය

### ඇමරිකා එක්සත් ජනපදය

1. **ද්විපාර්ශ්වික සබඳතා**

- එක්සත් ජනපද රාජ්‍ය ලේකම්ගේ ආරාධනයකට අනුව විදේශ කටයුතු අමාත්‍ය ගරු. තිලක් මාරපන මහතා 2019 මැයි 15 - 18 දක්වා එක්සත් ජනපදයේ සිය පළමු නිල සංචාරය සිදුකරන ලදී. විදේශ කටයුතු ලේකම් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක්ද ඔහු සමඟ එම සංචාරයට එක් විය.

- ගරු. අමාත්‍යවරයාගේ සංචාරය අතරතුර, 3 වන එක්සත් ජනපද-ශ්‍රී ලංකා හවුල්කාරිත්ව සංවාදය 2019 මැයි 16 වන දින එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේදී කැඳවන ලද අතර, එමඟින් සමස්ත සබඳතා ප්‍රමාණය සමාලෝචනය කරන ලදුව, වෙළඳාම, ආයෝජන සහ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම, සමුද්‍රීය වසම් පිළිබඳ දැනුවත් භාවය, ආරක්ෂක සහයෝගිතාව, ආර්ථික සහනාධාර, බුද්ධිමය කරුණු හුවමාරුව හා ප්‍රතිත්‍රස්තවාදය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන සහ නිලධාරීන් සඳහා විවෘත රාජ්‍ය හවුල් කාරිත්ව වැඩසටහන් සහ ශිෂ්‍යත්ව, රජයේ නිලධාරීන්, හමුදා නිලධාරීන් සහ අනෙකුත් තැනැත්තන් සඳහා පුහුණුව හා ධාරිතා වර්ධනය යනාදී ක්ෂේත්‍රවල සහයෝගිතාව තවදුරටත් ශක්තිමත් කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

- හවුල්කාරිත්ව සංවාදයට සමගාමීව, ගරු. අමාත්‍යවරයා එක්සත් ජනපද ජාතික ආරක්ෂක උපදේශක ජෝන් බෝල්ටන්, කොන්ග්‍රස් මණ්ඩලයේ සාමාජිකයින් හා එක්සත් ජනපද රජයේ නිලධාරීන් 'think tanks' හි නියෝජිතයින්, රාජ්‍ය හා පෞද්ගලික අංශය, ශ්‍රී ලංකා ඇමරිකානු ප්‍රජාව යනාදීන් හමුවිය.

- තුන්වන හවුල්කාරිත්ව සංවාදයේ ප්‍රතිඵලයන්හි පසුවිපරමක් ලෙස, උතුරු ඇමරිකානු අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදුව, එක්සත් ජනපද - ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවාදය 2019 දෙසැම්බර් 12 වන දින එක්සත් ජනපද නියෝජිත පිරිසකගේ සහභාගීත්වයෙන් යුතුව විදේශ කටයුතු අමාත්‍යාංශයේදී කැඳවීමට කටයුතු කරන ලදී.

- මීට සමගාමීව නව මුලපිරීමක් ලෙස, මෙම අංශය විසින් වර්ෂ 2020 දී පැවැත්වීමට නියමිත සංවාදයන් වන එක්සත් ජනපද - ශ්‍රී ලංකා කෘෂිකාර්මික සංවාදය සහ එක්සත් ජනපද - ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සංවාදය සඳහා ප්‍රාරම්භක රැස්වීම් තුනක් එක්සත් ජනපද තානාපති කාර්යාලයේ නිලධාරීන් සහ අදාළ රේඛීය නියෝජිත ආයතන / අමාත්‍යාංශ නියෝජිතයින් සමඟින් රැස්වී ඇත.

- 2019 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ ප්‍රධාන නියෝජ්‍ය සහකාර ලේකම් තානාපති ඇලිස් වෙල්ස් මහතාගේ සංචාරය සඳහා සහ එතුමන් සහ අතිගරු. ජනාධිපතිතුමන්, ගරු. අග්‍රාමාත්‍යතුමන් සහ ගරු. විදේශ සබඳතා අමාත්‍යතුමන් හා අනෙකුත් පිරිස සමඟ පැවති සාකච්ඡාවන්ට අමාත්‍යාංශය විසින් පහසුකම් සපයන ලදී.

- එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දකුණු ආසියානු අධ්‍යක්ෂ ලෝරාස්ටෝන් මහත්මිය සුහද සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි අතර, 2019 ඔක්තෝබර් 31 දිනැතිව අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡාවන්ට සහභාගි විය.

- වර්ෂ 2019 දී මුදල් අමාත්‍ය ගරු. මංගල සමරවීර මහතා, පොදු සැපයුම් හා ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු. ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා, නියෝජ්‍ය කථානායක ගරු. ආනන්ද කුමාරසිරි මහතා, මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු. එරාන් වික්‍රමරත්න මහතා සහ

පාර්ලිමේන්තු නියෝජිතයින් පිරිසක් එක්සත් ජනපද විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය යටතේ ඇමරිකා එක්සත් ජනපදයේ සංචාරයන් හි නිරත වූ අතර, විනිසුරුවන්ගේ සහ නීතිඥවරුන්ගේ සුහද සංචාරයන් සිදුකෙරිණි.

- සහශ්‍රක අභියෝගතා සංස්ථා (MCC) සංයුක්ත ගිවිසුමේ කෙටුම්පතට අදාළ කරුණු මෙම අංශය විසින් නියාමනය කරන ලදී. වොෂිංටන් ඩීසීහි, සහශ්‍රක අභියෝගතා සංස්ථාවෙහි (MCC) නිලධාරීන් සමඟ සිදු කළ සංවාදය පිළිබඳවද මෙම අංශය විසින් ශ්‍රී ලංකාවේ අදාළ බලධාරීන්ට කරුණු වාර්තා කරනු ලැබීය. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විද්වත් කමිටුවක් විසින් සහශ්‍රක අභියෝගතා සංස්ථා (MCC) කෙටුම්පත අබණ්ඩව සමාලෝචනය කරමින් පවතී. අවශ්‍ය අවස්ථාවන්හිදී පවතින ලේඛන සමාලෝචන කමිටුවට ලබාදෙමින් මෙම අංශය විසින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයනු ඇත.

- මිනිස් ජාවාරමට එරෙහිවීම පිළිබඳ ජාතික කාර්ය සාධක බලකාය (NAHTTF) විසින් කෙටුම්පත සකසා අවසන් කිරීමෙන් අනතුරුව, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව වෙත ශ්‍රී ලංකාව ඉදිරිපත් කරන මිනිස් ජාවාරම් පිළිබඳ වාර්තාව 2019 සකසා අවසන් කර, 2019 පෙබරවාරි 1 වන දින කොළඹ පිහිටි එක්සත් ජනපද තානාපති කාර්යාලය වෙත මෙම අංශය විසින් ඉදිරිපත් කරන ලදී.

- මිනිස් ජාවාරම පිළිබඳ ජාතික කාර්ය සාධක බලකාය (NAHTTF) විසින් කෙටුම්පත සකසා අවසන් කිරීමෙන් අනතුරුව, "ශ්‍රී ලංකා අන්තර්වාර වාර්තාව - මිනිස් වෙළඳ ජාවාරම පිළිබඳ 2019 වාර්තාවේ ප්‍රමුඛතා නිර්දේශයන්හි ප්‍රගති සාරාංශය", 2019 දෙසැම්බර් 2 වන දින කොළඹ පිහිටි එක්සත් ජනපද තානාපති කාර්යාලය වෙත මෙම අංශය විසින් ඉදිරිපත් කරන ලදී.

- එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව වෙත ශ්‍රී ලංකාව ඉදිරිපත් කරන මිනිස් ජාවාරම් පිළිබඳ වාර්තාව 2020 සකස් කිරීම / අවසන් කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීම සඳහා මිනිස් ජාවාරමට එරෙහිවීම පිළිබඳ ජාතික කාර්ය සාධක බලකායෙහි (NAHTTF) රැස්වීම් වලටද මෙම අංශය සිය නියෝජනය ලබාදුනි.

- ද්විපාර්ශ්වික සබඳතා ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන තානාපති කාර්යාලය විසින් ඊට අදාළ එක්සත් ජනපද රාජ්‍ය ආයතනයන් සමඟ සමීපව කටයුතු කරනු ලැබූ අතර, ඒවා නම් වශයෙන් රාජ්‍ය, ආරක්ෂක, වාණිජ, අධිකරණ, ජාතික ආරක්ෂක කවුන්සිලය, ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) සහ මන්ත්‍රණ සභා දෙකෙහිම කොන්ග්‍රස් මණ්ඩල සාමාජිකයින් සහ කොන්ග්‍රස් මණ්ඩල කාර්ය මණ්ඩලය යනාදිය වේ.

- වොෂිංටන් ඩීසී හි ශ්‍රී ලංකාවේ තානාපතිවරයා විසින් 2019 ජූලි මස 08 වන දින එක්සත් ජනපද ජනාධිපති අතිගරු. ඩොනල්ඩ් ට්‍රම්ප් මහතා වෙත සිය අක්තපත්‍ර පිළිගනුවනු ලැබීය. ශ්‍රී ලංකාවේ වෙසෙන විවිධාංගීකරණය වූ ප්‍රජාවන් අතර රහස්‍යභාවය හා විශ්වාසය ගොඩනගා ගැනීම සඳහා අබණ්ඩව දරන උත්සාහයන් සහ වෙළඳ හා ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම, පුළුල් කිරීම ඇතුළුව එක්සත් ජනපදය සමඟ ශක්තිමත් බහු-මාන සම්බන්ධතාවයක් පවත්වා ගැනීම, මිනිසුන් අතර සම්බන්ධතා පුළුල් කිරීම සහ ජාත්‍යන්තර හා කලාපීය සාමය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම යනාදියෙහි වැදගත්කම පිළිබඳව ඔහු එහිදී ජනාධිපතිතුමා වෙත විස්තර කරනු ලැබීය.

- විශේෂයෙන් 2019 නොවැම්බර් 17 දින පැවති ජනාධිපතිවරණයෙන් පසු දේශපාලන වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා - එක්සත් ජනපද සබඳතා සහ ද්විපාර්ශ්වික බැඳියාවන් පිළිබඳ කරුණු සම්බන්ධයෙන් එක්සත් ජනපද කොන්ග්‍රස් මණ්ඩලය සහ කොන්ග්‍රස් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට තානාපති කාර්යාලය විසින් කටයුතු කරනු ලැබීය.

- ද්විපාර්ශ්වික සබඳතා යලි පණ ගැන්වීම සහ එක්සත් ජනපදය සමඟ වඩාත් සමීප සබඳතා ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා දේශපාලන බල මණ්ඩලය පුනර්ජීවනය කිරීමටද තානාපති කාර්යාලය පියවර ගෙන තිබේ. තානාපති කාර්යාලය විසින් බල මණ්ඩල සහ කමිටු ක්‍රියාකාරකම් සහ සාකච්ඡා කිරීමට නියමිත යෝජිත නීති සම්පාදනය කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම අබණ්ඩව සිදුකරනු ලැබීය; ශ්‍රී ලංකාවට අදාළ ගැටලු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ විදේශ කටයුතු සහ සෙනෙට් විදේශ සම්බන්ධතා කමිටු විසින් සිදුකරන විභාග ණියාමනය කරනු ලැබේ.

- තානාපති කාර්යාලයේ නිලධාරීන්, එක්සත් ජනපද රජයේ දෙපාර්තමේන්තු, ආයතන, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ආධාර සපයන ආයතන, උපදේශක කණ්ඩායම්, ව්‍යාපාරික මණ්ඩල, 'think tank' ප්‍රජාව, මාධ්‍ය කාර්යාල, එක්සත් ජනපද - ශ්‍රී ලංකා මිත්‍රත්ව කණ්ඩායම් සහ ප්‍රජා සංවිධාන සහ කණ්ඩායම් සමඟ නිතිපතා සම්බන්ධ වී කටයුතු කළහ.

- තානාපති කාර්යාලය විසින්, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් ඉක්බිතිව ලංකාවට පක්ෂව ඔවුන්ගේ සුහදතාවය සහ සහයෝගය ප්‍රකාශ කිරීම සඳහා එක්සත් ජනපද රජය, මාධ්‍ය, සුභපතන්නන් සහ ප්‍රජා සාමාජිකයන් සමඟ ඉතා සමීපව කටයුතු කරනු ලැබූ අතර, එක්සත් ජනපදයේ ශ්‍රී ලාංකිකයන් අතර සාමය, සමගිය සහ සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් බහු-ආගමික, සමාජීය, සමරු ක්‍රියාකාරකම්, සහයෝගිතා රැස්වීම්, ප්‍රජාපාදක ආගමික වතාවත්, අන්තර් ආගමික සේවා යනාදිය සංවිධානය කිරීමට කටයුතු කරනු ලැබීය.

- ශ්‍රී ලංකා-එක්සත් ජනපද සබඳතා සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දීම උදෙසා ඔවුන් බල මුලු ගැන්වීමේ උත්සාහයක් ලෙස තානාපති කාර්යාලය ශ්‍රී ලංකා බෞද්ධ විහාරස්ථාන සහ වෙනත් පූජනීය ස්ථාන, ශ්‍රී ලංකා සංගම්, ශ්‍රී ලංකා-ඇමරිකානු ප්‍රජාව සමඟ නිරන්තර සම්බන්ධතා පවත්වනු ලබයි. කොන්ග්‍රසයේ සිටින ඔවුන්ගේ නියෝජිතයින්ට ශ්‍රී ලංකාවට පක්ෂව බලපෑම් කිරීමටත්, ඔවුන්ගේ ප්‍රාන්තවල ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය සහ සබැඳියාව ප්‍රවර්ධනය කිරීමටත්, ප්‍රක්ෂේපණය කිරීමටත් තානාපති කාර්යාලය ඔවුන්ට සහායවේ. නොමඟ යවන සහ සතුරු ප්‍රකාශයන්ට ප්‍රති ආඛ්‍යානයක් සැපයීම උදෙසා සමහර ඩයස්පෝරා කණ්ඩායම් විසින් ස්වකීය අභිලාෂයන් පෙරදැරිව සංවිධානය කරන ලද උත්සවවලදී ශ්‍රී ලංකා ප්‍රජාව බලමුලු ගැන්වීමට තානාපති කාර්යාලය උත්සාහ දරනු ලැබීය.

- ශ්‍රී ලංකාවේ 71 වන නිදහස් දින සංවත්සරය 2019 පෙබරවාරි 04 වන දින සමරනු ලැබූ අතර, තානාපති ඇලිස් වෙල්ස් මහතා එම උත්සවයෙහි ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී විය.

- සංවර්ධන ක්‍රියාවලිය අරමුණු කර ශ්‍රී ලංකා රජය ගෙන ඇත ප්‍රයත්නයන් පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින්, නගරාධිපතිවරුන්, නියෝජ්‍ය නගරාධිපතිවරුන්, ලොස් ඇන්ජලීස් එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ, විදේශ දූත මණ්ඩල කාර්යාලයේ ප්‍රාදේශීය අධ්‍යක්ෂක, ලොස් ඇන්ජලීස් ප්‍රාන්ත අධීක්ෂණ මණ්ඩලය සහ එක්සත් ජනපද නියෝජිතායතන සමඟ, ලොස් ඇන්ජලීස්හි කොන්සල් ජනරාල්වරයා සාකච්ඡා පවත්වනු ලැබීය.

- ලොස්ඇන්ජලීස්හි පැසඩේනා සහ මහනුවර නගර දෙක අතර සහෝදර නගර වැඩසටහනක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ලොස් ඇන්ජලීස්හි පැසඩේනා නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති සහ කමිටු සාමාජිකයින් සමඟ පැවති රැස්වීම්වලට කොන්සල් ජනරාල් (CG) සහභාගී විය.

- වෛද්‍ය ආධාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ලොස්ඇන්ජලීස්හි කොන්සල් ජනරාල් (CG) විසින් සැන්ටාබාබරාහි පිහිටි සහන සංවිධානයේ අධ්‍යක්ෂ සහ කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා පවත්වන ලදී. එහිදී සහන සංවිධානයේ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් සලකා බැලීම සඳහා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

- වංචා වැළැක්වීමේ මූල පිරීමක් ලෙස, එක්සත් ජනපද තානාපති කාර්යාලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව, නීතිවිරෝධී සංක්‍රමණ, හොර මිනිස් ජාවාරම් සහ හොර බඩු ජාවාරම් වැළැක්වීම සඳහා හවුල්කාරිත්වය පුළුල් කිරීමේ අදහසින් යුතුව, ආදර්ශක ගමන් සහ අනන්‍යතා ලේඛන සැපයීමේ සම්බන්ධීකරණ කටයුතු උතුරු ඇමරිකානු අංශය විසින් සිදු කරන ලදී.

- සමුද්‍රීය පුහුණුව, එක්සත් ජනපද තානාපති කාර්යාලය සමඟ සාකච්ඡා කිරීම, තාක්ෂණික හා පුහුණු වැඩසටහන් / සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම සහ මානුෂීය ආධාර වැඩසටහන් සඳහා වන ශ්‍රී ලංකාවේ නිල වැඩසටහන් වලට සහභාගීවන එක්සත් ජනපද නිලධාරීන්ට වීසා 831 ක් නිකුත් කිරීමට මෙම අංශය විසින් පහසුකම් සපයනු ලැබීය.

**2. රාජ්‍ය ආරක්ෂාව සහ ආරක්ෂක සහයෝගීතාව**

- සංචාරක හමුදා ගිවිසුමෙහි කෙටුම්පත සලකා බැලීම සඳහා පැමිණෙන එක්සත් ජනපද රජයේ නියෝජිත කණ්ඩායම සමඟ සාකච්ඡාවන් පැවැත්වීමට පහසුකම් සපයනු ලැබීය.

- එක්සත් ජනපදයේ හිටපු ඇමරිකානු වෙරළ ආරක්ෂක ගටර් "ෂර්මන්" එක්සත් ජනපද අතිරික්ත ආරක්ෂක ලිපි වැඩසටහන හරහා අත්පත් කරගෙන වර්ෂ 2019 දී ශ්‍රී ලංකාවට මාරුකර, ශ්‍රී ලංකාවේ SLNS ගජබාහු' ලෙස අධිකාරිත්වයට පත්කරන ලදී.

- වොෂිංටන් ඩීසී හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ආරක්ෂක සහ යෝගීතාව සහ හමුදා-හමුදා සහයෝගීතාව ඉහළ නැංවීම පිළිබඳ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ අඛණ්ඩව සම්බන්ධවී කටයුතු කරනු ලැබීය.

- විදේශ හමුදා මූල්‍යකරණය වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවට ලබා දී ඇති ඩොලර් මිලියන 39.5 ක ප්‍රදානය මගින් ශ්‍රී ලංකා නාවික හමුදාවට වෙරළබඩ ආරක්ෂක රේඩාර් පද්ධතියක් සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ගුවන් හා භූගත දත්ත සම්බන්ධතාවයක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් යෝජනා ඉදිරිපත් කරනු ලැබ, එම මිලදී ගැනීම් සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

- '333 මූල්‍යකරණය' වැඩසටහන හරහා එක්සත් ජනපද රජය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සමුද්‍රීය මුර සංචාර ගුවන්යානා දෙකක් ලබා දීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

- ත්‍රිවිධ හමුදා සේවයේ නියුතු වූවන්ගේ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව 'ජාත්‍යන්තර හමුදා අධ්‍යාපන හා පුහුණු' (IMET) සහ ඉන්දු පැසිෆික් පුහුණු වැඩසටහන් හි අරමුදල් මගින් අඛණ්ඩව සිදුකරන ලදී. වර්ෂ 2019 තුළ එක්සත් ජනපදයෙහි හා වෙනත් රටවල් හිදී සහ ශ්‍රී ලංකාවේදී පුද්ගලයින් 363 දෙනෙකුට අධ්‍යාපනය / පුහුණුව ලබා දී ඇත.

- විශේෂයෙන් ශ්‍රී ලංකාවේ පාස්කු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ත්‍රස්ත මර්දන කාර්යාංශය (CTB) සමඟ පැවති සහයෝගිතාවය වැඩි දියුණු කර ගත් අතර, ත්‍රස්ත මර්දන කාර්යාංශය (CTB) විසින් ශ්‍රී ලංකාවේ ප්‍රති-ත්‍රස්ත / ප්‍රති-අන්තවාදී හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා යෝජනා මාලාවක් ඉදිරිපත් කරනු ලැබීය.

- 'Near East South Asia' (NESA මධ්‍යස්ථානය) සහ වොෂිංටන් ඩීසී හි ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය ඇතුළු විවිධ සංවිධාන මගින් සංවිධානය කරන ලද ප්‍රති-ත්‍රස්තවාදය, ප්‍රති-අන්තවාදය, මුදල් විශුද්ධිකරණය පිළිබඳ වැඩසටහන් සහ සාකච්ඡා කිහිපයකට දූත මණ්ඩලය සහභාගීවිය.

- එක්සත් ජනපද නැව් 'USNS Millinocket' 2019 අප්‍රේල් 16 - 26 දක්වා 'USS Spruance' 2019 අප්‍රේල් 18 - 23 දක්වා 'Research Vessel RSV Sally Ride' 2019 මැයි 20 සිට අගෝස්තු 19 දක්වා සංචාරය කිරීමට මෙම අංශය විසින් පහසුකම් සපයනු ලැබීය.

- මෙම දූත මණ්ඩලය විසින් 2019 ජුනි 13 සිට ජූලි 05 දක්වා ඒකාබද්ධ සටන් හුවමාරු පුහුණු / ශේෂ ශෛලිය සඳහා සහ 2019 අප්‍රේල් මාසයේදී සහයෝගීතා පාවෙන සූදානම සහ පුහුණුව (CARAT) සඳහා පහසුකම් සපයන ලදී.

## 3. බහුපාර්ශ්වික සබඳතා

- රාජ්‍ය මුදල් අමාත්‍ය ගරු. එරාන් වික්‍රමරත්න මහතා ප්‍රමුඛ ශ්‍රී ලංකා දූත පිරිස 2019 අප්‍රේල් 8 සිට 13 දක්වා පැවති ලෝක බැංකු / ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වසන්ත රැස්වීම් සඳහා සහභාගි වූහ. මෙම දූත පිරිස තානාපති ඇලිස් වෙල්ස් මහතා, දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ ප්‍රධාන නියෝජ්‍ය සහකාර ලේකම් සහ සහශ්‍රක අභියෝගතා සංස්ථාවෙහි (MCC) නිලධාරීන්ද මුණ ගැසුණහ.

- 2019 සැප්තැම්බර් මාසයේ වොෂිංටන් ඩීසී හි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මූලස්ථානයේ පැවති මුදල් අමාත්‍යවරුන්ගේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්ෂික වසන්ත රැස්වීමට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ශ්‍රී ලංකා මහබැංකු අධිපති සමඟ භාණ්ඩාගාර ලේකම් ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග මහතා සහභාගි විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වාර්ෂික වසන්ත රැස්වීමට සමගාමීව පොදුරාජ්‍ය මණ්ඩලීය මුදල් අමාත්‍යවරුන් සහ සාර්ක් මුදල් අමාත්‍යවරුන්ගේ හමුවක් වොෂිංටන් ඩීසී හි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් මූලස්ථානයේදී පැවැත්විණි.

## 4. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

ඇමරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන ගමනාන්තය වන අතර, එය 2019 දී සිදු කළ සමස්ථ අපනයනයෙන් 26.3% කි. 2019 දී ශ්‍රී ලංකාවෙන් එක්සත් ජනපදයට කරන ලද සමස්ථ අපනයන ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන 3141 කි. එයින් ඇමරිකානු ඩොලර් මිලියන 195.5 ක් වටිනා භාණ්ඩ එක්සත් ජනපද ජීඑස්පී යෝජනා ක්‍රමය (GSP scheme) යටතේ විය. වර්ෂ 2019 දී ශ්‍රී ලංකාවෙන් ඇමරිකාවට කරන අපනයන ප්‍රමාණය වර්ෂ 2018 දී සිදු කළ අපනයන ප්‍රමාණය වන ඇමරිකානු ඩොලර් මිලියන 2675.0 සිට 2.8% කින් වර්ධනය වී, එය වර්ෂ 2019 දී ඇමරිකානු ඩොලර් මිලියන 2749.9 ක් බවට පත්විය.

- ඇමරිකා එක්සත් ජනපදය- ශ්‍රී ලංකා වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුම (TIFA) යටතේ 13 වන ඒකාබද්ධ සභා රැස්වීම 2019 ජුනි 19 සහ 20 යන දිනයන්හි කොළඹදී පැවැත්විණි. ඒකාබද්ධ කවුන්සිල රැස්වීම මඟින් වෙළඳපල ප්‍රවේශය, ආයෝජනය, බුද්ධිමය දේපළ අයිතිවාසිකම්, ධාරිතා වර්ධනය, තාක්ෂණික සහයෝගීතාව, කම්කරු සබඳතා සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම පිළිබඳ වෙළඳ ප්‍රතිපත්තිමය කතිකාවතක් සඳහා සංසදයක් සපයනු ලැබීය.

- තානාපති කාර්යාලය විසින් ඇඟලුම් සහ තේ ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් හයක් සංවිධානය කරන ලද අතර, වර්ෂ 2019 දී ඇඟලුම් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රදර්ශන දෙකක් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කිරීමට අදාළ සම්බන්ධීකරණය සිදුකරන ලදී. ශ්‍රී ලාංකික කර්මාන්තය සඳහා අදාළ වන වාණිජමය කරුණු සම්බන්ධයෙන් වෙළඳපල සමීක්ෂණ සහ විශේෂ වාර්තා 44 ක් සකස් කරන ලදී.

- තානාපති කාර්යාලය විසින් වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධනය පිළිබඳ ව්‍යාපාරික රැස්වීම් එකසිය දහයක් පවත්වා ඇති අතර, අභ්‍යන්තර හා බාහිර වෙළඳ විමසුම් හැත්තෑ තුනක් සඳහා සිය සේවය සපයන ලදී. තානාපති කාර්යාලය අභ්‍යන්තර හා බාහිර වෙළඳ පැමිණිලි

දොළහක් මෙහෙයවීමට කටයුතු කළ අතර, ශ්‍රී ලංකාවෙන් ලැබුණු පැමිණිලි වලින් දෙකක් සාර්ථකව විසඳනු ලැබීය.

- තානාපති කාර්යාලය විසින් අභ්‍යන්තර හා බාහිර තනි පුද්ගල සංචාර 10 ක් සම්බන්ධීකරණය කරන ලද අතර, වාණිජ කටයුතු සම්බන්ධව අභ්‍යන්තර නියෝජිත කණ්ඩායම් දෙකක් සහ එක් බාහිර නියෝජිත කණ්ඩායමක් සම්බන්ධීකරණය කරනු ලැබීය.

- 2019 වර්ෂය තුළදී ආයෝජන ප්‍රවර්ධන රැස්වීම් දහ අටක් පවත්වන ලදී.

- වර්ෂය තුළ එක්සත් ජනපදයේ සිට ශ්‍රී ලංකාව වෙත සංචාරකයින්ගේ සමස්ථ පැමිණීම 68,832 කි. පාස්කු ඉරිදා ප්‍රහාර හේතුවෙන් සංචාරකයින්ගේ පැමිණීම 2019 දී මන්දගාමී විය. පාස්කු ඉරිදා ප්‍රහාර හේතුවෙන් වසර මැදදී සැලසුම් කරන ලද සමහර සංචාරක ප්‍රවර්ධන කටයුතු අවලංගු කරන ලදී.

- තානාපති කාර්යාලය විසින් වසර ආරම්භයේදී එක් ප්‍රවර්ධන ප්‍රදර්ශනයක් සඳහා සහ වසර අවසානයේ ප්‍රවර්ධන වැඩසටහන් හතරක් සඳහා ශ්‍රී ලංකා සහභාගීත්වය සම්බන්ධීකරණය කරනු ලැබීය. සංචාරක ප්‍රවර්ධනය පිළිබඳව සංචාරක මෙහෙයවන්නන් හය දෙනෙකු විසින් රැස්වීම් හයක් පවත්වන ලදී. එක්සත් ජනපද සංචාරකයින් අතර ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරමින් ලොස් ඇන්ජලීස්හි කොන්සල් ජනරාල් විසින් කැලිෆෝනියාවේ සංචාරක මෙහෙයවන්නන් සමඟ රැස්වීම් සංවිධානය කරනු ලැබීය.

- එක්සත් ජනපද රජයට එරෙහිව ශ්‍රී ලංකාවේ සිට එක්සත් ජනපදයට මාර්ගයෙන් පිටත ටයර් ආනයනය කිරීම සඳහා ප්‍රතිප්‍රහාර තීරු බදු පැනවීම සම්බන්ධයෙන් එක්සත් ජනපද රජයට එරෙහිව ෆෙඩරල් මණ්ඩල අභියාචනාධිකරණයේ ගොනු කළ ශ්‍රී ලංකා රජයේ අභියාචනය පිළිබඳ කටයුතු තානාපති කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරන ලදී. එක්සත් ජනපද රජය පසුව නඩුව ඉල්ලා අස්කර ගනු ලැබුවේ ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද ප්‍රබල කරුණු හේතුවෙනි.

- 'අළු ලැයිස්තුවේ' ඇතුලත් ශ්‍රී ලංකාව නිමිතිකරණය සඳහා වන මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය (FATF) සම්බන්ධ කරුණු පිළිබඳව තානාපති කාර්යාලය විසින් එක්සත් ජනපද භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සහ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පැවැත්වීය. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකායේ (FATF) රෙගුලාසි යටතේ ශ්‍රී ලංකාව අළු ලැයිස්තුවෙන් ඉවත්කිරීමට එක්සත් ජනපද භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සිය උපරිම සහාය ලබාදෙන ලදී.

- ඉරානයෙන් බොරතෙල් මිලදී ගැනීමේදී ලබාගත් ණය පියවීම සහ ශ්‍රී ලංකාවේ උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා ලබාගත් ණය වාරික පියවීම සම්බන්ධයෙන් එක්සත් ජනපද භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව, විදේශ වත්කම් පාලන කාර්යාලය සහ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව සමඟ අඛණ්ඩ රැස්වීම් පැවැත්වීමට සහ ඒ පිළිබඳ පසු විපරම් කටයුතු සිදුකිරීමට තානාපති කාර්යාලය විසින් පියවරගෙන ඇත.

- ලොස් ඇන්ජලීස්හි කොන්සල් ජනරාල් විසින්, 2019 ජූලි මාසයේ කැලිෆෝනියාවේ පැවති ලෝක තේ ප්‍රදර්ශනය 'World Tea Expo' හි තේ රස බැලීමේ ශ්‍රී ලංකා දින උත්සවයේ ශ්‍රී ලංකා ජාතික මණ්ඩපයට සමගාමීව, 2019 පෙබරවාරි 7 වන දින පැවතිතේ ප්‍රවර්ධන උත්සවය, 2019 අප්‍රේල් 25 වන දින පැවති වාර්ෂික රාජ්‍ය තාන්ත්‍රික විවිධ තේ උත්සවය- 2019 හි ලංකා තේ රස බැලීමේ සහ ප්‍රවර්ධන වැඩසටහන, 2019 මැයි මස 2 වන දින පැවති 93 වන වාර්ෂික ලෝක වෙළඳ සතියේදී ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම, 2019 ජුනි 11 සිට 13 දක්වා පැවති ලංකා තේ ජාලකරණ උදෑසන ආහාරය සඳහා හමුව- 2019, ලෝක තේ ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් සහ 2019 ඔක්තෝබර් 18 වනදින ලාස්වේගාස්හි

මැන්ඩලේබේ හෝටලයේ පැවති කුළුබඩු / පොල් මද නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා පැවති ජාලකරණ උදෑසන ආහාරය සඳහා හමුව සංවිධානය කරනු ලැබීය.

- 2019 මාර්තු 5 සිට 9 දක්වා පැවති 'Natural Products Expo West' සහ 2019 ඔක්තෝම්බර් මාසයේදී ලාස්වේගාස්හි පැවති 'Supply Side West – 2019 වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා සහභාගීත්වය කොන්සල් ජනරාල් විසින් සම්බන්ධීකරණය කරනු ලැබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා සමාගම් හතක් සහභාගි විය. ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල (SLEDB) සමඟ එක්ව එක්සත් ජනපද වෙළඳපොළ තුළ කුළුබඩු සහ ආශ්‍රිත නිෂ්පාදන තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරනු ලැබීය. ප්‍රදර්ශකයින් හට ඇමරිකානු ඩොලර් 505,000/- ක් වටිනා කුළුබඩු සහ පොල් මද නිෂ්පාදන සඳහා ඇණවුම් ලැබී ඇති බව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තහවුරු කර ඇත.

- සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ ලොස්ඇන්ජලීස්හි කොන්සල් ජනරාල් විසින් වෙළඳපල වාර්තා 7 ක් සකස් කර ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන / පෞද්ගලික අංශයේ ආයතන වෙත යවා ඇති අතර, වෙළඳ විමසුම් 60 කට අධික සංඛ්‍යාවකට සහභාගී විය.

- කොන්සල් ජනරාල් විසින්, 2019 මැයි මාසයේදී ලොස්ඇන්ජලීස් ප්‍රාදේශීය වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද 93 වන වාර්ෂික ලෝක වෙළඳ සතියේ සමාප්ති සැමරුම් උළෙලේදී, සංස්ථාපිත සමූහ ව්‍යාපාර, බහුජාතික සමාගම්, ප්‍රමුඛ ව්‍යවසායකයින් සහ අනාගත ව්‍යාපාරිකයින් විදේශ ආයෝජන ප්‍රවර්ධනය කෙරෙහි අවධානය යොමුකරවන සංක්ෂිප්ත කිරීම් සිදුකරන ලදී.

- වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයා සමඟ සාකච්ඡාවකට එක්සත් ජනපද ආයෝජකයින්ගෙන් සමන්විත වූ සිව්දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වීමට අවශ්‍ය කටයුතු කොන්සල් ජනරාල් විසින් සිදුකරනු ලැබීය.

- බිංගිරියෙහි යෝජිත අපනයන සැකසුම් කලාපය / කාර්මික උද්‍යානය සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ අනාගත සංවර්ධකයෙකු හඳුනා ගැනීම අරමුණුකර ගෝලීය වෙළඳ හා විදේශ ආයෝජන මධ්‍යස්ථානයේ සභාපති සමඟ සහ ශ්‍රී ලංකාවේ සිට ඇමරිකා එක්සත් ජනපදයට තොරතුරු තාක්ෂණ / නවෝත්පාදන අපනයන වැඩිකිරීමට උපකාරීවීම සඳහා කොළඹ ගෝලීය කළමනාකරණ උපදේශන සමාගමක්වන ස්ටැක්ස් ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ සමඟ කොන්සල් ජනරාල්වරයා සාකච්ඡා පවත්වනු ලැබීය.

- ලොස්ඇන්ජලීස්හි නියෝජ්‍ය නගරාධිපති සහ නගර කාර්යාලයේ ජාත්‍යන්තර වෙළඳ හා ආයෝජන අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ නගර කාර්යාල විධායකයින් සමඟ පැවති රැස්වීමකට කොන්සල් ජනරාල්වරයා සහභාගි වූ අතර, ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සඳහා ලොස්ඇන්ජලීස් නගර කාර්යාල අධීක්ෂණය යටතේ ඇති නියෝජිතායතන වලින් එක්සත් ජනපද ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම පිණිස ඔවුන්ගේ සහාය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**5. අධ්‍යාපනික, ආගමික හා සංස්කෘතික සබඳතා**

- සාම බලකා ස්වේච්ඡා සේවකයින් ශ්‍රී ලංකාවෙහි සේවයේ යෙදවීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය සහ සාම බලකාය අතර පවතින අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම පිළිබඳව මෙම අංශය විසින් පසු විපරම් කරන ලදී. 2019 සැප්තැම්බර් 25 වන දින උතුරු ඇමරිකාවේ කොන්සල් ජනරාල් ශ්‍රී ලංකා සාම බලකායේ ප්‍රධානී Slsiafnla මහත්මිය හමුවිය.

- ඩෙංගු සහ ක්ෂය රෝගය කෙරෙහි අවධානය යොමුකරමින් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සඳහා ඇමරිකා එක්සත් ජනපදයෙන් පර්යේෂණ ප්‍රදාන දෙකක් ලබා ගැනීමට මෙම අංශය විසින් පහසුකම් සපයනු ලැබීය.

- යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස ත්‍රිපිටකය ප්‍රවර්ධනය කිරීම සඳහා "ත්‍රිපිටකාභිවන්දනා" තේමාව යටතේ තානාපති කාර්යාලය විසින් වොෂිංටන් ඩී.සී, මේරිලන්ඩ් සහ වර්ජිනියා හි ප්‍රධාන බෞද්ධ විහාරස්ථාන හතර තුළ සතියක් පුරා ආගමික කටයුතු සංවිධානය කරනු ලැබීය.

- කොන්සල් ජනරාල්වරයා විසින් ලොස්ඇන්ජලීස්හි, ක්‍රෙන්ෂෝ බිලූවිඩ් හි ධර්මවිජය බෞද්ධ විහාරයේ සහාය ඇතිව "ත්‍රිපිටකාභිවන්දනා" වැඩසටහන සංවිධානය කරන ලදී. නිව්යෝර්ක්හි එක්සත් ජාතීන්ගේ සංවිධානය සඳහා වූ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය විසින් නිව්යෝර්ක් බෞද්ධ විහාරයේ දී මෙවැනිම වැඩසටහනක් සංවිධානය කළ අතර එයට බුද්ධ පූජාවක්, ධර්ම දේශනයක් සහ දානයක්ද ඇතුළත් විය.

- එක්සත් ජනපද ජාතිකයන් අතර බෞද්ධාගම ප්‍රවර්ධනය කිරීම උදෙසා, තානාපති කාර්යාලය සහ ඇමරිකානු ජාත්‍යන්තර බෞද්ධ සංගමයේ (IBAA) සහයෝගීත්වයෙන් තානාපති අනු කාර්යාල පරිශ්‍රයේදී ධර්ම අධ්‍යයන වැඩසටහනක් සංවිධානය කරන ලදී. වසර පුරා හින්දු කෝවිල්, කතෝලික පල්ලි සහ ඉස්ලාමීය පල්ලි විසින් සංවිධානය කරන ලද සංස්කෘතික හා ආගමික කටයුතු සඳහා තානාපති කාර්යාල කාර්ය මණ්ඩලය සහභාගී විය.

- ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික උඩරට බෙරවාදනය ඉදිරිපත් කරමින් එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දකුණු ආසියානු ඇමරිකානු සේවක සංගමය විසින් සංවිධානය කර 2019 අගෝස්තු 01 දිනපවත්වන ලද 10 වන වාර්ෂික සංස්කෘතික වැඩසටහන සඳහා, තානාපති කාර්යාලය සිය සහභාගිත්වය සනිටුහන් කරන ලදී.

- තානාපති කාර්යාලය විසින් ප්‍රභූ පිළිගැනීම් උත්සව සංවිධානය කළ අතර, එක්සත් ජනපද පාසල් හා අධ්‍යාපන ආයතන සමඟ සම්බන්ධ වී ශ්‍රී ලාංකික සංස්කෘතිය සහ අධ්‍යාපනය පිළිබඳ තරුණයින් අතර දැනුවත් භාවය ඇති කරනු පිණිස වොෂිංටන් ඩී.සී. හි රොනල්ඩ් රේගන් ගොඩනැගිල්ලේ පැවති වෙෆ් චැලෙන්ජ්, වින්ටර් නැෂනල් - තානාපති කාර්යාල ප්‍රදර්ශනාගාරය සහ තානාපති කාර්යාල ප්‍රතිග්‍රහණ වැඩසටහන 2019 ට සහභාගී විය.

- වොෂිංටන් ඩී.සී. හි ශ්‍රී ලංකා සංගමය විසින් සංවිධානය කළ ශ්‍රී ලංකා දිනය, "6 වන වාර්ෂික පීතරයිට් ක්‍රිකට් සැණකෙළිය", වොෂිංටන් ඩී.සී., මේරිලන්ඩ් සහ වර්ජිනියාහි ශ්‍රී ලංකා සංගම් විසින් සංවිධානය කරන ලද සංගීත සංදර්ශන හා වේදිකා නාට්‍ය සහ වෙනත් සංස්කෘතික කටයුතු සඳහා සහ කැලිෆෝනියා, නෙවාඩා, ෆ්ලොරිඩා, බටහිර වර්ජිනියා, නිව් යෝර්ක් සහනිව් ජර්සි හි ප්‍රජා සංවිධාන විසින් පවත්වනු ලබන ආගමික උත්සව සඳහා තානාපති කාර්යාල කාර්ය මණ්ඩලය සිය සහාය ලබාදුන් අතර, ඒ සඳහා සහභාගී විය.

- 2019 මාර්තු 3 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සහයෝගීත්වයෙන් යුතුව ශ්‍රී ලංකා සංස්කෘතිය හා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා පැවති දකුණු ආසියානු අධ්‍යයන සංගමයේ වාර්ෂික සමුළුවට සහ දකුණු කැලිෆෝනියාවේ ශ්‍රී ලංකා ඇමරිකා සංගමය විසින් සංවිධානය කරන ලද සිංහල / දෙමළ අලුත් අවුරුදු සැමරුම් ප්‍රජා උත්සවයට තානාපති කාර්යාලය සහභාගී විය.

- කොන්සල් ජනරාල් විසින් මාස 7 ක් පුරා පැවති 'The Jeweled Isle –Art from Sri Lanka' ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී. මෙම ප්‍රදර්ශනයට "ශ්‍රී ලංකා කතුවරුන්ගේ කියවීම සහ කමිටු සාකච්ඡාව, ශ්‍රී ලංකාවේ සමකාලීන ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ දේශනය සහ සාකච්ඡාව" ඇතුළත් විය.

- කොන්සල් ජනරාල් සහ ශ්‍රී ලංකා ඇමරිකා ඡායාරූප කලා සංගමය එක්ව 2019 සැප්තැම්බර් මාසයේදී "ශ්‍රී ලංකාවේ සුන්දරත්වය / 'The Beauty of Sri Lanka' ඡායාරූප ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී.

- ශ්‍රී ලංකා වාර්තා චිත්‍රපට නෙට්ෆ්ලික්ස් ජාලයට ඇතුළත් කිරීමේ හැකියාව පිළිබඳව කොන්සල් ජනරාල් විසින් නෙට්ෆ්ලික්ස් ජාල කණ්ඩායම වෙතින් විමසීමක් කරන ලදී. අනුරුද්ධ ජයසිංහ මහතා විසින් අධ්‍යක්ෂණය කරන ලද ශ්‍රී ලංකා චිත්‍රපටයක් වන "ද ෆ්‍රොසන් ෆයර්" සිනමා පටයෙහි නම 2019 ඔස්කාර් සම්මාන උළෙලට යෝජනාකිරීම පිණිස නෙට්ෆ්ලික්ස් ජාලයට ඉදිරිපත් කිරීම සඳහා සාකච්ඡා පැවැත්විණි. එහි ප්‍රතිඵලයක් ලෙස නෙට්ෆ්ලික්ස් ජාලය විසින් ධනාත්මක ප්‍රතිචාරයක් දක්වා ඇති අතර ඔවුන්ගේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම් හි නිකුතුවක් ඉල්ලා ඇත.

- එක්සත් ජාතීන්ගේ සංවිධානය සඳහා වූ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාව වෙනුවෙන් ජාතික දිනය සැමරීම සඳහා නිව්ජර්සි හිදී සහ ඉන්ඩෝ, දීපවාලි සහ නත්තල් උත්සව සැමරීම සඳහා තානාපති කාර්යාල පරිශ්‍රයේදී උත්සව සංවිධානය කරන ලදී.

- ජුනි මාසයේදී, නිව්යෝර්ක් හි ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත කාර්යාලය 'UN Bazaar' වෙළඳ සැණකෙළියට සහභාගි වූ අතර, එහි සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික ආහාර හා හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා සහ අලෙවිය සඳහා තබා තිබුණි. මාර්තු මාසයේදී ශ්‍රී ලංකා සාරි ප්‍රවර්ධනය කිරීමේ සංස්කෘතික උත්සවයක් දූත මණ්ඩල පරිශ්‍රයේදී පවත්වන ලදී.

- නිව්යෝර්ක් බෞද්ධ විහාරයේ ප්‍රධාන නාහිමියන්ගේ අභාවයෙන් පසු නිව්යෝක්හි දූත පිරිස එම අවමංගල්‍ය කටයුතු සඳහා සහාය වූ අතර, වැඳුම් පිදුම් කරන්නන්ට තේ පැන් සංග්‍රහයක්ද පවත්වන ලදී.

6. **කම්කරු සබඳතා**

- ශ්‍රී ලංකා වෘත්තිකයින්ට ඇමරිකා එක්සත් ජනපදයේ සුදුසු රැකියා අවස්ථා සොයා ගැනීමට අවස්ථාව ලබා දීම සඳහා, කොන්සල් ජනරාල් විසින් සකස් කරන ලද රැකියා අවස්ථා, රෙගුලාසි / ගැටලු සහ වෙනත් තොරතුරු පිළිබඳ වාර්තාවක් ශ්‍රී ලංකාවේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට ඉදිරිපත්කරන ලදී.

**කැනඩාව**

1. **ද්විපාර්ශ්වික සබඳතා**

- ශ්‍රී ලංකාව සහ කැනඩාව අතර ගුවන් සේවා ගිවිසුම සකස් කර අවසන් කිරීම පිළිබඳව කොළඹ කැනේඩියානු මහකොමසාරිස් කාර්යාලය සමඟ සාකච්ඡා පැවැත්විණි.
- ශ්‍රී ලංකාව සහ කැනඩාව අතර ද්විපාර්ශ්වික උපදේශන යාන්ත්‍රණය පිළිබඳ අවබෝධතා ගිවිසුමේ පාඨයන් පෙළ ගැස්වීම දෙපාර්ශ්වයම විසින් 2019 දී අවසන් කරන ලද අතර, අත්සන් කිරීම සඳහා ඉදිරි පියවර ගත යුතුව තිබේ.
- මහ කොමසාරිස්වරයා විසින් ශ්‍රී ලංකාවේ සංහිඳියා ක්‍රියාවලියේ වැදගත් වර්ධනයන් සහ ප්‍රධාන ජාතික කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති මූලපිරීම් පිළිබඳව, ෆෙඩරල්, පළාත් සහ නාගරික මට්ටම්වල සිටින ජ්‍යෙෂ්ඨ දේශපාලනයින්, රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ අනෙකුත් මතධාරීන් යනාදී පාර්ශවයන් දැනුවත් කිරීමේ අරමුණින් විධිමත් රැස්වීම්, සම්මන්ත්‍රණ, සාකච්ඡාවන්හිදී සහ වෙනත් අවස්ථාවන්හිදී නිරන්තරයෙන් විස්තර කරනු ලැබීය.
- කැනඩාවේ ගෝලීය කටයුතු පිළිබඳ නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාවකට සහ රාජකීය කැනේඩියානු බලකා පොලිසිය, කැනඩාවේ භාණ්ඩාගාර මණ්ඩලය සහ ඩිජිටල් රජය, කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, කැනේඩියානු විදේශ සේවා ආයතනය (CFSI), කැනඩාවේ

අධිකරණ දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් ප්‍රධාන ආයතනයන් විසින් පැවැත්වූ සාකච්ඡා කිහිපයකට මහකොමසාරිස්වරයා සහභාගි විය.

- 2019 මාර්තු 04 වන දින මොන්ට්‍රියල්, කැල්ගරි, හැලිෆැක්ස් සහ නිව්බ්‍රන්ස්වික් වෙත ශ්‍රී ලංකාව සඳහා නිර්වේතනික කොන්සල්වරුන් සිව්දෙනෙකු පත්කරන ලදී.
- ශ්‍රී ලංකාවෙහි කැනඩා සංවර්ධන ආධාර වැඩසටහනේ කොටසක් ලෙස රාජ්‍ය භාෂා අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලංකා දූත පිරිස විසින් 2019 පෙබරවාරි 17 සිට 28 දක්වා සිදු කළ සංචාරය මහකොමසාරිස්වරයා විසින් සම්බන්ධීකරණය කරන ලදී. නියෝජිත පිරිස කැනේඩියානු නිලධාරීන් සහ කැනේඩියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡා පවත්වන ලදී.
- 2019 මාර්තු 5 සිට 8 දක්වා ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශයේ සිව්දෙනෙකුගෙන් යුත් දූත පිරිසකගේ සාමය ආරක්ෂා කිරීම පිළිබඳ සුහද සංචාරය මහකොමසාරිස්වරයා විසින් සම්බන්ධීකරණය කරනු ලැබීය.
- 2019 මැයි 29 - 31 දක්වා ඔටාවාහි පැවති විවෘත රාජ්‍ය හවුල්කාරිත්ව ගෝලීය සමුළුව 2019 සඳහා අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු. තලතා අතුකෝරල මහත්මියගේ නායකත්වයෙන් යුත් දහ තුන් දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසකගේ සංචාරය මහකොමසාරිස් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරන ලදී.
- 2019 ජුනි 01 සිට 06 දක්වා වැන්කුවර්, බ්‍රිටිෂ් කොලොම්බියා වෙත කාන්තා හා ළමා සංවර්ධන අමාත්‍ය ගරු. චන්ද්‍රානි බන්ඩාර මහත්මිය විසින් සිදු කළ සංචාරය සහ 2019 සැප්තැම්බර් 25 සිට 27 දක්වා ක්විබෙක් මොන්ට්‍රියල්හි පැවති ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) මැතිවරණයට සහභාගීවීම සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු. අර්ජුන රණතුංග මහතා සහ දූත පිරිස විසින් සිදු කළ සංචාරය මහකොමසාරිස් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරන ලදී.
- 2019 ඔක්තෝබර් 18 සිට 19 දක්වා ලංකා බැංකු නියෝජිත පිරිසගේ සංචාරය සහ 2019 නොවැම්බර් 02 සිට 04 දක්වා ඉන්දියානු සාගර සමුද්‍ර කටයුතු සංස්ථාවේ (IOMAC) මහලේකම් ආචාර්ය හිරාන් ඩබ්ලිව්. ජයවර්ධන මහතාගේ සංචාරය මහකොමසාරිස් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරන ලදී.
- විදේශ කටයුතු අමාත්‍යාංශය සහ කැනඩාවේ අධිකරණ දෙපාර්තමේන්තුව අතර පවතින 'අන්‍යොන්‍ය නෛතික සහාය වීම' මහකොමසාරිස් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරන ලදී.
- ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) සහ කැනේඩියානු විදේශ සේවා ආයතනය (CFSI) සමඟ එක්ව කැනඩාවේ තානාපති (විශ්‍රාමික) ඩේවිඩ් ඩෙවින් මහතා විසින් 2019 අප්‍රේල් මාසයේ දී පවත්වනු ලැබූ සතියක පුහුණු වැඩසටහනක් මහකොමසාරිස් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරන ලදී. කැනේඩියානු විදේශ සේවා ආයතනයේ සහාය ඇතිව බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනයෙහි පුහුණු ධාරිතාව ඉහළ නැංවීම සඳහා, බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) සහ කැනේඩියානු විදේශ සේවා ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් සකසා අවසන් කිරීමට පියවර ගෙන ඇත.
- ශ්‍රී ලංකාවේ වැදගත් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව සහ ප්‍රධාන ජාතික කාරණා සම්බන්ධයෙන් රජය ගෙන ඇති පියවර පිළිබඳව ඔන්ටාරියෝ පළාතේ ලුතිනන් ආණ්ඩුකාර ගරු. එලිසබෙත් ඩවුඩ්ස්වෙල්, අමාත්‍යාංශ ප්‍රධානීන් සහ පුහුණු විද්‍යාල හා විශ්වවිද්‍යාලයන්හි අංශ ප්‍රධානීන් වෙත ටොරොන්ටෝහි කොන්සල් ජනරාල් විසින් කරුණු විස්තර කරනු ලැබීය.
- පෞද්ගලික පනත් කෙටුම්පත්හි කෙටුම්පත් අංක 94, 97 සහ 104 සම්බන්ධයෙන්, කොන්සල් ජනරාල්වරයා ඔන්ටාරියෝ අග්‍රාමාත්‍යවරයාගේ සහකාර පළාත් පාර්ලිමේන්තු සාමාජික නෝර්ම් මිලර් මහතා, පළාත් පාර්ලිමේන්තු සාමාජික අරිස්බඛ්කියන් මහතා, පළාත් පාර්ලිමේන්තු සාමාජික අමර්ජොත් සිං මහතා, අග්‍රාමාත්‍ය කාර්යාලයේ විදේශ සම්බන්ධතා සහ අන්තර් රාජ්‍ය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ අනීෂ්ද්වේදි මහතා යන මහත්වරුන් හමුවිය. මෙම විෂය පිළිබඳ විවිධ පළාත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්යාලයේ ස්ථාවර කමිටුවේ කමිටු ලිපිකරුවන් සමඟද කොන්සල් ජනරාල් සම්බන්ධීකරණය වී කටයුතු කරන ලදී.

- කොන්සල් ජනරාල් මාර්ක්හැම් නගරයේ නගරාධිපති ෆ්‍රෑන්ක් ස්කාර්පිටිටි මහතා, මිසිසුගා නගරයේ නගරාධිපති බොනීක්‍රොම්බි මහතා, රිච්මන්ඩ්හිල් නගරයේ නගරාධිපති ඩේව්බැරෝ මහතා, පිකරිං නගරයේ නගරාධිපති ඩේව්රයන් මහතා යන මහත්වරුන් සමඟ සාකච්ඡා පවත්වා ශ්‍රී ලංකාවේ ස්ථාවරය ඔවුන්හට දැනුම් දුන් අතර මහජන සංහාරය පිළිබඳ ප්‍රකාශ කිරීමෙන් වළකින ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියේය. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සංවර්ධනය හා ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය පිළිබඳව කැනඩාවේ ඇමිනෙස්ටි ජාත්‍යන්තරයෙහි ශ්‍රී ලංකා සම්බන්ධීකාරක ජෝන් ආර්ගු මහතා සමඟද සාකච්ඡාවක් පැවැත්විණි.
- ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන්ට පුහුණු අවස්ථා ලබාදීම පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස කොන්සල් ජනරාල් පීල් ආගමේ ප්‍රධානී නිශාන් දුරෙයි අප්පා මහතා හමුවිය.
- වර්ෂ 2019 දී කොළඹ සෙනෙකා විද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන අතර ද්විපාර්ශ්වික සහයෝගීතාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා කොන්සල් ජනරාල් විසින් රැස්වීමක් සංවිධානය කරනු ලැබීය. සෙනෙකා සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම උදෙසා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) සමඟ සාකච්ඡාවක් පැවැත්වීම අරඹයා, සෙනෙකා ඉන්ටර්නැෂනල්හි සභාපති ඩේවිඩ් ඇග්නිව් මහතා 2019 ජනවාරි 13 වන දින ශ්‍රී ලංකාවේ, කොළඹ සංචාරයක නිරත විය. ශ්‍රී ලංකාවේ සෙනෙකා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ සෙනෙකාහි ඉගෙනුම ලබන පෙර දැක්මින් යුතු සිසුන්ට උපදෙස් හා මග පෙන්වීම ලබාදීම සඳහා ශ්‍රී ලංකාවේ ආසියානු ගුවන් සේවා මධ්‍යස්ථානය, සහ සෙනෙකා හවුල් කාරිත්වයකට එළඹ තිබේ.
- කැනේඩියානු රජයේ ආයතන විසින් සංවිධානය කරන ලද වැඩසටහන් 13 ක් වෙනුවෙන් මහකොමසාරිස් කාර්යාලය සිය නියෝජනය ලබාදුන් අතර, වෙනත් කරුණු අතර 2019 පෙබරවාරි 7 වන දින ඔටාවාහිදී කැනඩා ගෝලීය කටයුතු මගින් සිදුකළ ප්‍රතීතන සම්මන්ත්‍රණය, අපනයන සංවර්ධන කැනඩාවෙහි උප සභාපති සහ ප්‍රධාන ආර්ථික විද්‍යාඥ සමඟ පැවති ජාලකරණ දිවාභෝජන සංග්‍රහය, 2019 මැයි 29 - 31 දක්වා ඔටාවා හිෂෝ මධ්‍යස්ථානයේදී පැවති විවෘත රාජ්‍ය හවුල්කාරිත්ව ගෝලීය සමුළුව සහ ආසියා පැසිෆික් සමූහයේ ප්‍රධානීන් සහ රාජ්‍යතාන්ත්‍රික කණ්ඩායමේ පොදුරාජ්‍ය මණ්ඩලීය ප්‍රධානීන් සඳහා පැවති දිවාභෝජන සංග්‍රහ හමුව සහ ආසියා පැසිෆික් සමූහයේ පීඨාධිපති සහ අනෙකුත් සම්භාවනීයයන් විසින් පවත්වන 'Asia Pacific Queen's Ambassadors' Forum' සංසදය ඇතුලත් වේ.
- 2019 මාර්තු 28 - 29 දක්වා ටොරොන්ටෝහි පැවති කාන්තා කළමනාකරණ (WIM) සම්මාන උළෙලේ ප්‍රධාන ආරාධිතයා ලෙස මහකොමසාරිස් සහභාගී විය. මෙම සංචාරයේදී ඔහු ඔන්ටාරියෝහි ව්‍යවස්ථාදායක සභාවේ කථානායක ගරු. ටෙඩ් ආර්නොට් මහතා, ටොරොන්ටෝහි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ව්‍යාපාරික සහ ව්‍යාපෘති ආයෝජක රැන්ඩි අම්බලවනාර් මහතා, ටොරොන්ටෝහි බෞද්ධ, ඉස්ලාමීය හා හින්දු සහ කතෝලික ආයතනවල ප්‍රධාන පූජකවරුන් හමුවිය.

## 2. බහුපාර්ශ්වික සබඳතා

- ක්විබෙක්, මොන්ට්‍රියල්හි සිය මූලස්ථානය පිහිටා තිබෙන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) සම්බන්ධ කාරණා සඳහා මහකොමසාරිස් කාර්යාලය පහසුකම් සපයයි. 2019 පෙබරවාරි 19 වන දින ක්විබෙක්, මොන්ට්‍රියල්හි පිහිටි ICAO මහලේකම් කාර්යාලයේදී, මහකොමසාරිස්වරයා විසින් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) ශ්‍රී ලංකා නියෝජිතයා ලෙස ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) මහලේකම්වරයා වෙත සිය අක්තපත්‍ර පිළිගැන්වීය.
- ක්විබෙක්, මොන්ට්‍රියල්හි 2019 සැප්තැම්බර් 25 - 27 දක්වා පැවති ICAO සමුළුවේ 40 වන සැසිවාරයේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) මැතිවරණයට ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු. අර්ජුන රණතුංග මහතා සහභාගී විය.

## 3. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

ශ්‍රී ලංකාවේ සිට කැනඩාව වෙත 2019 වර්ෂය සඳහා වූ අපනයන ඉලක්කය ඇමරිකානු ඩොලර් මිලියන 232 කි. මහකොමසාරිස් කාර්යාලය සහ ටොරොන්ටෝහි කොන්සල් ජනරාල් විසින් ඇමරිකානු ඩොලර් මිලියන 322.27 ක් උපයා ඇති අතර, එය නියමිත ඉලක්කයට වඩා ඉහළ අගයක් විය. එම අගය 2018 වසර හා සසඳන විට 10.6% ක වර්ධනයකි. (එනම් ඇමරිකානු ඩොලර් මිලියන 291.395කි.)

- මහකොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ එක්ව 2019 මැයි 24 වන දින ප්‍රථම වරට ලංකා තේ සහ කේක් දින්සල පැවැත්වූ අතර, 2019 නොවැම්බර් 22 වන දින විවිධත්ව ශූරතා සම්මාන උළෙලේදී ලංකා තේ ප්‍රවර්ධනය සංවිධානය කරන ලදී.

- 2019 ඔක්තෝබර් 22 වන දින ටොරොන්ටෝහි පැවති සිල්ලර නවෝත්පාදන කැනඩා ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා සමාගම් දහයක නියෝජිතයින්ගෙන් සමන්විත ශ්‍රී ලංකා නියෝජිත පිරිසක් සහභාගී වූහ.

- කොන්සල් ජනරාල් විසින් වෙළඳ විමසීම් 345 ක් සහ එක් වෙළඳ පැමිණිල්ලක් සහ වෙළඳපල තොරතුරු වාර්තා 3 ක් සකස් කරන ලදී. කොන්සල් ජනරාල් විසින් ප්‍රවර්ධනය කරන ලද අංශ අතර මැණික් හා ස්වර්ණාභරණ, විජලනය කළ පලතුරු හා එළවළු සහ ඖෂධ පැළෑටි, ශීත කළ ආහාර, ඇඟලුම් / පිරිමි කපු කමිස සහ තුවා, ස්වාභාවික කුළුබඩු, පොල් නිෂ්පාදන, සිලෝන් තේ / විශේෂ තේ, හරිතාගාර, තවාන් සහ මල් වගා නිෂ්පාදන, කොහු නිෂ්පාදන / පොල්කොහු බහුකාර්ය නිෂ්පාදන, බිස්කට්, චොකලට් සහ වෙනත් රසකැවිලි සඳහා කැනේඩියානු ආනයනකරුවන් ඇතුලත් විය.

- ටොරොන්ටෝහි 2019 අප්‍රේල් 30 සිට මැයි 2 දක්වා පැවති SIAL Canada 2019 -ආහාර හා පානීය අංශයේ ජාත්‍යන්තර ප්‍රදර්ශනය සඳහා වූ ශ්‍රී ලංකා සහභාගීත්වය, විදේශ කටයුතු අමාත්‍යාංශය, අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ වාණිජ දෙපාර්තමේන්තුව සමඟ එක්ව, මහකොමසාරිස් සහ කොන්සල් ජනරාල් විසින් සම්බන්ධීකරණය කරනු ලැබිය.

- අනාගත ආයෝජකයින් සඳහා විවිධ රැස්වීම් 8 ක් 2019 වර්ෂයේ ඊට අදාළ නිලධාරීන් සමඟ කොළඹදී ස්ථාපනය කිරීම උදෙසා, ආයෝජන මණ්ඩලය හා අනෙකුත් රේඛීය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කොන්සල් ජනරාල් විසින් සිදුකරනු ලැබිය.

- ලෝහ ආශ්‍රිත නිෂ්පාදනයන් නිෂ්පාදනය කිරීමට සම්බන්ධ කැනේඩියානු සමාගමක් වන 'Ni-Met Metals Inc' සමාගම ත්‍රිකුණාමලය-කප්පල්තුරෙයි කාර්මික වතුයායේදී ලෝහ කැබලි ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද එම ව්‍යාපෘතිය කැනේඩියානු ඩොලර් මිලියන 35 ක ආයෝජනයකි.

- සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් 2019 මාර්තු 30 සිට 31 දක්වා ඔටාවාහි සංචාරක හා නිවාඩු ප්‍රදර්ශනයේ පැවති ශ්‍රී ලංකා පොළ, මහකොමසාරිස් කාර්යාලය විසින් මෙහෙයවනු ලැබිය.

- 2019 ඔක්තෝබර් 25 සිට 27 දක්වා මොන්ට්‍රියල්හි පැවති ජාත්‍යන්තර සංචාරක හා චාරිකා ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එක්ව මහකොමසාරිස් කාර්යාලය සහභාගී විය.

## 4. සංස්කෘතික සබඳතා

- 2019 ජනවාරි 01 වන දින ඔටාවා හි පැවති ආගමික ආයතන විසින් සංවිධානය කරන ලද නව වසර සඳහා ආශිර්වාද උළෙල, 2019 ජනවාරි 05 වන දින පැවති ශ්‍රී ලංකා ප්‍රජා උත්සව රාත්‍රී නර්තන සාදය, 2019 ජනවාරි 12 වන දින පැවති තෙයිපොංගල් සැමරුම, සර්ව රාත්‍රික පිරිත් සජ්ජායනා උත්සවය සහ 2019 අප්‍රේල් 13 සහ අප්‍රේල් 14 වන දින පැවති සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උත්සවය යන උත්සව සඳහා මහකොමසාරිස් වරයා සහභාගි විය.

- 71 වන නිදහස් දින සංවත්සරය 2019 පෙබරවාරි 4 වන දින කැනඩාවේ මහකොමසාරිස් නිල නිවාස පරිශ්‍රයේදී සහ ටොරොන්ටෝ නගර සභා නිල නිවාස පරිශ්‍රයේදී සමරනු ලැබීය. රාජ්‍ය තාන්ත්‍රික පිළිගැනීමේ උත්සවය 2019 පෙබරවාරි 11 වන දින ප්‍රධාන ආරාධිතයා ලෙස කැනඩාවේ විදේශ කටයුතු, වෙළඳ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ (DFATD) සහකාර නියෝජ්‍ය අමාත්‍ය / ආසියා පැසිෆික්, ඩොනල්ඩ් බොඩියාෂ් මහතාගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

- ආරාධිත කථිකයා ලෙස ඔටාවාහි කාල්ටන් විශ්වවිද්‍යාලයේ සහකාර මහාචාර්ය ධුරය හොබවන මහාචාර්ය නොයෙල් සැල්මන්ඩ් මහතාගේ සහභාගිත්වයෙන් යුතුව 2019 මාර්තු 16 වන දින පැවති "ත්‍රිපිටක" උත්සවය මහකොමසාරිස් විසින් සංවිධානය කරන ලදී.

- 2019 අප්‍රේල් 16 වන දින පන්සල් භූමියේ බුදුපිළිමය විනාශ කිරීමෙන් අනතුරුව හිල්ඩා ජයවර්ධනාරාමය විහාරස්ථානයට ගිය වැඩ බලන මහකොමසාරිස්වරයා නේවාසික භික්ෂූන් වහන්සේලාට සිය සහාය ලබා දුන්නේය. බෞද්ධ විහාරස්ථාන සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් අදාළ බලධාරීන් සමඟ කටයුතු කිරීමද ඇතුලත්ව, එවැනි ගැටලු සඳහා අවශ්‍ය සහායද මහකොමසාරිස් කාර්යාලය විසින් ලබාදුනි.

- 2019 පෙබරවාරි 09 වනදින ඔටාවා විශ්ව විද්‍යාලයේ පැවති ජාත්‍යන්තර සංවර්ධන සතිය (IDW) සමුළුව 2019, 2019 අප්‍රේල් 27 දින පැවති සිංහල උරුමයන් පිළිබඳ දිනය සමාරම්භක උළෙල, සහ අලුත් අවුරුදු පිළිගැනීමේ උළෙල, 2019 මැයි 18 වන දින පාර්ලිමේන්තු ගරු. මන්ත්‍රී චන්ද්‍ර ආර්යා මහතා විසින් පාර්ලිමේන්තු හිල් හිදී සංවිධානය කළ වෙසක් වැඩසටහන, 2019 මැයි 26 දින පැවති තවත් වාර්ෂික වෙසක් වැඩසටහන් දෙකක්, කැනඩාවේ ප්‍රගතිශීලී මුස්ලිම්වරුන්ගේ සංගමය විසින් 2019 ජුනි 13 වන දින පැවැත්වූ 24 වන වාර්ෂික පාර්ලිමේන්තු හිල් ඊඩ් උත්සවය, ඔටාවාහි ශ්‍රී ලංකා කැනඩාවේ සංගමය විසින් සංවිධානය කරන ලදුව 2019 ජුනි 15 වන දින පැවැත් විය.

- ශාන්ත අන්තෝනි පල්ලියේ මංගල්‍යය "ඔටාවා හි කොච්චිකඩේ" සහ 2019 ජූලි 22 වන දින ඔටාවා බෞද්ධ විහාරයේ පැවති භික්ෂූන්වහන්සේලාට වස් වැසීමට ආරාධනා කිරීම / වස් කාලය ආරම්භ කිරීමේ උත්සවය සහ දූත මණ්ඩල කලතුයන්ගේ සංගමයේ ප්‍රධානීන්ගේ සත්කාරකත්වයෙන් යුතුව 2019 ජුනි 11 වන දින පවත්වන ලද ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ආහාර ද්‍රව්‍ය සහිත අරමුදල් රැස්කිරීමේ උත්සවය සඳහා මහකොමසාරිස්වරයා සහභාගි විය.

- 2019 ජූලි 27 වන දින ටොරොන්ටෝහි පැවති ඔන්ටාරියෝ ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්ගේ සංගමයේ (OSPA) වාර්ෂික මහා සභා රැස්වීමට මහකොමසාරිස් වරයා සහභාගී විය. මෙම සංචාරය අතරතුර, 2019 ජූලි 28 වන දින කැනඩාවේ ශ්‍රී ලංකා කතෝලික සංගමය විසින් මිඩ්ලන්ඩ් හි පැවැත්වූ ශ්‍රී ලංකා දිනයටද මහකොමසාරිස්වරයා සහභාගී විය.

- 2019 අගෝස්තු 04 වන දින පැවති ත්‍රිත්ව නගර ක්‍රිකට් තරඟාවලිය සඳහා වන සම්මාන උළෙල, 2019 අගෝස්තු 11 වන දින ක්විබෙක්, මොන්ට්‍රියල්හි මොන්ට්‍රියල් බෞද්ධ සංගමය විසින් පැවැත්වූ සංස්කෘතික මිත්‍රත්ව උළෙල, 2019 සැප්තැම්බර් 08 වන දින ටොරොන්ටෝ හි කොන්සල් කාර්යාලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා දිනය සහ ඔටාවා බෞද්ධ විහාරය

විසින් 2019 සැප්තැම්බර් 22 දින සංවිධානය කරන ලද ආහාර ප්‍රදර්ශනය, 2019 නොවැම්බර් 13 වන දින කැනඩාවේ විදේශ කටයුතු, වෙළඳ හා සංවර්ධන දෙපාර්තමේන්තු DFATD (කැනඩා ගෝලීය කටයුතු) පරිශ්‍රයේදී පවත්වන ලද ජාත්‍යන්තර ආහාර ප්‍රදර්ශනය සහ ශ්‍රී ලංකා ප්‍රජාව විසින් සංවිධානය කරන ලදුව 2019 නොවැම්බර් 02 දින කයිලාෂ් මිටල් රඟහලේ දී පැවති ඔටාවා සංගීත රාත්‍රිය 2019 සඳහා මහකොමසාරිස්වරයා සහභාගි විය.

- පාස්කු ඉරිදා ප්‍රහාරයන් ට ගොදුරු වූවන්ට උපහාර දැක්වීම පිණිස දේව මෙහෙයක් සහ අනුස්මරණ අවස්ථාවක් 2019 අප්‍රේල් 28 වනදින ඕර්ලියන්ස් හි ගුඩ් ෂෙපර්ඩ් දේවස්ථානයේදී මහකොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කර පවත්වන ලදී. කොන්සල් ජනරාල් කාර්යාලය 'Our Lady of Miraculous Medal Catholic Church' කතෝලික දේවස්ථානයේදී දේව මෙහෙයක් සහ අනුස්මරණ අවස්ථාවක් සංවිධානය කළ අතර, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංගම් විසින් සංවිධානය කරන ලද ආගමික වැඩසටහන් කිහිපයකට සහභාගී විය.

- 2019 ඔක්තෝබර් 12 වන දින පැවති භරත නාට්‍යම් අරන්ගේත්‍රම් උළෙලේ ප්‍රධාන ආරාධිතයා ලෙස සහ 2019 අගෝස්තු 18 වන දින ඔටාවා හි ශ්‍රී ලංකා කැනඩා සංගමය (SLCAO) විසින් පවත්වන ලද සය සාමාජික ක්‍රිකට් තරඟාවලියට මහකොමසාරිස්වරයා සහභාගී විය.

- 2019 ඔක්තෝබර් 19 දින ඔටාවා බෞද්ධ විහාරයේ පැවති වාර්ෂික කඨින මහෝත්සවයේ සත්කාරකත්වය මහකොමසාරිස්වරයා විසින් සිදුකරන ලදී. 2019 ඔක්තෝබර් 22 වන දින ඔර්ලියන්ස් හි ඔටාවා ථේරවාද බෞද්ධ විහාරයේ සහ ඔටාවා බෞද්ධ විහාරයේදී නාගොඩ සද්ධාලෝක හිමිපාණන් විසින් පවත්වන ලද ධර්ම දේශනය සංවිධානය කරන ලද අතර, 2019 ඔක්තෝබර් 26 දින හිල්ඩා ජයවර්ධනාරාම බෞද්ධ ආරාමය විසින් සංවිධානය කරන ලද වාර්ෂික කඨින උත්සවයට මහකොමසාරිස් වරයා සහභාගී විය.

- 2019 නොවැම්බර් 30 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු. චන්ද්‍ර ආර්යා මහතා විසින් සංවිධානය කරන ලද පාර්ලිමේන්තු හිල්හි පැවති හින්දු උරුම දිනයට මහකොමසාරිස්වරයා සහභාගි වූ අතර, 2019 දෙසැම්බර් 01 වන දින කාල්ටන් විශ්ව විද්‍යාලයේ කයිලාෂ් මිට්ටාල් රඟහලේ පැවති පේගතිශ්වරලය ලලිත කලා මධ්‍යස්ථානයේ වාර්ෂික දින සැමරුමෙහි ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූ අතර, ඔටාවා ශ්‍රී ලංකා කතෝලික යාච්ඤා කණ්ඩායම විසින් 2019 දෙසැම්බර් 21 දින සංවිධානය කරන ලද 'Christmas with Christ' / ක්‍රිස්තු තුමා සමඟ නත්තල් වැඩසටහනට සහභාගි විය.

- 2019 දෙසැම්බර් 22 වනදින ඔර්ලියන්ස් හි ගුඩ් ෂෙපර්ඩ් දේවස්ථානයේදී පැවති වාර්ෂික නත්තල් සැමරුම් උත්සවය කොන්සල් ජනරාල් විසින් සංවිධානය කරන ලදී. 2019 අප්‍රේල් 21 දින ශ්‍රී ලංකා-කැනඩා ටොරොන්ටෝ සංගමය (CSLA) විසින් සංවිධානය කරන ලද සිංහල සහ දෙමළ අලුත් අවුරුදු සැමරුම් උත්සවයට සහභාගී විය, ටොරොන්ටෝහි ප්‍රධාන බෞද්ධ විහාරස්ථානයන්හි මැයි මාසයේදී පැවති වාර්ෂික වෙසක් හා පොසොන් සැමරුම් සඳහා, වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා දායකත්වය සපයා සහභාගි වූ අතර, ටොරොන්ටෝහි ප්‍රධාන බෞද්ධ විහාරස්ථාන තුනෙහි පැවති "ත්‍රිපිටකාභිවන්දනා" උළෙල සංවිධානය කරන ලදී.

- 2019 සැප්තැම්බර් 08 වන දින ටොරොන්ටෝ, ස්කාර්බොරෝ හිදී ටොරොන්ටෝ පොලිස් පර්සෙවල් කමින්ස් ක්‍රිකට් පිටියේ දී පැවති 'ශ්‍රී ලංකා දිනය', කොන්සල් ජනරාල්, ටොරොන්ටෝ පොලිස් ප්‍රජා හවුල්කාරිත්ව හා බැඳීම් ඒකකය සහ ටොරොන්ටෝ පොලිස් ක්‍රිකට් සමාජය සමඟ එක්ව සංවිධානය කරන ලදී.

## 5. කම්කරු සුබසාධනය

- රැකියා අවස්ථාවන්, රැකියා අවස්ථා පිරිනැමීම් වල සත්‍යතාව, සේවා යෝජකයින්ගේ / සමාගම්වල විශ්වසනීයත්වය සහ සංක්‍රමණික අපේක්ෂකයින් පිළිබඳ ප්‍රශ්න 15 කට සහ ඉල්ලීම් වලට මහකොමසාරිස්වරයා ප්‍රතිචාර දක්වා ඇත.
- නියෝජිතයින් හරහා කැනඩාවේ රැකියා අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයින් හට මහකොමසාරිස් සහ කොන්සල්ජනරාල් විසින් සහාය ලබා දී ඇත. කැනේඩියානු සමාගම් විසින් සේවයේ යොදවා ඇති ශ්‍රී ලාංකිකයින් හට ඔවුන්ගේ සුභසාධනය පිළිබඳ අවශ්‍ය සහාය කොන්සල් ජනරාල් විසින් ලබා දුන් අතර, අනාගත සේවායෝජකයින් සහ රැකියා අවස්ථා පහසුකම් සපයන්නන් අතර දැනුවත්භාවය ඇතිකිරීම සඳහා එහි අන්තර් ක්‍රියාකාරිත්වය අඛණ්ඩව සිදුකරනු ලැබීය.

# ලතින් ඇමරිකා හා කැරිබියානු අංශය

## ලතින් ඇමරිකා හා කැරිබියානු අංශය

### හැඳින්වීම

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ දී ලතින් ඇමරිකා හා කැරිබියානු අංශය මෙන්ම, එම අංශයේ විෂය පථය යටතට ගැනෙන දූත මණ්ඩල ද, ශ්‍රී ලංකාව සහ ලතින් ඇමරිකා හා කැරිබියානු කලාපයට අයත් රටවල් අතර දේශපාලන, ආර්ථික හා සංස්කෘතික මෙන්ම පුද්ගලාන්තර සබඳතා වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කළේය.

### භෞමික ආවරණය: 33

බ්‍රසීලය, කියුබාව, ඇන්ටිගුවා සහ බාබුඩා, ආර්ජන්ටිනාව, බහමාස්, බාබඩෝස්, බෙලීස්, බොලිවියාව, චිලී, කොලොම්බියාව, කොස්ටාරිකාව, පොදුරාජ්‍ය මණ්ඩලයීය ඩොමිනිකාව, ඩොමිනිකන් ජනරජය, ඉක්වදෝරය, එල් සැල්වදෝරය, ග්‍රෙනාඩා, ග්වාතමාලාව, ගයනා, හයිටි, හොන්ඩුරාස්, ජැමෙයිකාව, මෙක්සිකෝව, නිකරගුවාව, පැනමාව, පැරගුවේ, පේරු, ශාන්ත කිට්ස් සහ නෙවිස්, ශාන්ත වින්සන්ට් සහ ග්‍රෙනඩින්ස්, ශාන්ත ලුසියා, සුරිනාම්, ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ, උරුගුවේ, වෙනිසියුලාව.

### කලාපය තුළ පවතින නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව: 02

බ්‍රසිලියා - බ්‍රසීලය

හවානා - කියුබාව

### සමගාමී අක්තගැන්වීම:

බ්‍රසිලියා, බ්‍රසීලය - ආර්ජන්ටිනාව, කොලොම්බියාව, පැරගුවේ, සුරිනාම්.

හවානා, කියුබාව - පොදුරාජ්‍ය මණ්ඩලයීය ඩොමිනිකාව, ඩොමිනිකන් ජනරජය, ඉක්වදෝරය, එල් සැල්වදෝරය, හයිටි, හොන්ඩුරාස්, ජැමෙයිකාව, පැනමාව, වෙනිසියුලාව.

වොෂිංටන් ඩී.සී. - ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ

නිව්යෝක් හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය නියෝජිත - බහමාස්

### (1) ද්විපාර්ශ්වික සබඳතා:

සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී ලතින් ඇමරිකා හා කැරිබියානු කලාපයට අයත් රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල, කොළඹ පිහිටි ලතින් ඇමරිකා හා කැරිබියානු කලාපයට අයත් රටවල නේවාසික දූත මණ්ඩල මෙන්ම, නවදිල්ලි නුවර පිහිටි එම කලාපයේ රටවල් සඳහා සමගාමීව අක්තගන්වන ලද දූත මණ්ඩල සමඟ සමීප සම්බන්ධීකරණයෙන් යුතුව, මෙම අංශය ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ද්විපාර්ශ්වික සබඳතා මෙන්ම, පුද්ගලාන්තර සබඳතා වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කළේය.

මෙම කාලසීමාව තුළ දී විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු. වසන්ත සේනානායක මැතිතුමා රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිළිබඳ 60 වැනි සංවත්සරය සැමරීම පිණිස 2019 ජූනි මස 25-29 දිනවල දී කියුබාවේ ද, ජූනි 30 වැනි දින පැනමාවේ ද, 2019 ඔක්තෝබර් 3-6 දිනවල දී වෙනිසියුලාවේ ද සිදුකළ සංචාර, ශ්‍රී ලංකාව හා මෙම රටවල් අතර ද්විපාර්ශ්වික සබඳතා ඉහළ නැංවීමට උපකාරී විය.

2019 අගෝස්තු 24-28 දිනවල දී පැවති, ආසියාව, මැද පෙරදිග හා ඕෂනියාව යන රටවල් සඳහා වෙනිසියුලාවේ විදේශ කටයුතු පිළිබඳ උප අමාත්‍ය රූබන් ඩාරියෝ මොලිනා මැතිතුමාගේ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සංචාරය සඳහා මෙම අංශය මඟින් පහසුකම් සලසන ලදී.

ශ්‍රී ලංකාව, 2019 මැයි 15 වැනි දින නිකරගුවාව සමඟ ද, 2019 ජූනි 25 වැනි දින ශාන්ත ලුසියා සමඟ ද, 2019 ජූනි 28 වැනි දින බාබඩෝස් සමඟ ද, එම රටවල් තුනේ තානාපතිවරුන් සහ නිව්යෝර්ක් හි තානාපති හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාව සඳහා නිත්‍ය නියෝජිතවරයා අතර

ගිවිසුම්වලට අත්සන් තැබීම තුළින් රාජ්‍යතාන්ත්‍රික සබඳතා ගොඩනඟා ගත්තේය. මෙම කාල සීමාවේ දී පහත සඳහන් අනේවාසික නම්කරන ලද තානාපතිවරු සිය අක්තපත්‍ර ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාට පිළිගැන්වූහ.

- ආර්ජන්ටිනාවේ ඩැනියෙල් චුබුරු මැතිතුමා 2019 මැයි 06 වැනි දින
- කොලොම්බියාවේ ක්ලෙමන්සියා යුක්‍රොස් මැතිතුමා,
- එල් සැල්වදෝරයේ ඒරියල් ගැලින්ඩෝ මැතිතුමා,
- ගයනාවේ ආචාර්ය ඩේවිඩ් පොලාර්ඩ් මැතිතුමා 2019 පෙබරවාරි 01 වැනි දින
- චිලී හි ජුවාන් මොන්සල්වි මැතිතුමා,
- වෙනිසියුලාවේ කොරොමොටෝ කැල්ඩරන් මැතිතුමා 2019 ඔක්තෝබර් 03 වැනි දින

**බ්‍රසීලය**

i. ලතින් ඇමරිකා හා කැරිබියානු කලාපයට අයත් වඩාත්ම වැදගත් රටවල් දෙකෙන් එකක් වන්නේ බ්‍රසීලයයි. මෙම කාල පරිච්ඡේදය තුළ දී, බ්‍රසීලයේ පිහිටි අපගේ තානාපති කාර්යාලය හරහා බ්‍රසීලය සහ ශ්‍රී ලංකාව වෙත සමගාමීව අක්තගන්වා ඇති ආර්ජන්ටිනාව, කොලොම්බියාව, පැරගුවේ සහ සුරිනාම් යන රටවල් සමඟ ශ්‍රී ලංකාව ද්විපාර්ශ්වික දේශපාලන සබඳතා පවත්වාගන්නා ලදී. බ්‍රසීලයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සත්කාරක රටේ විදේශ කටයුතු අමාත්‍යාංශය, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟ මෙන්ම සමගාමීව අක්තගන්වන ලද රටවල් සමඟ ද ඉහළ පෙළේ සබඳතා පවත්වා ගන්නා ලදී. මෙම අමාත්‍යාංශය, බ්‍රසිලියාහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අනුග්‍රහය ඇතිව චිලී. ගයනා, උරුගුවේ හා බොලිවියාව ඇතුළු කලාපයේ අනෙකුත් රටවල් සමඟ ආර්ථික සහයෝගීතාවය තවදුරටත් වර්ධනය කිරීම ඇතුළුව අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන කරුණු සම්බන්ධයෙන් නියැලී කටයුතු කළේය.

ii. 2020 වසරේ දී එළඹෙන ශ්‍රී ලංකාව හා බ්‍රසීලය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතාවල 60 වැනි සංවත්සරය සැමරීමට සූදානම් වීම මෙම අමාත්‍යාංශය මෙන්ම තානාපති කාර්යාලය ද විසින් සම්බන්ධීකරණය කරන ලදී. මේ සඳහා උත්සව මාලාවක් සංවිධානය කිරීම පිණිස බ්‍රසිලියාහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය බ්‍රසීල විදේශ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා පැවැත්වීය. දේශපාලන උපදේශන සඳහා සුදුසු යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම පිළිබඳව ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශය හා බ්‍රසීල විදේශ අමාත්‍යාංශය අතර 2011 දී අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමට අනුව, ශ්‍රී ලංකාව හා බ්‍රසීලය අතර පළමු වටයේ ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන 2020 වසරේ දෙවැනි භාගයේ දී බ්‍රසීලයේ දී කැඳවීම ද මීට ඇතුළත් විය. 2020 දී මෙම 60 වැනි සංවත්සරය සැමරීම සඳහා විදේශ අමාත්‍යාංශ මට්ටමින් ඉහළ පෙළේ සංචාරයන් හුවමාරු කර ගැනීම සඳහා යෝජනාවක් ද ඉදිරිපත් කරන ලදී.

iii. අභිනවයෙන් පත් වූ ජනාධිපතිවරුන් වන බ්‍රසීලයේ අතිගරු ජයිර් බොල්සොනාරෝ මැතිතුමාගේ සහ ආර්ජන්ටිනාවේ අතිගරු ඇල්බර්ටෝ ෆර්නැන්ඩස් මැතිතුමාගේ ජනාධිපති පදවි ප්‍රාප්ති උළෙල සඳහා පිළිවෙලින් 2019 ජනවාරි 01 වැනි දින සහ 2019 දෙසැම්බර් 10 වැනි දින බ්‍රසිලියා හි ශ්‍රී ලංකා තානාපති එම්. එම්. ජෆීර් මැතිතුමා සහභාගී විය.

iv. බ්‍රසිලියාවේ සිටින ශ්‍රී ලංකා තානාපතිවරයා 2019 අප්‍රේල් 23 වැනි දින පැරගුවේ ජනරජයේ සහ 2019 සැප්තැම්බර් 12 වැනි දින කොලොම්බියාවේ රාජ්‍ය නායකයින් වෙත සිය අක්තපත්‍ර පිළිගැන්වූ අතර, මෙම රටවල් සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික සබඳතා පුළුල් කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා අදාළ බලධාරීන් සමඟ රැස්වීම් ගණනාවක් පැවැත්වීය.

v. බ්‍රසීලයේ පිහිටි තානාපති කාර්යාලය බොලිවියාව හා ගයනාව සඳහා අක්තගැන්වීම විධිමත් කිරීම පිණිස මෙම අංශය කටයුතු කළ අතර, ඒ සම්බන්ධයෙන් එම දෙරටේ එකඟතාවය ලබා ගැනීම ඉතිරි වී ඇත. උරුගුවේහි බලධාරීන්ගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව, බ්‍රසිලියා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය උරුගුවේ සඳහා සමගාමීව අක්ත ගැන්වීම විධිමත් කරන ලදී.

vi. බ්‍රසිලියාහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, බ්‍රසීලයේ පිහිටි නිර්වේතනික කොන්සාල් කාර්යාල ජාලය එනම්, රියෝ ද ජැනෙයිරෝ, සාවෝ පෝලෝ සහ බහියා සමඟ ද, දකුණු ඇමරිකාවේ වෙනත් රටවල එනම්, ආර්ජන්ටිනාවේ - බුවනෝස් අයිරස්, කොලොම්බියාවේ - බොගෝටා, සුරිනාමිහි - පරාමාරිබෝ, චිලිහි - සන්තියාගෝ සහ පේරුහි - ලීමා යන නගරවල පිහිටි නිර්වේතනික කොන්සාල් කාර්යාල සමඟ ද සක්‍රිය ලෙස නියැලී කටයුතු කළේය.

vii. බ්‍රසීලය සමඟ මෙන්ම සමගාමීව අක්තගන්වා ඇති රටවල් සමඟ අත්සන් තබා ඇති අධ්‍යාපනය, විද්‍යාත්මක හා තාක්ෂණික සහයෝගීතාවය, කෘෂිකර්මාන්තය සහ වීසා බලපත් නිදහස් කිරීම යන ක්ෂේත්‍ර පිළිබඳ ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය සහ බ්‍රසිලියාහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පසුවිපරම් කටයුතු සිදුකරන ලදී.

**කියුබාව**

i. දීර්ඝකාලීන ඓතිහාසික සබඳතා මෙන්ම, බහුපාර්ශ්වික වේදිකාවල දී කියුබාව විසින් ඉටුකරන ලද උපායමාර්ගික කාර්යභාරය නිසා කියුබාව අබණ්ඩව ශ්‍රී ලංකාව සඳහා වැදගත් රටක් ලෙස පවතී. කියුබාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ වෙනත් රාජ්‍ය ආයතන සමඟ පවතින සබඳතා ධනාත්මකව මැදිහත්වීම හරහා ශක්තිමත් කර ගැනීම මඟින් එරට රජය සමඟ සමීප මිත්‍රශීලී සබඳතා අබණ්ඩව පවත්වාගෙන යාමට ලතින් ඇමරිකා හා කැරිබියානු අංශය සහ හවානාහි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමත් විය. ශ්‍රී ලංකාවේ නව තත්ත්වයන් පිළිබඳව යාවත්කාලීන කිරීම සඳහා එම තානාපති කාර්යාලය ද කියුබානු දේශපාලන නායකත්වය සමඟ නිරන්තර සාකච්ඡා පැවැත්වීය.

ii. ලතින් ඇමරිකා හා කැරිබියානු අංශය සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව, හවානාහි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, 2019 ජූලි 29 වැනි දිනට සනිටුහන් වූ ශ්‍රී ලංකාව හා කියුබාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කිරීම පිළිබඳ 60 වැනි සංවත්සරය සැමරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සංවිධානය කරන ලදී:

- ශ්‍රී ලංකාව හා කියුබාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කිරීම පිළිබඳ 60 වැනි සංවත්සරයට සමගාමීව 2019 ජූනි 25-29 දිනවල දී පැවති විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු. වසන්ත සේනානායක මැතිතුමාගේ කියුබානු නිල සංචාරය.

- මෙම සංචාරය අතරතුර දී, රාජ්‍ය අමාත්‍යවරයා කියුබානු විදේශ කටයුතු අමාත්‍ය බෘනෝ එඩුවාර්ඩෝ රොඩ්‍රිගස් පරිල්ලා මැතිතුමා සමඟ මෙන්ම, කියුබාවේ විදේශ කටයුතු පිළිබඳ පළමු උප අමාත්‍ය මාර්සෙලිනෝ මෙඩිනා ගොන්සාලෙස් මැතිතුමා සමඟ ද අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවන් දක්වන කරුණු පිළිබඳව ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීය.

- මෙම ද්විපාර්ශ්වික සාකච්ඡාවේ දී ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය (LKI) හා කියුබාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ රාවුල් රෝවා ගාර්ෂියා ආයතනය අතර අවබෝධතා ගිවිසුමකට ද අත්සන් තබන ලදී. මෙම අවබෝධතා ගිවිසුම මඟින්, මෙම ආයතන දෙක අතර අධ්‍යයන ශාස්ත්‍රීය සහයෝගීතාව සහ පර්යේෂණ කටයුතු සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

- මෙම 60 වැනි සංවත්සරය නිමිත්තෙන් 'ජනතාව සමඟ මිත්‍රත්ව කියුබානු ආයතනය' (ICAP) සමඟ එක්ව සංවිධානය කරන ලද සාකච්ඡාවකට ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා මෙන්ම කියුබාවේ විදේශ කටයුතු පිළිබඳ උප අමාත්‍යවරයා ද සහභාගී වූහ.

- මෙම සංචාරය අතරතුර දී, රාජ්‍ය අමාත්‍යවරයා ශ්‍රී ලංකාව හා කියුබාව අතර පවත්නා සදාකාලික මිත්‍රත්වය හා සහයෝගීතාව සංකේතවත් කරමින් 2019 ජූනි 28 වැනි දින සැන්ටා ක්ලාරා හි පිහිටි චේ ගුවේරා සමරුව අසබඩ මැහොගනි ශාකයක් රෝපණය කළේය.

- හවානා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මඟින්, කීර්තිමත් සූපවේදී පබ්ලිස් සිල්වා මහතාගේ සහභාගිත්වයෙන් යුතුව මවුන්ට් ලැවිනියා හෝටලය සමඟ එක්ව ග්‍රෑන්ඩ් හොටේල් මන්සානා කෙම්පිස්කි හෝටලයේ දී 2019 ජූනි 28 වැනි දින ආහාර පාන උත්සවයක් සංවිධානය කිරීම.

- "60 වසරක සමෘද්ධිමත් මිත්‍රත්වය" නමින් වාර්තා චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම සඳහා කියුබාවේ 'ප්‍රෙන්සා ලැටිනා නිව්ස් ඒජන්සි' ආයතනයේ මාධ්‍යවේදීන් කණ්ඩායමක් 2019 නොවැම්බර් මස දී ශ්‍රී ලංකාවට පැමිණීම. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මෙම ව්‍යාපෘතියට සහයෝගය ලබා දී තිබේ.

iii. 2019 ජනවාරි 27 වැනි දින කියුබාවට බලපෑ සුළි සුළඟින් සිදු වූ විනාශයෙන් අනතුරුව, ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය කියුබානු රජයට ඇමරිකානු ඩොලර් 50,000 ක පරිත්‍යාගයක් කළේය.

iv. පොදුරාජ්‍ය මණ්ඩලයීය ඩොමිනිකාව, හයිටි, හොන්ඩුරාස් හා පැනමා යන රටවල් සමගාමීව අක්තගැන්වීම පිළිබඳ කටයුතු ලතින් ඇමරිකා හා කැරිබියානු අංශය විසින් හවානාහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා නිම කරන ලදී.

**එල් සැල්වදෝරය**

i. එල් සැල්වදෝරය සඳහා සමගාමීව අත්කගන්වා සිටින කියුබාවේ ශ්‍රී ලංකා තානාපති රත්නපාල ලියනගමගේ මැතිතුමා 2019 ජූනි 03 වැනි දින පැවති එල් සැල්වදෝරයේ ජනාධිපති පදවි ප්‍රාප්ති උළෙලට උත්සවයට ශ්‍රී ලංකාවේ රජය නියෝජනය කරමින් සහභාගී විය.

ii. ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාවන්ගේ නිදන්ගත වකුගඩු රෝගය (CKDu) සම්බන්ධ පර්යේෂණ පිළිබඳ අධ්‍යයන චාරිකාවක් සංවිධානය කිරීම සඳහා 2019 වසරේ දී සාකච්ඡා පැවැත්වූ අතර, එහි පළමු පියවර ලෙස එල් සැල්වදෝරයේ වෛද්‍ය කණ්ඩායමක් 2020 වසරේ දී ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතය.

**ඩොමිනිකානු ජනරජය**

i. ඩොමිනිකානු ජනරජය සඳහා සමගාමීව අක්තගන්වා සිටින කියුබාවේ ශ්‍රී ලංකා තානාපති රත්නපාල ලියනගමගේ මැතිතුමා 2019 ඔක්තෝබර් 10 වැනි දින ඩොමිනිකානු ජනරජයේ රාජ්‍ය නායකයා වෙත සිය අක්තපත්‍ර පිළිගැන්වීය.

ii. ශ්‍රී ලංකාව හා ඩොමිනිකානු ජනරජය අතර රාජ්‍යතාන්ත්‍රික හා නිල විදේශගමන් බලපත්‍ර සඳහා අන්‍යෝන්‍ය වශයෙන් වීසා බලපත්‍ර නිදහස් කිරීම සම්බන්ධයෙන් ගිවිසුමක් අත්සන් කිරීම සඳහා යෝජනාවක් ඩොමිනිකානු ජනරජය පාර්ශ්වය වෙත දැනුම් දී ඇති අතර, යෝජිත ගිවිසුම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව එහි එකඟතාවය පළ කොට ඇත. මෙම කරුණ ක්‍රියාත්මක වෙමින් පවතී.

**වෙනිසියුලාව**

i. 2019 අගෝස්තු 24-28 දිනවල දී පැවති, ආසියාව, මැද පෙරදිග හා ඕෂනියාව යන රටවල් සඳහා වෙනිසියුලාවේ විදේශ කටයුතු පිළිබඳ උප අමාත්‍ය රූබන් ඩාරියෝ මොලිනා මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය ලතින් ඇමරිකා හා කැරිබියානු අංශය මඟින් සංවිධානය කරන ලදී. මෙම සංචාරය අතරතුර දී උප අමාත්‍යවරයා ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සහ මෙම අමාත්‍යාංශයේ උසස් නිලධාරීන් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීය.

ii. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු. වසන්ත සේනානායක මැතිතුමා 2019 ඔක්තෝබර් 03-06 දිනවල දී වෙනිසියුලාවේ සංචාරයක යෙදුණේය. මෙම සංචාරය අතරතුර දී රාජ්‍ය අමාත්‍යවරයා වෙනිසියුලාවේ ජනාධිපති අතිගරු නිකොලස් මදුරෝ මැතිතුමා බැහැදැකීය. රාජ්‍ය අමාත්‍යවරයා මෙම සංචාරය අතරතුර දී සංචාරක කටයුතු සඳහා මහජන බලය පිළිබඳ අමාත්‍ය ෆීලික්ස් ප්ලැසෙන්ෂියා මැතිතුමා සහ වෙනිසියුලාවේ විදේශ කටයුතු උප අමාත්‍ය රූබන් ඩාරියෝ මොලිනා මැතිතුමා ද හමුවිය.

iii. වෙනිසියුලාව සඳහා සමගාමීව අක්තගන්වා සිටින කියුබාවේ ශ්‍රී ලංකා තානාපති රත්නපාල ලියනගමගේ මැතිතුමා 2019 ජූලි 18 වැනි දින වෙනිසියුලාවේ රාජ්‍ය නායකයා වෙත සිය අක්තපත්‍ර පිළිගැන්වීය.

iv. තානාපති රත්නපාල ලියනගමගේ මැතිතුමා, ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායමේ නායකයා ලෙස ශ්‍රී ලංකාව නියෝජනය කරමින් 2019 ජූලි මස වෙනිසියුලාවේ දී පැවති නොබැඳි ව්‍යාපාරයේ (NAM) සම්බන්ධීකරණ කාර්යංශයේ අමාත්‍ය රැස්වීමට සහභාගී විය.

**පැනමාව**

i. ඉතිහාසයේ ප්‍රථම වතාවට අභිනවයෙන් තේරී පත්වූ පැනමාවේ ජනාධිපතිවරයාගේ ජනාධිපති පදවි ප්‍රාප්ති උළෙලට සහභාගී වන ලෙස ශ්‍රී ලංකාවට ඇරයුමක් ලැබුණු අතර, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු. වසන්ත සේනානායක මැතිතුමා 2019 ජුනි 30 වැනි දින පැවති අභිනව ජනාධිපති අතිගරු ලෝරෙන්ටිනෝ කෝර්ටිසෝ මැතිතුමාගේ ජනාධිපති පදවි ප්‍රාප්ති උළෙලට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී විය.

**බහමාස්**

i. 2019 ඔක්තෝබර් මස ඩෝරියන් සුළි කුණාටුවෙන් එරටට සිදු වූ විනාශය පිළිබඳව ශ්‍රී ලංකාව බහමාස් රජය වෙත සිය ශෝකය පළකළාය. මෙම සුළි කුණාටුව බහමාස්හි ජනතාවගේ ජීවිතවලට මෙන්ම, එරට සංචාරක ව්‍යාපාරයට හා ආර්ථිකයට ද දැඩි ලෙස බලපෑවේය.

ii. නිව්යෝක්හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතවරයාගේ නිර්දේශය මත, බහමාස්හි නිර්වේතනික කොන්සාල් රවීන්ද්‍ර පෙසුබතම් මහතාගේ ධූර කාලය 2019 ජුනි 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර දෙකක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.

**(2) බහුපාර්ශ්වික සබඳතා:**

i. ලතින් ඇමරිකා හා කැරිබියානු අංශය, එම අංශය යටතට ගැනෙන රටවලට සහය දැක්වීම හා එම රටවලින් සහය ලබා ගැනීම සම්බන්ධ කලාපීය හා බහුපාර්ශ්වීය වේදිකාවල දී මෙම අමාත්‍යාංශයේ එක්සත් ජාතීන්ගේ අංශය සමඟ සමීපව සම්බන්ධීකරණය කළේය.

ii. පොදු උරුමයන් හා විශේෂ බැඳීම් සහිත, පොදුරාජ්‍ය මණ්ඩලයීය සාමාජිකයන් ද වන කැරිබියානු රටවල් (එනම්, බහමාස්, ජැමෙයිකාව, ඩොමිනිකා, ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ, ශාන්ත ලුසියා, ඇන්ටිගුවා සහ බාර්බුඩා ඇතුළු) සමඟ පොදුරාජ්‍ය මණ්ඩලයීය සබඳතා තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා මෙම අංශය විශේෂ අවධානයක් යොමු කළේය.

iii. නොබැඳි ව්‍යාපාරයේ හා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සාමාජිකයන් සහ ඇල්බා (ALBA) සංවිධානයේ කොටසක් වන ලතින් ඇමරිකානු හා කැරිබියානු රටවල් පිළිබඳව මෙම අංශය දැඩි අවධානයක් යොමු කළේය.

iv. G-20, BRICS යන බහුපාර්ශ්වීය වේදිකාවල සාමාජිකයෙකු හා කලාපීය බලවතෙකු වන බ්‍රසීලය සමඟ ශ්‍රී ලංකාව සමීප සබඳතා පවත්වා ගන්න ලදී.

v. නොබැඳි ව්‍යාපාරය, මානව හිමිකම් සංවිධානය වැනි කලාපීය සහ එක්සත් ජාතීන්ගේ ක්‍රියාවලි තුළ දී කියුබාව වෙත සහය දැක්වීම හා කියුබාවෙන් සහය ලබාගැනීම සම්බන්ධයෙන් කොළඹ පිහිටි කියුබානු දූත මණ්ඩලය සහ එක්සත් ජාතීන්ගේ අංශය සමඟ මෙම අමාත්‍යාංශය සමීප සම්බන්ධීකරණයක් සිදු කළේය. ශ්‍රී ලංකා රජයේ සම්මත ස්ථාවරයට අනුව, "එක්සත් ජනපදය කියුබාවට එරෙහිව පනවා ඇති ආර්ථික, වාණිජ හා මූල්‍ය සම්බාධක අවසන් කිරීමේ අවශ්‍යතාවය" යන මාතෘකාව යටතේ UNGA වාර්ෂික යෝජනාවට ශ්‍රී ලංකාව දිගින් දිගටම කියුබාවට සහයෝගය දැක්වීය.

vi. පහත සඳහන් අපේක්ෂකත්වයන් සඳහා ශ්‍රී ලාකවේ සහයෝගය සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය එක්සත් ජාතීන්ගේ අශය (සහ අදාළ දූත මණ්ඩල) සමඟ සම්බන්ධීකරණය කළේය:

- 2020-2022 මානව හිමිකම් කවුන්සිලය සඳහා බ්‍රසීලයේ හා වෙනිසියුලාවේ අපේක්ෂකත්ව
- 2019-2023 යුනෙස්කෝ විධායක මණ්ඩලය සඳහා ආර්ජන්ටිනාවේ, බ්‍රසීලයේ හා ඩොමිනිකානු ජනරජයේ අපේක්ෂකත්ව
- 2019-2022 ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) කවුන්සිලය සඳහා ආර්ජන්ටිනාව, බ්‍රසීලය, කොලොම්බියාව, ඩොමිනිකන් ජනරජය, මෙක්සිකෝව, පේරු සහ පැරගුවේ යන රටවල අපේක්ෂකත්ව
- 2020-2021 ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධාන කවුන්සිලය (IMO) සඳහා ආර්ජන්ටිනාව, බහමාස්, බ්‍රසීලය, චිලී, මෙක්සිකෝව, පැනමාව සහ පේරු යන රටවල අපේක්ෂකත්ව
- 2020-2023 ලෝක කාලගුණ විද්‍යා සංගමයේ (WMO) විධායක සභාව සඳහා බ්‍රසීලය සහ පේරු යන රටවල අපේක්ෂකත්ව
- 2020-2022 ආර්ථික හා සමාජ කවුන්සිලය (ECOSOC) සඳහා කොලොම්බියාව, නිකරගුවාව හා පැනමාව යන රටවල අපේක්ෂකත්ව
- 2020-2023 වධහිංසාවට එරෙහි කමිටුව (CAT) සඳහා බොලිවියානු අපේක්ෂකත්වය
- 2020-2023 වාර්ගික වෙනස්කම් කිරීම තුරන් කිරීමේ කමිටුව (CERD) සඳහා ජැමෙයිකානු අපේක්ෂකත්වය

**(3) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන:**

i. වාණිජ දෙපාර්තමේන්තුව හා අනෙකුත් රේඛීය නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව, ලතින් ඇමරිකා හා කැරිබියානු අංශය, ආර්ජන්ටිනාව, බ්‍රසීලය, චිලී, කොලොම්බියාව, කියුබාව සහ මෙක්සිකෝව යන රටවල් සමඟ ද්විපාර්ශ්වික වෙළඳ සබඳතා වැඩිදියුණු කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සහ අදාළ වෙළඳපොළ අවශ්‍යතාවන්ට අනුව එම රටවලට අපනයනය කළ යුතු නිශ්චිත නිෂ්පාදන හඳුනාගෙන තිබේ. වාණිජ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට, මේ සම්බන්ධයෙන් සංකල්ප පත්‍රිකාවක් සකස් කරන ලදී.

ii. ශ්‍රී ලංකාවේ සහ බ්‍රසිලියානු අදාළ රේඛීය නියෝජිතායතනවල සහය ඇතිව, බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් පහත දැක්වෙන වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධන කටයුතු හා අංග සංවිධානය කරන ලදී:

- සාඕ පවුලෝහි වාණිජ මණ්ඩලය (ACSP) සහ සාඕ පවුලෝහි සංචාරක කර්මාන්ත සංගමයේ (ABAV) සහය ඇතිව සාඕ පවුලෝහි දී වෙළඳ හා සංචාරක කටයුතු ප්‍රවර්ධන අංගයක් සංවිධානය කරන ලද අතර, එමඟින් බ්‍රසීලයේ වාණිජ මණ්ඩල හා කර්මාන්ත සංගම් සමඟ සබඳතා පිහිටුවා ගැනීම සඳහා මං පෙත් විවර විය.
- 2019 මැයි 06-09 දිනවල දී සාඕ පවුලෝ හි පැවති බ්‍රසීලයේ විශාලතම පාරිභෝගික ප්‍රදර්ශනය වන "APAS-2019" සඳහා පොල් නිෂ්පාදන හා සුගන්ධ තෙල් නියෝජනය කරන ශ්‍රී ලාංකික සමාගම් හතරක් සහභාගී විය.
- 2019 ඔක්තෝබර් 15-17 දිනවල දී බ්‍රසීලයේ මිනස් පේරයිස් ප්‍රාන්තයේ දී පැවති "සුපර් මිනස් වෙළඳ ප්‍රදර්ශනයේ දී" ශ්‍රී ලංකාව නියෝජනය විය.
- 2019 දෙසැම්බර් 06-07 දිනවල දී බ්‍රසිලියා හි පැවති බ්‍රසිල තේ උළෙලට ශ්‍රී ලංකාව නියෝජනය කිරීම, බ්‍රසිලියානු තේ ආනයනකරුවන් සහ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සබඳතා ඇති කර ගැනීමට ශ්‍රී ලාංකික තේ සමාගම්වලට උදව් විය.
- 2019 සැප්තැම්බර් මස දී බ්‍රසිලියානු සංචාරක සමාගම් හයක් සඳහා දින දහයක නුරුපුරුදු කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ද සහය ඇතිව සංවිධානය කරන ලදී.

- සුදුසු ආනයනකරුවන් හා වෙළඳ අවස්ථා හඳුනාගැනීම සඳහා කොලොම්බියාවේ හා සුරිනාමිහි වාණිජ මණ්ඩල සමඟ සමීප සම්බන්ධීකරණයක් ආරම්භ කරන ලදී.

iii. ශ්‍රී ලංකාවේ හා හවානා හි අදාළ රේඛීය නියෝජිතායතනවල ද සහාය ඇතිව, කියුබාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් පහත සඳහන් වෙළඳ, ආයෝජන හා සංචාරක ප්‍රවර්ධන කටයුතු හා අංග සංවිධානය කරන ලදී:

- දෙරට අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිළිබඳ 60 වැනි සංවත්සර සැමරුමේ අංගයක් ලෙස 2019 ජූනි 25-29 දිනවල දී කියුබාවේ ආනයන නියෝජිතායතන සමඟ පැවති ව්‍යාපාරික වටමේස රැස්වීමකට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවන ලද වෙළඳ දූත පිරිසක් ද සහභාගී වූහ.
- 'ශ්‍රී ලංකා යාඩන් ජාත්‍යන්තර ඖෂධ සමාගම' හා කියුබානු ඖෂධ අංශය අතර වියහැකි සහයෝගීතාව පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස 2019 ඔක්තෝබර් මස දී පැවති ව්‍යාපාරික රැස්වීමක් සඳහා පහසුකම් සලසන ලදී.
- කැරිබියානු කලාපයේ දංකොටුව නිෂ්පාදන බෙදාහැරීම සඳහා දංකොටුව පෝසිලේන් සමාගම හා කියුබාවේ බෙදාහරින්නෙකු අතර ගිවිසුමක් අත්සන් තැබීමට පහසුකම් සැලසීම.
- දංකොටුව පෝසිලේන් පීඑල්සී සමාගමට පැනමාවේ වියහැකි බෙදාහරින්නෙකු හඳුන්වා දීම.
- කැරිබියානු කලාපය පිළිබඳ ව්‍යාපාරික උනන්දුවක් දක්වන මාස් සහ බ්‍රැන්ඩික්ස් වැනි විශාල පරිමාණයේ ඇඟලුම් සමාගම් සමඟ සමීප සබඳතා පවත්වා ගැනීම.

iv. ශ්‍රී ලංකාව බහමාස් සමඟ නැව් හා නාවික කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයෙහි සහයෝගීතාව පවත්වාගනු ලබන්නේ, එරට මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබා සිටින ශක්තිමත් විශ්වසනීයභාවය හේතුවෙනි.

**(4) සංස්කෘතික සබඳතා**

**බ්‍රසීලය**

i. ලතින් ඇමරිකානු කලාපය තුළ, විශේෂයෙන් බ්‍රසීලයෙහි, ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා සංචාරක ව්‍යාපාරය විදහා දැක්වීමේ අරමුණින් යුතුව, මෙම තානාපති කාර්යාලය බ්‍රසීල ෆෙඩරල් රජය, බ්‍රසිලියානු සංස්කෘතික ආයතන හා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල විසින් සංවිධානය කරන ලද විවිධ සංස්කෘතික ප්‍රවර්ධන හා පුණ්‍ය කටයුතු සඳහා සහභාගී විය. ආසියා-ඕෂනියා කාන්තා සංගමය (AOLA) විසින් සංවිධානය කරන ලද "Gastronômico do Grupo AOLA-2019" සංස්කෘතික උළෙලේ දී ශ්‍රී ලංකාව නියෝජනය විය.

ii. "TV Supren I Brasilia" මඟින් විකාශය කරන ලද විනාඩි 30 ක රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක දී තානාපති ජෆ්රි මැතිතුමා සුප්‍රසිද්ධ පරමවිඥානාර්ථවාදී බෞද්ධ පුනර්ජීවනය ඇතිකරන්නෙකු වූ කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට් මැතිතුමා විසින් සම-ස්ථාපනය කරන ලද බ්‍රසීලයේ පරමවිඥානාර්ථ සමිතිය (TSP) තුළින් ඉදිරියට ගෙන ගිය ශ්‍රී ලංකාව හා බ්‍රසීලය අතර ඓතිහාසික හා සංස්කෘතික සබඳතා ඉස්මතු කළේය.

**කියුබාව**

i. ශ්‍රී ලංකා හා කියුබාව අතර අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගීතාව 2019 වසරේ දී ද අඛණ්ඩව පැවතුණි. සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික සිසු සිසුවියන්ට කියුබාවේ දී වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා වාර්ෂික ශිෂ්‍යත්වයක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ලබා දීමට කියුබානු රජය අඛණ්ඩව කටයුතු කළේය.

ii. කියුබාව විද්‍යාගාර පරීක්ෂණ සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු දියුණු කොට, විශේෂයෙන්ම පෙනහළු පිළිකා හා දියවැඩියාව සඳහා නව ප්‍රතිකාර ක්‍රම සොයාගෙන ඇති හෙයින්, ජීව විද්‍යාව, නැනෝ තාක්ෂණය මෙන්ම, ශ්‍රී ලංකාවේ වෛද්‍ය පර්යේෂණ ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සඳහා අධි තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ධාරිතා වර්ධනය හා

පුහුණුව ලබා දීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික හා කියුබානු බලධාරීන් අතර සාකච්ඡා අඛණ්ඩව පැවතුණි.

iii. කියුබානු ගුවන් විදුලි හා රූපවාහිනී ආයතනයේ (ICRT) කාර්ය මණ්ඩලය සඳහා ශ්‍රී ලංකා මාධ්‍ය පුහුණු ආයතනය සහ ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ ධාරිතා වර්ධන වැඩසටහනක් පැවැත්වීම සඳහා යෝජනාවක් ඉදිරිපත් විය. මෙය 2020 වසරේ දී ක්‍රියාත්මක වීමට ඉඩ ප්‍රස්තා පවතී.

**(5) කම්කරු සබඳතා:**

i. බ්‍රසීලයේ හා කියුබාවේ පිහිටි නේවාසික දූත මණ්ඩල දෙක සහ ශ්‍රී ලංකාවේ සමගාමී අක්තගැන්වීම් හරහා ලතින් ඇමරිකා හා කැරිබියානු කලාපයේ රටවල සේවය කරන්නන් ඇතුළු ශ්‍රී ලාංකිකයන්ගේ සුබසාධනය සඳහා මෙම අමාත්‍යාංශය මඟින් සිදුකරන ලදී. විශේෂයෙන් කලාපය තුළ සිටින නීති විරෝධී සංක්‍රමණිකයන් ඇතුළුව අතරමං වී සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා කොන්සියුලර් සේවා ව්‍යාප්ත කිරීම මෙයට ඇතුළත් වේ.

ii. කියුබාව තුළ මෙන්ම, ඇන්ගුයිලා, බ්‍රිතාන්‍ය වර්ජින් දූපත්, කේමන් දූපත් සහ ටර්ක්ස් හා කයිකෝස් ඇතුළු කැරිබියානු කලාපයේ අසල්වැසි රටවල ද වෙසෙන ශ්‍රී ලාංකික සිසු සිසුවියන් හා ශ්‍රී ලාංකික සේවකයන් සඳහා, සමීපතාවයේ පදනම මත කියුබාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සහයෝගය ලබා දෙන ලදී.

# දකුණු ආසියා සහ සාර්ක් අංශය

## දකුණු ආසියා හා සාර්ක් අංශය

### හැඳින්වීම

- දකුණු ආසියා සහ සාර්ක් අංශය, ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය සහ පාකිස්තානය යන දකුණු ආසියානු රටවල් හතක් සමග පවත්වන ද්විපාර්ශ්වික සබඳතාවලට අදාල කරුණු සම්බන්ධයෙන් කටයුතු කරයි. තවද, දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයට (SAARC) අදාළ කරුණු සම්බන්ධයෙන් ද කටයුතු කරයි.
- සමාලෝචනයට බඳුන්වන කාල පරිච්ඡේදය තුළදී, කලාපයේ භූදේශපාලනික හා සමාජ - ආර්ථික ප්‍රවණතා පිළිබඳව සොයා බැලීම සහ ඉහළ මට්ටමේ දේශපාලන කටයුතුවලට යෙදවුම් ලබා දීම මෙම අංශය සතු කාර්යයකි. මෙම රටවල දේශපාලන, ආර්ථික, ආරක්ෂක, අධ්‍යාපන සහ සමාජයීය යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය ද මෙහෙයවනු ලබයි. තාක්ෂණික සහයෝගිතාව, සංවර්ධන සහාය, ආයෝජන සබඳතා, සංචාරක හා සංස්කෘතික ප්‍රවර්ධනයන් ද්විපාර්ශ්වික හා කලාපීය වශයෙන් සිදුකෙරේ.
- සමාලෝචන කාල පරිච්ඡේදය තුළ, සාර්ක් සංසදවල සම්මතයන් හා ක්‍රියා පටිපාටිවලට අනුකූලව සාර්ක් සංවිධානය හා සම්බන්ධ රැස්වීම්වලට සහභාගී වීමට හා ඒවා පැවැත්වීමට ශ්‍රී ලංකාවේ දෙපාර්තමේන්තු, ශ්‍රී ලංකාවේ ආයතනවලට සහාය වෙමින් මෙම අංශය වැදගත් කාර්යයභාරයක් ඉටු කළේය. සාර්ක් ආශ්‍රිත රැස්වීම්වලට සහභාගී වන ශ්‍රී ලංකා නිලධාරීන් සහ නියෝජිතයන් සඳහා සාර්ක් වීසා බලපත්‍ර සම්බන්ධයෙන් මෙන්ම වෙනත් හිමිකම් ඇති පුද්ගලයින් සඳහා වීසා බලපත්‍ර සම්බන්ධයෙන් ද කටයුතු කරනු ලැබේ.

### භූගෝලීය නියෝජනයේ පසුබිම:

- ශ්‍රී ලංකාව නේවාසික දූත මණ්ඩල 06ක් (ඉන්දියාව, පාකිස්තානය, බංග්ලාදේශය, මාලදිවයින, නේපාලය, සහ ඇෆ්ගනිස්ථානය) පවත්වාගෙන යන අතර චෙන්නායි හි නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාල 01 ක් සහ මුම්බායි සහ කරච්චිහි කොන්සාල් ජනරාල් කාර්යාල 2ක් ඇත. මේ වන විට, ශ්‍රී ලංකාවට භූතානයේ නේවාසික රාජ්‍යතාන්ත්‍රික දූතමණ්ඩලයක් හෝ අක්තගැන්වීමක් හෝ නොමැත. ලංකාව විසින් චිතගොන් (බංග්ලාදේශය), තිම්පු (භූතානය), ලාහෝර් සහ පෙෂාවර් (පාකිස්ථානය) යන ස්ථානවල නිර්වේතනික නියෝජන පත් කර තිබේ.
- කොළඹ පිහිටි දකුණු ආසියානු නේවාසික දූත මණ්ඩල සම්බන්ධයෙන් සලකා බලන කල්හි, ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, ඉන්දියාව, නේපාලය, මාලදිවයින, පකිස්ථානය යන රටවල දූත මණ්ඩල 06ක් තිබේ. එසේම, ඉන්දියාව ද, යාපනය, හම්බන්තොට සහ මහනුවර, කොන්සල් ජනරාල් කාර්යාල/සහකාර මහ කොමසාරිස් කාර්යාල පවත්වාගෙන යයි. එසේම, භූතානය සහ පකිස්ථානය ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල් නියෝජනයන් දෙකක් පත්කර තිබේ.
- සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය කොළඹ පිහිටා ඇත.

### ඇෆ්ගනිස්ථානය

#### i. ද්විපාර්ශ්වික සබඳතා

පහත සඳහන් ගිවිසුම් පිළිබඳ කටයුතු අවසාන කිරීම සඳහා සාකච්ඡා පැවැත්වේ.

- දේශපාලන උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුම
- ගුවන් සේවා ගිවිසුම
- රාජ්‍යතාන්ත්‍රික හා නිල විදේශ ගමන් බලපත්‍ර හිමියන් වීසා බලපත්‍ර ලබාගැනීමෙන් නිදහස් කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම
- දඩුවම් ලැබූ පුද්ගලයින් මාරු කිරීම පිළිබඳ ගිවිසුම
- ආරක්ෂක ගිවිසුම

- සංස්කෘතික සහයෝගීතාව, අධ්‍යාපනය, ක්‍රීඩා, ආර්ථික සහයෝගීතාව සහ විද්‍යාව හා තාක්ෂණය යන ක්ෂේත්‍ර වල හඳුනාගත් ප්‍රමුඛතා අංශ කෙරෙහි සහයෝගීතාවයෙන් කටයුතු කිරීම හා ඒ පිළිබඳව අවධානය යොමු කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
- ඇෆ්ගනිස්ථානයෙන් වෛද්‍ය සංචාරක කටයුතු ආකර්ෂණය කර ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
- විදේශ සබඳතා අමාත්‍යාංශය, ජනාධිපති ශිෂ්‍යත්ව සහ කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය යටතේ ශිෂ්‍යත්ව ලබාදෙමින් ඇෆ්ගනිස්ථානයේ මානව සම්පත් සංවර්ධනය සඳහා සහාය වීමට උපදේශන අබණ්ඩව පවත්වමින් සිටියි.
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගීතාව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සාකච්ඡා කෙරෙමින් පවතී.

ii. ආර්ථික සම්බන්ධතා සහ විදේශ ආයෝජන

- ශ්‍රී ලාංකික තේ ඇෆ්ගනිස්ථානයට අපනයනය කිරීම පිළිබඳව සාකච්ඡා පවත්වා තිබේ.
- ආයෝජන ප්‍රවර්ධනය හා සුරක්ෂා කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුමේ පසු විපරම් සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

iii. සංස්කෘතික සබඳතා

- ඇෆ්ගනිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර සංස්කෘතික සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ කමිටුවක් ස්ථාපනය කිරීමේ සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

iv. කම්කරු සුබසාධනය

- ශ්‍රී ලංකා මිනිස් බලය සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ ඇෆ්ගනිස්ථානය අතර අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම් ඒකාබද්ධ කමිටුව ස්ථාපනය කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
- දෙරට අතර අත්සන් තබන ලද හෙද හෙදියන්ගේ ධාරිතා සංවර්ධන ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

**බංග්ලාදේශය**

**1. ද්විපාර්ශ්වික සබඳතා**

- 2019 සැප්තැම්බර් 03 සිට 05 දක්වා පැවති ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමයේ (IORA) 3 වැනි රුස්වීමට සහභාගී වීම සඳහා විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාරය. මෙම සංචාරයේ දී, බංග්ලාදේශ විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පවත්වන ලද අතර එහිදී ශ්‍රී ලංකාව - බංග්ලාදේශ සබඳතා ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.
- 2019 දෙසැම්බර් 12 වන දින පැවැති ආසියා පැසිෆික් අධ්‍යාපන සමුළුවට සහභාගී වීම සඳහා ගරු උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ සංචාරය. මෙම සංචාරයේ දී, බංග්ලාදේශයේ ගරු උසස් අධ්‍යාපන අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්විණි. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගීතාව ඉහළනැංවීමේ සහ අන්‍යෝන්‍ය වශයෙන් සිදුකරන ආයෝජන පුළුල් කිරීමේ අරමුණින් මෙම සාකච්ඡා පවත්වන ලදී.
- 2020 මුල් භාගයේදී ශ්‍රී ලංකාවේ දී විදේශ ලේකම් මට්ටමින් ශ්‍රී ලංකා -බංග්ලාදේශ දේශපාලන උපදේශනවල 04 වන වටය පැවැත්වීමට සාකච්ඡා කෙරෙමින් පවතී.
- ත්‍රස්තවාදය, ප්‍රචණ්ඩවාදී අන්තවාදය සහ රැඩිකලීකරණය මැඩපැවැත්වීමේ සහයෝගීතාව සඳහා දෙරටේදීම හා ඉන් ඔබ්බෙහි පවතින මෙවැනි අභියෝග සියල්ලම ජයගැනීම සඳහා සාමූහිකව කටයුතු කිරීම පිළිබඳව සාකච්ඡා කෙරෙමින් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 දී ඉවසීම සියල්ල ඇතුළත් කිරීම සහ බහුත්ව වාදය පිළිබඳ පුළුල් සංවාදයක් කැඳවීම සඳහා කටයුතු කිරීමට එකඟ විය.

- ඉහළ තත්ත්වයේ ඇඟලුම් හා රෙදිපිළි, තොරතුරු තාක්ෂණ, ආගමික හා පරිසර සංචාරක කටයුතු මැණික් හා ස්වර්ණාභරණ සහ වටිනා ලෝහ, කෘෂිකාර්මික හා කෘෂි සැකසුම්, ධීවර, පශු සම්පත්, කිරි, උද්‍යාන විද්‍යාව, සෞඛ්‍ය කළමණාකරණ, යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම්, ඖෂධ, විදුලිබල හා බලශක්ති යන අංශ සම්බන්ධයෙන් හවුල්කාරිත්වයේ විභවය හඳුනා ගැනීම සඳහා දෙරටේ පෞද්ගලික අංශ අතර සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
- ශ්‍රී ලංකාවේ රේඛීය නියෝජිතායතන සමඟ සාකච්ඡා කර බංග්ලාදේශයේ උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ශ්‍රී ලංකා සිසුන්ට ශිෂ්‍යත්ව ලබාදීම සඳහා පහසුකම් සලසන ලදී. (ශ්‍රී ලාංකික සිසුන් 350ක් පමණ බංග්ලාදේශයේ ඉගෙනුම ලබන අතර එම පාඨමාලා අතරෙන් ප්‍රධානවන්නේ එම්.බී.බී.එස් පාඨමාලාය)
- පහත සඳහන් ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් ඉක්මන් දිනයක දී අවසන් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් පවතී :

  -ඇඟලුම් අංශයේ අගය එකතු කිරීම හා නැවකින් නැවකට මාරු කිරීම සඳහා වන ගිවිසුම

  -වෙරළාසන්න නාවික කටයුතු පිළිබඳ ගිවිසුම

  -නාවික ව්‍යාපාර කටයුතුවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව පිලිබඳ අවබෝධතා ගිවිසුම

  -තරුණ සංවර්ධනය පිළිබඳ අවබෝධතා ගිවිසුම
- සෞඛ්‍ය ක්ෂේත්‍රයේ, විශේෂයෙන්, බංග්ලාදේශයේ ඖෂධ කර්මාන්තය සම්බන්ධයෙන් සහයෝගිතාවයෙන් කටයුතු කිරීමේ හැකියාව සෙවීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
- කෘෂිකාර්මික අංශ සංවර්ධනය කිරීම සඳහා බංග්ලාදේශයෙන් කාබනික හා කාබනික නොවන පොහොර ඇතුළු පොහොර මිලදී ගැනීමට සාකච්ඡා කෙරෙමින් පවතී.
- හෙදියන් පුහුණු කිරීමේ ආයතනවලට සහාය වීම ඇතුළුව බංග්ලාදේශ හෙදියන් සඳහා හෙද පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

**ii. බහුපාර්ශ්වීය සම්බන්ධතා**

- 2019 දී, 2020-2022 කාල සීමාව සඳහා ECOSOC හි බංග්ලාදේශයේ අපේක්ෂකත්වයට සහ 2019-2024 කාල සීමාව සඳහා සංක්‍රමණ පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (IHO) නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අපේක්ෂකත්වයට ෂාහදුල් හක් මහතාගේ අපේක්ෂකත්වයට ශ්‍රී ලංකාව සිය සහයෝගය ලබා දී ඇත.

**iii. ආර්ථික සම්බන්ධතා සහ ආයෝජන සහයෝගිතාව:**

- බංග්ලාදේශ - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමට එළඹීමේ සාකච්ඡා පැවැත්වීමට ඇති හැකියාව සෙවීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් පවතී. (2017 දී, අතිගරු ජනාධිපතිතුමාගේ බංග්ලාදේශ සංචාරයේ පසු විපරම් කටයුත්තක් ලෙස 2020 දී ඒකාබද්ධ ආර්ථික කොමිෂන් සභාවේ 06 වන වටය පැවැත්වීම පිළිබඳ සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
- ජානමය වශයෙන් වෙනස්කරන ලද බීජ හුවමාරු කර ගැනීමට සහ මිරිදිය ධීවර කර්මාන්තයේ ධාරිතාවය පුළුල් කිරීමට ඇති හැකියාව සොයා බැලීම සඳහා වූ සාකච්ඡා සඳහා පහසුකම් සපයන ලදී.
- රේගු සහයෝගිතාව, ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ දෙරට අතර ආයෝජන ප්‍රවර්ධනයේ හා සුරක්ෂා කිරීම පිළිබඳ ගිවිසුම් කල්තියා අවසන් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

**iv. සංස්කෘතික සබඳතා**

- පුද්ගලාන්තර සම්බන්ධතා සහ සංස්කෘතික හුවමාරුව පුළුල් කිරීම සඳහා, ලලිත කලා, විශේෂාංග චිත්‍රපට, සාරි, සංගීතය, ආහාර පිසීම සහ ජාත්‍යන්තර මව් භාෂා දිනය වැනි අංග රාශියක් පැවැත්වීමට මෙම අංශය විසින් කොළඹ පිහිටි බංග්ලාදේශ මහ කොමසාරිස් කාර්යාලයට පහසුකම් සලසන ලදී.

**v.කම්කරු හා සුබසාධන සබඳතා**

- බංග්ලාදේශයේ නිෂ්පාදන හා සේවා අංශයන්හි ශ්‍රී ලංකා කම්කරුවන් සහ වෘත්තිකයන් සැලකිය යුතු ප්‍රමාණයක් සිටින සන්දර්භය තුළ, වීසා පටිපාටිය ලිහිල් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

**භූතානය**

**ද්විපාර්ශ්වික සබඳතා**

- භූතානයේ නේවාසික දූතමණ්ඩලය පිහිටුවීම සඳහා සාකච්ඡා කෙරෙමින් පවතී.
- අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය, සෞඛ්‍ය, ගුවන් සේවා සහ සංස්කෘතික යන ක්ෂේත්‍රවල හඳුනාගත් සහයෝගිතා අංශ කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
- මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලය, කැලණිය, පේරාදෙණිය සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය යන ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල රැසක වෛද්‍ය උපාධිය හා දන්ත විද්‍යා උපාධි ඇතුළු විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ 200ක් පමණ භූතාන සිසුහු අධ්‍යාපනය හදාරමින් සිටිති. භූතාන සිසුන්ට ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හැදෑරීම සඳහා ජනාධිපති ශිෂ්‍යත්ව, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යත්ව සහ බෞද්ධ ආශ්‍රිත ශිෂ්‍යත්ව ලබා ගැනීමට මෙම අංශය පහසුකම් සපයයි.
- සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සහයෝගිතාව ඉහළ නැංවීමේ සඳහා භූතාන හෙද හෙදියන් පුහුණු කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුමකට එළඹීමට ඇති හැකියාව සෙවීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
- සංචාරක කටයුතු සහයෝගිතාව ඉහළ නැංවීමේ අරමුණින් යුතුව, ගුවන් සේවා ගිවිසුමකට අත්සන් තැබීමේ හැකියාව පිළිබඳ දෙරටම සොයා බලයි.
- නිල හා රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රහිමියන් වීසා බලපත්‍ර ලබාගැනීමෙන් නිදහස් කිරීම පිළිබඳ ගිවිසුමේ වැඩකටයුතු අවසන් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
- සංචාරක කටයුතු සඳහා භූතානයට පැමිණෙන ශ්‍රී ලාංකිකයන් සඳහා වීසා ගාස්තු අඩු කිරීමට මෙම අංශය අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කරමින් තිබේ.

**iii. සංස්කෘතික සබඳතා**

- ශ්‍රී ලංකා-භූතාන බෞද්ධ සබඳතා ශක්තිමත් කිරීම සඳහා මෙම අංශය සහාය විය.
- දෙරටටම පොදු සංස්කෘතික හා ආගමික උරුමය සැලකිල්ලට ගනිමින්, සංස්කෘතික සහයෝගිතා වැඩසටහනක් පිළිබඳව සාකච්ඡා කර අවසන් කිරීමේ හැකියාව දෙරටම සොයාබලමින් සිටියි.

**ඉන්දියාව**

**ද්විපාර්ශ්වික සබඳතා**

- 2019 දී දෙරට අතර ඉහළ මට්ටමේ සංචාර ගණනාවක් සිදු වූ අතර, ඒවා අතරින්, ශ්‍රී ලංකාවෙන්, වැදගත්ම ඉහළ මට්ටමේ ද්විපාර්ශ්වික සංචාරය වූයේ අලුතින් තේරී පත්වූ ශ්‍රී ලංකාවේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2019 නොවැම්බර් 28 සිට 30 දක්වා ඉන්දියාවේ නියැලුණු සංචාරයයි. එම සංචාරයේ දී, ඉන්දියාව ඩොලර් මිලියන 400 ක් සහ ඩොලර් මිලියන 50 ක් වන ණය පහසුකම් දෙකක් ශ්‍රී ලංකාවට ලබාදුණි.
- අනෙක් ඉහළ පෙළේ වැදගත් සංචාරය වූයේ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් පසු සාමඥීය ප්‍රකාශ කිරීම සඳහා 2019 ජූනි 9 වන දින ඉන්දීය අග්‍රාමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමා ශ්‍රී ලංකාවේ නියැලුණු සංචාරයයි. අග්‍රාමාත්‍යවරයා ලෙස නැවත තේරී පත්වීමෙන් පසු ඔහු නියැලුණු පළමු විදෙස් සංචාරය මෙය විය.

- ඉන්දියානු සහ ශ්‍රී ලංකා බලධාරීහු ඇමරිකානු ඩොලර් මිලියන 400 ක මුදල් හුවමාරුවක් සඳහා සහ ඇමරිකානු ඩොලර්මිලියන 434 ක් ආසියානු නිශ්කාශන සංගමයට (ACU)ගෙවීම මාසයකින් ප්‍රමාද කිරීම සඳහා එකඟ වූහ.
- ශ්‍රී ලංකාවේ "ෆිට්ස්" සීමාසහිත ගුවන් සේවා සමාගම 2019 දී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ගුවන් සේවා ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. එසේම, ඉන්දියාවේ "එලායන්ස් එයාර්" සමාගම ද 2019 දී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගුවන් සේවා මෙහෙයුම් ආරම්භ කළේය.
- ඉන්දියාවේ සිටින ශ්‍රී ලාංකික ජාතිකයන්ට සහාය වෙමින් අන්‍යෝන්‍ය නීති ආධාර සහ කොන්සියුලර් ස්වභාවේ කටයුතු 2019 දී සක්‍රීයව සළකා බලන ලදී. තමිල්නාඩු ප්‍රාන්තයෙන් ශ්‍රී ලාංකික සරණාගතයින් ස්වේච්ඡාවෙන් නැවත මෙරටට ගෙන්වා ගැනීමේ ගැටලුව සම්බන්ධයෙන් ඉන්දියාවේ අදාළ පාර්ශ්වකරුවන් සමඟ අන්‍යොන්‍ය වශයෙන් සිදු කළ කටයුතුවලට අනෙකුත් දේ අතර රුස්වීම් ද ඇතුළත් විය.
- ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය සමඟ කටයුතු සම්බන්ධීකරණය කරමින් 2019 දී එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහකොමසාරිස්වරයාගේ සරණාගතයින් නැවත මෙරටට ගෙන්වා ගැනීමේ වැඩසටහන යටතේ සරණාගතයින් 972කට ආපසු පැමිණීමට අවශ්‍ය පහසුකම් සැලසීය.
- ඉන්දියාවේ රාජ්‍යතාන්ත්‍රික නියෝජිතයන් සහ ශ්‍රී ලංකාවේ රේඛීය නියෝජිතායතන සමඟ එක්ව මෙම අංශය ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ හමුදා නිලධාරීන් 600කට ආසන්න සංඛ්‍යාවක් සඳහා ඉන්දියාවේ පුහුණුව ලබා දී ඇත. ශ්‍රී ලංකාව සහ ඉන්දියානු නාවිකයන් අතර වාර්ෂික ඒකාබද්ධ සමුද්‍රීය නාවික අභ්‍යාසය SLINEX. 2019 2019 සැප්තැම්බර් 7 වන දින සිට සතියක් පුරා විශාකා පටිනම් හිදී පැවැත්විණි.
- චෙන්නායි හි නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය සමඟ එක්ව ඉන්දියාවේ වෙරළබඩ ප්‍රදේශවලට ගසා ගෙන ගොස් ඇති ධීවරයින් සමඟ ශ්‍රී ලංකා ධීවර යාත්‍රා 113ක් නිදහස් කර ආපසු ගෙන්වා ගැනීම සඳහා මෙම අංශය සහාය විය. එසේම, ශ්‍රී ලංකාවේ අත්අඩංගුවේ පසුවන ඉන්දීය ධීවර යාත්‍රා මුදා හැරීම, නැවත ගෙන්වා ගැනීම, වෙන්දේසි කිරීම/විනාශ කිරීම යන ඉන්දියානු ඉල්ලීම් සඳහා පහසුකම් සැපයීය.
- 2019 අප්‍රියෙල් 08-09 දිනවල දී කොළඹ දී පැවති ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර 6 වැනි වාර්ෂික ආරක්ෂක සංවාදයට අවශ්‍ය පහසුකම් සැලසීය. තවද, සමුද්‍රීය බේරාගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC) ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීම සඳහා ඉන්දියානු රජය ඇමරිකන් ඩොලර් මිලියන 6 ක ප්‍රදානයක් ලබාදී තිබේ. මේ සඳහා, අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2019 ඔක්තෝබර් 09 වැනි දින ලබාගෙන තිබේ.
- ඉන්දියානු රජය විසින් ආරම්භ කරන ලද ආපදාවලින් පසුව යථා තත්ත්වයට පත්වීමේ යටිතල පහසුකම් සඳහා සන්ධානයට හා 2019 මාර්තු 19-20 දිනවලදී පැවති ආපදා වලින් යථා තත්ත්වයට පත්වීමේ යටිතල පහසුකම් පිළිබඳ 2 වැනි ජාත්‍යන්තර වැඩමුළුවට ශ්‍රී ලංකාව එක්වීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.
- නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරය අලුත්වැඩියා කිරීම හා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම සඳහා මෙම අංශය අවශ්‍ය පහසුකම් සැලසීය.
- රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලයක හෝ කොන්සියුලර් කාර්යාලයක සේවය කරන නිලධාරියකුගේ පවුලේ සාමාජිකයන් සඳහා වැටුප් ලබන රැකියාවක නියැලීම පිළිබඳව ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුමකට 2019 මාර්තු 05 වැනි දින අත්සන් තැබීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීය.

**ii. බහුපාර්ශ්වීය සබඳතා**

- 2019 වර්ෂයේ පහත දැක්වෙන අපේක්ෂකත්ව සඳහා ශ්‍රී ලංකා රජයේ සහාය ලබා දීමේදී මෙම අංශය එක්සත් ජාතීන්ගේ අංශය සමඟ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.
- 2020-2021 කාලසීමාව සඳහා ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධාන කවුන්සිලය (IMO)
- 2019-2023 කාල සීමාව සඳහා ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ: (WMO) විධායක සභාව

- 2019-2023 කාල සීමාව සඳහා එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ (UN-HABITAT) විධායක මණ්ඩලය;
- 2019-2021 කාල සීමාව සඳහා යුනෙස්කෝවේ අන්තර් රාජ්‍ය සාගර විද්‍යා කොමිෂන් සභාව (IOC) විධායක සභාව;

2020 - 2022 කාලසීමාව සඳහා ඉන්දියාවේ තරුණ කටයුතු හා ක්‍රීඩා පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු කිරන් රිජිජු මැතිතුමාගේ ලෝක මත්ද්‍රව්‍ය විරෝධී නියෝජිතායතන (WADA) පදනමේ අපේක්ෂකත්වය.

- 2019-2022 කාල සීමාව සඳහා, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධාන කවුන්සිලය (ICAO)
- ලෝක රේගු සංවිධානයේ (WCO) අධ්‍යක්ෂ/අනුකූලතා සහ පහසුකම් සැලසීම සඳහා ප්‍රනාබ් කුමාර් දාස් මහතාගේ අපේක්ෂකත්වය.
- 2019-2023 කාල සීමාව සඳහා ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ආචාර්ය රමේෂ් චන්ද් මහතාගේ අපේක්ෂකත්වය. (ඉන්දියාව පසුව සිය අපේක්ෂකත්වය ඉල්ලා අස්කර ගත්තාය); සහ
- ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) බාහිර විගණක තනතුර සඳහා රජීව් මෙහ්රිෂි මහතාගේ අපේක්ෂකත්වය.

**ආර්ථික සම්බන්ධතා සහ විදේශ ආයෝජන**

- ඉන්දියාව, ශ්‍රී ලංකාවේ 3 වන විශාලතම අපනයන රට ලෙස ශ්‍රේණිගත කර ඇති අතර 2019 දී ශ්‍රී ලංකාව සඳහා භාණ්ඩ වැඩිම ප්‍රමාණයක් කර ආනයනය කර ඇත්තේ ද ඉන්දියාවෙනි.
- 2019 දී ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට කරන මුළු අපනයන ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන 759.37 ක් වූ අතර ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට ආනයනය කළ භාණ්ඩවල වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 3,830.82 ක් විය.
- පලාලි /යාපනය ගුවන්තොටුපොළ ශ්‍රී ලංකාවේ තුන්වන ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ලෙස උසස් කරන ලද අතර වසර 40ක කාල පරිච්ඡේදයකින් පසු 2019 ඔක්තෝම්බර් මාසයේදී සමාරම්භ කරන ලදී. බැංගලෝරය, කොවින, මුම්බායි සහ හයිද්‍රාබාද් සිට ගුවන් ගමන් මෙහෙයවීමට අපේක්ෂා කෙරේ. චෙන්නායි -යාපනය ගුවන් ගමන් සේවය 2019 ඔක්තෝම්බර් 17 දින ආරම්භ විය.
- 2019 දී, නවදිල්ලි මහ කොමසාරිස් කාර්යාලයේ ක්‍රියාකාරී මැදිහත්වීම මගින් ඉන්දියානු ආයෝජන 16 ක් ශ්‍රී ලංකාව වෙත ආකර්ෂණය කර ගෙන ඇති අතර, මෙම අංශය විසින් කොම්ප්‍රෙෂර්, ගබඩා සැපයුම් සේවා, සෙල්ලම් බඩු නිෂ්පාදනය, සෞඛ්‍ය, කුඩා ජල විදුලි බලාගාර, ජල විදුලිය, ආපනශාලා දාම, සත්ව ආහාර, පරිගණක මතක මොඩියුල සහ ඇම්ප්, කුඩා ඩ්‍රෝන, බර වාහන සඳහා ටයර්, තොරතුරු තාක්ෂණ අධ්‍යාපන, සංචාරක කටයුතු කළමණාකරණය, ගිනිකෙළි නිෂ්පාදන ඒකකය, ගබඩා පහසුකම් ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මෙම අංශය මෙහිදී පහසුකම් සැලසිය. ශ්‍රී ලංකාව මේ අතුරින් 2019 දී ඉන්දියාවේ සංචාරක, වෙළඳ හා වාණිජ කටයුතු 228 කට සහභාගි විය. දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද සහ පහසුකම් සපයන ලද වෙළෙඳ හා ආයෝජන නියෝජිත කණ්ඩායම් 08, ඉන්දියානු පාවහන් කර්මාන්ත බලමණ්ඩලය (CIFI) සහ ඉන්දියානු පාවහන් කොටස් නිෂ්පාදකයින්ගේ සංගමය (IFCOMA) ඉන්දියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩල බලමණ්ඩලය (FICCI), සංවර්ධන හා අපනයන ප්‍රවර්ධන කවුන්සිලය, ඉන්දියානු කර්මාන්ත බලමණ්ඩලය (PDEXCIL) වාණිජ හා කර්මාන්ත, මණ්ඩලය සහ ඉන්දියානු අපනයනකරුවන්ගේ සංවිධාන බලමණ්ඩලය (FIEO) යන ඉන්දියාවේ ප්‍රධාන වාණිජ මණ්ඩල නියෝජනය කළ නියෝජිත කණ්ඩායම් විය. සමාලෝචන කාල පරිච්ඡේදය තුළදී, ඉන්දියාවෙන් පැමිණි මුළු සංචාරකයින්ගේ සංඛ්‍යාව 225,002 ක් වන අතර, ඇත්ත වශයෙන්ම එය පාස්කු ප්‍රහාර වලින් පසුව ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාවෙන් ඉහළින්ම සිටින්නේ ඉන්දියාවයි.

**සංස්කෘතික සබඳතා**

- 2019 දී ශ්‍රී ලංකා සිසුන් ඉන්දියාවේ අධ්‍යාපනය ලැබීම සඳහා ඉන්දියානු රජය විසින් පිරිනමන ශිෂ්‍යත්ව ගණනාවක් ලබා ගත්හ. ඉන්දියානු රජයේ ඉන්දියානු තාක්ෂණික හා ආර්ථික සහයෝගිතා (ITEC) වැඩසටහන යටතේ 2018 -2019 දී විවිධ ක්ෂේත්‍රයන් හි කෙටිකාලීන පුහුණු වැඩසටහන් හැදෑරීම සඳහා ශ්‍රී ලංකා රජයේ නිලධාරීන්ට සහ වෙනත් අයට ස්ථාන 402 ක් වෙන් කොට ඇත. එයින් ශ්‍රී ලංකාව 393 ක් භාවිතා කර ඇත.
- 2019 දී ඉන්දියානු විශ්ව විද්‍යාල උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු හැදෑරීම සඳහා ඉන්දියානු රජය විසින් ශ්‍රී ලංකා සිසුන් සඳහා ශිෂ්‍යත්ව 190ක් පිරිනමන ලදී.
- ඉන්දියානු මූල්‍ය ආධාර යටතේ යාපනයේ ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් මේ වන විටත් එනම් 2019 වසරේ දී අවසන් කර ඇත.
- 2019-2023 වසර සඳහා ශ්‍රී ලංකා - ඉන්දියානු සංස්කෘතික හුවමාරු වැඩසටහන 2019 දී අවසන් කිරීමට අපේක්ෂා කරන අතර, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ එකඟතාවය ලැබීමට නියමිතය.
- බෞද්ධ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සපයන ලදී. ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශ් හි හොපාල්, බෞද්ධ බැතිමතුන්ගේ වන්දනා ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරන ලදී.
- මහත්මා ගාන්ධිතුමාගේ 150 වන ජන්ම සංවත්සරය සැමරීම සඳහා ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අනුස්මරණ මුද්දර සහ පළමු දින කවරය තමිල්නාඩු ප්‍රාන්තයේ ප්‍රධාන තැපැල් පතිවරයා වෙත චෙන්නායි නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය විසින් පිළිගැන්විය.

**කම්කරු සුබසාධනය**

- 2019 මාර්තු 05 දින අත්සන් තබන ලද රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලයක හෝ කොන්සියුලර් කාර්යාලයක නිලධාරියෙකුගේ පවුලේ සාමාජිකයන් සඳහා වැටුප් ලබන රැකියාවක නියැලීම පිළිබඳ ඉන්දියානු රජය සහ ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුමට 2019 මාර්තු 05 වැනි දින අත්සන් තබන ලදී.
- ඒ අනුව පනත සංශෝධනය කිරීම සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර යෝජිත සමාජ ආරක්ෂණ ගිවිසුම සම්බන්ධයෙන් අදාළ රේඛීය ආයතන සමඟ සාකච්ඡා කිරීම.

**මාලදිවයින**

I. **ද්විපාර්ශ්වික සබඳතා**

- සමාලෝචන කාල පරිච්ඡේදය තුළදී, මෙම අංශය විසින් රේඛීය නියෝජිතායතන සහ මාලදිවයිනේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාල සමඟ සාකච්චා කර පහත සඳහන් සංචාර සම්බන්ධීකරණ කරන ලදී. පහසුකම් සලසන ලදී.
- 71 වන නිදහස් සංවත්සරයේදී ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීමට 2019 පෙබරවාරි 3 සිට 6 දක්වා දින වලදී මාලදිවයින් ජනාධිපති අතිගරු ඉබ්‍රාහිම් සොලිහ් මැතිතුමාගේ ශ්‍රී ලංකා රාජ්‍ය සංචාරය අතරතුර දේශපාලන, වෙළඳ, ආර්ථික හා සංස්කෘතික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සහ කලාපීය සාමය, ස්ථායීතාව සහ සමෘද්ධිය ප්‍රවර්ධනය කිරීමට එක්ව කටයුතු කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වන ලදී.
- මාලදිවයිනේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය අහමඩ් කලීල් මහතා මාලදිවයිනේ අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතයෙකු ලෙස, 2019 අප්‍රියෙල් 21-22 දිනවලදී ශ්‍රී ලංකාවට පැමිණියේය. (පාස්කු ප්‍රහාරය සමයේ ශ්‍රී ලංකාවට සහයෝගය දැක්වීම සඳහා)
- විදේශ අමාත්‍ය ගරු අබ්දුල්ලා ෂාහිඩ් මැතිතුමා සහ කථානායක ගරු කරු ජයසූරිය මැතිතුමා අතර පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායම් පිහිටුවීමට විධික්‍රම සාකච්ඡා කිරීම සඳහා 2019 මැයි 8 වන දින පැවති රැස්වීම.

- ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2019 සැප්තැම්බර් 02 සිට 04 දක්වා මාලදිවයිනේ නිල සංචාරයක නියැලිණි. මෙම සංචාරයේ දී ගරු අගමැතිතුමා පවත්නා ද්විපාර්ශ්වික සහයෝගිතාව සහ දෙරට අතර පුද්ගලාන්තර සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා සහ අනෙකුත් ඉහළ පෙළේ සම්භාවනීය අමුත්තන් සමඟ සාකච්ඡා පැවැත්විය. ගරු අගමැතිවරයා මැලදිවයිනේ පාර්ලිමේන්තුව- පීපල්ස් මජ්ලිස් ඇමතූ අතර ඉන්දියානු සාගර සමුළුව 2019 (IOC) හි මූලසුන දැරීය. පහත සඳහන් ගිවිසුම්වලටද එළඹිණි. වෘත්තීය පුහුණු හා තරුණ සංවර්ධනය පිළිබඳ අවබෝධතා ගිවිසුම, වීසා බලපත්‍ර ලබාගැනීම සඳහා පහසුකම් සැලසීම පිළිබඳ ගිවිසුම, සමාජ ආරක්ෂණ ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම, අධ්‍යාපන සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම.
- මාලදිවයිනේ විදේශ ඇමති ගරු අබ්දුල්ලා ෂාහීඩ්, මැතිතුමා දෙසැම්බර් 04 සිට 07 දක්වා දිනවලදී නියැලුණු නිල සංචාරය තුළදී ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා ගරු අගමැතිතුමා සහ ගරු විදේශ ඇමතිතුමා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වන ලදී. එම සාකච්ඡාවේදී, විදේශ ඇමතිවරු දෙදෙනාම සංස්කෘතික, ආර්ථික, වෙළඳ, ආයෝජන සහ ආරක්ෂක යන අංශවල කැපී පෙනෙන ද්විපාර්ශ්වික ගිවිසුම්වලට නොපමාව එළඹීමට හා 2020 පළමු කාර්තුවේදී ශ්‍රී ලංකා මාලදිවයින් ඒකාබද්ධ කොමිසම කැඳවීමට එකඟ වූහ.
- පහත සඳහන් සංචාර සඳහා ද පහසුකම් සපයන ලදී : ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසර් මුස්තාපා මැතිතුමාගේ සංචාරය 2019 පෙබරවාරි 09 සිට 12 දක්වා ; මාලදිවයිනේ ජනාධිපතිගේ විශේෂ නියෝජිතයෙකු ලෙස මාලදිවයිනේ හිටපු ජනාධිපති මෙහොමඩ් කලීල් මැතිතුමාගේ සංචාරය 2019 අප්‍රේල් 21-22 ; මාලදිවයිනේ හිටපු ජනාධිපති මෙහොමඩ් නෂීඩ් මැතිතුමාගේ සහ මන්ත්‍රීවරුන් 65 දෙනෙකුගේ ශ්‍රී ලංකා සංචාරය - 2019 මැයි ශ්‍රී ලංකාව සඳහා මාලදිවයින දක්වන සහයෝගිතාවය පෙන්වීම මෙම සංචාරයේ අරමුණු විය. ගරු. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංචාරය 2019 ජූලි 01 සිට 03 දක්වා.
- ශ්‍රී ලංකා - මාලදිවයින් ඒකාබද්ධ කොමිෂන් සභාවේ 4 වැනි සැසිවාරය පැවැත්වීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
- පහත සඳහන් ගිවිසුම්වල වැඩ කටයුතු අවසන් කිරීම සඳහා සාකච්ඡා අබණ්ඩව සිදුවෙමින් පවතී : සංක්‍රමණික කටයුතු සහ සහයෝගිතාව; රේගු කටයුතු පිළිබඳ අන්‍යෝන්‍ය සහාය, ජල හා මලාපවාහන අංශ සංවර්ධනය සඳහා තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම් මෘත දේහ නැවත මෙරටට ගෙන්වා ගැනීම පිළිබඳ අවබෝධතා ගිවිසුම, සංරක්ෂණ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම, උරුම සංරක්ෂණ හා පුරාවිද්‍යාව පිලිබඳ අවබෝධතා ගිවිසුම; අපරාධ කටයුතු මැඩපැවැත්වීම සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නෛතික සහාය පිළිබඳ ගිවිසුම, සෞඛ්‍ය අංශ සංවර්ධනය පිළිබඳ අවබෝධතා ගිවිසුම; උදර්පන ගිවිසුම.
- සමාලෝචන කාල පරිච්ඡේදය තුළදී, මෙම අංශය විසින් 2019 දී ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යත්ව 36 ක් මාලදිවයිනේ ශිෂ්‍යභට නිලධාරීන්ට ලබාදීම සඳහා පහසුකම් සලසා ඇත.
- මෙම අංශය විසින් ශ්‍රී ලංකා ආරක්ෂක නිලධාරීන්ට කිමිදීම පිළිබඳ පුහුණු පහසුකම් ලබා ගැනීම සඳහා මාලේ හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය සමඟ අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.
- මෙම අංශය විසින් මාලදිවයින් ජාතිකයන්ට ශ්‍රී ලංකා රෝහල්වල දී වකුගඩු හා අක්මාව ඇතුළු අවයව බද්ධ කිරීමේ සැත්කම් කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවේ රේඛීය නියෝජිතායතන සමඟ එක්ව පහසුකම් සලසන ලදී.
- මාලදිවයින් රජය විසින් හුල්හුමාලේ පිහිටි රාජ්‍යතාන්ත්‍රික පරිශ්‍රයේ නව චාන්සරි ගොඩනැගිල්ල සඳහා සුදුසු ඉඩම් කැබැල්ලක් වෙන් කිරීම කඩිනම් කිරීමට මෙම අංශය පහසුකම් සැලසීය.
- ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර ත්‍රෛපාර්ශ්වික සමුද්‍රීය ආරක්ෂක සහයෝගිතා සංවිධානයේ 03 වැනි සාකච්ඡා වටය පැවැත්වීමට සාකච්ඡා කෙරෙමින් පවතී.

- පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උප මණ්ඩපයක් පිහිටුවීම සඳහා මාලදිවයිනේ ප්‍රමුඛ උසස් අධ්‍යාපන සැපයුම්කරුවන් සමඟ ශ්‍රී ලංකා තාක්ෂණික විශ්ව විද්‍යාලයට රැස්වීම් පැවැත්වීමට පහසුකම් සලසන ලදී.
- මාලදිවයිනේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා තාක්ෂණික විශ්ව විද්‍යාලය (SLTC) අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම සඳහා දෙසැම්බර් 19 සිට 20 දක්වා දිනවලදී උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මැතිතුමා මාලදිවයිනේ නියැලුණු සංචාරයට පහසුකම් සලසන ලදී.

**II. බහුපාර්ශ්වීය සබඳතා**

- සමාලෝචන කාල පරිච්ඡේදය තුළ දී පහත දැක්වෙන මාලදිවයිනේ අපේක්ෂකත්වයෙන් සඳහා ශ්‍රී ලංකාව සහාය ලබා දී ඇත: 2019-2023 කාල සීමාව සඳහා මිනිසා සහ ජෛව ගෝල පිළිබඳ යුනෙස්කෝ වැඩසටහනේ අන්තර් රාජ්‍ය සම්බන්ධීකරණ කවුන්සිලය.

**III.ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන**

- මාලදිවයිනට ඖෂධ සපයා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය ඖෂධ සංස්ථාව සහ මාලදිවයිනේ රාජ්‍ය වෙළඳ සංවිධානය (STO) අතර නැවත සාකච්ඡා ආරම්භ කරන ලදී.
- සමාලෝචන කාලය තුළ දී, මාලදිවයිනේ සිට ශ්‍රී ලංකාවට පැමිණි සංඛ්‍යාව 60,278 ක් ලෙස වාර්තා වී තිබේ.
- පුද්ගලික අංශයේ මැදිහත්වීම සමඟ ආර්ථික සහයෝගිතාව යලි පණගැන්වීම සඳහා මාලදිවයින් මහ කොමසාරිස් කාර්යාලය සමඟ නිරන්තරයෙන් සාකච්ඡා පැවැත්විණි.
- ශ්‍රී ලංකා - මාලදිවයින් ඒකාබද්ධ කොමිසම සහ සංචාරක හා ධීවර කටයුතු පිළිබඳ උප කොමිසම ද පැවැත්වීමට සාකච්ඡා කෙරෙමින් පවතී.

**IV.සංස්කෘතික සබඳතා** :

- සංස්කෘතික සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම අවසන් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

**V.කම්කරු සුබසාධනය**

- මාලදිවයිනේ සිටින ශ්‍රී ලාංකික කම්කරුවන් සම්බන්ධයෙන් මුදල් ප්‍රේෂණ සීමාවන් ලිහිල් කිරීම සඳහා විධික්‍රම සොයා ගැනීමට පැවති සාකච්ඡා සඳහා පහසුකම් සපයන ලදී. (මාලදිවයින් රජය විසින් මසකට ඇමරිකානු ඩොලර් 200 ක් පමණක් ශ්‍රී ලංකාවට යැවිය හැකි බවට සීමාවන් පනවා ඇත).
- මාලදිවයින් සිරකරුවන් ශ්‍රී ලංකාවේ සිට මාලදිවයිනට මාරු කිරීම සඳහා ද පහසුකම් සලසන ලදී.

**නේපාලය**

**I. ද්විපාර්ශ්වික සබඳතා**

- සමාලෝචන කාල පරිච්ඡේදය තුළදී, මෙම අංශය විසින්, පහත සඳහන් අංග හා සංචාර සඳහා පහසුකම් සලසන ලද අතර ඒ පිළිබඳ පසු විපරම් කටයුතු ද සිදුකරන ලදී.
- ශ්‍රී ලංකා-නේපාල 60 වන සංවත්සරය නිමිත්තෙන් 2019 දෙසැම්බර් 27 වන දින ඒකාබද්ධ සමරු මුද්දරයක් නිකුත් කිරීමට පහසුකම් සලසන ලදී.
- නේපාලයේ හිටපු අගමැති සහ කොමියුනිස්ට් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ සාමාජික ගරු. මාධව් කුමාර් මැතිතුමා ජූලි 09 සිට 14 දක්වා දිනවල දී ශ්‍රී ලංකාවට පැමිණ ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සහ දෙරටම මුහුණ දෙන සමාජ හා ආර්ථික අභියෝග සාමූහිකව ජය ගැනීම සඳහා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා සමඟ සාකච්ඡා පැවැත්වීය.

- 2020 දී කත්මණ්ඩු නුවර පැවැත්වීමට නියමිත "සාගර්මාතා සම්බාද්" සමුළුවට සහභාගී වන ලෙසත්, ආනන්දකුටි විහාරය විවෘත කරන ලෙසත් අතිගරු ජනාධිපතිතුමාට ආරාධනා කරන ලදී.
- 2009 සිට පැවැත්වීමට නියමිතව තිබූ ශ්‍රී ලංකා-නේපාල ඒකාබද්ධ කොමිෂන් සභාවේ පළමු වටය 2020 දී ශ්‍රී ලංකාවේ දී පැවැත්වීමේ අරමුණින් මෙම අංශය නේපාලයේ අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්විය.
- මෙම අංශය විසින් 2019.08.30 දින ත්‍රිභුවන් විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී.
- 2020 මුල් භාගයේදී නේපාලයේ විද්‍යා හා තාක්ෂණ ලේකම්ගේ නායකත්වයෙන් යුත් නේපාල දූත පිරිසකගේ යෝජිත සංචාරයකදී විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අවබෝධතා ගිවිසුමකට එළඹීමේ සාකච්ඡා සඳහා හා ආයුර්වේද හා දේශීය වෛද්‍ය අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ අත්දැකීම් බෙදාහදා ගැනීම සඳහා සාකච්ඡා සඳහා පහසුකම් සලසන ලදී. නේපාලයේ ද එවැනිම අධ්‍යාපන පහසුකමක් ඇති කිරීමට ඇති හැකියාව පිළිබඳව ද සොයාබැලේ.
- නේපාල සිසුන්ට ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හැදෑරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ ශිෂ්‍යත්ව 20ක් නේපාල සිසුන්ට ලබාදීමේ කටයුත්ත සඳහා මෙම අංශය පහසුකම් සලසන ලදී.
- 2018 දී අත්සන් තබන ලද තරුණ සංවර්ධනයෙහිලා සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම සම්බන්ධ පසු විපරම් කටයුත්තක් ලෙස 2019 අප්‍රේල් /මැයි මාස වලදී තරුණ නියෝජිතයින් හුවමාරු කර ගැනීමට පියවර ගන්නා ලදී. එසේම, 2019 නේපාලයේ පැවති 13 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙලට ශ්‍රී ලංකාව සහභාගී විය.
- එළඹීමට නියමිත පහත සඳහන් ගිවිසුම්වල වැඩකටයුතු සිදුකිරීමෙන් පවතී: සංස්කෘතික ගිවිසුම අළුත් කිරීම (නේපාලයේ පාර්ශ්වයෙන් ඉටුකළ යුතු කාර්යය ඉතිරිව ඇත), සිරකරුවන් මාරු කිරීමේ ගිවිසුම (නේපාල පාර්ශ්ව ඉටුකළ යුතු කාර්යය ඉතිරිව ඇත), උසස් අධ්‍යාපනය පිළිබඳ අවබෝධතා ගිවිසුම (නේපාලය පාර්ශ්ව ඉටුකළ යුතු කාර්යය ඉතිරිව තිබේ. සංචාරක කටයුතු පිළිබඳ අවබෝධතා ගිවිසුම (ශ්‍රී ලංකා පාර්ශ්ව ඉටුකිරීමට කටයුතු ඉතිරිව තිබේ).

**II.ආර්ථික සම්බන්ධතා හා විදේශීය ආයෝජන**

- නේපාලය සංචාරක කර්මාන්තයේ නැගී එන වෙළඳපොළක් ලෙස ශ්‍රී ලංකා බැතිමත්තු 50,000 ක් පමණ ලුම්බිණි සහ වෙනත් බෞද්ධ සිද්ධස්ථාන නැරඹූහ.
- කත්මණ්ඩු සහ ශ්‍රී ලංකාව අතර හිමාලයන් ගුවන් සේවය මගින් සෘජු ගුවන් ගමන් නැවත ආරම්භ කිරීම සඳහා සාකච්ඡා කෙරෙමින් පවතී. එසේම, දෙරට අතර සංචාරක හා වෙළඳ සහයෝගීතාවයට රුකුලක් වන පරිදි ශ්‍රී ලංකන් ගුවන් සේවයට ද කත්මණ්ඩු බලා පියාසර කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බැලීම කෙරෙහි නිසි අවධානය යොමු කර ඇත.
- ශ්‍රී ලාංකික ව්‍යවසායකයින් හමුවීම සඳහා නොවැම්බර් 04 සිට 07 දක්වා දිනවල දී විටිවාන් හි වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ වෙළඳ නියෝජිත කණ්ඩායමක් නියැලුණු සංචාරයක් සඳහා සහාය ලබා දෙන ලදී. මෙම සංචාරයේ ප්‍රතිඵලය වූයේ ලංකා වාණිජ මණ්ඩලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමයි.

**III.සංස්කෘතික සබඳතා**

- 2019 ජූනි 27 සිට 30 දක්වා දිනවල දී ගරු බුද්ධසාසන අමාත්‍යවරයා නේපාලයේ නියැලුණු සංචාරය.
- ගරු අග්‍රාමාත්‍යතුමා සහ ගරු. සංස්කෘතික, සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ගරු. විදේශ කටයුතු අමාත්‍යතුමා සහ සංස්කෘතික, සංචාරක හා ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා සමඟ රැස්වීම් පැවැත්වීය. මෙම සංචාරය අතරතුර දී, ගරු. අමාත්‍යතුමා ලුම්බිණි, දුටුගැමුණු වන්දනා විශ්‍රාම ශාලාවලට සහ ශ්‍රී ලංකාව විසින් අරමුදල් සපයන ලද ආනන්දකුටි විහාරය සහ රතොමවීනද්‍රනාත් විහාරයට ද පැමිණියේය.
- 2015 දී නේපාලයේ ඇති වූ භූමිකම්පාවෙන් විනාශයට පත් වූ ආනන්දකුටි විහාරය සහ රතොමවීනද්‍රනාත් විහාරය ප්‍රතිසංස්කරණය කටයුතුවලදී මෙම අංශය විසින් නේපාල රජයට

සහාය වීම පිළිබඳව සලකා බැලීම සඳහා ලුම්බිණි ප්‍රධාන සැලැස්මේ සංවර්ධන ප්‍රගතිය ශ්‍රී ලංකා රජය සඳහා ඉල්ලා සිටියේය.

- නොවැම්බර් 07 වන දින ලුම්බිණි බෞද්ධ විශ්ව විද්‍යාලයේ සහ ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය අතර අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීමෙහි ලා මෙම අංශය සහාය දැක්විය.
- සංස්කෘතික කෞතුක වස්තූන් නේපාලයට ගෙන ඒමට මෙම අංශය සහාය විය. මෙම කෞතුක වස්තූන් නේපාලයේ ගරු. නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ අරක්ෂක අමාත්‍යවරයාට නොවැම්බර් 10 වන දින භාර දෙන ලදී.

**IV.කම්කරු කටයුතු හා සුබසාධනය**

- අධික කාලයක් රැඳී සිටීම නිසා අතරමංව සිටින ශ්‍රී ලාංකිකයන්/නේපාල ජාතිකයන් නැවත මෙරටට ගෙන්වා ගැනීම, නේපාලයට යැවීම සඳහා සහාය ලබාදුන් අතර සහ දඩ ගාස්තු සහ දඩ මුදල් වලින් නිදහස් කරන ලෙස අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටින ලදී.

**පාකිස්ථානය**

**I. ද්විපාර්ශ්වික සබඳතා**

- පාර්ලිමේන්තු නුවමාරු වැඩසටහනේ පහසුකම් යටතේ, 2019 ජූලි 29 සිට අගෝස්තු 2 දක්වා ඉස්ලාමාබාද් හි පැවති 5 වන පොදුරාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමයේ ආසියා කලාපීය සමුළුවට ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හය දෙනෙක් සහභාගී වූහ.
- පාකිස්තාන ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන සහයෝගීතා වැඩසටහන යටතේ ශ්‍රී ලාංකික සිසුන් සඳහා ආසන 1000 ක් වෙන් කර ඇති අතර එය පාකිස්ථානයේ පූර්ණ ශිෂ්‍යත්ව පදනම මත වසර පහක් දක්වා ක්‍රියාත්මකය. ඒ සඳහා මෙම අංශය පහසුකම් සලසන ලදී.
- ද්විපාර්ශ්වික සෞඛ්‍ය සහයෝගීතාවයේ කොටසක් ලෙස පාකිස්ථාන රජයට මිනිස් අක්ෂි පටල 65 ක් පරිත්‍යාග කිරීම සඳහා ශ්‍රී ලංකාවේ "ගිවිං සයිට්" පදනමට මෙම අංශය විසින් පහසුකම් සලසන ලදී.
- පාකිස්තානයේ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යාපන පාසල විසින් පිරිනමනු ලබන පුහුණු පාඨමාලාවට පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසි දෙනෙකුට සහභාගීවීම සඳහා මෙම අංශය අවශ්‍ය පහසුකම් සැලසීය.
- ආරක්ෂක සහයෝගීතාව, උසස් අධ්‍යාපන සහ සමුද්‍රීය සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම් වල කටයුතු අවසන් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
- 2019 දී පාකිස්තානයේ ත්‍රිවිධ හමුදාව විසින් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන් සඳහා හමුදා පුහුණු පුරප්පාඩු 622 ක් ලබා දෙන ලදී. ඉහළ මට්ටමේ හමුදා නියෝජිත කණ්ඩායම් සංචාර, ඒකාබද්ධ හමුදා අභ්‍යාස, සම්මන්ත්‍රණ සහ ක්‍රීඩා නුවමාරු වැඩසටහන් පැවැත්වීම මගින් දෙරටේ ත්‍රිවිධ හමුදා විසින් සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කරන ලදී.
- 2019 නොවැම්බර් 5 සිට 7 දක්වා පාකිස්ථානයේ දී 05 වන ආරක්ෂක සංවාදය පැවැත්වීමට මෙම අංශය සහාය දැක්විය.
- පාකිස්ථානයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු. මක්දූම් ෂා මෙහෙමූඩ් කුරේෂි මැතිතුමා 2019 දෙසැම්බර් 2 සිට 4 දක්වා දෙදින ශ්‍රී ලංකා සංචාරයක නිරත විය. වෙළඳ සහයෝගීතා, ආරක්ෂක, බුද්ධි සේවා නුවමාරු, සංචාරක කටයුතු, උසස් අධ්‍යාපන හා සංස්කෘතික සහයෝගීතා යන ක්ෂේත්‍ර පිළිබඳව මෙහි දී අවධානය යොමු කෙරිණි.
- 2020 දී විදේශ කාර්යාල උපදේශනවල 06 වන වටය පැවැත්වීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

**II. බහුපාර්ශ්වික සම්බන්ධතා**

- 2019 නොවැම්බර් මාසයේ පැරීසියේදී පැවති 2019-2023 කාලසීමාව සඳහා යුනෙස්කෝ විධායක මණ්ඩලයට පාකිස්ථානය තේරී පත්වීමට ශ්‍රී ලංකාව සහාය විය.
- 2019-2021 කාලසීමාව සඳහා යුනෙස්කෝවේ අන්තර් රාජ්‍ය සාගර විද්‍යා කොමිසමේ (IOC) විධායක සභාවට ශ්‍රී ලංකාව සහාය විය.

## III. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

- සාර්ක් කලාපයේ රටවල් අතුරින් පාකිස්ථානය ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වෙළඳ හවුල්කරුවා වන අතර 2005 දී පාකිස්ථානය සමඟ එළඹුණු නිදහස් වෙළඳ ගිවිසුම යළි පණ ගැන්වීම සඳහා මේ වන විට සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
- 2020 මුල් භාගයේදී පාකිස්තානයේ පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා-පාකිස්ථාන ඒකාබද්ධ ආර්ථික කොමිසමේ 12 වන සැසිවාරය පිළිබඳ සාකච්ඡා පැවැත්වෙමින් පවතී.
- දෙරට අතර සංචාරක සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමේ කටයුතු අවසන් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ. 2019 දී පාකිස්ථානයේ සිට ශ්‍රී ලංකාවට සංචාරකයින් 14,655 ක් පමණ පැමිණ තිබේ.
- පාකිස්ථානයේ ඇමරිකානු ඩොලර් මිලියන 200ක ණය පහසුකම ලබාදීමේ පාකිස්ථාන ප්‍රදාන යටතේ සහයෝගිතා ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා මූලික සාකච්ඡා ආරම්භ කොට තිබේ. (පශු සම්පත්, නිවාස, විද්‍යාව හා තාක්ෂණය සහ මාර්ග ජාලය).
- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (තාක්ෂණික) මෙරිල් ගුණතිලක මහතා දෙරටේ බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමේ හැකියාවන් ගවේෂණය කිරීම සඳහා පකිස්ථානයේ ජාතික විදුලිබල නියාමන අධිකාරියේ සභාපති ටොසෙෆ් එච්. ෆාරුකි මහතා හමුවිය.

## IV.සංස්කෘතික සබඳතා

- 2016 දී අත්සන් තබන ලද දෙරට අතර සංස්කෘතික සබඳතා ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය සැලැස්මක් සකස් කිරීම සාකච්ඡා සිදුකරමින් පවතියි.
- 2020 වසරේ දී එළඹීමේ අරමුණින් දෙරට අතර සංස්කෘතික හුවමාරු වැඩසටහනක් සංවිධානය කිරීම සඳහා සාකච්ඡා ආරම්භ කරන ලදී.

## දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමය (සාර්ක්) 2019

සමාලෝචන කාල පරිච්ඡේදය තුළ දී පහත සඳහන් කටයුතු සම්බන්ධීකරණය සඳහා මෙම අංශය සහාය විය:

- කත්මණ්ඩු නුවර සාර්ක් මහලේකම් කාර්යාලයේ සාර්ක් මහලේකම් ධුරය සඳහා ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් ඇසල වීරකෝන් මහතා/අතිගරු ශ්‍රී ලංකා ජනාධිපතිතුමා නම් කිරීම 2019 ජුනි 25 වැනි දින මෙම අංශය විසින් ඉදිරිපත් කරන ලදී.
- කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ නායකත්වයෙන් යුත් නියෝජිත කණ්ඩායමක් 2019 ජුනි 27 වන දින තිම්පු හි සාර්ක් කෘෂිකර්ම අමාත්‍යවරුන්ගේ සිව්වන රැස්වීමට සහභාගී විය. මෙම රැස්වීමේ දී "කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ තිම්පු ප්‍රකාශය සංවර්ධනය" සහ "ප්‍රති-ක්ෂුද්‍ර ජීවී ප්‍රතිරෝධය" (AMR) පිළිබඳ ප්‍රකාශය සම්මත තරන ලදී.
- 2019 අගෝස්තු 23 සිට 24 දක්වා කොළඹ දී පැවති සාර්ක් සංවර්ධන අරමුදල් මණ්ඩලයේ තිස් එක්වැනි රැස්වීමේ දී ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් විමලෙන්තිරාජා මහතා වසර දෙකක කාලයක් සඳහා සාර්ක් සංවර්ධන අරමුදලේ සභාපති ලෙස පත් කරන ලදී.
- නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ නායකත්වයෙන් යුත් නියෝජිත කණ්ඩායමක් 2019 ඔක්තොම්බර් 10 වන දින මාලදිවයිනේ පැවති සාර්ක් අධ්‍යාපන /උසස් අධ්‍යාපන අමාත්‍යවරුන්ගේ තුන්වන රැස්වීමට සහභාගී විය. මෙම රැස්වීමේදී " අධ්‍යාපනය/උසස් අධ්‍යාපනය" පිළිබඳ මාලේ ප්‍රකාශය සහ අධ්‍යාපනය 2030 : ක්‍රියාකාරීත්වය සඳහා සාර්ක් රාමුව සම්මත කර ඇත.

- ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා අමාත්‍යාංශයේ ද්විපාර්ශ්වික කටයුතු (බටහිර හා නීති) අතිරේක ලේකම් ඒ.එම්.ජේ.සාදික් මහතා වසර දෙකක කාලසීමාවක් සඳහා සාර්ක් බේරුම්කරණ කවුන්සිලයේ SARCO පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස 2019 ඔක්තොම්බර් 30 සිට 31 දක්වා පාකිස්ථානයේ ලාහෝර් හි පැවති සාර්ක් බේරුම්කරණ කවුන්සිලයේ (SARCO) 10 වැනි පාලක මණ්ඩල රැස්වීමේදී පත්කර ගන්නා ලදී.
- නේපාලයේ ශ්‍රී ලංකා තානාපතිවරයා, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු සමඟ 2019 නොවැම්බර් 19 වන දින කත්මණ්ඩු නුවරදී පැවති සාර්ක් අන්තර් ප්‍රවාහන කණ්ඩායමේ හයවන රැස්වීමට සහභාගී වූහ. මෙම රැස්වීමේ දී මෝටර් වාහන, දුම්රිය හා ගුවන් සේවා පිළිබඳ ගිවිසුම්; සාර්ක් කලාපීය බහු ආකාර වූ ප්‍රවාහන අධ්‍යයනය; සහ සාර්ක් භාණ්ඩ හා මගී බෝට්ටු සේවය පිළිබඳ සාර්ක් ගිවිසුම්වල ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.
- 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ 2020 වර්ෂය සඳහා වසර පුරා ක්‍රියාත්මකවන කටයුතු සඳහා අයවැය අනුමත කිරීම සඳහා වූ සාකච්ඡා පැවැත්වීමට මෙම අංශය 2019 දෙසැම්බර් 19 සිට 20 දක්වා කත්මණ්ඩු නුවර සාර්ක් වැඩසටහන් කමිටුවේ 57 වන සැසිවාරයට සහභාගී විය.
- සියලුම සාර්ක් රටවල් හා සාර්ක් මහලේකම් කාර්යාලය සමඟ කටයුතු සම්බන්ධීකරණය කරමින් 2019 දී ක්‍රියාකාරකම් /වැඩසටහන් 11 ක් පමණ සාර්ථකව පැවැත්වීමට මෙම අංශය සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයට (SCC) පහසුකම් සලසන ලදී.
- සාර්ක් වීසා බලපත්‍ර ලබාගැනීමෙන් නිදහස් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ, 2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළදී හිමිකම් ඇති පුද්ගලයින් සඳහා වීසා 627 ක් පමණ නිකුත් කිරීමට මෙම අංශය පහසුකම් සැලසීය.
- අදාළ නියෝජිතායතන ශ්‍රී ලංකාවේ සාමාජිකත්වය සඳහා සාර්ක් නියෝජිතායතනවලට ලබාදිය යුතු එක් එක් ගෙවීම් සම්බන්ධයෙන් අදාළ රජයේ අමාත්‍යාංශ හා වෙනත් ආයතන සමඟ මෙම අංශය කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.
- ඉහත කරුණු වලට අමතරව, 2019 දී පවත්වන ලද පහත දැක්වෙන ප්‍රධාන සාර්ක් වැඩසටහන් /ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වයට අවශ්‍ය සුදුසුකම් කටයුතු හා සැපයුම් සේවා මෙම අංශය විසින් ලබාදෙන ලදී.

- 2019 ජනවාරි 17 නවදිල්ලියේ පැවති සාර්ක් බීජ බැංකු මණ්ඩලයේ දෙවන රැස්වීම.
- 2019 ජනවාරි 21-22 දක්වා ඉස්ලාමාබාද්හි පැවති සාර්ක් ආහාර බැංකු මණ්ඩලයේ දසවන රැස්වීම.
- 2019 අප්‍රේල් 08-09 දිනවලදී ඉස්ලාමාබාද්හි පැවති බලශක්තිය පිළිබඳ සාර්ක් ක්‍රියාකාරී කණ්ඩායමේ නවවන රැස්වීම.
- 2019 අප්‍රේල් 18 වන දින කත්මණ්ඩු හිදී පැවති සාර්ක් ආගමන බලධාරීන්ගේ සහ වීසා විශේෂඥයින්ගේ ප්‍රධාන කණ්ඩායමේ තුන්වන රැස්වීම
- 2019 මැයි 02 දින ෆීජි හි නාඩි හිදී පැවති සාර්ක් මුදල් ඇමතිවරුන්ගේ දහතුන්වන අවිධිමත් රැස්වීම.
- 2019 මැයි 30-31 දිනවලදී කත්මණ්ඩුහි දී පැවති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා/සමාන ආයතනවල ප්‍රධානීන්ගේ කමිටුවේ දොළොස්වන රැස්වීම.
- 2019 ජුනි 10-11 දිනවලදී මාලේහි දී පැවති සාර්ක් රටවල බලශක්ති නියාමක විශේෂඥයින්ගේ කවුන්සිලයේ (විදුලිබල) සිව්වන රැස්වීම.
- 2019 ජුනි 24-25 දිනවල දී කත්මණ්ඩුහි දී පැවති කලාපීය ආර්ථික සමෝධානික අධ්‍යයනය (අදියර II) පිළිබඳ සාර්ක් ADB සිව්වන විශේෂ රැස්වීම.
- 2019 ජුනි 25 වන දින තිම්පු හි දී පැවති කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධන තාක්ෂණික කමිටුවේ නවවන රැස්වීම.
- 2019 ජූලි 23-24 දක්වා ඉස්ලාමාබාද්හි පැවති සාර්ක් ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරීන්ගේ සංසදයේ හත්වන රැස්වීම.

- 2019 ඔක්තෝබර් 15-16 දිනවල ඩකා හිදී පැවති සාර්ක් කෘෂිකාර්මික මධ්‍යස්ථානයේ (SAC) පාලක මණ්ඩලයේ දහතුන්වන රැස්වීම.
- 2019 ඔක්තෝබර් 16-17 ගාල්ලේහි දී පැවති සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ එකොළොස්වන රැස්වීම.
- 2019 ඔක්තෝබර් 17, වොෂිංටන් ඩී.සී හිදී පැවති සාර්ක් මුදල් ඇමතිවරුන්ගේ දහහතරවන අවිධිමත් රැස්වීම.
- 2019 ඔක්තෝබර් 30-31 දක්වා ලාහෝර්හි දී පැවති සාර්ක් බේරුම්කරණ කවුන්සිලයේ (SARCO)පාලක මණ්ඩලයේ දසවන රැස්වීම.
- 2019 නොවැම්බර් 05-06 ඩකාහි දී පැවති දකුණු ආසියානු කලාපීය ප්‍රමිති සංවිධානයේ (SARSO) පාලක මණ්ඩලයේ අටවන රැස්වීම.
- 2019 නොවැම්බර් 20 සිට 21 දක්වා කත්මණ්ඩු හි දී පැවති සාර්ක් ක්ෂය රෝගය සහ එච්.අයි.වී / ඒඩ්ස් මධ්‍යස්ථානයේ (STAC) පාලක මණ්ඩලයේ විසි නවවන රැස්වීම.

# නැගෙනහිර ආසියා හා ඕෂනියා අංශය

## නැගෙනහිර ආසියා හා ඕෂනියා අංශය

**ආවරණය වන රටවල්**: ඕස්ට්‍රේලියාව, චීන මහජන සමූහාණ්ඩුව, ප්‍රජාතාන්ත්‍රික මහජන කොරියානු ජනරජය, (DPRK) ෆීජී, ජපානය, මොන්ගෝලියාව, නවසීලන්තය, පැපුවා නිව්ගිනියාව, කොරියානු සමූහාණ්ඩුව, වනුආටු, සොලමන් දූපත්, සැමෝආ,

**නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව** - හතරකි (04). (ඕස්ට්‍රේලියාව, චීනය, ජපානය, කොරියානු ජනරජය)

**කොන්සල් කාර්යාල සංඛ්‍යාව** - හතරකි (04) (ඕස්ට්‍රේලියාව - සිඩ්නි, මෙල්බන්, චීනය - ෂැංහායි සහ ගුවාන්ෂු)

**සමගාමීව අක්තගැන්වීම්**

ඕස්ට්‍රේලියාව(කැන්බරා) - ෆීජී, නවසීලන්තය, පැවුවා නිව්ගිනියාව, සොලමන් දූපත්, සමෝආ, වනුආටු

චීනය - ප්‍රජාතාන්ත්‍රික මහජන කොරියා ජනරජය, මොන්ගෝලියාව

**බහුපාර්ශ්වීය/කලාපීය සංවිධාන සංඛ්‍යාව**

ෂැංහයි සහයෝගිතා සංවිධානය (SCO), ආසියාවේ අනෝන්‍ය ක්‍රියාකාරකම් හා විශ්වාසය ගොඩනැගීම පිළිබඳ සමුළුව (CICA) සහ බාලි ක්‍රියාදාමය

**නැගෙනහිර ආසියා අංශයේ ප්‍රධාන කාර්යය කටයුතු මෙසේය:**

i. භූගෝලීය කලාපයේ රටවල්වලට අදාළව ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සැකසීම.
ii. රජයේ ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳව මෙම භූගෝලීය කලාපයේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට උපදෙස් දීම හා ඔවුනට පවරා තිබෙන රටවලදී ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ධනාත්මක වශයෙන් ප්‍රවර්ධනය කිරීම හා ප්‍රක්ෂේපණය කිරීම
iii. ආර්ථික, රාජ්‍යතාන්ත්‍රික කටයුතු හා පොදු රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල ක්‍රියාකාරීව නියැලෙන ලෙස මෙම කලාපයේ ඇති ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට මඟ පෙන්වීම ලබාදීම සහ ශ්‍රී ලාංකිකයින්ට සහ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පුද්ගලයන්ට සහාය ලබාදීම.
iv. ශ්‍රී ලංකාවේ සංචාරවල නියැලෙන/විදේශීය රටවල සංචාරවල නියැලෙන සම්භාවනීය පුද්ගලයන්ගේ සංචාර සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම/අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
v. මෙම භූගෝලීය කලාපයේ රටවල් හා සංවිධාන සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තැබීමට අවශ්‍ය පහසුකම් සැලසීම
vi. ෂැංහයි සහයෝගිතා සංවිධානය, බාලි ක්‍රියාදාමයට සහ ආසියාවේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් හා විශ්වාසය ගොඩනැගීම පිළබඳ සමුළුවට අදාළ කටයුතු සම්බන්ධීකරණය සහ
vii. කොළඹ පිහිටි නැගෙනහිර ආසියා කලාපයේ ශ්‍රී ලංකා විදේශීය දූත මණ්ඩල සමඟ සමීප හා සුහද සබඳතා පවත්වාගෙන යාම.
viii. මෙම කලාපයේ ප්‍රවණතාවල දේශපාලන අනුමිනීන් පිළිබඳ අමාත්‍යාංශය තුළ විවිධ අංශවලට උපදෙස් ලබාදීම

### 1. ද්විපාර්ශ්වික සහයෝගිතාවය

i. ජපාන පාර්ලිමේන්තු මන්ත්‍රී හා අග්‍රාමාත්‍ය විශේෂ උපදේශක කෙන්ටරෝ සොනෝරා මහතා 2019 පෙබරවාරි 15 සිට 16 දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රී ජපාන අගමැතිගේ සංචාරයට අවශ්‍ය පහසුකම් සලසන ලදී.
ii. 2019 මැයි 13 සිට 16 දක්වා චීනයේ පැවති ආසියානු ශිෂ්ටාචාරය සංවාද සමුළුවට සහභාගීවීම සඳහා හිටපු ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා නිරත වූ සංචාරය සංවිධානය කරන ලදී. මෙම සංචාරය අතරතුර, අතිගරු ජනාධිපතිතුමා, අතිගරු චීනයේ

ජනාධිපති ෂී ජින් පිං, අග්‍රාමාත්‍ය අතිගරු ලී කේචියැන්ග් සහ චීන මහජන දේශපාලන උපදේශන සමුළුවේ CPPCC සභාපති අතිගරු අතිගරු වැන් යැං සහ මන්ත්‍රීතුමන්ලා හමුවිය.

iii. අංක 20178 - 025-iv 117 දරන පුපුරණ ද්‍රව්‍ය ඉවත්කිරීමේ උපකරණ පිළිබඳ (EOD) හමුදා සන්ධානවලට සහ අංක 2018B-025-iv117 දරන හදිසි අණ සහ සන්නිවේදන පද්ධති හමුදා සන්ධානවලට මෙම සංචාරයේ දී අත්සන් තබන ලදී.

iv. ඕස්ට්‍රේලියානු ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු පීටර් ඩටන් මැතිතුමාගේ සංචාරයට (2020 ජූනි 03-04), ඕස්ට්‍රේලියාවේ ඒකාබද්ධ කාර්ය සාධක බලකායේ අණදෙන නිලධාරී මේජර් ජනරාල් ක්‍රේග් ෆුරිනි මහතාගේ සංචාරයට (2019 සැප්තැම්බර් 03) සහ ත්‍රස්ත මර්දනය හා ප්‍රචණ්ඩකාරී අන්තවාදය මර්දනය පිළිබඳ ඕස්ට්‍රේලියානු තානාපති පෝල් ෆෝලි මහතාගේ සංචාරයට (2019 සැප්තැම්බර් 30 - ඔක්තෝබර් 10) පහසුකම් සැලසීය.

v. ජපානයේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ටොෂිකා අබේ මහත්මිය සහ ජපාන අග්‍රාමාත්‍යවරයාගේ විශේෂ උපදේශක ආචාර්ය හර්ප්ටෝ ඉසුමි මහතා ශ්‍රී ලංකාවට පැමිණියහ (2019 ජූලි 05).

vi. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ඕස්ට්‍රේලියානු විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුව අතර ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සාකච්ඡාවල තුන්වන වටය කොළඹ දී කැඳවන ලදී (2019 සැප්තැම්බර් 17 දින).

vii. චීන කොමියුනිස්ට් පක්ෂයේ ලේකම් මිනර් මහතාගේ සංචාරයට අවශ්‍ය පහසුකම් සලසන ලදී (2019 සැප්තැම්බර් 17 සිට 19 දක්වා).

viii. චීනයේ රාජ්‍ය කවුන්සිල් සාමාජිකගේ සහ චීනයේ විදේශ ඇමතිගේ විශේෂ නියෝජිත තානාපති වූ ජියැන්ගාවෝ මැතිතුමාගේ සංචාරයට පහසුකම් සැලසීය (2019 සැප්තැම්බර් 02)

ix. ටෝකියෝ නුවර නව ජපන් අධිරාජ්‍යයා වන නරුහිටෝගේ (2019 ඔක්තෝබර් 22 සිට 23 දක්වා) සිංහාසනාරූඩ උත්සවයට ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා සහ ජනාධිපති ආර්යාව සහභාගී වූ අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

x. නිදන්ගත වකුගඩු රෝග වැළැක්වීම සඳහා වූ ශ්‍රී ලංකා ජනාධිපති කාර්ය සාධක බලකාය සහ ඕස්ට්‍රේලියානු න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ සංවිධානය (ANSTO) අතර රෝග නිධානය නොදන්නා නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ සහයෝගිතා වැඩසටහන් සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා පහසුකම් සපයන ලදී. (2019 නොවැම්බර්) සහ ශ්‍රී ලංකාවේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය (GSHB) සහ ඕස්ට්‍රේලියා "ජියෝසයන්සස්" අතර විද්‍යාත්මක හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම සඳහා ද පහසුකම් සැලසීය (05 නොවැම්බර් 2019)

xi. ජපානයේ විදේශ කටයුතු අමාත්‍ය අතිගරු ටොෂිමිත්සු මොටෙගි මැතිතුමාගේ සංචාරයට පහසුකම් සපයන ලදී (2019 දෙසැම්බර් 13).

## 02. කලාපීය සහයෝගීතාවය

### 02.1 බාලි ක්‍රියාදාමය

ශ්‍රී ලංකාව බාලි ක්‍රියාදාමයේ සාමාජික රටකි.

මෙම කාල සීමාව තුළ දී බාලි ක්‍රියාදාමයේ වැඩමුළු /සම්මන්ත්‍රණ/අංග සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය පහත දැක්වේ.

i. ප්‍රතිලාභ සහ නැවත සමෝධානිකරණය කිරීම පිළිබඳ බාලි ක්‍රියාදාමයේ තාක්ෂණික විශේෂඥ කණ්ඩායම් රැස්වීම (2019 පෙබරවාරි 12-13)

ii. සැලසුම් කිරීම සහ සූදානම පිළිබඳ බාලි ක්‍රියාදාමයේ කාර්ය සාධක බලකාය (TEPP)) (2019 පෙබරවාරි 14 සිට 15 දක්වා

iii. කොන්සියුලර් නිලධාරීන් සඳහා නීති විරෝධී ලෙස ප්‍රවාහනයේ වින්දිතයින් හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම පිළිබඳ බාලි ක්‍රියාදාම පුහුණු වැඩමුළුව (2019 මාර්තු 12 සිට 13 දක්වා)

iv. පුද්ගලයින් නීති විරෝධී ලෙස ප්‍රවාහනය පිළිබඳ බාලි ක්‍රියාදාම ක්‍රියාකාරී කණ්ඩායම (TIPWG) සහ වාර්ෂික රැස්වීම (2019 ජූනි 18 සිට 20 දක්වා)

v. 14 වන තත්කාර්ය කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම (2019 ජූලි 22 සිට 23 දක්වා)
vi. මුහුදු මගින් සිදුකරන අක්‍රමවත් සංක්‍රමණවලට විසඳුම් ලබාදීම සඳහා බාලි ක්‍රියාදාමයේ විස්තීරණ ප්‍රවේශ, වටමේස සාකච්ඡා (2019 අගෝස්තු 20-22)
vii. බාලි ක්‍රියාදාම දේශසීමා කළමනාකරණ වටමේස සාකච්ඡා - මිනිසුන් නීති විරෝධී ලෙස ප්‍රවාහනය කිරීමේ අවදානම සහ ඉන් මතුවන ගැටලු (2019 ඔක්තෝබර් 22 සිට 24 දක්වා)

## 2.2 ආසියාවේ අන්තර් ක්‍රියාකාරිත්වය සහ විශ්වාසය ගොඩනැඟීමේ පියවර පිළිබඳ සමුළුව (CICA)

2018 අගෝස්තු 15 වන දින ශ්‍රී ලංකාව පූර්ණ සාමාජිකත්වය ලබා ගත්තාය.

i. කසකස්ථාන් ජනරජයේ නූර්-සලුතාන් හි 2019 අප්‍රේල් 18-19 දිනවලදී පැවති මෙම සමුළුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටු රැස්වීමට (SOC) නැගෙනහිර ආසියා අංශයේ අධ්‍යක්ෂ වරයා සහභාගි විය.
ii. ටජිකිස්ථානයේ දුෂාන්බේහි පැවති ආසියාවේ අන්තර් ක්‍රියාකාරිත්වය සහ විශ්වාසය ගොඩනැඟීමේ පියවර පිළිබඳ සමුළුවේ 5 වන සම්මන්ත්‍රණයට හිටපු ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහභාගිත්වය සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරන ලදී (2019 ජූනි 13-15)
iii. චීනයේ චොංචිං නගරයේ දී 2019 දෙසැම්බර් 18-19 දිනවලදී පැවති මෙම සමුළුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටු රැස්වීමට චීනයේ ශ්‍රී ලංකා තානාපතිතුමා සහභාගී විය.

## 2.3 ෂැංහයි සහයෝගිතා සංවිධානය (SCO)

ශ්‍රී ලංකාව 2009 සිට මෙම සංවිධානයේ සංවාද හවුල්කරුවෙකු වන අතර එහි නිරීක්ෂක තත්ත්වය සඳහා ඉල්ලුම් කර ඇත.

i. නිව්යෝර්ක්හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතගේ, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ෂැංහයි සහයෝගිතා සංවිධානය: සාමය, ආරක්ෂාව සහ හැකියාව ප්‍රවර්ධනය කිරීම සඳහා සහයෝගිතාව, සංවිධානාත්මක අපරාධවලදී ත්‍රස්තවාදය සම්බන්ධ කිරීම සහ මත්ද්‍රව්‍ය ජාවාරම හරහා එයට මුදල් සැපයීම වැළැක්වීම යන තේමාව යටතේ 2019 නොවැම්බර් 19 දින පැවැති ඉහළ මට්ටමේ විශේෂ රැස්වීමේදී ප්‍රකාශයක් නිකුත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී.

### 1. ඕස්ට්‍රේලියාව

ශ්‍රී ලංකාව ඕස්ට්‍රේලියාවේ නේවාසික දූත මණ්ඩල /දූත කාර්යාල තුනක් පවත්වාගෙන යයි. කැන්බරා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, මෙල්බර්න් හි කොන්සල් ජනරාල් කාර්යාලය සහ සිඩ්නි හි කොන්සල් ජනරාල් කාර්යලය වශයෙනි.

### ආ. ද්විපාර්ශ්වික සබඳතා :

i. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාතයාංශය සහ ඕස්ට්‍රේලියානු විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුව(DFAT) අතර ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ තුන්වන වටය කොළඹදී පැවැත්විණි. (2019 සැප්තැම්බර් 17)
ii. ඕස්ට්‍රේලියානු ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු පීටර් ඩුමොන් මැතිතුමා දේශසීමා ඉක්මවා සිදුකරන අපරාධ මැඩපැවැත්වීම සඳහා සහයෝගිතාව ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකාවට පැමිණියේය (2019 ජූනි 03-04)
iii. ඕස්ට්‍රේලියාවේ ඒකාබද්ධ කාර්ය සාධක බලකායේ අණදෙන නිලධාරී, ස්වෛරී දේශසීමා මෙහෙයුම් මේජර් ජනරාල් ක්‍රේග් ෆුරිනිගේ නායකත්වයෙන් යුතු මිනිසුන් නීති විරෝධී ලෙස ප්‍රවාහනය කිරීම සහ මිනිස් ජාවාරම් මැඩලීම සඳහා වූ දූත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණියේය. (2019 සැප්තැම්බර් 03).

iv. ඕස්ට්‍රේලියාවේ තුස්තවාදය සහ ප්‍රචණ්ඩවාදී අන්තවාදය මැඩලීම පිළිබඳ ඕස්ට්‍රේලියාවේ තානාපති පෝල් ෆෝලි මැතිතුමා ශ්‍රී ලංකාවට පැමිණියේය. (2019 සැප්තැම්බර් 30-ඔක්තෝබර් 10).

v. 1945 එක්සත් ජාතීන්ගේ පනතේ ප්‍රඥප්තියේ 15 (1) වගන්තිය යටතේ ඕස්ට්‍රේලියානු රජය (2019 සැප්තැම්බර් 23)ඕස්ට්‍රේලියාවේ එල්.ටී.ටී.ඊ ය තහනම් කිරීම 2022 සැප්තැම්බර් 17 දක්වා අඛණ්ඩව සිදුකරන බව ප්‍රකාශයට පත් කළේය.

**ආ. බහුපාර්ශ්වික සම්බන්ධතා :**

i. මුදල් විශුද්ධීකරණයට එරෙහිව කටයුතු කිරීමත් සහ තුස්තවාදී උපාය මාර්ගික ඥානතා සඳහා අරමුදල් සැපයීම මැඩ පැවැත්වීමත් සමග මූල්‍ය ක්‍රියාකාරී කාර්යය සාධන බලකා තුන්වැනි රටවල ඉහළ අවධානම් අළුපැහැති ලැයිස්තුවෙන් ශ්‍රී ලංකාව ඉවත් කර ගැනීම සඳහා ඕස්ට්‍රේලියානු බලධාරීන්ගෙන් උපකාර ඉල්ලා සිටින ලදී.

ii. ශ්‍රී ලාංකිකයන් ඇතුළුව ඕස්ට්‍රේලියාවේ කාලය ඉක්මවමින් රැඳී සිටින පුද්ගලයන් ස්වේච්ඡාවෙන් තම රටවලට ආපසු පැමිණීම සඳහා සහ ඔවුන් තම මවු රටවලට ගෙන්වා පදිංචි කිරීමේ හා සම්බන්ධීකරණ වැඩසටහන්වල පශ්චාත් අවධි ක්‍රියාවලිය සඳහා නවසීලන්ත සංක්‍රමණ පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය සමඟ කටයුතු කරන ලදී. (2019 ඔක්තෝබර් 03)

**ඇ. ආර්ථික සම්බන්ධතා සහ විදේශ ආයෝජන:**

i. ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුමේ TIFA දෙවන සැසිය කොළඹ දී (2019 සැප්තැම්බර් 17 පැවැත්විණි)

ii. ශ්‍රී ලංකාව සංචාරක, වෙළඳ හා ආයෝජන සඳහා ආකර්ශණීය ගමනාන්තයක් ලෙස ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් අඛණ්ඩව 4 වන වරටත් 4,400 ක සහභාගිත්වයෙන් යුතුව 2019 ශ්‍රී ලංකා උළෙල 2019 නොවැම්බර් 09 වැනි දින පවත්වන ලදී.

**ඈ. ආරක්ෂක සහයෝගීතාවය**

i. පුද්ගල ජාවාරම් සහ දේශ සීමා සිදු කරන වෙනත් අපරාධ පිළිබඳ ඕස්ට්‍රේලියානු-ශ්‍රී ලංකා ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ (JWG) හයවන රැස්වීම කැන්බරා හිදී පැවැත්විණි (2019 ඔක්තෝබර් 11)

ii. ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර සමාරම්භක උපායමාර්ගික සමුද්‍රීය සංවාදය කොළඹ දී පැවැත්විණි. (2019 සැප්තැම්බර් 16)

iii. ශ්‍රී ලංකාව සමඟ ඕස්ට්‍රේලියාව මෙතෙක් සිදුකළ විශාලතම ආරක්ෂක ක්‍රියාවලිය වන INDO-PACIFIC ENDEAVOR 2019 (IPE 19) ඕස්ට්‍රේලියානු සේවා නිලධාරීන් 1000කට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්විණි. (2019 මාර්තු 23 සිට 29 දක්වා)

iv. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයෙහි 15 දෙනෙකුගෙන් යුත් දූත පිරිසක අධ්‍යයන චාරිකාවක් සඳහා ඕස්ට්‍රේලියාවට ගියහ. (2019 සැප්තැම්බර් 01-13)

v. ඕස්ට්‍රේලියානු දේශසීමා බලකායේ ස්ථෙරී දේශසීමා මෙහෙයුම් ඒකාබද්ධ නියෝජිතායතන කාර්ය සාධක බලකායේ අණදෙන නිලධාරී මේජර් ජනරාල් ක්‍රේග් ෆුරිනි මහතා සමඟ රැස්වීමක් පැවැත්විණි. මෙහිදී මිනිස් ජාවාරම සහ දේශ සීමා ඉක්මවමින් සිදුකරන සංවිධානාත්මක අපරාධ මැඩ පැවැත්වීමේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර සිදුකරනු ලබන සහයෝගීතා කටයුතු කෙරෙහි මෙහිදී අවධානය යොමු විය. (2019 ඔක්තෝබර් 29)

**ඉ. විද්‍යාව හා තාක්ෂණය**

i. නිදන්ගත වකුගඩු රෝග වැළැක්වීම සඳහා වූ ශ්‍රී ලංකා ජනාධිපති කාර්යය සාධක බලකාය සහ ඕස්ට්‍රේලියානු න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ සංවිධානය (ANSTO) අතර රෝග මූලය

නොදන්නා නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ සහයෝගිතා වැඩසටහනක් පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී (2019 නොවැම්බර් 04)

ii. ශ්‍රී ලංකාව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ "ජියෝ සයන්ස් ඕස්ට්‍රේලියා (GA)" අතර විද්‍යාත්මක හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී (2019 නොවැම්බර් 05)

**ඊ අධ්‍යාපනය :**

i. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉහළ පෙළේ අධ්‍යයන දූත පිරිසක් කැන්බරා නුවරට පැමිණ කැන්බරා හි පිහිටි ප්‍රධාන පෙළේ ඕස්ටේලියානු විශ්වවිද්‍යාල සමඟ සහයෝගිතා අධ්‍යයන හා පර්යේෂණ හවුල්කාරිත්වයක් ඇති කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා ගවේෂණය කළේය.

**උ සංස්කෘතික සබඳතා :**

i. විදේශීය රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන් සමඟ නිරන්තරයෙන් කටයුතු කිරීමේ කොටසක් ලෙස, 2019 වර්ෂය තුළදී මහ කොමසාරිස් කාර්යාලය විසින් සිංහල දෙමළ අලුත් අවුරුද්ද, වෙසක්, ඉෆ්තාර් සහ ඊද්, දීපවාලි සහ නත්තල් සැමරුම් වැනි සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරන ලදී.

ii. මේජර් ජනරාල් ඇන්ටන් මුතුකුමාර කුසලානය සඳහා වාර්ෂික ක්‍රිකට් තරඟය, විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තු කණ්ඩායම සහ කැන්බරා හි පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල මහ කොමසාරිස්වරන්ගේ කණ්ඩායම කැන්බරා හි ඩේසිකින් හි මින්ට් ඕවල් හිදී පැවැත්විණි. එය පවත්වන ලද්දේ 2019 මාර්තු 17 ය.

iii. ICC T20 ලෝක කුසලාන සංවිධායක කණ්ඩායම, මහකොමසාරිස් කාර්යාලය වෙත පැමිණීම (2019 සැප්තැම්බර් 24). එම කණ්ඩායම, ICC T20 ලෝක කුසලාන 2020 හි රජයේ සබඳතා සහ සත්කාරක නගර පිළිබඳ සාමාන්‍යාධිකාරී නික් හොක්ලේ මහතා, සාමාන්‍යාධිකාරී සෑම් වොට්සන් මහතා සහ සත්කාරක නගර කළමනාකරු ලූක් විමන් මහතා ගෙන් සමන්විත වෙයි.

**මෙල්බර්න්**

**අ ද්විපාර්ශ්වික සබඳතා**

i. නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍ය ගරු කරුණාරත්න පරණවිතාන මැතුමාගේ සංචාරයට පහසුකමු සලසන ලදී. (2019 පෙබරවාරි 11 සිට 14 දක්වා)

ii. වික්ටෝරියා ප්‍රාන්තයේ ආණ්ඩුකාර ගරු ලින්ඩා ඩෙස්සෝ මැතිතුමා හමුවීම (2019 ජුනි 28)

iii. සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ පහත සඳහන් ප්‍රධාන දේශපාලන නායකයින් සමඟ සම්බන්ධ වී ඇත.

- වික්ටෝරියා ප්‍රාන්තයේ පාර්ලිමේන්තු මන්ත්‍රී සහ අගමැති ඩැනියෙල් ඇන්ඩෘස් වික්ටෝරියා පාර්ලිමේන්තු මන්ත්‍රී හා ව්‍යවස්ථාදායක සභාවේ කථානායක ගරු කොලින්ස් බෘක්ස් මැතිතුමා
- වික්ටෝරියා ව්‍යවස්ථාදායක සභාවේ සභාපති ගරු ෂෝන් ලීන් මැතිතුමා
- විපක්ෂයේ නව රාජ්‍ය නායක හා කුඩා ව්‍යාපාර පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු මයිකල් ඕ බ්‍රයන් මැතිතුමා
- පාර්ලිමේන්තු මන්ත්‍රී ලා ට්‍රෝබ් හි ෆෙඩරල් සාමාජික ගරු ජේසන් පූඩ් මැතිතුමා
- පාර්ලිමේන්තු මන්ත්‍රී සහ දකුණු මෙට්‍රොපොලිටන් කලාපයේ සාමාජික ගරු පිලිප් ඩලිඩකිස් මැතිතුමා
- වික්ටෝරියා පාර්ලිමේන්තුවේ නැගෙනහිර මෙට්‍රොපොලිටන් කලාපයේ සාමාජික සහ ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික ගරු බෘස් ඇට්ක්න්සන් මැතිතුමා
- පාර්ලිමේන්තු මන්ත්‍රී උතුරු මෙට්‍රොපොලිටන් කලාපයේ රාජ්‍ය සාමාංගික ගරු ක්‍රේග් ඔන්ඩාර්ච් මැතිතුමා
- පාර්ලිමේන්තු මන්ත්‍රී, සැලසුම්, නිවාස හා බහු සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු රිචඩ් වේන් මැතිතුමා

- පාර්ලිමේන්තු මන්ත්‍රී බහු සංස්කෘතික කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු නීල් ඇගස් මැතිතුමා
- පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වික්ටෝරියා හරිතයන්ගේ පාර්ලිමේන්තු නායක ගරු ආචාර්ය සමන්ත රත්නම් මැතිතුමා
- ගරු නගරාධිපති සාලි කැප් මැතිතුමා

iv. මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාගේ සංචාරය සඳහා පහසුකම් සැලසීය (2019 අප්‍රේල් 29 සිට 07 මැයි දක්වා)

v. විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුවේ (DFAT) වැඩ බලන රාජ්‍ය අධ්‍යක්ෂ සුසාන් කෝල්ස් මහත්මිය (2019 මැයි 16) හමුවීම

vi. කොන්සියුලර් ප්‍රජාවේ සහ වික්ටෝරියා හි ලේකම් ට්‍රනේට් ස්මිත් මහතා හමුවීම (2019 මැයි 24 දින)

vii. වික්ටෝරියා හි ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර කටයුතු ආයතනයේ (AIIA) විධායක අධ්‍යක්ෂ / ඇලෙක්ස්ටෙයාර් රොෆ් මහතා හමුවීම (2019 ජුනි 20 වන දින)

viii. කොළඹ මහ නගර සභාවේ නගරාධිපති ගරු රෝසි සේනානායක මහත්මියගේ සංචාරයට පහසුකම් සැලසීම (2019 ජුලි 06 සිට 11 දක්වා)

ix. ශ්‍රී ලංකා නගරාධිපතිවරුන් පිරිසකගේ සංචාරය සඳහා පහසුකම් සැපයීම (2019 අගෝස්තු 18 සිට 23 දක්වා)

x. ආරක්ෂක සේවා සහ මාණ්ඩලික විද්‍යාලයේ (DSCSC) විදේශීය අධ්‍යයන චාරිකාව සඳහා පහසුකම් සැපයීම (2019 සැප්තැම්බර් 01 සිට 13 දක්වා)

xi. මහ කොමසාරිස් ජේ.සී වැලිඅමුණ මැතිතුමාගේ සංචාරය සඳහා පහසුකම් සලසන ලදී (2019 ඔක්තෝබර් 13 සිට 15 දක්වා)

xii. නීති විරෝධී පුරවැසියන් නොවන පුද්ගලයන්ගේ නැවත පැමිණීමට සහාය වීම සඳහා ඕස්ට්‍රේලියාවේ බලයලත් නියෝජිත ආයතනයක් වන "හෝම්වරඩ් රිටර්න්" වැඩසටහනේ ජ්‍යෙෂ්ඨ සිද්ධි සේවක ලුයිස් බඩාඩ් මහත්මිය හමුවීම (2019 ඔක්තෝඉර් 23 දින)

xiii. තුස්ත මර්දන මූල්‍යකරණය පිළිබඳ "තුස්තවාදයට මුදල් නැත" යන අමාත්‍ය සම්මේලනයට සහභාගී වූ අතර මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (නීති) ඒ.කේ.ඩ.ඩී.ඩී. අරන්දර මහතාගේ සහභාගීත්වය සඳහා පහසුකම් සැලසීම.

## ආ. ආර්ථික සම්බන්ධතා සහ විදේශ ආයෝජන

i. "ව්‍යාපාරවලදී ඩයස්පෝරාවේ කාර්යභාරය" පිළිබඳ සැසියක් මොනෑෂ් විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලද අතර ඒ සඳහා පහසුකම් සපයන ලදී (2019 ජනවාරි 18) වන දින

ii. ඔස්ට්‍රඩේ සහ මොනෑෂ් විශ්වවිද්‍යාලය මඟින් ව්‍යාපාර සාක්ෂරතාවය සහ ව්‍යාපාරික කටයුතුවල නියැලීම පිළිබඳ DFAT රාජ්‍ය තාන්ත්‍රික ඇකඩමියේ ඉදිරිපත් කිරීමට සහභාගී විය. (2019 මාර්තු 22 වන දින)

iii. වෙළඳාම, සංචාරක සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පහත සඳහන් පුද්ගලයන් සමඟ නිරන්තර සම්බන්ධතා පැවැත්විය.

-රැකියා, නවෝත්පාදන හා වෙළඳ අමාත්‍ය

-අපනයන මූල්‍ය හා රක්ෂණ සංස්ථාව (Efic)

-ඕස්ට්‍රේලියානු වෙළඳ හා ආයෝජන කොමිෂන් සභාව (Austrade)

-වික්ටෝරියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලය

-වික්ටෝරියානු රජයේ ආර්ථික සංවර්ධන, රැකියා සහ ප්‍රවාහන හා සම්පත් දෙපාර්තමේන්තුව

-ඕස් -ලංකා ව්‍යාපාරික කවුන්සිලය

-තෝරාගත් අංශවල වෙනත් ව්‍යාපාරික ආයතන

iv. ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන යටතේ "ඒක් ගම්මාන ඒක් නිෂ්පාදනයක් (OVOP)" සහ " නව අපනයනකරුවන් 2000ක් සංවර්ධන වැඩසටහන" හඳුන්වාදීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජා

සංගම්වල නියෝජිතයින් සහ කැපී පෙනෙන පුද්ගලයින්ගේ නියෝජිතයින් සම පළමු කණ්ඩායම් රැස්වීම සංවිධානය කරන ලදී.

v. (2019 නොවැම්බර් 02 දින) වික්ටෝරියා හි වෙළඳ හා ආයෝජන සහ ඩයස්පෝරා ප්‍රජාවන් පිළිබඳ වට මේස සාකච්ඡාවට සහභාගි විය. (2019 දෙසැම්බර් 20 දින)

vi. 2019 ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ 6 වන ජාත්‍යන්තර සමුළුවට සහභාගී විය (2019 දෙසැම්බර් 12 දින)

### ඈ. සංස්කෘතික සබඳතා

i. නිදහස් දින සැමරුම සංවිධානය කරන ලදී (2019 පෙබරවාරි 04 දින)

ii. ත්‍රිපිටකාභිවන්දනා වැඩ සටහන යටතේ කීස්බරෝ ධම්ම සරණ විහාරය සහ මහමෙව්නා බෞද්ධ භාවනා මධ්‍යස්ථානයේ වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී.

iii. ධම්ම සරණ විහාරස්ථානයේ කීස්බරෝ සහ මෙල්බර්න් විශ්වවිද්‍යාලයේ සංස්කෘතික සංගම් සමඟ එක්ව සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සව සැමරීමට පහසුකම් සැලසීය (2019 අප්‍රියෙල් 10)

iv. ප්‍රජා සංගම් සහ විශ්වවිද්‍යාල විසින් සංවිධානය කරන ලද වෙසක්, ඉෆ්තාර්, ඊද් සහ නත්තල් සැමරුම් සඳහා සහභාගී විය.

### ඈ. සංචාරක ප්‍රවර්ධනය

i. ශ්‍රී ලංකා උළෙලේදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සඳහා ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යන ලදී (2019 අප්‍රියෙල් 14 වැනි දින)

ii. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් මෙල්බර්න් හි සංවිධානය කරන ලද MICE මාර්ග සංදර්ශනයට සහභාගි විය (2019 සැප්තැම්බර් 03 දින)

iii. සංචාරක ප්‍රවර්ධනය සඳහා සහයෝගිතාව ශක්තිමත් කිරීමේ අරමුණින් රටින් පිටත සිදු කරන සංචාර පිළිබඳ නියෝජිත ආයතන සහ උත්සව සංවිධායකයින් ඇතුළු ප්‍රධාන මැදිහත්කරුවන් සමඟ කටයුතු කරන ලදී.

### ඉ. අධ්‍යාපනය

i. මොනාෂ් විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර අධ්‍යයන වැඩසටහනට පහසුකම් සැලසීය (2019 ජනවාරි 14 දින)

ii. ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණික ආයතනයේ (SLINTEC) නිලධාරීන් සමඟ ස්කයිප් රැස්වීමට සහභාගි විය. (2019 අප්‍රේල් 09 දින)

iii. වික්ටෝරියා විශ්වවිද්‍යාලයේ ප්‍රවීන ශ්‍රී ලංකා විද්වතුන් සහ ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් එච්.ඊ.ජේ.සී. වැලිඅමුණ මැතිතුමා අතර රැස්වීමක් සංවිධානය කරන ලදී (2019 ඔක්තෝබර් 15 දින)

iv. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගිතාව සඳහා ඇති ඉඩ ප්‍රස්ථා ගවේෂණය කිරීම සඳහා ප්‍රමුඛ පෙළේ අධ්‍යයන ආයතන හා විශ්වවිද්‍යාල සමඟ නිරන්තරයෙන් කටයුතු කිරීම

v. CQ විශ්වවිද්‍යාල අන්තර්ජාතික පාර්ශ්වකරුවන්ගේ දිවා ආහාරය, වික්ටෝරියානු ජාත්‍යන්තර අධ්‍යාපන සම්මාන උළෙල සහ ඕස්ට්‍රේලියානු පරිගණක සංගමය (ඕස්ටේ) ප්‍රතිනිර්මාණය කිරීමේ චින්තන නායකයාගේ සමුළුව ඇතුළු විශ්වවිද්‍යාල සහ අධ්‍යයන ආයතන විසින් සංවිධානය කරන ලද ප්‍රධාන උත්සවවලට සහභාගී විය.

## III. සිඩ්නි

### අ. ද්විපාර්ශ්වික සහ ආරක්ෂක සම්බන්ධතා

i. සිඩ්නි නුවර සිටින එල්.ටී.ටී.ඊ සාමාජිකයින් විසින් සංවිධානය කරන ලද අංක පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා (2019 මැයි 7 වැනි දි) නිව් සවුත් වේල්ස් පොලිසියේ සම්බන්ධතා සහ මැදිහත්වීම් ඒකකයේ සමබන්ධතා නිලධාරීන් සමඟ පැවති රැස්වීම

ii. ප්‍රජා ආරක්ෂාව සඳහා නිව් සවුත් වේල්ස් පොලිසිය විසින් සපයනු ලබන සේවාවන් පිළිබඳ සාකච්ඡාවක් සංවිධානය කරන ලදී (2019 මැයි 15)

### ආ. ආර්ථික සම්බන්ධතා

i. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන (EDP) යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන කටයුතුවල නිරත වීම දිරිගැන්වීම සඳහා තෝරාගත් ශ්‍රී ලාංකීක ව්‍යාපාරිකයින් සහ සිඩ්නි නුවර ප්‍රජා සංගම් සාමාජිකයින් ජාලකරන රැස්වීමක් සංවිධානය කරන ලදී. "එක් ගම්මානයක් එක් නිෂ්පාදනයක්" (OVOP) සහ නව අපනයන කරුවන් 2000ක් සංවර්ධන වැඩසටහන (NEDP) පිළිබඳ ඉදිරිපත් කිරීමක් ආරාධිතයින් ඉදිරියේ සිදු කරන ලදී.

ii. පොල් සංවර්ධන අධිකාරිය (CDA) සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය (SLTB) සමග සම්බන්ධීකරණයෙන් යුතුව (2019 සැප්තැම්බර් 9 සිට 12 දක්වා) ෆයින් ෆුඩ් ඕස්ට්‍රේලියා ශ්‍රී ලංකා මණ්ඩපයක් සංවිධානය කරන ලදී.

iii. අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධිකාරිය (ICTA) සමග එක්ව (2019 ඔක්තෝබර් 29 සිට 31 දක්වා) ඕස්ට්‍රේලියාවේ සෙබිට් හිදී මණ්ඩපයක් සංවිධානය කරන ලදී.

iv. විදේශ සබඳතා අමාත්‍යාංශයේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන (EDP) යටතේ ද්විපාර්ශ්වික වෙළෙඳ සබඳතා වැඩි දියුණු කිරීම සඳහා සහ ශ්‍රී ලාංකික ඕස්ට්‍රේලියානු සමාගම් අතර සහයෝගීතාව ඉහල නැංවීම උදෙසා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ඕස්ට්‍රේලියාව සහ ශ්‍රී ලාංකික සමාගම් සම්බන්ධ කිරීමේ අරමුණින් (2019 ඔක්තෝබර් 30 වන දින) පැමිණ සිටින ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත කණ්ඩායමක් සඳහා ඕස්ට්‍රේලියානු සමාගම් සමග ව්‍යාපාරික ජාලකරණ රැස්වීමක් සංවිධානය කළේය.

v. ඕස්ට්‍රේලියාවේ යාවත්කාලීන තාක්ෂණික භාවිතය පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා පැමිණ සිටින ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම සඳහා මැවරි විශ්ව විද්‍යාලය සහ සිඩ්නි තාක්ෂණ විශ්වවිද්‍යාලය (UTS) වෙත හුරුපුරුදු කිරීමේ ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කරන ලදී.

vi. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය (SLCOB) කොන්සල් ජනරාල් කාර්යාලයේ සහයෝගයෙන් ශ්‍රී ලංකා MICE ගමනාන්ත ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කළේය. (2019 සැප්තැම්බර් 5 වන දින)

vii. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික හා ආයෝජන ඉඩප්‍රස්ථා ගවේෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියානු වාණිජ මණ්ඩලය (SLACC) සහ කොන්සල් ජනරාල් කාර්යාලය ගිල්බට් ඇන් ටොබින් ලෝයර්ස් සමග එක්ව ව්‍යාපාරික ජාලකරණ වැඩසටහනක් සංවිධානය කළේය. (2019 ඔක්තෝබර් 1 වන දින)

### ඇ සංස්කෘතික සබඳතා

i. ත්‍රිපිටකාභිවන්දනා වැඩසටහන යටතේ ධර්ම සාකච්ඡා මාලාවක් සංවිධානය කරන ලදී.

ii. පාස්කු ඉරිදා ප්‍රහාරයට ගොදුරු වූවන් සිහි කිරීම සඳහා ආචාර්ය ඇන්තනි ෆිෂර් (සිඩ්නි අගරදගුරු) විසින් ශාන්ත මේරි ආසන දෙව් මැදුරේ දී නිශ්ශබ්දතාවයක් පැවැත්විය. (2019 අප්‍රියෙල් 26)

## 2. චීනය

### 1. බීජිං

බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ප්‍රජාතාන්ත්‍රික මහජන කොරියානු ජනරජය සහ මොන්ගෝලියාව වෙත සමගාමීව අක්ත ගන්වා තිබේ.

**අ) ද්විපාර්ශ්වික සබඳතා**

**පහසුකම් සපයන ලද ඉහළ මට්ටමේ සංචාර**

i. 2019 මැයි 13-16 දිනවල දී පැවති ආසියානු ශිෂ්ඨාචාර සංවාද සමුළුවට සහභාගී වීම සඳහා හිටපු ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා නිරත වූ සංචාරය. මෙම සංචාරය අතරතුර දී හිටපු ජනාධිපතිවරයා චීනයේ ජනාධිපති අතිගරු ෂී ජින් පිං මැතිතුමා, ගරු අග්‍රාමාත්‍ය ලී කෙචියැන්ග් මැතිතුමා සහ චීන ජනතා මහජන උපදේශන සමුළුවේ (CPPCC) සභාපති වැං යැං මැතිතුමා හමුවිය.

ii. මෙම සංචාරය අතරතුර දී ආරක්ෂක ක්ෂේත්‍රයේ සමීප සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා සංධාන ගිවිසුම් දෙකක් අත්සන් තබන ලදී.

iii. 2 වැනි 'තීරය සහ මාවත' පිළිබඳ සංසදයට සහභාගී වීම සඳහා හයිනාන් පළාත් රජය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා හිටපු වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවීන් දිසානායක මැතිතුමා 2019 අප්‍රේල් 25-27 දිනවල දී නිරත වූ සංචාරය

iv. ලෝක ආර්ථික සංසදයේ නව ශූරයන්ගේ වාර්ෂික රැස්වීමට සහභාගී වීම සඳහා හිටපු සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම මැතිතුමා 2019 ජූලි 01-03 දිනවල දී නිරත වූ සංචාරය.

v. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ නායකත්වයෙන් යුත් පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායම 2019 ජූලි 14-21 දිනවල දී චීනයේ නිරත වූ සංචාරය.

vi. ආසියා පැසිෆික් කලාපයේ වනාන්තර සහයෝගීතාවය පිළිබඳ සම්මන්ත්‍රණයට සහ 2019 චීනයේ වන විද්‍යා සැලසුම් ජාලයට සහභාගී වීම සඳහා හිටපු මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍ය ගරු අජිත් මාන්නප්පෙරුම මැතිතුමා 2019 ජූලි 22-24 දිනවල දී චීනයේ නිරත වූ සංචාරය.

vii. චීනයේ රාජ්‍ය මන්ත්‍රණ සභික සහ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ විශේෂ නියෝජිත, තානාපති වූ පියැංග්හාඕ මැතිතුමා 2019 දෙසැම්බර් 02 වැනි දින ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරයට පහසුකම් සැලසීම.

**ආ) ශ්‍රී ලංකාවේ ධනාත්මක ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම හා ප්‍රක්ෂේපණය කිරීම සහ රාජ්‍යතාන්ත්‍රිකභාවය**

පහත සඳහන් සිදුවීම් ඇතුළුව, චීන මැදිහත්කරුවන් විසින් සංවිධානය කරන ලද ප්‍රධාන අංග 36 ක් සඳහා තානාපතිවරයා ශ්‍රී ලංකාව නියෝජනය කළේය.

i. ෂැංහයි හි ට්‍රැවල්සන් ජාත්‍යන්තර සංචාරක සේවා සමාගම විසින් 2019 ජනවාරි 19-20 දිනවල ෂැංහයි හි දී සංවිධානය කරන ලද සංචාරක ප්‍රවර්ධන සමුළුව

ii. 2019 අප්‍රේල් 09-12 දිනවල දී පැවති 2019 චීන ලියාං තේ උළෙල සහ ටියැන්මු ලේක් ට්‍රැවල් මාර්ට් හි සමාරම්භක උත්සවය හා ලියාං නගරයේ චීන-ශ්‍රී ලංකා මිත්‍රත්ව තේ වත්ත විවෘත කිරීමේ උත්සවය

iii. 2019 මැයි 15-16 දිනවල බීජිංහි දී පැවති ආසියානු ශිෂ්ඨාචාර සංවාද සමුළුව

iv. 2019 අප්‍රේල් 15-17 දිනවල දී යාන්චෙන් නගරයේ ආසියා කෘෂි ප්‍රදර්ශන උද්‍යානය වෙත සිදුකළ චාරිකාව

v. 2019 සැප්තැම්බර් 06-08 දිනවල ෂැන්සි පළාතේ චැංග්සි මහනගර සභාවේ ෂියැංග්යුආන් හිදී පැවති පළමු "එක් තීරයක් - එක් මාවතක්" ජාත්‍යන්තර සංස්කෘතික සමුළු සංසදය

vi. 2019 ඔක්තොබර් 11 සිට 13 දක්වා ලැන්ෂෝ හිදී පැවති පළමු වාර්ෂික උසස් අධ්‍යාපන ජාත්‍යන්තර සංසදය

vii. චීන මහජන සමූහාණ්ඩුවේ සංස්කෘතික හා සංචාරක කටයුතු අමාත්‍යාංශය, සිචුවාන් හි පළාත් රජය, යුනෙස්කෝව සහ යුනෙස්කෝව සඳහා චීන ජාතික කොමිසමේ අනුග්‍රාහකත්වයෙන් යුතුව 2019 ඔක්තෝබර් 17 සිට 22 දක්වා සිචුවාන් ප්‍රාන්තයේ, චංදු හිදී පැවති අස්පෘශ්‍ය සංස්කෘතික උරුමය පිළිබඳ 7 වැනි ජාත්‍යන්තර උත්සවය

viii. 2019 නොවැම්බර් 6 වැනි දින ෂැංහයි හි දී 2019 චීන ජාත්‍යන්තර ආනයන එක්ස්පෝ ප්‍රදර්ශනයේ දී ෂැංහයි හි යුනාන් වෙළඳ නියෝජිත කණ්ඩායම විසින් සංවිධානය කරන ලද ප්‍රධාන කර්මාන්ත ආයෝජන සහයෝගිතාව සහ ගෝලීය ප්‍රසම්පාදන ප්‍රවර්ධනය

ix. 2019 නොවැම්බර් 06-07 දිනවල ෂැංහයි හිදී පැවති 2019 ජාත්‍යන්තර ගුවන් සේවා සැපයුම් දාමයේ (IASC) නායකත්ව සමුළුව

x. 2019 දෙසැම්බර් 06-09 දිනවල දී පැවති පළමු චීන-ශ්‍රී ලංකා සන්නිවේදන හා සහයෝගිතා සංසදය

xi. 2019 දෙසැම්බර් 14 වැනි දින චීනයේ බෞද්ධ සංගමයේ උප සභාපති යැන් ජුඒ මහතා හමු වී වැඩිදුර සහයෝගිතාවය හා හුවමාරු පිළිබඳව පැවැත්වූ සාකච්ඡාව

xii. ෆූජියෑන් පළාතේ පැවති සංචාරක ප්‍රවර්ධන වැඩසටහනකට සහභාගී වී "ශ්‍රී ලංකාව වෙත සංචාරය" යන මාතෘකාව යටතේ දේශනයක් පවත්වන ලදී.

xiii. 2019 අගෝස්තු 20 වැනි දින විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආසියානු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ෂූ හංතියෑන් මහතා සහ 2019 අගෝස්තු 21 වැනි දින විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් දෙපාර්තමේන්තුවේ උපදේශක ෂැං යැං මහතා හමු වී අන්‍යෝන්‍ය ද්විපාර්ශ්වික සහයෝගිතාව සහ දේශපාලන හා කොන්සියුලර් උපදේශන පිළිබඳව සාකච්ඡා පැවැත්විණ.

### ඇ) කලාපීය සහ බහුපාර්ශ්වීය සංවිධාන සමඟ සම්බන්ධ වීම

i. BOAO සංසදය සමඟ සමීප සබඳතා පවත්වා ගැනීම.

ii. බීජිංහි ෂැංහයි සහයෝගිතා සංවිධානයේ (SCO) ලේකම් කාර්යාලය සමඟ සමීප සබඳතා පවත්වාගෙන ගිය අතර, එහි නිතිපතා රැස්වීම්වලට සහභාගී විය.

iii. බීජිං හි එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සමීප සබඳතා පවත්වා ගැනීම.

iv. බීජිං හි උණගස් සහ වේවැල් පිළිබඳ ජාත්‍යන්තර ජාලයේ (INBAR) ලේකම් කාර්යාලය සමඟ සමීප සබඳතා පවත්වා ගන්නා අතර, එම ලේකම් කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබන රැස්වීම/උත්සවවලට සහභාගී වීම.

v. ෂැංහයි සහයෝගිතා සංවිධානය මඟින් 2019 මැයි 26-29 දිනවල ගුවැන්සි හි ෆැන්චෙංගාං හිදී පවත්වන ලද ජාත්‍යන්තර වෛද්‍ය නවෝත්පාදන හා සහයෝගිතා සංසදය.

vi. ෂැංහයි සහයෝගිතා සංවිධානය මඟින් 2019 දෙසැම්බර් 01 වැනි දින කුන්මිං හිදී පවත්වන ලද හතරවැනි කුන්මිං මැරතන් තරඟය.

vii. 2019 දෙසැම්බර් 17-20 දිනවල චොංචිං පළාතේ දී පැවති CICA හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ නිල කමිටු රැස්වීමේ දී ශ්‍රී ලංකාව නියෝජනය කළ අතර, ශ්‍රී ලංකාවේ විශ්වාසය ගොඩනැඟීමේ පියවර පිළිබඳ ඉදිරිපත් කිරීමක් කළේය.

viii. 2019 දෙසැම්බර් 18-19 දිනවල චොංචිං හිදී පැවති CICA රාජ්‍ය නොවන සංසදයේ තුන්වැනි සමුළුව

### ඈ) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

### ද්විපාර්ශ්වික වෙළඳ කටයුතු ප්‍රවර්ධනය

i. ශ්‍රී ලංකා සිවුවාන් වෙළඳ ආයෝජන ඉහළ නැංවීම සඳහා සිවුවාන් පළාතේ චෙංදු හි ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීමේ චීන කවුන්සිලය (CCPIT) සමඟ පැවති රැස්වීම. 10 වැනි දකුණු ආසියාවේ සිවුවාන් ව්‍යාපාර ප්‍රවර්ධන වට මේස සමුළුවට සහභාගී විය.

ii. චීනයේ ස්වාභාවික සම්පත් අධිකාරියේ ජාතික මැණික් තාක්ෂණ පරිපාලන අධිකාරිය සමඟ රැස්වීම.

iii. 2019 ජූනි 10 සිට 14 දක්වා පැවති දකුණු ආසියානු වෙළඳ ප්‍රදර්ශනයට කුන්මිං හි ප්‍රදර්ශකයන් 100 දෙනෙකු සමඟ සහභාගී විය. මෙම අවස්ථාවට වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍යවරයා සහභාගී විය. එහි ආගන්තුක රටක් ලෙස ශ්‍රී ලංකාව සහභාගී වූ අතර, විශේෂ ආකර්ශණීය ශ්‍රී ලංකා මණ්ඩපය "කොළඹ

වරාය නගරය" සහ මැණික්, තේ, පොල්, රතු සහල්, හස්ත කර්මාන්ත වැනි ප්‍රධාන අපනයන නිෂ්පාදන ප්‍රවර්ධනය කළේය.

**නව නිෂ්පාදන හඳුන්වා දීම**

චීනයේ ශ්‍රී ලංකා ධීවර නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා මූලාරම්භයක් සිදු කරන ලදී. ධීවර අපනයනය පිළිබඳ තීරුබදු රහිත බාධක ඉවත් කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ සාමාන්‍ය රේගු පරිපාලනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට යෝජනා කර තිබේ.

**පවත්නා නිෂ්පදනවල වෙළඳපොළ භාගය පුළුල් කිරීම**

මැණික් හා ස්වර්ණාභරණ ප්‍රවර්ධනය කිරීම සහ චීනයේ ශ්‍රී ලංකා ප්‍රදර්ශකයන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවීම. තානාපති කාර්යාලය මේ සම්බන්ධයෙන් විශේෂ වෙළඳ ප්‍රදර්ශන 15 කට අධික සංඛ්‍යාවක් හඳුනාගෙන ඇති අතර, ශ්‍රී ලාංකික වෙළඳ ප්‍රදර්ශන 12 කට අධික සංඛ්‍යාවකට සහභාගී වී ඇත.

**වෙළඳ ප්‍රදර්ශන සංවිධානය/සහභාගිත්වය**

i. චයිනා වෙස්ටර්න් එක්ස්පෝ ප්‍රදර්ශනය - සැප්තැම්බර් මස
ii. හැන්ග්ෂෝ ලක්සරි එක්ස්පෝ ප්‍රදර්ශනය - ජනවාරි මස
iii. ෂෙන්සෙන් තේ එක්ස්පෝ ප්‍රදර්ශනය - මාර්තු මස (UBM)
iv. ෂැංහයි ස්වර්ණාභරණ
v. ඩාලියන් ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - අප්‍රේල් මස
vi. කුන්මිං දකුණු ආසියානු වෙළඳ ප්‍රදර්ශනය - ජුනි මස
vii. බීජිං - මැණික් සම්බන්ධයෙන්- සැප්තැම්බර් මස
viii. දෙවැනි චීන ජාත්‍යන්තර ආනයන එක්ස්පෝ ප්‍රදර්ශනය (CIIE) ෂැංහයි
ix. බීජිං මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - බීජිං - දෙසැම්බර් මස
x. හැංෂෝ තේ එක්ස්පෝ ප්‍රදර්ශනය - දෙසැම්බර් මස
xi. ගෝලීය සැපයුම් සේවා සන්ධාන සමුළුව - ෂෙන්සෙන්
xii. ශ්‍රී ලංකා ආයෝජන සංසදය - චෙන්ඩු
xiii. චීන ජාත්‍යන්තර ගෘහභාණ්ඩ එක්ස්පෝ ප්‍රදර්ශනය
xiv. මධ්‍යම චීන චැංෂා ආනයන එක්ස්පෝ ප්‍රදර්ශනය (ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය)
xv. බටහිර චීන වෙළඳ හා ආයෝජන එක්ස්පෝ ප්‍රදර්ශනය - නැන්චැං, චීනය
xvi. චීනයේ ජාතික ඖෂධ යන්ත්‍රෝපකරණ ප්‍රදර්ශනය - චොංකිං, චීනය
xvii. ගෝලීය කළු තේ සමුළුව - ෂියාමන්
xviii. ජිංඩාඕ වෙළඳ ප්‍රදර්ශනය
xix. සුබෝපභෝගී එක්ස්පෝ ප්‍රදර්ශනය - ෂැංහයි
xx. චයිනා වෙස්ටර්න් එක්ස්පෝ ප්‍රදර්ශනය හි වට මේස සාකච්ඡාව - චෙංදු

**තේ ප්‍රවර්ධන ඒකකය විසින් පවත්වනු ලබන ලංකා තේ ප්‍රවර්ධන කටයුතු**

ශ්‍රී ලංකා රේගු සංඛ්‍යා ලේඛනවලට අනුව, 2019 දී ශ්‍රී ලංකාවෙන් චීනයට සෘජු අපනයනය කි.ග්‍රෑ. මිලියන 11.87 ක් වූ අතර එහි වටිනාකම දළ වශයෙන් මිලියන 50 ක් පමණ වේ. 2018 වර්ෂයේ එම කාලසීමාවට සාපේක්ෂව එය ප්‍රමාණාත්මකව 30% ක වැඩිවීමක් පෙන්නුම් කරන අතර, එහි වටිනාකම 15.53% කින් හෙවත් ඇ.ඩො. මිලියන 6.74 කින් ඉහළ ගොස් තිබේ.

i. පහත සඳහන් තේ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වන ලදී.

- යිබින් ජාත්‍යන්තර තේ සමුළුව
- වාර්ෂික කිමුන් කළු තේ උත්සවය

- ආසියානු තේ සන්ධාන රැස්වීම
- ගුවැංඡෝ මුහුදු සේද මාවත එක්ස්පෝ ප්‍රදර්ශනය 2019
- බීජිං තේ එක්ස්පෝ ප්‍රදර්ශනය
- චීන තේ ලෝක එක්ස්පෝ ප්‍රදර්ශනය
- චීන ජාත්‍යන්තර ආහාර සුරක්ෂිතතා සහ නවෝත්පාදන එක්ස්පෝ ප්‍රදර්ශනය, සියාල් චයිනා ට්‍රේඩ්
- රිෂාවෝ තේ ප්‍රදර්ශනය
- නැනිං හි ජැස්මින් තේ සමුළුව
- චීන-අරාබි එක්ස්පෝ ප්‍රදර්ශනය, යින්චුවාන්
- 7 වැනි සිචුවාන් කෘෂිකාර්මික එක්ස්පෝ ප්‍රදර්ශනය
- ගුවැංඩොං පළාතේ යින්ග්ඩේ නගරයේ පැවති ලෝක කළු තේ ඇගයීමේ තරඟය (මෙම තරඟයේ දී ශ්‍රී ලංකාවේ කළු තේ සාම්පල විසින් ස්ථාන 30 ක් දිනා ගන්නා ලදී)
- ෂියාමෙන් තේ ප්‍රදර්ශනය
- 2 වැනි චීන ජාත්‍යන්තර ආනයන එක්ස්පෝ ප්‍රදර්ශනය (CIIE)
- චීන ආහාර ආගන්තුක සත්කාර ප්‍රදර්ශනය 2019
- ගෝලීය තේ ප්‍රදර්ශනය 2019, ෂෙන්සෙන්
- චිබි නගරයේ, 5 වැනි චීන තේ කර්මාන්ත සමුළුවේ තේ වෙළඳ ප්‍රදර්ශනය
- 15 වැනි චීන තේ කර්මාන්ත ආර්ථික සමුළුව
- 2019 ලෝක කළු තේ තත්ත්ව ඇගයීමේ තරඟය, යිංඩේ නගරය

ii. මාර්ගගත ලංකා තේ වේදිකාව සංවර්ධනය කිරීම සඳහා ආයෝජකයෙකු සමඟ සාකච්ඡා ආරම්භ කරන ලද අතර, ගබඩාව, ඇසුරුම් කම්හල හා බෙදාහැරීමේ මාර්ග නැරඹීමෙන් අනතුරුව, ආයෝජනය කිරීමේ හැකියාව ඇගයීමට ලක් කරන ලදී.

iii. ශ්‍රී ලංකාවේ යෝජිත තේ කර්මාන්ත ආයෝජනය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා සහ බෙනී තේ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ෂැං මහතා අතර පැවති සාකච්ඡාව සඳහා පහසුකම් සලසන ලදී.

iv. බීජිං හි පැවති "මාර්ගය හා තීරුව" සමුළුවේ දී ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා සහ චීන කෘෂිකර්ම අමාත්‍යවරයා අතර සාකච්ඡාව සඳහා පහසුකම් සලසන ලදී.

v. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ජේ. ඒ. රංජිත් මහතාගේ ෆූජියෑන් හි ෆූෂෝ හි කර්මාන්තශාලා සංචාරය සංවිධානය කරන ලදී.

vi. ෂැංඩොං පළාතේ රිෂාවෝ ඩසොංවාං රූපවාහිනිය, ගුවැංබෝ රූපවාහිනිය හා ෂියැංකුන් රූපවාහිනිය සමඟ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීම.

vii. ඩාර්ට්‍රි තේ කම්හල, කැලණිවැලි වැවිලි සමාගම, මස්කෙලිය වැවිලි සමාගම සහ අක්බාර් බ්‍රදර්ස් (පුද්ගලික) සමාගම සමඟ එක්ව, බෙනී තේ සමූහය සඳහා ලංකා තේ චාරිකාව සංවිධානය කරන ලදී.

viii. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා සහ බෙනී තේ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීවරයා අතර රැස්වීමක් සංවිධානය කරන ලදී.

ix. ෂියාමන් තේ ප්‍රදර්ශනය අතරතුර දී, ෆූජියෑන්-ෂියාමන් ඩේලි, ෆූජියෑන් ඩේලි පුවත්පත් සහ ෂියාමන් රූපවාහිනිය සමඟ ලංකා තේවල සුවිශේෂතා ඉස්මතු කරන සම්මුඛ සාකච්ඡා පැවැත්වීම.

x. 2 වැනි SIIE ප්‍රදර්ශනය අතරතුර දී, ෂැංහයි නිවුස් සහ CCTV රූපවාහිනිය සමඟ ලංකා තේවල සුවිශේෂී ලක්ෂණ ඉස්මතු කරන සම්මුඛ සාකච්ඡා පැවැත්වීම.

xi. චීන CTC තේ නිෂ්පාදනය, ඕර්තොඩොක්ස් තේ නිෂ්පාදනය සහ ඉහළ වටිනාකමකින් යුතු කාබනික තේ නිෂ්පාදනය පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා ගුයිෂෝ පළාතේ තේ කර්මාන්තශාලා සහ තේ වතුවල චාරිකාව.

xii. සිචුවාන් පළාතේ, යිබින් හි ජාත්‍යන්තර තේ සංස්ථා සංවිධානයේ (TG20+) දී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

xiii. 2019 ජූනි 12 සිට 18 දක්වා චීනයේ කුන්මිං හිදී පැවති 6 වැනි දකුණු ආසියා එක්ස්පෝ ප්‍රදර්ශනයට ශ්‍රී ලාංකික ප්‍රදර්ශකයන් 104 දෙනෙකු සමඟ සහභාගී විය.

xiv. වෙළඳ, ආයෝජන සහ සංචාරක යන ක්ෂේත්‍රවල රටේ ශක්තීන් විදහා දැක්වීම සඳහා, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ගුවන් සේවය සහ අපනයන සංවර්ධන මණ්ඩලය යන ආයතනවල සහභාගිත්වයෙන් 2019 නොවැම්බර් 5 සිට 20 දක්වා දිනවල දී SIIE හි රටේ ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකාවේ ජාතික මණ්ඩපය අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

### වෙළඳපොළට ප්‍රවේශ වීමේ බාධක පිළිබඳව කටයුතු කිරීම

i. ශ්‍රී ලංකාවේ විසිතුරු මසුන් අපනයනකරුවන් මුහුණ දෙන නිරෝධායන ගැටලු සම්බන්ධයෙන් චීන රේගුවේ සාමාන්‍ය පරිපාලනය හමුවිය.

ii. ගුවැංෂෝ හි චෙංදු හා කුන්මින්, නැන්චැං, චොංචිං, බීජිං හි ෂින්ඩාවෝ යන පළාත්වල දී ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන ලදී.

### ව්‍යාපාර සහා පිහිටුවීම

i. APTA වාණිජ මණ්ඩලය පිහිටුවීමට අදාළ අභියෝග විසඳීම සඳහා ශ්‍රී ලංකාවට සහාය විය.

### ආයෝජන ප්‍රවර්ධනය

i. විශේෂයෙන් යටිතල පහසුකම්, නිවාස, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, සාම්ප්‍රදායික චීන වෛද්‍ය විද්‍යාව, තොරතුරු තාක්ෂණය, රෙදිපිළි හා ඉලෙක්ට්‍රොනික් උපකරණ, ආහාර හා ආපන ශාලා යන අංශවල ශ්‍රී ලංකාවේ ආයෝජනය සිවුවාන් හි ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සාකච්ඡා පැවැත්විණ.

ii. හෙබෙයි පළාතේ සංචාරය කොට, පෙව පොහොර, සූර්ය බලශක්තිය සහ බිත්තර නිෂ්පාදන ක්ෂේත්‍රවල අනාගත ආයෝජකයන් හමු වී ඔවුන්ගේ ශ්‍රී ලංකා සංචාරය සඳහා පහසුකම් සලසන ලදී.

iii. තීරය සහ මාර්ගය මූලාරම්භය යටතේ ශ්‍රී ලංකාව ආයෝජන ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා, චීන විද්‍යා ඇකඩමියෙහි පැවති "තීරය සහ මාර්ගය යටතේ ශ්‍රී ලංකාව සඳහා පවතින අවස්ථා" පිළිබඳ සම්මන්ත්‍රණයකට සහභාගී විය.

iv. පාස්කු ඉරුදින එල්ල වූ බෝම්බ ප්‍රහාරයෙන් අනතුරුව, ආයෝජන මණ්ඩලය සමඟ එක්ව, ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ නැංවීම සඳහා චීන ව්‍යාපාරිකයන් 100 කට ආසන්න පිරිසකගේ සහභාගිත්වයෙන් ආයෝජන සංසදයක් සංවිධානය කරන ලදී.

v. 2019 වසර සඳහා තේමා රට වන ශ්‍රී ලංකාව, කොළඹ වරාය නගරය - දකුණු ආසියාවේ කේන්ද්‍රස්ථානය ලෙස ඉස්මතු කරමින් සහ ප්‍රධාන ආයෝජන හා සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කරමින් 2019 ජූනි 12 සිට 18 දක්වා කුන්මිං හි පැවති 6 වැනි දකුණු ආසියා එක්ස්පෝ ප්‍රදර්ශනයට සහභාගී විය.

vi. "මැරිනා චතුරශ්‍රයේ" සත්කාරකත්වයෙන් යුතුව, 50 දෙනෙකුට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් නානාපති කාර්යාලයේ පැවති සම්මන්ත්‍රණයක් සඳහා පහසුකම් සලසන ලදී.

vii. වෙළඳ හුවමාරු සේවා පිළිබඳ CIFTIS May චීන ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වූ ශ්‍රී ලංකාව එහි හොඳම ජාත්‍යන්තර මණ්ඩපය සඳහා වූ සම්මානය දිනා ගත්තේය. තවද, විශේෂයෙන්ම කොළඹ වරාය නගරය ඇතුළුව, ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා විස්තර කරමින් සම්මන්ත්‍රණයක් ද පවත්වන ලදී.

viii. කොළඹ වරාය නගරය ප්‍රවර්ධනය කිරීම සඳහා CGTN සජීවී වැඩසටහන පවත්වන ලදී.

ix. ශ්‍රී ලංකාවේ ඖෂධ අංශයේ පවතින අවස්ථා ප්‍රවර්ධනය කරමින්, චීනයේ චොංචිං හි පැවති චීන ජාත්‍යන්තර ඖෂධ යන්ත්‍රෝපකරණ ප්‍රදර්ශනයට සහභාගී විය.

x. ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන යටතේ අනාගත ආයෝජකයන් 100 දෙනෙකුගේ සහභාගිත්වයෙන් යුතුව ආයෝජන ප්‍රවර්ධන වැඩසටහනක් පවත්වන ලද අතර, එහි දී අතිගරු ජනාධිපතිවරයාගේ 'ශ්‍රී ලංකාවේ සෞභාග්‍යයේ දැක්ම' එළිදක්වන ලදී.

xi. ආචාර්ය වැං ෂින්බිංගේ නායකත්වයෙන් යුත් චීන ආයෝජන නියෝජිත පිරිසකට ශ්‍රී ලංකාවේ සංචාරයක් සඳහා පහසුකම් සැලසීම. මෙම නියෝජිත කණ්ඩායම ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය හා ආයෝජන මණ්ඩලය හමුවිය.

xii. චීනයේ ෆෝචූන් 500 සමාගම් අතුරින් එකක් වන SINOPEC හමු වී ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම පිළිබඳ සාකච්ඡා කළ අතර, ඔවුන්ගේ ශ්‍රී ලංකා සංචාරය සඳහා පහසුකම් සලසන ලදී.

**සංචාරක කටයුතු ප්‍රවර්ධනය**

i. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී, පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් චීනයෙන් පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව විශාල වශයෙන් පහත වැටීම නිසා, සංචාරය කිරීම සඳහා ආරක්ෂිත ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමට පියවර ගන්නා ලදී.

ii. අඛණ්ඩව 7 වැනි වරටත්, IBTM China - දිරිගැන්වීමේ ව්‍යාපාරක සංචාරක සහ රැස්වීම් එක්ස්පෝ ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ සහය ඇතිව ශ්‍රී ලංකාවට FAM සංචාර සංවිධානය කිරීම මඟින් MICE අංශය ක්‍රියාශීලී ලෙස ප්‍රවර්ධනය කරන ලදී.

iii. 2019 ඔක්තෝබර් 12-18 දිනවල දී ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය බීජිං හි ප්‍රමුඛ MICE සමාගම් සහ මාධ්‍යවේදීන්ගෙන් සමන්විත MICE දූත පිරිසකගේ සහභාගිත්වයෙන් චීනයේ සිට ශ්‍රී ලංකාවට හුරුපුරුදු කිරීමේ චාරිකාවක් සංවිධානය කළේය.

iv. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ගුවැන්ෂු සහ ෂැංහයි හි පිහිටි ශ්‍රී ලංකන් ගුවන් සේවයේ කාර්යාල, 2019 නොවැම්බර් 28-30 දිනවල පැවති චෙංඩු ජාත්‍යන්තර සංචාරක එක්ස්පෝ ප්‍රදර්ශනයේ (CITE 2019) දී සහ නොවැම්බර් 14-18 දිනවල දී පැවති කුන්මිං සංචාරක එක්ස්පෝ ප්‍රදර්ශනය සමඟ එක් කණ්ඩායමක් ලෙස සහභාගී වූ අතර, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ පාර්ශ්වකරුවන් 10 දෙනෙකු මෙම ප්‍රවර්ධන කටයුතු සඳහා සම්බන්ධ විය.

v. කුන්මින් හා සිචුවාන් සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා කුන්මිං රූපවාහිනිය සහ කුන්මිං හා සිචුවාන් හි පළාත් සංචාරක අධිකාරිය සමඟ සාකච්ඡා පවත්වන ලදී.

vi. ප්‍රදර්ශනයට සමගාමීව, ශ්‍රී ලංකා සංචාරක ආයතනය ද චීන ජාත්‍යන්තර මාධ්‍ය ආයතන සඳහා විශේෂ මාධ්‍ය සාකච්ඡාවක් මාධ්‍ය ආයතන 60 කට අධික සංඛ්‍යාවකගේ ද, ගුවන් සමාගම් සහ සංචාරක නියෝජිතායතනවල නියෝජිතයින් 40 කගේ ද සහභාගිත්වයෙන් 2019 ජූනි 17 වැනි දින බීජිං හි චයිනා වර්ල්ඩ් හෝටලයේ දී පැවැත්විණ.

vii. ශ්‍රී ලංකා සංචාරක ආයතනය 2019 බීජිං ජාත්‍යන්තර සංචාරක එක්ස්පෝ ප්‍රදර්ශනයට (BITE) සහභාගී වූ අතර, බීජිං ජාත්‍යන්තර සංචාරක එක්ස්පෝ ප්‍රදර්ශනයේ 'හොඳම සංවිධානය' සඳහා වන සම්මානය ද ලබා ගත්තේය.

viii. ෆූෂෝ චාරිකා හා සංචාරක ප්‍රදර්ශනයට සහභාගී විය.

ix. චොංකිං ගුවන් සමාගමේ කොළඹ දක්වා ගුවන් සේවා මෙහෙයුම් සඳහා පහසුකම් සලසන ලදී.

**නිල සංවර්ධන සහාය**

i. විදේශ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ එක්ව, ශ්‍රී ලංකාවේ එක්සිම් බැංකුව මඟින් අරමුදල් සැපයෙන ව්‍යාපෘති සඳහා සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම

ii. බීජිං පදනම් කරගත් ආසියානු යටිතල පහසුකම් බැංකුව (AIIB) විසින් ශ්‍රී ලංකාවේ පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති දෙක සඳහා ණය ගිවිසුම් අත්සන් කිරීමට පහසුකම් සැපයීම
අ) ලිහිල් කිරීමේ පියවර මඟින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය: ඇ.ඩො. මිලියන 110
ආ) කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය. මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො. මිලියන 287 ක් ලෙස ගණන් බලා ඇත.

iii. කොළඹ මහනුවර මහාමාර්ග ව්‍යාපෘතිය සඳහා එක්සිම් බැංකු අරමුදල් බෙදා හැරීමට සහය වීම සහ පහසුකම් සැපයීම.

### ඉ. සංස්කෘතික සබඳතා

i. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී චීන සිසු සිසුවියන් සඳහා ශ්‍රී ලාංකික සංස්කෘතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්/හස්ත කර්මාන්ත ක්‍රියාකාරකම් 06 ක් පවත්වන ලදී.

ii. INBAR හි සහයෝගිත්වයෙන් යුතුව බීජිං හි යැන්කිං හිදී පැවති උද්‍යාන විද්‍යා එක්ස්පෝ ප්‍රදර්ශනයේ දී අමුත්තන් 150 දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් යුතුව "ආර්ට් ඔෆ් ද ක්‍රාෆ්ට්: ශ්‍රී ලාංකික හස්ත කර්මාන්ත දිනය" නමින් සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහනක් 2019 අගෝස්තු 08 වැනි දින පවත්වන ලදී.

iii. ශ්‍රී ලාංකික සංස්කෘතික උරුමය ප්‍රදර්ශනය කිරීම සඳහා පහත සඳහන් ජාත්‍යන්තර සංස්කෘතික ප්‍රවර්ධන උත්සවවලට සහභාගී විය.

- ශ්‍රී ලංකාවේ ජාතික කෞතුකාගාරයෙන් ලබාගත් ත්‍රිභාෂා සෙල්ලිපියේ අනුරුව ප්‍රදර්ශනය කරමින් 2019 මැයි 13 වැනි දින පැවති ආසියානු ශිෂ්ඨාචාර ප්‍රදර්ශනය
- ශ්‍රී ලාංකික ශිල්පියෙකුගේ ලී කැටයම් ප්‍රදර්ශනය කරමින් 2019 මැයි 10-15 දිනවල දී පැවති ආසියාවේ අලංකාරය ප්‍රදර්ශනය
- ශ්‍රී ලාංකික සිතුවම් ලබා දෙමින් 2019 මැයි 26-29 දිනවල ෂියාන් හිදී පැවති 2019 ලෝක ශිල්පීන්ගේ ප්‍රදර්ශනයට සහභාගී වීම.
- 2019 ජනවාරි 29 වැනි දින පැවති විදේශ රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ ජාතික ඇඳුම් ප්‍රදර්ශනය

iv. ශ්‍රී ලාංකික හා චීන සුබ පතන්නන්ගේ සහභාගිත්වයෙන් තානාපති කාර්යාල පරිශ්‍රයේ දී පහත සඳහන් බෞද්ධ ආගමික කටයුතු සංවිධානය කරන ලදී:

- ජාතික ත්‍රිපිටක සතිය සැමරුම පිණිස 2019 මාර්තු 22 වැනි දින පැවති ධර්ම දේශනය.
- 2019 මැයි 18 වැනි දින පැවති වෙසක් උත්සවය

v. 2019 ඔක්තෝබර් 29 වැනි දින චීනයේ ෂැන්ඩොං පළාතේ ෂෙංටොං විහාරය සහ ශ්‍රී ලංකාවේ බෝධිරාජ විහාරය අතර මිත්‍රශීලී සංස්කෘතික සම්බන්ධතාවක් ඇතිකිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට තානාපතිවරයා ඉදිරිපිට දී අත්සන් තබන ලදී.

vi. ශ්‍රී ලාංකික සංස්කෘතික ප්‍රවර්ධන සඳහා ආධාර ලබා ගැනීමේ හැකියාව සොයාබැලීම ස

vii. සඳහා සහභාගී වීමට සංස්කෘතික නියෝජිතයින් 3 දෙනෙකුට පහසුකම් සලසන ලදී.

### ඊ) අධ්‍යාපනය

i. ශ්‍රී ලාංකික සිසු සිසුවියන් සඳහා ශිෂ්‍යත්ව අවස්ථා 13 ක් ලබාගන්නා ලදී. මෙයින් ශිෂ්‍යත්ව 10 ක් BUCEA වෙතින් ද, තවත් 3 ක් වෘත්තිකයන් වෙනුවෙන් ජාත්‍යන්තර මහජන සෞඛ්‍ය පශ්චාත් උපාධි සඳහා වූ සිංහුවා විශ්වවිද්‍යාලයෙන් ද ලැබිණ.

ii. BUCEA, සිංහුවා විශ්වවිද්‍යාලය, CFAU, BIT, EPU සහ BFSU යන විශ්වවිද්‍යාලය වෙතින් ශ්‍රී ලංකාව සඳහා ශිෂ්‍යත්ව ලබා ගැනීමේ හැකියාව සොයා බැලීම සඳහා විශ්වවිද්‍යාල 6 ක් සමඟ සාකච්ඡා 14 ක් පවත්වන ලදී.

iii. ශ්‍රී ලාංකික ආයතන සහ චීන සංවිධායකයන් සමඟ එක්ව, 2019 ජුනි මස චෙංදු හිදී පැවති 2019 බටහිර චීන අධ්‍යාපන ප්‍රදර්ශනය ඇතුළුව, අධ්‍යාපනික ප්‍රදර්ශන 2 ක් සඳහා පහසුකම් සලසන ලදී.

iv. අවස්ථා 51 කදී චීනයේ ශ්‍රී ලාංකික සිසු සිසුවියන්ට උපදේශන ලබා දුන් අතර, අදාළ චීන අධ්‍යාපන බලධාරීන් සම්බන්ධ කර ගනිමින් ඔවුන්ගේ විමසීම්, අභියාචනා ආදිය සම්බන්ධයෙන් කාලෝචිත ආකාරයකින් අවශ්‍ය පියවර ගන්නා ලදී.

### උ) ආරක්ෂක කටයුතු

i. 2019 අප්‍රේල් මස ඕන්ඩාවෝ හිදී පැවති මහජන විමුක්ති හමුදාව (PLA) පිහිටුවීම පිළිබඳ 70 වැනි සංවත්සර සැමරුම් උත්සවය සඳහා සහභාගි වීම පිණිස නිරත වූ නාවික හමුදාපතිවරයාගේ සංචාරය සඳහා පහසුකම් සපයන ලදී.

ii. 2019 ජූලි මාසයේ දී චීනය විසින් තෑගි කරන ලද OPV P625 නෞකාව කොළඹට සැපත් විය. මෙම භාරදීමේ උත්සවය සඳහා නාවික හමුදා මාණ්ඩලික ප්‍රධානී ඇතුළු කණ්ඩායමක් චීනයට පැමිණියේය.

iii. 2019 සැප්තැම්බර් මාසයේ දී මහජන විමුක්ති හමුදා කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ "දියකාවා මෙහෙයුම-2019" යුධ අභ්‍යාසය සඳහා සහභාගී විය.

iv. 2019 සැප්තැම්බර් මාසයේ දී ආරක්ෂක සේවා අණ දෙන මූලස්ථානයේ හා මාණ්ඩලික විද්‍යාලයේ නියෝජිත කණ්ඩායමට චීනයට පැමිණීම සඳහා පහසුකම් සපයන ලදී.

v. 2019-2020 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකා හමුදා නිලධාරීන් හා අනෙකුත් නිලයන්ට චීන හමුදා ආයතනවල අධ්‍යාපනය ලැබීම සඳහා මහජන විමුක්ති හමුදාව විසින් පුහුණු අවස්ථා 227 ක් ලබා දී ඇත.

vi. ශ්‍රී ලංකා නාවික හමුදාවේ දිගු සැපයුම් සේවා කළමනාකරණ පාඨමාලාව අංක 5 හදාරන්නන් 2019 ඔක්තෝබර් 18 සිට 29 දක්වා අධ්‍යයන චාරිකාවක් සඳහා චීනයට පැමිණියේය.

vii. 9 වැනි බීජිං 'ෂියැංෂාන්' සංසදය ඔක්තෝබර 20-21 දිනවල දී පැවති අතර, ශ්‍රී ලංකා යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී ඇතුළු දූත පිරිසක් මෙම සංසදයට සහභාගී වූහ.

## 2. ගුවැන්ෂෝ

### අ) ද්විපාර්ශ්වික සබඳතා

i. ගුවැංදොං හි විදේශ කටයුතු කාර්යාලය සහ කොන්සියුලර් බලකාය සමඟ යහපත් සම්බන්ධතාවයක් ගොඩනඟා ගැනීම පිණිස 2019 ජනවාරි 21 වැනි දින වාර්ෂික 'GDFAO රාත්‍රිය' ට සහභාගී විය.

ii. ගුවැන්ෂෝ හි නායකත්වය සහ ගුවැන්ෂෝ හි කොන්සියුලර් බලකාය අතර සන්නිවේදනය පහසු කිරීම සඳහා 2019 පෙබරවාරි 28 වැනි දින ගුවැන්ෂෝ හි නගරාධිපතිවරයා හමුවීම පිණිස සියලුම කොන්සල් ජනරාල්වරුන් සඳහා පවත්වන ලද පිළිගැනීමේ උත්සවයකට සහභාගී විය.

iii. 2019 මාර්තු 13-14 දිනවල දී ෂාවෝගුවාන් නගරයට ගොස්, කොමියුනිස්ට් පක්ෂයේ ලේකම්වරයා සහ උප නගරාධිපතිවරයා හමුවිය.

iv. 2019 අප්‍රේල් 26 වැනි දින නගරයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවීමට සහ හාර්බින් තාක්ෂණික ආයතනය (ප්‍රමුඛ බුද්ධිමත් උපකරණ නිෂ්පාදන උද්‍යානය) සහ චීනයේ පර්ල් ගඟේ ඩෙල්ටාවේ ප්‍රධාන නගර දෙකක් යා කරන ෂෙන්ෂෙන්-ෂොංෂාන් පාලම ඇතුළු වැදගත් ස්ථාන නැරඹීම සඳහා ගුවැංදොං පළාතේ ෂොංෂාන් නගරයට යන ලදී.

v. ගුවැංදොං පළාත සහ අනෙකුත් රාජ්‍ය  අතර හුවමාරු හා හවුල්කාරිත්වයන් පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස 2019 ජූලි 9 වැනි දින ගුවැංදොං හි ආණ්ඩුකාරවරයා හමුවන ලදී.

vi. 2019 සැප්තැම්බර් 02 වැනි දින පැවති දිවා භෝජන සංග්‍රහ රැස්වීමක දී ගුවැංෂෝ හි ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අධ්‍යක්ෂ ලියු ලියු මහත්මිය හමුවී ගුවැංෂෝ නගරය සහ හම්බන්තොට නගරය අතර පවත්නා සබඳතා ඇතුළු ද්විපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කිරීම සඳහා අන්‍යෝන්‍ය සහයෝගිතාව පිළිබඳව සාකච්ඡා කරන ලදී.

vii. 2019 දෙසැම්බර් 5-7 දිනවල දී ෆූජියන් පළාත් ජනතා සම්මේලනයේ ස්ථාවර කමිටුවේ උප සභාපති ලෙයි චුන්මෙයි මහත්මිය ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරයට පහසුකම් සපයන ලදී. මෙම දූත පිරිස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා හමුවී ෆූජියන් සහ ශ්‍රී ලංකාව අතර ආයෝජන, සංචාරක කටයුතු, තේ, බෞද්ධ සංස්කෘතිය යන අංශවල සහයෝගිතාව පිළිබඳව සාකච්ඡා කළහ.

## ආ) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

### සංචාරක ප්‍රවර්ධනය

i. හිටපු සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් අලුවිහාරේ මැතිතුමා සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ 2019 පෙබරවාරි 21-23 දිනව පැවති ගුවැංඡෝ ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනයට සහභාගී විය. මෙහි දී ශ්‍රී ලංකාවට "ආගන්තුක රට" යන ගෞරවය හිමිවිය.

ii. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එක්ව 2019 පෙබරවාරි 25 වැනි දින ෆ්‍රීයන් පළාතේ ෂියාමන් හිදී ශ්‍රී ලංකා මාර්ග සන්දර්ශනය සංවිධානය කරන ලදී.

iii. චීන සංචාරකයන් සඳහා ශ්‍රී ලංකාව තවදුරටත් ප්‍රවර්ධනය කිරීම පිණිස, සංචාරක කටයුතු සහයෝගිතාව සඳහා 2019 පෙබරවාරි 28 වැනි දින චයිනා සදර්න් එයාර්ලයින්ස් ගුවන් සමාගමේ ජාත්‍යන්තර සහ ආයතනික සබඳතා අංශයේ ජ්‍යෙෂ්ඨ උප සභාපති වූ ගුඕසියාං මහතා හමුවිය.

iv. 2019 මැයි 15 සිට 23 දක්වා කාලය තුළ දී ආහාර, ලංකා තේ, සංචාරක ස්ථාන, ස්වාභාවික සුන්දරත්වය සහ සමහර ශ්‍රී ලාංකික හස්ත කර්මාන්තවල පින්තූර ප්‍රදර්ශනය කරමින් කොන්සල් කාර්යාලය විසින් නිර්මාණය කොට හැඩගන්වන ලද ප්‍රදර්ශන ශාලාවක් සහිත ආසියානු ආහාර පිසීමේ උළෙලට සහභාගී විය.

v. 2019 ජුනි 19 වැනි දින ගුවැංඩොං හි ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් චෙන් වියුයාන් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ලූඕ ජුන් මහතා සහ එම සංවිධානයේ අනෙකුත් නිලධාරීන් හමුවී ශ්‍රී ලංකාව යථා තත්ත්වයට පත්වීම සහ සංචාරක උපදේශනය ඉවත් කිරීම පිළිබඳ දැනුවත් කරන ලදී.

vi. 2019 ජුනි 24-27 දිනවල දී චීන ජාත්‍යන්තර කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ප්‍රදර්ශනයට (CISMEF) සහභාගී විය.

vii. පාස්කු ඉරුදින එල්ල වූ බෝම්බ ප්‍රහාරයෙන් අනතුරුව, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පුනර්ජීවනය කිරීම පිණිස සාකච්ඡා පවත්වා සහය ලබාගැනීම සඳහා 2019 අගෝස්තු 5 වැනි දින ගුවැංඩොං හි සංස්කෘතික හා සංචාරක කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අනෙකුත් නිලධාරීන් හමුවිය.

viii. 2019 සැප්තැම්බර් 5-7 දිනවල දී අපනයන සංවර්ධන මණ්ඩලය හරහා ප්‍රථම වතාවට ගුවැංඡෝ ලෝක කෘෂිකාර්මික ප්‍රදර්ශනයට සහභාගී වීම ආරම්භ කිරීම සහ සම්බන්ධීකරණය කිරීම. මෙම ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා ආහාර හා තේ සමාගම් 4 ක් සහභාගී විය.

ix. 2019 අගෝස්තු 30 සිට සැප්තැම්බර් 01 දක්වා ගුවැංඡෝ හිදී පැවති චීනයේ (ගුවැන්දොං) ජාත්‍යන්තර සංචාරක කර්මාන්ත ප්‍රදර්ශනය (CITIE) සඳහා ශ්‍රී ලංකන් ගුවන් සේවය සහ සීමිත ගුවැංඩොං සන්ෂයින් හොලිඩේ ජාත්‍යන්තර සංචාරක නියෝජිතායතන සමාගම සමඟ සහභාගි විය.

x. ගුවැංඩොං කොමියුනිස්ට් පක්ෂයේ නිල පුවත්පත වන නැන්ෆැං ඩේලි සමඟ පසුවිපරම් කර, 2019 අගෝස්තු 02 වැනි දින එහි පළ වූ 'ශ්‍රී ලංකාව වීසාවලින් තොර වන අතර, සංචාරක උනන්දුව සියයට 71 කින් ඉහළ ගොස් තිබේ' යන මාතෘකාව යටතේ පළ වූ ප්‍රවෘත්ති ලිපියක අඩංගු වැරදි තොරතුරු නිවැරදි කිරීමට පියවර ගෙන තිබේ.

### වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධනය සහ අදාළ කරුණු

i. දෙරට අතර වෙළඳ හා ව්‍යාපාර සඳහා තවදුරටත් සහයෝගිතාව ලබාගැනීම පිණිස 2019 මාර්තු 22 වැනි දින ගුවැංඡෝ හි ජාත්‍යන්තර වෙළඳ කමිටුව ප්‍රවර්ධන චීන කවුන්සිලයේ (CCPIT) සභාපති යැං යොං මහතා හමුවිය.

ii. CCPIT හි සහාය ඇතිව ශ්‍රී ලංකා වෙළඳ/ආයෝජන සම්මන්ත්‍රණ/සංසද ආරම්භ කිරීම සඳහා 2019 මාර්තු 28 වැනි දින ගුවැංඩොං CCPIT හි සභාපතිවරයා හමුවිය.

iii. 2019 මාර්තු 29 වැනි දින පැවති ග්‍රේටර් බේ ප්‍රදේශයේ ජලජ නිෂ්පාදන හුවමාරු රැස්වීමේ දී ගුවැංඡෝහි මුහුදු ආහාර සමාගම්, ආහාර පාන අලෙවිසැල්, මත්ස්‍ය වෙළඳ සමාගම් හමුවී ශ්‍රී ලංකාවේ මුහුදු ආහාර අපනයන නිෂ්පාදන, ඒවායේ සැපයුම්කරුවන් සහ වෙනත් අදාළ තොරතුරු ලබා දෙන ලදී.

iv. දෙරට අතර වෙළඳ සහ ආයෝජන සහයෝගිතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා, 2019 අප්‍රේල් 11 වැනි දින ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය උපදේශක-අධ්‍යක්ෂ ෂැං ලිංපිං මහත්මිය, අධ්‍යක්ෂ අයිලින් ෂු මහත්මිය සහ ගුවැංෂු නාගරික වාණිජ කාර්යාංශයේ අනෙකුත් නිලධාරීන් හමුවී අදාළ ශ්‍රී ලාංකික නිලධාරීන් හමුවීම පිණිස ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස චීන වෙළඳ නියෝජිතයෙකුට ආරාධනා කරන ලදී.

v. ටින්කළ ආහාර සමාගමක් වන ගුවැංදොං ඊගල් කොයින් හයිබාවෝ සමාගම ශ්‍රී ලංකාව වෙත ඔවුන්ගේ නිෂ්පාදනවලට වියහැකි ආනයනකරුවන් පිළිබඳව සොයාබැලීම පිණිස ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා 2019 අප්‍රේල් 12 වැනි දින කොන්සල් ජනරාල්වරයා හමුවිය.

vi. සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු රංජිත් අලුවිහාරේ මැතිතුමාගේ සහභාගිත්වයෙන්, තේ, රබර් කිරි නිෂ්පාදන, හස්ත කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරණ පිළිබඳ ශ්‍රී ලාංකික සමාගම් කිහිපයක් 2019 මැයි 18 සිට 22 දක්වා ෆූජියාන් පළාතේ ෆුෂෝ නගරයේ පැවති 21 වැනි සමුද්‍ර සේද මාර්ග ප්‍රදර්ශනය සහ සමුද්‍ර සන්ධි හරහා ආර්ථිකය හා වෙළඳාම පිළිබඳ ප්‍රදර්ශනයට සහභාගී විය.

vii. 2019 මැයි 23 වැනි දින 'ලංකා තේ, ශ්‍රී ලංකාවෙන් ලෝකයට දෙන ත්‍යාගය' පිළිබඳ ඉදිරිපත් කිරීමක් ගුවැංෂෝ හි තේ සාප්පු සංකීර්ණයේ දී පවත්වන ලදී.

viii. 'සමුද්‍ර සේද මාවත' අසල රටවල් සමඟ වෙළඳ, ආයෝජන, සංචාරක, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ සහයෝගිතාව තවදුරටත් ශක්තිමත් කිරීම සහ හම්බන්තොට ගුවැංෂෝ හි සහෝදර නගරය සමඟ සබඳතා වැඩිදියුණු කිරීම සඳහා 2019 ජූලි 10 වැනි දින ගුවැංෂෝ හි වාණිජ කාර්යාංශය හමුවිය.

ix. 2019 සැප්තැම්බර් 20-21 දිනවල ගුවාංෂි ෂුවාං ස්වයං පාලන කලාපයේ නැනිං හිදී පැවති 16 වැනි චීන ආසියාන් ප්‍රදර්ශනයේ (CAEXPO) විවෘත කිරීමේ උත්සවයට සහභාගී වූ අතර, මෙම මැණික් ප්‍රදර්ශනයට සහභාගී වූ ශ්‍රී ලාංකික මැණික් ප්‍රදර්ශකයන් ද හමුවිය.

x. 2019 සැප්තැම්බර් 19-21 දිනවල දී පැවති ෆුඩ්2චයිනා ප්‍රදර්ශනයට ලයන් බියර් බෲවරි (ලංකා) පීඑල්සී හි ප්‍රදර්ශන කුටිය සංවිධානය කරමින් සහභාගී විය.

xi. 2019 සැප්තැම්බර් 30 සිට ඔක්තෝබර් 1 දක්වා ගුවැංෂෝ හි පැවති චීනයේ (ගුවැංඩොං) ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනයට ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ ගුවැංදොං සන්ෂයින් හොලිඩේ ජාත්‍යන්තර සංචාරක නියෝජිතායතනය සමඟ සහභාගී විය.

xii. 2019 නොවැම්බර් 14-17 දිනවල දී චීන-ආසියාන් එක්ස්පෝ (CAEXPO) ලේකම් කාර්යාලයේ උප ලේකම් ජනරාල් සෙං ෂොං මහතා ඇතුළු 5 දෙනෙකුගෙන් යුත් දූත පිරිස නිරත වූ ශ්‍රී ලංකා සංචාරය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කරන ලදී.

සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ දී කොන්සල් කාර්යාලය පහත සඳහන් කටයුතු සිදුකරන ලදී:

i. චීන වෙළඳපොළට ඇතුළුවීම සඳහා ශ්‍රී ලාංකික සමාගම්වලට සහාය වීම.

ii. සහභාගී වීම සඳහා, වෙළඳ ප්‍රදර්ශන/වෙළඳ තොරතුරු ශ්‍රී ලංකාවේ අදාල බලධාරීන් වෙත බෙදා හැරීම.

iii. අදාළ චීන බලධාරීන් වෙත ටෙන්ඩර් ලේඛන සම්ප්‍රේෂණය කිරීම.

iv. වෙළඳ ආරවුල්වලට මැදිහත් වීම.

v. ශ්‍රී ලාංකික/චීන ගැනුම්කරුවන්/සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු උනන්දුවක් දන්වන පාර්ශ්වයන් වෙත සැපයීම.

**ඇ) සංස්කෘතික සබඳතා**

i. ශ්‍රී ලංකාව, කොන්සල් කාර්යාලය හා විහාරස්ථාන අතර පවත්නා සංස්කෘතික සහයෝගිතාවය වැඩිදියුණු කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ගුවැංෂෝ හි චීන බෞද්ධ විහාරස්ථානවල පහත සඳහන් නාහිමිවරුන් හමුවිය:
අ) ඩැෆෝ බෞද්ධ විහාරස්ථානයේ පූජ්‍ය යාඕ ෂි නාහිමි

ආ) නන්හුවා බෞද්ධ විහාරස්ථානයේ නාහිමි
ඇ) පිංගෑං බෞද්ධ විහාරස්ථානයේ නාහිමි
ඈ) ගුවංෂියාඹි බෞද්ධ විහාරස්ථානයේ පූජ්‍ය මිං ෂෙං නාහිමි

ii. සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් 2019 අප්‍රේල් 13 වැනි දින සුන් යැට් සෙන් වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සහ ජින්නාන් විශ්වවිද්‍යාලයේ සිසු සිසුවියන් විසින් සුන් යැට් සෙන් විශ්වවිද්‍යාලයේ දී සංවිධානය කරන ලද සුභද හමුව සහභාගී වෙමින් පහසුකම් සපයන ලදී.

iii. 2019 ජුනි 18 වැනි දින පූජ්‍ය පරණගම ඥානවිමල ස්වාමීන් වහන්සේ විසින් පිංගැං විහාරස්ථානයේ දී සංවිධානය කරන ලද වෙසක් උත්සවයට සහභාගී විය.

iv. ශ්‍රී ලංකාව හා ගුවැංෂෝ නගරය අතර බෞද්ධ කටයුතු සම්බන්ධීකාරක පූජ්‍ය පරණගම ඥානවිමල ස්වාමීන් වහන්සේගේ ඉල්ලීම පරිදි, අඩි 3 ක් උස ග්‍රැනයිට් බුද්ධ ප්‍රතිමාවක් ශ්‍රී ලංකාවේ සිට ප්‍රවාහනය කිරීම සඳහා සහාය වී පහසුකම් සලසන ලද අතර, එම ප්‍රතිමාව 2019 දෙසැම්බර් 19 වැනි දින ලැබුණි.

v. පීඩී ග්‍රේට් සීනරි ජාත්‍යන්තර සංචාරක සේවා සමාගම සමඟ එක්ව 2019 නොවැම්බර් 28 සිට 30 දක්වා පැවති චීන ක්‍රීඩා සංස්කෘතික සහ ක්‍රීඩා සංචාරක එක්ස්පෝ ප්‍රදර්ශනයට සහභාගී විය.

### 3. ෂැංහයි

#### අ) ද්විපාර්ශ්වික සබඳතා

i. ෂැංහයි, පියැංසු, අන්හුයි, ෂෙජියැං සහ හුනාන් පළාතේ නගරාධිපතිතුමා/උප නගරාධිපතිතුමා සමඟ අඛණ්ඩව කටයුතු කිරීම සහ හමුවීම. වසර පුරා ෂැංහයි, පියැංසු, අන්හුයි, ෂෙජියැං සහ හුනාන් පළාතේ නිලධාරීන් හමුවීම.

i. 2019 අගෝස්තු 29 වැනි දින ෂැංහයි සමාජ විද්‍යා ඇකඩමියේ මහලේකම්වරයා හමුවීම.

ii. 2019 සැප්තැම්බර් 10-11 දිනවල ෂැංහයි හිදී පැවති චීන අධ්‍යයන පිළිබඳ ලෝක සංසදයට සහභාගී වූ අතර, ඉදිරි වසර 15 සඳහා චීනයේ දේශපාලන, ආර්ථික හා තාක්ෂණික ගමන් මඟ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

iii. 2019 නොවැම්බර් 21 වැනි දින ෂැංහයි හිදී පැවති චීන ජනතාවගේ දේශපාලන සමුළුවට සහභාගී වීම සහ වාර්තාව ඉදිරිපත් කිරීම.

iv. 2019 දෙසැම්බර් 9 වැනි දින ෂැංහයි හි නගරාධිපතිවරයා විසින් පවත්වන ලද සාකච්ඡාවට සහභාගී වීම.

v. පහත සඳහන් කරුණු පිළිබඳව වාර්තා ඉදිරිපත් කරන ලදී:

- නිතිපතා ආර්ථික හා දේශපාලන වාර්තාව
- නව යුගයේ චීනයේ ජාතික ආරක්ෂාව
- චීනයේ හොඳම ෆෝචූන් 500 සමාගම්
- නිරීක්ෂණ හා නිර්දේශ සහිතව, තීරය හා මාවත සම්බන්ධ තොරතුරු තාක්ෂණ කර්මාන්තය
- චීන ජාත්‍යන්තර ආනයන එක්ස්පෝ ප්‍රදර්ශනය (CIIE) විශ්ලේෂණයක් සමඟ

#### ආ) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන ප්‍රවර්ධනය

i. 2019 ජනවාරි 7 වැනි දින පැවති ලෝක හැංෂෝ ව්‍යවසායකයන්ගේ ජාත්‍යන්තර වෙළඳ සංසදයට සහභාගී වීම. ආයෝජන සඳහා ශ්‍රී ලාංකිකයන් කිහිප දෙනෙකුට ශ්‍රී ලංකාවට පැමිණීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

ii. 2019 මැයි 14 සිට 16 දක්වා සියල් එක්ස්පෝ ප්‍රදර්ශනය සමඟ ලංකා තේ ප්‍රවර්ධනයට සහභාගී වීම. ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ ශ්‍රී ලංකා දේ සමාගම් කිහිපයක් මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කළහ.

iii. 2019 මැයි 21-24 දිනවල දී පැවති 'චීන යිව්' ආනයනික වෙළඳ භාණ්ඩ ප්‍රදර්ශනය සහ ජාත්‍යන්තර මිත්‍රත්ව ප්‍රදර්ශනය හා සංචාරක ප්‍රදර්ශනයට ශ්‍රී ලාංකික සමාගම් 4 ක සහභාගිත්වය සඳහා පහසුකම් සැපයීම.

iv. 2019 මැයි 31 සිට ජුනි 2 දක්වා ෂැංහයි හිදී පැවති 'තීරය සහ මාවත සන්නාම සහිත එක්ස්පෝ' ප්‍රදර්ශනය සහභාගී වීම සඳහා පහසුකම් සපයන ලදී. තේ, මැණික්, හස්ත කර්මාන්ත හා පොල් නිෂ්පාදන සම්බන්ධ ශ්‍රී ලාංකික සමාගම් 10 ක් මෙම එක්ස්පෝ ප්‍රදර්ශනය සඳහා සහභාගී විය.

v. 2019 ජූලි 23-26 දිනවල දී ෂෙජියෑං හි විදේශ කොන්සල් සංචාරයට සහභාගී වූ අතර, 2019 ජූලි 25 වැනි දින හැංෂෝ වාණිජ මණ්ඩලයේ සම්මේලනයේ දී ශ්‍රී ලංකාවේ පවතින ව්‍යාපාරික අවස්ථා පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරන ලදී.

vi. 2019 අගෝස්තු 6 වැනි දින ෂැංහයි හිදී චීන ජාත්‍යන්තර ආනයන එක්ස්පෝ (CIIE) හි විධායක අධ්‍යක්ෂවරයා සමඟ පැවති රැස්වීම.

vii. 2019 අගෝස්තු 14 වැනි දින ෂෙජියැං පළාතට ගොස් ෂෙජියැං විදේශ කටයුතු කාර්යාලයේ, වාණිජ දෙපාර්තමේන්තුවේ සහ ෂෙජියැං පළාත් රජයේ ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කරන චීන කවුන්සිලයේ (CCPIT) ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවීම.

viii. 2019 අගෝස්තු 20 වැනි දින පැවති ෂැංහයි ඩ්‍රැගන් සහයෝගීතාවයේ උප සභාපතිවරයා සමඟ රැස්වීම.

ix. 2019 අගෝස්තු 26 වැනි දින පැවති ෂැංහයි හි ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීමේ චීන කවුන්සිලයේ සභාපතිවරයා සමඟ රැස්වීම.

x. 2019 සැප්තැම්බර් 17 වැනි දින නැන්පිං හි පැවති ශ්‍රී ලංකා ප්‍රවර්ධන වැඩසටහන්වලට සහභාගී වීම.

xi. 2019 සැප්තැම්බර් 26 සිට 29 දක්වා වෙන්ෂෝ හි ශ්‍රී ලංකා නිෂ්පාදන, තේ සහ මැණික් මෙන්ම, සංචාරක ප්‍රවර්ධනය සඳහා ද සහභාගී විය.

xii. 2019 සැප්තැම්බර් 25 වැනි දින ෂැංහයි හි ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික ජැක් ෂී මහතා හමුවී ඔහුගේ සමාගම සහ ශ්‍රී ලංකාව අතර අනාගත සහයෝගීතාව ගැන සාකච්ඡා කරන ලදී.

xiii. 2019 සැප්තැම්බර් 25-28 දිනවල දී ඇඟලුම් කර්මාන්ත දූත පිරිසකට ෂැංහයි වෙත පැමිණීමට පහසුකම් සැලසීම.

xiv. 2019 ඔක්තෝබර් 16 වැනි දින ෂැංහයි හි විදේශ කටයුතු කාර්යාලයේ දී නිලධාරීන් හමුවීම.

xv. 2019 ඔක්තෝබර් 10-11 දිනවල හෙෆෙයි හිදී පැවති 2019 චයිනා අන්හුයි උසස් තත්ත්වයේ කෘෂිකාර්මික නිෂ්පාදන සහ කෘෂිකාර්මික කාර්මීකරණ වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වීම.

xvi. 2019 ඔක්තෝබර් 17 වැනි දින නැන්පිං හි විදේශ කටයුතු කාර්යාලය, CCPIT සහ වාණිජ දෙපාර්තමේන්තුව සමඟ රැස්වීම.

xvii. 2019 නොවැම්බර් 4 වැනි දින ෂැංහයි හි CCPIT සමඟ එක්ව B2B රැස්වීම් මාලාවක් පැවැත්වීම.

xviii. 2019 නොවැම්බර් 5-10 දිනවල පැවති 2 වැනි චීන ජාත්‍යන්තර ආනයන එක්ස්පෝ ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකාවේ සහභාගිත්වයට සහ 2019 නොවැම්බර් 12-20 දිනවල පැවති ශ්‍රී ලංකාවේ මණ්ඩපය කළමනාකරණයට පහසුකම් සැලසීම.

xix. 2019 දෙසැම්බර් 10 වැනි දින කුෂෝ මහ නගර සභාවේ දී රජයේ නිලධාරීන් හමුවීම.

xx. 2019 දෙසැම්බර් 13 වැනි දින නිංබෝ මහ නගර සභාවේ දී රජයේ නිලධාරීන් හමුවීම.

xxi. 2019 දෙසැම්බර් 17 වැනි දින ෂැනිං ජාත්‍යන්තර වෙළඳ සහයෝගීතාවයේ දී රජයේ නිලධාරීන් හමුවීම සහ ඇ.ඩො. මිලියන 200 ක් වටිනා ආයෝජන යෝජනාවක් ඉදිරිපත් කිරීම.

xxii. 2019 දෙසැම්බර් 17 වැනි දින ෂැංහයි හි විදේශ කටයුතු කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හමුවීම.

xxiii. 2019 දෙසැම්බර් 21 වැනි දින බෙල්ට් ඇන්ඩ් රෝඩ් ඉන්ටර්නැෂනල් කර්මාන්තයේ අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දී අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දී ප්‍රකාශයක් ලබා දුන් අතර, හැංෂෝ හි ෂෙජියැං විශ්වවිද්‍යාලයේ තේ විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී.

**ඇ) සංචාරක කටයුතු ප්‍රවර්ධනය**

i. 2019 සැප්තැම්බර් 11 වැනි දින ෂැංහයි හි සංචාරක නියෝජිතයින් හා මාධ්‍යවේදීන් සඳහා ජාලකරණ අංගයක් සංවිධානය කිරීම.

ii. 2019 සැප්තැම්බර් 5 වැනි දින හැංඡෝ හි ජාතික දිනයට සහභාගී වීම.
iii. චීනයේ සිට ශ්‍රී ලංකාව වෙත සංචාරක කර්මාන්තය නංවාලීමේ අරමුණින්, හැංඡෝ හි සංචාරක නියෝජිතයින් හමුවීම.
iv. 2019 ෂැංහයි ලෝක සංචාරක ප්‍රදර්ශනය (SWTF) 2019 අප්‍රේල් 18 සිට 21 දක්වා පැවැත්විණ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මෙම මෙහෙයුම සමඟ එක්ව ශ්‍රී ලාංකික සංචාරක ව්‍යාපාරය සඳහා ශක්තිමත් ප්‍රවර්ධනයක් ලබා දුන්නේය.
v. 2019 අප්‍රේල් 23 වැනි දින ෂැංහයි හිදී පැවති ශ්‍රී ලංකා මාර්ග සංදර්ශනයට ශ්‍රී ලංකා සංචාරක කටයුතු කාර්යාංශය සමඟ සහභාගී විය.

**ඈ) චීන මාධ්‍ය සමඟ සම්බන්ධ වීම**

i. 2019 සැප්තැම්බර් 20 වැනි දින පැවති ග්ලෝබල් ටයිම්ස් ඉන්ටර්නැෂනල් ප්‍රවෘත්ති මැදිරියේ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාව.
ii. කෘෂිකාර්මික කර්මාන්ත සම්බන්ධයෙන් චීන ශ්‍රී ලංකා සහයෝගිතාව පිළිබඳ 2019 ඔක්තෝබර් 14 වැනි දින පැවති සම්මුඛ සාකච්ඡාව.
iii. 2019 ඔක්තෝබර් 22 වැනි දින පැවති ෂැංහයි හි ජාත්‍යන්තර නාලිකාවේ සම්මුඛ සාකච්ඡාව.

**ඉ) අධ්‍යාපනික, විද්‍යා, සංස්කෘතික හා තාක්ෂණික සහයෝගිතාව**

i. සීමාසහිත ෂැංහයි යුන්කායි අධ්‍යාපන පුහුණු සමාගම සමඟ එක්ව 2019 ජනවාරි මස ෂික්ෂි පාථමික පාසල සමඟ පැවති සංස්කෘතික ප්‍රවර්ධනය. මෙම වැඩසටහන යටතේ චීන සිසු සිසුවියන්, ගුරුවරුන් හා දෙමාපියන් 300 දෙනෙකු පමණ වාර්ෂිකව ශ්‍රී ලංකාවට පැමිණේ.
ii. හැංඡෝ-ශ්‍රී ලංකා අධ්‍යයන හුවමාරු වැඩසටහනේ ප්‍රවර්ධන අංගය 2019 අප්‍රේල් 11 වැනි දින පැවැත්විණ. මෙම හුවමාරු වැඩසටහන යටතේ වාර්ෂිකව චීන සහ ශ්‍රී ලාංකික සිසු සිසුවියන් හා ගුරුවරුන් 1000 ක් පමණ චීනයේ සහ ශ්‍රී ලංකාවේ සිය සහෝදර පාසල් නැරඹීමට යති.
iii. 2019 ජූලි 18 වැනි දින පැවති 2019 ෂැංහයි ජාත්‍යන්තර සහෝදර නගර තරුණ කඳවුරට සහභාගී විය.
iv. 2019 ජූලි 23 වැනි දින OBORCLOUD හි සභාපතිවරයා හමුවීම.
v. 2019 ඔක්තෝබර් ෂැංහයි හි පුනරුදය රෝහලේ දී වෛද්‍ය කණ්ඩායම සමඟ පැවති රැස්වීම.
vi. 2019 නොවැම්බර් 12 වැනි දින තොරතුරු සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ (ICT) සහයෝගිතාව පිළිබඳ තීරය හා මාවත සංගමයට සහභාගී වීම.
vii. 2019 දෙසැම්බර් 20 වැනි දින ෂැංහයි විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ දී එහි නිලධාරීන් හමුවීම.
viii. 2019 දෙසැම්බර් 30 වැනි දින අලිබාබා කැම්පස් වෙත යාම.
ix. 2019 දෙසැම්බර් 31 වැනි දින හැංඡෝ රජයේ අධ්‍යාපන අංශ නිලධාරීන් හා පාසල් සමඟ රැස්වීමකට සහභාගී වීම.

**ඊ) සමුද්‍රීය කටයුතු**

i. 2019 සැප්තැම්බර් 19 වැනි දින බෙංගාල බොක්කේ සහ නැගෙනහිර සමක ඉන්දියානු සාගරයේ ඒකාබද්ධ උසස් සාගර හා පාරිසරික අධ්‍යයන වාර්තා කිරීම.
ii. 2019 නොවැම්බර් 19 වැනි දින හැංඡෝ හි දෙවැනි සාගර විද්‍යා අයතනය නැරඹීම සහ පසුව ආයතනයේ දී සිදුකරන ලද සමුද්‍රීය ව්‍යාපෘති පිළිබඳ වාර්තාව.

**3. ප්‍රජාතන්ත්‍රවාදී මහජන කොරියානු ජනරජය (DPRK)**

**අ) ද්විපාර්ශ්වික සබඳතා**

i. ප්‍රජාතන්ත්‍රවාදී මහජන කොරියානු ජනරජය සමඟ ද්විපාර්ශ්වික සබඳතා සුහදව පවත්වාගෙන යනු ලැබේ.

ii. බීජිං හි සිටින ප්‍රජාතන්ත්‍රවාදී මහජන කොරියානු ජනරජයේ තානාපතිවරයා 2019 ජනවාරි 14 වැනි දින ප්‍රජාතන්ත්‍රවාදී මහජන කොරියානු ජනරජය සඳහා සමගාමීව අක්තගන්වා සිටින චීනයේ ශ්‍රී ලංකා තානාපතිවරයා හමුවීමට පැමිණි අතර, අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන කරුණු සහ කොන්සියුලර් කටයුතු පිළිබඳව සාකච්ඡා කළේය.

**4. ජපානය**

**අ) ද්විපාර්ශ්වික සබඳතා**

i. ජපාන අග්‍රාමාත්‍යවරයාගේ විශේෂ උපදේශක පාර්ලිමේන්තු මන්ත්‍රී කෙන්ටාරෝ සොනෝරා මහතා 2019 පෙබරවාරි 15-16 දිනවල දී ශ්‍රී ලංකාවට පැමිණ, දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ නායකයින් හමුවිය.

ii. හිටපු වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති කාවන් රත්නායක මහතා සමඟ ජපානය සමඟ සබඳතා තවදුරටත් වර්ධනය කර ගැනීමට සහ නව ව්‍යාපාරික අවස්ථා පිළිබඳව ගවේෂණය කිරීම සඳහා 2019 අප්‍රේල් මස ජපානයේ සංචාරයක නිරත වූ අතර, එහි දී ජපාන අධිකරණ අමාත්‍යවරයා ඇතුළු රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ නිලධාරීන් හමුවිය.

iii. රැකියා අවස්ථා පිළිබඳ සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා, හිටපු විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය ගරු හරීන් ප්‍රනාන්දු මැතිතුමා 2019 ජූනි මාසයේ දී ජපානයට පැමිණියේය. මෙම සංචාරයේ දී ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් හට රැකියා අවස්ථා ලබා ගැනීම සඳහා රජයන් දෙක අතර සහයෝගිතා ගිවිසුමකට අත්සන් තබන ලදී.

iv. ජපානයේ ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය කෙන්ජි හරදා මැතිතුමා 2019 ජූනි මාසයේ දී ශ්‍රී ලංකාවට පැමිණ, දෙරට අතර ආරක්ෂක සහයෝගීතාව පිළිබඳව සාකච්ඡා කළේය. මෙම සංචාරයේ දී අමාත්‍යවරුන් දෙදෙනා 'ආරක්ෂක සහයෝගිතාව සහ නුවමාරුව පිළිබඳ සංදේශයකට' අත්සන් තැබූහ.

v. ආයෝජන සඳහා ව්‍යාපාරික ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා, හිටපු සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම මැතිතුමා 2019 සැප්තැම්බර් මාසයේ දී ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් සමඟ ජපානයේ සංචාරය කළේය.

vi. ශ්‍රී ලංකාවේ ආරක්ෂක සේවා අණදෙන මූලස්ථානයේ හා මාණ්ඩලික විද්‍යාලයේ ත්‍රිවිධ හමුදා නියෝජිත කණ්ඩායමේ වාර්ෂික අධ්‍යයන චාරිකාව සම්බන්ධීකරණය කිරීම.

vii. 2019 ඔක්තෝබර් 22-23 දිනවල දී පැවති නව ජපාන අධිරාජයා වන නරුහිතෝ රජතුමාගේ සිංහාසනාරූඪ වීමේ උත්සවයට, හිටපු ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ ජනාධිපති ආර්යාව සහභාගී වූහ.

viii. ජපානයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු ටොෂිමිට්සු මොටෙගි මැතිතුමා අන්‍යෝන්‍ය වශයෙන් ඵලදායී සබඳතා ශක්තිමත් කිරීම සහ දෙරට අතර සහයෝගීතාව විවිධාංගීකරණය කිරීම සඳහා 2019 දෙසැම්බර් 13 වැනි දින ශ්‍රී ලංකාවට පැමිණියේය.

**ආ) බහුපාර්ශ්වීය සබඳතා**

i. මෙම තානාපති කාර්යාලයේ ඉල්ලීම පරිදි, ජපානයේ මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකායේ (FATF) සාමාජික රටක් ලෙස, එහි පූර්ණ සැසියේ දී ශ්‍රී ලංකාව FATF අළු ලැයිස්තුවෙන් ඉවත් කිරීමට සහාය විය.

ii. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන 11 ක ජපානයේ අපේක්ෂකත්ව සඳහා ශ්‍රී ලංකාව සහාය විය.

**ඇ) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන**

i. හිටපු ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍ය ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා සහ සාමාජිකයන් 8 දෙනෙකුගෙන් සමන්විත තොරතුරු තාක්ෂණ ව්‍යාපාර නියෝජිත කණ්ඩායමක් ජපානයේ නිරත වූ සංචාරයක් සඳහා පහසුකම් සලසන ලද අතර, ඔවුහු ප්‍රවර්ධන කටයුතු මාලාවක නිරත වූහ.

ii. යෝජිත ඇ.ඩො. මිලියන 500 ක 'සමුරායි බැඳුම්කර' නිකුතුව ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුවේ අධිපතිවරයා සහ අනෙකුත් ප්‍රමුඛ නිලධාරීන්ගේ ජපාන සංචාරය සඳහා පහසුකම් සැලසීම.

iii. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී 2018 වසරට සාපේක්ෂව ජපානය වෙත ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනය 25% කින් පමණ වර්ධනය වී තිබේ. මෙය ශ්‍රී ලංකාව ජපානය වෙත සිදුකළ වැඩිම අපනයන වටිනාකම ලෙස වාර්තා වේ. 2018 වසරට සාපේක්ෂව ජපානය සමඟ පැවති ඍණාත්මක වෙළඳ ශේෂය 2019 දී 50% ක් පමණ දක්වා හැකිලී ගොස් ඇත.

iv. 2019 වර්ෂය අවසානයේ දී ජපානයේ ඍජු විදේශ ආයෝජන ඇ.ඩො. මිලියන 31.8 ක් ලෙස සටහන් විය. 2018 දී ශ්‍රී ලංකාවේ 13 වැනි ඍජු විදේශ ආයෝජන ප්‍රභවය ලෙස පැවති ජපානය, 2019 වසරේ දී 10 වැනි ස්ථානය දක්වා ඉදිරියට ගමන් කොට ඇත.

v. ශ්‍රී ලංකාව වෙත පැමිණි ව්‍යාපාර සම්බන්ධ නියෝජිත කණ්ඩායම් 03 ක් සහ ජපානය වෙත ගිය නියෝජිත කණ්ඩායම් 07 ක් සඳහා සංවිධානය කිරීම/පහසුකම් සැපයීම සිදුකරන ලදී.

vi. යමානෂි, ටෝකියෝ, නීගාටා සහ සයිටාමා වෙත ආයෝජන/ව්‍යාපාර ප්‍රවර්ධන සම්මන්ත්‍රණ 08 ක් සහ චාරිකා සිදුකරන ලදී.

vii. තනි රටක නිෂ්පාදන උත්සව අංග 8 ක් සංවිධානය/පහසුකම් සැපයීම සිදු කරන ලදී. උදා: ජපානයේ ශ්‍රී ලංකා උළෙල, ශ්‍රී ලංකා තේ සම්මන්ත්‍රණ 5 ක්, නගොයා හි තේ උත්සවය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ අංගය

viii. 2019 දී ජපානයේ පැවති ප්‍රධාන ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන 4 ක ශ්‍රී ලංකාවේ සහභාගිත්වයට සහාය විය.

ix. පුද්ගලික සමාගම් 7 ක සංචාරය සහ ජපාන සමාගම් 50 ක් පමණ සමඟ අබණ්ඩ B2B රැස්වීම් මාලාවක් සංවිධානය කරන ලදී.

x. අපනයන විමසීම් සම්බන්ධයෙන් ජපානයෙන් ශ්‍රී ලංකාව වෙත සිදුකරන ලද සමාගම් මට්ටමේ හඳුන්වා දීම් 15 ක් පමණ සඳහා සහාය විය. 2019 වසර තුළ දී වෙළඳ හා ආයෝජන විමසීම් 50 ක් පමණ සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන ලද අතර, වෙළඳ පැමිණිලි 3 ක් පිළිබඳව කටයුතු කරන ලදී.

### ඈ) සංචාරක කටයුතු

i. පාස්කු ඉරුදින එල්ල වූ ප්‍රහාරයෙන් අනතුරුව පනවන ලද සංචාරක උපදේශන 2 වැනි මට්ටමේ (අත්‍යවශ්‍ය නොවන සංචාරවලින් වළකින්න) සිට 1 වැනි මට්ටම (ප්‍රමාණවත් ලෙස ප්‍රවේශම් වන්න) දක්වා ලිහිල් කිරීම සඳහා ජපාන රජය වෙත නියෝජනයක් සිදුකරන ලදී.

ii. මෙම තානාපති කාර්යාලයේ අනුග්‍රහය ඇතිව, 2019 අගෝස්තු මාසයේ දී ජපානයේ ශ්‍රී ලාංකික ව්‍යාපාරික සභාව විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා උළෙලට සහභාගී විය.

iii. ජපානයේ සංචාරක නියෝජිතයින්ගේ සංගමය (JATA) විසින් 2019 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ සංවිධානය කරන ලද වාර්ෂික සංචාරක ප්‍රදර්ශනයට සහභාගී විය.

### ඉ) සංස්කෘතික සබඳතා

i. ජාත්‍යන්තර හා දේශීය සහභාගීවන්නන් සහිතව සංවිධානය කරන ලද ජපානයේ විවිධ සංස්කෘතික උත්සවවලට සහභාගී විය. ජපාන රජය, ප්‍රාන්ත රජයන් සහ රාජ්‍ය නොවන සංවිධාන මඟින් මෙම උත්සව සංවිධානය කරන ලදී.

ii. ප්‍රාථමික හා මධ්‍යම පාසල් ළමුන්, ප්‍රජා කණ්ඩායම් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සංස්කෘතික දැනුවත් කිරීම්/හුවමාරු වැඩසටහන් 11 ක් පැවැත්වීම.

iii. 2020 ඔලිම්පික් තරඟවලට සමාන්තරව ශ්‍රී ලාංකික මළල ක්‍රීඩකයන් පිළිගැනීම සඳහා සුම්මු, හෂිමා සහ මේබෂිටෝ යන සත්කාරක නගර මඟින් සංවිධානය කරන ලද උත්සවවලට සහභාගී විය.

### 5. මොන්ගෝලියාව

මොන්ගෝලියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් සඳහා අවශ්‍ය කොන්සියුලර් සහය ලබා දීම පිණිස මොන්ගෝලියාවේ නිර්වේතනික කොන්සල් කාර්යාලය වෙත අවශ්‍ය උපදෙස් ලබා දී තිබේ.

### 6. කොරියානු ජනරජය (RoK)

#### අ) ද්විපාර්ශ්වික සබඳතා

i. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාවේ රජය සහ කොරියානු ජනරජයේ රජය අතර පවත්නා මිත්‍රශීලී ද්විපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව, මෙම තානාපති කාර්යාලය විසින් අදාළ කොරියානු අමාත්‍යාංශ හා ඒවාට අනුබද්ධිත ආයතන, කොරියානු ආයතන, ව්‍යාපාරික ආයතන මෙන්ම, ජාතික සභාවේ සාමාජිකයන් ඇතුළු කොරියානු ජනරජයේ දේශපාලන නායකත්වය සමඟ ද සුහද සබඳතා පවත්වා ගන්නා ලදී.

ii. ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියානු කලාපය සමඟ සම්බන්ධ වීම ඇතුළත් ජනාධිපති මූන්ගේ නව දක්ෂිණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරමක් සිදු කරන ලදී.

iii. කොරියානු ජාතික රාජ්‍යතාන්ත්‍රික ඇකඩමියේ ද සහාය ඇතිව, කොරියානු විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද 10 වැනි කොරියානු ජනරජ/සාර්ක් හවුල්කාරිත්ව සම්මන්ත්‍රණය 2019 සැප්තැම්බර් 20 වැනි දින පැවති අතර, ඒ සඳහා ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සාර්ක් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තිලෝමා අබයපීව මහත්මිය (මණ්ඩලයේ සාමාජික) ඇතුළු අදාළ රටවල සාර්ක් නිලධාරීන් සහභාගී විය.

iv. කොරියා පදනම විසින් 2019 අප්‍රේල් 07 සිට 13 දක්වා විදේශ ප්‍රතිපත්ති හා ආරක්ෂාව පිළිබඳ සම්භාවනීය අමුත්තන් සඳහා පවත්වන ලද වැඩසටහනට ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය ගනේෂන් විග්නරාජා මහතා සහභාගී විය.

v. කොරියානු ජනරජයේ ජාතික සභාවේ කථානායකවරයාගේ මූලපිරීමක් ලෙස, තෝරාගත් දකුණු ආසියානු රටවල් සමඟ අන්තර් පාර්ලිමේන්තු රාජ්‍යතාන්ත්‍රිකභාවය ශක්තිමත් කිරීම පිණිස කොරියා-දකුණු ආසියා අන්තර් පාර්ලිමේන්තු රාජ්‍යතාන්ත්‍රික සංසදය දියත් කිරීමට සහභාගී වූ අතර, එහි දී ආරම්භක සාමාජිකයන් ලෙස, දකුණු ආසියාවේ තෝරාගත් රටවල් 5 ක (එනම්, බංග්ලාදේශය, ඉන්දියාව, නේපාලය, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව) පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායම්වල සාමාජිකයින් ට ආරාධනා කරන ලදී.

#### ආ) ආර්ථික සහයෝගිතාව

i. යටිතල පහසුකම්, පාලනය, අධ්‍යාපනය, කර්මාන්ත, ධීවර, බලශක්ති, කෘෂිකාර්මික, මානව සම්පත් සංවර්ධනය සහ රාජ්‍ය පරිපාලනය ඇතුළු පුළුල් පරාසයක සංවර්ධන සහයෝගිතාව සම්බන්ධයෙන්, කොරියා ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA) සහ කොරියාවේ එක්සිම් බැංකුවේ, ආර්ථික සහයෝගිතා අරමුදලේ (EDCF) ජ්‍යෙෂ්ඨ මැදිහත්කරුවන් සමඟ සම්බන්ධ වන ලදී.

ii. කොරියාවේ සඵමෝල් ගෝලීයකරණ පදනම (SGF) හා කොළඹ පිහිටි එහි ශාඛා කාර්යාලය සමඟ සමීප සම්බන්ධීකරණයක් පවතින අතර, ආදායම් දිරිගන්වන නිෂ්පාදන හඳුන්වා දීම සමඟ තාක්ෂණික දැනුම ලබා දෙමින්, සබරගමුව පළාතේ ගම්මාන 4 ක් (පිටියෙගම, පහළගම, හේවාදිවෙල සහ වල්පොල) නියමු ගම්මාන ලෙස සංවර්ධනය කොට ඇත.

#### ඇ. ආරක්ෂක සහයෝගිතාව

අඛණ්ඩ සහයෝගිතාවය යටතේ පුහුණු/නුවමාරු වැඩසටහන් සඳහා ශ්‍රී ලංකාවේ ආරක්ෂක ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම. ඒ අනුව, තානාපති කාර්යාලය විසින් 2019 සැප්තැම්බර් මස සපුගස්කන්ද ආරක්ෂක සේවා අණදෙන මූලස්ථානය සහ ආරක්ෂක විද්‍යාලයේ 16 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත කණ්ඩායමක් සඳහා සති 2 ක පුළුල් විදේශ අධ්‍යයන චාරිකා වැඩසටහනක් සඳහා පහසුකම් සපයන ලදී.

### ඈ. පරිසරය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ විද්‍යාව පිළිබඳ සහයෝගීතාව

i. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සහ විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදන පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI) ඇතුළුව, ශ්‍රී ලංකාවේ අදාළ ආයතන සමඟ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන (STI) සහයෝගීතාව සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය (STEPI) සමඟ වැඩිදියුණු කළ සහයෝගීතාවය.

ii. නවෝත්පාදන සඳහා සියල්ල ඇතුළත් පුළුල් පරිසර පද්ධතියක් සැපයීම පිණිස 2017 දී ආරම්භ කරන ලද කොළඹ ටෙක් සිටි ප්‍රධාන සැලසුම් ව්‍යාපෘතිය සඳහා, STEPI වෙතින් ආධාර ලබාගැනීමට සාකච්ඡා ආරම්භ කරන ලදී. ඒ අනුව, 2019 පෙබරවාරි මාසයේ දී අතිරේක ලේකම් මාධව වෛද්‍යරත්න මහතා සහ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිතයන් අතර රැස්වීමක් තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලද අතර, කේ-නවෝත්පාදන වැඩසටහන සහ ටෙක්සිටි ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වැඩිදුර සහයෝගීතාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා STEPI හි නියෝජිත පිරිසක් 2019 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාවට පැමිණියහ.

iii. නාරා සහ අනෙකුත් රජයේ ආයතන සමඟ සමුද්‍ර විද්‍යාත්මක හා තාක්ෂණික ධාරිතා වර්ධනය හා පර්යේෂණ සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා කොරියානු සාගර විද්‍යා හා තාක්ෂණ ආයතනය (KIOST) සමඟ සම්බන්ධ වන ලදී. ඒ අනුව නාරා හි සමුද්‍ර විද්‍යා හා තාක්ෂණ ඩිජිටල් පුස්තකාලය පිහිටුවීම සඳහා නව ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාවක් සකස් කෙරිණ. මෙය කොරියානු ODA ආධාර යටතේ වන ඇ.ඩො. මිලියන 3 ක් වටිනා ව්‍යාපෘතියකි.

iv. 2019 ජූලි 24-26 දිනවල සෝල් හිදී පැවති කොරියාවේ විද්‍යා හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍යාංශය සහ හරිත තාක්ෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද කොරියාවේ දේශගුණ තාක්ෂණ 2019 හි ගෝලීය සහයෝගිතා සංසදයට කුරුණෑගල නගර සභාවේ නගරාධිපති තුෂාර සංජීව මහතා සහභාගී විය.

### ඉ) අධ්‍යාපනික සහයෝගීතාවය

i. ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය සහ ග්වංජු මෙට්‍රොපොලිටන් අධ්‍යාපන කාර්යාලය අතර අධ්‍යාපන ක්ෂේත්‍රයේ අඛණ්ඩ සහයෝගීතාව සඳහා සහාය විය. මේ සඳහා අතිරේක ලේකම් (සංවර්ධන) සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ දූත පිරිසකගේ සංචාරය සඳහා පහසුකම් සපයන ලදී.

ii. මෙම සංචාරයට සමගාමීව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ ග්වංජු මෙට්‍රොපොලිටන් අධ්‍යාපන කාර්යාලය අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගුරුවරුන් 19 දෙනෙකු සහ අධ්‍යාපන නිලධාරීන් 6 දෙනෙකු සඳහා සති දෙකක පුහුණුවක් ලබා දීමට ග්වංජු මෙට්‍රොපොලිටන් අධ්‍යාපන කාර්යාලය ඉදිරිපත් විය.

iii. 2019 සැප්තැම්බර් 29 වැනි දින තානාපති කාර්යාලයේ දී පැවති 9 වැනි වාර්ෂික මහා සභා රැස්වීම ඇතුළුව, කොරියානු ජනරජයේ ශ්‍රී ලංකා ශිෂ්‍ය සංගමයට (SLSA) අඛණ්ඩව උපදෙස් දීම හා සම්බන්ධ වීම. ශ්‍රී ලංකා ශිෂ්‍ය සංගමය, කොරියානු ජනරජයේ සිටින ශ්‍රී ලාංකික සිසු සිසුවියන්ට එකිනෙකා සමඟ අන්තර් ක්‍රියා කිරීම, ශිෂ්‍යත්ව හා වෙනත් අවස්ථා විධිමත් කිරීම හා බෙදා හැරීම සඳහා වේදිකාවක් සපයයි.

iv. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) සහ KDI රාජ්‍ය ප්‍රතිපත්ති කළමණාකරණ පාසල අතර 2017 සැප්තැම්බර් මාසයේ දී අත්සන් තබන ලද ඉගෙනුම, සංවර්ධනය හා පර්යේෂණ සම්බන්ධ අන්‍යෝන්‍ය සහයෝගිතාව පිළිබඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සමඟ KDI පාසල විසින් 2019 පෙබරවාරි 21-25 දිනවල දී සංවිධානය කරන ලද අධ්‍යයන චාරිකා වැඩසටහනට ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීහු 30 දෙනෙක් සහභාගී වූහ.

### ඊ) ශ්‍රී ලංකාවේ සිට කොරියානු ජනරජය වෙත සිදුකළ ඉහළ මට්ටමේ සංචාර

i. 2019 ජූනි 23-30 දිනවල දී බුසාන් හි පැවති වරාය විශේෂඥ වැඩමුලුවකට සහභාගී වන ලෙස කොරියානු රජය විසින් කරන ලද ආරාධනයකට අනුව එහි ගිය හිටපු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු දිලිප් වෙදආරච්චි මැතිතුමා නිරත වූ සංචාරය.

ii. කොරියාවේ ජාත්‍යන්තර ජල සතියට සහභාගී වීම සඳහා හිටපු නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු ලක්ී ජයවර්ධන මැතිතුමා 2019 සැප්තැම්බර් 4-7 දිනවල දී නිරත වූ සංචාරය.

iii. ශ්‍රී ලංකා ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුමංගල ඩයස් මහතා 2019 සෝල් ජාත්‍යන්තර ගුවන් හා ආරක්ෂක ප්‍රදර්ශනයට සහභාගී වීම පිණිස 2019 ඔක්තොබර් 13-17 දිනවල දී කොරියාවේ සංචාරයක නිරත විය.

iv. ITOP ජාත්‍යන්තර ප්‍රතිපත්ති සම්මන්ත්‍රණයට සහභාගී වීම සඳහා හිටපු දකුණු පළාත් ආණ්ඩුකාර ගරු රංජිත් කීර්ති තෙන්නකෝන් මැතිතුමා 2019 මැයි 29 දින නිරත වූ සංචාරය.

### උ) බහුපාර්ශ්වික සබඳතා

i. බහුපාර්ශ්වික ගැටලු පිළිබඳ සහයෝගිතාව සම්බන්ධයෙන්, විදේශ කටයුතු අමාත්‍යාංශය මෙන්ම අනෙකුත් කොරියානු රාජ්‍ය ආයතන සහ කොරියානු ජනරජයේ පිහිටි බහුපාර්ශ්වීය ආයතන එනම්, හරිත දේශගුණික අරමුදල (GCF), ගෝලීය හරිත වර්ධන ආයතනය හා අද්‍යාළ තානාපති කාර්යාල සමඟ සම්බන්ධීකරණය කිරීම.

ii. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී, ලෝක රේගු සංවිධානයේ (WCO), ධාරිතා වර්ධන අධ්‍යක්ෂ තනතුර සඳහා කොරියානු ජනරජයේ අපේක්ෂකත්වයට ශ්‍රී ලංකා රජයේ සහයෝගිතාවය සම්බන්ධීකරණය කිරීම හා තහවුරු කිරීම.

iii. දේශගුණික විපර්යාස සහයෝගිතාව සම්බන්ධයෙන් හරිත දේශගුණික අරමුදල සමඟ අඛණ්ඩව කටයුතු කිරීම. 2018 ජූනි මාසයේ දී මුලින්ම ඉදිරිපත් කරන ලද, "ශ්‍රී ලංකාවේ නකල්ස් කඳුවැටියේ ජල පෝෂක ප්‍රදේශයේ අවදානමට ලක්විය හැකි ගංගා ද්‍රෝණිවල, ජලය රැඳෙන ප්‍රදේශවල සහ පහළ නිම්නයේ ජීවත්වන යැපුම් ගොවීන්ගේ හා කෘෂිකාර්මික වතු ප්‍රජාවන්ගේ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම" ව්‍යාපෘති යෝජනාව සම්බන්ධයෙන් 2019 වසරේ දී සාර්ථකව කටයුතු කරන ලද අතර, ඒ සඳහා ඇ.ඩො. මිලියන 39.775 ක මුදලක් ලබා දීමට හරිත දේශගුණික අරමුදල් මණ්ඩලය විසින් 2020 පෙබරවාරි මාසයේ දී අනුමත කරන ලදී.

iv. ශ්‍රී ලංකාව 2019 ජනවාරි 13 වැනි දින ගෝලීය හරිත වර්ධන ආයතනයේ 30 වැනි සාමාජික රට ලෙස එහි සාමාජිකත්වය ලබා ගත්තේය. මෙම සම්මේලනයේ 8 වැනි සැසිවාරය සහ ගෝලීය හරිත වර්ධන ආයතනයේ කවුන්සිලයේ 12 වැනි සැසිය 2019 ඔක්තෝබර් මාසයේ දී ගෝලීය හරිත වර්ධන සතිය තුළ දී පැවැත්විණ. පරිසර අමාත්‍යාංශයේ උපදේශක (ප්‍රතිපත්ති) සහ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායක ආරියරත්න හේවගේ මහතා 2020-2021 කාලය තුළ දී විශේෂඥයෙකු හා රාජ්‍ය නොවන ක්‍රියාකාරිකයෙකු ලෙස කවුන්සිලයේ සේවය කිරීම සඳහා තෝරා පත්කර ගන්නා ලදී.

### ඌ) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

i. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී කොරියාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය, වෙළඳ, කර්මාන්ත හා බලශක්ති අමාත්‍යාංශය සහ අනෙකුත් අද්‍යාළ අමාත්‍යාංශ, නියෝජිතායතන සහ අනුබද්ධිත ආයතන මෙන්ම, කොරියානු අපනයනකරුවන්ගේ සංගමය (KOIMA), කොරියා ජාත්‍යන්තර වෙළඳ සංගමය (KITA), කොරියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (KCCI), කොරියාවේ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ කර්මාන්ත සමුපකාරය (KAMICO), කොරියානු රෙදිපිළි කර්මාන්ත සම්මේලනය (KOFOTI) යනාදී ආයතන සමඟ සහද සබඳතා පවත්වා ගන්නා ලදී.

ii. 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ වෙළඳ, ආයෝජන සහ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව, පහත සඳහන් උත්සවවල දී ශ්‍රී ලංකා මණ්ඩප සංවිධානය කරන ලදී.

- ශ්‍රී ලාංකික අපනයන සමාගම් හතරක සහභාගිත්වයෙන් 2019 අප්‍රේල් 26-29 දිනවල දී පැවති ජාත්‍යන්තර උද්‍යාන විද්‍යා ගෝයං කොරියා-2019 ප්‍රදර්ශනය
- 2019 ජුනි 6-9 දිනවල දී පැවති සෝල් ජාත්‍යන්තර සංචාරක කර්මාන්ත ප්‍රදර්ශනය (SITIF). එහි දී ඔලබොඩුව නර්තන ආයතනයේ කැපී පෙනෙන දක්ෂතා වෙනුවෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය "හොඳම ජනකලා රංගන සම්මානය" දිනා ගත්තේය.
- 2019 අගෝස්තු 15-18 දිනවල දී පැවති කොරියානු ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනය (KITS 2019)
- 2019 සැප්තැම්බර් 5-8 දිනවල දී පැවති 22 වැනි බුසාන් ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනය
- 2019 අගෝස්තු 31 සිට සැප්තැම්බර් 1 දක්වා පැවති සෝල් මිත්‍රත්ව උළෙල
- 2019 අගෝස්තු 29 සිට සැප්තැම්බර් 2 දක්වා පැවති ඉන්සාඩොං ජාත්‍යන්තර සංස්කෘතික ප්‍රදර්ශනය
- 2019 ඔක්තෝබර් 12 සිට 13 දක්වා පැවති ඉටේවොන් ගෝලීය ගම්මාන උළෙල.
- 2019 ඔක්තෝබර් 25 සිට 27 දක්වා පැවති ඉහළ පෙළේ සංක්‍රමණිකයන්ගේ අරිරං බහු සංස්කෘතික උළෙලට (MAMF) ශ්‍රී ලංකාව "විශේෂිත රට" ලෙස සහභාගී විය.
- 2019 ජුනි 6-9 දිනවල දී පැවති සෝල් ජාත්‍යන්තර සංචාරක කර්මාන්ත ප්‍රදර්ශනයේ දී (SITIF) ග්‍රීන් නැවුරල් කෝපරේෂන් ආයතනය සඳහා නොමිලයේ ප්‍රදර්ශන කුටියක් ලබා ගැනීමට පහසුකම් සැලසීම.

**එ) තේ ප්‍රවර්ධනය**

කොරියානු චේබෝල් ලොට් සමූහය විසින් 1997 සිට එම සමූහයට අයත්ව තිබූ "www.ceylontea.com" ඩොමේන් නාමය, ශ්‍රී ලංකා තේ මණ්ඩලයට මාරු කළේය. ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, කොරියානු ජනරජයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ පැවති සාර්ථක සාකච්ඡා මාලාවකින් පසුව, කොරියානු චේබෝල් සමූහය විසින් මෙම ඩොමේන් නාමය ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත නොමිලයේ ලබා දෙන ලදී.

**ඒ) ශ්‍රී ලංකාව වෙත සිදුකෙරුණු ව්‍යාපාර නියෝජන**

i. නැවුම් මල් සහ කැපූ පත්‍ර සඳහා කොරියානු ආනයනකරුවන් 3 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිස (2019 ජනවාරි/පෙබරවාරි)
ii. කොරියානු තේ මාස්ටර්ස් සමාජ සම්මේලනයේ 12 දෙනෙකුගෙන් යුත් දූත පිරිස (2019 මාර්තු)
iii. නාවික කටයුතු සඳහා ආධාර සංවර්ධනය කිරීමේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම යටතේ ශක්‍යතා අධ්‍යයනය සඳහා සාමාජිකයින් 5 දෙනෙකුගෙන් යුත් නියෝජිත පිරිස (2019 ජනවාරි)
iv. විදුලිබල හා බලශක්ති සමාගමක් වන කෙප්කෝ ඊ එන්සී හි සාමාජිකයින් 3 දෙනෙකුගෙන් යුත් දූත පිරිස (2019 නොවැම්බර්)

**ඔ) ආයෝජන සංසදය**

i. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය (BOI) සමඟ එක්ව, 2019 පෙබරවාරි 19-22 දිනවල සෝල් නුවර දී ආයෝජන ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කරන ලදී.

ii. කොරියානු ජනරජයේ ඉහළ පෙළේ සංස්ථා සහ සමාගම් රැසක් සමඟ අඛණ්ඩ රැස්වීම්, සැසි සහ සාකච්ඡා විශාල ප්‍රමාණයක් පවත්වන ලදී.

**ඕ) සංස්කෘතික සබඳතා**

i. ශ්‍රී ලංකාවේ 71 වැනි නිදහස් සැමරුම 2019 පෙබරවාරි 6 වැනි දින කොරියානු ජනරජයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවගේ ද සහාය ඇතිව ඇන්සන් නගරයේ දී සංවිධානය කරන ලදී.

ii. කොරියාවේ ශ්‍රී ලාංකික විහාරස්ථාන සහ ප්‍රජාවගේ සහාය ඇතිව 2019 මැයි මාසයේ වෙසක් සැමරුමට සමගාමීව පැවති, කොරියානු බුද්ධාගමේ ජොග්යේ නිකාය විසින් සංවිධානය කරන ලද වාර්ෂික නෙළුම් පහන් පෙරහැරේ දී ශ්‍රී ලාංකික පෙරහැර සංවිධානය කරන ලදී.

iii. කොරියානු ජනරජයේ ශ්‍රී ලංකා ශිෂ්‍ය සංගමය (SLSA) සමඟ එක්ව, 2019 ඔක්තෝබර් මස පැවති ඉටේවොන් ගෝලීය උළෙලේ දී පෙළපාළියක් සංවිධානය කරන ලදී.

iv. 2019 අගෝස්තු මස පැවති සෝල් මිතුත්ව උළෙලේ දී ආහාර, සංස්කෘතිය, සංචාරක කටයුතු හා පෙළපාළි ඇතුළු කටයුතු රැසක් සිදුකරන ලදී.

v. කොරියාවේ මානව සම්පත් සංවර්ධන සේවය (HRD Korea) විසින් සංවිධානය කරන ලද 2019 සැප්තැම්බර් 8-9 දිනවල දී පැවති 2019 විදේශ සේවක උළෙලේ දී රටේ බොහෝ සංස්කෘතික හා සංචාරක ආකර්ශනීය ස්ථාන ප්‍රවර්ධනය කරන ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියක් තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලදී.

**කොරියානු ජනරජයේ ශ්‍රී ලාංකික සහ කොරියානු බෞද්ධ විහාරස්ථාන සමඟ සහයෝගීතාව**

i. ශ්‍රී ලාංකික බෞද්ධ විහාරස්ථාන විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික කඨින උත්සව හා වෙනත් ආගමික උත්සව සඳහා පහසුකම් සැලසීම හා සහභාගිත්වය.
ii. ශ්‍රී ලංකාවේ විශාල ජනකායක් පැමිණි මෙම ආගමික උත්සවවලට සමගාමීව ජංගම කොන්සියුලර් සේවා සහ සුබසාධන සේවා 3 ක් පවත්වන ලදී.
iii. කොරියාවේ පිහිටි ප්‍රධාන ශ්‍රී ලාංකික විහාරස්ථාන 9 සමඟ අඛණ්ඩව කටයුතු කිරීම.

**ඒ) කම්කරු සුබසාධනය (රැකියා නියුක්තිය සහ සුබසාධනය)**

EPS යටතේ කොරියාවේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුබසාධනය සම්බන්ධයෙන් කොරියානු රැකියා හා කම්කරු අමාත්‍යාංශය සහ කොරියාවේ මානව සම්පත් සංවර්ධන සේවය (HRD) වැනි අදාළ කොරියානු නියෝජිත ආයතන සමඟ අඛණ්ඩව සමීප සම්බන්ධීකරණයක් පැවැත්වීම. 2019 ජනවාරි 1 වැනි දින සිට කොරියානු ජනරජය වෙත පැමිණි ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව 3,590 කි. එනම්, නිෂ්පාදන - 2,795, ධීවර - 756, ඉදිකිරීම් - 39.

i. රැකියා ප්‍රවර්ධනය: සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී රැකියා ප්‍රවර්ධන උපාය මාර්ගයක් ලෙස සමාගම් 150 ක් ඇගයීමට ලක් කොට සමරුඵලක හා සිහිවටන පිරිනමන ලදී.
ii. ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය: ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනත යටතේ එම කාර්යාංශයේ ලියාපදිංචි කිරීමේ ගාස්තු ලෙස කොරියානු වොන් (KRW) 4,497.500 (ශ්‍රී.ලං.රු.686,424.30) ක මුදලක් 2019 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා රැස් කරන ලදී.
iii. දැනුවත් කිරීමේ වැඩසටහන්: සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ දී, කොරියාවේ මානව සම්පත් සංවර්ධන සේවය (HRD) සහ සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා ආධාරක මධ්‍යස්ථාන සමඟ එක්ව, ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා කොරියාවේ විවිධ ප්‍රදේශවල දී " දිරිය මග" දැනුවත් කිරීමේ සහ උපදේශන වැඩසටහන් 5 ක් පවත්වන ලදී.
iv. ආරක්ෂිත පියවර පිළිබඳ තොරතුරු: නිෂ්පාදන අංශ හා ධීවර අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, කාර්මික හා වෙනත් අනතුරු වලක්වාගැනීම සඳහා ශ්‍රී ලාංකික සේවකයන් විසින් අනුගමනය කළ යුතු ආරක්ෂිත පියවර පිළිබඳ තොරතුරු බෙදා හැරීම.
v. වන්දි: සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී මියගිය ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් 11 දෙනෙක් සඳහා වන්දි ලබා දීමට පහසුකම් සපයන ලද අතර, එය කොරියානු වොන් (KRW) 374,675,774 (දළ වශයෙන් ශ්‍රී.ලං.රු. මිලියන 68) කි.

# අග්නිදිග ආසියා අංශය

## අග්නිදිග ආසියා අංශය

**ආවරණය කරන රටවල් සංඛ්‍යාව** - 11

බෘනායි දරුස්සලාම්, කාම්බෝජය, ඉන්දුනිසියාව, ලාඕසය, මැලේසියාව, මියන්මාරය, පිලිපීනය, සිංගප්පූරුව, තායිලන්තය, වියට්නාමය, ටිමෝර්ලෙසතෝ

**නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව** - රටවල් 07

ඉන්දුනීසියාව, මැලේසියාව, මියන්මාරය, පිලිපීනය, සිංගප්පූරුව ,තායිලන්තය, වියට්නාමය

**සමගාමී අක්තගැන්වීම්**

ඕස්ට්‍රේලියාව (කැන්බරා),සිංගප්පූරුව, බෘනායි ,දරුස්සලාම්, තායිලන්තය, කාම්බෝජය, ලාඕසය

**ආවරණය කරන බහු පාර්ශ්වීය/ කලාපිය සංවිධාන**

ආසියන් (ASEAN) අග්නිදිග ආසියානු කලාපීය රටවල සංගමයේ ආසියාන් කලාපීය සංසදය (ARF) ආසියාන් සමාජික රටවලට අදාළ ගැටලු

නැගෙනහිර ආසියානු හා පැසිපික් කලාප පිළිබඳ අංශය මගින් සිදුකෙරෙන ප්‍රමුඛ කාර්යයන් පහත පරිදි වර්ගීකරණයට ලක් කළ හැකිය.

i. අදාල භූගෝලීය කලාපය තුළ පිහිටි රටවල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සකස් කිරීම.
ii. ශ්‍රී ලංකා රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් අදාල කලාපයට අයත් රටවල සිටින ශ්‍රී ලාංකේය දූත මණ්ඩල දැනුවත් කිරීම සහ එම රටවලදී ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය හා ඔප් නැංවීමට අවශ්‍ය මඟපෙන්වීම් ලබාදීම.
iii. ආර්ථික මෙන්ම මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල සක්‍රීයව නියැළීමටත් එම රටවල වෙසෙන ශ්‍රී ලාංකේය ජනතාව වෙත සහය සැපයීමටත් අදාළ කලාපීය රටවල ශ්‍රී ලාංකේය දූත මණ්ඩල වෙත මඟපෙන්වීම.
iv. අදාළ රටවලින් ශ්‍රී ලංකාවේ සිදු කරන නිල සංචාර සහ ශ්‍රී ලංකාවෙන් අදාළ රටවලට සිදුකරන නිල සංචාර සංවිධානය කිරීම/අවශ්‍ය පහසුකම් සැපයීම.
v. අදාල භූගෝලීය කලාපය තුළ පිහිටි රටවල් සමග අත්සන් තබන ද්විපාර්ශ්වීය ගිවිසුම් /අවබෝධතා ගිවිසුම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
vi. ආසියාන් කලාපීය සංසදය (ARF) ට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
vii. අග්නිදිග ආසියානු රටවල් නියෝජනය කරමින් කොළඹ පිහිටා ඇති විදේශීය දූත මණ්ඩල සමඟ සමීප සුහද සම්බන්ධතා පවත්වාගෙන යාම.

**කලාපිය සහයෝගීතාවය**

ආසියාන් කලාපීය සංසදය (ARF)

ශ්‍රී ලංකාව යනු ආසියානු කලාපීය සංසදයේ 'සහභාගීත්ව' රටක් වන අතර ආසියන් සංවිධානය සමග ආංශික සංවාදී හවුල්කාරිත්වය ලබාගැනීමේ ක්‍රියාවලියේ නිරතව සිටින රටකි. ආසියන් කලාපීය සංසදයට අයත් පහත දැක්වෙන අවස්ථාවන්හිදී ශ්‍රී ලංකාව සිය සක්‍රීය සහභාගීත්වය ලබා දී තිබේ.

- 2019 අගෝස්තු 02 වන දින තායිලන්තයේදී පවත්වන්නට යෙදුණු ආසියාන් කලාපීය සංසදයට ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා සහභාගී වීම.
- 2019 අගෝස්තු 09 වෙනි දින දියත් කෙරුණු මහා මාර්ග ආරක්ෂාව පිළිබඳ නීති සම්පාදකයින් සඳහා වන ''ආසියාන් සහ WHO- SEAROZZ ජාලය සඳහා එවකට ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ හා මහජන බෙදාහැරීම් පිළිබඳ අමාත්‍යවරයාගේ සහභාගීත්වය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම හා එම ජාලයේ නියෝජ්‍ය සභාපති ධූරය සඳහා ඒකමතිකව තේරී පත්වීම.

ආසියාන්- අග්නිදිග ආසියානු රටවල සංගමය සහ එහි සාමාජික රටවල් සමග සිදුකරන ගනුදෙනු තවදුරටත් ශක්තිමත් කිරීම හරහා ආසියාන් හි ආංශික සංවාදී හවුල්කාරිත්ව මට්ටමට ළඟා වීමට අග්නිදිග ආසියානු අංශය වැඩකටයුතු සිදු කරමින් සිටී. 2018 වසරේ පළමු කාර්තුව තුළදී තායිලන්ත ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමක් ඇතිකර ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කෙරිණි. මැලේසියාව හා ඉන්දුනිසියාව ඇතුලු අනෙකුත් ආසියාන් සාමාජික රටවල් සමග නිදහස් වෙළඳ ගිවිසුම්වලට එළඹීම සම්බන්ධයෙන් වූ සාකච්ඡා ක්‍රියාවලීන් දැනටමත් සිදුකෙරෙමින් පවතී.

- මැයි මාසයේ ආරම්භ කිරීමට නියමිත තෙමාසික පුහුණු පාඨමාලාවක් වන විවිධ ගණයේ යුධ ගැටුම් පිළිබඳ පුහුණු පාඨමාලාව සඳහා සහභාගීවීමේ අවස්ථාව මියන්මාරයට සහ තායිලන්තයට ලබාදීමට ශ්‍රී ලංකා නාවික හමුදාව කටයුතු කර ඇති අතර විශේෂ පුහුණු පාඨමාලා ආසියාන් සාමාජක රටවල් වෙනුවෙන් පැවැත්වීමටද එකඟතාව පළකර තිබේ.
- මීට අමතර වශයෙන් ආරක්ෂක සහයෝගීතාව සඳහා වූ එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNODC) සමග එක්ව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ලබාදෙනු ලබන VBSS පාඨමාලා පැවැත්වීමේ අවස්ථාව තම රටවල් වෙත ලබා ගැනීමටද ආසියාන් සාමාජික රටවලට හැකියාව ඇත.
- රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සහ ලෝක තතු XXII පිළිබඳ 22 වැනි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ගාස්තුව ගෙවීමේ පදනම මත සහභාගීවීමේ අවස්ථා 10ක් ආසියාන් සාමාජික රටවල් වෙත ලබාදීමට බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික පුහුණුව පිළිබඳ ආයතනය (BIDTI) අපේක්ෂා කරයි.

i. ආසියාන් සාමාජික රටවල් සඳහා ලබාදෙන ජනාධිපති ශිෂ්‍යත්ව ක්‍රමය.
ආසියාන් සාමාජික රටවල් සඳහා 50% ශිෂ්‍යත්ව 25ක් ලබාදීමට නො. 16/1023/713/035 යන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කැබිනට් අමාත්‍යවරුන් විසින් අනුමැතිය ලබාදී තිබේ.

ii. ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශිෂ්‍යත්ව සඳහාවන ජාතික ආයතනය.
    - පාඨමාලා ගාස්තුව පමණක් ඇමරිකානු ඩොලර් 15000ක් වන තෙවසර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ගාස්තුව අඩු කිරීමේ ශිෂ්‍යත්ව ආසියාන් සාමාජික රටවල් වෙත ලබාදීමටද ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය (NIBM) කටයුතු කර තිබේ.
    - 30% සිට 50% දක්වා ගාස්තුව අඩු කිරීමේ හැකියාව පවතින විශේෂ ශිෂ්‍යත්ව ආසියාන් සාමාජික රටවල් වෙත ලබාදීමට ද මෙම ආයතනය කටයුතු කොට තබේ.

iii. ආසියාන් සාමාජික රටවල් වෙත ලබාදෙන තොරතුරු තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ (SLIIT) ශිෂ්‍යත්ව

සම්පූර්ණ ශිෂ්‍යත්ව 05ක් සහ අර්ධ ශිෂ්‍යත්ව 10ක් ආසියාන් රටවල් වෙත ලබාදීමේ හැකියාව පවතින බව තොරතුරු තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය නිවේදනය කර තිබේ .

i. ශ්‍රී ලංකා සමුද්‍රීය විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ශිෂ්‍යත්ව
ආසියාන් සාමාජික රටවල සිසුන් වෙත සන්නිවේදනය හා තොරතුරු තාක්ෂණය,තිරසර වෙරළ සහ සමුද්‍රීය පාරිසරික සංචාරක කර්මාන්තය, වෙරළ තීර කළමනාකරණය, සමුද්‍රීය ප්‍රවාහනය සහ ඊට අදාළ ක්ෂේත්‍ර පිළිබඳ ශිෂ්‍යත්ව පිරිනැමීමට ශ්‍රී ලංකා සමුද්‍රීය විශ්ව විද්‍යාලය සිය කැමැත්ත පළකර තිබේ. මේ පිළිබඳව ගත්කළ ලියාපදිංචිය ඉගැන්වීම සහ අනෙකුත් මූලික පහසුකම් නොමිලේ ලබා දීමට විශ්වවිද්‍යාලය සිය කැමැත්ත පළකර තිබේ.

**වියට්නාමය**

**ද්විපාර්ශ්වීය සබඳතා**

- වියට්නාමයේ පැවති එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙසක් සැමරුමට (මැයි 12-14) සහභාගී වූ හිටපු බුද්ධ ශාසන අමාත්‍ය ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා සහ ශ්‍රී ලාංකිකයින් 40 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත කණ්ඩායමට එම සංචාරය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

- දෙරට අතර ද්වීපාර්ශ්වීය සබඳතා පිළිබඳ සම්මුඛ සාකච්ඡාවක් සඳහා වියට්නාමයේ ''ද වොයිස් ඔෆ් වියට්නාම් ජර්නි'' චැනලය මගින් වියට්නාමයේ ශ්‍රී ලංකා තානාපති වෙත ආරාධනා කරනු ලැබීය.
- දෙරට අතර ආරක්ෂක සහයෝගීතාව ඉහළ නැංවීම වෙනුවෙන් වියට්නාමයේ මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශය මගින් කරනු ලැබූ ආරාධනාවකට අනුව වියට්නාමයේ සංචාරය කරන ලද (සැප්තැම්බර් 17) ශ්‍රී ලංකා පොලිසියේ නියෝජිත කණ්ඩායමට අවශ්‍ය පහසුකම් සැපයීම.
- 'වියට්නාමයේ සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය සඳහා බලපෑ හෝ වි මින් දායාද' මැයෙන් වියට්නාමයේ පැවති ජාත්‍යන්තර වැඩමුළුවට සහභාගීවීමට ශ්‍රී ලංකා තානාපතිවරයා නේ අන් පළාතේ සංචාරය කළ අතර (ඔක්තොම්බර් 28-29) දෙරට අතර පවතින දිගුකාලීන ද්වීපාර්ශ්වීය සබඳතා පිළිබඳව විශේෂයෙන් සඳහන් කරමින් එම වැඩමුළුව ආමන්ත්‍රණය කළේය.
- තානාපතිවරයා, වියට්නාම සමාජවාදී ජනරජයේ රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ජ්‍යෙෂ්ඨ ලුතිනන් ජනරාල් පැන් වැන් ගියෑං, වියට්නාම හමුදාවේ සාමාන්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානී, ගරු ආචාර්ය වූ චීන් තෑං, වියට්නාමයේ ආගමික කටයුතු සඳහා වන රාජ්‍ය කමිටුවේ සභාපති ගුයෙන් හු ටෑං මහතාද, විදේශ කටයුතු පිළිබඳ මධ්‍යම කොමිසමේ උප සභාපති ගරු ගුයෙන් කූක් ඩූං මහතා සහ වියට්නාමයේ විදේශ කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයා යන පිරිස හමු වී සාකච්ඡා කළේය.

**බහුපාර්ශ්වීය සබඳතා**

- ඉන්දියානු සහ නිරිතදිග ආසියානු අධ්‍යයන පිළිබඳ වියට්නාම ආයතනය විසින් (2019 ජූලි 15) දින සංවිධානය කරන ලද ''චීනයේ තීරයක් සහ මාවතක් පිළිබඳ මූලෝපායයන් සහ කලාපීය රටවල කාර්යභාරය'' මැයෙන් පැවති ජාත්‍යන්තර සමුළුවට සහභාගී වී අදහස් හුවමාරු කරගන්නා ලදී.
- වියට්නාමයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය හා වියට්නාමයේ යුරෝපා සංගම් නියෝජිත කණ්ඩායම එක්ව සංවිධානය කරන ලද Asi@connect වැඩසටහන දියත් කිරීමේ උළෙලට සහභාගී විය.

**ආර්ථික සබඳතා**

- ශ්‍රී ලංකාවත් වියට්නාමයත් අතර පවත්වාගෙන යන වෙළඳ කටයුතු සම්බන්ධයෙන් වන දෙවන උපකමිටු රැස්වීම ඔක්තොම්බර් 03-04 දිනවල හැනෝයි නිදී පැවැත්වුණු අතර තානාපතිවරයා සහ ශ්‍රී ලංකා නියෝජිත පිරිස ඊට සහභාගි වූහ.
- වියට්නාම වාණිජ මණ්ඩලය (VCCI) විසින් වියට්නාමයේ අනෙකුත් පළාත් වෙත සංවිධානය කරන ලද වෙළඳ ප්‍රවර්ධන සංචාර වාර 04ක් සඳහා සහභාගී වූ අතර වියට්නාමය සමග වෙළඳ ගනුදෙනු පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සතු අභිලාශය පැහැදිලි කරමින් සිය දායකත්වය ලබාදීමට TS (වාණිජ) කටයුතු කළේය.
- වියට්නාමයේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ (VCCI) මහලේකම් ගුයෙන් ක්වෑං වින් මහතා හමු වී දෙරට අතර පවතින වෙළඳ ආරෙයෝජන සහ සංචාරක සබඳතා තවදුරටත් කරන්නේ කෙසේද යන්න පිළිබඳව සාකච්ඡා කිරීමට තානාපතිවරයා වියට්නාමයේ සංචාරය කළේය.(නොවැ. 05)

**සංචාරක ප්‍රවර්ධනය**

- ශ්‍රී ලංකාවේ එම්පයර් තේ පුද්ගලික සමාගම විසින් හෝ චී මින් නගරයේ ආරම්භ කෙරුණු (ජනවාරි04) ''ටී ඇවනියු රිවර්සයිඩ්'' විවෘත කිරීමේ අවස්ථාව සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

- හැනෝයි හි මොසැයික් තාප්පයේ ශ්‍රී ලාංකික චිත්‍ර නිර්මාණයකරණය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම (ජනවාරි 22) දින සිදු කෙරිණි.
- සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමේ විවිධ ක්‍රියාකාරකම් සහ අවස්ථා සඳහා තානාපති කාර්යාලය සහභාගීත්වය ලබාදුන්නේය.
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය මගින් ලබාදුන් අනුග්‍රාහක දායකත්වය මත සංචාරයක් සඳහා ''වොයිස් ඔෆ් වියට්නාම් ජර්නි'' චැනලයේ නියෝජිතයින් 04 දෙනෙක් ශ්‍රී ලංකාවට පැමිණියහ. දෙපාර්ශ්වය අතර ඇතිකරගත් ගිවිසුමට අනුව 2019 සැප්තැම්බර් සහ ඔක්තොම්බර් මාසවල දී ඔවුන්ගේ වෙබ් අඩවි සහ සමාජ මාධ්‍යවල ඒ පිළිබඳ ලිපි පළකිරීමට ද ඔවුහු කටයුතු කළහ. (අගෝස්තු 12-16)
- ටුවර් බ්ලූ (Tour Blue) පෞද්ගලික සමාගම සහ ට්‍රොපිකල් ඒෂියා ටුවර්ස් පෞද්ගලික සමාගම යන සමාගම් දෙකේ නියෝජිතයින් දෙදෙනෙකුගේ සහයෝගය ඇතිව හැනෝයි හි ක්‍රියාත්මක සංචාර මෙහෙයවන්නන්ගේ ආයතන සමග හමුවක් සංවිධානය කෙරිණි. (සැප්තැම්බර් 10)
- වියට්නාමයේ ශ්‍රී ලාංකේය සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ''චැරිටි බසාර්'' සඳහා සහභාගී විය. (නොවැම්බර් 17)
- ඉදිරි වසරේ සිය ප්‍රචලිත සඟරාවේ ශ්‍රී ලංකාව පිළිබඳ ලිපියක් පළකිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට වන්ඩර් ලස්ට් ට්‍රිපිස් සඟරාවේ ප්‍රධාන කතෘ සමග හමුවක් පැවැත්වීම. (දෙසැම්බර් 05)
- 2019 වියට්නාම සංචාරක හා චාරිකා සමුළුවට සහභාගී වීම හා ශ්‍රී ලංකාවේ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කරුණු දැක්වීම (දෙසැම්බර්09).

**සංස්කෘතික සබඳතා**

- අදාළ කලාපයේ වෙසෙන ශ්‍රී ලාංකේය ප්‍රජාවගේ සහභාගීත්වය සහිතව තානාපති කාර්යාලය විසින් විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කරන ලදී.
- වියට්නාම සමාගම් මගින් සංවිධානය කරන ලද සංස්කෘතික ක්‍රියාකාරකම්වලට සහභාගී වීම.
- 2019 එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙසක් දින සැමරුමට සමගාමීව ටැබ් චුක් දාගැබ වෙත බුදු පිළිම පිරිනැමීමේ අවස්ථාවට අවශ්‍ය කටයුතු සම්පාදන කිරීම. (මැයි 15)
- HAUFO සහ වියට්නාමයේ අධ්‍යාපන කටයුතු සිදු කරන ශ්‍රී ලාංකේය සිසුන් විසින් සංවිධානය සිදු කරන ලද ''සාමය සඳහා වූ නගරයේ ගීතාවලිය'' සංස්කෘතික උළෙලට තානාපති කාර්යාලය සහභාගී වූ අතර සංස්කෘතිකාංග දෙකක් ඉදිරිපත් කළේය. (ඔක්තොම්බර් 26)
- හැනෝයි හි මොයි පුවත්පත සහ HAUFO එක්ව පස්වෙනි වරටත් සංවිධානය කළ ''හැනෝයි සාම මැරතන් තරගාවලිය'' ට තානාපති කාර්යාලය සහභාගී විය. (සැප්තැම්බර් 29)
- විට්නාමයේ අධ්‍යාපනය හදාරන ශ්‍රී ලාංකීය සිසුන් පිරිසක් වියට්නාමයේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කළ ජාත්‍යන්තර ආහාර උළෙලට සහභාගී වෙමින් සම්ප්‍රදායික ශ්‍රී ලාංකික නර්තනයක් ඉදිරිපත් කළහ. (දෙසැම්බර් 08)

**තායිලන්තය**

**ද්විපාර්ශ්වීය සබඳතා**

- තායිලන්තයේ 7 වෙනි රාම රජතුමාගේ රාජාභිෂේකය පැවති 2019 පෙබරවාරි මස ශ්‍රී මහා බෝධියේ පූජනීය බෝධි අංකුරයක් තායිලන්තය වෙත ප්‍රදානය කෙරිණි. ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතයෙකු ලෙස එම බෝධි අංකුරය රැගෙන ගිය බුද්ධ ශාසන අමාත්‍යවරයා තායිලන්ත අග්‍රාමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වීය සාකච්ඡා පැවැත්වූ අතර නිල උත්සව අවස්ථාවකදී එම බෝධි අංකුරය ආයුත්යා හි වඩා හිඳුවීමට සහසම්බන්ධ විය.
- තායිලන්ත සහ සමගාමී අත්තගැන්වීම් සිදු කරන ලද රටවල් 15ක ඉහළ පෙළේ නියෝජිතයින් සමග ද්වීපාර්ශ්වීය සාකච්ඡා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලදී.
- තායිලන්තය වෙත අමාත්‍ය මට්ටමේ සංචාර දෙකක් (ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සහ සංචාරක හා වනජීවී අමාත්‍යවරයා) සහ කම්බෝජය වෙත එක් රාජ්‍ය සංචාරයක් වශයෙන් 2019 වසරේ සංචාර සම්බන්ධීකරණය කිරීමට දූත මණ්ඩලය කටයුතු කළේය.

- කාම්බෝජය වෙත සිදුකළ රාජ්‍ය සංචාරය අතරතුරදී කාම්බෝජය හා ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වීය දේශපාලනික උපදේශනය සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමකට එළඹී අතර කොළඹ වාණිජ මණ්ඩලය සහ කාම්බෝජ වාණිජ මණ්ඩල විසින් අවබෝධතා ගිවිසුමකට ද අත්සන් තැබිණි.
- සෑම ප්‍රමුඛ ද්විපාර්ශ්වීය රැස්වීම් හා අවස්ථා සියල්ලෙන් අනතුරුව සාමාන්‍ය දේශපාලනික වාර්තා නිකුත් කිරීමේ ක්‍රියාවට අමතරව මාධ්‍ය නිවේදන ද නිකුත් කරන ලදී.
- තාක්ෂණික සහයෝගිතාව යටතේ තායි විශේෂඥයින් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරය කළ අතර වර්ෂාව නිපදවීමේ අත්හදා බැලීමක්ද සාර්ථක ලෙස සිදු කරන ලදී.

**බහුපාර්ශ්වීය සබඳතා**

- UNESCAP, ASEAN, ACD, ARF සහ ආපදා සඳහා සූදානම් වීමේ ආසියානු මධ්‍යස්ථානය (ADPC) යන සංවිධානවලට අදාළව පැවැත්වූ උත්සව අවස්ථා, රැස්වීම්, ක්‍රියාකාරකම් සහ සංසදවලට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ නියෝජිත කණ්ඩායම් 10කට අවශ්‍ය පහසුකම් සැපයීමට දූත මණ්ඩලය කටයුතු කළේය.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

- ද්විපාර්ශ්වීය ආර්ථික සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් තායිලන්ත ආයතන කිහිපයක ප්‍රධානීන් හා පැවැත්වූ හමු කිහිපයක් සඳහා අවශ්‍ය පහසුකම් සපයාදෙමින් ඉතා වැදගත් මට්ටමේ නියෝජිත පිරිස් 03ක තායිලන්ත සංචාර 03ක් සංවිධානය කරන ලද අතර APTA හි 54, 55 සහ 56 වැනි SCM සඳහා සහභාගිවීමට ශ්‍රී ලාංකේය නියෝජිත කණ්ඩායම් වෙත අවස්ථාව උදාකර දෙන ලදී. කොළඹ පැවති තෙවන SCMTRM සඳහා සහභාගී වූ තායි නියෝජිත පිරිසට අවශ්‍ය පහසුකම් ද සම්පූර්ණ කෙරිණි. ශ්‍රී ලංකාව හා තායි ආයතන අතර අත්සන් තැබුණු අවබෝධතා ගිවිසුම් සඳහා මෙන්ම PAT, TNSC, DEPA, INFOFISH, තායි ආයෝජනය මණ්ඩලය, GIT, SACICT සහ TCC හා BOD ඇතුලු පෞද්ගලික සමාගම් සමග සම්බන්ධ වෙමින් ශ්‍රී ලාංකේය වෙළඳ කටයුතු ප්‍රවර්ධනය කිරීමට ද ඒවායේ නියෝජිත කණ්ඩායම් හා සම්බන්ධීකරණයට ද අවශ්‍ය පහසුකම් සලසා දුනි.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, මැණික් හා ස්වර්ණාභරණ, ආහාරපාන යන ක්ෂේත්‍රවල වෙළඳාම ප්‍රවර්ධනය කිරීම උදෙසා පැවති2019 තායිලන්ත ඩිජිටල් ''බිග් බෑන්ග්'', 64 වැනි බැංකොක් මැණික් හා ස්වර්ණාභරණ සල්පිළ'' සහ 2019 තායිලන්ත ආහාර හා හෝටල් යන අවස්ථා සඳහා ශ්‍රී ලාංකේය නියෝජනයන් මෙන්ම සහභාගීත්වයන් සංවිධානය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට තායිලන්තයේ සිටින ශ්‍රී ලංකා දූත මණ්ඩලය ක්‍රියා කළේය. 2019 වසරේ ඇමරිකානු ඩොලර් මිලියන 97. 44ක් වශයෙන් තායිලන්තය වෙත ශ්‍රී ලංකාවෙන් සිදුකළ ඉහළම අපනයන ආදායම ලෙස එය වාර්තා වූ අතර ඇමරිකානු ඩොලර් මිලයන 437.94ක් වටිනා භාණ්ඩ ප්‍රමාණයක් ශ්‍රී ලංකාව වෙත එහිදී ආනයනය කෙරිණි.
- විවිධ උත්සව සහ රැස්වීම් අවස්ථාවලදී ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමේ ඉඩ ප්‍රස්ථා ප්‍රවර්ධනය කිරීමට මෙම දූත මණ්ඩලය කටයුතු කර ඇති අතර ප්‍රචලිත තායි සංවිධාන සහ තායි සමාගම් 04ක් සමග රැස්වීම් 05ක් පැවැත්වීමට ආයෝජන මණ්ඩල නියෝජිත පිරිසට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලදී. 2019 වසරේදී තායිලන්තයෙන් ශ්‍රී ලංකාව වෙත ලැබුණු සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන 2.754 කි.
- බැංකොක් හි පැවති TITF සහ Thai Fex වෙළඳ ප්‍රදර්ශන සඳහා සංචාරක අමාත්‍යවරයා සහ SLTPB නියෝජිත කණ්ඩායම සමග සංචාරක නියෝජිතයින් සහභාගීකරවමින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට මෙම දූත මණ්ඩලය කටයුතු කොට තිබේ. තායි චාරිකා නියෝජිතවරුන් සිදුකළ FAM චාරිකා දෙකක් සඳහා අවශ්‍ය කටයුතු සම්පාදන කිරීමද සිදුකොට තිබේ. SLTPB හි ඉල්ලීම මත ''SO SRI LANKA'' අත් පත්‍රිකාව සහ ''කුඩා බෞද්ධ භූමිය'' යන පොත් පිංචේ අන්තර්ගතය තායි භාෂාවට පරිවර්තනය කිරීමටද පියවර ගැණිනි. 2019 වසරේදී තායිලන්තයෙන් ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 9,861 කි.

**සංස්කෘතික සබඳතා සහ මහජන රාජ්‍යතාන්ත්‍රිකභාවය**

- ශ්‍රී ලංකාවේ නිදහස් දිනය, සිංහල හා හින්දු අලුත් අවුරුද්ද, වෙසක්, රාමසාන්, දීපාවලි සහ නත්තල් දින සැමරීම පිණිස විශේෂ උත්සව අවස්ථා 06ක් දූත මණ්ඩලය විසින් සංවිධානය කෙරිණි. බැංකොක් හි වෙසෙන සියලුම ශ්‍රී ලාංකීය සාමාජිකයින්ට සහ ශ්‍රී ලංකා හිතෛෂීන්ට මෙම අවස්ථා සඳහා ආරාධනා ලැබිණි.
- පාස්කු දින ප්‍රහාරයෙන් විපතට පත් ශ්‍රී ලාංකිකයින් සිහිකොට, අති උතුම් රෙඩීමර් දේවස්ථානයේදී පවත්වන ලද විශේෂ දේව මෙහෙයක්ද සමඟ විශේෂ අනුස්මරණ අවස්ථාවක් ශ්‍රී ලාංකේය ප්‍රජාව වෙනුවෙන් සංවිධානය කරන ලදී.
- තායිලන්ත ජාත්‍යන්තර කාන්තා සමාජය විසින් සංවිධානය කෙරුණු වාර්ෂික දිවා භෝජන සංග්‍රහයේදී ශ්‍රී ලාංකේය ආහාර වට්ටෝරු ඉදිරිපත් කිරීමට දායකත්වය ලබාදීම සහ තායි ජාත්‍යන්තර චාරිකා ප්‍රදර්ශනයට සමගාමීව සංවිධානය කෙරුණු ශ්‍රී ලාංකේය සංස්කෘතික ප්‍රදර්ශනය යන අවස්ථා දෙක සංවිධානය කරමින් ශ්‍රී ලාංකේය ආහාරපාන සහ සංස්කෘතය ප්‍රවර්ධනය කිරීමට මෙම දූත මණ්ඩලය ක්‍රියා කළේය.
- ශ්‍රී ලාංකීය මොස්තර නිරූපන ශිල්පිණී දර්ශි කීර්තිසේනගේ සහභාගීත්වය ඇතිව ශ්‍රී ලංකේය බතික් ඇඳුම් හා නිර්මාණ ප්‍රවර්ධනය කිරීමට 9 වැනි 'තායි සිල්ක් ෆැෂන් එක්ස්ට්‍රාවැගන්සා' නම් ඇඳුම් නිර්මාණ සල්පිලට සාර්ථකව දායකත්වය ලබා දීමට දූත මණ්ඩලයට හැකියාව ලැබිණි.
- රතු කුරුස රාජ්‍යතාන්ත්‍රික පුණ්‍ය කටයුතු වීදිය (Charity Bazzar) සහ YWCA රාජ්‍යතාන්ත්‍රික පුණ්‍ය කටයුතු වීදිය (Charity Bazzar) නමින් පැවති පුණ්‍ය කටයුතු ප්‍රවර්ධන අවස්ථා 02කට සහභාගීවෙමින් ශ්‍රී ලංකා තේ /කුරුඳු සහ උසස් තත්ත්වයේ වටිනා මැණික් හා ආභරණ ප්‍රවර්ධනය කිරීම දූත මණ්ඩලය මගින් සිදු කෙරිණි.

**සිංගප්පූරුව**

i. ඉහළ පෙළේ දේශපාලනික සංචාර ඇතුලුව දෙරට අතර ඇතිවුණු දේශපාලනික, ආර්ථික, වෙළඳ හා සංස්කෘතික සබඳතා

- හිටපු ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා සිංගප්පූරුවේ කරන ලද සංචාරය සම්බන්ධීකරණය කරන ලද්දේ සිංගප්පූරුවේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය මගිනි.
- මහකොමසාරිස් කාර්යාලය මඟින්, 2019 මාර්තු මාසයේදී සිංගප්පූරු සන්නිවේදන සහ තොරතුරු අමාත්‍ය සහ වෙළඳ සබඳතා භාරව කටයුතු කරන අමාත්‍ය ගරු ඊශ්වරන් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය සඳහා පහසුකම් සැපයීමඳ සිදු කෙරිණි.
- 2019 අගෝස්තු මස සිංගප්පූරුවේ පැවති මැදිහත්කරණය සහ ජාත්‍යන්තර අර්බුද නිරාකරණය පිළිබඳ ඉහළ පෙළේ සම්මන්ත්‍රණය සහ අත්සන් තැබීමේ උත්සවයට සහභාගිවීමට අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු තලතා අතුකෝරල මහත්මිය සහභාගී විය.
- දෙරට අතර ද්විපාර්ශ්වීය වශයෙන් වැදගත්වන විවිධ කාරණා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ කොමසාරිස්වරයා 2019 ජූලි මස සිංගප්පූරුවේ සන්නිවේදන හා තොරතුරු අමාත්‍ය මෙන්ම වෙළඳ සබඳතා ප්‍රධාන අමාත්‍ය ගරු එස්.ඊශ්වරන් මහතා හමු වූ අතර, 2019 සැප්තැම්බර් 13 දින සිංගප්පූරු විදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය විවියන් බාලක්‍රිෂ්ණන් මහතාද, 2019 ඔක්තෝම්බර් මස ජ්‍යෙෂ්ඨ රාජ්‍ය අමාත්‍ය සහ නීතිය පිළිබඳ අමාත්‍ය ගරු එඩ්වින් තොං මහතා ද හමුවිය.
- ශ්‍රී ලංකාවේ සිදු කෙරුණු පාස්කු දින ත්‍රස්ත ප්‍රහාරයෙන් අනතුරුව සිංගප්පූරු රජයේ සහයෝගය ශ්‍රී ලංකාව වෙත ලබාදෙන බවට ශ්‍රී ලංකාවේ අදාළ බලධාරීන් වෙත ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය සාකච්ඡා සිදු කිරීමට සිංගප්පූරුවේ අභ්‍යන්තර ආරක්ෂක දෙපාර්තමේන්තුවට අවශ්‍ය පහසුකම් සැපයීමට දූත මණ්ඩලය කටයුතු කළේය.

ii. සම්පාදනය කරන ලද වාර්තා හා ඇගයුම් සහ නියත මෙන්ම අනියත ප්‍රතිඵල සහිතව සිදු කරන ලද වැඩකටයුතු

- 2019 ජනවාරි මස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සිංගප්පූරුවේ සිදුකළ සංචාරයෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් වූ විස්තරාත්මක වාර්තාවක් දූත මණ්ඩලය විසින් අමාත්‍යාංශය වෙත එවන ලද අතර කොළඹ පිහිටි දූත මණ්ඩලයේ උපදෙස් අනුව ඒ පිළිබඳව පියවර ගන්නා ලදී.
- 2019 ජනවාරි මස සිදුකළ ඉහළ පෙළේ සාකච්ඡාවලින් අනතුරුව නිදහස් වෙළඳ ගිවිසුම සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ පසු විපරම් කටයුතු සිදු කිරීමට සහ ගිවිසුමට අදාළව පවතින ගැටලු සාකච්ඡා කිරීමේ අරමුණෙන් සිංගප්පූරුවේ වෙළඳ සබඳතා අමාත්‍ය ගරු එස්. ඊශ්වරන් මහතා ශ්‍රී ලංකාවේ සිදුකළ සංචාරය.
- ශ්‍රී ලාංකේය නිලධාරීන් වෙත වාර්ෂිකව කෙටි කාලීන හා දිගු කාලීන පුහුණු අවස්ථාවන් හිමිවන අතර ඒවා අධ්‍යාපන, නාගරික සැලසුම්කරණය සහ සංවර්ධනය, ප්‍රවාහනය, සිවිල් ගුවන් සේවා, වරාය කළමනාකරණය, ආපදා කළමනාකරණය සහ හදිසි තත්වයන්ට සූදානම්වීම, තිරසර සංවර්ධනය,වෙළඳාම සංචාරක ප්‍රවර්ධනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විවිධ ක්ෂේත්‍රවලට අදාළ වේ.

iii. දේශපාලනික, සමාජයීය සහ සංස්කෘතික අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීම සඳහා සංවිධාන පහසුකම් සපයන ලද අවස්ථා

- 2019 වෙසක් උත්සවය සැමරීම වෙනුවෙන් සිංගප්පූරුවේදි බුදුරජාණන් වහන්සේගේ පූජනීය කේෂධාතු ප්‍රදර්ශනයක් සඳහා පහසුකම් සැපයීමට දූත මණ්ඩලය පියවර ගත්තේය.
- සිංගප්පුරුවේ සිටින ශ්‍රී ලාංකීය ප්‍රජාවගෙන් සැදුම්ලත් විවිධ සංගම්/සංවිධානවල නම් වශයෙන් ගත්කළ ලංකා ක්‍රීඩා සමාජය, ලංකා සිංහ ක්‍රිකට් සමාජය, සිංගප්පුරු-ශ්‍රී ලංකා ව්‍යාපාර සංගමය, සිංගප්පූරු සිංහල සංගමය, ලංකා දමිළ ජනතාවගේ සංගමය, සිංගප්පුරු සිංහල බෞද්ධ සංගමය සහ ශ්‍රී සෙන්පාගා විනයාගර් කෝවිල යන ආයතනවල සහභාගිත්වය ඇතිව සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින්, පාස්කු ඉරු දින ශ්‍රී ලංකාවේ ඇති වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් විපතට පත්වූවන් සිහිපත්කර ඔවුන් වෙනුවෙන් යාඥා කිරීමේ අනුස්මරණ උත්සවයක් 2019 මැයි 04 වන දින සංවිධානය කළේය.
- සිංගප්පූරුවේ ''ලිට්ල් ඉන්දියා ෂොප්කීපර්ස් සහ හෙරිටේජ්'' සංගමය (LISHA)
  2019 සැප්තැම්බර් 07 වන දිනට යෙදුනු දිපාවලි උත්සවයේ 60 වන සැමරුම ආලෝක උත්සවයක් හා පෙරහැරක්ද සහිතව සංවිධානය කළ දින සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහා කොමසාරිස් කාර්යාලය ප්‍රථම වරට එම සංගමයට සම්බන්ධ විය. මෙම උත්සව අවස්ථාවට ශ්‍රී ලංකාවේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරමින් ශිල්පීන් 22 දෙදනකුන්ගෙන් යුත් නර්ථන කණ්ඩායමක් සහභාගී විය.

iv. විදේශ රටවලදී සහ ජාත්‍යන්තර සංවිධාන සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ උත්සව සහ සංසද

- ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති ප්‍රමුඛ ඉහළ පෙළේ නියෝජිත කණ්ඩායමක් 2019 ජනවාරි 23 -25 දිනවල පැවති එක්සත් ජාතීන්ගේ පරිසර අමාත්‍ය සංසදයේ තුන්වන සැසිවාරයට සහ ආසියා පැසිපික් කලාපයේ පරිසර බලධාරීන්ගේ හමුවට සහභාගී වූ අතර දූත මණ්ඩලය එම අවස්ථාවට සහභාගී වෙමින් අදාළ නියෝජිත කණ්ඩායමට අවශ්‍ය පහසුකම් ද සම්පාදනය කළේය.
- දූත මණ්ඩලය විසින් 2019 මැයි මස පැවති ආසියා-පැසිපික් සමුද්‍රීය ආරක්ෂක ප්‍රදර්ශනයට (IMDEX Asia 2019) සහභාගී වූ ශ්‍රී ලංකා නාවික හමුදා කණ්ඩායමට අවශ්‍ය පහසුකම් සලසා දුණි.

- 2019 මැයි 31 සිට ජුනි 02 දින දක්වා සිංගප්පුරුවේ දී පවත්වන්නට යෙදුණු IISS ASIA ආරක්ෂක සමුළුව : ෂැංග්‍රිලා සංවාදය 2019 සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගිවූවන්ට අවශ්‍ය පහසුකම් සැපයීමට මූලෝපායික අධ්‍යයන සඳහා වන ජාත්‍යන්තර ආයතනය හා දූත මණ්ඩලය එක්ව කටයුතු කළහ. මෙම සංසදයට සමගාමීව ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම සඳහා ද්විපාර්ශ්වීය හමු කිහිපයක් ද සැලසුම් කෙරිණි.

v. වෙළඳ, විදේශීය ආයෝජන සහ සංචාරක කටයුතු

- සමාගම් 26කින් සමන්විත ශ්‍රී ලංකා සිංගප්පූරු ව්‍යාපාර කවුන්සිල (SLSBC) නියෝජිත කණ්ඩායම අගෝස්තු 21 සිට 23 දක්වා දිනවල සිංගප්පූරුවේ සංචාරය කළේය. එම ව්‍යාපාර කවුන්සිලය සහ සිංගප්පූරුවේ අදාළ සමාගම් සමඟ පවත්වන ලද වැඩසටහන මහ කොමසාරිස් කාර්යාලය මඟින් සම්බන්ධීකරණය කෙරිණි.
- සිංගප්පූරුවේ ඉන්දිය වාණිජ හා කර්මාන්ත මණ්ඩල සාමාජිකයින් සමඟ ජාලගත කිරීමේ සැසියක් පැවැත්විණි. එම වාණිජ හා කර්මාන්ත මණ්ඩලයත් ශ්‍රී ලංකා සිංගප්පූරු ව්‍යාපාර කවුන්සිලයත් අතර සබඳතා ශක්තිමත් කිරීමට දෙපාර්ශවය අතර 2019 දී අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබිණි.
- ශ්‍රී ලාංකේය ජාතික සන්නාමයන් වන ලංකා තේ, ලංකා කුළු බඩු, මැණික් හා ස්වර්ණාභරණ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ බෝට්ටු හා නැව් ආදිය ප්‍රවර්ධනය කිරීමට ප්‍රමුඛ පෙළේ වෙළඳ සල්පිල්වලදී ශ්‍රී ලංකා මැදිරියක් හා වෙළඳ සල්පිල්වලදී ශ්‍රී ලංකා මැදිරියක් හා වෙළඳ ප්‍රවර්ධන කුටි සංවිධානය කිරීම.
- 2019 පෙබරවාරි 13 සිට 15 දක්වා මැන්ඩරින් ඕරිර්ඩිහිදී පවත්වන ලද ශ්‍රී ලාංකේය ආහාරපාන උළෙල.
- 2019 නොවැම්බර් 11 සිට 15 දක්වා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය පිළිබඳ වැඩසටහන යටතේ පැවති ෆින්ටෙක් ෆෙස්ටිවල් (SFF) හිදී මහකොමසාරිස් කාර්යාලය මඟින් ශ්‍රී ලාංකේය මැදිරිය සංවිධානය කෙරිණ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතන සහ ෆින්ටෙක් සමාගම් 12ක් මෙම සමුළුවට හා වෙළඳ සල්පිලට සහභාගී වූහ. නියෝජිත පිරිස සහ ප්‍රමුඛ පෙළේ කර්මාන්ත නියෝජනය කරන පිරිස වෙනුවෙන් මහ කොමසාරිස්වරයා විසින් ඉහළ පිළිගැනීමේ උළෙලක් සංවිධානය කොට තිබිණි. සිංගප්පූරු ෆින්ටෙක් සංගම් මඟින් සංවිධානය කෙරුණු ජාලගත කිරීමේ හා වෙනත් සමාන්තරගත සංසදවලට සහභාගිවීමේ අවස්ථාවද නියෝජිත පිරිස වෙත ලබාදෙන ලදී.

**සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා පවත්වන ලද සංසද සහ දැනුවත් කිරීමේ වැඩසටහන්.**

- 2019 මැයි 21 දින සිංගප්පූරුවේදී පැවැත්වූ ආයෝජන සංසදය - ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සමාගම් සමඟ පවත්වන ලද සැසි සමඟ ''ඉන්වෙස්ට් ශ්‍රී ලංකා සංසදය'' සිංගප්පූරුවේදි පැවැත්වීමට කොළඹ කොටස් හුවමාරුව සමඟ මහකොමසාරිස් කාර්යාලය මඟින් පියවර ගන්නා ලදී. මෙම සංසදයට මුදල් පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු එරාන් වික්‍රමරත්න සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි යන අය සහභාගි වූහ.
- පාස්කු ප්‍රහාරයෙන් පසු ආයෝජක විශ්වසනීයත්වය යළි ළඟාකර ගැනීමට ශ්‍රී ලංකාව විසින් කුමක් කළ යුත්තේද?''යන්න සඳහන් කරමින් චැනල් නිව්ස් ඒෂියා සමඟ විශේෂ සම්මුඛ සාකච්ඡාවක් සමඟ මාධ්‍ය ආවරණයට සැලසුම් කිරීම දූත මණ්ඩලය මඟින් සිදු කෙරිණි.

**සංචාරක ප්‍රවර්ධනය**

- මේ සඳහා චාරිකා සල්පිල්, ගමනාන්ත ප්‍රවර්ධනය කිරීම්, MICE ප්‍රවර්ධනය සහ FAM චාරිකා සංවිධානය කෙරිණ.

- 2019 පෙබරවාරි 22-24 දක්වා NATAS චාරිකා සල්පිලට සහභාගීවීම. මෙම සල්පිළ, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය මඟින් අයිටිකන් ස්පෙන්ස් , එස්නා හොලිඩේස් ක්ලබ් වස්කඩුව බීච් රිසෝට් සහ ස්පා, මඩුකැලේ හොටෙල්ස් සහ ලොජස් පුද්. සමාගම, දේවා රෙසිඩන්සි සහ බෝලිස් කළමිඹු යන ශ්‍රී ලංකා සමාගම් හය සමඟ ඒක්ව සංවිධානය කරන ලදී.
- 2019 සැප්තැම්බර් 09 සිට 13 දක්වා ජනමාධ්‍යවේදීන් ද ඇතුළුව MICE පිටපළාත් චාරිකා නියෝජිතායතන 06 ක් සමඟ MICE ප්‍රවර්ධනය කිරීමේ FAM චාරිකා සංවිධානය කෙරිණි.
- ''ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම ආරක්ෂිතයි'' යන ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් TTG Asia '', බියොන්ඩ් එස්කේප්ස්, ට්‍රැවල් වොයිස්, ට්‍රැවල් වයර් නිව්ස් යන ඩිජිටල් මාධ්‍යවල ලිපි පළ කෙරිණි

**විදෙස් රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමට සහ පහසුකම් සැපයීමට සංවිධානය කරන ලද ක්‍රියාකාරකම්**

ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් රැකියා අවස්ථා 3000 ක් ලබා ගැනීමේ අරමුණෙන් සිංගප්පූරුවේ රැකියා නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය කිරීම දූත මණ්ඩලය මඟින් ඉටුකෙරිණි. කම්කරු අංශයට 2019 වසරේදී රැකියා ඇනවුම් 64ක් ලබා ගත හැකි විය.

**ඉන්දුනීසියාව**

**ද්විපාර්ශ්වීය සබඳතා**

මැතිවරණ කොමිසම් අතර සහයෝගිතාව ඇතිකරගැනීම අරමුණු කර ගනිමින් ඉන්දුනීසියානු ජනරජයේ මහ මැතිවරණ කොමිෂන් සභාවේ ආරාධනයකට අනුව ශ්‍රී ලංකා මැතිවරණ කොමිසමේ සභාපති මහින්ද දේශප්‍රිය, එහි සම්බන්ධීකරණ ලේකම් ආර්.එම්.ඒ හමීඩ් සහ තානාපති දර්ශන එම් පෙරේරා යන මහත්වරු 2019 අප්‍රියෙල් 15-18 දිනවල පැවති ඉන්දුනිසියානු මැතිවරණය අතරතුර එය නිරීක්ෂණය කිරීමේ වැඩසටහනක් සඳහා සහභාගී වූහ.

ශ්‍රී ලංකාව හා ඉන්දුනිසියාව අතර අත්සන් තැබුනු මත්ද්‍රව්‍ය, මත්කුඩු සහ මනෝ ව්‍යාධික ද්‍රව්‍ය සහ ඒවාගේ රසායනික මූල ද්‍රවයයන් නීති විරෝධී ලෙස ප්‍රවාහනය වැළැක්වීම සඳහා වූ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම යටතේ ඉන්දුනිසියානු ජාතික මත්ද්‍රව්‍ය මණ්ඩලය මඟින් සංවිධානය කරන ලදුව පෙබරවාරි 25 සිට මාර්තු 05 දක්වා බෝගෝර් හි පැවති ඒකාබද්ධ තහනම් කිරීම පිළිබඳ තාක්ෂණික පුහුණුවට ශ්‍රී ලංකාවේ විශේෂ කාර්යය සාධක බලකාය සහ පොලිසිය නියෝජනය කරමින් තිදෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගී විය.

**බහුපාර්ශ්වීය සබඳතා**

- ඉන්දුනීසියාවේ බාලි හිදී 2019 දෙසැම්බර් 05 - 06 දින වල පැවති 12 වෙනි බාලි ප්‍රජාතාන්ත්‍රික සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් තානාපතිවරයා සහභාගි වූවේය.
- ඉන්දුනිසියාවේ මැනාඩෝහි 2019 ඔක්තොම්බර් 31 සිට නොවැම්බර් 01 දින දක්වා පැවති කොදෙව් සහ දුපත් සමූහයන්ගෙන් සුසැදී රාජ්‍යයන්ගේ (AIS) අමාත්‍ය හමුවේ 02 වැනි රැස්වීම සහ එයට පූර්වගාමිව පැවැත්වෙන ජ්‍යෙෂ්ඨ නිලධාරි හමුවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් තානාපතිවරයා සහභාගිවුවේය.
- විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් 2019 සැප්තැම්බර් 10 දින පවත්වන ලද ඩිජිටල් රාජතාන්ත්‍රිකභාවය පිළිබඳ කලාපීය සම්මන්ත්‍රණයට මෙන්ම ආසියාන් ලේකම් කාර්යාලය මගින් 2019 අගෝස්තු 22 දින පවත්වන්නට යෙදුණු කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ කලාපීය ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් තානාපතිවරයා සහභාගී වූයේය.
- 2019 සැප්තැම්බර් 26 දින පැවැති 03 වෙනි ජකර්තා භූ දේශපාලනික සංසදයට තානාපතිවරයා හා දූත මණ්ඩලයේ උපදේශන (ආරක්ෂක) අමත්‍යවරයා සහභාගි වූහ.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

- තානාපති කාර්යාලය මගින් සංවිධානය කෙරුණු ASTINDO 2019 සංචාරක සල්පිළ 2019 පෙබරවාරි 22 - 24 දින වල පැවති අතර ශ්‍රී ලංකික සමාගම් බොහෝමයකට එහි ශ්‍රී ලාංකිය මැදිරියේදි තම ප්‍රවර්ධන කටයුතු සිදුකිරීමේ අවස්ථාව හිමිවිය.
- ඉන්දුනීසියානු ප්‍රචලිත සංචාරක නියෝජිතයින් කණ්ඩායමක් සඳහා තායි ජාත්‍යන්තර ගුවන් සමාගම හරහා ලැබුනු අනුග්‍රහය මත ජූලි 31 සිට අගොස්තු 03 දින දක්වා ශ්‍රී ලංකාවේ FAM සංචාරක අවස්ථාවක් සංවිධානය කෙරිණි.
- සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ඉන්දුනීසියාවේ ප්‍රවර්ධනය කිරීමට බහාසා ඉන්දුනීසියාහි සමාජ මාධ්‍ය උපයෝගි කරගනිමින් 2019 අගොස්තු මස සිට මාධ්‍ය වැඩපිළිවෙලක් දූත මණ්ඩලය විසින් ආරම්භ කෙරිණි.
- 2019 නොවැම්බර් 11 සිට 14 දක්වා පැවති ජාත්‍යන්තර කාන්තා සමාජයේ සමාජ සේවා විදිය සඳහා දූත මණ්ඩලය සහභාගී වූවේය.

**සංස්කෘතික සබඳතා**

- ඉන්දුනීසියාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2019 සැප්තැම්බර් 21 දින සංවිධානය කෙරුණු 3 වෙනි සාම පාපන්දු ජාත්‍යන්තර තරඟාවලියට සහභාගී වූ ශ්‍රී ලාංකේය පාපන්දු කණ්ඩායමට මෙන්ම ඊට සහභාගී වූ ශ්‍රී ලාංකික නරඹන්නන් වෙනුවෙන් අවශ්‍ය පහසුකම් දූත මණ්ඩලය විසින් සපයාදෙන ලදී.
- 'චමත්කාර ශ්‍රී ලංකා' නමින් නම් කරන ලද ඡායාරූප ප්‍රදර්ශනයක් ජකර්තාහි ජාතික පුස්තකාලයේදී සංවිධානය කෙරුණු අතර ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන්හි චමත්කාරය මෙන්ම ස්වාභාවික සුන්දරත්වය විදහා දක්වන ඡායාරූප එම ප්‍රදර්ශනයට අන්තර්ගතකර තිබිණි. ශ්‍රී ලාංකේය සංස්කෘතියට අදාළ විවිධ පැතිකඩයන් පිලිබඳව අවධානය යොමුකරමින් ඉන්දුනීසියානු විශ්වවිද්‍යාල සිසුන් සඳහා පවත්වන ලද ඉවුම් පිහුම් පෙරහුරු වැඩසටහන් ද ඇතුළත් මහජන රාජතාන්ත්‍රික වැඩසටහන් මාසිකව සංවිධානය කිරීම දූත මණ්ඩලය විසින් සිදු කරන ලදී.

**ආරක්ෂක සහයෝගිතාව**

එමඟින් අත්කරගත් ප්‍රතිඵල පහත පරිදි වේ.

> ඉන්දුනීසියානු බලධාරීන්, ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා වූ ජාතික නියෝජිතායතනය (BNPT) සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශයේ ජාතික බුද්ධි අංශ ප්‍රධානී යන අංශවල දායකත්වයද සමග ත්‍රස්තවාදය පිටුදැකීමේ 4 වෙනි ඒකාබද්ධ ක්‍රියාකාරී හමුව ශ්‍රී ලංකාවේ පැවැත්වීමට කටයුතු සැලසුම් කිරීම.

ශ්‍රී ලාංකේය හමුදා නිලධාරීන් වෙනුවෙන් ඉන්දුනීසියාවේ පුහුණු ඉඩප්‍රස්ථා ලබා දීම.

i. ඉන්දුනිසියාවේ LEMHANAS හි 2019/2020 සාමාන්‍ය අධ්‍යාපන වැඩසටහනේ 60 වෙනි සහ 61 වෙනි කණ්ඩායම්වලට ඇතුළත් වී පුහුණුවීමේ අවස්ථා 02ක් හමුදා නිලධාරීන් වෙත ලබාගන්නා ලදී.
ii. ඉන්දුනීසියාව සහ ශ්‍රී ලංකාව අතර පැවති අන්‍යෝන්‍ය සහයෝගීතාව යටතේ ශ්‍රී ලංකා පොලිස් හා විශේෂ කාර්ය සාධක බලකා නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා ඉන්දුනිසියානු ජාතික මත්ද්‍රව්‍ය මණ්ඩල (BNN) පුහුණු මධ්‍යස්ථානයේ ඒකාබද්ධ මත්ද්‍රව්‍ය තහනම්කිරීම පිළිබඳ තාක්ෂණික පුහුණුව ලබාගැනීමේ වැඩපිළිවෙලක් සකස් කෙරිණි.
iii. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2019 උපාධි වැඩසටහන සඳහා TNI හි කැඩෙට් නිලධාරීන් වෙත ශිෂ්‍යත්ව 02ක් පිරිනැමිණි.

**මියන්මාරය**

**ද්විපාර්ශ්වීය සබඳතා**

- ශ්‍රී ලංකාව හා මියන්මාරය අතර ද්විපාර්ශ්වීය සහයෝගීතාවය සම්බන්ධයෙන් වූ 3 වැනි සැසිය 2019 අප්‍රියෙල් 11 වැනි දින මියන්මාර ජනරජයේ නේ පි තෝ හි පිහිටි විදේශ කටයුතු අමාත්‍යාංශයේදී පැවැත්විණි.
- මියන්මාර ආණ්ඩුවේ පහත දැක්වෙන අමාත්‍යවරුන් සමග 2019 අගෝස්තු 08 වැනි දින නේ පී තෝ හිදී තානාපතිවරයා පැවැත්වූ රැස්වීම් සම්බන්ධීකරණය කිරීම දූත මණ්ඩලය සිදු කළේය.
- මියන්මාර පාර්ලිමේන්තුවේ කථානායක ගරු මාන් චින් කායින් තාන්
- මියන්මාර රජයේ සමාජ සුභසාධන සහන සහ නැවත පදිංචි කිරීම පිළිබඳ අමාත්‍ය ගරු ආචාර්ය වීන් මාත් ආයි සහ මියන්මාර රජයේ ආගමික කටයුතු සහ සංස්කෘතිය පිළිබඳ අමාත්‍ය ගරු තුරා යූ ආන්.
- මෙසේ පැවති සාකච්ඡා ප්‍රධාන වශයෙන් දෙරට අතර පාර්ලිමේන්තු සහයෝගීතාව හා ආගමික, සංස්කෘතික සබඳතා ශක්තිමත් කිරීම සහ සමාජ සුභසාධන සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම යන කාරණා ඔස්සේ සිදු කෙරිණි.
- ඒකාබද්ධ කොමිසම හමුවේ දී සාකච්ඡා කළ කාරණාවන්හි ප්‍රතිඵල ලෙස පහත දැක්වෙන ඉලක්ක සපුරා ගන්නා ලදි.
    - කෘෂිකාර්මික වන වගාව වැඩි දියුණු කිරීමේ අරමුණෙන් 2019 දෙසැම්බර් 12 වෙනි දින මියන්මාර රජය විසින් ජාන නාක්ෂණය ඔස්සේ වැඩි දියුණු කළ තේක්ක ඇට 15000ක් මියන්මාර නේ පී තෝ හි ජාතික සම්පත් හා පරිසර සංරක්ෂණ අමාත්‍යාංශයේදී ප්‍රදානය කරන ලදී.
    - පූජනීය ස්වේදගොන් විහාරය වෙතින් ශ්‍රී ලංකා රජය වෙත අඩි පහක උසකින් යුතු කිරිගරුඩ බුද්ධ ප්‍රතිමාවක් ප්‍රදානය කෙරිණි.
    - 2019 සැප්තැම්බර් 01 දින සිට 04 දින දක්වා ශ්‍රී ලංකාවේ සිට මියන්මාරය වෙත යාත්‍රා කළ ශ්‍රී ලාංකේය නාවුක හමුදාවට අයත් 'සයුර' සහ 'නන්දිමිත්‍ර' යන නැව් සහ 320කින් යුතු ඒවායේ කාර්යය මණ්ඩලය කළ සංචාරය දූත මණ්ඩලය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

**ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

- මියන්මාර් ආණ්ඩුවේ කෘෂිකර්ම, පශු සම්පත් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ සංවිධානයෙන් 2019 ජූලි මස 11 වෙනි දින 12 දක්වා කෘෂිකර්මය පිළිබඳ පළමු බිම්ස්ටෙක් අමාත්‍ය හමුව (1st BAMM & සහ කෘෂිකර්මය පිළිබඳ පළමු බිම්ස්ටෙක් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හමුව (1st SOM-A) නේ පී තෝ හිදී පැවැත්විණි. ''සමෘද්ධිය, තිරසර සංවර්ධනය සඳහා ගොවිතැන'' සහ ''ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය පිළිබඳ අවධානය යළිත් ගොඩනැගීම'' යන තේමාව යටතේ මෙම හමුව පැවති අතර තානාපතිවරයා සහ දූත මණ්ඩලයේ පළමු ලේකම්වරයා ඉහත අවස්ථා දෙකේදීම ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඊට සහභාගී වූහ.
- මෙම හමුවේදී, සාමාජික රටවල් විසින් එකිනෙකා අතර සහයෝගීතාවයෙන් යුක්තව කටයුතු කොට ආහාර හා පෝෂණය සුරක්ෂිත කිරීමට, ගොවීන්ගේ සමෘද්ධිය තහවුරු කිරීමට, රැකියා උත්පාදනය, දිළිඳුකම පිටුදැකීම, සහ ඔවුන් අතර කෘෂිකාර්මික වෙළඳ කටයුතු සහ ආයෝජන ප්‍රවර්ධනය සඳහා තම තමන්ගේ දායකත්වය ලබාදීමට බිම්ස්ටෙක් (BIMSTEC) රාජ්‍ය සිය එකඟතාව පළ කළහ.
- ශ්‍රී ලංකේය සාම්ප්‍රදායික ආහාරපාන ප්‍රචලිත කිරීම හරහා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතුව 'ශ්‍රී ලංකේය රසය' නමින් ආහාරපාන ප්‍රවර්ධන වැඩසටහනක් යැන්ගොන්හි පාක් රෝයල් හෝටලයේදී 2019 නොවැම්බර් මස 24 දින සංවිධානය කිරීම දූත මණ්ඩලය මඟින් සිදු කෙරිණි. මෙම අවස්ථාවට මියන්මාරයේ සිටින රාජ තාන්ත්‍රික නියෝජිත කණ්ඩායම්, මියන්මාරයේ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයින්, එහි සිටින ශ්‍රී ලාංකික ප්‍රජාවගෙන් කිහිපදෙනෙක් සහ තානාපති කාර්යාලයේ කාර්යය මණ්ඩලය සහභාගී වූහ.

- තවද, මෙම අවස්ථාව ආසියාන් සංවිධානයේ ආංශික සංවාදි හවුල්කාරිත්වය ලබා ගැනීමට ශ්‍රී ලංකාව කරන ලද ඉල්ලීම පිළිබඳව එහි සාමාජික රටවල දූත මණ්ඩල ප්‍රධානීන් වෙත සිහිපත් කිරීමට ඉතා යෝග්‍ය අවස්ථාවක් විය.
- දෙරට අතර අන්‍යොන්‍ය සුභ සිද්ධිය උදෙසා මියන්මාරය තුළ තිබෙන නව ව්‍යාපාර ඉඩ ප්‍රස්ථා පිළිබඳ සොයා බැලීම සඳහා 2019 නොවැම්බර් 26,30 දිනවල එහි සංචාරය කළ ශ්‍රී ලාංකික තරුණ ව්‍යවසායකයින්ගේ වාණිජ මණ්ඩලයට අවශ්‍ය සම්බන්ධීකරණය කටයුතු ධූත මණ්ඩලය විසින් සිදු කරන ලදී.
- 2019 ජනවාරි 28-29 දිනවල නේ පී තෝ හිදී මියන්මාර ආයෝජන කොමිසම (MIC) ආයෝජන අධ්‍යක්ෂ මණ්ඩලය හා සමාගම් පරිපාලනය (DICA) සහ වාණිජ හා කර්මාන්ත මණ්ඩල මියන්මාර ෆෙඩරේෂනය (UMFCCI) විසින් සාමූහිකව සංවිධානය කෙරුණු මියන්මාර ආයෝජන සමුළුව - 2019 සඳහා දූත මණ්ඩලය සිය සහභාගීත්වය ලබා දුන්නේය. ජාත්‍යන්තර මෙන්ම දේශීය ආයෝජකයන්ගේ ව්‍යාපාර ප්‍රජාව වෙත මියන්මාරය තුළ ව්‍යාපාරික ඉඩ ප්‍රස්ථා නිර්මාණය කර ගැනීමට සුදුසු ප්‍රවේශයක් ලබා දීම මෙම හමුවේ මුඛ්‍ය පරමාර්ථය විය.

**සංස්කෘතික සබඳතා**

- දූත මණ්ඩලය විසින් මියන්මාරයේ සිට සහ මියන්මාරය වෙත විවිධ පුද්ගලයින් සිදු කළ සංස්කෘතික/ආගමික සංචාර කිහිපයක් සම්බන්ධීකරණය කරන ලදී.
- 2019 පෙබරවාරි 04 වැන දින යැන්ගොන්හි WYNDHAM GRAND හෝටලයේදී සමරනු ලැබූ ශ්‍රී ලංකාවේ 71 වැනි නිදහස් දින සැමරුමට සමගාමීව, සබරගමුව පළාත් අධ්‍යාපන ආයතනයේ වෘත්තිය නර්තන කණ්ඩායමේ සහභාගීත්වය ඇතුව සංස්කෘතික උළෙලක් සංවිධානය කෙරිණි.
- යැන්ගොන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මියන්මාරයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව හා එක්ව 2019 ජූනි මස 16 වැනි දිනට යෙදුණු පොසොන් මංගල්‍ය වෙනුවෙන් විශේෂ පුණ්‍ය කටයුත්තක් සංවිධානය කරමින් මියන්මාරයෙ හ්ලැං තයාර නගරයේ පවුල් 500 ක ජනතාව වෙත වියළි ආහාර බෙදා දීමට පියවර ගත්තේය.

**පිලිපීනය**

**ද්විපාර්ශ්වීය සබඳතා**

- සංචාරක, වෙළඳ, කෘෂිකාර්මික හා සංස්කෘතික ආදි විවිධ ක්ෂේත්‍රවල සහයෝගීතාව ගොඩනගානැගීමේ හැකියාව පිළිබඳ පසුගිය වසර තුළ තානාපති කාර්යාලයේ ප්‍රධාන අවධානය යොමුව තිබිණි.
- හිටපු ජනාධිපතිවරයාගේ රාජ්‍ය සංචාරය අතරතුර දෙරට අතර අවබෝධතා ගිවිසුම් (05) පහක් අත්සන් තබන ලද අතර ඒවා හැකි ඉක්මනින් ක්‍රියාත්මක කිරීම සඳහා ගතයුතු අභ්‍යන්තර ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීමට අවශ්‍ය පසු විපරම් කටයුතු ඉටු කිරීමට තානාපති කාර්යාලය පියවර ගත්තේය.
- පිලිපීනයේ ජාතික ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශය එළඹී අවබෝධතා ගිවිසුම
- පිලිපීනය සහ ශ්‍රී ලංකාව අතර කෘෂිකාර්මික, ධීවර සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල සහයෝගීතාවය ඇතිකර ගැනීම පිළිබඳ අවබෝධතා ගිවිසුම
- පිලිපීනයේ උසස් අධ්‍යාපන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය අතර ශාස්ත්‍රීය සහයෝගීතාවය ඇතිකර ගැනීම පිළිබඳ අවබෝධතා ගිවිසුම
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශයත් පිලිපීන ජනරජයේ සංචාරක කටයුතු දෙපාර්තමේන්තුවත් අතර අත්සන් තැබුණු අවබෝධතා ගිවිසුම

- කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සඳහා වූ ශ්‍රී ලංකා කවුන්සිලය (SLCARP) සහ පිලිපීනයේ ලොස් බානොස් විශ්වවිද්‍යාලය අතර අත්සන් තැබුණු අවබෝධතා ගිවිසුම මඟින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කෘෂිකාර්මික පර්යේෂණ ආයතන අතර සබඳතා ප්‍රවර්ධනය කිරීම සහ කෘෂිකාර්මික විද්‍යාඥයින් සඳහා පශ්චාත් උපාධි පුහුණු පාඨමාලා හැදෑරීමේ ඉඩ ප්‍රස්ථා නිර්මාණය කිරීම අරමුණු විය.
- පිලිපීනයේ විදේශ කටයුතු දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ කවුන්සිලය මඟින් 2019 දෙසැම්බර් මස 01 දින සිට 07 දින දක්වා වූ සතියක කාලය තුළ පුහුණු අවශ්‍යතා පිළිබඳ ඇගයීමක් සිදු කිරීමට ඉහළ පෙළේ නියෝජිතයින්ගේ සංචාරයක් සංවිධානය කෙරිණි.

**ද්විපාර්ශ්වීය සබඳතා**

**වෙළඳ**

වෙළඳ හා ආයෝජන ක්ෂේත්‍රයේ නව ව්‍යාපාර අවස්ථා නිර්මාණය කිරීමේ අරමුණෙන් තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකා - පිලිපීන ව්‍යාපාර කවුන්සිලය (SLPBC) සහ පිලිපීන වාණිජ මණ්ඩලය අතර ව්‍යාපාර ජාලගතකිරීමේ සැසියක් 2020 ඔක්තොම්බර් මස 21 දින සංවිධානය කරන ලදී. සාමාජිකයින් 15 දෙනෙකුගෙන් යුත් ශ්‍රී ලංකා පිලිපීන ව්‍යාපාර කවුන්සිල නියෝජිත කණ්ඩායම ඉදිකිරීම්, සංචාරක කර්මාන්තය, සැපයුම් සේවා, ශ්‍රමිකයින් බඳවා ගැනීමේ සේවා සපයන්නන්, තොරතුරු තාක්ෂණය, කෘෂිකර්මාන්තය සහ ආහාර නිෂ්පාදනය, IT/BPO සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල නියෝජිත කණ්ඩායම් හා සමග සාකච්ඡාකොට ව්‍යාපාර ගනුදෙනු සහ සබඳතා වැඩි දියුණු කර ගැනීමට කටයුතු කළේය.

- ''අත්කම් නිර්මාණ ශිල්පයේ ප්‍රෞඩ උරුමය - ශ්‍රී ලංකා'' යන තේමාව යටතේ සාමාජිකයින් 14 දෙනෙකුගෙන් යුත් නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහයෝගයද ඇතිව 2019-17/19 දිනවල පිලිපීනයේ පැවති මැනිලා ෆේම් (Manila Fame) ප්‍රදර්ශනයට සහභාගී විය.
- පිලිපීනයේ බාසිලුර් තේ සහ ඩිල්මා තේ මෙන්ම ජෝර්ජ් ස්ටුවර්ට් තේ සමාගම් සමඟ 2018 නොවැම්බර් මස පැවති 52 වැනි ජාත්‍යන්තර සල්පිළේදී ''ලංකා තේ'' ප්‍රදර්ශනය කුටියක් පවත්වාගෙන යාමට තානාපති කාර්යාලය කටයුතු කළේය.

**සංචාරක ප්‍රවර්ධනය**

- 2019 පෙබරවාරි 08-10 දිනවල මැනිලා හිදී පැවති පිලිපීන්ස් ට්‍රැවල්ස් තෙදින චාරිකා හා සංචාරක ප්‍රවර්ධන වැඩසටහනට ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහභාගී විය.
- 2019 ඔක්තොම්බර් 25-27 දිනවල ''පිලිපීන ජනතාව සඳහා වූ අනාගත සංචාරක ගමනාන්තය'' නමින් මැනිලා හිදී පවත්තන්නට යෙදුණු'' 2019 ලෝක සංචාරක ප්‍රදර්ශනයට'' ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමග තානාපති කාර්යාලය සහභාගී විය.

**බහු පාර්ශ්වීය සබඳතා**

- ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය (IRRI) සමඟ කරන ලද සාකච්ඡාවකට අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය අතර 2019-2023 ශ්‍රී ලංකා -IRRI සහයෝගීතාව 5 අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය ලබා ගැනීම සඳහා ආධාර සපයන විදේශීය නියෝජිතායතනයක් සොයා ගැනීම වෙනුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ IRRI ආයතන වෙත විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් සපයාදීම තානාපති කාර්යාලය විසින් සිදු කරන ලදී.
- කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමෙන් පවත්වන ලද කෙටි කාලීන පුහුණු වැඩසටහන් සෑහෙන ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ පැවැත්වීමේ අවස්ථාව උදාකර ගැනීමට තානාපති කාර්යාලයට හැකියාව ලැබිණි.

**සංස්කෘතික සබඳතා**

- ''සංස්කෘතික සහ ආහාර රාජ්‍යතාන්ත්‍රිකභාවය තුළින් සබඳතා ශක්තිමත් කර ගැනිම'' යන නමින් 2019 ශ්‍රී ලංකා නිදහස් දිනයේදී රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් පිළිගැනීමේ උළෙලක් සංවිධානය කෙරිණි.
- මැනිලා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මඟින් වෙසක් සහ නත්තල් දින සැමරුම් උත්සව සංවිධානය කරන ලදී.

**මැලේසියාව**

**ද්විපාර්ශ්වීය සබඳතා**

පහත සඳහන් පුද්ගලයන් මැලේසියාව වෙත කරන ලද සංචාර සඳහා පහසුකම් සැලසීම කරන ලදී.

- කොළඹ පුරපති පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ ගරු අමාත්‍ය ගරු අජිත් පී පෙරේරා සහ සංචාරක හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ගරු රංජිත් අලුවිහාරේ යන මහත්වරුන්ගේ මැලේසියානු සංචාරය.

පහත සඳහන් රැස්වීම ද පවත්වන ලදී.

- මැලේසියාවේ නියෝජිත මන්ත්‍රණ සභාවේ කථානායක ගරු ටෑන් ශ්‍රී ඩාටෝ මොහොමඩ් අරීෂ් බින් යුසොෂ් මහතා සමඟ පවත්වන ලද රැස්වීම, මැලේසියාවේ ජාත්‍යන්තර වෙළඳ හා කර්මාන්ත අමාත්‍ය ගරු ඩැරල් ලීකිං මහතා සමග පවත්වන ලද රැස්වීම.

**වෙළඳ හා ආර්ථික සබඳතා**

- මැලේසියානු ජාත්‍යන්තර ආහාර හා පාන වර්ග අලෙවි කිරීමේ සල්පිළට සහභාගි වීම. (MIFB 2019)
- මැලේසියාව සමග එළඹීමට යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීම.
- මැලේසියාවෙන් ශ්‍රී ලංකාවට පැමිණි වැදගත් වෙළඳ නියෝජිත පිරිස්වලට අවශ්‍ය පහසුකම් සැපයීම.
- මහ කොමසාරිස් කාර්යාලය තුළ චිත්‍ර හා අත්කම් නිර්මාණ ප්‍රදර්ශන පැවැත්වීම.
- සංචාරක, ව්‍යාපාරික සහ ශ්‍රමය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

**ආරක්ෂක සබඳතා** - ආරක්ෂක නියෝජිත කණ්ඩායම් සහ පුහුණු වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම.

# අප්‍රිකා අංශය

## අප්‍රිකා අංශය

### මෙම අංශයේ කාර්ය කටයුතු

අප්‍රිකානු රටවල් සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික සබඳතා සම්බන්ධීකරණය කිරීම.

1. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු විදේශ අමාත්‍යතුමා හා අනෙකුත් කැබිනට් අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ද්විපාර්ශ්වික සංචාර සම්බන්ධීකරණය කිරීම.
2. ඉහළ මට්ටමේ සංචාර හා අක්තපත් පිළිගැන්වීමේ උත්සව සඳහා සාකච්ඡා සටහන් හා රට පිළිබඳ සංක්ෂිප්ත සටහන් සකස් කිරීම.
3. අතිශයින් වැදගත් පුද්ගලයින් හා ඉතා වැදගත් පුද්ගලයින් ශ්‍රී ලංකාවේ දී නියැලෙන හා විදේශීය රටවල දී නියැලෙන සංචාර සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම. *(විස්තර අඳාළ දූත මණ්ඩල යටතේ දක්වා ඇත.)*
4. අත්සන් තැබීමට නියමිත අවබෝධතා ගිවිසුම්/ගිවිසුම්වලට ඉක්මනින් එළඹීමේ කටයුතු පසු විපරම් කිරීම.
5. අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයීය පත්‍රිකා පිළියෙළ කිරීම හා ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය ලබා ගැනීම.
6. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ගරු විදේශ අමාත්‍යතුමාගේ ශෝකය ප්‍රකාශ කිරීමේ පණිවුඩ ජාතික දින පණිවුඩ, සව්දිය පිරීමේ පණිවුඩ හා සුභාශිංසන පණිවුඩ පිළියෙළ කිරීම.
7. කොළඹ සිටින අප්‍රිකානු කලාපයේ තානාපතිවරුන්/මහ කොමසාරිස්වරුන්ගේ අභ්‍යන්තර රැස්වීම් සහ සුහද පිළිසඳර සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
8. අප්‍රිකානු කලාපය සඳහා කාර්යය සැලැස්ම සහ කාර්යය සාධන හා අයවැය වාර්තා ආදිය සැකසීම.
9. එදිනෙදා කටයුතු සම්බන්ධයෙන්, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල, අප්‍රිකා කලාපයේ රටවල කොළඹ පිහිටි විදේශ දූත මණ්ඩල හා රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා වෙනත් නියෝජිතායතන සමඟ අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.
10. අප්‍රිකානු සංගම් කොමිෂන් සභාවේ කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම.

### ආවරණය කරනු ලබන රටවල්

අ) රටවල් 54 - දකුණු අප්‍රිකාව, ඇන්ගෝලාව, බොට්ස්වානා, එස්වටිනි, ලෙසොතො, මලාවි, මොසැම්බික්, සැම්බියාව, සිම්බාබ්වේ, නැමීබියාව, ටියුනිසියාව, ඇල්ජීරියාව, මොරොක්කෝව, ඊජිප්තුව, ලිබියාව, එරිත්‍රියාව, ඉතියෝපියාව, ජිබුටි, දකුණු සුඩානය, සුඩාන ජනරජය, සෝමාලියාව, ඝානාව, සෙනෙගල්, ගැබොන්, කේප්වර්ඩේ, සාඕ ටෝමිඇන්ඩ් ප්‍රින්සිපේ, ඉක්වටෝරියල් ගිනියා, බුරුන්දි, නයිගර්, නයිජීරියා, බෙනින්, බර්කිනා ෆාසෝ, කෝට් ඩී අයි වෝර්, මාලි, ලයිබීරියාව, මොරිටේනියාව, චැඩ්, කැමරූන්, ටෝගෝ, කෙන්යාව, උගන්ඩාව, රුවන්ඩාව, ටැන්සානියාව, සීෂෙල්ස්, මැඩගස්කරය, මුරුසිය, කොමොරොස්, ගැම්බියාව, සියරාලියෝන්, ගිනියා, ගිනියා-බිසව්, කොන්ගෝ ජනරජය, කොන්ගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජය, මධ්‍යම අප්‍රිකානු ජනරජය.

අප්‍රිකානු මහාද්වීපයේ ඇති ස්වාධීන රාජ්‍ය 54 අතුරෙන් ශ්‍රී ලංකාව මේ දක්වා රටවල් 45 ක් සමඟ විධිමත් රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කර තිබෙන අතර, අප්‍රිකාවේ අනෙකුත් රටවල් 09 සමඟ විධිමත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිහිටුවා ගැනීම සඳහා දැනටමත් පියවර ගෙන තිබේ.

එම ඉතිරි රටවල් 09 සමඟ සබඳතා ඇති කර ගැනීම සඳහා මෙම අංශය පසුවිපරම් කටයුතු සිදුකරමින් පවතී.

ආ) ශ්‍රී ලංකාව අප්‍රිකානු මහාද්වීපයේ පහත සඳහන් අගනුවරවල නේවාසික රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල 06 ක් පිහිටුවා තිබේ.

- දකුණු අප්‍රිකාව/ප්‍රිටෝරියා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය.

- කෙන්යාව/නයිරෝබි හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය.
- නයිජීරියාව/අබුජා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය.
- සීෂෙල්ස්/වික්ටෝරියා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය.
- ඉතියෝපියාව/අඩිස් අබාබා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය.
- ඊජිප්තු/කයිරෝ හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය.

ඇ) අප්‍රිකානු මහාද්වීපයේ රාජ්‍යතාන්ත්‍රික නියෝජන 4 ක් කොළඹ පිහිටුවා තිබේ.

- දකුණු අප්‍රිකානු ජනරජයේ මහ කොමසාරිස් කාර්යාලය.
- ඊජිප්තු අරාබි ජනරජයේ තානාපති කාර්යාලය.
- සීෂෙල්ස් ජනරජයේ මහ කොමසාරිස් කාර්යාලය.
- ලිබියානු රාජ්‍යයේ තානාපති කාර්යාලය.

ඈ) සමගාමී අක්තගැන්වීම්:

- **දකුණු අප්‍රිකාවේ** ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය (8)- ඇන්ගෝලාව, එස්වටිනි, ලෙසොතෝ, මලාවි, මොසැම්බික්, නැම්බියාව, සැම්බියාව, සිම්බාබ්වේ.

- **ඊජිප්තුවේ** ශ්‍රී ලංකා තානාපති කාර්යාලය (3)- ලිබියා, එරිත්‍රියාව, සුඩාන් ජනරජය.

- **ඉතියෝපියාවේ** ශ්‍රී ලංකා තානාපති කාර්යාලය (3)- දකුණු සුඩානය, සෝමාලියාව, ජිබුටි.

- **නයිජීරියාවේ** ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය (11)- කෝට් ඩී අයිවෝර්, ගැම්බියාව, සියේරාලියෝන්, ගිනියා, ගිනියා-බිසව්, ටෝගෝ, බෙනින්, බර්කිනා ෆාසෝ, ලයිබීරියාව, මොරිටේනියාව, මාලි.

- **කෙන්යාවේ** ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය (5)- කොන්ගෝ ජනරජය, කොන්ගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජය, උගන්ඩාව, රුවන්ඩාව, ටැන්සානියාව.

- **සීෂෙල්ස්** හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය (1)- මැඩගස්කරය

**ඉ) අප්‍රිකානු සංගමය**

අප්‍රිකානු රටවල් සමඟ පවතින ශ්‍රී ලංකාවේ සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ ඉදිරි දැක්මකින් යුතුව, 2014 අප්‍රේල් මස සිට බලපැවැත්වෙන පරිදි අප්‍රිකානු නොවන රාජ්‍යයක් ලෙස අප්‍රිකානු සංගමයේ පිළිගැනීමේ තත්ත්වය ශ්‍රී ලංකාව ලබා ගත්තාය. ඒ අනුව, අඩිස් අබාබා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2017 පෙබරවාරි මාසයේ දී පිහිටුවන ලදී.

**උ) නිර්වේතනික කොන්සාල් නියෝජනය**

ශ්‍රී ලංකාව, මලාවි, මුර්සිය, මැඩගස්කරය, මොසැම්බික්, නැමීබියාව, සෙනෙගල්, දකුණු අප්‍රිකාව (ඩර්බන් හා කේප්ටවුන්, සුඩානය, ටැන්සානියාව, ටියුනීසියාව හා සැම්බියාව යන රටවල නිර්වේතනික කොන්සාල් නියෝජන ස්ථාපනය කර තිබේ.

**1. නයිජීරියාව**

**i. ද්විපාර්ශ්වික සබඳතා**

මෙම දෙරටම පොදුරාජ්‍ය මණ්ඩලයීය සාමාජිකයන් වීමත්, එක හා සමාන ජාතික හා ජාත්‍යන්තර අභියෝගවලට මුහුණ දීමත් හේතුවෙන්, ශ්‍රී ලංකාව හා නයිජීරියාව අතර ද්විපාර්ශ්වික සබඳතා 2019 වසර පුරාම ආදර්ශමත් ලෙස පැවතිණ.

- නයිජීරියාවේ හිටපු ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා, එම ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සිය රාජකාරිවලින් ඉවත් වීමට පෙර, නයිජීරියාවේ ජනාධිපතිවරයා සමඟ සමුගැනීමේ සුභද හමුවක් පවත්වා තිබේ. නයිජීරියානු මූල්‍ය අවපාත සමයේ දී වසා දමන ලද කොළඹ පිහිටි නයිජීරියානු දූත මණ්ඩලය යළි විවෘත කිරීමේ අවශ්‍යතාව පිළිබඳව නයිජීරියානු ජනාධිපතිවරයාට අවධාරණය කිරීම සඳහා ඔහු එම අවස්ථාව යොදාගෙන තිබේ.
- මහ කොමසාරිස්වරයා, නයිජීරියාවේ ගරු. විදේශ කටයුතු අමාත්‍යවරයා, ගරු. විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා සහ නයිජීරියාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා ද හමුවිය.
- ශ්‍රී ලංකාව විසින් හමුදා භටයින් පුහුණු කිරීම සඳහා නයිජීරියාවට ආධාර ලබා දී ඇති අතර, 2019 වසර තුළ දී නයිජීරියානුවන් දස දෙනෙකුට ශ්‍රී ලංකාවේ දී විවිධ ආරක්ෂක පාඨමාලා හැදෑරීමට හැකිවීම තුළින් දෙරට අතර ආරක්ෂක සහයෝගිතාවය තවදුරටත් ඉහළ නැංවිණ.
- කොළඹ පැවති ආරක්ෂක සම්මන්ත්‍රණයට නයිජීරියානු ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වූහ.

### ii. බහුපාර්ශ්වික සබඳතා

- විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යන්තර සංසදවල දී ශ්‍රී ලංකාව හා නයිජීරියාව අඛණ්ඩව අන්‍යෝන්‍ය සහයෝගය ලබාදෙන ලදී. 2019 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සභාපති ධුරය සඳහා සිය අපේක්ෂකයාට සහාය දැක්වීම පිළිබඳව නයිජීරියානු ජනාධිපතිවරයා ශ්‍රී ලංකා රජයට විශේෂ ස්තුතිය පුද කර තිබේ. කඩොලාන ප්‍රතිශ්ඨාපනය පිළිබඳ පොදුරාජ්‍ය මණ්ඩලයීය නිල් ප්‍රඥප්ති ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම හා නීති අමාත්‍යවරුන්ගේ රැස්වීම සඳහා නීතිපතිවරයා ඇතුළු නයිජීරියානු නිලධාරීන් ශ්‍රී ලංකාවට පැමිණියහ.

### iii. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

- ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා නයිජීරියාවේ අබුජා වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂවරයා හමුවී තේ, ඇඟලුම්, සැකසූ ආහාර සහ බෝට්ටු වැනි හඳුනාගත් ශ්‍රී ලාංකික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට මග පෑදීය.
- ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා නයිජීරියාවේ මැණික් පතල්කරුවන්ගේ හා අලෙවිකරුවන්ගේ සංගමයේ ජාතික සම්බන්ධීකාරක හමුවී මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත ක්ෂේත්‍රයේ ද්විපාර්ශ්වික සහයෝගිතාවය පිළිබඳ සාකච්ඡා පැවැත්විය.
- අබුජා හි දී ශ්‍රී ලාංකික ආයුර්වේද සායනයක් පිහිටුවීම සඳහා මෙම දූත මණ්ඩලය සිය ආයතනික සහයෝගය ලබා දුන්නේය.

### iv. සංස්කෘතික සබඳතා

- සිංහල හා දෙමළ අලුත් අවුරුදු වැඩසටහන වෙනුවෙන් ශ්‍රී ලාංකිකයන්ගේ මෙන්ම නයිජීරියානුවන්ගේ ද සහභාගිත්වයෙන් යුතුව ඉදිරිපත් කළ ශ්‍රී ලාංකික සංස්කෘතික අංග සඳහා මෙම දූත මණ්ඩලය පහසුකම් සැලසීය.
- අබුජා හි පැවති ආසියානු සිනමා උළෙල, ජාත්‍යන්තර මව් භාෂා දිනය, ජාත්‍යන්තර සිතුවම් හා ශිල්ප ප්‍රදර්ශනය යනාදියෙහි දී මෙම දූත මණ්ඩලය ශ්‍රී ලංකාව නියෝජනය කළේය.

### v. කම්කරු සුබසාධනය

- නයිජීරියාවේ සහ ඊට සමගාමීව අක්තගන්වන ලද රටවල සිටින ශ්‍රී ලාංකික ශ්‍රම බලකායට මෙම දූත මණ්ඩලය මඟින් කොන්සියුලර් සහය ලබා දෙන ලදී.
- ශ්‍රී ලංකාවෙන්, කෘෂිකර්මාන්තය, කර්මාන්ත හා ආගන්තුක සත්කාර යන ක්ෂේත්‍ර සඳහා පුහුණු සේවකයන් බඳවා ගැනීම මෙම දූත මණ්ඩලය ප්‍රවර්ධනය කළේය.
- නයිජීරියානු නාවික හමුදාව මඟින් රැඳවාගනු ලැබ තිබූ එම්ටී සීබෘෆ් තෙල් ප්‍රවාහන නෞකාවේ සේවය කළ ශ්‍රී ලාංකික කාර්ය මණ්ඩලයට මෙම දූත මණ්ඩලය උපකාර කළේය.

## 2. දකුණු අප්‍රිකාව

### i. ද්විපාර්ශ්වික සබඳතා

දකුණු අප්‍රිකාව හා සමගාමීව අක්ත ගන්වන ලද රටවල් සමඟ පැවති සබඳතා

- මෙම මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් දකුණු අප්‍රිකානු රජයේ බලධාරීන්, එනම්, අභ්‍යන්තර සබඳතා දෙපාර්තමේන්තුව, වෙළඳ හා කර්මාන්ත දෙපාර්තමේන්තුව, ආරක්ෂක දෙපාර්තමේන්තුව, ක්‍රීඩා ව්‍යාපාර සංවර්ධන දෙපාර්තමේන්තුව සහ විද්‍යා හා නවෝත්පාදන දෙපාර්තමේන්තුව සමඟ ද්විපාර්ශ්වික ගැටලු හා ද්විපාර්ශ්වික සංචාර පිළිබඳව රැස්වීම් 16 ක් පැවැත්වීය.
- පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් ළමයින්ට උපකාර කිරීම පිණිස ඩර්බන් හි වෝටර්ස් ලිවිං පල්ලිය මඟින් සියොන් පල්ලියට සාරා 50,000 ක පරිත්‍යාගයක් ලබා දීම සඳහා මෙම මහ කොමසාරිස් කාර්යාලය පහසුකම් සැලසීය.
- විද්‍යා හා නවෝත්පාදන දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කරන ලද නොබැඳි ව්‍යාපාරයේ පුහුණු මධ්‍යස්ථානයේ ආරම්භක දේශනය පැවැත්වීමට මෙම මහ කොමසාරිස් කාර්යාලයට ආරාධනා කරන ලදී.
- නෙල්සන් මැන්ඩෙලා දිනය සමරමින් පාසල් ළමුන් සඳහා කරන ලද පරිත්‍යාග මෙම මහ කොමසාරිස් කාර්යාලය මඟින් සම්බන්ධීකරණය කරන ලදී. දකුණු අප්‍රිකාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් පිරිසක් විසින්, දකුණු අප්‍රිකාවේ ජාත්‍යන්තර සබඳතා හා සහයෝගිතා දෙපාර්තමේන්තුව (DIRCO) විසින් ඉල්ලා ඇති භාණ්ඩ හා ද්‍රව්‍ය කිහිපයක් පරිත්‍යාග කළහ.
- ශ්‍රී ලංකාවේ ආරක්ෂක සේවා බලඇණිය හා මාණ්ඩලික විද්‍යාලයේ නියෝජිත කණ්ඩායමක් 2019 සැප්තැම්බර් 01-13 දිනවල දී දකුණු අප්‍රිකාවේ ආරක්ෂක ආයතන සහ ආරක්ෂක කටයුතු ආශ්‍රිත කර්මාන්ත නැරඹීම සඳහා සංචාරයක නිරත විය. මේ අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා පැවති වසර 25 තුළ දී ශ්‍රී ලංකාවේ සිට දකුණු අප්‍රිකාව වෙත ගිය පළමු ආරක්ෂක නියෝජිත කණ්ඩායමයි.
- ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල සමඟ සබඳතා ඇතිකර ගැනීම සඳහා මෙම මහ කොමසාරිස් කාර්යාලය දකුණු අප්‍රිකාවේ විශ්වවිද්‍යාල කිහිපයක් සමඟ සාකච්ඡා ආරම්භ කරන ලද අතර, එම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ඔවුන්ගේ සහාය ලබා ගැනීම පිණිස දකුණු අප්‍රිකානු විශ්වවිද්‍යාලවල සේවය කරන ශ්‍රී ලාංකික විද්‍යාර්ථීන් හමුවිය.
- ඇන්ගෝලාව, එස්වාටිනි, මොසැම්බික්, නැමීබියාව, සැම්බියාව හා සිම්බාබ්වේ යන රටවල පැවති අක්තපත්‍ර පිළිගැන්වීමේ උත්සවවල දී මහ කොමසාරිස්වරයා අදාළ රටවල රාජ්‍ය නායකයින් සමඟ රැස්වීම් ගණනාවක් පවත්වා තිබේ.

දකුණු අප්‍රිකාවේ වෙනත් දූත මණ්ඩල සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ සබඳතා

- වෙනත් දූත මණ්ඩල සහ ජාත්‍යන්තර සංවිධාන (යුරෝපා සංගමය, එක්සත් ජාතීන්ගේ සංවිධානය, සංක්‍රමණිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය, පෑන් ඇමරිකානු පාර්ලිමේන්තුව) සහ ප්‍රිටෝරියාහි බුද්ධි මණ්ඩල විසින් සංවිධානය කරන ලද සිදුවීම් (වැඩමුලු, සම්මේලන, සම්මන්ත්‍රණ හා සංස්කෘතික අංග) ගණනාවකට මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් සහභාගී විය.
- දකුණු අප්‍රිකාවේ අතරමංව සිටි ශ්‍රී ලාංකිකයෙකුට ආපසු පැමිණීම සඳහා ප්‍රිටෝරියාහි සංක්‍රමණිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ ද සහාය ඇතිව මෙම දූත මණ්ඩලය සහාය විය.

### ii. බහුපාර්ශ්වික සබඳතා

- දකුණු අප්‍රිකානු රජය විසින් සංවිධානය කරන ලද ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ උත්සව සහ දකුණු අප්‍රිකාවේ ජාත්‍යන්තර සබඳතා හා සහයෝගිතා දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ජංගම උපකරණ පිළිබඳ කරුණු, පතල් කර්මාන්තය, කෘෂිකර්මාන්තය, ඉදිකිරීම් (MAC සංධානය) පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් උනන්දුවක් දක්වන කරුණු පිළිබඳ සම්මුතිය සඳහා සංධාන කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා වූ රාජ්‍යතාන්ත්‍රික සමුළුවට මෙම මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් සහභාගී විය.

### iii. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

- ශ්‍රී ලංකා පොල් නිෂ්පාදන අපනයනකරුවන්ගේ දකුණු අප්‍රිකානු සංචාරයේ දී මහ කොමසාරිස්වරයා ඔවුන් සඳහා අබණ්ඩ රැස්වීම් මාලාවක් පැවැත්වීය.
- 2019 මාර්තු 19-25 දිනවල ප්‍රිටෝරියා හි මැන්ලින් සාප්පු සංකීර්ණයෙහි දී පැවැත්වුණු "සෝ ශ්‍රී ලංකා" සතියක සංචාරක ප්‍රවර්ධන වැඩසටහන මෙම මහ කොමසාරිස් කාර්යාලය මඟින් සංවිධානය කරන ලද අතර, එහි සමාරම්භක උත්සවයට ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයෝ සහභාගී වූහ.
- ශ්‍රී ලංකාවට පැමිණෙන දකුණු අප්‍රිකානු සංචාරකයන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා, ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ දකුණු අප්‍රිකාවෙන් පිටතට යන සංචාර මෙහෙයවන්නන් අතර ස්කයිප් සාකච්ඡාවක් මෙම දූත මණ්ඩලය මඟින් සංවිධානය කරන ලදී.
- ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුවේ වෙළඳ ප්‍රවර්ධන අයවැයෙහි ද සහාය ඇතිව, මෙම දූත මණ්ඩලය 2019 ජූලි 29-31 දිනවල දී පැවති දකුණු අප්‍රිකාවේ ජාලකරණ හා ගැලපීම් පිළිබඳ ගෝලීය වෙළඳ ප්‍රදර්ශනය (GTS) 2019 ට සහභාගී විය. මණ්ඩපයේ පැවති ශ්‍රී ලාංකික ප්‍රදර්ශන කුටියේ දී, ලංකා තේ, බිස්කට්, ආලේපන සහ ආයුර්වේද නිෂ්පාදන, පොල් කොහු හා රබර් ආශ්‍රිත නිෂ්පාදන, රෙදිපිළි, ආහාර, වැසි ඇඳුම් හා කුඩ ප්‍රදර්ශනය කරන ලදී. මෙම අවස්ථාවේ දී ආරම්භක දේශනය පවත්වමින්, දූත මණ්ඩල නිලධාරීන් විසින් ශ්‍රී ලංකාව පිළිබඳ ඉදිරිපත් කිරීමක් ද පවත්වන ලදී.
- ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික කලත්‍රයින්ගේ සංගමයේ (IDSA) ප්‍රිටෝරියාහි සාමාජිකයන් සඳහා මහ කොමසාරිස්වරයා "මහ කොමසාරිස් සමඟ තේ පානය" යන තේමාව යටතේ ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධන අංගයක් සංවිධානය කළ අතර, දිවා ආහාරය සඳහා ශ්‍රී ලාංකික ආහාර ලබා දුන්නේය.
- දකුණු අප්‍රිකාවේ ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික කලත්‍රයින්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද වාර්ෂික ජාත්‍යන්තර කඩමණ්ඩිය සඳහා මෙම මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකාව නියෝජනය කරන ලද අතර, එහි දී ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කරන ලදී.
- ශ්‍රී ලාංකික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සහ දෙරට අතර ව්‍යාපාරික සබඳතා පුළුල් කිරීම සම්බන්ධයෙන් මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් දකුණු අප්‍රිකාවේ විවිධ ව්‍යාපාරික ආයතන සමඟ රැස්වීම් කිහිපයක් පවත්වා තිබේ.
- ශ්‍රී ලාංකික පොල් කර්මාන්තවලට සයිටෙක්ස් ප්‍රදර්ශනයට සහභාගී වීමට මෙම දූත මණ්ඩලය පහසුකම් සැලසීය.
- විනෝදය හා සුදු ක්‍රීඩා සඳහා දකුණු අප්‍රිකාවේ සංවිධානය කරන ලද විශාලතම බෝට්ටු සංදර්ශනයක් වූ කේප් බෝට් ෂෝ උත්සව අංගය සඳහා මෙම දූත මණ්ඩලය ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී විය. ශ්‍රී ලාංකික බෝට්ටු සමාගමක් මෙම ප්‍රදර්ශනයට සහභාගී වූ අතර, අබණ්ඩව පැවති රැස්වීම්වලට ද සහභාගී විය.

### iv. සංස්කෘතික සබඳතා

- මිඩ්රාන්ඩ්ස් හි තායි ථේරවාද විහාරය විසින් පවත්වන ලද පූජාවක් සඳහා සහභාගී වීමට මහ කොමසාරිස්වරයා හා දූත මණ්ඩලයේ නිලධාරීන්ට ආරාධනයක් ලැබුණු අතර, එම තායි විහාරය විසින් සංවිධානය කරන ලද කඨින සිවුර පූජා කිරීමේ උත්සවයට දූත මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සහභාගී විය.

- එස්වාටිනි රාජ්‍යයේ සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණික පවුලක සාමාජිකයන්ගේ ද සහභාගිත්වය ඇතිව, මෙම මහ කොමසාරිස් කාර්යාලය ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික කලත්‍රයින්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද සංස්කෘතික සංදර්ශනයට ද සහභාගි විය.

### 3. ඉතියෝපියාව

#### i. ද්විපාර්ශ්වික සබඳතා

ඉතියෝපියාවට සහ මෙම දූත මණ්ඩලය සඳහා සමගාමීව අක්ත ගන්වන ලද රටවල් සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව, තානාපතිවරයා පහත සඳහන් නියෝජිතායතන/සම්භාවනීය අමුත්තන් සමඟ රැස්වීම් පැවැත්වීය.

- ශ්‍රී ලංකාවේ සිදුවන සමාජ දේශපාලනික වර්ධනයන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා ඉතියෝපියාවේ රාජ්‍ය ලේකම්වරයා සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ නිතිපතා රැස්වීම් පවත්වන ලදී.
- ජිබුටි, සෝමාලියාව හා දකුණු සුඩානයේ තානාපතිවරුන් සමඟ නිතිපතා සාකච්ඡා පැවැත්විණ. ජනමාධ්‍යවේදීන්, මතවාද හා ප්‍රතිපත්ති සම්පාදකයින්, බුද්ධි මණ්ඩල හා දේශපාලන නායකයින් සමඟ නිතිපතා අන්තර් ක්‍රියාකාරිත්වය. අප්‍රිකානු මහාද්වීපය තුළ ශ්‍රී ලංකාවට උපරිම ප්‍රචාරයක් ලබා දීම සඳහා තානාපතිවරයා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවලට සම්මුඛ සාකච්ඡා ගණනාවක් ලබා දුන්නේය.
- ටයිග්‍රේ කලාපයේ අගනුවර වන මෙකෙල් හි නියැලුනු සංචාරය අතරතුර දී තානාපතිවරයා එම කලාපීය සභාපතිවරයා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීය.
- අප්‍රිකානු මහාද්වීපයේ රටවල් සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව, තානාපතිවරයා අඩිස් අබාබා හි සිටින අප්‍රිකානු තානාපතිවරුන් සමඟ සාකච්ඡා පැවැත්වීය.

#### ii. බහුපාර්ශ්වික සබඳතා

- අප්‍රිකානු සංගම් කොමිෂන් සභාව සමඟ පුළුල් සම්බන්ධතාවයක් ඇති කර ගැනීමේ අරමුණින් යුතුව, ශ්‍රී ලංකාවේ සමාජ දේශපාලනික වර්ධනයන් පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා අප්‍රිකානු සංගම් කොමිෂන් සභාවේ සභාපතිවරයා, නියෝජ්‍ය සභාපතිවරයා සහ කොමසාරිස්වරුන් සමඟ නිතිපතා රැස්වීම් පවත්වන ලදී.
- 2019 පෙබරවාරි 10-11 දිනවල දී අඩිස් අබාබා හි පැවති අප්‍රිකානු සංගම් කොමිෂන් සභාවේ 32 වැනි සාමාන්‍ය සැසියේ ආරම්භක හා සමාප්ති උළෙලවලට තානාපතිවරයා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී විය.
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහ ඉතියෝපියාවේ ජල, වාරිමාර්ග හා බලශක්ති අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ, පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ දකුණු-දකුණු සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමේ වැඩමුලුවක් 2019 ජූලි 31 වැනි දින ඉතියෝපියාවේ අඩිස් අබාබා හි දී පැවැත්විණ. තානාපතිවරයා විශේෂ ආරාධිතයෙකු ලෙස මෙම වැඩමුළුව ඇමතීය.
- අප්‍රිකානු සංගම් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද ඒකාබද්ධ කම්කරු සංක්‍රමණ වැඩසටහන - 2019.10.29 වැනි දින අප්‍රිකානු සංගම් කොමිෂන් සභාවෙහි දී පැවති කම්කරු සංක්‍රමණ පාලනය පිළිබඳ අප්‍රිකාව හා මැදපෙරදිග අතර සහයෝගීතාව පිළිබඳ සම්මන්ත්‍රණයක දී තානාපතිවරයාට විශේෂ ආරාධිත කථිකයෙකු ලෙස සහභාගී වීමට ආරාධනා කරන ලදී.
- ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් වසන්තා පෙරේරා මහත්මිය, 2019 පෙබරවාරි 12-13 දිනවල දී පැවති ආහාර හා කෘෂිකර්ම සංවිධානය/ලෝක

සෞඛ්‍ය සංවිධානය/අප්‍රිකා සංගමය හි ජාත්‍යන්තර ආහාර සුරක්ෂිතතා සමුළුවට සහභාගී වීම සඳහා අඩිස් අබාබා හි නිල සංචාරයක නියැලුනාය.

- මෙම දූත මණ්ඩලය, අප්‍රිකානු සංගමයේ හවුල්කාරිත්ව කණ්ඩායම, දකුණු සුඩානයේ තානාපතිවරයාගේ කණ්ඩායම හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ - අප්‍රිකානු සංගමයේ හවුල්කාරිත්ව කණ්ඩායම සහ අප්‍රිකාව සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික කොමිසමේ (UNECA) රැස්වීම් සමඟ ද එක්ව කටයුතු කළේය.
- යුනෙස්කෝ අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකාව සහ අප්‍රිකානු සංගමය අතර සංචාරක හා සංස්කෘතික සහයෝගීතාව ගිවිසුමකට එළඹීමට ඇති හැකියාව පිළිබඳව සොයා බැලීම සඳහා තානාපතිවරයා අප්‍රිකාවේ යුනෙස්කෝ අධ්‍යක්ෂවරයා සමඟ නියැලී කටයුතු කළේය.
- 2019 දෙසැම්බර් 11-12 දිනවල දී අප්‍රිකානු සංගමය විසින් සංවිධානය කරන ලද 'මාර්ගගත ළමා ලිංගික සූරාකෑම මැඩපැවැත්වීමේ ගෝලීය සමුළුව' සඳහා කාන්තා හා ළමා කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය විජිත බේරුගොඩ මැතිතුමා සහභාගී විය.

### iii. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

- ඉතියෝපියාව සමඟ ශ්‍රී ලංකාවේ වෙළඳ, ආර්ථික හා ආයෝජන සබඳතා වැඩිදියුණු කිරීම සඳහා මෙම දූත මණ්ඩලය ඉතියෝපියාවේ සහ අප්‍රිකානු සංගමයේ නිලධාරීන්/නියෝජිතායතන සමඟ නිතිපතා රැස්වීම් පැවැත්වීය.
- 2019 සැප්තැම්බර් 24-27 දිනවල අඩිස් අබාබා හි දී පැවති 16 වැනි ඉතියෝ-කොන් ඉදිකිරීම් ප්‍රදර්ශනයට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රය නියෝජනය කරමින් 8 දෙනෙකුගෙන් යුත් දූත පිරිසක් මෙම දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.
- ලෝක අපනයන සංවර්ධන සංසදයට (WEDF) සහභාගී වන ශ්‍රී ලාංකික කණ්ඩායම් සඳහා ඉතියෝපියානු වාණිජ හා ආංශික සංගම් සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සමඟ එක්ව 2019 නොවැම්බර් 19 වැනි දින ඇඩිස් අබාබා හි කිංග්ස් හෝටලයේ දී අබණ්ඩ රැස්වීම් සංසදයක් පැවැත්වීය. නෙස්ලේ ලංකා පීඑල්සී, විල්කින්ස් ස්පෙන්ස් පැකේජිං ලංකා (පුද්.) සමාගම, සීමාසහිත ටී ඇන්ඩ් හර්බ් (පුද්.) සමාගම සහ සිනෙක්ස් සමාගම් සමූහයේ නියෝජිතවරුන් මෙම සංසදයට සහභාගී වූහ. ඉතියෝපියාවේ වාණිජ හා ආංශික සංගමයේ සභාපති ඉංජිනේරු මෙලකු එසෙස් මහතා සහ ශ්‍රී ලංකා තානාපතිවරයා විසින් මෙම ව්‍යාපාරික සංසදයේ මුලසුන හොබවන ලදී.
- 2019 නොවැම්බර් 20 වැනි දින පැවති ලෝක අපනයන සංවර්ධන සංසදයේ, ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ 19 වැනි නියමු අංගය නිල වශයෙන් එළිදැක්වීමේ අවස්ථාවට තානාපතිවරයා විශේෂ අමුත්තෙකු වශයෙන් සහභාගී විය.

### iv. කම්කරු සුබසාධනය

- 2019.09.29 වැනි දින මෙම දූත මණ්ඩලය සිය පළමු ජංගම කොන්සියුලර් සේවාව ශ්‍රී ලාංකිකයන් 350 කට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් යුතුව හවාසා කාර්මික උද්‍යානයේ දී පැවැත්වීය.
- 2014 වසරේ සිට ඉතියෝපියාවේ රැඳවුම් භාරයේ සිටි ශ්‍රී ලාංකිකයන් සිව් දෙනෙකු 2018 මාර්තු මාසයේ දී නිදහස් කරන ලද අතර, ඔවුන් සියලු දෙනාම ශ්‍රී ලංකා රජයට හෝ ඔවුන්ගේ ළඟම ඥාතීන් හට කිසිදු වියදමකින් තොරව ආපසු ශ්‍රී ලංකාවට එවන ලදී.
- ටයිග්‍රේ කලාපයේ සභාපතිවරයා විසින් ආසියා පැසිෆික් කලාපයේ තානාපතිවරුන් වෙත කරන ලද ආරාධනයකට අනුව තානාපතිවරයා 2019 ඔක්තෝබර් 04-06 දිනවල දී එහි අගනුවර වන මෙකෙල් හි සංචාරයක යෙදුනි. තානාපතිවරයා එහි දී කලාපීය සභාපතිවරයා සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර, ටයිග්‍රේ කලාපයේ ශ්‍රී ලාංකිකයන්ට වැඩි රැකියා අවස්ථා ලබා දීමට ඔහු එකඟ විය.

## 4. ඊජිප්තුව

### i. ද්විපාර්ශ්වික සබඳතා

- ඊජිප්තු අරාබි ජනරජය සඳහා අභිනවයෙන් පත් කරන ලද තානාපති රේණුකා දමයන්ති රාජපක්ෂ මැතිනිය 2019 දෙසැම්බර් 02 වැනි දින ඊජිප්තුවේ කයිරෝ හි පිහිටි ජනාධිපති මන්දිරයේ දී ඊජිප්තු අරාබි ජනරජයේ ජනාධිපති අබ්දෙල් ෆට්ටා එල් - සිසි මැතිතුමා වෙත සිය අක්තපත්‍ර පිළිගැන්වූවාය.

- ශ්‍රී ලංකාව හා ඊජිප්තුව අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල පළමු සැසිය 2019 දෙසැම්බර් 12 වැනි දින ඊජිප්තුවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී පැවැත්විණ. ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා ලේකම් රවිනාථ ආර්යසිංහ මහතා සහ ඊජිප්තුවේ විදේශ සබඳතා අමාත්‍යාංශයේ ආසියාව සඳහා සහකාර විදේශ අමාත්‍ය තානාපති හැනි සෙලිම් මැතිතුමා මෙම සැසිවාරයේ සම සභාපතිත්වය දැරූහ. ඊජිප්තුවේ ශ්‍රී ලංකා තානාපතිනි දමයන්ති රාජපක්ෂ මැතිනිය, ඊජිප්තුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දෙවැනි ලේකම් අනෝද්‍යා චිරශ්‍රී මහත්මිය හා පළමු ලේකම් (වාණිජ) ශිවන්ති අබයරත්න මහත්මිය සහ ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා අමාත්‍යාංශයේ අප්‍රිකා කටයුතු අංශයේ සහකාර අධ්‍යක්ෂ තුලාන් බණ්ඩාර මහතා ශ්‍රී ලාංකික දූත පිරිසට අයත් වූහ. මෙම ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවලට අමතරව, විදේශ සබඳතා ලේකම්වරයාගේ සංචාරය අතරතුර දී පහත සඳහන් සිදුවීම් ද සිදුවිය.

    - 2019 දෙසැම්බර් 11 වැනි දින කයිරෝ නුවර ඊජිප්තු විදේශ කටයුතු පිළිබඳ කවුන්සිලයේ (ECFA) සභාපති තානාපති මවුනීර් සහරන් මැතිතුමාගේ සභාපතිත්වයෙන් එම කවුන්සිලයෙහි පැවති රැස්වීමක දී විද්වත් කණ්ඩායමක් අමතමින්, 'ශ්‍රී ලංකා-ඊජිප්තු සබඳතා සහ අප්‍රිකානු මහාද්වීපය සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා ශක්තිමත් කිරීම' යන තේමාව යටතේ කථාවක් පැවැත්විය. ඊජිප්තුවේ ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව, එම ස්ථානයේ දී විශේෂ ශ්‍රී ලංකා තේ ප්‍රදර්ශනයක් ද පවත්වන ලදී.

    - අප්‍රිකාව පුරා දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාවේ සහයෝගීතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව, විදේශ ලේකම් රවිනාථ ආර්යසිංහ මහතා, අප්‍රිකාව පුරා විකාශය වන කේබල් රූපවාහිනී ජාලයක් වන නයිල් ටීවී ඉන්ටර්නැෂනල් හි සභාපතිනිය වන තග්‍රිඩ් හුසේන් මහත්මිය සමඟ "පුනර්ජීවනය කරන ලද අප්‍රිකානු ප්‍රතිපත්තිය" ක්‍රියාවට නැංවීම පිළිබඳව සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීය.

    - ඊජිප්තුව සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික ආර්ථික හා වෙළඳ සබඳතා ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව, ඊජිප්තුවේ අල් අහ්රාම් හා අල් අක්බාර් ජාතික පුවත්පත්වල මාධ්‍යවේදීන් දෙදෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා දෙකක් පැවැත්වීය.

    - ඊජිප්තුවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්, ඊජිප්තු විදේශ කටයුතු පිළිබඳ කවුන්සිලයේ නිලධාරීන් සහ ශ්‍රී ලාංකික නියෝජිතයන් සඳහා ශ්‍රී ලංකා තානාපතිවරයා විසින් ක්‍රියාකාරී රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වන ලදී.

- ඊජිප්තුව සහ ශ්‍රී ලංකාව අතර දකුණු-දකුණු සහයෝගිතා යෝජනා ක්‍රමය යටතේ, ඊජිප්තුවේ, කෘෂිකර්ම හා ඉඩම් ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ඊජිප්තු ජාත්‍යන්තර කෘෂිකාර්මික මධ්‍යස්ථානයේ (EICA) පැවති මාස තුනක (03) පුහුණු වැඩසටහන් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීන් සහභාගී වූ අතර, ඒ සඳහා සම්පූර්ණ අරමුදල් ඊජිප්තු රජය විසින් සපයන ලදී.

- ශ්‍රී ලාංකිකයන් දෙදෙනෙකු වන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමණාකරු නිලන්ත ඉලංගමුව මහතා සහ ධනංජය එදිරිසිංහ මහතා, අරාබි ජනරජයේ අතිගරු ජනාධිපති අබ්දෙල් ෆට්ටා එල්-සිසි මැතිතුමාගේ අනුග්‍රාහකත්වයෙන් යුතුව 2019 දෙසැම්බර් මස ෂර්ම් එල්-ෂෙයික් හි දී පැවති ලෝක තරුණ සංසදයට සහභාගී වූහ.

- ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම, උතුරු සංවර්ධන හා තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වී. සිවඥානසෝති මහතා, අධ්‍යක්ෂවරියක් වන වෛදේශි අනුෂ්යන්තන් මහත්මිය සමඟ 2019 ඔක්තෝබර් මාසයේ දී හුර්ගාඩා හි පැවති ජාතික ඇගයීම් හැකියාවන් (NEC) සමුළුවට සහභාගී විය. මෙම සමුළුවේ ඉහළම සම්පත්දායකයින් අතර වී. සිවඥානසෝති මහතා ද විය.

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ හා ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු. රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමා 2019 අප්‍රේල් මස ඊජිප්තුවේ සංචාරයක නියැලෙමින් ඊජිප්තුවේ සැලසුම්, අධීක්ෂණ හා පරිපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ ගරු අමාත්‍යවරිය වූ හලා අල්-සයෙඩ් මැතිනිය හමුවී සාකච්ඡා පැවැත්වීය.

- ටියුනීසියාවේ ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සාල් මුස්තාපා ට්‍රබෙල්සි මහතා 2019 පෙබරවාරි මස ඊජිප්තුවේ සංචාරයක යෙදෙමින් තානාපතිවරයා හමුවිය.

### ii. බහුපාර්ශ්වික සබඳතා

- ආසියානු කලාපයට අදාළ කරුණු සාකච්ඡා කිරීම සඳහා ආසියානු තානාපති කණ්ඩායම මාසිකව රැස් විය.
- 2019 ජූලි මාසයේ දී ඊජිප්තුවේ කයිරෝ නුවර පැවති අප්‍රිකානු මහාද්වීපයේ උසස් අධ්‍යාපන ආයතනවල නායකයින් සඳහා වූ 20 වැනි ජාත්‍යන්තර සමුළුවට තානාපතිවරයා සහභාගී විය.

### iii. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

- පහත සඳහන් පරිදි අවස්ථා හතරක (04) දී ජාත්‍යන්තර දින සැමරුම් සහ තරුණ ප්‍රදර්ශන කුටි සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය මෙම දූත මණ්ඩලය මඟින් සංවිධානය කරන ලදී.
    - ඊජිප්තුවේ බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාලය
    - ඔක්තෝබර් 6 විශ්වවිද්‍යාලය
    - පාරාවෝනික් ගම්මානය (දෙවරක්)
- සංචාරකයන් ලෙස ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා සිසුන් අතර දැඩි උනන්දුවක් ඇති වූ අතර, ඔවුන්ගෙන් කිහිප දෙනෙක් ශ්‍රී ලංකාවට පැමිණීම පිණිස වීසා ලබාගැනීම සඳහා දූත මණ්ඩලය වෙත පැමිණියහ.
- මෙම දූත මණ්ඩලය මඟින් සලසන ලද පහසුකම් මත, ඩී.එස්.අයි. ටයර්ස් (පුද්.) සමාගමේ 03 දෙනෙකුගෙන් යුත් දූත පිරිසක් ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු සඳහා කයිරෝ නුවර සංචාරයක යෙදුනහ. ඊජිප්තුවේ මෝටර් සයිකල් ටයර් හා ත්‍රිරෝද රථ ටයර් ආනයන කරන්නන් වෙතින් ඔවුන්ට යහපත් ප්‍රතිචාර ලැබුණි.
- ජේ.බී. එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගමේ 02 දෙනෙකුගෙන් යුත් දූත පිරිසක් ශ්‍රී ලංකාවෙන් කොකෝ පීට් ආනයනය කිරීමට උනන්දුවක් දක්වන ඊජිප්තු සමාගම් හමුවීම සඳහා ඊජිප්තුවේ සංචාරයක යෙදුනහ.
- ආසියානු රාජ්‍යතාන්ත්‍රික කලත්‍රයන්ගේ සංගමය (ADSA) විසින් සංවිධානය කරන ලද වාර්ෂික කඩ මණ්ඩියට මෙම දූත මණ්ඩලය සහභාගී විය. ශ්‍රී ලාංකික ආහාර හා අතින් වියන ලද බීරලු රේන්ද සමඟ ඩිල්මා සමාගම විසින් පරිත්‍යාග කරන ලද ශ්‍රී ලංකා තේ මෙම කඩමන්ඩියේ දී අලෙවි කරන ලදී. ශ්‍රී ලංකා තේ තවදුටත් ප්‍රවර්ධනය කිරීම සඳහා සහභාගී වූ සියලුම දෙනාට පිවිසීමේ දොරටුව අසල දී නොමිලයේ ශ්‍රී ලංකා තේ පිරිනමන ලදී. ඊජිප්තුවේ වෙසෙන ශ්‍රී ලාංකික දරුවන් විසින් සංස්කෘතික නර්තන අංග ද ඉදිරිපත් කරන ලදී.

- ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල පළමු සැසිවාරය සඳහා විදේශ ලේකම්වරයා සහභාගී වූ අවස්ථාවේ දී ශ්‍රී ලාංකික ව්‍යාපාරික ප්‍රජාව සහ විදේශ සබඳතා ලේකම් සමඟ රැස්වීමක් තානාපති මන්දිරයේ දී පැවැත්විණ.
- 2020 පෙබරවාරි මස ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන්ගේ රැස්වීමක් පැවැත්වීමේ පළමු පියවර ලෙස ඊජිප්තු ව්‍යාපාරිකයන් සඳහා ව්‍යාපාර ජාලකරන සැසියක් මෙම දූත මණ්ඩලයේ දී පැවැත්විණ. ශ්‍රී ලංකා තේ, පොල් නිෂ්පාදන, මුහුදු ආහාර, කුළුබඩු සහ රබර් නිෂ්පාදන ආනයනය කිරීමට උනන්දුවක් දක්වන ගැනුම්කරුවන් ලෙස ඊජිප්තු සමාගම් 25 ක් ඊට සහභාගී විය.
- මෙම දූත මණ්ඩලයේ නිලධාරීන් ඊජිප්තුවේ පෝට් සයිඩ් ආණ්ඩුකාර පාලන ප්‍රදේශයට ගොස් ශ්‍රී ලංකා තේ සඳහා, විශේෂයෙන්ම සවුදැන්කෝ සමාගමේ එල් සලාම් සිලෝන් ටී වෙළඳ නාමය සඳහා එම ප්‍රදේශයේ පවතින ඉල්ලුම පිළිබඳව වෙළඳපොළ සමීක්ෂණයක් සිදුකරන ලදී. මෙම සමීක්ෂණය පිළිබඳ වාර්තාව, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අවධානයට යොමු කර ඇති අතර, එහි පිටපතක් විදේශ සබඳතා අමාත්‍යාංශය වෙත යවා ඇත.
- ඊජිප්තු වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා අපනයන නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම දූත මණ්ඩලය, වෙළඳ විමසීම් විශාල සංඛ්‍යාවකට ප්‍රතිචාර දැක්වීම, ඊජිප්තුවේ සහ ශ්‍රී ලංකාවේ වෙළඳ ආරවුල් විසඳීමට කටයුතු කිරීම මෙන්ම, නිතිපතා ඊජිප්තුවේ අනාගත ගැනුම්කරුවන් හමුවීම ද සිදුකළේය.

### iv. සංස්කෘතික සබඳතා

මෙම දූත මණ්ඩලය විසින් ඊජිප්තුවේ සිටින ශ්‍රී ලාංකික ප්‍රජාවේ ද සහභාගීත්වයෙන් යුතුව පහත සඳහන් උත්සව අවස්ථා සමරනු ලැබීය.

- පොංගල් බත් සකස් කොට අනුභව කිරීම හා සාම්ප්‍රදායික හින්දු සැරසිලි හා චාරිත්‍ර අනුගමනය කරමින් තායි පොංගල් උත්සවය පවත්වන ලදී.
- උත්සව අංග තුන (03) කින් ජාතික දිනය සමරනු ලැබූ අතර, ශ්‍රී ලංකා ගුවන් හමුදා සංස්කෘතික කණ්ඩායම ජාතික දින සැමරුම් සමයේ දී ඊජිප්තුවේ සංචාරයක යෙදෙමින් ඉහත වැඩසටහන් තුනෙහි දී සංදර්ශන දැක්වීය.
- ජාතික ධජය එසවීමේ උත්සවය ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහභාගිත්වයෙන් තානාපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වූ අතර, තානාපතිවරයා විසින් දිවා ආහාරය ලබා දෙන ලදී.
- කයිරෝවේ ඊජිප්තු සංගීත ආයතනයේ දී ඊජිප්තුවේ වෙසෙන රාජ්‍යතාන්ත්‍රිකයින්, ඊජිප්තු රජයේ සම්භාවනීය අමුත්තන්, ව්‍යාපාරික ප්‍රජාව හා ඊජිප්තුවේ වෙසෙන ශ්‍රී ලාංකික සඳහා සංස්කෘතික ප්‍රදර්ශනයක් පවත්වන ලද අතර, ඊජිප්තුවේ සංස්කෘතික අමාත්‍යාංශය විසින් ඒ සඳහා පහසුකම් සපයන ලදී.
- රාජ්‍යතාන්ත්‍රිකයන්, රජයේ නියෝජිතයන් සහ ව්‍යාපාරික ප්‍රජාවේ සහභාගිත්වයෙන් කොන්රාඩ් කයිරෝ හෝටලයේ දී ජාතික දින සැමරුමක් පවත්වන ලදී.
- සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනයේ දී ඊජිප්තුවේ සිටින ශ්‍රී ලාංකික ප්‍රජාවට සුබපැතුම් හුවමාරු කර ගැනීම සඳහා සාම්ප්‍රදායික කිරිබත් හා රසකැවිලි සංග්‍රහයක් තානාපති මන්දිරයේ දී පැවැත්විණ.
- පූජ්‍ය ලුණුගම්වෙහෙර නාරද ස්වාමීන් වහන්සේගේ සහභාගිත්වයෙන් යුතුව දූත මණ්ඩලයේ දී වෙසක් උත්සවය සමරන ලද අතර, ඊට ශ්‍රී ලාංකික ප්‍රජාව මෙන්ම බෞද්ධ රටවල රාජ්‍යතාන්ත්‍රිකයන් ද සහභාගී විය.
- ශ්‍රී ලංකාවේ ෂියා සහ සුන්නි මුස්ලිම් ප්‍රජාවන්ගේ සහභාගිත්වයෙන්, ඉෆ්තාර් උත්සවය මෙම දූත මණ්ඩලයේ සත්කාරකත්වයෙන් යුතුව පැවැත්විණ.
- 2019 අප්‍රේල් 20 සිට 29 දින දක්වා ඊජිප්තුවේ සංස්කෘතික අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද 07 වැනි ජාත්‍යන්තර බෙර හා ජනශ්‍රැති උළෙලට ශ්‍රී ලංකා නාවික හමුදාවේ කලාකරුවන් 13 දෙනෙකුගෙන් සමන්විත නර්තන කණ්ඩායමක් සහභාගී විය.
- ප්‍රජාවගේ යහපත උදෙසා, ඉහත සංස්කෘතික කණ්ඩායම්වලට දූත මණ්ඩලයේ දී ද සංදර්ශන දැක්වීම සඳහා පහසුකම් සලසන ලදී.

- 2019 දෙසැම්බර් 24-25 දිනවල දී නත්තල් දිනට පෙරදින උත්සවය හා නත්තල් දේව මෙහෙය ශ්‍රී ලංකාවේ කතෝලික සභාවේ ජූඩ් අමිල ප්‍රනාන්දු පියතුමාගේ සහභාගිත්වයෙන් මෙම දූත මණ්ඩලයේ දී පවත්වන ලද අතර, ශ්‍රී ලාංකික ප්‍රජාව ඊට සහභාගී විය.

**v. කම්කරු සුබසාධනය**

- වලංගු වීසා බලපත්‍ර නොමැතිව ඊජිප්තුවේ රැඳී සිට, ඊජිප්තුවේ ආගමන දෙපාර්තමේන්තුවේ නිෂ්කාශන ක්‍රියා පටිපාටිය අතරතුර දී නැවත ශ්‍රී ලංකාවට යාමට අපේක්ෂා කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් හට, වැඩිපුර කාලයක් රැඳී සිටීම සඳහා දඩයක් නියම කිරීම හැර වෙනත් දඬුවමකට යටත් නොකොට එරටින් පිටවීම සඳහා මෙම දූත මණ්ඩලය සහය ලබා දුන්නේය.

- මධ්‍යධරණී මුහුදට මායිම්ව පවතින රටවල් හරහා සිදුකෙරෙන මිනිස් ජාවාරමට හසු වූ ශ්‍රී ලාංකිකයන් වෙතින් ආධාර පතමින් කෙරෙන ඉල්ලීම් මෙම දූත මණ්ඩලය වෙත ලැබේ. කයිරෝවේ සංක්‍රමණිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOM) මෙන්ම කයිරෝවේ පිහිටි අදාළ රටවල දූත මණ්ඩල භාවිත කරමින් මෙම දූත මණ්ඩලය ඔවුන්ට සහාය වෙයි. පහත විස්තර කර ඇති පරිදි ශ්‍රී ලාංකික කණ්ඩායම් දෙකක් ඇල්ජීරියාවේ අතරමංව සිටියහ.

- ව්‍යාජ මැලේසියානු විදේශ ගමන් බලපත්‍ර මගින් යුරෝපයට යාමට උත්සාහ කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන් තිදෙනෙකු (03) ගේ කණ්ඩායමක් අත්අඩංගුවට ගෙන වරදකරුවන් කරනු ලැබීය. ඔවුන්ට වසර දෙකක සිරදඬුවම් නියම විය. ඔවුන්ගේ සිර දඬුවම් කාලය ඔක්තෝබර් 09 වැනි දිනෙන් අවසන් වූ අතර, ඔවුන් නැවත ශ්‍රී ලංකාවට එවීම සඳහා මෙම දූත මණ්ඩලය ඇල්ජීරියානු දූත මණ්ඩලය සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් සමඟ සම්බන්ධීකරණය කරන ලදී.

- අනෙක් කණ්ඩායම, කිසියම් නොදන්නා වැරදි ක්‍රියාවක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබ, පිටුවහල් කරනු ලැබීමේ අවසරය ඇතිව මාස දෙකක අත්හිටවූ සිර දඬුවම් නියම වූ පුද්ගලයන් දෙදෙනෙකි. මෙම දූත මණ්ඩලය විසින් මොවුන්ගේ ළඟම ඥාතීන් සොයාගෙන, ඔවුන් ආපසු ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා ඇල්ජීරියානු දූත මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කරන ලදී.

- මොරොක්කෝව, ගිනියාව වැනි රටවල අතරමංව සිටින ශ්‍රී ලාංකිකයන්ගෙන් මීට සමාන ඉල්ලීම් බොහෝ ගණනක් මෙම දූත මණ්ඩල වෙත ලැබී තිබේ.

- මෙම දූත මණ්ඩලයට බලය ලබා දී ඇති බැවින්, ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය (SLBFE) යටතේ ශ්‍රමිකයන්ගේ නව ලියාපදිංචි කිරීම් හා ලියාපදිංචිය අලුත් කිරීම් සඳහා වසර පුරා පහසුකම් සපයන ලදී. ලියාපදිංචි වූ ශ්‍රමිකයන් පීඩාවට පත් වූ අවස්ථාවල දී අප්‍රමාදව සහය ලබා දෙනු ලැබේ. වෛද්‍ය ප්‍රතිකාර සඳහා සහය ඉල්ලා සිටින ශ්‍රමිකයන්ට ද ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය විසින් උපකාර කරන ලදී.

- සෑම පසළොස්වක පෝය දින සැන්දෑවක දීම, රාත්‍රී 8.00 ට ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහභාගිත්වයෙන් යුතුව ආගමික වැඩසටහනක් මෙම දූත මණ්ඩලයේ දී පවත්වන ලද අතර, ඉන් පසුව රාත්‍රී ආහාරය ද ලබාදෙන ලදී. පෝය දින ධර්ම දේශනය සාමාන්‍යයෙන් පවත්වනු ලබන්නේ ස්කයිප් පහසුකම හරහා සම්බන්ධ කරගනු ලබන බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් විසිනි. මහ සිකුරාදා දිනයේ දී ද පූජාවක් පැවැත්වීම සඳහා ඒ හා සමාන විධිවිධානයක් අනුගමනය කෙරේ.

- කොන්ත්‍රාත්තුවක් ලබා දෙමින් තවත් ශ්‍රී ලාංකිකයෙකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් මලිත් මංගල පෙරේරා නම් ශ්‍රී ලාංකිකයෙකු වැරදිකරු විය. ඔහුට වසර 25 ක ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් නියම කර ඇති අතර, එයින් වසර 12 ක් ගෙවා අවසන් කොට

තිබෙන බැවින්, ඔහුගේ ඉතිරි සිර දඬුවම් කාල සීමාව ගෙවීම සඳහා මෙම සිරකරුවා ශ්‍රී ලංකාවට මාරු කරන ලෙස ඔහුගේ පවුලේ ඥාතීන් විසින් ඉල්ලීමක් කර ඇත. දීර්ඝ සාකච්ඡාවලින් අනතුරුව, ඊජිප්තු ජනාධිපතිවරයා 2019 වසරේ දී කිසිදු ගිවිසුමකින් තොරව ඔහුව මාරු කිරීමට අවසර ලබා දුන්නේය. කෙසේ වෙතත්, ඊජිප්තු බන්ධනාගාරවල වඩාත් හොඳ පහසුකම් පවතින බැවින්, මලිත් යන අය ආපසු ශ්‍රී ලංකාවට යාම පිළිබඳව දෙගිඩියාවෙන් පසුවේ. දඬුවමින් යම් සමාවක් ලබා ගැනීමේ හැකියාවක් තිබේ නම් පමණක් ශ්‍රී ලංකාවට යාමට ඔහු අදහස් කරයි.

## 6. සීෂෙල්ස්

### i. ද්විපාර්ශ්වික සබඳතා

- ආරක්ෂක හා නාවික සහයෝගිතා ක්ෂේත්‍රයේ සහයෝගිතාව ශක්තිමත් කිරීමේ පියවරක් ලෙස ශ්‍රී ලංකාවේ නාවික හමුදාව විසින් සාදන ලද විශේෂයෙන් නිපදවූ මුරසංචාරක යාත්‍රා දෙකක් පරිත්‍යාග කිරීමට මෙම දූත මණ්ඩලය විසින් සහසුකම් සපයන ලද අතර, තවත් වේව් රයිඩර් වෙරළාසන්න මුරසංචාරක යාත්‍රාවක් මුදල් ගෙවීමේ පදනම මත සීෂෙල්ස් හි වෙරළාරක්ෂක බලකාය වෙත ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

- ඔවුන්ගේ ජාතික උරුමයක් ලෙස සැලකෙන වටිනා ඉබ්බන් දෙදෙනෙකු ශ්‍රී ලංකාවේ ජාතික සත්වෝද්‍යානය වෙත පිරිනැමීමට සීෂෙල්ස් හි රජය එකඟ විය.

- ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා වික්ටෝරියාහි සුදුසු ඉඩමක් පරිත්‍යාග කිරීමට සීෂෙල්ස් හි රජය පියවර ගත්තේය.

- එම රටවල් සමඟ ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මැඩගස්කර ජනරජය සහ කොමොරොස් ජනරජය සඳහා නව නිර්වේතනික කොන්සාල්වරු පත් කිරීමේ මූලික කටයුතු සඳහා මෙම දූත මණ්ඩලය පහසුකම් සැපයීය.

- කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහයෝගිතාවය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා කෘෂිකර්මික පර්යේෂණ හා සංවර්ධන අමාත්‍යාංශය සහ අයිලන්ඩ් ඩිවෙලොප්මන්ට් කම්පනි ලිමිටඩ් අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම පිළිබඳව මෙම දූත මණ්ඩලය ක්‍රියාකාරිව පසුවිපරම් කටයුතු සිදු කරයි.

- ශ්‍රී ලංකා රජය සහ සීෂෙල්ස් රජය අතර වීසා බලපත්‍රවලින් නිදහස් කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම සඳහා යෝජිත සංශෝධන පිළිබඳව සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

### ii. බහුපාර්ශ්වික සබඳතා

- සෝමාලියාවේ වෙරළට ඔබ්බෙන් සිදුවන මුහුදු කොල්ලකෑම් පිළිබඳ සම්බන්ධතා කණ්ඩායමේ ලේකම් කාර්යාලය (CGPCS) කොළඹ දී පිහිටුවීම සඳහා වූ යෝජනාව ශ්‍රී ලංකා රජය විසින් අනුමත කොට ඇති අතර, එය ක්‍රියාත්මක වෙමින් පවතී.
- ශ්‍රී ලංකාව බටහිර ඉන්දියානු සාගරයේ පිහිටි අප්‍රිකානු ජාතීන් සමඟ සමීප කරවමින්, සෝමාලියාවේ වෙරළට ඔබ්බෙන් සිදුවන මුහුදු කොල්ලකෑම් පිළිබඳ සම්බන්ධතා කණ්ඩායම සහ ඉන්දියන් සාගර කොමිෂන් සභාවේ පූර්ණ සැසි වාරයට මහ කොමසාරිස්වරයා සහභාගී වී ඇති අතර, එමඟින් එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යන්තර වේදිකාවල දී එම රටවල සහයෝගිතාවය සහතික කෙරෙයි.
- ශ්‍රී ලංකාව නිරීක්ෂක සාමාජිකයෙකු ලෙස ඉන්දියන් සාගර කොමිසමට බැඳීම සඳහා මූලික පියවර ගනිමින් පවතී.
- සීෂෙල්ස් හි දී පැවති නිල් සාගර සමුළුවේ දී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

### iii. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

- ශ්‍රී ලංකාවේ හැත්තෑ එක් වැනි ජාතික නිදහස් දින සැමරුමට සමගාමීව සීෂෙල්ස් හි කොරල් ස්ට්‍රෑන්ඩ් හෝටලයේ දී ශ්‍රී ලාංකික ආහාර උළෙලක් මෙම දූත මණ්ඩලය මගින් සංවිධානය කරන ලදී.
- වෛද්‍ය සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා හේමාස් හොස්පිට්ල් ලිමිටඩ් හි ශාඛාවක් වික්ටෝරියා හි දී විවෘත කිරීමට මෙම දූත මණ්ඩලය සහාය ලබා දුන්නේය.
- එහි පුරවැසියන්ට සෞඛ්‍ය සේවා හා පහසුකම් ලබාදීමේ අරමුණින් යුතුව ආසිරි රෝහල් සමූහය සීෂෙල්ස් වෙත ගියේය.
- ශ්‍රී ලංකා ගුවන් සේවය සීෂෙල්ස් සිට මැඩගස්කරය දක්වා ව්‍යාප්ත කිරීම සඳහා නව ආරම්භයක් සම්බන්ධයෙන් එම ගුවන් සේවය සමඟ කටයුතු කරනු ලැබේ. එයාර් සීෂෙල්ස් විසින් මෙහෙයවන ලද ගුවන් සේවය නතර කිරීමෙන් ඇති වූ රික්තය, ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවයේ වාසිය සඳහා යොදා ගැනීමට මෙමඟින් අපේක්ෂා කෙරේ.
- ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම විශේෂඥයින් විසින් සීෂෙල්ස් හි දී 'ස්වයංක්‍රීය හරිතාගාරයක්' පිහිටුවන ලදී. සීෂෙල්ස් හි ගොවීන් කුඩා පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණ ශීත ගබඩා ස්ථාපනය කිරීම සහ ශ්‍රී ලාංකික ව්‍යවසායකයින් විසින් පරිසර හිතකාමී කසළ මඟ සැපයීම පිළිබඳ අධ්‍යාපන චාරිකාවක් අවසන් කළහ.
- මාහේ හි වික්ටෝරියා නුවර දී 'ආයුර්වේද පංචකර්ම රෝහලක්' විවෘත කිරීමට සැලසුම් කොට ඇත. මෙය 2020 වන විට ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂිතය.
- ශ්‍රී ලංකාව, ඉන්දියාව, සීෂෙල්ස්, මැඩගස්කරය හා මොරිෂස් යන රටවල් සම්බන්ධ කර ගනිමින් බහුරටවල මුදල් හුවමාරුවක් පිහිටුවීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී. ශ්‍රී ලාංකික සමාගමක් මෙම යෝජනාව පිටුපස සිටී.
- දෙරට අතර ආර්ථික සහයෝගිතාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා - සීෂෙල්ස් ඒකාබද්ධ කොමිෂන් සභාව පිහිටුවීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගන්නා ලදී.
- ව්‍යාපාර කටයුතු සඳහා ෆියුචර් හෝල්ඩිංස් ලිමිටඩ් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතක් දැන් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අදියරෙහි පවතී.
- ශ්‍රී ලංකාවේ සහ සීෂෙල්ස් හි ව්‍යාපාරිකයන් අතර පහත සඳහන් තනි ව්‍යාපාරික ගිවිසුම්වලට අත්සන් තබන ලදී:
    - ශ්‍රී ලංකාවෙන් මිනිස් බලය බඳවා ගැනීම
    - සීෂෙල්ස් හි දී කෘෂිකාර්මික හා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ/උපකරණ ආනයනය, විකිණීම හා කුලියට දීම
    - සීෂෙල්ස් හි දී පාරිභෝගික ද්‍රව්‍ය හා ගෘහ නිෂ්පාදන ආනයනය හා තොග වශයෙන් බෙදා හැරීම
- අජිත් කවිකුමාර හා ජේම්ස් ලෙස්පෙරන්ස් යන මහත්වරුන් විසින් සිදුකරන ලද සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස පැලියගොඩ මාළු වෙළඳපොලට මාළු කිලෝග්‍රෑම් 25,000-30,000 ක් ගෙනැවිත් භාරදීම සඳහා මෙම දූත මණ්ඩලය සහාය විය.

### iv. සංස්කෘතික සබඳතා

- සීෂෙල්ස් හි ශ්‍රී ලාංකිකයන්ගේ සංගමය, බෞද්ධ සංගමය හා ලක් ස්ටාර් ක්‍රීඩා සමාජය විසින් ආරම්භ කරන ලද වැඩසටහන් සඳහා මහ කොමසාරිස් කාර්යාලය මගින් පූර්ණ සහයෝගය, නායකත්වය හා අනුග්‍රාහකත්වය ලබා දී ඇති අතර, එමඟින් මෙහි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව උද්‍යෝගිමත් ප්‍රජාවක් බවට පත් කරන ලදී.
- 2019 පෙබරවාරි 04 වැනි දින පැවති ජාතික නිදහස් දින සැමරුමට සමගාමීව සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික නැටුම් හා සංගීතය ඉස්මතු කරවන සංස්කෘතික උත්සවයක් සංවිධානය කිරීම.
- පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් වූවන් සිහිපත් කිරීම සඳහා අනුස්මරණ වැඩසටහනක් සංවිධානය කිරීම.

- ශ්‍රී ලංකාවෙන් ගුවන් මගින් වැඩම කරවන ලද භික්ෂූන් වහන්සේලාගේ සහභාගීත්වයෙන් යුතුව, සීෂෙල්ස් හි බෞද්ධ සංගමය සමඟ එක්ව, වෙසක්, පොසොන් හා ඇසළ පොහොය දිනවල දී ආගමික කටයුතු හා භාවනා වැඩසටහන් පවත්වන ලදී.
- ශ්‍රී ලාංකික බෞද්ධ සංගමය සමඟ සහයෝගයෙන් යුතුව, ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ දී පිරිත් සජ්ඣායනයක් පවත්වන ලදී.
- මහ කොමසාරිස්වරයාගේ නිල නිවසේ දී නත්තල් ආගමික වැඩසටහනක් පවත්වන ලදී.
- සීෂෙල්ස් හි උප ජනාධිපතිවරයා සමඟ සාකච්ඡා කොට, සීෂෙල්ස් හි බෞද්ධ විහාරස්ථානයක් පිහිටුවීම පිළිබඳ කටයුතු අවසන් කිරීම සඳහා පියවර ගෙන තිබේ.

**v. කම්කරු සුබසාධනය**

- සීෂෙල්ස් හි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායේ සුබසාධනය සහතික කිරීම සඳහා මහ කොමසාරිස් කාර්යාලය රැකියා අමාත්‍යාංශය සමඟ සමීප සහයෝගීතාවයෙන් කටයුතු කරමින් සිටී.
- සීෂෙල්ස් වෙත ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය බඳවා ගැනීම සඳහා ප්‍රමුඛ පෙළේ මිනිස්බල බඳවා ගැනීමේ සමාගමක් සමඟ ගිවිසුමකට අත්සන් තැබීම සඳහා මෙම දූත මණ්ඩලය පහසුකම් සැපයීය.
- පිළියම් හෝ සහන ලබාගැනීමේ අරමුණින් යුතුව, සීෂෙල්ස් හි ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සම්බන්ධ කම්කරු නඩු ගණනාවකට මෙම දූත මණ්ඩලය සහභාගී විය.

# මැද පෙරදිග අංශය

## මැද පෙරදිග අංශය

### අංශයේ කාර්යයන්

1. අදාළ කලාපයේ සමස්ත විදේශ ප්‍රතිපත්තිය හා සබඳතා කළමණාකරණය කිරීම.

2. අතිගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍යවරයා සහ වෙනත් අමාත්‍ය මණ්ඩල සාමාජිකයන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ද්විපාර්ශ්වික සංචාර සම්බන්ධීකරණය කිරීම.

3. එවැනි ඉහළ පෙළේ සංචාර, අක්ත පත්‍ර භාරදීමේ උත්සව සහ වෙනත් සියලුම රැස්වීම් සඳහා සාකච්ඡා සටහන් සහ රට පිළිබඳ විස්තර සකස් කිරීම.

4. ද්විපාර්ශ්වීය දේශපාලන උපදේශන, දේශපාලන සංවාද හා ඒකාබද්ධ කොමිෂන් සභා ආදිය පැවැත්වීම.

5. එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සකස්කොට අවසන් කිරීම.

6. අමාත්‍ය මණ්ඩල සංදේශ සකස්කිරීම සහ අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

7. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන ශෝක පණිවුඩ, ජාතික දින පණිවුඩ, විදේශීය රටවල නිදහස් දිනවලදී පවත්වන සච්දිය පිරීමේ කථාව සහ සුභ ප්‍රාර්ථනා පණිවුඩ සකස් කිරීම.

8. මැදපෙරදිග කලාපයේ රටවලින් ශ්‍රී ලංකාවට පත් කරනු ලැබ සිටින තානාපතිවරුන්/මහ කොමසාරිස්වරුන් සමඟ කොළඹ දී අභ්‍යන්තර රැස්වීම් පැවැත්වීම සඳහාත් සුහද බැහැදැකීම් සඳහාත් පහසුකම් සැලසීම.

9. මැදපෙරදිග කලාපය වෙනුවෙන් පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සැකසීම, තොරතුරු දැනගැනීමේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම, ක්‍රියාකාරී සැලසුම්, කාර්යසාධනය සහ අයවැය වාර්තා ආදිය සකස් කිරීම.

10. එදිනෙදා කාර්යයන් වලදී විදේශීය රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල, කොළඹ පිහිටි මැද පෙරදිග කලාපීය රටවල දූත මණ්ඩල, සහ රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු සහ වෙනත් නියෝජිතායතන සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

11. ශ්‍රී ලංකාවේ සංචාරය කරන/ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මැද පෙරදිග කලාපයේ ජාතීන්ට අදාළව කොන්සියුලර් කටයුතු, නෛතික නඩු විභාග, හා වෙනත් කරුණු.

12. රාජ්‍ය සංචාර, දේශපාලන සාකච්ඡා, ඒකාබද්ධ කොමිෂන් සභා හා මැද පෙරදිග කලාපයේ සිදුකරන වෙනත් සංචාර අතරතුර දී ගනු ලබන තීරණ පිළිබඳ පසුවිපරම් කිරීම.

### ආවරණය කරනු ලබන රටවල්

අ. මැද පෙරදිග කලාපයේ රටවල් 17ක් නිබේ. පලස්තීනය හැර ශ්‍රී ලංකාව රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යන රටවල් 13 ද ඇතුළුව ඊජිප්තුව, ලිබියාව (අප්‍රිකා අංශය) තුර්කිය (බටහිර අංශය) මෙම රටවල් 17 අතර වේ.

ආ.පහත දැක්වෙන මැද පෙරදිග රටවල් 14 සමඟ ශ්‍රී ලංකාව රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වයි.

1. බහරේන් රාජධානිය
2. ඉරාන ඉස්ලාමීය ජනරජය
3. ඉරාක ජනරජය
4. ඊශ්‍රායල් රාජ්‍යය
5. ජෝර්දාන රාජධානිය
6. කුවේට් රාජ්‍යය
7. ලෙබනන ජනරජය
8. ඕමාන් සුල්තාන් රාජ්‍යය
9. පලස්තීන රාජ්‍යය
10.කටාර් රාජ්‍යය
11.සවුදි අරාබි රාජධානිය
12.සිරියා අරාබි ජනරජය
13.එක්සත් අරාබි එමීර් රාජ්‍ය
14.යේමන් ජනරජය

ඇ. ශ්‍රී ලංකාව,ඉහත රටවල් 14 අතුරින් රටවල් 12ක නේවාසික දූත මණ්ඩල ස්ථාපිත කර ඇත. ඒවා නම්;

1. බහරේන් (මැනමා)
2. ඉරානය (ටෙහෙරාන්)
3. ඉරාකය (බැග්ඩෑඩ්)
4. ඊශ්‍රායලය (ටෙල් අවිව්)
5. ජෝර්දානය (අම්මාන්)
6. කුවේට් (කුවේට් නගරය)
7. ලෙබනන් (බීරුට්)
8. ඕමානය (මස්කට්)
9. කටාර් (දෝහා)
10. සවුදි අරාබිය (රියාද්)
11. එක්සත් අරාබි එමීර් රාජ්‍යය (අබුඩාබි)
12. රාමල්ලාහ් නගරයේ (පලස්තීනය) නියෝජිත කාර්යාලය
13. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ (ඩුබායි)හි කොන්සල් ජනරාල් කාර්යාල
14. සවුදි අරාබියේ (ජෙඩා)

ඈ. එහෙයින්, යේමනය සහ සිරියාව යන රටවල් දෙකේ පමණක් ශ්‍රී ලංකා නේවාසික දූත මණ්ඩල පිහිටුවා නොමැති අතර එම රටවල් ඕමානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය (යේමනය) සඳහා සහ ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය (සිරියා) සඳහා සමගාමීව අක්තගන්වා ඇත.

- ඉරානයේ ශ්‍රී ලංකා දූත මණ්ඩලය අසර්බයිජාන් හා ටර්ක්මෙනිස්ථානය සඳහා සමගාමීව අක්තගන්වා ඇත.
- මැද පෙරදිග කලාපයේ නිර්වේතනික කොන්සල් නියෝජනයන් හතරක් (04)ක් තිබෙන අතර ඒවා මෙසේය;
    1. ඊශ්‍රායල රාජ්‍යය (ජෙරුසෙලම)
    2. පලස්තීන රාජ්‍යය (බෙත්ලෙහෙම)
    3. ඉරාක ජනරජය (කුර්දිස්ථානය)
    4. සිරියානු අරාබි ජනරජය (ඩැමැස්කස්)

**මැදපෙරදිග රටවල කොළඹ පිහිටි නියෝජන/තානාපති කාර්යාල/නිර්වේතනික කොන්සාල්වරුන් සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම.**

**අ. කොළඹ පිහිටි මැදපෙරදිග තානාපති කාර්යාල ගණන අටකි. (08)**

1.ඉරානය
2.ඉරාකය
3.කුවේටය
4.ඕමානය
5.පලස්තීනය
6.කටාර්
7.සෞදි අරාබිය
8.එක්සත් අරාබි එමීර් රාජ්‍යය

**ආ. නවදිල්ලි නුවර පිහිටි මැද පෙරදිග තානාපති කාර්යාල ගණන හයකි (06)**

1.ලෙබනනය 4.සිරියාව
2.ජෝර්දානය 5.යේමනය
3.ඊශ්‍රායලය 6.බහරේනය

**ඇ. මැදපෙරදිග රටවල කොළඹ පිහිටි නිර්වේතනික කොන්සල් නියෝජන ගණන තුනකි.(03)**

1.ඊශ්‍රායලය
2.ජෝර්දානය
3.යේමනය

**1.බහරේන් රාජධානිය**

**අ. ද්විපාර්ශ්වික සබඳතා**

- දේශපාලන, වෙළඳ හා සංචාරක සබඳතා මෙන්ම ශ්‍රී ලාංකිකයන් සඳහා රැකියා අවස්ථා උදාකිරීම කෙරෙහි මූලික අවධානය යොමු කරමින් අවස්ථා කීපයකදී තානාපතිවරයා විසින් බහරේන් රජතුමා, අමාත්‍යවරයා, ඔටුන්න හිමි කුමරා, කථානායකවරයා සහ විදේශ කටයුතු හා කම්කරු හා සමාජ සංවර්ධන අමාත්‍යවරුන් හමුවීම හා බැහැදැකීම සිදුකරන ලදී. තවද, ශ්‍රී ලංකාව සහ බහරේන් අතර ද්විපාර්ශ්වික ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්/ගිවිසුම්වලට අත්සන් තැබීම/අලුත් කිරීම පිළිබඳ සාකච්ඡා පත්වන ලදී.
- විවිධ ජාතීන්ගේ අමාත්‍ය මට්ටමේ ආරම්භක රැස්වීම: ගෝලීය ව්‍යවසායකත්ව සමුළුවට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවේ සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍ය නලින් බණ්ඩාර මහතා 2019 අප්‍රේල් 14 සිට 16 ක් දක්වා බහරේන්හි නිල සංචාරයක නිරත විය. අමාත්‍යතුමා, නේපාලයේ කර්මාන්ත, වාණිජ හා සැපයුම් අමාත්‍ය මැට්‍රිකා ප්‍රසාද් යාදව් මැතිතුමා, බංග්ලාදේශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ රාජ්‍ය අමාත්‍ය සුනයිඩ් අහමඩ් පාලක් මැතිතුමා, මුරුසියේ ව්‍යාපාර, ව්‍යවසාය සහ සමූපකාර අමාත්‍ය සුමිල්තුන් බෝලා මැතිතුමා සහ ව්‍යවසාය පිළිබඳ තානාපති පැට්‍රවාන් වෙචසාර්ට් මැතිනිය, සමඟ ඵලදායී ද්විපාර්ශ්වික රැස්වීම් පවත්වා තිබේ.
- ශ්‍රී ලංකාව සහ බහරේනය අතර රාජ්‍යතාන්ත්‍රික, සේවා සහ නිල විදේශ ගමන් බලපත්‍ර හිමියන් විසා බලපත්‍ර ලබාගැනීමෙන් නිදහස් කිරීමේ ගිවිසුමේ කටයුතු දෙපාර්ශ්වය විසින්ම අවසන් කර ඇති අතර අත්සන් කිරීමට නියමිතය.

**ආ. බහුපාර්ශ්වික සම්බන්ධතා**

- 2021-2024 කාල සීමාව සඳහා 'මානව හිමිකම් කමිටුවේ සාමාජිකත්ව' (CCPR) අපේක්ෂකත්වය ලබා ගැනීම සඳහා බහරේන් රජය විසින් ශ්‍රී ලංකා රජයේ සහය ඉල්ලා තිබේ.

මෙම මැතිවරණය 2020 ජුනි/ජූලි මාසවල නිව්යෝර්ක් නුවරදී පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා රජය තවමත් සිය ස්ථාවරය තහවුරු කර නොමැත.

**ඇ. ආර්ථික සම්බන්ධතා සහ විදේශ ආයෝජන**

- බහරේන් හි සිට ශ්‍රී ලංකාවට සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා බහරේන් රාජධානියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ කටයුතු සමීපව සම්බන්ධීකරණය කරමින් සංචාරක අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) 2019 අප්‍රේල් 9 වන දින සංචාරක ප්‍රවර්ධන මාර්ග සංදර්ශනයක් පැවැත්වීය. මෙම

ප්‍රවර්ධන කාර්යාංශය වැඩසටහන, ශ්‍රී ලංකාවේ සහ බහරේනයේ පිහිටි සංචාරක නියෝජිතයන් අතර ව්‍යාපාරික (B2B) සැසි, ඉදිරිපත් කිරීම් සහ වැඩමුළු වලින් සමන්විත විය. මෙම ප්‍රවර්ධන වැඩසටහනට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක නියෝජිතයන්/සංචාරක මෙහෙයවන්නන් සහ හෝටල් හිමියන් 20 කට ආසන්න පිරිසක් මෙම ප්‍රවර්ධන අංගයට සහභාගිවීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක නිලධාරීන් ද සමඟ බහරේනය බලා පිටත්ව යන ලදී. මෙම අවස්ථාවට බහරේනයේ සංචාරක නියෝජිතයින්, සංචාරක මෙහෙයවන්නන් සහ සමාගම් 120කට අධික සංඛ්‍යාවක් සහභාගී වූ අතර ශ්‍රී ලංකා සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තයේ නියුතු පුද්ගලයින් සමඟ අදහස් හුවමාරු කර ගන්නා ලදී.

- ශ්‍රී ලාංකිකයන්ගේ රැකියා සුරක්ෂිත කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා තානාපතිවරයා බහරේනයේ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික ආයතනවල සභාපතිවරුන්/ප්‍රධාන විධායක නිලධාරීන් ගණනාවක් හමුවිය.
- ප්‍රමුඛතම සූර්ය හා පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ විසඳුම් සැපයුම්කරුවෙකු වන ශ්‍රී ලංකාවේ ජේ. ලංකා ජාත්‍යන්තර සමාගම ඇමරිකානු ඩොලර් මිලියන 10 ක ආයෝජනයක් සිදුකිරීම මගින් බහරේන් රාජධානියට සිය සේවාවන් ව්‍යාප්ත කළේය. තානාපති කාර්යාලය විසින්, අදාළ බහරේන් බලධාරීන් සමඟ සාකච්ඡා කර සමාගමට අවශ්‍ය සහය ලබා දෙන ලදී.

**ඈ. සංස්කෘතික සබඳතා**

- බහරේනයේ "ශ්‍රී ලංකා ක්ලබ්" සහ ශ්‍රී ලංකා සංගම් ගණනාවක් අලුත් අවුරුදු, වෙසක්, පොසොන්, දීපවාලි, තායි පොංගල්, නත්තල් සහ ඉෆ්තාර් වැනි උත්සවවලදී පවත්වන ලද සංස්කෘතික අංගවලට දූත මණ්ඩලය ඒ අවශ්‍ය පහසුකම් සලසමින්, හා සහභාගී වෙමින් පූර්ණ සහාය ලබා දී ඇත.

ත්‍රිපිටකය එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානයේ (යුනෙස්කෝ) ලොව මතක සටහන් ලේඛනයේ ලැයිස්තුගත කිරීම සඳහා ථේරවාදී ත්‍රිපිටකය ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සනිටුහන් කිරීමට තානාපති කාර්යාලය "ත්‍රිපිටකාභිවන්දන සතිය" සංවිධානය කළේය. තානාපති කාර්යාලය බහරේනයේ බාර්බාර් විහාරස්ථානය සමඟ කටයුතු සම්බන්ධීකරණය කර අති පූජ්‍ය සම්මානා නායක හිමිපාණන් වහන්සේගේ හා පූජ්‍ය දෙහිවල චන්ද්‍රවිසුද්දි හිමියන්ගේ ආගමික වතාවත් පැවැත්විය. ඒ 2019 මාර්තු 16 සිට 23 දක්වා " ත්‍රිපිටක සතිය" සැමරීම සඳහා සහ ලෝක මතක සටහන් යටතේ යුනෙස්කෝව විසින් ත්‍රිපිටකය පිළිගැනීමට ලක් කිරීම වෙනුවෙන් ආශිර්වාද කිරීම සඳහාය.

**ඊ. කම්කරු සුබසාධනය**

- බහරේන් රාජධානියේ ශ්‍රී ලාංකික සංගම් සම්බන්ධීකරණයෙන් තානාපති කාර්යාලය විසින් 2019.03.01 දින බහරේනයේ පදිංචිව සිටින ශ්‍රී ලාංකිකයන් සඳහා බහරේනයේ අද්ලියාහි අල්-හිලාල් රෝහලේ දී නොමිලේ වෛද්‍ය සායනයක් සංවිධානය කරන ලදී. වෛද්‍ය සායනයට 400 කට අධික පිරිසක් සහභාගී වූ අතර ඔවුන්ට නොමිලේ වෛද්‍ය පරීක්ෂණ, වෛද්‍ය පරීක්ෂා කිරීම් සහ විශේෂඥ උපදෙස් ගාස්තු රහිතව ලබා දෙන ලදී.
- ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වීමෙන් ලැබෙන සුබසාධන ප්‍රතිලාභ පිළිබඳව බහරේනයේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් දැනුවත් කිරීම සඳහා බහරේනයේ තෝරාගත් ශ්‍රී ලාංකික සංගම්වලදී වැඩමුළු කිහිපයක් දූත මණ්ඩලයේ කම්කරු අංශය විසින් පවත්වන ලද අතර දූත මණ්ඩලය විසින් සකස් කරන ලද අත් පත්‍රිකාවක් බෙදා හරින ලදී.
- අර්ධ නිපුණතා හා නිපුණතා ක්ෂේත්‍රවල ශ්‍රී ලාංකික මිනිස් බලය ප්‍රවර්ධනය කිරීම සඳහා කම්කරු අංශය රැකියා ප්‍රවර්ධන අංග 08 ක් පවත්වා ඇත.

## 2.ඉරාන ජනරජය

### අ. ද්විපාර්ශ්වික සබඳතා

- ඉරාන ඉස්ලාමීය ජනරජය විසින් පවත්වනු ලබන 2019 ආසියා පැසිෆික් සංසදයේ සමාරම්භක උළෙලට සහභාගී වීමට ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුජීව සේනසිංහ මහතා ඉරානයේ කළ සංචාරයට අවශ්‍ය පහසුකම් සලසන ලදී. මෙම සංචාරයේදී, එනම් 2019 ජුනි 10 වන දින අමාත්‍යවරයා ඉරාන ජාතික නවෝත්පාදන කවුන්සිලයේ වගකිව යුතු සම්භාවනීය අමුත්තන් හමුවී ශ්‍රී ලංකාවේ නැනෝ තාක්ෂණ සංවර්ධනය සඳහා ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කළේය. තවද, 2019 ජූලි 19 වන දින පැවැත්වූ පළමු ඒකාබද්ධ කමිටු රැස්වීම පැවැත්වීමට ඇති හැකියාව පිළිබඳව ඔවුහු සාකච්ඡා කළහ. නොවැළැක්විය හැකි තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා පාර්ශ්වය යෝජිත රැස්වීම කල් දැමීය.
- මත්ද්‍රව්‍ය, මධ්‍ය ස්නායු පද්ධතියට බලපෑම් එල්ල කරන රසායනික ද්‍රව්‍ය සහ ඒවායේ මුල් රසායන ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීම මැඩලීම සඳහා වන සහයෝගීතා අවබෝධතා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ පොලිස් හා රේගු නිලධාරීන් සඳහා පුහුණුව ලබා ගැනීමේ හැකියාව පිළිබඳ මෙම දූතමණ්ඩලය සාකච්ඡා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඉරාන පාර්ශ්වය 2019 ඔක්තෝබර් 01 වන දින, පුහුණුව ලබා දීමට එකඟ විය. නොවැලැක්විය හැකි තත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා පාර්ශ්වය යෝජිත පුහුණුව කල් දැමීය.
- ශ්‍රී ලංකාව සහ ඉරානය අතර දඩුවම් නියම වූ පුද්ගලයින් මාරු කිරීම පිළිබඳව අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා මෙම දූත මණ්ඩලය පහසුකම් සැපයීය.
- ශ්‍රී ලංකාවේ තෝරාගත් විශ්ව විද්‍යාල අතර අධ්‍යයන සහයෝගීතාව ඇති කිරීම සඳහා මෙම දූත මණ්ඩලය ටෙහෙරාන් විශ්ව විද්‍යාලයේ ලෝක අධ්‍යයන පීඨය සමඟ සාකච්ඡාවක් පැවැත්වීය.

### ආ. බහුපාර්ශ්වික සම්බන්ධතා

2019 ජුනි 21 වන දින වර්ගවාදී වෙනස්කොට සැළකීම තුරන් කිරීම සඳහා වූ කමිටුවේ සාමාජිකත්වය සඳහා ආචාර්ය ජැනට් එලිසබෙත් මහතාගේ ඉරාන අපේක්ෂකත්වයට ශ්‍රී ලංකාව සහාය දැක්වීය.

### ඇ. ආර්ථික සම්බන්ධතා සහ විදේශ ආයෝජන

- ඉරානයේ යාස්ඩි පළාතේ ආණ්ඩුකාරවරයාගේ ආරාධනයෙන් දූත මණ්ඩලය 2019 පෙබරවාරි 15 වන දින මෙම දූත මණ්ඩලය යාස්ඩි පළාතට පැමිණියේය. මෙම සංචාරයේ ප්‍රධාන පරමාර්ථය වූයේ වෙළඳ, අධ්‍යාපන, ආයෝජන සහ සංචාරක සබඳතා ප්‍රවර්ධනය කිරීමයි.
- යාස්ඩි සංචාරයේ ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාවේ සිට ඉරානයට පිටිකළ පොල් ආනයනය කිරීම සඳහා පූයාන් පාර්සිස් සමාගමට පහසුකම් සැපයීමට දූත මණ්ඩලයට හැකි විය.
- ඉරාන සමාගම් වන පැසර්ගාඩ් මාල් සහ "බිස්නස් සෙන්ටර්", මෙහර්ගන් ලංකා පුද්ගලික සමාගම සහ ඩොක්ටර් බිස්නස් ලංකා පුද්ගලික සමාගම වැනි ඉරාන ආයතනවලට මෙම දූත මණ්ඩලය පහසුකම් සැලසීය. කෙසේ වෙතත්, ඉරානය සම්බන්ධයෙන් එක්සත් ජනපද පැනවූ සම්බාධක හේතුවෙන් ඉරානය සහ ශ්‍රී ලංකාව අතර නිසි බැංකු ක්‍රමයක් සහ මුදල් ගනුදෙනු ක්‍රමයක් නොමැති බැවින් මෙම සමාගම් ලියාපදිංචි කිරීම දුෂ්කර වී තිබේ. මෙම දූත මණ්ඩලය, ශ්‍රී ලංකාවේ ට්‍රැක්ටර් උපාංග සවිකිරීමේ සමාගමක් පිහිටුවීම සඳහා ඉරානයේ,

- "ඉරාන් මැනුෆැක්ටරීන්" ට්‍රැක්ටර් සමාගමෙහි (ITMCO) කළමනාකාර අධ්‍යක්ෂවරයා සමඟ ද සාකච්ඡාවක් පැවැත්වීය. ශ්‍රී ලංකාවේ දේශීය ව්‍යාපාරික හවුල්කරුවෙකු සොයා ගන්නා ලෙස මෙම දූතමණ්ඩලය අමාත්‍යාංශයෙන් ඉල්ලා තිබේ. ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් ප්‍රතිචාරය ලැබෙන තෙක් බලා සිටියි.

- ටෙහෙරානයේ සංචාරක නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් මෙම දූත මණ්ඩලය 2019 ඔක්තෝබර් 28 වන දින "must visit Sri Lanka" යන සංචාරක ප්‍රවර්ධන වැඩසටහන පැවැත්විය.

**ඉ. සංස්කෘතික සබඳතා**

මෙම දූත මණ්ඩලය 2019 පෙබරවාරි 04 වන දින ඉරානයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහභාගිත්වයෙන් නිදහස් දින සැමරුම පැවැත්විය.

2020 මැයි 19 වන දින ඉරානයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහභාගිත්වයෙන් මෙම දූත මණ්ඩලය "වෙසක් ඩේ" සැමරුම් පැවැත්විය.

තවද, නේවාසික දූත මණ්ඩල විසින් සංවිධාන කරන ලද නිදහස් දින උත්සව හා සංස්කෘතික වැඩසටහන් සඳහා දූත මණ්ඩලය සහභාගී වී ඇත.

**ඊ. කම්කරු සුභසාධනය**

NMRP නිකුත් කිරීම සහ නැවත මෙරටට ගෙන්වා ගැනීම සඳහා පහසුකම් සලසමින් ශ්‍රී ලාංකික සේවා දායකයන්ගේ කොන්සියුලර් කටයුතු සඳහා දූත මණ්ඩලය සහාය දැක්විය.

ඊ. අසර්බයිජාන් ජනරජය ටෙහෙරානය (ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට අක්තගන්වා ඇත).

- ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අසර්බයිජානයට යවන ලද අපනයන නිෂ්පාදන පිළිබඳ තොරතුරු දූත මණ්ඩලය විසින් බෙදා හරින ලද අතර අසර්බයිජානයේ ව්‍යාපාරික ව්‍යාපාරික සගයන් සමඟ ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද මාර්ගගත ප්‍රවර්ධන සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම සඳහා තොරතුරු හුවමාරු කර ගන්නා ලදී.
- ශ්‍රී ලංකාවෙන් තේ, පොල්, සහ ඇඟලුම් අපනයනය කිරීමේ හැකියාව පිළිබඳව ටෙහෙරානයේ අසර්බයිජාන් තානාපති කාර්යාලය සමඟ සාකච්ඡා කෙරිණි.
- අසර්බයිජානයේ අධ්‍යාපන හා ව්‍යාපාරික ඉඩප්‍රස්ථා ඇති බැවින්, අසර්බයිජානයේ ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරයෙකු පත්කිරීමේ වැදගත්කම ටෙහෙරානයේ අසර්බයිජාන් තානාපති කාර්යාලය සමඟ සාකච්ඡා කෙරිණි.
- අසර්බයිජානයෙන් ඇති රැකියා ඉඩප්‍රස්ථා පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා පාර්ශ්වයට දූතමණ්ඩලය විසින් බෙදා හරින ලදී.

**උ. ටර්ක්මෙනිස්ථාන ජනරජය (ටෙහෙරානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට අක්තගන්වා ඇත)**.

- දෙරට අතර සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා දූතමණ්ඩලය ටෙහෙරානයේ ටර්කමෙනිස්ථාන් තානාපති කාර්යාලය සමඟ සාකච්ඡාවක් පැවැත්විය.

කපු කර්මාන්තයට ටර්කමෙනිස්ථාන් ප්‍රසිද්ධ බැවින් ටර්කමෙනිස්ථානයෙන් කපු ආනයනය කිරීමේ හැකියාව පිළිබඳව ද දූතමණ්ඩලය සාකච්ඡා පැවැත්විය.

සංස්කෘතිය, උරුමය, සංරක්ෂණය සහ ප්‍රවර්ධන පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමට ද මෙම දූත මණ්ඩලය ටර්කමෙනිස්ථාන පාර්ශ්වයට යෝජනා කළේය.

### 3. ඉරාක ජනරජය

අ. ද්විපාර්ශ්වික සබඳතා:

2020 හෝ 2 වැනි කාර්තුවේ දී, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ 9 වැනි ඉරාක - ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටුවේ දී (9 th ISLJCETC) ගිවිසුම් අවබෝධතා ගිවිසුම් දෙකකට (02) කොළඹ දී අත්සන් තැබීමට හා අපරානුමත කිරීමට නියමිතය.

- ශ්‍රී ලංකාව සහ ඉරාකය අතර දේශපාලන උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුමේ අවසන් කෙටුම්පතට අත්සන් තැබීමට හා අපරානුමත කිරීමට නියමිතය.
- රාජ්‍යතාන්ත්‍රික, විශේෂ, සේවා සහ නිල විදේශ ගමන් බලපත්‍ර හිමියන් අන්‍යෝන්‍ය වශයෙන් වීසා බලපත් ලබාගැනීමෙන් නිදහස් කිරීම පිළිබඳ ගිවිසුමට එළඹීම.
- දඩුවම් ලැබූ පුද්ගලයින් මාරු කිරීම පිළිබඳ ගිවිසුම; උදර්පනය ගිවිසුම;

සාපරාධී කටයුතු මර්දනයෙහිලා අන්‍යොන්‍ය නීති සහාය ලබාදීම පිළිබඳ ගිවිසුම යන ගිවිසුම්වලට එළඹීම සඳහා විදේශ සබඳතා අමාත්‍යාංශය කටයුතු ආරම්භ කරයි. ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ 9 වැනි ඉරාක ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටුවේ 9 වැනි රැස්වීම 9th (ISLJCETC) කොළඹ දී පැවැත්වීම. 1 වන 2 වන කාර්තුවේ දී ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා අමාත්‍යාංශයෙන් ඒ සඳහා ස්ථිර දින වකවානු ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- කොළඹ පැවැත්වෙන 9 වන ISLJCETC රැස්වීමට සහභාගී වීම සඳහා ඉරාක වෙළඳ අමාත්‍යාංශයේ නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණීම.
- ඉරාක භූමි බලකායේ මාණ්ඩලික ප්‍රධානී ජනරාල් අහමඩ් සලිම් බජ්ජත් උට්බි, 2019 අගෝස්තු මාසයේ කොළඹ පැවති ආරක්ෂක සම්මන්ත්‍රණයට සහභාගී විය.
- විශේෂ අමුත්තෙකු ලෙස ඉරාක ආරක්ෂක ප්‍රදර්ශනයට සහභාගී වීමට තානාපතිවරයාට ආරාධනා කර ඇත.

**ආ.බහුපාර්ශ්වික සම්බන්ධතා**

මෙම තානාපති කාර්යාලය, බැග්බෑඩ් සහ අර්බිල්වල පිහිටි සියලුම රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සමඟ සමීප සුහද සබඳතා පවත්වාගෙන යයි.

**ඇ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන:**

ආයෝජන ප්‍රවර්ධනය සහ සුරක්ෂා කිරීම පිළිබඳ ගිවිසුමේ වැඩකටයුතු කල් ඇතිව අවසන් කිරීම ද්විත්ව බදුකරණයෙන් වැළැක්වීම පිළිබඳ ගිවිසුමට මුල පිරීම. කොළඹ පැවති 9 වන ISLJCETC රැස්වීමේදී ඉරාක සහ ශ්‍රී ලංකා පාර්ශ්වය හමුවෙයි.

ඉරාක කුර්දිස්ථාන වෙළඳ සහ ආයෝජන නියෝජිත කණ්ඩායම 2020 ජනවාරි 27-30 දක්වා ශ්‍රී ලංකාවට පැමිණීම.

2020 දී කොළඹ දී ඉරාක කුර්දිස්ථාන වාණිජ හා කර්මාන්ත මණ්ඩලය හා ලංකා වාණිජ මණ්ඩලය අතර අත්සන් තැබීමට නියමිත අවබෝධතා ගිවිසුම සම්බන්ධ කටයුතු ආරම්භ කිරීම.

2020 දී කොළඹ පැවැත්වෙන මීළඟ 9 වන ISLJCETC රැස්වීමේ දී ඉරාකය සමඟ ව්‍යාපාරික කවුන්සිලය පිහිටුවීම සඳහා පියවර ගැනීම.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයසහ ශ්‍රී ලංකා තේ අපනයනකරුවන් 05 දෙනෙකු 2019 අප්‍රේල් 15 සිට 17 දක්වා බැග්බෑඩ් ජාත්‍යන්තර ප්‍රදර්ශන භූමියේදී පැවති 'ඉරාක කෘෂි ආහාර - බැග්බෑඩ් 2019' වෙළඳ ප්‍රදර්ශනයට සාර්ථකව සහභාගී විය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා තේ අපනයනකරුවන් 07 දෙනෙකු 'එර්බිල් ඇග්‍රෝ ආහාර -2019' වෙළඳ ප්‍රදර්ශනයට 2019 සැප්තැම්බර් 30 සිට ඔක්තෝබර් 3 දක්වා ඉරාකයේ කුර්දිස්ථාන පළාතේ අර්බිල් හි පැවති සාර්ථකව සහභාගී විය.

දෙවන විශාලතම ශ්‍රී ලංකා තේ ආනයනකරු වන ඉරාකය විසින් 2019 වසරේදී ලංකා තේ මෙ.ටො.38, 408 ක් ආනයනය කරන ලදී.

දූතමණ්ඩලය, ඉරාක වාණිජ හා කර්මාන්ත මණ්ඩල සමඟ ක්‍රමවත් පදනමක් ඔස්සේ රැස්වීම් පවත්වයි.

දූතමණ්ඩලය, ඉරාක සංචාරක හා විදේශ ගමන් නියෝජිත ආයතන සමඟ ක්‍රමවත් පදනමක් මත රැස්වීම් පවත්වනු ලබන අතර ඔවුන්ගේ ප්‍රදර්ශනවලට ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ලිපි ලේඛන සපයන ලදී.

**ඈ. සංස්කෘතික සබඳතා**

- තානාපතිවරයා නජාෆ් සහ කර්බාලා වෙත ගොස් සංස්කෘතිය හා ආගම ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහළ පෙළේ සම්භාවනීය අමුත්තන් හමුවිය.

**ඉ. කම්කරු සුබසාධනය**

ඉරාකයේ අර්බිල් හි වෙසෙන ශ්‍රී ලාංකික සංක්‍රමණික කම්කරුවන්ට ලබා දී ඇති නවාතැන් පහසුකම් තානාපතිවරයා විසින් පරීක්ෂා කර තිබේ. අඩි 40 ක බහාලුම්වල ලබාදී ඇති නවාතැන් සම්පූර්ණයෙන්ම වෙනස් කිරීම සඳහා සහ එර්බිල් ජාත්‍යන්තර ගුවන්තොටුපලේ සංක්‍රමණික සේවකයන් 200 ක් සඳහා නිසි හා ආරක්ෂිත ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා එක් නියෝජිතායතනයක කැමැත්ත ලබා ගත්තේය.

**4. ඊශ්‍රායල් රාජ්‍යය**

**අ.ද්විපාර්ශ්වික සබඳතා**

- තානාපතිවරයා, ඊශ්‍රායලයේ අයිලට් නගරාධිපති මීර් ඉට්ස්චක් හැලෙවි සමඟ රැස්වීමක් පැවැත්විය.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඉල්ලීම පරිදි, තානාපතිවරයා 2019 ජූනි 07 වන දින ඊශ්‍රායල් ගුවන් ගමන් අවකාශ කර්මාන්තවල (IAI) නිලධාරීන් හමුවිය.
- තානාපති කාර්යාලය 2019 සැප්තැම්බර් 01 සිට 14 දක්වා කාලය තුළදී ත්‍රිවිධ හමුදාවේ 14 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමකගේ ඊශ්‍රායලය සංචාරය සම්බන්ධීකරණය කළේය. එහි ප්‍රධානත්වය දරන ලද්දේ ශ්‍රී ලංකා යුධ හමුදාවේ ලුතිනන් කර්නල් බී.එන්.එස්.බී. රංගම මහතාය.

**ආ. බහුපාර්ශ්වික සම්බන්ධතා**

- ඊශ්‍රායලයේ ත්‍රස්ත මර්දන ආයතනය (ICT) විසින් 2019 සැප්තැම්බර් 09 සිට 12 දක්වා දිනවලදී හර්ස්ලියාවේ දී පවත්වන ලද 19 වන ලෝක ත්‍රස්ත මර්දන සමුළුවට සහභාගී විය.
- 2021-2024 යන කාල වකවානු සඳහා එක්සත් ජාතීන්ගේ ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CRPD) සඳහා ඊශ්‍රායලයේ අපේක්ෂකත්වයට ශ්‍රී ලංකාවේ සහය ඉල්ලා සිටි අතර 2025-2027 කාලසීමාව සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලයේ (ECOSOC) ශ්‍රී ලංකා අපේක්ෂකත්වයට ඊශ්‍රායලයේ සහාය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් අන්‍යෝන්‍ය පදනම මත ඊශ්‍රායලයට සහාය ලබා දෙන බව ශ්‍රී ලංකාව තහවුරු කර තිබේ.

### ඈ. ආර්ථික සම්බන්ධතා සහ විදේශ ආයෝජන, සංචාරක ප්‍රවර්ධනය

- තානාපති කාර්යාලය විසින් 2019 පෙබරවාරි 10 වන දින ටෙල් අවිව් හි ෂෙරටන් හෝටලයේ දී ශ්‍රී ලංකා සංචාරක මාර්ග සංදර්ශනය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහය ඇතිව සංවිධානය කරන ලදී. 25 වන ජාත්‍යන්තර මධ්‍යධරණී සංචාරක වෙළඳපොළ (IMTM) ට සමගාමීව මෙය සංවිධානය කරන ලද අතර 2019 පෙබරවාරි 12 සිට 13 දක්වා ටෙල් අවිව් සම්මේලන මධ්‍යස්ථානයේ දී පැවති ඊශ්‍රායලයේ වාර්ෂික ජාත්‍යන්තර සංචාරක මෙහෙයවන්නන්, සංචාරක නියෝජිතායතනවල නියෝජිතයින්, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ සංචාරක සමාගම් 08 ක නියෝජිතයින් 80 කට අධික පිරිසක් මේ සඳහා සහභාගී වූහ. ඉහත අංගවල අරමුණ වූයේ ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සහ අදහස් හුවමාරු කර ගැනීම, අනාගත ව්‍යාපාරික ඉඩප්‍රස්ථා පිළිබඳ ගවේශනය කිරීම හා ජාලකරණය සඳහා වේදිකාවක් සැපයීමය.

### වෙළඳ ප්‍රවර්ධනය

- තානාපතිවරයා ඊශ්‍රායලයේ ප්‍රමුඛ සමාගම්වල නියෝජිතයින් 8 දෙනෙකු හමුවිය. එනම් රොස්ඩෝර් ට්‍රේඩිං කම්පැනි, ODIS, ස්කැන්ඩිනේවියානු මැරීන් ඊවන් ප්‍රොඩක්ට්ස්, එස්.සී.ආර්.ඩයරි, ඒ.අස්රියල් කන්සල්ටින්, TAL ඒවියේෂන් සහ සුපර්කොම් එම සමාගම් අතර විය. ඊශ්‍රායල් වාණිජ මණ්ඩලයේ බල මණ්ඩලය (FICC) හරහා ශ්‍රී ලංකාව සමඟ ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම සඳහා 2019 ජනවාරි 07 වන දින මෙම සමාගම් හමුවිය.
- 2019 අගෝස්තු 12 සිට 24 දක්වා පේරුසලමේ පැවති 44 වන ජාත්‍යන්තර කලා හා ශිල්ප උළෙලට ශ්‍රී ලංකා සමාගම් දෙකක් වන සීමාසහිත රුවන් සමාගම (පුද්ගලික) සහ බ්ලූ ස්ටාර් සමාගම යන සමාගම්වල සහභාගිත්වය සංවිධානය කරන ලදී.
- නව තානාපතිවරයා 2019 නොවැම්බර් 06 වන දින ශ්‍රී ලංකාව සහ ඊශ්‍රායලය අතර වෙළඳාම ප්‍රවර්ධනය කිරීමේ හැකියාව පිළිබඳව ශ්‍රී ලංකා ඊශ්‍රායල් වාණිජ මණ්ඩලයේ සභාපති ඇනට් බර්න්ස්ටයින් රීච් මහත්මිය සමඟ සාකච්ඡා කළ අතර නව තානාපතිතුමා 2019 දෙසැම්බර් 29 වැනි දින ඊශ්‍රායල වාණිජ බල මණ්ඩලය හරහා වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ හැකියාව පිළිබඳව එහි සභාපති යූරියල් ලින් මහතා සමඟ සාකච්ඡාවක් ද පැවැත්විය.
- ශ්‍රී ලංකාවෙන් මැණික්/දියමන්ති ආනයනය කිරීමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා 2019 දෙසැම්බර් 17 වන දින ඊශ්‍රායල වටිනා ගල් සහ දියමන්ති හුවමාරු සමාගම විසින් සංවිධානය කරන ලද උළෙලට/ප්‍රදර්ශනයට නව තානාපතිවරයා සහභාගී වූ අතර ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ අංශය පිළිබඳ කෙටි ඉදිරිපත් කිරීමක් ද කළේය.

### වෙළඳ විමසීම්

- ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදන සැපයීම සම්බන්ධයෙන් තානාපති කාර්යාලයට ඊශ්‍රායල් සමාගමෙන් වෙළඳ විමසීමක් ලැබුණි. පොල් සංවර්ධන මණ්ඩලය/ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හරහා අදාළ පාර්ශ්වයට සහාය වීමට පියවර ගන්නා ලදී.

### ඈ. සංස්කෘතික සබඳතා

- තානාපති කාර්යාලය විසින් 2019 මාර්තු 20 වන දින චාන්සරි පරිශ්‍රයේ දී, 'ත්‍රිපිටකාභිවන්දනා සතිය' තුළදී ධර්මදේශනයක් සංවිධානය කළේය. 2019 මාර්තු 16 සිට 23 දක්වා කාලය ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් 'ත්‍රිපිටකාභිවන්දනා සතිය' ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. 2019 මැයි 25 වන දින ශ්‍රී ලාංකික භික්ෂුවකගේ සහභාගීත්වයෙන් වෙසක් උත්සවය චාන්සරි පරිශ්‍රයේ දී සමරනු ලැබීය.

### අධ්‍යාපනය

- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල සමඟ සහයෝගීතාව ඇති කර ගැනීමේ හැකියාව පිළිබඳව සොයාබැලීම සඳහා තානාපතිවරයා 2019 අප්‍රේල් 30 වන දින ටෙල් අවිව් විශ්ව විද්‍යාලයේ උප සභාපති මහාචාර්ය රනාන් රයින් සමඟ සාකච්ඡාවක් පැවැත්වීය.
- ගැලීලි ජාත්‍යන්තර කළමණාකරණ ආයතනය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සුදුසු විශ්ව විද්‍යාල හඳුනා ගැනීමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා තානාපතිවරයා විසින් 2019 මැයි මස 05 වන දින ගැලීලි ජාත්‍යන්තර කළමණාකරණ ආයතනයේ (GIMI) සභාපති ආචාර්ය ජෝශප් ෂෙවෙල් සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී.

### ඉ. කම්කරු සුබසාධනය/රැකියා නියුක්තිය

- ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් 70 දෙනෙකුට ඔවුන්ගේ රැකියා සම්බන්ධ ගැටළු විසඳීමට සහාය වූ අතර කම්කරු කටයුතු පිළිබඳ අංශයේ නිලධාරීහු රෝහල්ගතව සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණික කම්කරුවන් 03 දෙනෙකුට සහ සිරගෙවල්වල සහ රැඳවුම් මධ්‍යස්ථානවල සිටින ශ්‍රී ලාංකිකයින් 03 දෙනෙකුට එම ස්ථානවලට ගොස් සහාය වූහ.
- කම්කරු කටයුතු පිළිබඳ අංශය ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන් 644 ක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ලියාපදිංචි කර තිබේ.
- ඒකාබද්ධ නියමු වැඩසටහන යටතේ පෞද්ගලික බඳවා ගැනීමේ නියෝජිතවරුන් හරහා ඊශ්‍රායලයට පැමිණි රැකබලා ගන්නන් 197 දෙනෙකු හා ස්වයං පදනම හරහා පැමිණි රැකබලා ගන්නන් 1362 කට කම්කරු කටයුතු පිළිබඳ අංශ සහය විය.
- ඊශ්‍රායලයේ විශේෂිත ශ්‍රම වෙළඳපොළ අංශවල ශ්‍රී ලාංකික කම්කරුවන්ගේ තාවකාලික සේවා නියුක්තිය පිළිබඳ කෙටුම්පත් ගිවිසුමේ කටයුතු අවසන් කිරීමට දූතමණ්ඩලය විසින් පහසුකම් සපයන ලදී. මෙම ගිවිසුමට 2020 පෙබරවාරි මාසයේ දී අත්සන් තැබීමට නියමිතව තිබුණි.

### ඊ. වෙනත්

- 2019 අප්‍රේල් 21 වන දින ශ්‍රී ලංකාවේ පාස්කු ඉරිදා බෝම්බ පිපිරීමෙන් ජීවිත අහිමි වූවන් සිහිවීම හා ඔවුනට ගෞරවය පිණිස 2019 අප්‍රේල් 24 සහ 25 යන දිනවල චාන්සරි හිදී ශෝක ප්‍රකාශ පොතක් විවෘත කරන ලදී.
- ශ්‍රී ලංකාවේ පාස්කු ඉරිදා බෝම්බ පිපිරීමෙන් මියගිය අය සිහි කිරීම සඳහා ශ්‍රී ලංකා බෞද්ධ ප්‍රජාව සහ ක්‍රිස්තියානි ප්‍රජාව විසින් පිළිවෙලින් 2019 අප්‍රේල් 26 සහ 27 යන දිනවල සංවිධානය කරන ලද අනුස්මරණ මෙහෙයන්ට සහභාගී විය.

## 5. ජෝර්දාන රාජධානිය

### අ. ද්විපාර්ශ්වික සබඳතා

- තානාපතිවරයා ජෝර්දානයේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යවරයා සහ කම්කරු අමාත්‍යවරයා සමඟ සාකච්ඡා පැවැත්වූ අතර එහිදී ජෝර්දානයේ සිටින ශ්‍රී ලාංකිකයන්ගේ සුබසාධනය සඳහා වැදගත් මුලපිරීම් පිළිබඳව සාකච්ඡා කරන ලදී.
- තානාපතිවරයා රාජකීය පවුලේ සාමාජිකයන් වන ඩනා ෆිරාස් කුමරිය, බස්මා මයර්ඩ් බින් රාඩ් කුමරු සහ හසන් කුමරු සමඟ ජනවාරි සහ පෙබරවාරි මාසවලදී සාකච්ඡා පැවැත්වීය. අක්තපත්‍ර භාරදීම සඳහා සහ ජෝර්දාන - ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික
- 2019 දෙසැම්බර් 29 වන දින චාන්සරි පරිශ්‍රයේ දී ශ්‍රී ලංකා කතෝලික/ක්‍රිස්තියානි ප්‍රජාවේ සහභාගීත්වයෙන් නත්තල් උත්සවය සමරනු ලැබීය.

සබඳතා පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා තානාපතිවරයා ඔක්තෝබර් මාසයේ දී විදේශ කටයුතු අමාත්‍යාංශයේ සන්ධාන ප්‍රධානී සහ මහ ලේකම්වරයා හමුවිය.

- දෙසැම්බර් 2 වන දින තානාපතිවරයා ජෝර්දානයේ රජතුමා වන අබ්දුල්ලා රජතුමා වෙත අක්තපත්‍ර භාර දීමෙන් අනතුරුව, සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතා සහ සබඳතා වැඩි දියුණු කර ගැනීමේ මාර්ගය පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී. මෙහිදී විදේශ අමාත්‍යාංශ දෙක අතර දේශපාලන සාකච්ඡා ආරම්භ කළ යුතු බව තානාපතිවරයා යෝජනා කළේය. ඒ සඳහා කෙටුම්පත් අවබෝධතා ගිවිසුමක් ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් ජෝර්දාන විදේශ අමාත්‍යාංශයට භාරදෙන ලදී. එළඹීමට නියමිත පහත සඳහන් කෙටුම්පත් ගිවිසුම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්/ආසියා ඒකකය සමඟ වැඩිදුර රැස්වීම් පවත්වන ලදී.

    - දඬුවම් ලැබූ පුද්ගලයන් මාරු කිරීම පිළිබඳ කෙටුම්පත් ගිවිසුම.

- දෙසැම්බර් 2 වන දින තානාපතිවරයා ජෝර්දානයේ රජතුමා වන අබ්දුල්ලා රජතුමා වෙත අක්ත පත්‍ර භාරදීමෙන් අනතුරුව සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කර ගැනීමේ මාර්ග පිළිබඳව දීර්ඝයෙන් සාකච්ඡා කරන ලදී.

ජෝර්දානයේ සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ට සහාය වීම සඳහා තානාපතිවරයා, සංක්‍රමණ පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (IOM) ප්‍රධානියා හමුවී එම සංවිධානය සමඟ ඒකාබද්ධ සහයෝගිතාවයක් ඇති කර ගැනීමට ඇති ඉඩකඩ පිළිබඳව සාකච්ඡාවක් පැවැත්විණි.

ශ්‍රී ලංකාව සහ ජෝර්දානය අතර වඩාත් සමීප ශිෂ්‍ය හා අධ්‍යයන හුවමාරුව වැඩිදියුණු කිරීම සඳහා තානාපතිවරයා, ජෝර්දාන් විශ්වවිද්‍යාලයේ සභාපතිවරයා හමුවී ජෝර්දාන් විශ්ව විද්‍යාලය සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලය අතර අධ්‍යයන සහයෝගිතා යෝජිත අවබෝධතා ගිවිසුම පිළිබඳව සාකච්ඡා පැවැත්විය.

**ආ. ආර්ථික සම්බන්ධතා සහ විදේශ ආයෝජන**

ජෝර්දානයේ ආයෝජන නියෝජිත පිරිසකට ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා පහසුකම් සැලසීම සඳහා ජෝර්දාන් ආයෝජන අධිකාරියේ වැඩබලන සභාපති ෆරීඩන් හාර්තෝකා මහතා සමඟ පුළුල් සාකච්ඡා පැවැත්විණි.

දකුණු ආසියාවේ සුවිශේෂී සංචාරක ගමනාන්තයක් ලෙස ජෝර්දානයේ දී ශ්‍රී ලංකාව පිළිබඳ දැක්ම ප්‍රවර්ධනය කිරීම හා ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධනය කාර්යාංශයේ පහසුකම් ඇතිව මෙම දූතමණ්ඩලය විසින් 2019 අප්‍රේල් 3 වන දින රොටානා හෝටලයේ දී ශ්‍රී ලංකා සංචාරක මාර්ග සංදර්ශනයක් සංවිධානය කරන ලදී. මෙම මාර්ග සංදර්ශනය ජෝර්දාන මහජනතාව අතර සැලකිය යුතු උනන්දුවක් ඇති කළේය.

තානාපතිවරයා අම්මාන් වාණිජ මණ්ඩලයේ හා ජෝර්දාන් වාණිජ මණ්ඩලයේ සභාපතිවරුන් සමඟ ජෝර්දානයට අපනයනය වැඩි කිරීම සඳහා කෙසෙල් සහ අඹ ශ්‍රී ලංකාවෙන් ජෝර්දානයට අපනයනය කිරීම අත්හිටුවීම ඉවත් කිරීමේ හදිසි අවශ්‍යතාව පිළිබඳව දැනුම් දුන්නේය. තානාපති කාර්යාලය විසින් 2020 දී පැවැත්වීමට නියමිත ජෝර්දාන් වාණිජ මණ්ඩලයේ සභාපතිවරයා හමුවිය. (මෙය 2020 පෙබරවාරි 26 දින පැවැත්විණි).

2020 ජූනි මාසයේ දී පැවැත්වීමට නියමිත ජෝර්දාන ආහාර අන්තර්ජාතික ප්‍රදර්ශනයට ශ්‍රී ලංකාවේ සහභාගිත්වය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා තානාපතිවරයා IPCO හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හමුවිය. මේ සඳහා ශ්‍රී ලංකාව සහභාගී වන්නේ ප්‍රථම වතාවටය. ලංකා තේ සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් දෙරට අතර ද්විපාර්ශ්වික වෙළඳාම වැඩි කිරීම සඳහා පලස්තීන "ට්‍රේඩිං කම්පැනි" හි ප්‍රධානියා (ජෝර්දානයට ලංකා තේ විශාලතම ආනයනකරු) ජෝර්දානයේ ලංකා තේ සඳහා වෙළඳපොල කොටස් තවදුරටත් ඉහළ නැංවීම පිළිබඳව තානාපතිවරයා සමඟ පුළුල් සාකච්ඡා පැවැත්විය.

- ජෝර්දානයේ සිට ශ්‍රී ලංකාවට සංචාරය කිරීමේ කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සහ ජෝර්දාන මාධ්‍යවේදීන් සඳහා ශ්‍රී ලංකාවේ දී හුරුපුරුදු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම පිළිබඳව තානාපතිවරයා ජෝර්දාන් සංචාරක මණ්ඩලයේ සභාපති ආචාර්ය අරාබියාත් සමඟ සාකච්ඡාවක් පැවැත්විය.

**සංස්කෘතික සබඳතා**

- මෙම දූත මණ්ඩලය, 2019 පෙබරවාරි 06 වන දින අල් හුසේන් සංස්කෘතික මධ්‍යස්ථානයේ දී වන්දන වික්‍රමසිංහ නැටුම් කණ්ඩායමේ රඟදැක්වීමක් සහිතව ශ්‍රී ලංකා සංස්කෘතික ප්‍රදර්ශනයක් සංවිධානය කළ අතර ශ්‍රී ලාංකික සංස්කෘතිය සහ ආහාර පිසීම ප්‍රදර්ශනය කිරීම සඳහා ග්‍රෑන්ඩ් හයට් හෝටලයේ දී සංස්කෘතික සංදර්ශනයක් ද සංවිධානය කළේය.
- 2019 අප්‍රේල් මාසයේ බක් පුර පසළොස්වක පෙහොය දිනයේ, ශ්‍රී ලංකා ප්‍රජාව වෙනුවෙන් මෙම දූත මණ්ඩලය පුස්සැල්ලයායේ චන්දිම ස්වාමීන් වහන්සේ ධර්ම දේශන වැඩසටහනක් පවත්වන ලදී.
- ඔක්තෝම්බර් මාසයේ දී, බාස්මා බින්ට් තලාල් කුමරියගේ පදනම විසින් සංවිධානය කරන ලද වාර්ෂික රාජ්‍යතාන්ත්‍රික වෙළඳපළට මෙම දූත මණ්ඩලය සක්‍රීයව සහභාගී විය. රාජකීය පවුලේ අනුග්‍රහය යටතේ පැවැත්වෙන වැදගත්ම රාජ්‍යතාන්ත්‍රික වෙළඳපළ මෙයයි. ශ්‍රී ලංකාවේ ඉහළ පෙළේ සහ විවිධාකාර වෙළඳ නාම ප්‍රදර්ශනය කිරීම සඳහා ආහාර ද්‍රව්‍ය, ලංකා තේ, අත්කම්, ආයුර්වේද නිෂ්පාදන සහ ශ්‍රී ලංකා ආලේපන මෙම තානාපති කාර්යාලය විසින් ප්‍රදර්ශනය කරන ලදී.
- 2020 සඳහා "රටවල් කෙරෙහි අවධානය යොමු කිරීම" වැඩසටහන යටතේ රෝයා රූපවාහිනී වැඩසටහනට ශ්‍රී ලංකාව ඇතුළත් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා තානාපතිවරයා රෝයා රූපවාහිනී මාධ්‍යවේදීන් දෙදෙනෙකු හමුවිය.
- ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි ප්‍රමුඛ ජෝර්දාන සංචාරක කර්මාන්ත නියෝජිතයින් සහ ප්‍රමුඛ පෙළේ ගුවන් සමාගම්වල කළමනාකරුවන් සඳහා සුවදායක සංචාරක කටයුතු පිළබඳ ශ්‍රී ලංකා සංචාර ප්‍රවර්ධන වැඩමුළුවක් 2019 දෙසැම්බර්09 වන දින තානාපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්විණි. මෙම වැඩමුළුව අතරතුර දී ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට ආකර්ෂණයන්හි විවිධත්වය පිළිබඳ දළ විශ්ලේෂණයක් සිදු කරන ලද අතර ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට සහ ශ්‍රී ලංකාවේ සුවදායී සංචාරක පහසුකම් අත්විඳීමට ජෝර්දාන වැසියන් දිරිමත් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ සංක්‍රමණික ශ්‍රම බලකායට ගෞරවය දැක්වීම සඳහා තානාපති කාර්යාලය 2019 දෙසැම්බර් 12 වන දින අම්මන් හි කොලොම්බියා ගෝලීය මධ්‍යස්ථානයේ දී සංක්‍රමණිකයන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය සමඟ එක්ව ජාත්‍යන්තර සංක්‍රමණික දිනය සමරනු ලැබීය. ශ්‍රී ලංකාවේ සංක්‍රමණික ශ්‍රම බලකාය දැනට ජෝර්දානයේ තුන්වන විශාලතම සංක්‍රමණික ශ්‍රම බලකාය වේ. එහිදී ශ්‍රී ලංකාව පිළිබඳ අරාබි භාෂාවෙන් ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.
- නත්තල් දේශනයක් පැවැත්වූ පීටර් උපාලි ගරු පියතුමාගේ සහභාගීත්වයෙන් තානාපති කාර්යාලය විසින් වාර්ෂිකව නත්තල් සැමරුම් උත්සවය තානාපති කාර්යාල පරිශ්‍රයේ දී සංවිධානය කරන ලදී.

**ආ. කම්කරු සුබසාධනය**

- ශ්‍රී ලංකාවේ රැඳවියන්ගේ සුබසාධනය පිළිබඳව සොයා බැලීම සඳහා තානාපතිවරයා සහ කාර්ය මණ්ඩලය නිරතුරුවම ජුවෙයිඩේ, නඩාරා (නැගෙනහිර සහ බටහිර අම්මාන්) සහ සුවකාහි රැඳවුම් මධ්‍යස්ථාන වෙත යයි.
- ශ්‍රී ලාංකිකයන්ගේ සුබසාධන හා ජීවන තත්ත්වයන් පිළිබඳව සොයා බැලීමට ඔවුන් සේවය කරන ඇඟලුම් කර්මාන්තශාලා වෙතටද මොවුහු යති.

- ඊ.ඒ.එම්. මැලිබන් ටෙක්ස්ටයිල්ස් කර්මාන්තශාලාව විසින් පරිත්‍යාග කරන ලද රැඳවුම් මධ්‍යස්ථාන /බන්ධනාගාරවල සිටින සියලුම ශ්‍රී ලාංකික රැඳවියන්ට ශීත ඇඳුම් කට්ටල පරිත්‍යාග කිරීමට අවශ්‍ය කටයුතු තානාපති කාර්යාල විසින් ඉටු කරන ලදී.
- ශ්‍රී ලාංකිකයන් 1500කට පමණ ජංගම කොන්සියුලර් සේවාවක් ඉර්බිඩ් නගරයේ ක්ලැසික් විලාසිතා ඇඟලුම් කම්හල් පරිශ්‍රයේදී පැවැත්විණි. සංක්‍රමණික ශ්‍රී ලාංකික කම්කරුවන් සේවය කරන හා වාසය කරන දුර බැහැර ප්‍රදේශවලට කොන්සියුලර් සේවා සැපයීම සඳහා මෙය සිදු කරන ලදී.
- විවිධ චෝදනා මත අධිකරණයේ පෙනී සිටින ශ්‍රී ලාංකිකයන්ගේ සියලුම නඩු සඳහා තානාපති කාර්යාලයේ කාර්ය මණ්ඩලය සහභාගී විය. මෙම නඩු අම්මාන් සහ ඉර්බිඩ් හි දී පැවැත්විණි.
- උසාවියේ දී චෝදනා ලැබ සිටින ශ්‍රී ලාංකිකයන්ගේ සුබසාධනය සහ යහපැවැත්ම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා තානාපතිවරයා සහ කාර්ය මණ්ඩලය සැමවිටම පාහේ ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් උසාවියේ පෙනී සිටින නීතිඥයින් හමුවිය.
- වසර 20 ක් තිස්සේ වැටුප් නොගෙවූ ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවක් සඳහා නොවැම්බර් 28 වන දින ශ්‍රී ලංකා රුපියල් මිලියන 5.6 ක වන්දි මුදලක් ලබා ගැනීමට තානාපති කාර්යාලයට හැකි විය. තවද, මැයි 7 වන දින තවත් ගෘහ සේවිකාවක් සඳහා ඇමරිකානු ඩොලර් 20,000 ක් ලබා ගැනීමට තානාපති කාර්යාලයට හැකි විය.
- 2019 දී ශ්‍රී ලාංකිකයින් සඳහා රැකියා අවස්ථා වැඩිකිරීමට තානාපති කාර්යාලයේ කම්කරු අංශය සමත් වූ අතර එය 2018 ට වඩා 11% ක වැඩිවීමකි.
- තානාපති කාර්යාලය විසින් පලායන ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් නැවත මෙරටට ගෙන්වා ගන්නා තෙක් ඔවුන්ගේ රැකවරණය සහතික කිරීම සඳහා ආරක්ෂිත නිවසක් පවත්වාගෙන යනු ලැබේ. ජෝර්දානයේ රැකියා සඳහා යන ශ්‍රී ලාංකිකයන් සඳහා ඇති රෙගුලාසි පිළිබඳව ජෝර්දාන රැකියා ඒජන්සි දැනුවත් කිරීම සඳහා තානාපති කාර්යාලය දෙසැම්බර් 31 දින වැඩමුළුවක් පවත්වන ලදී.

**6. කුවේට් රාජ්‍යය**

**අ. ද්විපාර්ශ්වික සබඳතා**

- 2019 දී ශ්‍රී ලංකාව සහ කුවේට් අතර ද්විපාර්ශ්වික සබඳතා අඛණ්ඩව වර්ධනය වූ අතර මෙම සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ වැදගත්කම කුවේටිහි එමීර්වරයා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් දූත මණ්ඩල ප්‍රධානියා සමඟ අක්තපත්‍ර ප්‍රදානයෙන් අනතුරුව පැවති සාකච්ඡාවලදී අවධාරණය කළහ.
- 2018 දී ශ්‍රී ලංකාවට ආසියානු කටයුතු පිළිබඳ සහකාර විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරයේ දී පවත්වන ලද රැස්වීමේ දී හා 2018 ඔක්තෝබර් මස පවත්වන ලද වෙළෙඳාම තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකා-කුවේට් 2 වැනි ඒකාබද්ධ රැස්වීමේ දී පැමිණි තීරණ පිළිබඳව පසු විපරම් කිරීම ඇතුළු විවිධ ආකාරවලින් මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා තානාපති කාර්යාලය අවශ්‍ය පියවර ගෙන තිබේ.
- දඩුවම් ලැබූ පුද්ගලයින් මාරු කිරීම පිළිබඳ ගිවිසුමේ උදර්පන ගිවිසුමේ සහ විධිවිධානවලට අනුව, කුවේටයේ සිටින ශ්‍රී ලාංකික සිරකරුවන් මාරු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට තානාපති කාර්යාලය පියවර ගත්තේය. දූත මණ්ඩල ප්‍රධානියා, අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කර නඩු විස්තර, සිරකරුවන්ගේ ලැයිස්තුව, සිදු කළ වැරදි සහ ඔවුන්ගේ සෞඛ්‍ය තත්වයන් පිළිබඳ තොරතුරු ලබාගෙන ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ හා රේඛීය ආයතනවලට ලබාදෙන ලදී. බුද්ධි අංශ හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් අදාළ සාකච්ඡා සහ මෙම විෂය පිළිබඳව අවබෝධතා ගිවිසුමකට එළඹීමේ හැකියාව පිළිබඳව ද නීති උපදේශකවරයා සමඟ සාකච්ඡා කරන ලදී.
- මෙම දූත මණ්ඩලය, කුවේටයේ රතු අඩසඳ සංගමයේ පරිත්‍යාගයක් ලෙස යාපනය ශික්ෂණ රෝහලේ පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඉදිකිරීම පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.
- සංක්‍රමණික සේවකයින්ගේ විවිධ ගැටලු සහ සුබසාධනය හා වන්දි ගෙවීම්වලට අදාළ කටයුතු රැසක් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා කොන්සියුලර් කටයුතු පිළිබඳ සහකාර විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ රැස්වීම් පවත්වන ලදී.

### ආ. බහුපාර්ශ්වික සබඳතා

- මෙම දූත මණ්ඩලය කුවේටයේ පැවති ආසියානු සහයෝගිතා සංවාද (ACD) සියලුම වාර රැස්වීම්වලට සහභාගී වූ අතර තෙවන රටවල පැවති අංග පිළිබඳව අමාත්‍යාංශය සහ අනෙකුත් රේඛීය ආයතන සමඟ පසු විපරම් කටයුතු සිදු කරන ලදී. ජූලි මාසයේ බැංකොක් නුවර පැවති ආසියානු සහයෝගිතා සංවාද මහලේකම් කාර්යාලයේ ආයතනික ව්‍යුහය පිළිබඳ එම සංවාදයේ ඉහළ මට්ටමේ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමට ශ්‍රී ලංකාවේ සහභාගීත්වය දූත මණ්ඩලය විසින් සම්බන්ධීකරණය කර සහතික කරන ලදී.

### ඇ. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

- මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය පිහිටුවීම සඳහා, සංවර්ධනය හා සහයෝගිතාවය සඳහා කුවේට් අරමුදලේ ණය පහසුකම පිළිබඳව දූත මණ්ඩල ප්‍රධානියා මොරටුව විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමා සහ කොළඹ විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්තුමා හමුවිය.
- සංවර්ධනය හා සහයෝගිතාව සඳහා කුවේට් අරමුදලේ ප්‍රාදේශීය කළමණාකරුගේ සහ නියෝජිත කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරයට තානාපති කාර්යාලය පහසුකම් සලසා ඇති අතර මොරටුව විශ්ව විද්‍යාලය සඳහා වෛද්‍ය පීඨය පිහිටුවීම හා කළු ගඟ ව්‍යාපෘතියේ තෙවන අදියර සඳහා අතිරේක ණය පහසුකම සම්බන්ධයෙන් කොළඹ දී රැස්වීම් පැවැත්විය.
- කුවේට් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (KCCI) සහ ශ්‍රී ලංකාවේ ජාතික වාණිජ මණ්ඩලය අතර යෝජිත ගිවිසුමේ වැඩකටයුතු අවසන් කිරීම සම්බන්ධයෙන් දෙසැම්බර් මාසයේදී කුවේට් කර්මාන්ත හා වාණිජ මණ්ඩල නිලධාරීන් සමඟ රැස්වීමක් පැවැත්වූ අතර ගිවිසුමට අත්සන් තැබීමට එකඟ විය. ආගන්තුක සත්කාර අංශයේ ආයෝජන, ශ්‍රී ලංකාවෙන් පළතුරු සහ එළවළු ආනයනය කිරීම සහ ඔවුන්ගේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා දක්ෂ ශ්‍රී ලාංකිකයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් BTC සමූහ ව්‍යාපාරයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා ඇතුළු ව්‍යාපාරිකයන් සමඟ සාකච්ඡා පැවැත්විය.

### ඈ. සංස්කෘතික සබඳතා

- නිදහස් දින සැමරුම්වල ධජය එසවීමේ උත්සවයේ දී ශ්‍රී ලංකාවේ සංස්කෘතිය විදහා දැක්වීය. මේ සඳහා කොළඹ සිට සංස්කෘතික කණ්ඩායමක් කුවේටය වෙත ගිය අතර රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව, කුවේට් රජයේ නිලධාරීන්, ව්‍යාපාරික ප්‍රජාව සහ කුවේටයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව සහ සංක්‍රමණික සේවකයන් ඇතුළු ශ්‍රී ලාංකික ප්‍රජාව, සඳහා උත්සවාංග දෙකක් සංවිධානය කරන ලදී.
- තෙපොංගල් සහ සිංහල හින්දු අලුත් අවුරුද්ද තානාපති කාර්යාල පරිශ්‍රයේ දී ආරක්ෂිත නිවාස රැඳවියන් සමඟ සමරනු ලැබීය. තානාපති කාර්යාලය කුවේටයේ ශ්‍රී ලංකා අවමංගල්‍ය අරමුදල සමඟ එක්ව අලුත් අවුරුදු උත්සවයක් සංවිධානය කළ අතර එය ශ්‍රී ලාංකික සංක්‍රමණික කම්කරුවන් දහස් ගණනකගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. ඔලගන්වන්නේ වන්ද්‍රසිරි ස්වාමීන් වහන්සේගේ විශේෂ ධර්ම දේශනයක් 2019 දෙසැම්බර් මාසයේදී සංවිධානය කරන ලදී.
- කුවේට් හි ශ්‍රී ලංකා අවමංගල්‍ය අරමුදල හා එක්ව තානාපති කාර්යාලය විසින් තෙදින ආගමික වැඩසටහනක් සංවිධානයකරන ලද අතර 2019 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ සිට කුවේටය බලාගිය බෞද්ධ භික්ෂූන් වහන්සේලා 06 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පිරිත් දේශනයක්, සීල ව්‍යාපාරයක් හා දන් පිළිගැන්වීමක් සංවිධානය කෙරිණි.
- 2019.12.23 දින තානාපති කාර්යාල පරිශ්‍රයේ දී ගැලවීමේ හමුදාවේ සහාය ඇතිව නත්තල් උත්සවය පැවැත්විණි. නත්තල් බැති ගී ගායනා කරන ලද අතර ආරක්ෂක නිවස්නයේ රැඳවියන්ට විශේෂ තෑගි පිරිනමන ලදී. ඉන් අනතුරුව සහභාගී වූ සියලු දෙනාටම කෙටි සංග්‍රහයක් පවත්වන ලදී.

**ඉ. කම්කරු සුබසාධනය**

2012 දී අත්සන් තබන ලද කම්කරු, බඳවා ගැනීමේ හා මිනිස්බල සංවර්ධනය පිළිබඳ අවබෝධතා ගිවිසුමේ විධිවිධානවලට අනුව ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම පිහිටුවීම සම්බන්ධයෙන් කුවේටයේ මිනිස්බල සඳහා වූ රාජ්‍ය අධිකාරිය සමඟ මෙම දූතමණ්ඩලය කටයුතු සම්බන්ධීකරණය කළේය. පුද්ගල ජාවාරම සම්බන්ධ ගැටලු විසඳීමේ අරමුණින් මෙම දූත මණ්ඩලය විදේශ කටයුතු අමාත්‍යාංශය, මිනිස්බල පිළිබඳ රාජ්‍ය අධිකාරී දෙපාර්තමේන්තුව, ගෘහස්ථ කම්කරු දෙපාර්තමේන්තු, කුවේටයේ පිහිටි සංක්‍රමණිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධාන කාර්යාලය යන ආයතන කිහිපයක් නියෝජනය කළේය.

සංක්‍රමණික ශ්‍රමිකයන් විශාල පිරිසකට ඔවුන් මුහුණ දී ඇති විවිධ අභියෝග ජය ගැනීම, සේවකයින්, සේවා යෝජකයින්/අනුග්‍රාහකයින් සහ නියෝජිත ආයතන අතර මැදිහත්වී කටයුතු කිරීම සහ එම ගැටලු විසඳීම සඳහා මෙම දූත මණ්ඩලය සහාය ලබා දී ඇත. 2019 ජනවාරි01 සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සේවයේ නියුතු ගෘහ සේවක සේවිකාවන්ට අදාළව වාර්තා වී ඇති පැමිණිලි සංඛ්‍යාව 2357 කි.

i. කම්කරුවන්ගේ නියමිත වැටුප් ලබා ගැනීමට මැදිහත් වීම.

අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කිරීමෙන් හා කම්කරු අමාත්‍යාංශය, ගෘහ සේවක දෙපාර්තමේන්තුව සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නිසි බලධාරීන් වෙත යොමු කිරීමෙන් සංක්‍රමණික කම්කරුවන් කිහිප දෙනෙකුගේ වැටුප් අයකර ගැනීමට දූත මණ්ඩලය මැදිහත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2019 දී සංක්‍රමණික කම්කරුවන් 48 දෙනෙකුගේ හිඟ වැටුප් මුදල් ලෙස ශ්‍රී ලංකා රුපියල් මිලියන 4.7 ට සමාන කුවේට් ඩිනාර් 8061/- ක මුදලක් අයකර ගැනීමට මෙම දූත මණ්ඩලයට හැකි විය.

ii. රෝහල් සංචාර

මෙම දූත මණ්ඩලය ශ්‍රී ලාංකික රෝගීන්ට උපකාර කිරීම සඳහා රෝහල් වෙතට ගියේය. මෙම දූත මණ්ඩලයේ මැදිහත්වීම මත රු.මිලියන 16.5 සමාන කුවේට් ඩිනාර් 27, 950/- ක රෝහල් ගාස්තු වලින් නිදහස් කර රෝගීන් 10 දෙනෙකු ආපසු මෙරටට ගෙන්වා ගන්නා ලදී.

iii. තානාපති කාර්යාලයීය ආරක්ෂිත නිවස්නය

විවිධ දුෂ්කරතා හේතුවෙන් තම සේවා ස්ථානවලින් පලා ආ කාන්තා ගෘහ සේවිකාවන් සඳහා රැකවරණය මෙම දූත මණ්ඩලය විසින් ලබාදෙනු ලබයි. පලා ආ කාන්තා සංක්‍රමණික සේවිකාවන් 1080 ක් 2019 දී ආරක්ෂිත නිවසට වාර්තා කර තිබේ. මෙම දූත මණ්ඩලය මගින් සාමාන්‍යයෙන් කාන්තා සේවිකාවන් 150 ක් පමණ ආරක්ෂිත නිවසේ කඩත්තු කරනු ලැබීය.

iv. නැවත මෙරටට ගෙන්වා ගැනීම

ශ්‍රී ලාංකිකයන් 1073 දෙනෙකු නැවත ගෙන්වා ගැනීම සඳහා දූත මණ්ඩලය මැදිහත් විය. ආරක්ෂිත නිවස්නයට වාර්තා කළ ශ්‍රී ලාංකිකයින් සඳහා නව රැකියා අවස්ථා ලබා ගැනීම සඳහා දූත මණ්ඩලය කුවේටයේ විදේශ රැකියා ඒජන්සි සහ කීර්තිමත් ව්‍යාපාරික ආයතන වෙත බොහෝ වාර ගණනක් ගිය අතර පිළිගත් සමාගම් සහ නියෝජිත ආයතනවලින් රැකියා ඇණවුම් 503 ක් ලබා ගත්තේය.

v. බන්ධනාගාර වෙත යාම

මෙම කාලය තුළ දූත මණ්ඩලය අවස්ථා 07 කදී මධ්‍යම බන්ධනාගාරයට ගියේය. රැඳවියන් සඳහා කොන්සියුලර් ආධාර ලබා දීම සහ නැවත මෙරටට ගෙන්වා ගැනීමේ කටයුතු වේගවත් කිරීම සඳහා පිටුවහල් කිරීමේ කඳවුරට සහ රජයේ රැකවරණ මධ්‍යස්ථානය වෙතද යාමට දූත මණ්ඩලයට සිදුවිය. කුවේට් බන්ධනාගාරවල රඳවා සිටින ශ්‍රී ලාංකිකයන් පිරිස 200 ක් වන අතර ඔවුන්ගේ 160ක් පිරිමින් හා 40 ක් කාන්තාවන් වෙයි.

## 7. ලෙබනන් ජනරජය

අ. ද්විපාර්ශ්වික සබඳතා

- ලෙබනන් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද කෙටුම්පත් ගිවිසුම් :
    - රාජ්‍යතාන්ත්‍රික, විශේෂ, නිල සහ සේවා විදේශ ගමන් බලපත්‍ර හිමියන් වීසා බලපත්‍ර ලබාගැනීමෙන් නිදහස් කිරීම පිළිබඳ ගිවිසුම.
    - දේශපාලන උපදේශනය පිළිබඳ අවබෝධතා ගිවිසුම
- කෙටුම්පත් ගිවිසුම් හතක් සහ අවබෝධතා ගිවිසුමක් සකස් කරමින් පවතී.
- තානාපතිවරයා විසින් ජනාධිපති, විදේශ කටයුතු අමාත්‍ය, ලෙබනන් පාර්ලිමේන්තුවේ කථානායක, කම්කරු අමාත්‍ය, අධිකරණ අමාත්‍ය, මහජන සෞඛ්‍ය අමාත්‍ය, ආර්ථික හා වෙළඳ අමාත්‍ය සහ අභ්‍යන්තර කටයුතු අමාත්‍ය හමුවන ලදී.
- අලුතින් පත් කරන ලද තානාපතිවරිය විසින් 2019 සැප්තැම්බර් 11 වන දින ලෙබනන් ජනරජයේ ජනාධිපති අතිගරු ජනරාල් මයිකල් අවුන් වෙත අභිප්‍රාය ප්‍රකාශ කිරීමේ ලිපිය ප්‍රදානය කරන ලදී. ඇය ලෙබනන් ජනරජ පාර්ලිමේන්තුව, අධිකරණ අමාත්‍ය, කම්කරු අමාත්‍ය හා ආරක්ෂක අමාත්‍යතුමා හමුවිය.
- අක්තපත්‍ර ඉදිරිපත් කිරීම සඳහා එකඟතාවය ලබා ගැනීමට සිරියානු අරාබි ජනරජයේ ජනාධිපතිවරයා වෙත යොමු කරන ලද අභිලාෂය ප්‍රකාශ කිරීමේ ලිපිවල පිටපත් සිරියානු බලධාරීන් වෙත යොමු කරන ලදී.

### ආ. බහුපාර්ශ්වීය සම්බන්ධතා

- 2019 ජනවාරි 22, 2019 ජූලි 18 සහ 2019 නොවැම්බර් 12 යන දිනවල UNIFIL හවුස් හි පැවති UNIFIL මෙහෙයුම් පිළිබඳ රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡාවට තානාපතිතුමා සහභාගී විය.
- 2019 පෙබරවාරි 20 වන දින ස්විට්සර්ලන්තයේ සංවර්ධන හා සහයෝගිතා නියෝජිතායතනය (SDC) විසින් ලෙබනනයේ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලද සංක්‍රමණ සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය වැඩසටහනට GPMD මෙම දූත මණ්ඩලය සහභාගී විය; ලෙබනන් කාන්තා කවුන්සිලය විසින් එක්සත් ජාතීන්ගේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම සහ අරාබි කාන්තා සංවිධානය සමඟ එක්ව සංවිධානය කරන ලද අරාබි කාන්තාවන්ගේ යතාර්ථයට දේශපාලන, ආර්ථික හා සමාජීය වෙනස්කම්වල බලපෑම පිළිබඳ 2019 පෙබරවාරි 21 දින පැවති කලාපීය සමුළුවට සහභාගී විය. බීරූට් හි සංක්‍රමණිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ ජාවාරම්වලට එරෙහි ප්‍රතිචාරය පිළිබඳ කලාපීය සංවාදයට සහභාගී විය.
- තානාපතිවරයා, 2019 නොවැම්බර් 15 වන දින දූත මණ්ඩල ප්‍රධානි හා UNIFIL හි අණදෙන නිලධාරී මේජර් ජනරාල් ස්ටෙෆානෝ ඩෙල් කොල් සමඟ සාකච්ඡා පැවැත්වීය.

### ආර්ථික සම්බන්ධතා සහ විදේශ ආයෝජන

- 2019 දී ශ්‍රී ලංකාවේ සිට ලෙබනනයට අපනයනය කළ භාණ්ඩවල වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 23.91 ලෙස සටහන් වූ අතර සිරියාව ශ්‍රී ලංකාවෙන් ඩොලර් මිලියන 55.38 ක් වටිනා භාණ්ඩ ආනයනය කර තිබේ.
- ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන යටතේ, තානාපති කාර්යාලය ශ්‍රී ලංකාවේ 71වන නිදහස් දිනය සැමරීම සඳහා 2019 පෙබරවාරි 05 සිට 08 දක්වා වෙළඳ සල්පිලක් සංවිධානය කළේය. තානාපති කාර්යාලය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එක්ව, ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා 2019 අප්‍රේල් 05 වැනි දින බීරූට් හි රැඩිසාන් බ්ලූ මාර්ටිෆස් හෝටලේයේ දී වෙළඳ සංදර්ශනයක් සංවිධානය කරන ලදී. ලෙබනනයේ සංචාරක මෙහෙයවන්නන්ගේ සහ සංචාරක නියෝජිතායතන, ගුවන් සමාගම් හා මාධ්‍යවේදීන් ශ්‍රී ලංකාවේ සංචාරක නියෝජිතායතන, සංචාරක ගමනාන්ත කළමනාකරණය කිරීමේ සමාගම්වල නියෝජිතයන් විස්සකට වැඩි පිරිසක් මීට සහභාගී වූහ.

- ලෙබනනයේ කෘෂිකාර්මික පර්යේෂණ ආයතනයේ ත්‍රිපුද්ගල කෘෂිකාර්මික විශේෂඥයින් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග හා ධීවර හා සම්පත් සංවර්ධන අමාත්‍යාංශවල 2019 අගෝස්තු 20 දින සිට දින පහක ක්ෂේත්‍ර සංචාරයක නියැලිණි. තානාපති කාර්යාලයේ සහයෝගීතා ප්‍රයත්න යටතේ, ශ්‍රී ලංකා ලංකා බැංකුවේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් නියෝජිත කණ්ඩායමක් 2019 සැප්තැම්බර් 6 වන දින, දින හතරක සංචාරයක් සඳහා බීරූට් වෙත පැමිණි අතර ලෙබනනයට ස්ථිර බැංකු නියෝජිතයෙකු පත් කිරීම මුල්කරගෙන මෙම සංචාරය සිදුවිය.
- ශ්‍රී ලංකා සහ ලෙබනන් වෙළෙඳුන්ට පහසුකම් සැපයීම- HORECA වෙළඳ ප්‍රදර්ශනය මෙය 2019 අප්‍රේල් 2 සිට 5 දක්වා "සී සයිඩ් ඇරේනා" හිදී පැවැති අතර එයට අක්බාර් බුදර්ස් (පුද්) සමාගම සහභාගී විය.
- ශ්‍රී ලංකාවෙන් තේ ආනයනය කිරීම සම්බන්ධයෙන් රේඩාර් සමූහ ව්‍යාපාරයේ (ලෙබනන් ජාතික) සීනඹ් හස්මි ශ්‍රී ලංකා බලධාරීන් සමඟ සම්බන්ධ විය.
- වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා සිරියාවේ රාජ්‍යතාන්ත්‍රික සමාජය විසින් සංවිධානය කරන ලද අපේ උරුම උළෙල, ඩී.එස්.ඒ.එල්. ජාත්‍යන්තර පුණ්‍යායතනය සහ ජාත්‍යන්තර බසාර් සඳහා සහභාගී විය. අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු අංශයේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු යටතේ මෙම දූත මණ්ඩලය, නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම සඳහා චාන්සරි පරිශ්‍රයේ ප්‍රදර්ශන කැබිනෙට්ටුවක් පිහිටුවන ලදී.
- ලෙබනනයේ සිටින ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රේෂණ යැවීම පහසු කිරීම සඳහා කොමර්ෂල් බැංකුවේ සහ ලංකා බැංකුවේ නියෝජිතයින්ගේ පැමිණීමට තානාපති කාර්යාලය පහසුකම් සැලසීය.
- ශ්‍රී ලංකාව සහ ලෙබනනය අතර සංචාරක ක්ෂේත්‍රයේ ගිවිසුමක වැඩකටයුතු ආරම්භ කරන ලදී.

**ඉ. සංස්කෘතික සබඳතා**

- ශ්‍රී ලංකාවේ නිදහස් දිනයේ 71 වන සංවත්සරය සැමරීම සඳහා රාජ්‍යතාන්ත්‍රික පිළිගැනීමේ උත්සවයක් 2019 පෙබරවාරි 04 වන දින නිල නිවසේ දී පැවැත්විණි. 2019 පෙබරවාරි 04 වන දින තානාපති කාර්යාල පරිශ්‍රයේ දී ශ්‍රී ලංකා හමුදාව ඇතුළු ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ උත්සවයක් ද පවත්වන ලදී.
- ලෙබනනයේ සිටින ශ්‍රී ලාංකික දෙමළ ප්‍රජාව සමඟ එක්ව තානාපති කාර්යාලය 2019 ජනවාරි 20 වන දින තෛපොංගල් හින්දු අස්වැන්න උත්සවය තානාපති කාර්යාල පරිශ්‍රයේ දී පවත්වන ලද අතර ලෙබනනයේ ශ්‍රී ලංකා කාන්තා සංගමය සමඟ එක්ව 2019 මාර්තු 24 වැනි දින තානාපති කාර්යාලය පරිශ්‍රයේ දී ජාත්‍යන්තර කාන්තා දිනය සමරන ලදී.
- බීරූට්හි පිහිටි ආසියානු රටවල රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල, ලෙබනන විශ්ව විද්‍යාලය පරිශ්‍රයේ දී සංවිධානය කරන ලද "ඒසියන් ගර්මෙට් ෆෙස්ටිවල්" සඳහා තානාපති කාර්යාලය සහභාගී විය.
- තානාපති කාර්යාලය, බීරූට් හි පිහිටි සංක්‍රමණිකයන් පිළිබඳ ජාත්‍යන්තර ආයතනය සමඟ එක්ව, 2019 ජූලි 14 වැනි දින තානාපති කාර්යාලයීය පරිශ්‍රයේ දී සංක්‍රමණික සේවකයන් සඳහා වෛද්‍ය කඳවුරක් පවත්වන ලදී.
- තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලද දීපවාලි උත්සවය, 2019 ඔක්තෝබර් 27 වැනි දින ශ්‍රී ලාංකික හා ඉන්දියානු ජාතිකයන්ගේ සහභාගිත්වයෙන් තානාපති කාර්යාලීය පරිශ්‍රයේ දී පවත්වන ලදී.
- DSAL විසින් සංවිධානය කරන ලද, බීරූට් හි ෆිනිසියා හෝටලයේ දී 2019 දෙසැම්. 01 දින පැවති 2019 ජාත්‍යන්තර පුණ්‍යායතන බසාර් සඳහා තානාපති කාර්යාලය සහභාගී විය.
- තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලාකික සංක්‍රමණික ප්‍රජාව සමඟ එක්ව 2019 දෙසැම්බර් 22 වැනි දින ජාත්‍යන්තර සංක්‍රමණික දිනයත්, 2019 දෙසැම්බර් 25 වන දින නත්තල් උත්සවයත් සමරන ලදී.

**කම්කරු සුබසාධනය**

රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම

- ලෙබනනයේ සිටින ශ්‍රී ලාංකික ශ්‍රම බලකායේ සේවා නියුක්තිය ඉහළ නැංවීම සඳහා තානාපති කාර්යාල පරිශ්‍රයේ බඳවා ගැනීමේ ආයතන සමඟ රැස්වීමක් පවත්වන ලදී.
- බඳවා ගැනීමේ ක්‍රියාවලිය, සේවා නියුක්ත කම්කරුවන්ට ලබා දී ඇති පහසුකම් සේවක වැටුප් ගෙවීම ආදිය සම්බන්ධ කරුණු සාකච්ඡා කිරීම සඳහා ආයතන හයකට ක්ෂේත්‍ර චාරිකා සිදුකරන ලදී. "Perfect clean" නමින් නව බඳවා ගැනීමේ ආයතනයක් ලියාපදිංචි කරන ලදී. උතුරු ආණ්ඩුකාර මණ්ඩලයේ ට්‍රිපෝලි හි නියෝජිතායතන හයක් සහ සහෙල් හි නියෝජිතායතන ආයතන හයක් වෙත යන ලදී.

වැඩමුළු හා සම්මන්ත්‍රණ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ දෙදින වැඩමුළුවකට සහභාගී වීම සඳහා දූත මණ්ඩලය නිලධාරීන් දෙදෙනෙකු යවා ඇත. මැලේසියාවේ පැවති ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල කම්කරු අංශ සඳහා වූ මෙහෙයුම් අත්පොත සංශෝධනය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයකට තානාපති කරුණාරත්න මහතා සහ උපදේශකවරයා සහභාගී වූහ. මෙම සම්මන්ත්‍රණය ජාත්‍යන්තර කම්කරු සංවිධානය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා විදේශ සබඳතා අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලදී.

- කම්කරු අංශයේ කාර්යය සාධන දත්ත

- කම්කරු අංශය විසින් රැකියා කොන්ත්‍රාත් 437 ක් සහ රැකියා ඇණවුම් 17 ක් අනුමත කරන ලදී.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සංක්‍රමණික සේවකයන් 526 ක් ලියාපදිංචි කර තිබේ.
- පැමිණිලි කළමනාකරණ පද්ධතිය හරහා පැමිණිලි 62 න් 56 ක් සමථයට පත් කරන ලදී.
- ආරක්ෂිත නිවාස රැඳවියන් (දැනට ආරක්ෂිත නිවසේ 02) - මුළු පැමිණීම -19. නැවත මෙරටට ගෙන්වා ගැනීම- 10, අනුග්‍රාහකයන් වෙත චාර්තා කිරීම -02, නියෝජිත ආයතන වෙත ආපසු යාම 03

මරණ- මරණ 16 ක් වාර්තා වූ අතර මෘත දේහ 12ක් ශ්‍රී ලංකාවට යවා ඇති අතර මෘතදේහ 04 ක් ලෙබනනයේ මිහිදන් කරන ලදී.

- මියගිය කම්කරුවන් සඳහා වන්දි ගෙවීම
  - මරණ 04 ක් සම්බන්ධයෙන් මරණ වන්දි වශයෙන් ඇමරිකානු ඩොලර් 23,700/- ක මුදලක් එකතු කර ඇත.
- නැවත මෙරටට ගෙන්වා ගැනීම්
  - මෙම වර්ෂය තුළ ශ්‍රී ලාංකිකයින් 98 දෙනෙකු සාමාන්‍ය ආරක්ෂාව යටතේ ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගන්නා ලදී.
  - දඩ මුදල් නොගෙවා නැවත මෙරටට ගෙන්වා ගැනීම - ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් 98 දෙනාගෙන් 20 දෙනෙකු ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගන්නා ලදී. අත්අඩංගුවට ගත් පිරිස අතුරෙන් 24 දෙනෙකු ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා ලදී.
  - විශේෂ අවස්ථා - සිරියාවේ මිනිස් ජාවාරම්කරුවන්ගේ ගොදුරක් බවට පත්වූවෙක් බීරූට් හි රාෆික් හරිරි ජාත්‍යන්තර ගුවන් තොටුපොල හරහා නැවත ශ්‍රී ලංකාවට යවන ලදී. තානාපති කාර්යාලය සංක්‍රමණික සේවකයන් 10 දෙනෙකු සහාය විය.
- උසාවි නඩු - උසාවි නඩු පහකට සහභාගී වෙමින් සිටියි. බන්ධනාගාර රැඳවියන් - මරණ දඩුවම ලැබ ශ්‍රී ලංකා කාන්තා සිරකාරියන් සිව්දෙනෙකු වර්ඩුන් සහ ට්‍රිපොලි බන්ධනාගාරවල සිටිති.

## 8. ඕමාන් සුල්තාන් රාජ්‍යය

### අ) ද්විපාර්ශ්වික සබඳතා

ඇගයීම සිදුකෙරෙන කාලසීමාව තුළ දී පහත සඳහන් ද්විපාර්ශ්වික සංචාර සිදුකරන ලදී:

- යෝජිත හම්බන්තොට තෙල් පිරිපහදු ව්‍යාපෘතිය පිළිබඳව ඕමානයේ තෙල් හා ගෑස් පිළිබඳ අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කිරීම සඳහා එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු, දීර්ඝකාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කරවීම හා සමුපකාර සංවර්ධන අමාත්‍ය ගරු. රිෂාඩ් බදියුදීන් මැතිතුමා 2019 පෙබරවාරි 24-26 දිනවල දී ඕමානයේ නියැලුණු සංචාරය.
- එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍යවරයාගේ ආරාධනයකට අනුව, ඕමාන් සුල්තාන් රාජ්‍යයේ තෙල් හා ගෑස් පිළිබඳ අමාත්‍ය ආචාර්ය මොහමඩ් හමාඩ් අල් රූමි මැතිතුමා 2019 මාර්තු 23-25 දිනවල දී නියැලුණු ශ්‍රී ලංකා සංචාරය. හම්බන්තොට මිරිජ්ජවිල අපනයන කලාපයේ දී පැවති ග්‍රීන් ෆීල්ඩ් තෙල් පිරිපහදුවට මුල්ගල් තැබීමේ උත්සවය සඳහා ආරාධිත අමුත්තා ලෙස එතුමා සහභාගී විය.
- ඕමාන් සුල්තාන් රාජ්‍යයේ තෙල් හා ගෑස් පිළිබඳ අමාත්‍ය ආචාර්ය මොහමඩ් හමාඩ් අල් රූමි මැතිතුමා සමඟ සිදුකළ සාකච්ඡා පිළිබඳ පසුවිපරම් කටයුතු සඳහා, එවකට මහාමාර්ග, මාර්ග සංවර්ධන හා බණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු. කබීර් හෂීම් මැතිතුමාගේ නායකත්වයෙන් හා එවකට සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු. මලික් සමරවික්‍රම මැතිතුමාගේ සහ එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු, දීර්ඝකාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කරවීම හා සමුපකාර සංවර්ධන අමාත්‍ය ගරු. රිෂාඩ් බදියුදීන් මැතිතුමාගේ සහභාගිත්වයෙන් යුතුව 2019 මැයි 04-06 දිනවල දී නියැලුණු අමාත්‍ය දූත පිරිසකගේ නිල සංචාරය.
- 2019 මාර්තු 25 මස්කට් හි දී පැවති උතුරු ඉන්දීය ජල විද්‍යාත්මක කොමිෂන් සභාවේ 19 වැනි සමුළුවට සහභාගී වීම සඳහා එවකට ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම් ඩබ්.පී. සඳනායක මහත්මිය නිරත වූ සංචාරය.
- 2019 මාර්තු 25-28 දිනවල ශ්‍රී ලංකාවේ කොළඹ දී පැවති උසස් අධ්‍යාපනය පිළිබඳ ගුණාත්මක බව සහතික කිරීමේ අධිකාරීන්ගේ ජාත්‍යන්තර ජාලයේ ද්විවාර්ෂික සමුළුවට සහභාගී වීම සඳහා ඕමානයේ සුල්තාන් කබූස් විශ්වවිද්‍යාලයේ ආචාර්ය සාලෙම් රිසා මුහම්මද් රිස්වි මහතා නිරත වූ සංචාරය.
- 2019 අප්‍රේල් 22-25 දිනවල දී පැවති සීනත් අල්-බහාර් රාජකීය යාත්‍රාව ශ්‍රී ලංකාවට පැමිණීම.
- මස්කට් හි දී පැවැත්වීමට නියමිත 3 වැනි දේශපාලන උපදේශනවලට සූදානම් වීම පිණිස, 2018 අගෝස්තු 15 වැනි දින ශ්‍රී ලංකාවේ දී දෙරටේ විදේශ කටයුතු අමාත්‍යාංශ දෙක අතර පැවති 2 වැනි දේශපාලන රැස්වීමේ දී සාකච්ඡා කළ/එකඟ වූ කරුණු පිළිබඳව පසුවිපරම් කිරීම සඳහා තානාපතිවරයා 2019 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා ඕමානයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා මාලාවක් පැවැත්විය.
- ඕමාන පාර්ශ්වය සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්/යෝජනාවලට අත්සන් තැබීම හා සම්බන්ධ කටයුතු අවසන් කිරීම පිළිබඳව මෙම දූත මණ්ඩලය පසුවිපරම් කළේය.
- 71 වැනි නිදහස් සමරු උළෙල නිමිත්තෙන් රාජ්‍යතාන්ත්‍රික පිළිගැනීමේ උත්සවයක් පවත්වන ලදී.

### ආ) බහුපාර්ශ්වික සබඳතා

- 2019 ජනවාරි 27-28 දිනවල ඕමානයේ දී පැවති ජාතික දැක්ම සමුළුවේ දී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

- 2019 පෙබරවාරි 11 වැනි දින ඕමානයේ පර්යේෂණ කවුන්සිලය හා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද සාගර ආර්ථිකය හා අනාගත තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ දී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

## ඇ) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

### i. වෙළඳාම

- මෙම අමාත්‍යාංශයේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන යටතේ, ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධන මණ්ඩලය හා ඕමානයේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව, 2019 පෙබරවාරි 04-06 දිනවල දී පැවති ශ්‍රී ලාංකික වෙළඳ දූත පිරිසකගේ සංචාරය හා ඉන් අනතුරුව පැවති වෙළඳපොළ හුරුපුරුදු කිරීමේ වැඩසටහන සඳහා පහසුකම් සැලසීය.
- ශ්‍රී ලංකාවේ 71 වැනි නිදහස් සමරු උළෙල නිමිත්තෙන්, මෙම දූත මණ්ඩලය ලුලු හයිපර් මාර්කට් සමඟ එක්ව "ශ්‍රී ලංකන් ඩිලයිට්ස්" ශ්‍රී ලාංකික නිෂ්පාදන සතිය 2019 පෙබරවාරි 10-16 දිනවල මස්කට් හි දී පැවැත්වීම සඳහා සංවිධානය කළේය.
- 2019 ජූනි මාසයේ මස්කට් හි දී පැවති ව්‍යාපාරික ප්‍රවර්ධන රැස්වීම්වලට සහභාගී වීම සඳහා ලංකා බැංකුවේ නියෝජිත කණ්ඩායම නිරත වූ සංචාරය.
- අපනයන සංවර්ධන මණ්ඩලයේ සහයෝගයෙන් යුතුව, 2019 ඔක්තෝබර් 01-05 දිනවල දී කුළුබඩු, පලතුරු, එළවළු, සැකසූ ආහාර, තේ, පොල් මදයෙන් කළ නිෂ්පාදන, කුකුළු මස් සහ වෙනත් පාරිභෝගික ආහාර වර්ග ඇතුළුව, පාරිභෝගික ආහාර අංශය නියෝජනය කරන සමාගම් 11 ක් නිරත වූ සංචාරය මෙම දූත මණ්ඩලය මඟින් මූලාරම්භ කොට සංවිධානය කරන ලදී.
- 2019 ඔක්තෝබර් 02-05 දිනවල ඕමානයේ කැරෆෝර් හයිපර් මාර්කට් හි දී පැවති ශ්‍රී ලාංකික ආහාර නිෂ්පාදන පිළිබඳ වෙළඳසැල් තුළ සිදුකළ ප්‍රදර්ශනයක් වූ "ඕමානයේ කැරෆෝර් හි ශ්‍රී ලංකා සතිය" මෙම දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

### ii. ආයෝජන

- ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර, දේපළ වෙළඳාම් හා සැපයුම් සේවා අංශය තුළ පවතින ආයෝජන අවස්ථා පිළිබඳව දැනුවත් කිරීම සඳහා, එවකට අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මැතිතුමා සමඟ වූ නියෝජිත කණ්ඩායම සඳහා රාජ්‍ය පොදු සංවිත අරමුදල සමඟ රැස්වීමක් 2019 පෙබරවාරි 25 වැනි දින මෙම දූත මණ්ඩලය මඟින් සංවිධානය කරන ලදී.
- හම්බන්තොට විශේෂ ආර්ථික කලාපයේ තෙල් පිරිපහදුවක් ස්ථාපනය කිරීම සඳහා සිංගප්පූරුවේ පිහිටි සමාගමක් වන සිල්වර් පාක් ඉන්ටර්නැෂනල් හා ඕමාන් ඔයිල් සමාගම අතර යෝජිත හවුල්කාරිත්වය පිළිබඳව තෙල් හා ගෑස් පිළිබඳ අමාත්‍යාංශය හා ඕමාන් ඔයිල් සමාගම සමඟ සාකච්ඡා කිරීම සඳහා එහි ගිය අමාත්‍ය නියෝජිත කණ්ඩායමේ නිල සංචාරය.
- ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සඳහා දැනුවත් කිරීම හා දිරිගැන්වීම පිණිස රාජ්‍ය පොදු සංවිත අරමුදල සහ අමාත්‍ය දූත පිරිස අතර රැස්වීමක් මෙම දූත මණ්ඩලය විසින් කොළඹ හිල්ටන් හා ෆ්‍රෑන්ඩ් හයට් හෝටල්වල දී සංවිධානය කරන ලද අතර, එහි දී ආයෝජන අවස්ථා පිළිබඳව පැහැදිලි කරන ලදී.
- ශ්‍රී ලංකාවේ නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා එකඟ කරවා ගැනීම පිණිස ඉදිකිරීම්, දේපොළ වෙළඳාම්, ආගන්තුක සත්කාර සහ නිෂ්පාදන විසඳුම් පිළිබඳ පුළුල් දැනුමක් ඇති බහුආංශික සමාගම් සමූහයක් වන MFAR හි නිර්මාතෘ ආචාර්ය පී. මොහොමඩ් අලි මහතා හමුවීම. හෝටලයක් ඉදිකිරීම සඳහා, මෙම සමාගම ත්‍රිකුණාමලයේ කුච්චවේලි හි අක්කර 25 ක ඉඩමක් මිලදී ගත්තේය.

iii. **සංචාරක කටයුතු**

- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ, ශ්‍රී ලංකා සංචාරක කටයුතු මාර්ග ප්‍රදර්ශනය 2019 මැයි 31 වැනි දින මස්කට් හි දී පවත්වන ලදී.
- පාස්කු ඉරුදින එල්ල වූ ප්‍රහාරයෙන් අනතුරුව, සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණීම උනන්දු කරවීම පිණිස මෙම දූත මණ්ඩලයේ නිල ට්විටර් හා ෆේස්බුක් ගිණුම්වල "ශ්‍රී ලංකාව සංචාරය කිරීම සඳහා ආරක්ෂිතයි" යනුවෙන් සමාජ මාධ්‍ය ව්‍යාපාරවල නිරත වන ලදී.
- 2019 නොවැම්බර් 25 වැනි දින සලාම් එයාර් ගුවන් සේවයේ මස්කට් සිට කොළඹ දක්වා පළමු සෘජු ගුවන් ගමන දියත් කිරීම සඳහා පහසුකම් සලසන ලදී. මෙම සමාරම්භක ගුවන් ගමන සඳහා ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීමට ඕමානයේ ශ්‍රී ලංකා තානාපතිවරයාට ආරාධනා කරන ලද අතර, ඕමානයේ විවිධ මාධ්‍ය නියෝජනය කරන මාධ්‍යවේදීන් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතනවල සංචාරයක යෙදුනාහ.

**ඈ) සංස්කෘතික සබඳතා**

- මෙම දූත මණ්ඩලයේ ඉල්ලීම පරිදි, ඕමාන රජය විසින් ඕමානයේ විද්‍යාත්මක හා සංස්කෘතික සහයෝගිතාව පිළිබඳ වැඩසටහන යටතේ 2019/20 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලාංකික සිසු සිසුවියන්ට ශිෂ්‍යත්ව පිරිනමා තිබේ.
- ශ්‍රී ලංකාවේ 71 වැනි නිදහස් සමරු උළෙල නිමිත්තෙන් 2019 පෙබරවාරි 04 වැනි දින ධජය එසවීමේ උත්සවයක් පවත්වන ලද අතර, එම අවස්ථාව සනිටුහන් කිරීම සඳහා පුවත්පත් අතිරේකයක් ප්‍රකාශයට පත් කරන ලදී.
- 2019 පෙබරවාරි 07 වැනි දින රිද්ම තරංග සංගීත සංදර්ශනය සඳහා පහසුකම් සපයන ලදී.
- ශ්‍රී ලාංකික ප්‍රජා සමාජය විසින් 2019 පෙබරවාරි 08 වැනි දින මස්කට් හි ටියුලිප් ඉන් හෝටලයේ දී පැවැත්වූ තෙපොංගල් දිනය සඳහා පහසුකම් සපයන ලදී.
- 2019 පෙබරවාරි 22-23 දිනවල දී පැවති ශ්‍රී ලාංකික ප්‍රජා සමාජ ක්‍රීඩා උළෙල සඳහා පහසුකම් සලසන ලදී.
- 2019 මැයි 17 දින සිට 25 දින දක්වා මෙම තානාපති කාර්යාල පරිශ්‍රයේ පිහිටි ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති විහාරයේ දී පැවති වෙසක් උත්සවය සඳහා පහසුකම් සැලසීම.
- මස්කට් හි ශ්‍රී ලාංකික පාසලේ 30 වැනි සංවත්සරය සැමරීම සඳහා ශ්‍රී ලාංකික පාසල සහ ශ්‍රී ලාංකික ප්‍රජා සමාජය විසින් 2019 මාර්තු 15 වැනි දින සංවිධානය කරන ලද සංගීතමය විනෝදාස්වාදන වැඩසටහනට සහභාගී වීම සඳහා පැමිණි භාතිය සහ සන්තුෂ් ඇතුළු කලාකරුවන් කණ්ඩායමේ සංචාරය.
- මෙම වර්ෂය තුළ දී රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහන් කිහිපයක් සඳහා පහසුකම් සපයන ලදී.
- 2019 ඔක්තෝබර් 29 වැනි දින ඕමානයේ පිළිකා සංගමය විසින් සංවිධානය කරන ලද 'වාර්ෂික පිළිකා පා ගමන 2019' සඳහා මෙම දූත මණ්ඩලය පහසුකම් සැලසීය.
- 2019 දෙසැම්බර් 05 සිට 14 දක්වා මස්කට් හි දී පැවති පිරිමි කණිෂ්ට AHF කුසලාන තරඟාවලියට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා කනිෂ්ඨ හොකී කණ්ඩායමට මෙම දූත මණ්ඩලය පහසුකම් සැලසීය.

**ඉ) කම්කරු සුබසාධනය**

- 2019 මැයි 20 වැනි දින රුවි හි SAOG ඕමාන ධීවර සමාගම සමඟ රැකියා ප්‍රවර්ධන සාකච්ඡාවක් පවත්වන ලදී.
- ඕමානයේ සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ට වඩාත් හොඳ සේවාවක් ලබාදීම සහතික කිරීම සඳහා ඔවුන් සමඟ සම්බන්ධ වීම පිණිස, ගාස්තු රහිත හා වට්ස්ඇප්/ඉමෝ අංකවලින් සමන්විත 'හොට්ලයින්' සෘජු ඇමතුම් සේවාවක් 2019 අගෝස්තු 01 වැනි දින ආරම්භ කරන ලදී.

- ශ්‍රී ලංකාවේ විදේශ රැකියා හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්වාලාලම්පූර් හි ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එක්ව 2019 සැප්තැම්බර් 18 සිට 20 දක්වා සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල කම්කරු අංශ සඳහා මෙහෙයුම් අත්පොත යාවත්කාලීන කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයට තානාපතිවරයා සහභාගී විය.
- ආරවුල් නිරාකරණය කර නැවත සියරට පමුණුවන තෙක් හොඳ පිවන තත්ත්වයන් හා වඩා හොඳ සේවාවක් ලබා දීම සඳහා, මෙම තානාපති කාර්යාලයේ රැකවරණ පතන කාන්තා සංක්‍රමණික ගෘහ සේවිකාවන් සඳහා 2019 නොවැම්බර් මස නව ආරක්ෂිත නිවාස පහසුකමක් විවෘත කිරීම.
- ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ මිනිස් ජාවාරම මැඩපැවැත්වීම සඳහා දීර්ඝ කාලයක් තිස්සේ අපේක්ෂා කළ යාන්ත්‍රණයක් වූ ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් ඕමානයට බඳවාගැනීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් ලෙස "විරෝධතාවයක් නොමැති බවට සහතිකයක්" නිකුත් කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා මෙම දූත මණ්ඩලය 2019 ඔක්තෝබර් 21 වැනි දින ඕමාන් රජයෙන් අවසර ලබා ගත්තේය.
- ලේඛනගත/ලේඛනගත නොවූ සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ ශ්‍රම සම්බන්ධ ගැටළු විශාල සංඛ්‍යාවක් සඳහා විසඳුම් සෙවීමට මෙම දූත මණ්ඩලය පහසුකම් සැලසීය. 2019 වර්ෂය තුළ දී රැකියා ගිවිසුම් 5,588 කට අත්සන් තැබීමට ද මෙම දූත මණ්ඩලය පහසුකම් සැලසීය.

## 9. කටාර් රාජ්‍යය

### අ) ද්විපාර්ශ්වික සබඳතා

- 2019 අප්‍රේල් 06-12 දිනවල පැවති 140 වැනි අන්තර් පාර්ලිමේන්තු සංගම් රැස්වීමට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ගරු. කරු ජයසූරිය මැතිතුමාගේ නායකත්වයෙන් යුත් පාර්ලිමේන්තු දූත පිරිසක් දෝහා හි සංචාරයක නිරත විය.

    - 2019 අප්‍රේල් 06 වැනි දින පැවති රැස්වීමට සමගාමීව ගරු. කථානායකවරයා සහ දූත පිරිස නියෝජ්‍ය අග්‍රාමාත්‍ය හා විදේශ කටයුතු අමාත්‍ය ෂෙයික් මොහමඩ් බින් අබ්දුල් රහ්මාන් බින් ජාසිම් අල්-තානි මැතිතුමා හමුවිය. මෙම රැස්වීමේ දී, දෙරට අතර පවත්නා ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා වන ක්‍රම පිළිබඳව දෙපාර්ශ්වයම සාකච්ඡා කළහ. කොළඹ වරාය නගරයේ ආයෝජනය කිරීමේ හැකියාව පිළිබඳව ගරු. කථානායකවරයා විදේශ අමාත්‍යවරයාව දැනුවත් කළේය
    - ශ්‍රී ලංකාව දැනට වෙනත් රටවලින් ආනයනය කරනු ලබන කටාර් පොහොර නිෂ්පාදන සෘජුවම කටාර් වෙතින් ආනයනය කිරීමේ ඇති හැකියාව පිළිබඳව ගරු. කථානායකවරයා විමසා බැලීය.
    - ගරු. කථානායකවරයා සහ දූත පිරිස දෝහා හි ස්ටැෆර්ඩ් ශ්‍රී ලාංකික පාසල (SSLSD) වෙත පැමිණ එහි කාර්ය මණ්ඩලය හා සිසු සිසුවියන් හමුවිය.
    - ගරු. කථානායකවරයා සහ දූත පිරිස 2019 අප්‍රේල් 08 වැනි දින කටාර්හි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජා නායකයින් හමුවිය.

- ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු. පෑලිස්ගේ හැරිසන් මැතිතුමා 2019 අප්‍රේල් 20-22 දිනවල දී කටාර් නුවර සංචාරයක නිරත විය. එහි දී ගරු. අමාත්‍යවරයා කටාර් පොහොර සමාගමට ද පැමිණියේය.
- 2019 මැයි 01 වැනි දින පැවති ආසියානු සහයෝගිතා සංවාදයේ (ACD) 10 වැනි අමාත්‍ය රැස්වීමට සහභාගී වීම සඳහා විදේශ කටයුතු අමාත්‍ය ගරු. තිලක් මාරපන මැතිතුමා 2019 අප්‍රේල් 30 දින සිට මැයි 2 දින දක්වා කටාර් නුවර සංචාරයක නිරත විය.
- මෙම අමාත්‍ය රැස්වීමට පෙර, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම සහ ආසියානු සහයෝගිතා සංවාදයේ ව්‍යාපාරික සංසදය පැවැත්විණ.
- ආසියානු සහයෝගිතා සංවාදයේ ව්‍යාපාරික සංසදය පිහිටුවීම සඳහා කටාරය විසින් කටයුතු කිරීම ශ්‍රී ලංකාව විසින් සාදරයෙන් පිළිගත් අතර, එමඟින් අදාළ ව්‍යාපාරික ප්‍රජාවන්ට

අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක හා ප්‍රයෝජනවත් හවුල්කාරිත්වයන් හඳුන්වා දීමට සහ ඒවා ඉදිරියට ගෙනයාමට අවස්ථාව සැලසේ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, මෙම ආසියානු සහයෝගිතා සංවාදයේ ව්‍යාපාරික සංසදය සඳහා සහභාගී වූ ශ්‍රී ලාංකික දූත පිරිසට නායකත්වය ලබා දුන්නේය.

- මෙම රැස්වීමට, විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්, දෝහා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ පෞද්ගලික අංශයේ නියෝජිතයින් සහභාගී විය.
- ගරු අමාත්‍යවරයා තුර්කි විදේශ අමාත්‍යවරයා හමු වී, පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියගිය තුර්කි ජාතිකයන් දෙදෙනා සම්බන්ධයෙන් සිය ශෝකය පළකළේය. එම දේහයන් තුර්කිය වෙත පිටත්කර හැරීම සඳහා ශ්‍රී ලංකා රජය කඩිනමින් පියවර ගැනීම පිළිබඳව තුර්කි විදේශ අමාත්‍යවරයා සිය ස්තූතිය පුද කළේය.
- තුර්කියේ සිට ශ්‍රී ලංකාවට විදුලි ජනක ආනයනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරු දෙදෙනාම සාකච්ඡා කළහ.
- ගරු. අමාත්‍යවරයා ඉරාන විදේශ අමාත්‍යවරයා හමු වී ශ්‍රී ලංකාව විසින් මිල දී ගත් තෙල් සඳහා ගෙවිය යුතු හිඟ මුදල් ගෙවීම සඳහා ක්‍රම සොයාගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කළේය. ඇමරිකාව විසින් ඉරානයේ තෙල් සඳහා පනවා ඇති තහනම සහ ඉරානයෙන් තෙල් ආනයනය කිරීමේ හැකියාව පිළිබඳව ඔවුහු තවදුරටත් සාකච්ඡා කළහ.
- එහි රැඳී සිටි කාලය තුළ දී ගරු. අමාත්‍යවරයා 2019 මැයි 02 දින කටාර් හි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජා නායකයින් හමුවිය.

**ආ) බහුපාර්ශ්වික සබඳතා**

- 2019 අගෝස්තු 29-30 දිනවල දී පැවති කොළඹ ආරක්ෂක සම්මන්ත්‍රණයට කටාර් සන්නද්ධ හමුදාවේ පහත සඳහන් නිලධාරීන් සහභාගී විය.
    - බ්‍රිගේඩියර් ජනරාල් (ආචාර්ය/ගුවන්) රෂීඩ් හමාඩ් අල් නොයිමි මහතා - වැඩබලන අණදෙන නිලධාරි, උපාය මාර්ගික අධ්‍යයන ආයතනය
    - බ්‍රිගේඩියර් ජනරාල් අබ්දුල්ලා මොහොමඩ් අල් ඩොව්සාරි මහතා - බුද්ධි හා ආරක්ෂක ඒකකයේ අණදෙන නිලධාරි
- කටාර් රාජ්‍යයේ පරිපාලන සංවර්ධන, කම්කරු හා සමාජ කටයුතු අමාත්‍ය යූසෙෆ් බින් මොහමඩ් අල් ඔත්මන් ෆක්රෝ මැතිතුමා කටාර් රාජ්‍යයේ ප්‍රගතිය සඳහා ශ්‍රී ලාංකික ප්‍රජාව විසින් ලබාදුන් විශිෂ්ට සේවාව හා ධනාත්මක දායකත්වය වෙනුවෙන් විශිෂ්ටතා සම්මානයක් පුද කළේය.
- 2019 මැයි 01 වැනි දින ෂෙරටන් ග්‍රෑන්ඩ් දෝහා හි දී පැවති ජාත්‍යන්තර කම්කරු දින උළෙලේ දී මෙම සම්මානය මෙම දූත මණ්ඩලයේ උපදේශක (E & W) විසින් ලබාගන්නා ලදී.

**ඇ) ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

- 2019 නොවැම්බර් 12-14 දිනවල දෝහා හි ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේ දී පැවති Hospitality Qatar 2019 – The Global Hospitality and HORECA ප්‍රදර්ශනය සඳහා මෙම දූත මණ්ඩලය සහභාගී විය.
    - ශ්‍රී ලංකාවේ මණ්ඩපය, එහි පොහොසත් උරුමය, සුන්දර භූ දර්ශන, සුන්දර වෙරළ සහ ශ්‍රී ලංකාවේ වනජීවීන් නිරූපණය කරන දර්ශන සමඟින්, ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ නව අනන්‍යතාවය වන "පුදුමයන්ගෙන් පිරී ගිය ශ්‍රී ලංකාව" විදහා දැක්වීය.
    - ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ප්‍රදර්ශන කුටියට සංචාරකයින් හා සංචාර මෙහෙයවන්නන් විශාල සංඛ්‍යාවක් පැමිණියහ.

**ඈ) සංස්කෘතික සබඳතා**

- කටාර් හි දෙමළ සංගමය හා එක්ව වාර්ෂික තෙපොංගල් උත්සවය 2019 ජනවාරි 25 වැනි දින තානාපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වීම සඳහා මෙම දූත මණ්ඩලය මඟින් සංවිධානය කරන ලදී.
- 2019 පෙබරවාරි 04 වැනි දින ශ්‍රී ලංකාවේ නිදහස් සමරු උළෙල තානාපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වීම සඳහා මෙම දූත මණ්ඩලය මඟින් සංවිධානය කරන ලදී.
- 2019 මැයි 15-18 දිනවල දී තානාපති කාර්යාල පරිශ්‍රයේ දී වෙසක් උත්සවය සැමරීම පිණිස සංස්කෘතික වැඩසටහනක් පැවැත්වීම සඳහා මෙම දූත මණ්ඩලය මඟින් සංවිධානය කරන ලදී. එහි ආගමික හා සංස්කෘතික අංග පැවැත්වීම සඳහා පූජ්‍ය දිගන සුගතවංස ස්වාමීන් වහන්සේට ආරාධනා කරන ලදී.
- නේපාල තානාපති කාර්යාලයේ කාර්ය භාර නිලධාරි ලක්ෂ්මන් බනායි මහතා, මෙම දූත මණ්ඩලයේ කාර්ය භාර නිලධාරිවරයාගේ ආරාධනයට අනුව 2019 මැයි 18 වැනි දින මෙම සැමරුමට සහභාගී විය.
- 2019 මැයි 27 වැනි දින ශ්‍රී ලාංකික ප්‍රජාව හා තානාපති කාර්යාල නිලධාරීන් සමඟ වාර්ෂික ඉෆ්තාර් සැමරුම මෙම දූත මණ්ඩලය මඟින් තානාපති නිල නිවසේ දී සංවිධානය කරන ලදී.
- මෙම දූත මණ්ඩලය විසින් 2019 ජූනි 15-16 දිනවල පොසොන් උත්සවය සැමරීම සඳහා සංස්කෘතික වැඩසටහනක් සංවිධානය කරන ලදී. එහි ආගමික හා සංස්කෘතික අංග මෙහෙයවීම සඳහා පූජ්‍ය මොරගහවැවේ සිරිසුගත ස්වාමීන් වහන්සේට ආරාධනා කරන ලදී.
- ශ්‍රී ලාංකික කතෝලික ප්‍රජාව හා තානාපති කාර්යාලයේ නිලධාරීන් සමඟ 2019 දෙසැම්බර් 20 වැනි දා තානාපති කාර්යාල පරිශ්‍රයේ දී මෙම දූත මණ්ඩලය මඟින් වාර්ෂික නත්තල් උත්සවය සංවිධානය කරන ලදී.

**ඉ) කම්කරු සුබසාධනය**

- බන්ධනාගාරයට ගොස් එහි සිටින ශ්‍රී ලාංකික රැඳවියන් අතර රෙදි පිළි, අතේ ගෙනයා හැකි ගුවන්විදුලි යන්ත්‍ර සහ රැවුල බෑමේ යන්ත්‍ර බෙදා දෙන ලදී.
- බන්ධනාගාරයේ පුස්තකාලය සඳහා පොත්පත් ලබාදෙන ලදී.
- බන්ධනාගාරයේ සිටින ශ්‍රී ලාංකික රැඳවියන් සඳහා මත්ද්‍රව්‍ය පිළිබඳව හා කටාරයේ වෙනත් නීති රීති පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- ශ්‍රී ලාංකික ප්‍රජාව සඳහා මත්ද්‍රව්‍ය පිළිබඳව හා කටාරයේ කම්කරු හා වෙනත් නීති රීති පිළිබඳව ජංගම දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් පවත්වන ලදී.
- ඔවුන්ගේ ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මාසිකව බන්ධනාගාරය වෙත හා පිටුවහල් කිරීමේ කඳවුරු වෙත යන ලදී.
- ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සමඟ හෝ ඔවුන් වෙනුවෙන් පෙනීසිටීම සඳහා අධිකරණය හමුවේ පෙනී සිටින ලදී.
- වාසය කිරීමේ තත්ත්වයන් පරීක්ෂා කිරීම සඳහා වාසස්ථාන 320 නැරඹීමට යන ලදී.
- ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ විවිධ ලිපිලේඛන අරාබි භාෂාවට පරිවර්තනය කරන ලදී.
- ශ්‍රී ලාංකික සේවකයන්ගේ ගැටලු 326 ක් විසඳීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ පෙනී සිටින ලදී.
- රෝහල්වලට ගොස් ශ්‍රී ලාංකික රෝගීන් සම්බන්ධයෙන් වෛද්‍ය නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය කරන ලදී.
- පැමිණිලි ඉදිරිපත් කිරීමට හා ශ්‍රී ලාංකික සේවකයන්ගේ ගැටලු විසඳීම සඳහා පොලිස් ස්ථාන වෙත යන ලදී.
- ආරක්ෂිත නිවාස නඩත්තු කිරීම.
- මෙම දූත මණ්ඩලය මඟින් ශ්‍රී ලාංකික කාන්තා ශ්‍රමිකයන් 203 දෙනෙකුට ආහාර, ඖෂධ හා නවාතැන් පහසුකම් ලබා දී ඇති අතර, ඔවුන් ආපසු ශ්‍රී ලංකාව වෙත එවන ලදී.

- රැකියා ප්‍රවර්ධනය කිරීම සඳහා තානාපතිවරයා සමඟ ගල්ෆ් වෙයාර්හවුසිං සමාගම (GWC) වෙත යන ලදී.
- රැකියා ප්‍රවර්ධනය කිරීම සඳහා තානාපතිවරයා සමඟ ප්ලාසා හොලැන්ඩ් ආයතනය වෙත යන ලදී.

### 10. (1) සවුදි අරාබි රාජධානිය - රියාද්

#### අ) ද්විපාර්ශ්වික සබඳතා

දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව මෙම තානාපති කාර්යාලය සිවිංර සංවිධානය කරන ලද අතර, සවුදි අරාබි රාජධානියේ රජයේ පහත සඳහන් ඉහළ පෙළේ බලධාරීන් සමඟ සාකච්ඡා පවත්වන ලදී.

**ද්විපාර්ශ්වික සංචාර:**

- සවුදි අරාබි රාජධානියේ ෂුරා කවුන්සිලයේ සභාපති ආචාර්ය අබ්දුල්ලා ඉබ්න් මොහමඩ් ඉබ්න් ඉබ්‍රාහිම් අල්-ෂෙයික් මහතා සහ ෂුරා කවුන්සිලයේ සාමාජිකයන් පිරිසක්.

**ද්විපාර්ශ්වික රැස්වීම්:**

- සවුදි අභ්‍යවකාශ කොමිෂන් සභාවේ සභාපති සහ සංචාරක කටයුතු හා පුරාවස්තු පිළිබඳ උත්තරීතර කොමිෂන් සභාවේ (SCTA) මහලේකම් සුල්තාන් බින් සල්මාන් බින් අබ්දුලාසීස් අල් සවුඩ් කුමරු
- අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු. ආචාර්ය හමාඩ් බින් මොහොමඩ් අල් ෂෙයික් මැතිතුමා
- නැගෙනහිර පළාතේ ආණ්ඩුකාර සවුඩ් බින් නයෙෆ් අල් සවුඩ් කුමරු
- කම්කරු කටයුතු පිළිබඳ උප අමාත්‍ය ආචාර්ය අබ්දුල්ලා අබු තිනයින් මැතිතුමා
- සවුදි අරාබි රාජධානියේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සංධාන කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ගරු. අසාම් අබ්දුල් කරීම් අල් ගේන් මැතිතුමා
- විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (නැගෙනහිර පළාත) ආචාර්ය කාලිඩ් බින් මුහම්මද් අල්-ෂෙයිබානි මහතා
- සමාජ රක්ෂණය සඳහා වන පොදු සංවිධානයේ (GOSI) ආණ්ඩුකාර සුලෙයිමාන් අබ්දුල් රහ්මාන් අල් ග්වායිස් මහතා
- සවුදි මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ආචාර්ය බන්ඩාර් බින් මොහොමඩ් අල් අයිබාන් මහතා, විශේෂයෙන්ම රාජධානිය තුළ සිටින ගෘහ සේවකයන් ඇතුළුව, ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ මානව හිමිකම් සුරැකීම පිළිබඳව ඵලදායී සාකච්ඡාවක් පැවැත්විය.
- සවුදි අරාබි රාජධානියේ විදේශයන් හි සිටින සවුදි පවුල්වල සුබසාධක සංගමයේ සභාපති වලීඩ් අල් සුවයිදාන් මහතා
- මුසානෙඩ් මාර්ගගත පද්ධතිය හරහා සවුදි ගෘහ සේවිකාවන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය මෙහෙයවන ටකමොල් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි ඉන්ජිනේරු අහමඩ් අල් යමානි මහතා සමඟ ශ්‍රී ලංකාවේ බඳවා ගැනීමේ පද්ධතිය වැඩිදියුණු කිරීමේ ක්‍රම සහ විධි පිළිබඳව සාකච්ඡා කිරීම.
- සිවිල් ගුවන් සේවා සඳහා පොදු අධිකාරිය විසින් සංවිධානය කරන ලද ගෝලීය ගුවන් සේවා සමුළුවට සහ සංක්‍රමණියන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය විසින් සංවිධානය කරන ලද සවුදි කම්කරු සංසදයට තානාපතිවරයා සහභාගී විය.

#### ආ) බහුපාර්ශ්වික සබඳතා

සවුදි අරාබිය බහුපාර්ශ්වික සංවිධාන කිහිපයකට සත්කාරකත්වය සපයයි. ශ්‍රී ලංකාව සහ මෙම සංවිධාන අතර බහුපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම සඳහා මෙම තානාපති කාර්යාලය පහත සඳහන් නිලධාරීන් හමුවිය:

- ජෙඩා හි ඉස්ලාමීය සහයෝගිතා සංවිධානයේ (OIC) මහලේකම් ආචාර්ය යූසෙෆ් බින් අහමඩ් අල් ඔතයිමීන් මැතිතුමා සහ එහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්
- ගල්ෆ් සෞඛ්‍ය කවුන්සිලයේ (GHC) විධායක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සුලෙයිමාන් බින් සාලේ අල් ඛකීල් මහතා

**ආ) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන**

- සවුදි සංවර්ධන අරමුදල (SFD) සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතාගේ නායකත්වයෙන් යුත් සය සාමාජික දූත පිරිසක් රියාද් නුවරට ගියේය.
- ශ්‍රී ලංකාවේ බණිජ තෙල් ආශ්‍රිත ආයෝජන සම්බන්ධ ගැටලු පිළිබඳව සවුදි ඇරැම්කෝ සමාගමේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි අමීන් එච්. නසර් මහතා සමඟ සාකච්ඡා පවත්වන ලදී.
- දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා ගල්ෆ් සහයෝගිතා කවුන්සිලයේ ප්‍රමිතිකරණ සංවිධානයේ (GSO) විශේෂඥ කණ්ඩායමක් 2019 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවට පැමිණියේය.
- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය මෙම තානාපති කාර්යාලය සමඟ සහයෝගයෙන් යුතුව 2019 නොවැම්බර් මාසයේ දී සවුදි ෆුඩෙක්ස් නමින් ජාත්‍යන්තර ආහාර හා පාන ප්‍රදර්ශනයක් සංවිධානය කළේය.
- 'ලුලු' හයිපර් මාර්කට් දාමය සමඟ සහයෝගයෙන් යුතුව මෙම තානාපති කාර්යාලය වෙළඳසැල් 30 ක දී 'ශ්‍රී ලංකා ආහාර සතිය' පැවැත්වීම සඳහා සංවිධානය කළේය.
- තානාපති කාර්යාලය 'රියාද් ආහාර සතිය' සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සම්බන්ධීකරණය කළේය.
- තානාපති කාර්යාලය 'රියාද් සංචාරක ප්‍රදර්ශනය' සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සම්බන්ධීකරණය කළේය.
- සවුදි අරාබි රාජධානියේ, සවුදි අපනයන සංවර්ධන අධිකාරියේ (SEDA) මහලේකම් සාලේ එස්. අල්සොලාමි මහතා, සවුදි වාණිජ හා කර්මාන්ත කවුන්සිලයේ (DCCI) මහලේකම් ආචාර්ය සවුඩ් ඒ. අල්මාෂාරි මහතා සහ සවුදි ආහාර හා ඖෂධ අධිකාරියේ සභාපති නිෂාම් සාද් අල්ජාදේ මහතා වාණිජ ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව රැස්වීම් සංවිධානය කරන ලදී.
- වාණිජමය කරුණු සම්බන්ධයෙන් පැමිණිලි 05 ක් ලැබී තිබුණු අතර, ඒවා සාර්ථකව සමථයකට පත් කරන ලදී. ඉන් එක වැදගත් කරුණක් වූයේ ශ්‍රී ලංකාවෙන් කුනිස්සන් නිෂ්පාදන ආනයනය කිරීම තහනම් කිරීමයි.

**ඇ) සංස්කෘතික සබඳතා**

- බෞද්ධ, ක්‍රිස්තියානි හා හින්දු ආගම්වලට අයත් විදේශික ශ්‍රී ලාංකිකයන් සඳහා මෙම තානාපති කාර්යාලය එකම ආකාරයේ 'සංස්කෘතික අවකාශයක්' ලබා දෙයි.
- තානාපති කාර්යාලය ප්‍රධාන බෞද්ධ ආගමික ක්‍රියාකාරකම් 03 ක්, ක්‍රිස්තියානි ආගමික ක්‍රියාකාරකම් 02 ක් හා හින්දු ආගමික ක්‍රියාකාරකම් 03 ක් සංවිධානය කළේය. තව ද, ඉස්ලාම් ආගමික ක්‍රියාකාරකම් 02 ක් සංවිධානය කිරීම සඳහා ද එය සහය විය.
- 'සිංහල සහ හින්දු' අලුත් අවුරුදු උත්සවයක් සංවිධානය කිරීමට ද තානාපති කාර්යාලය සහය විය.
- තානාපති කාර්යාලයේ සංස්කෘතික ශාලාවේ සම්පත් ලබා දීමෙන්, සතිපතා හින්දු පූජා, මාසික බෞද්ධ වැඩසටහන් සහ මාසික දහම් පාසල් වැඩසටහන් (බෞද්ධ හා කතෝලික) සඳහා තානාපති කාර්යාලය පහසුකම් සපයයි.

**ඉ) කම්කරු සුබසාධනය**

- කම්කරුවන් හා සම්බන්ධ කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා, පුරවැසි කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් තානාපති මොහමඩ් අල් ෂම්මරි මැතිතුමාගේ නායකත්වයෙන් යුත් සවුදි දූත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණියහ.
- විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු. එම්.ඒ.ඩී.එච්.එච්. අප්පුහාමි මැතිතුමාගේ නායකත්වයෙන් යුත් දූත පිරිසක් රියාද් හි තෙදින සංචාරයක නිරත විය.
- නැගෙනහිර පළාතේ සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ට උපකාර කිරීම සඳහා තානාපති කාර්යාලයේ කම්කරු අංශය ජංගම සේවා 12 ක් පවත්වන ලදී. එම කාලසීමාව තුළ දී මෙම තානාපති කාර්යාලයට පිරිමි ශ්‍රමිකයන්ගෙන් පැමිණිලි 452 ක් ලැබී ඇති අතර, එයින් 278 ක් සමථයකට පත් කරන ලදී. ක්ෂේත්‍ර චාරිකා 228 ක් සිදු කරන ලදී (පොලිසිය, කම්කරු දෙපාර්තමේන්තුව හා බන්ධනාගාර පිටුවහල් කිරීමේ කඳවුරු, රෝහල්, සමාගම්/වැඩබිම් සහ කම්කරු උසාවි යනාදී වශයෙන්). කාන්තා ශ්‍රමිකයන්ගෙන් පැමිණිලි 118 ක් ලැබී ඇති අතර, එයින් 77 ක් සමථයකට පත් කරන ලදී. කාන්තා ශ්‍රමිකයන්ගේ සුබසාධනය සඳහා සුබසාධන/සමාජ සත්කාර මධ්‍යස්ථාන, උසාවි, පොලිස් ස්ථාන සහ රෝහල් වෙත ගමන් වාර 430 ක් සිදු කරන ලදී. කිසියම් නිශ්චිත කාලසීමාවක් තුළ දී මෙම තානාපති කාර්යාලය සාමාන්‍ය වශයෙන් ආරක්ෂිත නිවසක රැඳවියන් 22 දෙනෙකු පවත්වාගෙන යයි. 2019 වසරේ දී කාන්තා ගෘහ සේවිකාවන් 223 දෙනෙකු ආරක්ෂත නිවස්නයේ නවාතැන් ගෙන ඇත. 2019 වසර තුළ දී මරණ 80 ක් වාර්තා වී ඇත. මෙයින් 26 දෙනෙකු භූමදාන කරනු ලැබූ අතර, 54 දෙනෙකුගේ දේහයන් තානාපති කාර්යාලයේ සහය ඇතිව ශ්‍රී ලංකාව වෙත යවන ලදී.
- 2019 වසරේ දී වන්දි නඩු 33 ක් අවසන් කරන ලදී. 2019 වසරේ දී ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා හිඟ වැටුප්, සේවය අවසන් කිරීම, වන්දි සහ රුධිර මුදල් වශයෙන් ශ්‍රී.ලං.රු. මිලියන 356 ක මුදලක් ලබා දීමට මෙම තානාපති කාර්යාලය සමත් විය.
- එම කාලසීමාව තුළ දී තානාපති කාර්යාලය බන්ධනාගාර රැඳවියන්ගේ නඩු 128 ක් පිළිබඳව සොයා බැලීය. දීර්ඝ කාලීන බරපතල නඩු කටයුතු 18 ක් සඳහා තානාපති කාර්යාලය දිගින් දිගටම සහභාගී වෙයි. නඩු කටයුතු දෙකක් මෙම තානාපති කාර්යාලය සාර්ථකව බේරුම් කර ඇති අතර, දැනටමත් පනවා ඇති දැඩි දඬුවම් වෙනස් කර ගැනීමට ද සමත් විය.

**10(2) සවුදි අරාබි රාජධානිය - ජෙද්දා (කොන්සල් ජනරාල් කාර්යාලය)**

**අ) ද්විපාර්ශ්වික සබඳතා**

- මෙම කොන්සල් ජනරාල් කාර්යාලය, ජෙද්දා හි පිහිටි සවුදි විදේශ කටයුතු අමාත්‍යාංශයේ බටහිර කලාප කාර්යාලය සහ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය හා කම්කරු අමාත්‍යාංශය වැනි රේඛීය ආයතනවල ප්‍රාදේශීය කාර්යාල සමග සමීපව කටයුතු කරයි. ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සුබසාධනයට අදාළ ද්විපාර්ශ්වික වශයෙන් වැදගත්වන කරුණු හා ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා කොන්සල් ජනරාල් කාර්යාලය මෙම අමාත්‍යාංශ සමග සාකච්ඡා පැවැත්වීය.
- ඉහළ පෙළේ සවුදි සම්භාවනීය අමුත්තන්, ව්‍යාපාරිකයන් හා සුබපතන්නන්ගේ සහභාගිත්වයෙන් යුතුව, මෙම කොන්සල් ජනරාල් කාර්යාලය ශ්‍රී ලංකාවේ 71 වැනි නිදහස් දිනය (2019) ජෙද්දා නුවර දී සමරන ලදී.
- ජෙද්දා හි මූලස්ථානය පිහිටි හජ් හා උම්රා කටයුතු අමාත්‍යාංශය සඳහා ශ්‍රී ලංකාවේ නියෝජිතයා වන මෙම කොන්සල් ජනරාල් කාර්යාලය, ශ්‍රී ලාංකික හජ් හා උම්රා වන්දනා කටයුතු ශ්‍රී ලංකාවේ මුස්ලිම් කටයුතු දෙපාර්තමේන්තු සමග සම්බන්ධීකරණය කළේය. 2019 හජ් වන්දනාවේ දී, ශ්‍රී ලාංකික හජ් වන්දනාකරුවන්ට සිම් කාඩ් පත් 4,000 ක් නොමිලයේ ලබා දීම සඳහා මෙම කොන්සල් ජනරාල් කාර්යාලය විසින් කොන්සියුමර් මොබයිල් - ස්ට්‍රැටජිස් ඇන්ඩ් ඉන්වේස්ට්මන්ට් සමාගම සමග අවබෝධතා ගිවිසුමක් ඇති කර ගන්නා ලදී.
- 2019 ජනවාරි 13 සිට 20 දක්වා තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය ගරු. ඒ.එච්.එම්. හලීම් මැතිතුමාගේ නායකත්වයෙන් යුතුව, මුස්ලිම් ආගමික හා සංස්කෘතික

කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්.ආර්.එම්. මලික් මහතා, ශ්‍රී ලංකාවේ හජ් කමිටුවේ සභාපති ආචාර්ය සියාඩ් මොහමඩ් තාහා මහතා, ගරු. අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් එම්.එච්.එම්. ෆාහිම් මහතා සහ ශ්‍රී ලංකා ගුවන් සේවයේ නියෝජිත අර්ෆාස් නුවයිස් මහතා සහභාගී වූ හජ් නියෝජිත පිරිසේ සංචාර සඳහා මෙම කොන්සල් ජනරාල් කාර්යාලය පහසුකම් සැපයීය.

- මක්කම වන්දනාවේ යෙදුණු ශ්‍රී ලාංකික හජ් වන්දනා කරුවන් 3,500 දෙනෙකුට මෙම කොන්සල් ජනරාල් කාර්යාලය පහසුකම් සැපයීය.

**ආ) බහුපාර්ශ්වික සබඳතා**

- රියාද් හි කොන්සල් ජනරාල් කාර්යාලය සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ජෙඩා හි මූලස්ථානය පිහිටි ඉස්ලාමීය රටවල සංවිධානය (OIC) වෙත කරුණු දැක්වීය. එහි එක් ප්‍රධාන රැස්වීමක් පැවැත්වූයේ, 2019 අප්‍රේල් මස 21 වැනි දින ශ්‍රී ලංකාවට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාර සම්බන්ධයෙන් ඉස්ලාමීය රටවල සංවිධානයේ ප්‍රතිචාරය පිළිබඳව එම සංවිධානයේ මහලේකම් ආචාර්ය යූසෙෆ් අල් ඔතයිමීන් සමඟය.

**ඇ) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන**

- ආර්ථික න්‍යායපත්‍රය ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලබන්නේ රියාද් හි තානාපති කාර්යාලය මඟින් වුව ද, මෙම කොන්සල් ජනරාල් කාර්යාලය ජෙඩා හි පැවති 'ෆුඩෙක්ස් 2019' ප්‍රදර්ශනයට ශ්‍රී ලංකාවට සහභාගී වීම සඳහා පහසුකම් සැලසීම සහ වෙළඳ විමසීම් කිහිපයක් වියහැකි ගැනුම්කරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීම මඟින් ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම සඳහා සහයෝගී කාර්යභාරයක් ඉටුකර ඇත. තවද, ජෙඩා හි සවුදි වාණිජ මණ්ඩල සමඟ වෙළඳ පැමිණිලි සහ ආරවුල් කිහිපයක් විසඳීම සඳහා කොන්සල් ජනරාල් කාර්යාලය සම්බන්ධීකරණය සිදු කළේය.

**ඈ) වෙනත් සංවිධාන සමඟ සබඳතා**

- ප්‍රමුඛ ඉස්ලාමීය පුණ්‍යායතන සංවිධානයක් වන ලෝක මුස්ලිම් ලීගය (MWL) සංවිධානයේ මහලේකම් ආචාර්ය මොහොමඩ් බින් අබ්දුල් කරීමම් අල්-ඊසා මහතාගේ ශ්‍රී ලංකා සංචාරය සම්බන්ධයෙන් මෙම කොන්සල් ජනරාල් කාර්යාලය එම සංවිධානය සමඟ සම්බන්ධීකරණය කළේය. මෙම සංචාරයේ දී, ත්‍රස්තවාදී ක්‍රියාවන්ට ගොදුරු වූවන්ගේ පවුල්වලට ආධාර කිරීම සඳහා ඩොලර් මිලියන 5 ක මුදලක් ලබා දීමට ලෝක මුස්ලිම් ලීගය පොරොන්දු විය.

**ඉ) ප්‍රජා සංවිධාන සමඟ සබඳතා**

- ශ්‍රී ලංකාවේ ප්‍රමාණ සමීක්ෂකයන්ගේ සංගමය, ශ්‍රී ලංකා ගිණුම්කරණ වෘත්තිකයන්ගේ සමාජය සහ විවිධ ටෝස්ට්-මාස්ටර්ස් සමාජ වැනි වෘත්තීය ශ්‍රී ලාංකික සංවිධන සමඟ ද මෙම කොන්සල් ජනරාල් කාර්යාලය කටයුතු කරයි.
- කොන්සල් ජනරාල් කාර්යාලය ජෙඩා හි ශ්‍රී ලාංකික ජාත්‍යන්තර පාසලේ අනුශාසක ධුරය දරයි. මෙම කාලසීමාව තුළ දී කොන්සල් ජනරාල් කාර්යාලය පාසලේ පරිපාලන අවශ්‍යතා සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණය කරන ලදී. පාසලේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනෙකුත් ශ්‍රී ලාංකිකයන් සමඟ එක්ව, විෂයානුබද්ධ හා විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ද එය සහභාගී විය.
- මෙම කොන්සල් ජනරාල් කාර්යාලය මදීනා හි ඉස්ලාමීය විශ්වවිද්‍යාලයේ හා අබා හි කිං ඛාලිඩ් විශ්වවිද්‍යාලයේ සිසු සිසුවියන් සමඟ සමීප සබඳතා පවත්වයි. මෙම ශ්‍රී ලාංකික ශිෂ්‍ය කවයන් තම විශ්වවිද්‍යාල උත්සවවල දී ශ්‍රී ලංකාව නියෝජනය කරන අතර, කොන්සල් ජනරාල් කාර්යාලය විසින් ඔවුන්ට අවශ්‍ය සහය ලබා දෙනු ලැබේ.

**බහුපාර්ශ්වික සබඳතා:** රියාද්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ආවරණය කොට වාර්තා කරනු ලැබේ.

**ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන:** රියාද්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ආවරණය කොට වාර්තා කරනු ලැබේ.

**සංස්කෘතික සබඳතා**

- ඇසළ පොහොය නිමිත්තෙන් 2019.07.19 වැනි දින පිරිත් පින්කම, පෙරහැර, බෝධි පූජා සහ භක්ති ගී ප්‍රසංගය ඇතුළු උත්සව අංග පවත්වන ලද අතර, එක් රැස් වූ 800 කට අධික ශ්‍රී ලාංකික පිරිස සඳහා දන්සැලක් ද පවත්වන ලදී.
- හින්දු පූජනීය කටයුතු, සංස්කෘතික අංග සහ සංගීත සන්දර්ශනය සමඟ 2019.10.25 වැනි දින දීපවාලි උත්සවය පවත්වනු ලැබූ අතර, එක් රැස්වූ 700-750 දෙනෙකු ගේ පමණ පිරිසට සාම්ප්‍රදායික හින්දු ආහාර පිරිනමන ලදී.
- ශ්‍රී ලංකාවේ මුස්ලිම් සංස්කෘතික හා ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් යුතුව, කොන්සල් ජනරාල් කාර්යාලය ශ්‍රී ලාංකික හජ් වන්දනාකරුවන් 4,000 දෙනෙකු මෙහෙයවීම සඳහා විවිධ මට්ටම් හා පරාසයන් ඔස්සේ සහය ලබා දුන්නේය. කොන්සල් ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන්, කොන්සල් ජනරාල් කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩලයේ සහය ඇතිව මෙම මෙහෙයුමේ අරමුණු ඉටුකරගන්නා ලදී.
- 2019 නොවැම්බර් 114-14 දිනවල ජෙඩා නුවර දී පැවති ආහර හා පාන කර්මාන්තය වෙනුවෙන් කැපවූ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයක් වන 'ෆුඩෙක්ස් 2019' සඳහා සහභාගී වීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලයට කොන්සල් ජනරාල් කාර්යාලය පහසුකම් සැලසීය.

**කම්කරු සුබසාධනය**

අබා කලාපයෙහි වෙසෙන ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ට උපකාර කිරීම සඳහා, ජෙඩා හි දූත මණ්ඩලය එක් ප්‍රංගම සේවාවක් පවත්වා තිබේ. දූත මණ්ඩලය වෙත පැමිණිලි 278 ක් ලැබී ඇත. කෙසේ වෙතත්, පිටවීමේ අවශ්‍යතා 67 ක් හා වෙනත් නිරවුල් කිරීම් 180 කින් සමන්විත පැමිණිලි 247 ක් නිරාකරණය කරන ලදී. ඒ අනුව, පැමිණිලි 31 ක් (විභාග වෙමින් පවතින) විසඳිය යුතුව ඇත.

**පිරිමි:**

ජෙඩා දූත මණ්ඩලයට පිරිමි ශ්‍රමිකයන්ගෙන් පැමිණිලි 259 ක් ලැබී ඇති අතර, එයින් 90% ක්ම විසඳා ඇත. තවද, නැවත සියරට පැමිණවීම් 277 ක් (කොන්සල් කාර්යාලය 67 + සුමයිෂි පිටුවහල් කිරීමේ කඳවුර 196 + ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය 14) සිදු කරන ලදී. පිටුවහල් කිරීමේ කඳවුරුවලට ගමන් වාර 64 ක්, රෝහලට ගමන් වාර 13 ක්, පොලිස් ස්ථානවලට ගමන් වාර 39 ක් සහ සමාගම්වලට ගමන් වාර 86 ක් සිදුකරන ලද අතර, කම්කරු අධිකරණ නඩු කටයුතු 77 ක් මෙහෙයවන ලදී.

**කාන්තා:**

ජෙඩා දූත මණ්ඩලයට කාන්තා ශ්‍රමිකයන්ගෙන් පැමිණිලි 19 ක් ලැබී ඇති අතර, එයින් 84% ක්ම විසඳා ඇත. තවද, නැවත සියරට පැමිණවීම් 145 ක් (ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ පැමිණිලි කළමනාකරණ පද්ධතිය 29 + සුමයිෂි පිටුවහල් කිරීමේ කඳවුර 103 + සෘජු සියරට පැමිණවීම් 13) සිදු කරන ලදී. කාන්තා සුබසාධන/සමාජ සත්කාර ආයතනය වෙත ගමන්වාර 19 ක්, රෝහල වෙත ගමන්වාර 13 ක්, පොලිස් ස්ථානවලට ගමන් වාර 16 ක් සිදුකරන ලද අතර, කම්කරු නඩු කටයුතු 20 ක් සඳහා අධිකරණයේ පෙනීසිටින ලදී. මෙම දූත මණ්ඩලයේ ආරක්ෂිත නිවාසයෙහි පවත්වා ගන්නා රැඳවියන් සංඛ්‍යාවේ සාමාන්‍යය 03 දෙනෙකු වන අතර, එහි කාන්තා ගෘහ සේවිකාවන් 40 දෙනෙකු නවාතැන් ගෙන ඇත.

2019.12.31 වැනි දින වන විට මරණ 39 ක් වාර්තා වී තිබේ. මෙයින් 25 දෙනෙකු රාජධානිය තුළ දී භූමදාන කරන ලද අතර, 14 දෙනෙකුගේ දේහයන් ශ්‍රී ලංකාව වෙත යවන ලදී.

## 11. (1) එක්සත් අරාබි එමීර් රාජ්‍යය - අබුඩාබි

### අ) ද්විපාර්ශ්වික සබඳතා

- මාකඳුරේ මධුෂ් පිටුවහල් කිරීම සම්බන්ධයෙන් මෙම තානාපති කාර්යාලය එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ බලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වූ අතර, මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු. තිලක් මාරපන මැතිතුමා සහ අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතවරයා 2019 අප්‍රේල් 2-4 දිනවල දී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ නිරත වූ සංචාරය සඳහා තානාපති කාර්යාලය පහසුකම් සැලසීය. එහි දී අමාත්‍යවරයා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය අන්වර් ගර්ගාෂ් මැතිතුමා සමඟ සාකච්ඡා පැවැත්වීය. තවද, මාකඳුරේ මධුෂ් පිටුවහල් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සිට පැමිණි ඉන්ටර්පොල් දූත පිරිසේ සංචාරය සඳහා ද මෙම තානාපති කාර්යාලය පහසුකම් සැලසීය.

- 2014 දී දෙරට අතර අත්සන් තබන ලද උදර්පන ගිවිසුම සංශෝධනය කිරීම සඳහා 2019 ජූලි 22 වැනි දින පවත්වන ලද ද්විපාර්ශ්වික සාකච්ඡාවට මෙම තානාපති කාර්යාලය පහසුකම් සැලසූ අතර, ඊට සහභාගී විය. නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා, ආරක්ෂක අමාත්‍යාංශයේ නීති උපදේශක සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය නීති උපදේශකගෙන් සමන්විත ශ්‍රී ලංකාවේ දූත පිරිස ද සාකච්ඡාවලට සහභාගී විය. සාකච්ඡාවල දී එකඟ වූ පරිදි, ශ්‍රී ලංකාව මෙම ගිවිසුමේ 5(I) ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා යෝජිත පාඨය එක්සත් අරාබි එමීර් රාජ්‍ය පාර්ශ්වය වෙත ඉදිරිපත් කළේය.

- 2019 නොවැම්බර් 4-8 දිනවල දී විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් රවිනාථ ආර්යසිංහ මහතා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ නියැළුණු සංචාරයට මෙම තානාපති කාර්යාලය පහසුකම් සැලසීය. මෙම සංචාරය අතරතුර දී ලේකම්වරයා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඉවසීම පිළිබඳ අමාත්‍ය ෂෙයික් නහියන් මුබාරක් අල් නහියන් උතුමාණන්, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය අන්වර් ගර්ගාෂ් මැතිතුමා සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ උප ලේකම් එව්. බාලිඩ් අබු අල්හූල් මහතා සමඟ සාකච්ඡා පැවැත්වීය. 2019-2023 කාලසීමාව සඳහා යුනෙස්කෝ විධායක මණ්ඩලයට එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අපේක්ෂකත්වයට සහය දෙන බවට ශ්‍රී ලංකාව පොරොන්දු විය.

- රාජ්‍යතාන්ත්‍රිකයන් සඳහා පුහුණු හා හුවමාරු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා මෙම තානාපති කාර්යාලය එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, එමීර් රාජ්‍යයේ රාජ්‍යතාන්ත්‍රික ඇකඩමිය සමඟ සාකච්ඡා පැවැත්වීය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 මැද භාගයේ දී පැවැත්වීමට නියමිත 21 වැනි සියවසේ රාජ්‍යතාන්ත්‍රික නායකත්වය පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී වන ලෙස එමීර් රාජ්‍යයේ රාජ්‍යතාන්ත්‍රික ඇකඩමිය ශ්‍රී ලංකාවට ආරාධනා කළේය.

- එමීර් රාජ්‍යයේ උපායමාර්ගික අධ්‍යයන හා පර්යේෂණ මධ්‍යස්ථානය සහ ජාත්‍යන්තර සම්බන්ධතා සහ උපායමාර්ගික අධ්‍යයන සඳහා ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම සඳහා මෙම තානාපති කාර්යාලය එමීර් රාජ්‍යයේ ක්‍රමෝපායික අධ්‍යයන හා පර්යේෂණ මධ්‍යස්ථානය සමඟ සාකච්ඡා පැවැත්වීය. මෙම අවබෝධතා ගිවිසුමේ කෙටුම්පත සලකා බැලීම සඳහා අමාත්‍යාංශයෙන් එමීර් රාජ්‍යයේ උපායමාර්ගික අධ්‍යයන හා පර්යේෂණ මධ්‍යස්ථානය වෙත යැවිය යුතුව ඇත.

- ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය සිය 40 වසරක රාජ්‍යතාන්ත්‍රික සබඳතා 2019 වසරේ දී සමරණ ලද බැවින්, මෙම තානාපති කාර්යාලය එමීර් රාජ්‍යයේ උපායමාර්ගික අධ්‍යයන හා පර්යේෂණ මධ්‍යස්ථානය සමඟ එක්ව දෙරට අතර 40 වසරක රාජ්‍යතාන්ත්‍රික සබඳතා සනිටුහන් කරමින් සමරු සිහිවටනයක් ප්‍රකාශයට පත් කිරීම සඳහා කටයුතු කළේය.

- 2019 සැප්තැම්බර් 2 සිට 13 දක්වා පැවති ආරක්ෂක සේවා අණදෙන මූලස්ථානයේ හා මාණ්ඩලික විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන්ගේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අධ්‍යයන චාරිකාව සඳහා මෙම තානාපති කාර්යාලය පහසුකම් සැලසීය.

**ආ) බහුපාර්ශ්වික සබඳතා**

- මෙම තානාපති කාර්යාලය 2019 දී පහත සඳහන් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා පහසුකම් සලසමින් සහභාගී විය.

- 2019 ජනවාරි 11-13 දිනවල දී පැවති ජාත්‍යන්තර පුනර්ජනනීය බලශක්ති නියෝජිතායතනයේ (IRENA) 9 වැනි සැසිය හා 2019 අප්‍රෙල් හා ඔක්තෝබර් මාසවල දී පැවති එහි සභා රැස්වීම්.

- 2019 පෙබරවාරි 17-21 දිනවල දී පැවති ජාත්‍යන්තර ආරක්ෂක ප්‍රදර්ශනය හා සමුළුවට සහභාගී වීම සඳහා මෙම තානාපති කාර්යාලය ශ්‍රී ලංකා නාවික හමුදාවට පහසුකම් සැලසීය. මෙම සමුළුව සඳහා නාවික හමුදාවේ සයුරල නෞකාව සහභාගී විය.

- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය අජිත් මාන්නප්පෙරුම මැතිතුමාගේ නායකත්වයෙන් යුත් නියෝජිත පිරිස 2019 ජුනි 30 - ජූලි 02 දිනවල දී පැවති එක්සත් ජාතීන්ගේ සංගමයේ මහලේකම්වරයාගේ දේශගුණික ක්‍රියාකාරී සමුළුවට සහභාගී විය.

- විදේශ කටයුතු ලේකම් රවිනාථ ආර්‍යසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් නියෝජිත කණ්ඩායම 2019 නොවැම්බර් 7 වැනි දින අබුඩාබියේ පැවති ඉන්දියන් සාගර වටදඳර රටවල සංගමයේ (IORA) 19 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීමට සහභාගී විය.

- 2019 නොවැම්බර් 3-7 දිනවල දී පැවති එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ (UNIDO) මහා සම්මේලනයේ 18 වැනි සැසිය.

- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ (CIABOC) කොමසාරිස් හා අධ්‍යක්ෂ ජනරාල් සහ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ ශ්‍රී ලංකාවේ කේන්ද්‍රස්ථානයේ නායකත්වයෙන් යුත් නියෝජිත පිරිසක්, 2019 දෙසැම්බර් 13-20 දිනවල දී පැවති එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි සම්මුතියෙහි (UNCAC) 8 වැනි රාජ්‍ය පාර්ශ්ව සමුළුවට සහභාගී විය.

**ඇ) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන**

- එක්සත් අරාබි එමීර් රාජ්‍යය තුළ ශ්‍රී ලාංකික ආහාර පාන ප්‍රවර්ධනය කිරීම පිණිස, 2019 නොවැම්බර් 7-9 දිනවල අබුඩාබි හි දී පැවති ටේස්ට් ඔෆ් අබුඩාබි සංචාරක ප්‍රවර්ධන වැඩසටහනට සහභාගී වීම සඳහා මෙම තානාපති කාර්යාලය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට පහසුකම් සැලසීය.
- තානාපති කාර්යාල පරිශ්‍රයේ දී ශ්‍රී ලංකා තේ, අත්කම් ආදී ශ්‍රී ලාංකික නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රදර්ශන කැබිනෙට්ටුවක් පිහිටුවීම.
- ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු, තේ, අපනයන භාණ්ඩ හා ආයෝජන විදේශික අමුත්තන් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා තානාපති කාර්යාලයේ පොදු ස්ථානයේ රූපවාහිනී තිරයක් පිහිටුවීම.
- "සෝ ශ්‍රී ලංකා" සංචාරක ප්‍රවර්ධන පොත් පිංච අරාබි භාෂාවට පරිවර්තනය කිරීම.

**ඉ) සංස්කෘතික සබඳතා**

- තානාපති කාර්යාලය අබුඩාබි හි ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ එක්ව පහත සඳහන් සංස්කෘතික වැඩසටහන් සංවිධානය කළේය.

    - ශ්‍රී ලංකාවේ 71 වැනි නිදහස් දිනය නිමිත්තෙන් ලේ දන් දීමේ ව්‍යාපාරයක් සහ වෛද්‍ය සායනයක්.
    - මාසික පෝය දින වැඩසටහන්, සිකුරාදා දහම් පාසල, ඉෆ්තාර් වැඩසටහන, දීපවාලී සහ නත්තල් සැමරුම.
    - පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් සිය ජීවිත අහිමි වූ ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සිහිපත් කිරීම සඳහා 2019 අප්‍රේල් 26 වැනි දින තානාපති කාර්යාලයේ දී බහු ආගමික උත්සවයක් පවත්වන ලදී.

- 2019 දෙසැම්බර් 31 වැනි දින තානාපති කාර්යාලයේ පැවති සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනය. අති පූජනීය බෞද්ධ භික්ෂූන් වහන්සේලා 10 නමක් පිරිත් සජ්ඣායනයට සහභාගී වූහ.

**ඊ) කොන්සියුලර් කටයුතු සහ කම්කරු සුබසාධනය**

- 2019 දෙසැම්බර් මාසයේ දී තානාපති කාර්යාලයේ සහ කොන්සල් ජනරාල් කාර්යාලයේ නිලධාරීන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ජාතික සුදුසුකම් අධිකාරියේ (NQA) ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර සේවක නිපුණතා එකඟතාවයට අදාළවන කරුණු පිළිබඳව සාකච්ඡා පැවැත්වූහ.
- අල් අයින් හි දී කොන්සියුලර් හා කම්කරු ජංගම සේවා පවත්වන ලද අතර, එය රාස්-අල්-බයිමා ප්‍රදේශයට ද ව්‍යාප්ත කරන ලදී.
- මෙම දූත මණ්ඩලය මගින් අහලියා වෛද්‍ය කණ්ඩායම සහ ශ්‍රී ලාංකික වෛද්‍යවරුන් සමඟ එක්ව තානාපති කාර්යාල පරිශ්‍රයේ දී මාසික වෛද්‍ය කඳවුරු සහ උපදේශන සැසි පවත්වන ලදී.
- තම අනුග්‍රාහකයන් සහ බඳවාගැනීමේ නියෝජිතයන් වෙතින් මිදී පලාගිය ගෘහ සේවිකාවන්ට මෙම තානාපති කාර්යාලය දූත මණ්ඩලයේ ආරක්ෂිත නිවහනේ නවාතැන් ලබාදෙන ලදී. එහි විස්තර පහත පරිදි වේ:
    - දූත මණ්ඩලය වෙත පැමිණි ගෘහ සේවිකාවන් සංඛ්‍යාව - 49
    - ශ්‍රී ලංකාව වෙත ආපසු එවන ලද ගෘහ සේවිකාවන් සංඛ්‍යාව - 33
    - ඩුබායි හි කොන්සල් ජනරාල් කාර්යාලය වෙත භාර දෙන ලද ගෘහ සේවිකාවන් සංඛ්‍යාව - 05
    - නියෝජිතායතනයට භාර දෙන ලද ගෘහ සේවිකාවන් සංඛ්‍යාව - 01
    - පොලිසියට භාර දෙන ලද ගෘහ සේවිකාවන් සංඛ්‍යාව - 03
    - අනුග්‍රාහකයන්ට භාර දෙන ලද ගෘහ සේවිකාවන් සංඛ්‍යාව - 01
    - ඉදිරි වසර දක්වා ඉදිරියට ගෙන යන ලද නඩු සංඛ්‍යාව - 06
- 2019.03.02 සිට 2019.12.01 දක්වා බරපතල හෘද රෝග තත්ත්වයක් හේතුවෙන් අබුඩාබි හි දැඩි සත්කාර ඒකකයක ප්‍රතිකාර ලැබූ රෝගියෙකු වූ එස්.අයි. සිත්ති සුවාරා මෙනෙවිය (N6177270) සමඟ නීතිවිරෝධී/වැඩිපුර කාලයක් රැඳී සිටි ශ්‍රමිකයන් 34 දෙනෙකු ආපසු ශ්‍රී ලංකාව වෙත එවීම සඳහා මෙම දූත මණ්ඩලය සහාය විය.
- සංක්‍රමණික ශ්‍රමිකයන් විසින් දූත මණ්ඩලයට කරන ලද පැමිණිලි, හියුමන් රිසෝර්සස් ඇන්ඩ් එමිරටයිසේෂන් ආයතනය මගින් හඳුන්වා දී ඇති TAWFUQ මධ්‍යස්ථාන හරහා භාර ගන්නා ලදී. මෙවැනි පැමිණිලි 74 ක් මෙම දූත මණ්ඩලය මගින් භාරගෙන ඇත.
- උසාවි වෙත යාම/නියෝජනය කිරීම, බන්ධනාගාර වෙත යාම, වන්දි ලබා දීම, මෘතදේහයන් නැවත මෙරටට ගෙන්වා ගැනීම, පිටවීමේ අවසරපත් නිකුත් කිරීම, "අමානාත්" ගිණුමට තැන්පත් කිරීම සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් විසින් සපයනු ලබන වෙනත් පරිභෝජන ද්‍රව්‍ය ලබා දීම වැනි නිත්‍ය ශ්‍රමික සේවා සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා මෙම දූත මෙහෙවර මගින් ලබාදෙන ලදී.

**11 (2) එක්සත් අරාබි එමීර් රාජ්‍යය - ඩුබායි (කොන්සල් ජනරාල් කාර්යාලය)**

**අ) ද්විපාර්ශ්වික සබඳතා**

මෙය අබුඩාබියේ පිහිටි තානාපති කාර්යාලයේ විෂය පථයට අයත් වේ.

**ආ) බහුපාර්ශ්වික සබඳතා**

මෙය අබුඩාබියේ පිහිටි තානාපති කාර්යාලයේ විෂය පථයට අයත් වේ.

**ඇ) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන**

- ශ්‍රී ලංකාව නැගී එන සුවතා සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කරමින්, 2019 ජනවාරි 28-31 දිනවල එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි ඩුබායි ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ දී පැවති 'අරාබි සෞඛ්‍යය 2019' ප්‍රදර්ශනයේ දී, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සුවතා සමාගම් හයකට (06) එහි ශ්‍රී ලාංකික ප්‍රදර්ශනාගාරය යටතේ සහභාගී වීම සඳහා මෙම කොන්සල් ජනරාල් කාර්යාලය මඟින් සම්බන්ධීකරණය කරන ලදී. මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ විශාලතම සෞඛ්‍ය හා සුවතා ප්‍රදර්ශනය වන මෙම වාර්ෂික අංගයට ශ්‍රී ලංකාව සහභාගී වූ පළමු අවස්ථාව මෙය විය. විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන යටතේ වෙන් කර ඇති ප්‍රධාන අරමුදල් උපයෝගී කර ගනිමින්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ සහය ඇතිව සිදුකළ 'අරාබි සෞඛ්‍යය 2019' ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය, සෞඛ්‍ය ප්‍රවර්ධනයෙහි නියැලී සිටින ලොව පුරා සන්නාම නායකයින් විශාල සංඛ්‍යාවක් ආකර්ෂණය කරගත් සංසදයක් තුළ ශ්‍රී ලංකාවේ විශේෂිත සුවතා සංචාරක සන්නාමය ප්‍රවර්ධනය කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

- ලොව විශාලතම ආහාර හා පාන ප්‍රදර්ශනය 2019 පෙබරවාරි 17-21 දිනවල ඩුබායි හි ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ දී පැවැත්වූ අතර, ශ්‍රී ලාංකික අපනයන සමාගම් 60 කට අධික සංඛ්‍යාවක් ගල්ෆ් කලාපයට හා අනෙකුත් ගෝලීය වෙළඳපොළවලට ලංකා තේ සහ අනෙකුත් ආහාර ආශ්‍රිත අපනයන ප්‍රවර්ධනය කරමින් මෙම අවස්ථාවට සහභාගී වූහ. එහිදී ඇ. ඩො. මිලියන කිහිපයක් වටිනා ඇනවුම් ලබා ගැනීම මෙන්ම, ව්‍යාපාරික සබඳතා විශාල සංඛ්‍යාවක් ස්ථාපිත කිරීම හා තහවුරු කිරීම ද සිදුවිය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ එක්ව ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය මෙම ගල්ෆ් ආහාර 2019 ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය කොට පහසුකම් සැපයීය.

- ශ්‍රී ලංකාවේ 71 වැනි නිදහස් සමරුව සනිටුහන් කරමින් 2019 පෙබරවාරි 04 වැනි දින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ප්‍රමුඛ ඉංග්‍රීසි පුවත්පත් වන 'බලීජ් ටයිම්ස්' සහ 'ගල්ෆ් නිවුස්' හි පිටු 4 ක විශේෂ පුවත්පත් අතිරේකයක් පළ කරන ලදී. රටෙහි ප්‍රතිරූපය එක්සත් අරාබි එමීර් රාජ්‍යය තුළ ප්‍රවර්ධනය කරමින්, ශ්‍රී ලංකාවේ අපනයන, සංචාරක අපේක්ෂාවන්, ශ්‍රී ලංකන් ගුවන් සේවය යනාදිය පිළිබඳව පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී.

- 2019 අප්‍රේල් 28 සිට මැයි 01 දක්වා පැවති මැදපෙරදිග හා පෑන් අරාබි කලාපයේ ප්‍රමුඛතම චාරිකා සංචාරක කටයුතු ප්‍රදර්ශනය වන අරාබියානු සංචාරක වෙළඳපොළ සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වයට මෙම කොන්සල් ජනරාල් කාර්යාලය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එක්ව පහසුකම් සැලසීය. චාරිකා හා සංචාරක කටයුතු කර්මාන්තයේ නියැළි ශ්‍රී ලාංකික සමාගම් 65 කට අධික සංඛ්‍යාවක්, ශ්‍රී ලංකාව ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කරමින් ඊට සහභාගී විය.

- 2020 ජූලි 08 වැනි දිනට යෙදෙන එක්ස්පෝ 2020 සඳහා සහභාගිත්ව කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීම ඇතුළුව, ශ්‍රී ලංකාවේ සහභාගිත්වය පිළිබඳ අවශ්‍ය සහාය එක්ස්පෝ ලේකම් කාර්යාලය සමඟ එක්ව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත ලබා දෙන ලදී.

**ඈ) සංස්කෘතික සබඳතා**

- 2019.02.04 වැනි දින ඩුබායි හි සිටින ශ්‍රී ලාංකික විදේශිකයන් සඳහා ජාතික දින සැමරුමක් සංවිධානය කරන ලදී.
- ඩුබායි දී අලුතින් පිහිටුවන ලද ලංකාරාමය විහාරස්ථානයේ දී මාසික ආගමික වතාවත් සිදුකිරීම.
- සෑම සිකුරාදා දිනකම කොන්සල් ජනරාල් කාර්යාල පරිශ්‍රයේ දී, ඩුබායි සහ උතුරු එමීර් රාජ්‍යයේ වෙසෙන විදේශගත බෞද්ධ ශ්‍රී ලාංකිකයන්ගේ දරුවන් 600 දෙනෙකුට අධික සංඛ්‍යාවක් සඳහා දහම් පාසල් පැවැත්වීම. මෙම දහම් පාසලේ දී දරුවන්ට ශ්‍රී ලාංකික සංස්කෘතිය, සිංහල භාෂාව සහ බුද්ධාගම යන විෂයයන් උගන්වනු ලැබේ.

- විවිධ ආගමික කණ්ඩායම් අතර සමගිය හා සුහදතාවය පවත්වා ගැනීමේ වැදගත්කම සනිටුහන් කරමින් ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය විසින් 2019 මැයි 16 වැනි බ්‍රහස්පතින්දා ඩුබායි හි සිටින මුස්ලිම් ප්‍රජාව සමඟ එක්ව ඉෆ්තාර් උත්සවයක් පවත්වන ලදී. ඉහත වැඩසටහනට සියලුම ආගම් නියෝජනය කරමින් ශ්‍රී ලාංකිකයන් 200 කට අධික සංඛ්‍යාවක් සහභාගී වූහ. මෙවැනි සිදුවීමක් ඩුබායි හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය විසින් සංවිධානය කරන ලද අඛණ්ඩ තුන්වැනි අවස්ථාව මෙය වේ.
- සංචාරක කටයුතු හා ආයෝජන යන දෙකටම කීර්තිමත් ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන අරමුණෙන් යුතුව, ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කර වසර 40 ක් සපිරීම නිමිත්තෙන් "ශ්‍රී ලාංකික සංස්කෘතික හා සංචාරක කටයුතු ප්‍රවර්ධන රාත්‍රිය 2019" අමුත්තන් 300 දෙනෙකුට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් ඩුබායි හි ප්‍රමුඛතම තරු පහේ හෝටලය වන බර්ජ් බලිෆා හි පිහිටි අර්මානි හෝටලයේ දී පැවැත්වීම සඳහා සත්කාරකත්වය සපයන ලදී.

**ඉ) කම්කරු සුබසාධනය**

- සමාලෝචනයට භාජනය වූ කාලසීමාවේ දී නව රැකියා ඇනවුම් 152 ක් ලබා දී ඇත.
- අවශ්‍යතා පවතින ශ්‍රී ලාංකිකයන් සඳහා ආධාර ලබා දීමේ දී, බන්ධනාගාරවල සිටින ශ්‍රී ලාංකිකයන්ගේ සහ ආගමන, උසාවි සහ පොලිසිවල අවශ්‍යතා ඇතුළුව, ඩුබායි හා උතුරු එමීර් රාජ්‍යයේ සිටින ශ්‍රී ලාංකිකයන් 273 දෙනෙකුට නීති ආධාර ලබා දෙන ලදී.
- ශ්‍රී ලාංකිකයන්ගේ ඉල්ලීම් පිළිබඳව කටයුතු කිරීම සඳහා කම්කරු කඳවුරු 152 ක් වෙත යාම.
- ශ්‍රී ලාංකිකයන්ගේ වන්දි සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ සඳහා වූ ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රමුඛතා පදනමින් කටයුතු කිරීම.
- ළඟම ඥාතීන් විසින් ඉල්ලා ඇති පරිදි, මෘත දේහයන් නැවත මෙරටට ගෙන්වා ගැනීම/භූමදාන කිරීම සහ විදේශ සබඳතා අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයට වාර්තා කිරීම සඳහා ඉක්මනින් පියවර ගැනීම. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී මෘත දේහ 22 ක් ශ්‍රී ලංකාව වෙත ගෙන එන ලද අතර, මෘත දේහ 06 ක් ඩුබායි හා උතුරු එමීර් රාජ්‍යයේ දී භූමදාන කරන ලදී.
- ආගමන නිෂ්කාශන ලැබීමෙන් පසුව, ආරක්ෂිත නිවාසවල රැඳවියන් ඇතුළුව ශ්‍රමිකයන් 376 දෙනෙකු නැවත සියරට පමුණුවන ලදී.
- ශ්‍රී ලාංකිකයන් 386 දෙනෙකුට ආරක්ෂිත නිවාස පහසුකම් ලබා දී ඇත.
- ශ්‍රී ලාංකිකයන් 386 දෙනෙකුට සහ 215 දෙනෙකුට පිළිවෙලින් උපදේශන හා සමාදාන කිරීමේ සේවා ලබා දී ඇත.
- ශ්‍රී ලාංකිකයන් 94 දෙනෙකුට වෛද්‍යාධාර ලබා දී ඇති අතර, ඉන් 20 දෙනෙකු රෝහල්ගත කිරීම සඳහා සහාය වී ඇත.
- ශ්‍රී ලාංකිකයන් 420 දෙනෙකුට විවිධ කරුණු සම්බන්ධයෙන් ප්‍රවාහන පහසුකම් ලබා දී ඇත.
- ශ්‍රී ලාංකිකයන් 150 දෙනෙකුට ආහාර සැපයීමට සහාය වී ඇති අතර, 218 දෙනෙකු සඳහා අවශ්‍ය තොරතුරු ලබා දී ඇත.
- පැමිණිලි 286 ක් සමථයකට පත් කරන ලදී.

# ආර්ථික කටයුතු අංශය

## ආර්ථික කටයුතු අංශය

ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය, ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ආර්ථික සහයෝගිතාවය සහ තාක්ෂණික සහයෝගිතාවය සම්බන්ධ කටයුතු ආර්ථික කටයුතු අංශය වෙත පැවරී තිබේ. ඒ අනුව, මෙම අමාත්‍යාංශයේ විදේශවල දී වෙළඳ, ආයෝජන, සංචාරක කටයුතු හා අනෙකුත් ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වගකිවයුතු අදාළ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ සිදුකරන කේන්ද්‍රීය ස්ථානය ලෙස මෙම අංශය කටයුතු කරන අතර, ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩලවල වෙළඳ හා වාණිජ, ආයෝජන, තාක්ෂණික සහයෝගිතාව, සංචාරක කටයුතු හා තේ ප්‍රවර්ධනයට අදාළ කරුණු, විදේශ රැකියා ප්‍රවර්ධනයේ දී සහය වීම, සංවර්ධන සහයට අදාළ කරුණු හා වෙළඳ ආරවුල් නිරාකරණය සම්බන්ධීකරණය යනාදී කටයුතු සිදුකරයි. මීට අමතරව, බහුපාර්ශ්වීය සංවිධාන හා ආර්ථික ගැටලු සම්බන්ධයෙන් කටයුතු කරන සංසදවල දී මෙම අංශය ශ්‍රී ලංකාවේ නියෝජනය සම්බන්ධීකරණය කරයි.

මෙම ප්‍රයත්නයේ විශේෂිත කාර්යයන් අතරට, ශ්‍රී ලංකා දූත මණ්ඩල හා අදාළ රාජ්‍ය නියෝජිතායතන සමඟ එක්ව ශ්‍රී ලාංකික භාණ්ඩ හා සේවා සඳහා නව වෙළඳපොළවල් පිළිබඳ ගවේෂණය කිරීම, පවත්නා වෙළඳපොළ පුළුල් කිරීම සහ සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීමේ අරමුණෙන් යුතුව උත්සව අංග, රැස්වීම් හා ව්‍යාපාරික කටයුතු භාරගැනීම සහ සංවිධානය කිරීම ඇතුළත් වේ.

පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් අනතුරුව, සංචාරක කර්මාන්තය යළි පණගැන්වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, අනෙකුත් රටවල් සමඟ ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා ආර්ථික පුනර්ජීවනය සඳහා වන යාන්ත්‍රණවලට සහාය වන පහසුකම් සලසන්නෙකු ලෙස 2019 වසර තුළ දී මෙම අමාත්‍යාංශය සිය කාර්යභාරය අඛණ්ඩව ඉටු කළේය.

### 1. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

### 1.1. ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන (EDP)

රජයේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික මුලපිරීම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වසර තුනක කාලයක් තිස්සේ ක්‍රියාත්මක වන, අංග තුනකින් සමන්විත වැඩසටහනක් 2018 වසරේ දී මෙම අංශය මඟින් හඳුන්වා දෙන ලදී.

(i) විදේශ ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා කාර්ය දර්ශක හා කාර්ය දර්ශන ඉලක්ක සැපයීම (EIPTM), (ii) තෝරාගත් වෙළඳපොළවල ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු ප්‍රවර්ධනය, (iii) විදේශීය ශ්‍රී ලාංකිකයන් සංවර්ධනයේ හවුල්කරුවන් ලෙස - වැඩසටහන. මෙම සෑම එක් එක් උප වැඩසටහනක්ම ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු තුළින් අනෙකුත් ජාතීන් සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා ශක්තිමත් කිරීම සඳහා දායක වේ.

#### i. දූත මණ්ඩල සඳහා ආර්ථික ඉලක්ක

විදේශයන්හි දූත මණ්ඩල සඳහා ආර්ථික කාර්ය සාධන ඉලක්ක සැකසීම මඟින්, නැඟී එන වෙළඳපොළ සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් වෙන් කරන අතරම, ස්ථාපිත හා ශක්තිමත් වෙළඳපොළ හඳුනාගැනීම හා ඒ සමඟ නියැලීම වැඩිදියුණු කිරීමට ආර්ථික කටයුතු අංශය අපේක්ෂා කරයි. උපායමාර්ගික සම්පත් වෙන්කිරීම මඟින් ශ්‍රී ලංකාවට විවිධ වෙළඳපොළවල් සමඟ පූර්ණ වශයෙන් නියැලීම වඩාත් සුහද ආකාරයකින් සිදුකළ හැකි වේ. සවිස්තරාත්මක අධ්‍යයනයකින් පසුව හා අදාළ රේඛීය නියෝජිතායතන සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, 2019 වසරේ දී එක් එක් දූත මණ්ඩලයට අපනයන හා විදේශ රැකියා ඉලක්ක ලබා දෙන ලදී.

#### ii. තෝරාගත් වෙළඳපොළවල ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

ආර්ථික ප්‍රවර්ධන වැඩසටහනෙහි දෙවැනි අංගය වන 'ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රවර්ධනය' උප වැඩසටහන, ශ්‍රී ලංකාවට වෙනත් ජාතීන් සමඟ තවදුරටත් නියැලී කටයුතු කළ හැකි සුදුසු ප්‍රවේශයන් හඳුනාගැනීම අරමුණු කොටගෙන හඳුන්වා දී ඇත. සෑම වෙළඳපොළකටම එකිනෙකට වෙනස් ශක්තීන් සමූහයක් ඇති බැවින්, මෙම උප වැඩසටහන සැලසුම් කොට ඇත්තේ ප්‍රධාන වෙළඳපොළවල්

හඳුනාගෙන එම ශක්තීන් සඳහා සුදුසු ප්‍රවර්ධන උපායමාර්ග යෝජනා කිරීම සඳහාය. මෙම වැඩසටහන තුළින්, 2018 දී ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන්වලට ඍජුවම සම්බන්ධ වී, අරමුදල් යොදවා සංවිධානය කිරීමටත්, 2019-2020 දී අදළ අමාත්‍යාංශ හා පුද්ගලික අංශයේ ද සහයෝගීතාවයෙන් යුතුව සංවිධානය කිරීමටත් මෙම අමාත්‍යාංශය කටයුතු කළේය.

මෙම වසර තුළ දී ශ්‍රී ලංකාවේ ගෝලීය පියසටහන වැඩිදියුණු කිරීම සහ රටට ස්පෘෂ්‍ය ආර්ථික ප්‍රතිලාභ ගෙන ඒම පිණිස ඉලක්කගත ව්‍යාපාර 39 ක් ක්‍රියාත්මක කිරීම සඳහා විදේශවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට සහය ලබා දුන් අතර, ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන යටතේ වෙළඳ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී.ලං.රු. 50,000,000 ක අතිරේක අරමුදල් බෙදා හරින ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දියත් කරන ලද ජාතික අපනයන උපායමාර්ගයේ අවධානය යොමු වූ ප්‍රධාන අංශවලට අනුකූලව මෙම ප්‍රවර්ධන අංග පවත්වන ලදී. මෙම ප්‍රදර්ශන අංග අවසන් වීමෙන් අනතුරුව මෙම අංශය සෑම දූත මණ්ඩලයකින්ම ප්‍රගති වාර්තා ඉල්ලා සිටියේය. ලැබී ඇති වාර්තාවලට අනුව, මෙම ඉලක්කගත ප්‍රවර්ධන අංග මඟින්, ශ්‍රී ලාංකික අපනයනකරුවන් හා අපේක්ෂිත රටවල ආනයනකරුවන් අතර ඍජු සබඳතා සහතික කිරීම හා වැඩිදියුණු කිරීම තුළින් අතිශයින් දිරිගන්වන සුළු ප්‍රතිඵල ලබා දී ඇති බව පෙනී ගියේය. මෙම විශේෂිත සිදුවීම් හරහා ඍජු අපනයන ඇණවුම් කිහිපයක්ම ක්‍රියාත්මක විය.

### iii. විදේශීය ශ්‍රී ලාංකිකයන් සංවර්ධනයේ හවුල්කරුවන් ලෙස

ආර්ථික කටයුතු අංශය විසින් කාණ්ඩ හතරක් යටතේ විදේශීය ශ්‍රී ලාංකිකයන් සංවර්ධනයේ හවුල්කරුවන් ලෙස සම්බන්ධ කර ගැනීම පිළිබඳ සංකල්ප පත්‍රිකාවක් සකස් කරන ලදී. 1. ආර්ථික, 2. දේශපාලනික, 3. මහජන හා සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය, 4. පුද්ගලාන්තර සබඳතා. මෙම උප වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රියාකාරක් සිදුකරන ලදී:

i. බ්‍රිතාන්‍ය ශ්‍රී ලාංකික ඩයස්පෝරාව සඳහා ආයෝජන හා වෙළඳ වටමේස රැස්වීම - 2019 සැප්තැම්බර් 02, ලන්ඩන්, එක්සත් රාජධානිය

ii. ශ්‍රී ලංකා උළෙල - 2019, 2019 නොවැම්බර් 09, කැන්බරා, ඕස්ට්‍රේලියාව

iii. උනන්දුවක් ඇති කිරීම හා ආයෝජකයන් හඳුනාගැනීමේ අරමුණින් යුතුව, අපනයන සංවර්ධන මණ්ඩලයේ, එක් ගම්මානයක එක් නිෂ්පාදනයක් සහ අපනයනකරුවන් 2,000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන මෙල්බර්න්හි ශ්‍රී ලංකා කොන්සාල් කාර්යාලය හරහා ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත හඳුන්වා දීමේ වැඩසටහන - 2019 ඔක්තෝබර් 13

## 2. ද්විපාර්ශ්වික සබඳතා

i. මෙම අංශය මඟින්,

අ) කටාර්, ජපානය හා සීෂෙල්ස් යන රටවලින් මෙහි පැමිණි ඉහළ මට්ටමේ සංචාර 03 ක්

ආ) සිංගප්පූරුව, චීනය, ජපානය, කාම්බෝජය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕමානය, කෙන්යාව, ඉන්දියාව, මාලදිවයින හා එක්සත් රාජධානිය යන රටවල් කරා සිදුකෙරුණු ඉහළ මට්ටමේ සංචාර 10 ක්

සඳහා පහසුකම් සපයන ලදී.

ii. ලෙබනනය, පිලිපීනය හා පෝලන්තය යන රටවලින් මෙහි පැමිණි ව්‍යාපාරික සංචාර 03 ක් සහ ඊශ්‍රායලය, ඉරානය, දකුණු අප්‍රිකාව, මැලේසියාව, ඉන්දුනීසියාව, බෙල්ජියම, පෝලන්තය, එක්සත් රාජධානිය, රුසියාව, තුර්කිය, ජර්මනිය, ස්විට්සර්ලන්තය, ලක්සම්බර්ග් සහ ස්වීඩනය යන රටවල් කරා සිදු කෙරුණු ව්‍යාපාරික සංචාර 31 ක් සඳහා ආර්ථික කටයුතු අංශය සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය.

iii. 2019 දෙසැම්බර් 2-6 දිනවල දී පැවති පිලිපීනයේ නාක්ෂණික සහයෝගිතා කවුන්සිලයේ නියෝජිතයන්ගේ සංචාරය සඳහා පහසුකම් සපයන ලදී.

iv. මෙම අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් (ද්විපාර්ශ්වික) හා සහකාර නීති උපදේශක යන නිලධාරීහු සේවා, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව සහ ආයෝජන අදියර පිළිබඳ FTA සහ ETCA සාකච්ඡා සඳහා සහභාගී වූහ.

විශේෂයෙන්ම, වාණිජ ගිවිසුම් හා නිදහස් වෙළඳාමේ දියුණුව පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ජාත්‍යන්තර සංවිධාන සමඟ සමීපව කටයුතු කරමින් සිටී.

## 2.1 2018 වසරේ දී පවත්වන ලද ඒකාබද්ධ ආර්ථික කොමිෂන් සභා හා ඒවායේ ප්‍රගතිය සහ අනාගත රැස්වීම්

### i. ශ්‍රී ලංකා හා ඕස්ට්‍රේලියා වෙළඳ හා ආයෝජන රාමුගත විධිවිධානය (TIFA)

වෙළඳ හා ආයෝජන රාමුගත විධිවිධානය යටතේ, ශ්‍රී ලංකා - ඕස්ට්‍රේලියා ඒකාබද්ධ කොමිෂන් සභාව ස්ථාපිත කොට ඇත්තේ ද්විපාර්ශ්වික වෙළඳාම හා ආයෝජන වැඩිදියුණු කිරීම හා පහසුකම් සැපයීම යන ඉදිරි දර්ශනයෙනි. ඒ අනුව මෙම ඒකාබද්ධ කොමිෂන් සභාවේ දෙවැනි සැසිවාරය 2019 සැප්තැම්බර් 17 වැනි දින ශ්‍රී ලංකාවේ දී පැවැත්විණ. රජයේ සහයෝගීතාව, සංවර්ධන හවුල්කාරිත්වය, වෙළඳපොළ ප්‍රවේශය හා වාණිජමය අවශ්‍යතා සඳහා රජයට පහසුකම් සැලසීම ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක් මෙම රැස්වීමේ දී සාකච්ඡා කෙරිණි.

### ii. වෙළඳ හා ආර්ථික සම්බන්ධතා සහයෝගීතාවය පිළිබඳ යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම

වෙළඳ හා ආර්ථික සම්බන්ධතා සහයෝගීතාවය පිළිබඳ යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම සිය වාර්ෂික රැස්වීම 2019 ඔක්තොබර් 24 වැනි දින බ්‍රසල්ස් හි දී පැවැත්වීය. ශ්‍රී ලංකාවේ සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඒ.එල්.එම්. සලීම් මහතා සහ යුරෝපා කොමිසමේ වැඩබලන අධ්‍යක්ෂ හා වෙළඳ කටයුතු අධ්‍යක්ෂ ජනරාල් පීටර් බර්ස් මහතා විසින් මෙම රැස්වීමේ සම-සභාපතිත්වය දරන ලදී.

විශේෂයෙන්, වෙළඳ හා ආර්ථික සම්බන්ධතා සහයෝගීතාවය පිළිබඳ යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම සහ යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ආයෝජක සංවාදය යටතේ කැපී පෙනෙන, වෙළඳාම සම්බන්ධ ගැටලු සහ උනන්දුවක් දක්වන කරුණු සම්බන්ධයෙන් අඛණ්ඩව සහයෝගයෙන් යුතුව කටයුතු කිරීමට මෙම දෙපාර්ශ්වයම එකඟ වූහ.

### iii. ආර්ථික සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකා-හංගේරියානු ඒකාබද්ධ කොමිසමේ පළමු සැසිය

ආර්ථික සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකා-හංගේරියානු ඒකාබද්ධ කොමිසමේ පළමු සැසිය, 2019 අප්‍රේල් 23-24 දිනවල බුඩාපේස්ට් හි දී පැවැත්විණි. වෙළඳ හා ආර්ථික සහයෝගීතාව, උදම් ආධාර ණය සහයෝගීතාව, කෘෂිකර්ම හා ආහාර ආර්ථිකය, ජල කළමනාකරණය, අධ්‍යාපනය, විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාව සහ ආපතා කළමනාකරණය යන ක්ෂේත්‍රවල සහයෝගීතාවය දියුණු කිරීම පිළිබඳව මෙම සැසියේ දී සාකච්ඡා කෙරිණි.

පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් විපතට පත්වූවන්ට උපකාර කිරීම සඳහා හංගේරියාව හංගේරියානු ෆ්‍රොයින්ට් මිලියන 09 ක් වටිනා හදිසි ආධාර ශ්‍රී ලංකාව වෙත ලබා දුන් අතර, 2017 වසරේ දී ශ්‍රී ලංකාවේ ගංවතුරෙන් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් හංගේරියානු රජය ඇමරිකානු ඩොලර් 25,000 ක් පිරිනැමීය. දෙරට අතර ද්විත්ව බදුකරණය පිළිබඳ ගිවිසුම දැනට සාකච්ඡා කෙරෙමින් පවතී. තවද, පුනර්ජනනීය බලශක්තිය, සුවතා සංචාරක ව්‍යාපාරය සහ යටිතල පහසුකම් සංවර්ධනය යන අංශවල සහයෝගීතාවය සඳහා පවතින හැකියාවන් පිළිබඳව සොයා බැලීමට එකඟ වන ලදී.

**iv. කයිරෝ හි දී පැවති ශ්‍රී ලංකාව හා ඊජිප්තුව අතර ද්විපාර්ශ්වික දේශපාලන සාකච්ඡා (2019 දෙසැම්බර් 12)**

සංචාරක කර්මාන්තය වියහැකි වර්ධන ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගන්නා ලද අතර, උපදේශන අතරතුර දී තිරසාර ආයෝජන ප්‍රවාහයන් සහතික කිරීම සඳහා වූ ක්‍රමවේදයන් පිළිබඳව සාකච්ඡා කරන ලදී.

**3. බහුපාර්ශ්වීය සබඳතා**

**3.1 ආසියා හා පැසිෆික් කලාපය සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම (යුනෙස්කැප්)**

විදේශ සබඳතා අමාත්‍යාංශය තුළ, ආසියා හා පැසිෆික් කලාපය සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම සම්බන්ධයෙන් කේන්ද්‍රීය ස්ථානය වන්නේ ආර්ථික කටයුතු අංශයයි.

මෙම කලාපීය ආයතනය තුළ ESCAP පාලක සභා පහක (05) දී ශ්‍රී ලංකාව නියෝජනය වෙයි. ආසියා හා පැසිෆික් සංඛ්‍යාන ආයතනය (SIAP), තිරසාර කෘෂිකාර්මික යාන්ත්‍රීකරණ මධ්‍යස්ථානය (CSAM), තිරසාර කෘෂිකර්මාන්තය තුළින් දිළිඳුකම පිටුදැකීමේ මධ්‍යස්ථානය (CASPA), ආසියා හා පැසිෆික් තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානය (APCTT), ආසියා හා පැසිෆික් ආපදා තොරතුරු කළමනාකරණ මධ්‍යස්ථානය (APDIM).

ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම සහ රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු සඳහා නියෝජිතයින් සහභාගී කරවීම සහ 75 වැනි සැසිවාරය සඳහා පාලක සභාවට අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම අංශය ඉවහල් විය.

**3.2 බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානය (බිම්ස්ටෙක්)**

ශ්‍රී ලංකාව, 2018 සිට 2020 දක්වා බිම්ස්ටෙක් සංවිධානයේ සභාපතිත්වය දරයි. මෙම අමාත්‍යාංශයේ එහි කේන්ද්‍රීය ස්ථානය ලෙස ආර්ථික කටයුතු අංශය පහත සඳහන් රැස්වීම් සඳහා සහභාගිත්වය සම්බන්ධීකරණය කළේය.

i. 2019 ජනවාරි 17-18 දිනවල ශ්‍රී ලංකාවේ, කොළඹ දී විදේශ සබඳතා අමාත්‍යාංශයේ සත්කාරකත්වයෙන් යුතුව පැවති නිත්‍ය ක්‍රියාකාරී කමිටුවේ (BPWC) පළමු රැස්වීම
ii. 2019 ජනවාරි 21-22 දිනවල ඉන්දියාවේ, නවදිල්ලි නුවර දී පැවති මූලාරම්භයේ ඊති පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ 19 වැනි රැස්වීම
iii. 2019 ජනවාරි 24-25 දිනවල මියන්මාර සංගමයේ ජනරජයේ, නේ පී ටෝ හි දී පැවති සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව පිළිබඳ බිම්ස්ටෙක් කාර්ය සාධක බලකායේ (BTFTM) දෙවැනි රැස්වීම
iv. 2019 මාර්තු 21 වැනි දින තායිලන්තයේ, බැංකොක් නුවර දී පැවති බිම්ස්ටෙක් ජාතික ආරක්ෂක ප්‍රධානීන්ගේ තෙවැනි රැස්වීම
v. 2019 අප්‍රේල් 24-25 දිනවල බංගලාදේශයේ දී පැවති කෘෂිකාර්මික සහයෝගීතාවය පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥ කණ්ඩායමේ හත්වැනි රැස්වීම
vi. 2019 ජුනි 16-17 දිනවල බංගලාදේශයේ, ඩකා නුවර දී පැවති බිම්ස්ටෙක් සාම්ප්‍රදායික වෛද්‍ය සම්බන්ධීකරණය පිළිබඳ ජාතික මධ්‍යස්ථාන ජාලයේ සිව්වන රැස්වීම
vii. 2019 මාර්තු 28-29 දිනවල මියන්මාරයේ, නේ පී ටෝ හි දී පැවති බලශක්තිය පිළිබඳ විශේෂඥ කණ්ඩායමේ පළමු රැස්වීම
viii. 2019 ජූලි 12 දින මියන්මාරයේ, නේ පී ටෝ හි දී පැවති පළමු බිම්ස්ටෙක් අමාත්‍ය රැස්වීම
ix. 2019 ජූලි 30-31 දිනවල බංගලාදේශයේ, ඩකා නුවර දී පැවති බිම්ස්ටෙක් ට්‍රැක් 1.5 ආරක්ෂක සංවාද සංසදයේ රැස්වීම
x. 2019 අගෝස්තු 13-15 දිනවල තායිලන්තයේ, බැංකොක් නුවර දී පැවති මුදල් විශුද්ධිකරණයට එරෙහිවීම හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම පිළිබඳ වෘත්තික මට්ටම සඳහා වූ වැඩමුලුව

xi. 2019 සැප්තැම්බර් 3-4 දිනවල තායිලන්තයේ, බැංකොක් නුවර දී පැවති මුදල් විශුද්ධිකරණයට එරෙහිවීම හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම පිළිබඳ බිම්ස්ටෙක් උප-කණ්ඩායමේ එකොළොස්වැනි රැස්වීම

xii. 2019 සැප්තැම්බර් 28 වැනි දින බංගලාදේශයේ, ඩකා නුවර දී පැවති බිම්ස්ටෙක් කලාපයේ සංචාරක සම්බන්ධතාවය පිළිබඳ සම්මන්ත්‍රණය

xiii. 2019 සැප්තැම්බර් 29-30 දිනවල බංගලාදේශයේ, ඩකා නුවර දී පැවති වෙළඳ පහසුකම් සැපයීම පිළිබඳ බිම්ස්ටෙක් ක්‍රියාකාරී කණ්ඩායමේ දෙවැනි රැස්වීම

xiv. 2019 ඔක්තෝබර් 10-11 දිනවල ශ්‍රී ලංකාවේ, කොළඹ දී පැවති බිම්ස්ටෙක් නිත්‍ය ක්‍රියාකාරී කණ්ඩායමේ දෙවැනි රැස්වීම

xv. 2019 නොවැම්බර් 07-08 දිනවල ඉන්දියාවේ, විශාකාපටිනම් හි දී පැවති බිම්ස්ටෙක් වරාය පිළිබඳ විශේෂ සාකච්ඡාව

xvi. 2019 නොවැම්බර් 14-15 දිනවල ඔඩිෂාහි, පූරි හි දී පැවති දෙවැනි බිම්ස්ටෙක් අපදා කළමනාකරණ අභ්‍යාසය සඳහා සූදානම් වීමේ රැස්වීම

xvii. 2019 නොවැම්බර් 20-22 දිනවල ඉන්දියාවේ, ගුරුග්‍රාම් හි දී පැවති බිම්ස්ටෙක් වෙරළ ආරක්ෂණ වැඩමුලුව

xviii. 2019 නොවැම්බර් 27-28 දිනවල ඉන්දියාවේ, නවදිල්ලි නුවර දී පැවති කලාපී ආරක්ෂව පිළිබඳ දෙවැනි බිම්ස්ටෙක් බුද්ධි මණ්ඩල සංවාදය

xix. 2019 නොවැම්බර් 27-29 දිනවල ශ්‍රී ලංකාවේ, කොළඹ දී පැවති "සිද්ධි අධ්‍යයන තුළින්, ත්‍රස්තවාදය හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහිව ක්‍රියාකිරීම පිළිබඳ අත්දැකීම්" පිළිබඳ වැඩමුලුව

xx. 2019 දෙසැම්බර් 05-06 දිනවල ඉන්දියාවේ, ගෝවා හි දී පැවති බිම්ස්ටෙක් හිමාලයානු විද්‍යා කවුන්සිලය පිළිබඳ විශේෂඥයින්ගේ වැඩමුලුව

xxi. 2019 දෙසැම්බර් 11-13 දිනවල ඉන්දියාවේ, නවදිල්ලි නුවර දී පැවති දේශගුණ සුහුරු ගොවිතැන් ක්‍රමය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

xxii. 2019 දෙසැම්බර් 17-20 දිනවල ඉන්දියාවේ, ගුජරාට් හි දී පැවති අවදානම ගැන දැනුවත් නාගරික සැලසුම්කරණය පිළිබඳ වැඩමුලුව

### 3.3 ආසියා සහයෝගිතා සංවාදය (ACD)

පහත සඳහන් ආසියා සහයෝගිතා සංවාද රැස්වීම් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සම්බන්ධයෙන් ආර්ථික කටයුතු අංශය රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය සිදු කළේය.

i. 2019 අප්‍රේල් 30 සිට මැයි 02 දක්වා කටාර් හි, දෝහා හි පැවති ආසියා සහයෝගිතා සංවාදයේ 16 වැනි අමාත්‍ය රැස්වීම, ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම සහ ව්‍යාපාරික සංසදය

ii. 2019 ජූලි 18-19 දිනවල තායිලන්තයේ, බැංකොක් නුවර දී පැවති ආසියා සහයෝගිතා සංවාද ලේකම් කාර්යාලයේ ආයතනික ව්‍යුහය පිළිබඳ ඉහළ මට්ටමේ ක්‍රියාකාරී කණ්ඩායම

iii. 2019 සැප්තැම්බර් 27 දින නිව්යෝක්හි එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ දී, 74 වැනි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයට සමගාමීව පැවති ආසියා සහයෝගිතා සංවාදයේ විදේශ අමාත්‍යවරුන්ගේ රැස්වීම

### 3.4 ඉන්දියන් සාගර වටදේදර රටවල සංගමය (IORA)

ඉන්දියන් සාගර වටදේදර රටවල සංගමයේ කේන්ද්‍රීය ස්ථානය ලෙස, ආර්ථික කටයුතු අංශය එම සංගමයේ පහත සඳහන් රැස්වීම් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය සිදු කළේය.

i. 2019 ජනවාරි 24 වැනි දින දකුණු අප්‍රිකාව විසින් සංවිධානය කරන ලද, ඉන්දියන් සාගර වටදේදර රටවල සංගමය, නීල ආර්ථිකය තුළ කාන්තා ආර්ථික සවිබල ගැන්වීම පිළිබඳ වෙබිනාර් සාකච්ඡාව

ii. 2019 ජනවාරි 05-06 දිනවල ඉන්දියාවේ, නවදිල්ලි නුවර දී පැවති ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ පොකුරු සමූහයේ රැස්වීම

iii. 2019 මාර්තු 04-08 දිනවල සිංගප්පූරුවේ දී පැවති සංචාරක කළමනාකරණය හා ගමනාන්ත අලෙවිකරණය පිළිබඳ සිංගප්පූරු සහයෝගිතා වැඩසටහන

iv. 2019 අප්‍රේල් 08-10 දිනවල දකුණු අප්‍රිකාවේ දී පැවති IORA හි සාමාජික රාජ්‍යවල මාධ්‍යවේදීන් හා මාධ්‍ය වෘත්තිකයන් සඳහා හුරුපුරුදු වීමේ සංචාරය.

v. 2019 අප්‍රේල් 09-11 දිනවල මොරිෂස් හි දී පැවති IORA ලේකම් කාර්යාලයේ ආයතනික ශක්තිමත් කිරීම පිළිබඳ 2 වැනි වැඩමුලුව

vi. 2019 ජුනි 17-18 දිනවල දකුණු අප්‍රිකාවේ දී පැවති ඉන්දියන් සාගර වටද්දර රටවල සමුළුවේ, වෙළඳාම නවීකරණය කිරීම, වෙළඳ හා ආයෝජන පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGTI), කාන්තා ආර්ථික සවිබලගැන්වීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGWEE) සහ ඉන්දියන් සාගර වටද්දර රටවල ව්‍යාපාරික සංසදය (IORBF)

vii. 2019 ජුනි 19-20 දිනවල දකුණු අප්‍රිකාවේ, ඩර්බන් හි දී පැවති ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගේ කමිටුවේ (CSO) 09 වැනි ද්විවාර්ෂික රැස්වීම

viii. 2019 අගෝස්තු 02-04 දිනවල ඉන්දියාවේ, චෙන්නායි හි දී පැවති සිවිවන ඒකාබද්ධ වාර්ෂික මානුෂීය ආධාර සහ ආපදා සහන අභ්‍යාසය (HADR)

ix. 2019 සැප්තැම්බර් 26-28 දිනවල ඉන්දුනීසියාවේ, ජකාර්තා හි දී පැවති සුනාමි පූර්ව අනතුරු හැඟවීමේ පද්ධති පිළිබඳ ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ වැඩමුලුව - 2018 ඉන්දුනීසියාවේ සුනාමියෙන් උගත් පාඩම්

x. 2019 සැප්තැම්බර් 04-05 දිනවල බංගලාදේශයේ, ඩකා හි දී පැවති ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ තිරසාර නීල ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ 03 වැනි නීල ආර්ථික අමාත්‍ය සමුළුව

xi. 2019 ඔක්තෝබර් 22 හා නොවැම්බර් 26 දිනවල පැවති කාන්තා ආර්ථික සවිබලගැන්වීම පිළිබඳ වෙබිනාර් රැස්වීම

xii. 2019 ඔක්තෝබර් 29-30 දිනවල ඕමානයේ, මස්කට් හි දී පැවති ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ ධීවර හා ජලජීවී වගා අංශවල ද්විවාර්ෂික සමාලෝචනය පිළිබඳ වැඩමුලුව "FSU රටවල ධීවර හා ජලජීවී වගා තොරතුරු පද්ධතිය සුසර කිරීම"

xiii. 2019 නොවැම්බර් 18-21 දිනවල එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, අබුඩාබි හි දී පැවති ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ 19 වැනි අමාත්‍ය රැස්වීම සහ ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගේ 21 වැනි කමිටුව

xiv. 2019 නොවැම්බර් 18-21 දිනවල ජර්මනියේ දී පැවති පශ්චාත් ආපදා තත්ත්වයන් සඳහා අදාළවන පෙව වෛද්‍ය ඉන්පිනේරු සහ වෙනත් නවෝත්පාදන තාක්ෂණ පිළිබඳ වැඩමුළුව

### 3.5 පී-77, වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණය (UNCTAD) සහ ලෝක වෙළඳ සංවිධානය (WTO)

රේඛීය අමාත්‍යාංශ සමඟ පවතින පී-77, වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණය සහ ලෝක වෙළඳ සංවිධානය සම්බන්ධ ගැටලුවල දී, මෙම අංශය සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම සිදුකරයි.

3.5.1 පී-77

සැප්තැම්බර් 27 වැනි දින 74 වැනි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයට සමගාමීව පැවති පී-77 විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ 43 වැනි වාර්ෂික රැස්වීම

### 3.6 ලෝක බුද්ධිමය දේපල සංවිධානය (WIPO)

ආර්ථික කටයුතු අංශය, ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ වැදගත් කරුණු සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය සහ ජාතික බුද්ධිමය දේපල කාර්යාංශය (NIPO) සමඟ සම්බන්ධීකරණය කරයි.

2019 වසරේ දී, ලෝක බුද්ධිමය දේපල සංවිධානයේ පහත සඳහන් රැස්වීම් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය ආර්ථික කටයුතු අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී:

i. 2019 අප්‍රේල් 08-11 දිනවල ජිනීවා හි දී පැවති වෙළඳ ලකුණු, කාර්මික සැලසුම් හා භූගෝලීය දර්ශක පිළිබඳ නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවේ 41 වැනි සැසිය.
ii. 2019 සැප්තැම්බර් 2-4 දිනවල ජිනීවා හි දී පැවති බලාත්මක කිරීම පිළිබඳ උපදේශක කමිටුවේ (ACE) 14 වැනි සැසිය
iii. 2019 සැප්තැම්බර් 30 - ඔක්තෝබර් 09 දිනවල ජිනීවා හි දී පැවති ලෝක බුද්ධිමය දේපල සංවිධානයේ සාමාජික රටවල සම්මේලනයන්හි 59 වැනි රැස්වීම් මාලාව සහ පේටන්ට් බලපත්‍ර සහයෝගිතා ගිවිසුම් පිළිබඳ සංගමයේ සම්මේලනය
iv. 2019 නොවැම්බර් 13-15 දිනවල ජිනීවා හි දී පැවති ලෝක බුද්ධිමය දේපල විනිශ්චයකරුවන්ගේ සංසදය

### 3.7 කොළඹ ක්‍රමය

2019/2020 මුදල් වර්ෂය සඳහා කොළඹ ක්‍රමය ස්ථාවර කමිටුවේ සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව පත් කරන ලදී. පහත සඳහන් කොළඹ ක්‍රමය රැස්වීම් සඳහා ආර්ථික කටයුතු අංශය විදේශ සබඳතා අංශය නියෝජනය කරමින් සහභාගී විය:

i. 2019 මාර්තු 01 දින ශ්‍රී ලංකාවේ, කොළඹ ක්‍රමය ලේකම් කාර්යාලයේ දී පැවති කොළඹ ක්‍රමය ස්ථාවර කමිටු රැස්වීම
ii. 2019 මාර්තු 07 දින ශ්‍රී ලංකාවේ, කොළඹ ක්‍රමය ලේකම් කාර්යාලයේ දී පැවති කොළඹ ක්‍රමය කවුන්සිලයේ 297 වැනි සැසිය
iii. 2019 ජූලි 23 දින ශ්‍රී ලංකාවේ, කොළඹ ක්‍රමය ලේකම් කාර්යාලයේ දී පැවති කොළඹ ක්‍රමය කවුන්සිලයේ 298 වැනි සැසිය
iv. 2019 ඔක්තෝබර් 18 දින ශ්‍රී ලංකාවේ, කොළඹ ක්‍රමය ලේකම් කාර්යාලයේ දී පැවති කොළඹ ක්‍රමය ස්ථාවර කමිටු රැස්වීම
v. 2019 නොවැම්බර් 27 දින ශ්‍රී ලංකාවේ, කොළඹ ක්‍රමය ලේකම් කාර්යාලයේ දී පැවති කොළඹ ක්‍රමය කවුන්සිලයේ 299 වැනි සැසිය

### 3.8 කොළඹ ක්‍රියාවලිය (CP), අබුඩාබි සංවාදය (ADD) සහ සංක්‍රමණ පිළිබඳ ගෝලීය සංසදය (GFMD)

ආර්ථික කටයුතු හා නිපුණතා සංවර්ධන, රැකියා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය සමඟ ආර්ථික කටයුතු අංශය (සංක්‍රමණ ආශ්‍රිත කටයුතු සඳහා කේන්ද්‍රීය ස්ථානය), කොළඹ ක්‍රියාවලිය, අබුඩාබි සංවාදය සහ සංක්‍රමණ පිළිබඳ ගෝලීය සංසදය පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය.

#### 3.8.1 කොළඹ ක්‍රියාවලිය

2019 22-23 දිනවල තායිලන්තයේ, බැංකොක් හි දී පැවති සංක්‍රමණය පිළිබඳ ගෝලීය රාමුව සම්බන්ධ කිරීම පිළිබඳ සාකච්ඡාව

#### 3.8.2 අබුඩාබි සංවාදය

2019 ඔක්තෝබර් මස පැවති අබුඩාබි සංවාදයේ 05 වැනි අමාත්‍ය උපදේශනයේ දී ශ්‍රී ලංකාව අබුඩාබි සංවාදයේ සභාපතිත්වය එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙත භාරදුන්නේය.

i. 2019 පෙබරවාරි 09-10 දිනවල එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, ඩුබායි හි දී පැවති අබුඩාබි සංවාදයේ අමාත්‍යවරුන්ගේ විශේෂ රැස්වීම
ii. 2019 අප්‍රේල් 29 දින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, ඩුබායි හි දී පැවති අනාගත කටයුතු පිළිබඳ ඉහළ මට්ටමේ සම්මන්ත්‍රණය

iii. 2019 අප්‍රේල් 30 දින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, ඩුබායි හි දී පැවති ජේෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම

**iv.** 2019 ඔක්තෝබර් 16-17 දිනවල එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, ඩුබායි හි දී පැවති අබුඩාබි සංවාදයේ 05 වැනි අමාත්‍ය උපදේශන

### 3.8.3 සංක්‍රමණ හා සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදය (GFMD)

i. 2019 මැයි 28 දින ජිනීවා හි දී පැවති, රජය විසින් මෙහෙයවන ලද දෙවැනි වටමේස කණ්ඩායම් උපදේශනය

ii. 2019 ජූලි 02-06 දිනවල මොරොක්කෝ හි දී පැවති, සංක්‍රමණ හා සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදයේ තේමාත්මක වැඩමුලුව

### 3.9 එක්ස්පෝ 2020

වසර 5 ක කාල සීමාවක් තුළ දී එක්ස්පෝ ඩුබායි 2020 සඳහා පැමිණෙන මිලියන 15 ක අමුත්තන්ගෙන් 1% ක් ආකර්ශනය කර ගැනීමේ අරමුණින් යුතුව, ශ්‍රී ලංකාව 2019 ජූලි 8 වැනි දින එක්ස්පෝ ඩුබායි 2020 නිල සහභාගිත්ව ගිවිසුමට අත්සන් තැබීය. පහත සඳහන් රැස්වීම් සඳහා මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් සහභාගී විය:

i. 2019 සැප්තැම්බර් 12-15 දිනවල එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි දී පැවති ජාත්‍යන්තර සහභාගීවන්නන්ගේ තාක්ෂණික රැස්වීම

ii. 2019 නොවැම්බර් 29-30 දිනවල එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි දී පැවති 4 වැනි ජාත්‍යන්තර සහභාගීවන්නන්ගේ රැස්වීම

මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් පහත දැක්වෙන කමිටුවල දී නියෝජනය වේ:

i. සැලසුම් කමිටුවේ සම-සභාපති

ii. මහජන සම්බන්ධතා සහ අනුග්‍රාහක උප කමිටුවේ සම-සභාපති

iii. එක්ස්පෝ ඩුබායි 2020 සඳහා සිදුවීම් කළමනාකරණ සමාගමක සේවය ලබා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති

iv. එක්ස්පෝ ඩුබායි 2020 සඳහා සිදුවීම් කළමනාකරණ සමාගමක සේවය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය මගින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ සභාපති

## 4. වීසා බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන (2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා)

ආර්ථික කටයුතු අංශය, ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය වැනි ආයතනවල නිලධාරීන්ගේ කෙටිකාලීන සංචාර සඳහා වීසා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධීකරණය කළ අතර, විවිධ රාජ්‍ය ආයතන විසින් සංවිධානය කරන ලද වැඩමුළු හා සම්මන්ත්‍රණවලට සහභාගී වන්නන් සඳහා වීසා බලපත්‍ර ලබා දීමට පහසුකම් සැපයීය.

| වීසා ප්‍රභේදය | | | |
|---|---|---|---|
| **කෙටිකාලීන ගෙවීම් රහිත වීසා බලපත්‍ර** | | **පදිංචි වීමේ/ප්‍රවේශ දිගුකාලීන වීසා බලපත්‍ර නිර්දේශ** | |
| **කා හටද** | **වීසා බලපත්‍ර සංඛ්‍යාව** | **කා හටද** | **වීසා බලපත්‍ර සංඛ්‍යාව** |
| World Bank | 66 | World Bank | 12 |

| | | | |
|---|---|---|---|
| JICA | 57 | JICA | 42 |
| වෙනත් | 118 | Colombo Plan | 07 |
| AIIB | 01 | IFC | 02 |

කොළඹ ක්‍රමය තුළින් ශ්‍රී ලාංකික සිසුන්, වෘත්තිකයන් සහ රජයේ නිලධාරීන් සඳහා කෙටිකාලීන හා දිගුකාලීන ශිෂ්‍යත්ව කිහිපයක් ලබා දී ඇත. සිංගප්පූරු තාක්ෂණික සහයෝගිතා වැඩසටහන, මැලේසියානු තාක්ෂණික සහයෝගිතා වැඩසටහන, UNESCAP, කොරියා ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA) සහ ඉන්දීය රජය

**5. තාක්ෂණික සහයෝගීතාවය**

i. 2019 ජූනි 03-06 දිනවල ශ්‍රී ලංකාවේ, කොළඹ දී කියුබානු ගුවන්විදුලි හා රූපවාහිනී ආයතනයේ තාක්ෂණික/නිෂ්පාදන කාර්යය මණ්ඩලය සඳහා ශ්‍රී.ලං.රු. 598,800.00 ක වියදමින් තාක්ෂණික සහයෝගිතා වැඩසටහනක් පැවැත්වීම පිණිස ශ්‍රී ලංකා පදනමට සහසුකම් සැපයීම.

ii. රජයේ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ මුදල් අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලදුව, 2019 ජූලි 23-27 දිනවල අනුරාධපුරයේ දී පැවති 'දැක්ම 2025 ව්‍යවසාය ශ්‍රී ලංකා' ප්‍රදර්ශනය සහ 2019 සැප්තැම්බර් 07-10 දිනවල යාපනයේ දී පැවති එහි දෙවැනි අංගය සඳහා කටයුතු සූදානම් කර, සක්‍රියව සහභාගී විය.

iii. යාපනය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ 2020 ආර්ථික සංවර්ධන පංතිය (AECC42013) විසින් ආරාධිත දේශන මාලාවක් එහි දී සංවිධානය කරන ලදී. ආර්ථික කටයුතු හා පරිපාලන අතිරේක ලේකම් පී. එම්. අම්සා මහතා ආරාධිත දේශකයෙකු වශයෙන් ඊට සහභාගී වූ අතර, 2019 සැප්තැම්බර් 09-10 දිනවල ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයෙන් ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන පිළිබඳ දේශන දෙකක් එහි දී පැවැත්විය.

# මානව සම්පත් හා
# දූත මණ්ඩල කළමනාකරණ
# අංශය

## මානව සම්පත් හා දූත මණ්ඩල කළමනාකරණ අංශය

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාල පිහිටුවීම, ඒවාට අවශ්‍ය මානව සම්පත් සපයාදීම, විදේශ සේවය සඳහා යොදවනු ලබන නිලධාරීන්ගේ හිමිකම් / අවශ්‍යතා සලසාදීම, මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම, දූත මණ්ඩලවල ක්‍රියාකාරිත්වය හා ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා වූ කරුණු පිළිබඳ දුක්ගැනවිලි විමසා සහන සැපයීම හා ඒ සම්බන්ධයෙන් මග පෙන්වීම් ලබාදීම ඇතුළු අවශ්‍ය සම්පත් ලබා දීම මඟින් මානව සම්පත් හා දූත මණ්ඩල කළමනාකරණ අංශය විදේශයන්හි පිහිටි සියලුම දූත මණ්ඩල/ කාර්යාල බාධාවකින් තොරව ක්‍රියාත්මක වීම සඳහා පහසුකම් සපයයි.

ශ්‍රී ලංකාව මේ වන විට පහත සඳහන් විදේශ රාජ්‍යයන්හි රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල හා කාර්යාල පවත්වාගෙන යයි.

| | |
|---|---|
| තානාපති කාර්යාල / මහ කොමසාරිස් කාර්යාල | - 50 |
| එක්සත් ජාතීන්ගේ නිත්‍ය දූත මණ්ඩල | - 02 |
| නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාල | - 01 |
| නියෝජිත කාර්යාල | - 01 |
| කොන්සල් ජනරාල් කාර්යාල | - 13 |
| එකතුව | 67 යි |

මෙම කාල සීමාව තුළ සිදු කරන ලද ඇතැම් ක්‍රියාකාරකම්වලට අදාළ සුවිශේෂී අවස්ථා පහත දැක්වේ.

### 1. කාර්ය මණ්ඩල පත්කිරීම - විදේශීයන්හි පිහිටුවා ඇති ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාල

i. නව දූත මණ්ඩල ප්‍රධානීන් පත් කිරීම:

දූත මණ්ඩල ප්‍රධානීන් සහ කාර්යාල ප්‍රධානීන් පත්කිරීම් විසි හතක් (27) සම්බන්ධයෙන් පිලිසැකසිම් කටයුතු ඉටුකරන ලද අතර ඔවුන්ගේ පත්වීම්වලට අදාළ පහසුකම් සැලසීමද සිදු කරන ලදී. එහිදී පූර්වගාමී නිලධාරීන්ගේ ධුර කාලය අවසන් කිරීමට අදාළ පහසුකම් සැලසීම ද සිදු කරන ලදී.

ii. ශ්‍රී ලංකා විදේශ සේවයේ ස්ථාන මාරුවීම් සහ විදේශ සේවයේ නොවන අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් පත් කිරීම:

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් (36) සහ අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් පත්කිරීම් තිස්තුනක් (33) සම්බන්ධයෙන් පිළිසැකසීම සහ ඔවුන්ගේ පත්වීම්වලට අදාළව පහසුකම් සැපයීම. මේ සම්බන්ධයෙන්, සිය ධුර කාලය අවසන් වූ පූර්වගාමී නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම/ ඒ සඳහා පහසුකම් සැලසීමද සිදු කරන ලදී.

iii. විදේශයන්හි පිහිටි දූත මණ්ඩල/කාර්යාලවල තාක්ෂණික හා පරිපාලන කාර්ය මණ්ඩලය ලෙස සියරට පදනමින් නිලධාරීන් පත් කිරීම:

කළමනාකරණ සේවා නිලධාරීන් හය (06) දෙනෙකු රාජ්‍ය කළමනාකාර සහායකයන් ලෙස ද, කළමනාකරණ සේවා නිලධාරීන් පස් (05) දෙනෙකු පෞද්ගලික සහකාරවරුන් ලෙස ද, සන්ධාන සහායකයින් හතර (04) දෙනෙකු සහ කොන්සියුලර් සහායකයින් 9 දෙනෙකු පත් කිරීම සහ ඔවුන්ගේ පත්වීම්වලට අදාළ පහසුකම් සැපයීම. මේ සම්බන්ධයෙන්, සිය ධුර කාලය අවසන් වූ පූර්වගාමී නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම/ඒ සඳහා පහසුකම් සැලසීමද සිදු කරන ලදී

iv. සියරට පදනමින් බඳවා ගත් HRC සහායක කාර්ය මණ්ඩල පත් කිරීම

HRC සහායක කාර්ය මණ්ඩල නිලධාරීන් 37 කගේ පත්කිරීම් සහ ඔවුන්ගේ පත්වීම්වලට අදාළ පහසුකම් සැපයීම.

vi. තනතුරු ඇති කිරීම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර සේවක සංඛ්‍යාවේ තනතුරු හතක් (07) ඇති කිරීම හා තවත් සේවක තනතුරු පහක් (05) ඇති කිරීම ආරම්භ කිරීම.

vii. තරඟ විභාග පැවැත්වීම

විභාග දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා කාර්ය මණ්ඩලයේ සහ පෞද්ගලික සහකාරවරුන්ගේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සීමිත තරඟ විභාග පැවැත්වීම.

viii. ස්ථාන මාරු මණ්ඩල

වර්ෂය තුළ පහත ස්ථාන මාරු මණ්ඩල පත් කරන ලදී.

- විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා සන්ධාන නිලධාරීන් තෝරා ගැනීම සඳහා වූ ස්ථාන මාරු මණ්ඩලය
- විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා පෞද්ගලික සහකාරවරුන් තෝරා ගැනීම සඳහා වූ ස්ථාන මාරු මණ්ඩලය
- විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා කොන්සියුලර් සහායකයින් තෝරා ගැනීම සඳහා වූ ස්ථාන මාරු මණ්ඩලය

ix. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීම සඳහා පහසුකම් සැලසීම සහ විශ්‍රාම වැටුප් යොජනා ක්‍රමයට බඳවා ගැනීම.

2. **විදේශයන්හි පිහිටි දූත මණ්ඩල/කාර්යාලවල ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ සහ සියරට පදනමින් බඳවාගත් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම**

- විදේශයන්හි පිහිටි දූත මණ්ඩල / කාර්යාලවල සේවය කරන ශ්‍රී ලංකා විදේශ සේවයේ සහ රාජ්‍ය සේවයේ අනෙකුත් මාණ්ඩලික නිලධාරීන්ගේ වාර්ෂික වැටුප් වර්ධක සැකසීම
- ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාලවල සියරට පදනමින් සේවය කරන කාර්ය මණ්ඩලයේ වැටුප් පරිවර්තන සැකසීම
- ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ උසස්වීම් සැකසීම.
- රාජ්‍ය සේවක විශ්‍රාම අරමුදලේ සහ සේවා අවසන් කිරීමේ ප්‍රතිලාභ ඉල්ලීම් සඳහා පහසුකම් සැපයීම

**3. ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාල වෙත සංචාර / කොන්සියුලර් ජංගම සේවා සඳහා පහසුකම් සැපයීම**

- දූත මණ්ඩල ප්‍රධානීන්ගේ සංචාර 169 කට පහසුකම් සැපයීම
- ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාලවල නිලධාරීන්ගේ නිල සංචාර 41 ක් සඳහා පහසුකම් සැපයීම.
- ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාලවල කොන්සියුලර් ජංගම සේවා 38 ක් සඳහා පහසුකම් සැපයීම.

**4. හිමිකම් ලබා දීම**

ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාලවල සහ සියරට පදනමින් සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ සහ ඔවුන්ගේ සුදුසුකම් ලත් පවුලේ සාමාජිකයන්ගේ වෛද්‍ය හිමිකම් සැකසීම.

- ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාලවල සියරට පදනමින් සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ දරුවන්ගේ අධ්‍යාපන හිමිකම් සැකසීම.

- පවත්නා රෙගුලාසි වලට අනුව අධ්‍යාපන පහසුකම්, හදිසි ගමන් පහසුකම් සහ වාස නිවාඩු සම්මත කිරීම.
- දූත මණ්ඩල / කාර්යාලවල සියරට පදනමින් සේවයේ නියුතු සියලුම නිලධාරීන්ගේ විදේශීය / වෛද්‍ය සහ රාජකාරි නිවාඩු සැකසීම
- ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයට අනුව ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධයෙන් සියලු ඉල්ලීම් සැකසීම
- සියරට පදනමින් සේවයේ නියුතු කාර්ය මණ්ඩලය කැටුවයන කලත්‍රයින්ගේ නිවාඩු සැකසීම
- සියරට පදනමින් සේවයේ නියුතු නිලධාරීන්ගේ පාසල් යන දරුවන්ගේ නිවාඩු සැකසීම
- අමාත්‍යාංශයේ සියලුම ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ අධ්‍යාපන හිමිකම් සැකසීම

**5. විමසුම් වලට ප්‍රතිචාර දැක්වීම**

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ විගණන විමසුම්, පාර්ලිමේන්තු ප්‍රශ්න සහ විමසීම්වලට පිළිතුරු සැපයීම

**6. දුක්ගැනවිලි විසඳීම**

දූත මණ්ඩල / කාර්යාලවල ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ සහ සියරට පදනමින් බඳවා ගත් සහ දේශීය කාර්ය මණ්ඩලයේ දුක්ගැනවිලි ආමන්ත්‍රණය කිරීම / විසඳීම / ප්‍රතිචාර දැක්වීම

**7. පැමිණිලි / චෝදනා හැසිරවීම**

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්, දූත මණ්ඩල / කාර්යාල සහ ඒවායේ කාර්යය මණ්ඩල සාමාජිකයින් වෙත එල්ල වෙන පැමිණිලි / චෝදනාවලට ප්‍රතිචාර දැක්වීම

# විදේශ වත්කම් කළමනාකරණ හා සංවර්ධන අංශය

## විදේශ වත්කම් කළමනාකරණ හා සංවර්ධන අංශය

විදේශ වත්කම් කළමනාකරණ හා සංවර්ධන අංශයෙහි (OAM & D) මූලික කාර්යය වනුයේ අවශ්‍ය ද්‍රව්‍යමය සම්පත් සැපයීම, චංචල හා නිශ්චල වත්කම් කළමනාකරණය කිරීම මගින් විදේශයන්හි තිබෙන සියලුම ශ්‍රී ලංකා දූත මණ්ඩල / තනතුරු සුමටව පවත්වා ගෙන යාම සඳහා පහසුකම් සැලසීම සහ අමාත්‍යාංශය සහ එහි දූත මණ්ඩල ජාලය අතර එදිනෙදා සිදුකෙරෙන සන්නිවේදනයන් අධීක්ෂණය කිරීමයි. මෙයට අමතරව, චාරිකා අංශය, ආරක්ෂක තැපැල් අංශය සහ තොරතුරු තාක්ෂණ (Cypher) අංශයට අදාළ කාර්යයන් ද විදේශ වත්කම් කළමනාකරණ හා සංවර්ධන අංශයට අයත්වේ.

වර්තමානයේ දී, ශ්‍රී ලංකා රජය විසින් විදේශයන් හි පහත සඳහන් රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සහ තනතුරු පවත්වා ගෙන යනු ලබයි.

| | | |
|---|---|---|
| තානාපති කාර්යාල / මහකොමසාරිස් කාර්යාල | - | 50 |
| එක්සත් ජාතීන්ගේ සංවිධානය සඳහාවූ නිත්‍ය නියෝජිත කාර්යාල | - | 02 |
| නියෝජ්‍ය මහකොමසාරිස් කාර්යාලය | - | 01 |
| නියෝජිත කාර්යාලය | - | 01 |
| කොන්සියුලර් ජනරාල් කාර්යාල | - | 13 |
| එකතුව | | 67 |
| | | == |

### 1. විදේශ වත්කම් අත්පත්කර ගැනීම සහ නඩත්තු කිරීම

### i. නිශ්චල දේපල :

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල / තනතුරු සමඟ සාකච්ඡා කර, සෑම වර්ෂයකදීම අපගේ විදේශ දූත මණ්ඩලයන්හි භාවිතය සඳහා අවම වශයෙන් නව දේපල දෙකක්වත් මිලදී ගැනීමේ ප්‍රතිපත්තිමය මුලපිරුමක් විදේශීය වත්කම් කළමනාකරණ හා සංවර්ධන අංශය (OAM & D) සතුව පවතී. මෙම වර්ෂයේදී අබලන් තත්වයේ පවතින දේපල අලුත්වැඩියා කිරීම / ඉදිකිරීම සඳහා අවධානය යොමු කෙරුණි. මේ සම්බන්ධයෙන් කටයුතු කර දේපල 23 ක් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගෙන තිබේ.

**2019 වර්ෂය තුළ ශ්‍රී ලංකා රජය සතු දේපලවල සිදුකරන ලද ඉදිකිරීම්, අලුත්වැඩියාව සහ ඔපවත් කිරීම් පිළිබඳ විස්තර.**

| අනුඅංකය | දූත මණ්ඩලයේ නම | විස්තරය | ශ්‍රී ලංකා රුපියල් |
|---|---|---|---|
| 1 | ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය / කැන්බරා | උනු කාර්යාලය අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම | 1,019,578.40 |
| 2 | ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය / සිඩ්නි | කොන්සියුලර් කාර්යාලය / නිල නිවාසය අලුත් වැඩියා කිරීම / නඩත්තු කිරීම | 652,344.93 |
| 3 | බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / බ්‍රසල්ස් | අනු කාර්යාලය සහ නිල නිවාසය අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම | 4,049,407.25 |
| 4 | බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / බ්‍රසීලියා | අනු කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම / පිළිසකර කිරීම | 13,033,252.48 |
| 5 | කැනඩාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය / ඔටාවා | නිල නිවාසය පිළිසකර කිරීමේ IIවන අදියර | 12,525,169.99 |

| | | | |
|---|---|---|---|
| 6 | චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / බීජිං | තානාපති කාර්යාල උද්‍යානයේ හරිත මන්දිරය අලුත්වැඩියා කිරීම | 709,410.00 |
| | | තානාපති කාර්යාල ගොඩනැගිල්ලේ ප්‍රධාන උණු ජල නල මාර්ගය අලුත්වැඩියා කිරීම | 871,320.00 |
| 7 | ඊජිප්තුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / කයිරෝ | තානාපති කාර්යාලයේ බාහිර මුහුණත වර්ණාලේප කිරීම | 926,235.00 |
| 8 | ජර්මනියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / බර්ලින් | අනු කාර්යාලයේ ප්‍රාකාර බිත්තිය නඩත්තු කිරීම | 539,843.50 |
| 9 | ඉන්දියාවේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය / නවදිල්ලිය | අනු කාර්යාලය, නිල නිවාසය සහ නිල වාසස්ථාන පිළිසකර කිරීම / ඔපවත් කිරීම<br>- විදුලි ට්‍රාන්ස්ෆෝමර් සහ බෙදාහැරීමේ පුවරු පරීක්ෂා කිරීම, අවශ්‍යතාවය මත පදනම්ව ඒවා අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම<br>- අලුත්වැඩියා කටයුතු සහ වර්ණාලේප කිරීම<br>- වෝල්ටීයතා ඒකක 07 ක අවශ්‍යතාවය සහිත බෙදුණු වායුසමීකරණ සකස් කිරීම<br>- අලුත්වැඩියා කිරීම / පිළිසකර කටයුතු සහ වර්ණාලේප කිරීම<br>- ට්‍රාන්ස්ෆෝමර් කාමරය උද්‍යාන බංකු, විදුලි කණු ආදිය අලුත්වැඩියා කිරීම / පිළිසකර කිරීම<br>- ප්‍රධාන විදුලි බෙදාහැරීමේ මධ්‍යස්ථානයේ සිට මහ කොමසාරිස් කාර්යාලයේ සිවිමහල් ගොඩනැගිල්ල දක්වා තිබෙන (ගෘහස්ථ මාණ්ඩලික මහල් නිවාස) විදුලිබල සැපයුම් කේබලයේ හානි සකස් කිරීම | 17,923,737.03 |
| 10 | ශ්‍රී ලංකා නියෝජ්‍ය මහකොමසාරිස් කාර්යාලය / චෙන්නායි | අනු කාර්යාලය අලුත්වැඩියා කිරීම / ඔපවත් කිරීම<br>- අනු කාර්යාලයේ බාහිර බිත්තිවල සිතුවම් වැඩ කටයුතු<br>- කිරිගරුඬ හා කළුගල් වලින් බිම් සැකසීම සහ ඉටිහෝ කුඩු යොදා යන්ත්‍රයෙන් ඔප දැමීම | 3,701,879.55 |
| 11 | ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය / මුම්බායි | අනු කාර්යාල පරිශ්‍රයේ අලුත්වැඩියා කටයුතු | 76,620.00 |
| 12 | ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / ජකර්තා | අනු කාර්යාල පරිශ්‍රයේ සහ නිල නිවාසයේ අලුත්වැඩියා කටයුතු | 6,141,038.00 |
| 13 | ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / ටෝකියෝ | අනු කාර්යාලය අලුත්වැඩියා කිරීම / ඔපවත් කිරීම<br>- අනු කාර්යාල ගොඩනැගිල්ලේ සිව්වන | 1,983,657.00 |

| | | | |
|---|---|---|---|
| | | මහලේ වැසිකිළි දෙක අලුත්වැඩියා කිරීම.<br>- මහජන සම්බන්ධතා නිලධාරීගේ කාමරය සඳහා උණුසුම් සහ සිසිලන පද්ධතිය ස්ථාපනය කිරීම<br>- ගිණුම් නිලධාරියාගේ කාමරයේ පිටත දොර ප්‍රතිස්ථාපනය කිරීම<br>- අනු කාර්යාල ගොඩනැගිල්ලේ දෙවන මහලෙහි පටු ආලින්දයේ සිට නල මාර්ග 02 ක් ඉදිකිරීම | |
| 14 | මැලේසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / ක්වාලා ලම්පූර් | අනු කාර්යාලය අලුත්වැඩියා කිරීම / ඔපවත් කිරීම<br>- නිල නිවාසය අලුත්වැඩියා කිරීම / ඔපවත් කිරීම<br>- නිල නිවාසයේ ප්‍රාකාර බැම්ම විස්තාරණය කිරීම<br>- ජලාපවහන පද්ධතිය ඔපවත්කර අලුත්වැඩියා කිරීම<br>- නිල නිවසේ ප්‍රාකාර බැම්ම ඉදිකිරීම<br>- මහ කොමසාරිස්වරයාගේ නිල නිවස සඳහා හදිසි අවශ්‍යතාවයක් මත ජලාපවහනය සැකසීම සහ ජල ප්‍රවාහය සකස් කිරීම | 7,201,506.86 |
| 15 | මියන්මාරයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / යැන්ගොන් | අනු කාර්යාලය සහනිල නිවාසය අලුත්වැඩියා කිරීම / ඔපවත් කිරීම<br>- බෝ ගස පිහිටි බිම්ප්‍රදේශය පිළිසකර කිරීම<br>- බුද්ධ ප්‍රතිමාව සඳහා වානේ වහලක් ඉදිකිරීම | 1,324,366.24 |
| 16 | ඕමානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / මස්කට් | අනු කාර්යාල ගොඩනැගිල්ලේ පළවන මහලේ දොරටුවෙහි වීදුරු දොර සවිකිරීම | 770,800.00 |
| 17 | සෞදිඅරාබියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / රියාද් | අනු කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | 4,172,676.00 |
| 18 | දකුණු අප්‍රිකාවේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය / ප්‍රිටෝරියා | අනු කාර්යාලය, නිල නිවාසය සහ නිල වාසස්ථාන අලුත්වැඩියා කිරීම / ඔපවත් කිරීම<br>- අතිගරු මහකොමසාරිස් නිල නිවසේ නිදන කාමරයක නව බුමුතුරුණු සවිකිරීම<br>- ලිස්ඩොජන්, බැල්මොරල් මාවත, අංක 172 හි වහල අලුත්වැඩියා කිරීම<br>- සියලුම් අභ්‍යන්තර හා බාහිර බිත්ති මතුපිට, සිවිලිම්, ප්ලැස්ටර්, දොරවල් සහ රාමු, මායිම් බිත්ති සහ ගේට්ටු වර්ණාලේප කිරීම | 3,038,429.00 |
| 20 | ස්වීඩනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / ස්ටොක්හෝම් | අනු කාර්යාලය සහ නිල නිවාසය අලුත්වැඩියා කිරීම | 30,370,000.00 |

| | | | |
|---|---|---|---|
| 21 | තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / බැංකොක් | නිල නිවාසය අලුත්වැඩියා කිරීම<br>- නිල නිවාසයේ සමහර කොටස් වර්ණ ගැන්වීම ඇතුළු සුළු අලුත්වැඩියාවන්<br>- නිල නිවාසයේ මුළුතැන්ගෙය අලුත්වැඩියා කිරීම<br>- කොන්සල් කාර්යාල ප්‍රදේශය ප්‍රතිව්‍යුහගත කිරීම / විභේදනය කිරීම<br>- නිල නිවසේ දෙවන මහලෙහි කුඩා බැල්කනියට / විවෘත ආලින්දවලට ඇලුමිනියම් ස්ලයිඩින් කවුළු කට්ටලයක් සවි කිරීම | 3,067,676.17 |
| 22 | එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය / ලන්ඩන් | අනු කාර්යාලය සහ නිල නිවාසය අලුත්වැඩියාකිරීම / ඔපවත් කිරීම<br>- නිල නිවාසයේ තාපන පද්ධතියෙහි අලුත් වැඩියා කිරීමේ කටයුතු<br>- නිල නිවාසයේ වහල මුදුනත අලුත් වැඩියා කිරීමේ කටයුතු<br>- මහ කොමසාරිස් කාර්යාලයේ දෘශ්‍ය හඳුනා ගැනීමේ පද්ධතිය සහ ප්‍රධාන පිවිසුමට තනිවම පිවිසීමේ පාලනයන් සකස් කිරීම.<br>- අතිගරු මහ කොමසාරිස් නිල නිවසේ හදිසි සෝපාන අලුත්වැඩියා කටයුතු<br>- අනු කාර්යාලයේ බිම්මහලේ නව පිරිමි වැසිකිළියක් ඉදිකිරීම<br>- මහ කොමසාරිස්වරයාගේ නිල නිවසට නව බේසම් ඒකකයක් සැපයීම සහ ස්ථාපනය කිරීම<br>- අනු කාර්යාල බිත්ති අලුත්වැඩියා කිරීම<br>- මහ කොමසාරිස් කාර්යාලයේ පැන්ට්‍රි ප්‍රදේශයේ කාර්යයන් ප්‍රති සංවිධානය කිරීම<br>- අතිගරු මහ කොමසාරිස් නිල නිවසේ අලුත්වැඩියා කටයුතු<br>- නිල නිවස සඳහා තිරස් වහල සෙවන ගන්වන ආවරණ (Skylight shading) මිලදී ගැනීම සහ ස්ථාපන යකිරීම<br>- අනු කාර්යාල බිම්මහලේ නව පිරිමි වැසිකිළියක් ඉදි කිරීම | 22,390,667.45 |
| 23 | එක්සත් ජාතීන්ගේ සංවිධානය සඳහා වූ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය / නිව්යෝර්ක් | නිල නිවාසය සඳහා කවුළු ආවරණ ස්ථාපනය කිරීම | 435,015.00 |
| 24 | එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / වොෂින්ටන් | අනු කාර්යාලය සහ නිල නිවාසය අලුත්වැඩියා කිරීම / ඔපවත් කිරීම<br>- නිල නිවසේ උණුසුම / සිසිලන පද්ධතිය අලුත්වැඩියා කිරීම<br>- නව ගෑස් උදුනක් සහ පිටාරකයක් මිලදී ගැනීම | 9,924,868.18 |

| | | | |
|---|---|---|---|
| | | - නිල නිවාසයේ ප්‍රධාන නිදන කාමරයේ දැනට පවතින නානකාමරය අලුත්වැඩියා කිරීම සහ ප්‍රති සැකසුම් කිරීම<br>- නිල නිවාසයේ ප්‍රධාන නිදන කාමරයේ නානකාමරය අලුත්වැඩියා කිරීම<br>- ඉදිරිපස දොරටුවේ අභ්‍යන්තර පිවිසුම් දොරක් (විදුරු) ප්‍රතිස්ථාපනය කිරීම සහ නිල නිවාසයෙහි නිල නිවස අභ්‍යන්තරයේ හිරු කාමරයට විවෘත වන පරිදි ප්‍රංශ දොරවල් කට්ටලයක් ආදේශ කිරීම | |

**ii. චංචල දේපල :**

**අ. වාහන**

විදේශීය වත්කම් කළමනාකරණ හා සංවර්ධන අංශය (OAM & D) භාණ්ඩාගාරය සමඟ සාකච්ඡාකර උපදෙස් ලබා ගනිමින්, විදේශයන්හි දූත මණ්ඩල / තනතුරු සඳහා නව වාහන ආදේශ කිරීම අවශ්‍ය වන අවස්ථාවන් හිදී, වාහන මිලදී ගැනීමට පහසුකම් සපයයි.

එම කාල සීමාව තුළ විදේශ දූත මණ්ඩලයන්හි භාවිතය සඳහා ඇමරිකානු ඩොලර් 268,536/ක (ශ්‍රී ලංකා රුපියල් 49,710,144/-) මුළු පිරිවැයකින් යුතු වාහන 6 ක් මිලදී ගැනීමට අනුමැතිය ලබා දී ඇත.

නඩත්තු පිරිවැය අවම කිරීම පිණිස, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 ට අනුකූලව පැරණි වාහන අපහරණය කරන ලෙස අමාත්‍යාංශය විසින් ඉහත සඳහන් දූත මණ්ඩල 6 ට උපදෙස් ලබා දී තිබේ.

නවදිල්ලිය, ටෙල්අවිව්, ජිනීවා, මොස්කව්, ජෙඩා, රියාද්, සිංගප්පූරුව සහ පැරිස් යන ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල සඳහා නව වාහන මිලදී ගැනීම උදෙසා වන ඉල්ලීම භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, ජාතික අයවැය චක්‍රලේඛඅංක 05/2019 අනුව, මහා භාණ්ඩාගාරය විසින් නව වාහන මිලදී ගැනීම නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව අත්හිටුවා ඇත.

**ආ. අනෙකුත් ප්‍රාග්ධන වත්කම්**

විදේශ දූත මණ්ඩල කිහිපයක් විසින් සිදුකරන ලද ඉල්ලීම් මත 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු. මිලියන 91.1 ක පිරිවැයකින් යුතු කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අත්පත්කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් සිය අනුමැතිය ලබා දී ඇත.

**ඇ. චංචල හා නිශ්චල වත්කම් රක්ෂණය**

ශ්‍රී ලංකා රජයේ වත්කම් සුරක්ෂිත කිරීම සඳහා, සුදුසු පරිදි නව රක්ෂණයක් ලබා දීම / නියමිත වෙලාවට රක්ෂණය අලුත් කිරීම සඳහා මෙම අංශය පියවර ගෙන ඇත.

**2. විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම**

විදේශයන්හි ශ්‍රී ලාංකික දූත මණ්ඩලවලට පත්කර ඇති නිලධාරීන් (ගෘහස්ථ කාර්ය මණ්ඩලය) සඳහා රාජ්‍ය තාන්ත්‍රික / නිල විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම / අලුත් කිරීම / දීර්ඝ කිරීම සඳහා නිර්දේශ ලිපි ලබා දීම.

### 3. විශාල ගමන් මලු ඇසුරුම් කිරීම, ප්‍රවාහනය කිරීම සහ රක්ෂණය කිරීම

රාජ්‍ය තාන්ත්‍රික නොවන ගෘහස්ථ කාර්යය මණ්ඩල නිලධාරීන්ගේ විශාල ගමන් මලු ප්‍රවාහනය සඳහා දරන වියදම අවම කිරීම උදෙසා 2018.07.17 දිනැති එම් අයි එස් චක්‍රලේඛ අංක 215 ක්‍රියාත්මක කිරීම.

### 4. ගෘහස්ථ කාර්ය මණ්ඩලය සඳහා පිටත්වීම / පැමිණීමේ කටයුතු

සිය පවුලේ සාමාජිකයන් සමඟ නිලධාරීන් 185 දෙනෙකුගේ පිටත්වීම සඳහා සහ තම රාජකාරී චාරිකාව අවසන් කිරීමෙන් පසුව සිය පවුලේ සාමාජිකයන් ඇතුළුව නිලධාරීන් 115 දෙනෙකුගේ පැමිණීම සඳහා මෙම අංශය විසින් පහසුකම් සපයා ඇත.

### 5. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල පිළිබඳ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය

සියලුම ශ්‍රී ලංකා දූත මණ්ඩල / තනතුරු පිළිබඳ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2018 ලබාගෙන අවශ්‍ය නිෂ්කාශන කටයුතු සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, භාවිතයට ගත නොහැකි භාණ්ඩ අපහරණය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

### 6. විගණන පරීක්ෂණ

අභ්‍යන්තර විගණන අංශය සමඟ සාකච්ඡාකර විදේශයන්හි දූත මණ්ඩලවල / තනතුරු වල විධිමත් විගණන පරීක්ෂණ සිදුකිරීම සඳහා මෙම අංශය පහසුකම් සපයයි.

### 7. ප්‍රගති වාර්තාව සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම

විදේශීය වත්කම් කළමනාකරණ හා සංවර්ධන අංශය (OAM&D) විදේශයන්හි දූත මණ්ඩල සහ අමාත්‍යාංශයේ අදාළ අංශ සමඟ සම්බන්ධීකරණය වී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රගති වාර්තාවක්, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සහ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් සකස් කරන ලදී.

### 8. වෙබ් අඩවිය නඩත්තු කිරීම

ආර්ථික / රාජ්‍ය තාන්ත්‍රික වැඩසටහන් වලට අනුකූලව, විදේශයන්හි අදාළ පාර්ශ්වයන්ට වඩාත්ම යාවත්කාලීන තොරතුරු සැපයීම පිණිස විධිමත්ව වෙබ් අඩවි නඩත්තු කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස ශ්‍රී ලංකා දූත මණ්ඩලවලින් ඉල්ලා සිටින ලදී. මේ වනවිට වෙබ් අඩවි නොමැති දූත මණ්ඩල සඳහා නව වෙබ් අඩවි ස්ථාපිත කරන ලෙස තවදුරටත් ඉල්ලා සිටින ලදී.

### 9. අනු කාර්යාල, නිල නිවාස බදු දීම / කුලියට දීම

ශ්‍රී ලංකා රජයට ආර්ථික වශයෙන් බර පැටවීම අවම වන පරිදි සහ සාධාරණ වන පරිදි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අනුයුක්ත නිලධාරීන් සඳහා තාවකාලික / ස්ථිර නවාතැන් පහසුකම් සැපයීම සඳහා මෙම අංශය කැපවී ඇත.

### 10. කාර්ය මණ්ඩල නිවාස වෙන් කිරීම

පළමුව ලැබෙන ඉල්ලීමට පළමුව සේවා සැපයීමේ පදනම මත ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් අතර නිල නිවාස වෙන් කිරීමද මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

## 11. චක්‍රලේඛ නිකුත් කිරීම

මෙම අංශය විසින් 2019.11.11 දිනැති චක්‍රලේඛ අංක 303 නිකුත් කර ඇති අතර, සියලු රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවල බදු / වැට් හිමිකම් ඉල්ලීම්වලට අනුකූල වන ලෙසත්, එම ඉපැයීම් කාර්තුමය වශයෙන් මෙම අමාත්‍යාංශයට වාර්තා කරන ලෙසත් එමඟින් ඉල්ලා සිටින ලදී.

### නිල සංචාර සඳහා පහසුකම් සැපයීම

විදේශීය වත්කම් කළමනාකරණ හා සංවර්ධන අංශයෙහි (OAM & D) විෂය පථයට අයත් චාරිකා ඒකකය 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා නිල සංචාර 154 ක් සඳහා වීසා සහ ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට පහසුකම් සලසා ඇති අතර, එම කාලය තුළ නිලධාරීන් 308 දෙනෙකු සඳහා අවශ්‍ය ගමන් වියදම් දීමනා සහ වෙනත් හිමිකම් ගෙවීම්ද සිදුකර ඇත. විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වල රජයේ නිලධාරීන් සහ අර්ධ රාජ්‍ය ආයතනයන්හි නිලධාරීන්ට වීසා ලබා ගැනීමේ පහසුකම් සැලසීම සඳහා තෙවන පාර්ශ්වීය සටහන්ද (TPN) නිකුත් කර ඇත.

### ආරක්ෂක තැපැල් අංශය

ආරක්ෂක තැපැල් අංශය, ශ්‍රී ලංකා දූත මණ්ඩල / තනතුරු සඳහා රාජ්‍ය තාන්ත්‍රික මලු පිටත්කර යැවීම, ශ්‍රී ලංකා දූත මණ්ඩල / තනතුරු විසින් තැපැල් මඟින් එවන ලද රාජ්‍ය තාන්ත්‍රික මලු එක්රැස් කර ගැනීම සහ එක්රැස් කරන ලද රාජ්‍ය තාන්ත්‍රික මලුවල අන්තර්ගත භාණ්ඩ අමාත්‍යාංශයේ අදාළ අංශ වෙත ලබා දීම සම්බන්ධයෙන් කටයුතු කරයි. පිරිවැය අඩුකිරීම සහ වේලාව මත පදනම්ව තැපැල් මඟින් එවන මලු ඉක්මනින් ලබා දීම සහතික කිරීම සඳහා, තෝරාගත් සමහර දූත මණ්ඩල වලින් රාජ්‍යතාන්ත්‍රික මලු පිටත්කර යැවීමට කුරියර් සමාගමේ සහාය ලබා ගැනීම අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදී.

පිටත්කර යැවීමේදී DPL බෑග් අස්ථානගත වීම අවම කිරීම සඳහා විදේශ සබඳතා අමාත්‍යාංශයේ නම සහිතව නව DPL බෑග් මුද්‍රණය කරන ලදී.

### තොරතුරු තාක්ෂණ අංශය

තොරතුරු තාක්ෂණ අංශය විසින් විදේශයන් හි ශ්‍රී ලංකා දූත මණ්ඩල / තනතුරු සහ ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වෙනත් සංවිධාන සහ ආයතන වෙතින් ලැබෙන ෆැක්ස් සහ විද්‍යුත් තැපැල් ලේඛන 600 ත් 700 ත් අතර ප්‍රමාණයක් දෛනිකව හසුරුවයි. තොරතුරු තාක්ෂණ අංශය සතියේ දින හතම පැය 24 පුරාම ක්‍රියාත්මක වන අතර, කාර්ය මණ්ඩලය සේවා මුර පදනම මත සේවයේ යොදවනු ලැබේ.
CYPHER හි ලේඛන සුරක්ෂිත කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශයේ ගබඩා පහසුකම් වැඩි කිරීමට කටයුතු කරන ලදී.

# සන්ධාන අංශය

## සන්ධාන අංශය

**1. සන්ධාන අංශයේ කාර්ය කටයුතු පහත දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපය යටතේ වර්ග කළ හැකිය.:-**

අ) සැමරුම් උත්සව සම්බන්ධීකරණය

ආ) විදේශීය රාජ්‍යතාන්ත්‍රික නියෝජන, එක්සත් ජාතීන්ගේ සංවිධානය හා එහි විශේෂිත නියෝජිතායතන හා ශ්‍රී ලංකාවට අක්තගන්වා ඇති ජාත්‍යන්තර සංවිධානවලට පිරිනමා ඇති රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද හා විනිර්මුක්තීන්වලට අදාළ පහසුකම් සැලසීම හා නිරීක්ෂණය කිරීම.

ඇ) ශ්‍රී ලංකාවට අක්තගන්වා ඇති (කොළඹ පිහිටි දූත මණ්ඩලවල ප්‍රධානීන් හා වෙනත් දූත මණ්ඩලවලින් සමගාමීව අක්තගන්වන ලද) දූත මණ්ඩලවල ප්‍රධානීන් සඳහා පහසුකම් සැලසීම

ඈ) ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාත්‍යන්තර සමුළු සඳහා සැපයුම් සේවා සහ සන්ධාන කටයුතු ඉටුකිරීම.

**2. උත්සව අවස්ථා**

සමාලෝචනයට බඳුන්වන කාලසීමාව තුළදී මෙම අංශය මගින් සම්බන්ධීකරණය කරන ලද උත්සව අවස්ථා.

**2.1 ශ්‍රී ලංකාවේ සංචාරවල නියැලෙන අතිශයින් වැදගත් පුද්ගලයන්ගේ/ඉතා වැදගත් පුද්ගලයන්ගේ සංචාර**

2.1.1 රාජ්‍ය නායකයින්/අග්‍රාමාත්‍යවරුන්
2.1.2 විදේශ අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය විදේශ අමාත්‍යවරුන්
2.1.3 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හා වෙනත් ජාත්‍යන්තර සංවිධානවල සම්භාවනීය පුද්ගලයන්
2.1.4 මාර්ගස්ථ සංචාර
2.1.5 වෙනත් විදේශීය සම්භාවනීය පුද්ගලයන්
2.1.6 රැස්වීම්/සමුළු සඳහා නියෝජිත කණ්ඩායම්

ඇමුණුම් I/I,I/II,I/III බලන්න

**2.2 ශ්‍රී ලාංකික අතිශයින් වැදගත් පුද්ගලයන්ගේ/ ඉතා වැදගත් පුද්ගලයන්ගේ සංචාර**

2.2.1 අතිගරු ජනාධිපතිතුමාගේ සංචාර (ඇමුණුම II)

2.2.2 ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංචාර (ඇමුණුම III)

2.2.3 ගරු විදේශ සබඳතා අමාත්‍යතුමාගේ සංචාර (ඇමුණුම IV)

2.2.4 ගරු විදේශ සබඳතා නියෝජ්‍ය/ රාජ්‍ය අමාත්‍යතුමාගේ සංචාර (ඇමුණුම V)

**3. විනිර්මුක්ති හා වරප්‍රසාද**

සමාලෝචනයට බඳුන්වන කාලය තුළදී සන්ධාන අංශයේ වරප්‍රසාද හා විනිර්මුක්තිවලට අදාළව ඉටුකරන ලද කාර්ය කටයුතු මෙසේය:-

3.1 නිෂ්කාශන සහතිකපත් නිකුත් කිරීම
3.1.1 විදේශීය දූත මණ්ඩල සඳහා
(සහතික පත් 50ක් ඇතුළත් පොත් 17ක්) **850**
3.1.2 ජාත්‍යන්තර සංවිධාන සඳහා
(සහතික පත් 50ක් ඇතුළත් පොත් 2ක්) **100**
3.2 රේගු පහසුකම් - ආනයනය

3.2.1 විදේශීය දූත මණ්ඩල සඳහා **1120**
3.2.2 ජාත්‍යන්තර සංවිධාන සඳහා **513**

3.3 රේගු පහසුකම් - අපනයනය
3.3.1 විදේශීය දූත මණ්ඩල සඳහා **130**
3.3.2 ජාත්‍යන්තර සංවිධාන සඳහා **11**

3.4 වාහන (රාජ්‍යතාන්ත්‍රික / එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් සංවිධාන)
3.4.1 වාහන විකිණීම **194**
3.4.2 වාහන ලියාපදිංචිය **102**
3.4.3 ආදායම් බලපත්‍ර නිකුත්කිරීම **602**
3.4.4 රියදුරු බලපත්‍ර නිකුත් කිරීම **192**
3.4.5 පැට්ට්‍රෝල් කූපන් පොත් නිකුත් කිරීම **466**

3.5 වීසා බලපත්

3.5.1 විදේශීය දූත මණ්ඩල සඳහා වීසා බලපත් - ප්‍රවේශ වීසා (ඇමුණුම VI) **565**
3.5.2 විදේශීය දූත මණ්ඩල සඳහා වීසා බලපත් - වාස වීසා (ඇමුණුම VII) **1062**
3.5.3 ජාත්‍යන්තර සංවිධාන සඳහා වීසා බලපත් - ප්‍රවේශ වීසා (ඇමුණුම VIII) **204**
3.5.4 ජාත්‍යන්තර සංවිධාන සඳහා වීසා බලපත් - වාස වීසා (ඇමුණුම IX) **411**

3.6 ගුවන්තොටුපළ අවසරපත්
3.6.1 ස්ථිර- අලුතින් නිකුත්කළ **77**
3.6.2 තාවකාලික (මාස 6ක් සඳහා)- අලුතින් නිකුත්කළ **36**
3.6.3 ස්ථිර - අලුත් කිරීම් **127**
3.6.4 තාවකාලික (මාස 6ක් සඳහා) - අලුත් කිරීම් **217**

3.7 ඉතා වැදගත් පුද්ගලයන්ගේ පිවිසුම සඳහා අවසරපත්
3.7.1 විදේශීය මගින් **5810**
3.7.2 දේශීය මගින් **4152**

3.8 රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාශන (ඇමුණුම X)
3.8.1 විදේශීය ගුවන් යානා සඳහා අනුමැතිය (යුධ ගුවන් යානා/රජයට අයත්) **184**
3.8.2 විදේශීය නැව් සඳහා අනුමැතිය (යුධ නැව්/රජයට අයත්) **37**

3.9 අනන්‍යතා පත්‍ර (රාජ්‍යතාන්ත්‍රික / එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් සංවිධාන) **788**

## 4. දූත මණ්ඩල ප්‍රධානීන්/නිර්වේතනික කොන්සල්වරු පත්කිරීම

ශ්‍රී ලංකාවට අක්තගන්වා ඇති විදේශීය තානාපතිවරුන් / මහ කොමසාරිස්වරුන් වෙත අක්තපත්‍ර පිළිගැන්වීම සඳහා වන උත්සව සංවිධානය කිරීමේ සහ ශ්‍රී ලංකාව නේවාසික දූත මණ්ඩල පිහිටුවා ඇති රටවලට පත්කරනු ලබන ශ්‍රී ලංකා තානාපතිවරුන්/ මහ කොමසාරිස්වරුන් සඳහා අදාළ රටවලින් පිරිනමන පිළිගැනීමේ ලිපිය ලබාගැනීමේ වගකීම පැවරෙන්නේ සන්ධාන අංශයටය. ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීම හා ශ්‍රී ලංකාවේ සිටින වෙනත් රටවල නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීම පිළිබඳ වගකීම මෙම

අංශය වෙත පැවරේ. සමාලෝචනයට බඳුන්වන කාලය තුළදී මෙම අංශය විසින් පවත්වන ලද උත්සව අවස්ථා මෙසේය,

4.1 ශ්‍රී ලංකාව සඳහා විදේශීය දූත මණ්ඩල ප්‍රධානීන්ගේ පත් කිරීම (ඇමුණුම XI) **39**
විදේශයන් සඳහා ශ්‍රී ලාංකික දූත මණ්ඩල ප්‍රධානීන්ගේ පත් කිරීම **31**

4.2 විදේශීය රටවල සිටින ශ්‍රී ලංකා නිර්වේතනික හා කොන්සල්වරුන්ගේ පත්කිරීම් (ඇමුණුම XII)

4.2.1 පත් කිරීම් **09**
4.2.2 සේවා කාලය දීර්ඝ කිරීම **23**

4.3 ශ්‍රී ලංකාවේ සිටින නිර්වේතනික කොන්සල්වරුන්ගේ පත් කිරීම් **04**

## 5. මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලද ජාත්‍යන්තර සමුළු

ජාත්‍යන්තර සමුළු පැවැත්වීම සඳහා සිත්ගන්නාසුළු ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමෙහිලා සන්ධාන අංශය මූලික කාර්යභාරයක් ඉටු කරයි. රේඛීය අමාත්‍යාංශ විසින් සංවිධානය කරනු ලබන වෙළඳ අංග සංවිධානය කිරීමේදී මෙම අංශය අදාළ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟ සමීපව කටයුතු සම්බන්ධීකරණය කරයි.
එවැනි ජාත්‍යන්තර සමුළුවලට අදාළ වන සන්ධාන සහ සැපයුම් කටයුතු ඉටුකිරීම සඳහා අදාළ රේඛීය නියෝජිතායතනවල කාර්ය මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය සහාය හා මාර්ගෝපදේශ ලබා දෙනුයේ ද මෙම අංශය විසිනි.

**රාජ්‍ය නායකයින්/ අග්‍රාමාත්‍යවරුන්**

| | |
|---|---|
| 1. | ලෙසොතෝ රාජධානියේ රාජ්‍ය නායක ලෙස්ටි iii රජතුමාගේ සහ මාසෙනාටේ මහ ටෝ සීසෝ රාජකුමාරිකාවගේ පෞද්ගලික සංචාරය - 2019 ජනවාරි 02- 08 |
| 2. | මාලදිවයින් ජනරජයේ ජනාධිපති අතිගරු ඊබ්‍රහිම් මොහමඩ් සොලිහ් මැතිතුමාගේ පෞද්ගලික සංචාරය - 2019 ජනවාරි 6 |
| 3. | මාලදිවයින් ජනරජයේ ජනාධිපති අතිගරු ඊබ්‍රහිම් මොහමඩ් සොලිහ් මැතිතුමාගේ ශ්‍රී ලංකා රාජ්‍ය සංචාරය - 2019 පෙබරවාරි 03- 06 |
| 4. | ඉන්දියාවේ අග්‍රාමාත්‍ය ගරු. නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ රාජ්‍ය සංචාරය - 2019 ජුනි 09 |
| 5. | දකුණු අප්‍රිකානු ජනරජයේ ජනාධිපති අතිගරු එම්. සී. රමෆෝසා මැතිතුමාගේ මාර්ගස්ථ සංචාරය - 2019 ජුනි 27- 29 |
| 6. | ඇන්ගෝලා ජනරජයේ ජනාධිපති අතිගරු ජොආඕ මැනුවෙල් ගොන්කාල්විස් මැතිතුමාගේ මාර්ගස්ථ සංචාරය |
| 7. | ටොගොලෙස්හි ජනාධිපති අතිගරු ෆෝරේ ඉසොසිම්හා ඉයඩින්ග්බේ මැතිතුමාගේ සංචාරය 2019 සැප්තැම්බර් 13-18 |
| 8. | කොන්ගෝ ජනරජයේ අතිගරු ෆෙටික්ස් ඇන්ටිනෙට් ස්කුසේකෙයි මැතිතුමාගේ මාර්ගස්ථ සංචාරය -2019 අගෝස්තු 31 |
| 9. | මාලදිවයින් ජනරජයේ ජනාධිපති අතිගරු ඊබ්‍රහිම් මොහමඩ් සොලිහ් මැතිතුමාගේ මාර්ගස්ථ සංචාරය -2019 සැප්තැම්බර් 21 |
| 10. | දකුණු අප්‍රිකානු ජනරජයේ ජනාධිපති අතිගරු එම්. සී. රමෆෝසා මැතිතුමාගේ සංක්‍රාන්ති සංචාරය |
| 11. | මාලදිවයින් ජනරජයේ ජනාධිපති අතිගරු ඊබ්‍රහිම් මොහමඩ් සොලිහ් මැතිතුමාගේ පෞද්ගලික සංචාරය |

**ඇමුණුම I / II**

**විදේශ අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය විදේශ අමාත්‍යවරු**

| | |
|---|---|
| 1. | වෙනිසියුලාවේ උප විදේශ කටයුතු අමාත්‍ය රූබන් ඩාරියෝ මොලිනා මැතිතුමාගේ කාර්ය සංචාරය (2019 අගෝස්තු 24- 28) |
| 2. | ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය එස් ජයශන්කර් මැතිතුමා |
| 3. | පාකිස්ථානයේ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාරය -2019 දෙසැම්බර් 1-2 |
| 4. | ජපානයේ විදේශ කටයුතු අමාත්‍ය මොටෙගි ටොෂිමිට්සෝ මහතාගේ සංචාරය -2019 දෙසැම්බර් 12-14 |
| 5. | මාලදිවයිනේ විදේශ කටයුතු අමාත්‍ය ගරු අබ්දුල්ලා ෂහිඩ් මහතාගේ සංචාරය- දෙසැම්බර් 4-7 |
| 6. | සිංගප්පූරුවේ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාරය - 2019 දෙසැම්බර් 19 -21 |

**අනෙකුත් අමාත්‍යවරුන් විසින් ශ්‍රී ලංකාවේ යෙදුණු සංචාර**

| | |
|---|---|
| 1. | ස්වදේශ කටයුතු හා නීති අමාත්‍ය ගරු කේ.ඡන්මුගම් මැතිතුමා - 2019 මැයි 18- 23 |
| 2. | ජපානයේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු ටොෂිකි මැතිනිය |

**ඇමුණුම I / III**

**එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හා වෙනත් ජාත්‍යන්තර සංවිධානවල සම්භාවනීය පුද්ගලයන්**

| | |
|---|---|
| 1. | යුරෝපා පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා මිතුරෝ කණ්ඩායමේ සංචාරය |
| 2. | 28 වැනි එක්සත් ජනපද තානාපති 2013-2017 හා බැරැක් ඔබාමා ජනාධිපතිතුමාගේ අමාත්‍යමණ්ඩලයීය සාමාජික සමන්තා පවර් මැතිනිය (2019 පෙබරවාරි 2- මාර්තු 2) |
| 3. | කෙන්යා ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ කැබිනට් ලේකම්වරයාගේ සංචාරය- 2019 මාර්තු 8 |
| 4. | ත්‍රස්තවාදය මර්දනය කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNOCT) -2019 මැයි 31 |
| 5. | ජපාන අග්‍රාමාත්‍යවරයාගේ විශේෂ උපදේශක - 2019 ජූනි 20- 21 |
| 6. | ඉරානයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ බටහිර/ ආසියා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හා ඉරානයේ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ උපදේශක ආචාර්ය සෙයෙඩ් රාසොල් මොන්සෝරි මැතිතුමාගේ සංචාරය |
| 7. | සාර්ක් මහ ලේකම් අතිගරු අම්ජාඩ් හුසේන් බී. සියල් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය - 2019 ජූලි 4- 8 |
| 8. | යුරෝපා සංගම් ත්‍රස්ත මර්දන සම්බන්ධීකාරක -2019 ජූලි 16 |
| 9. | IWAWDCE 2019 රැස්වීම -2019 දෙසැම්බර් 1-4 |
| 10. | ආචාර්ය සියෙඩ්නා මුෆාඩ්ඩල් මැතිතුමාගේ සංචාරය -2019 අගෝස්තු 28- සැප්තැම්බර් ජාව) |
| 11. | චීන මධ්‍යම කමිටුවේ කොමියුනිස්ට් පක්ෂ දේශපාලන කාර්යාංශයේ සාමාජික අති ගරු චෙන් අමාත්‍ය -2019 සැප්තැම්බර් 17-19 |
| 12. | කැන්ටබරි අගරදගුරු හිමිපාණන්ගේ සංචාරය -2019 අගෝස්තු 21-29 |
| 13. | නසෙබ් සාමිවරයාගේ ශ්‍රී ලංකා සංචාරය - 2019 සැප්තැම්බර් 16-20 |
| 14. | තිරසර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ගෝලීය ව්‍යාපාරය දියත් කිරීම -2019 ඔක්තෝබර් 23-24 |
| 15. | එක්සත් ජනපද පාර්ලිමේන්තුවේ දේශපාලන කටයුතු පිළිබඳ උපලේකම් අතිගරු ඩේවිඩ් හේල් මැතිතුමාගේ සංචාරය |
| 16. | ෆුජියාන් පළාත් මහජන කොන්ග්‍රසයේ ස්ථාවර කමිටු උපසභාපති ලි චුමෙයු මැතිනියගේ සංචාරය |

ඇමුණුම II

**අතිගරු ජනාධිපතිතුමාගේ විදේශ සංචාර**

| අංකය | රට | කාලසීමාව | අරමුණ |
|---|---|---|---|
| 1. | **පිලිපීනය** | 2019 ජනවාරි 15-19 | රාජ්‍ය සංචාරය |
| 2. | **සිංගප්පූරුව** | 2019 ජනවාරි 23-25 | ආසියා පැසිෆික් රටවල අමාත්‍යවරුන්ගේ හා පරිසර බලධාරීන්ගේ 3 වැනි සංසදය පිළිබඳ සමුළුව |
| 3. | **කෙන්යාව** | 2019 මාර්තු 13-17 | නිල සංචාරය |
| 4. | **චීනය** | 2019 මැයි 13-16 | ආසියානු ශිෂ්ඨාචාර සංවාදය පිළිබඳ සමුළුව |
| 5. | **ඉන්දියාව** | 2019 මැයි 30-31 | ඉන්දියාවේ ගරු අමාත්‍යවරයා සිය ධූරයේ රාජකාරි භාරගැනීම |
| 6. | **ටජිකිස්ථානය** | 2019 ජූනි 13-16 | නිල සංචාරය |
| 7. | **කාම්බෝජියාව** | 2019 අගෝස්ත 07-10 | රාජ්‍ය සංචාරය |
| 8. | **ජපානය** | 2019 ඔක්තෝබර් 21-23 | ජපානයේ අධිරාජයාගේ අභිෂේක මංගල්‍ය |

ඇමුණුම III

**ගරු අග්‍රාමාත්‍යවරයාගේ විදේශ සංචාර**

| අංකය | රට | කාලසීමාව | අරමුණ |
|---|---|---|---|
| 1. | **සිංගප්පූරුව** | 2019 අප්‍රේල් 23-25 | නිල |
| 2. | **සිංගප්පූරුව** | 2019 ජූනි 12-14 | නිල |
| 3. | **මාලදිවයින** | 2019 සැප්තැම්බර් 2-4 | නිල |

**ඇමුණුම IV**

## ගරු විදේශ අමාත්‍යවරයා නියැලුණ විදේශ සංචාර

| අංකය | රට | කාල සීමාව | අරමුණ |
|---|---|---|---|
| 1. | **පිලිපීනය** | 2019 ජනවාරි 15-19 | අතිගරු ජනාධිපතිතුමාගේ පිලිපීන රාජ්‍ය සංචාරය |
| 2. | **සයිප්‍රසය** | 2019 පෙබරවාරි 25-29 | නිල |
| 3. | **ජිනීවා** | 2019 මාර්තු 18-24 | මානව හිමිකම් කවුන්සිල සැසිවාරය |
| 4. | **මියන්මාරය** | 2019 අප්‍රේල් 10-15 | ශ්‍රී ලංකා මියන්මාර ඒකාබද්ධ කොමිෂන් සභාව |
| 5. | **කටාර්** | 2019 අප්‍රේල් 30-මැයි 02 | ආසියා සහයෝගිතා සංවාදයේ විදේශ අමාත්‍යවරුන්ගේ රැස්වීම |
| 6. | **නිව්යෝර්ක්** | 2019 මැයි 08-10 | නිල |
| 7. | **මෙක්සිකෝව** | 2019 මැයි 11-15 | නිල |
| 8. | **නෝර්වේ** | 2019 මැයි 22-26 | ජාත්‍යන්තර සමුළුව |
| 9. | **හන්ගේරියාව හා පෝලන්තය** | 2019 ජූනි 12-18 | නිල |
| 10. | **තායිලන්තය** | 2019 අගෝස්තු 02-04 | 26 වැනි ආසියාන් කළාපීය සංසද ජාත්‍යන්තර මට්ටමේ රැස්වීම |
| 11. | **බංගලාදේශය** | 2019 සැප්තැම්බර් 04-07 | නිල |
| 12. | **රොමේනියාව** | 2019 සැප්තැම්බර් 08-12 | නිල |
| 13. | **රෝමය, ඉතාලිය** | 2019 ඔක්තෝබර් 08-11 | නිල |

**ඇමුණුම V**

**ගරු රාජ්‍ය අමාත්‍යවරයාගේ විදේශ සංචාර**

| අංකය | රට | කාලසීමාව | අරමුණ |
|---|---|---|---|
| **1.** | **කියුබාව හා පැනමාව** | 2019 ජූනි 24 -ජූලි 05 | නිල |
| **2.** | **කාම්බෝජය** | 2019 අගෝස්තු 07-11 | නිල |
| **3.** | **වෙනිසියුලාව** | 2019 ඔක්තෝබර් 02-08 | නිල |

විදේශ දූතමණ්ඩල සඳහා විසා බලපත්- වාස විසා- 2019

| රට | ජන | පෙබ | මාර්තු | අප්‍රේ | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඇෆ්ගනිස්ථානය | | | | | | | 3 | | | | | | 3 |
| ඕස්ට්‍රේලියාව | 4 | 5 | | 1 | | 2 | 1 | | | 3 | 1 | 4 | 21 |
| බංගලාදේශය | 4 | | 1 | | 3 | | 10 | | | | | | 18 |
| බ්‍රිතාන්‍ය කවුන්සිලය | | | 3 | 2 | | | 1 | 9 | 9 | 13 | 4 | | 41 |
| බ්‍රසීලය | 1 | 1 | | 4 | | | | 2 | | | | | 8 |
| කැනඩාව | 2 | | | | | | 3 | | 4 | | | | 9 |
| චීනය | | 3 | 4 | 6 | 6 | | 1 | | 6 | 1 | 1 | | 28 |
| කියුබාව | | | | | | | | | | 3 | | | 3 |
| ඊජිප්තුව | | | 1 | | 1 | 1 | | | | | | | 3 |
| යුරෝපා සංගමය | 1 | 3 | 2 | | | | 4 | 1 | 6 | | 4 | 1 | 22 |
| ප්‍රංශය | 5 | 1 | 2 | 5 | 3 | 3 | 3 | | 12 | 10 | 3 | | 47 |
| ජර්මනිය | 2 | | 1 | 2 | 4 | | 5 | 6 | 1 | 1 | 2 | 1 | 25 |
| වතිකානුව | | | | | | | | | | | | | 0 |
| ඉන්දියාව | 6 | 17 | 21 | 15 | 10 | 5 | 15 | 16 | 58 | 5 | 6 | | 174 |
| ඉන්දුනීසියාව | | | | | | 2 | 1 | 3 | | 4 | | | 10 |
| ඉරානය | | | | | | | 2 | | | | 1 | | 3 |
| ඉරාකය | | | | | | | 2 | | | 1 | | | 3 |
| ඉතාලිය | 4 | | | | 3 | | 1 | 2 | 2 | 2 | | | 14 |
| ජපානය | 3 | | 1 | 12 | 2 | 1 | 4 | | 1 | 1 | 1 | | 26 |
| කොරියාව | 2 | 2 | 5 | | 3 | 1 | 8 | 7 | | | 2 | | 30 |
| කුවේටය | 1 | | | | | | 1 | 5 | | 1 | | | 8 |
| ලිබියාව | | | 17 | 2 | | 5 | 5 | 4 | 1 | 7 | 2 | 1 | 44 |
| මැලේසියාව | | | | | | | | | | | | | 0 |
| මාලදිවයින | 11 | 5 | 5 | 9 | 7 | | 6 | 7 | 7 | 1 | 6 | 1 | 65 |
| මියන්මාරය | | | 6 | | | | | | | | | | 6 |
| නේපාලය | | | | | | | | 8 | 3 | | | | 11 |
| නෙදර්ලන්තය | 2 | | 2 | | | | | 8 | 1 | | | 5 | 18 |
| නවසීලන්තය | | | | | | | | 1 | | | | | 1 |
| රොමේනියාව | | | | | | | | | | 1 | | | 1 |
| නෝර්වේ | 1 | | | | | 2 | | | | | 1 | | 4 |
| ඕමානය | | | | | | | | 1 | | | | | 1 |
| පකිස්ථානය | 5 | 9 | 3 | 7 | 4 | 1 | 9 | 10 | 1 | 6 | 1 | | 56 |
| පලස්තීනය | | 7 | | | | | | 4 | 1 | | | | 12 |
| කටාර් | | 1 | 1 | 3 | | | 1 | | | | | | 6 |
| රුසියාව | 7 | | 4 | | 3 | | 5 | 7 | 8 | | 1 | | 35 |
| සෞදිඅරාබිය | 10 | 3 | 1 | | | 5 | 7 | 6 | 13 | 7 | 2 | | 54 |
| සීෂෙල්ස් | | | | | 1 | | | | 5 | | | | 6 |
| දකුණු අප්‍රිකාව | | | | | | | | | 1 | | 2 | | 3 |
| ස්විට්සර්ලන්තය | 1 | 3 | | | 1 | 4 | 1 | 1 | | 1 | 2 | | 14 |
| තායිලන්තය | | | | | | | | | | 4 | | | 4 |
| තුර්කිය | | | | | | | | 1 | | | | 4 | 5 |
| එක්සත් අරාබි රාජධානිය | 5 | | | 5 | | | 1 | 1 | | 1 | 7 | | 20 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 7 | 3 | 17 | 11 | 5 | 3 | 17 | 35 | 24 | 14 | 13 | 8 | 157 |
| එක්සත් රාජධානිය | 26 | 1 | | 1 | 1 | 1 | 6 | 7 | | | | | 43 |
| වියට්නාමය | | | | | | | | | | | | | 0 |
| එකතුව | 110 | 64 | 97 | 85 | 57 | 36 | 123 | 152 | 164 | 87 | 62 | 25 | 1062 |

ජාතසත්තර සංවිධාන සඳහා පුහුණු වියා බලපත්‍ර 2019.01.01 සිට 2019.12.31

| | | |

# කොන්සියුලර් කටයුතු අංශය

## කොන්සියුලර් කටයුතු අංශය

### අ. හැඳින්වීම

කොන්සියුලර් කටයුතු අංශය යනු, 1981 අංක 04 දරන කොන්සියුලර් කාර්යයන් පිළිබඳ පනතට සහ 2006 අංක 18 දරන පනත් සංශෝධනයට අනුකූලව, එහි ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල, කොන්සාල් ජනරාල් කාර්යාල, නිර්වේතනික කොන්සාල් කාර්යාල මෙන්ම, ශ්‍රී ලංකාව සඳහා අක්ත ගන්වා ඇති විදේශ දූත මණ්ඩල හා දූත කාර්යාල සහ වෙනත් පළාත් පාලන ආයතන/බලධාරීන් හරහා, ශ්‍රී ලාංකිකයින්ට සහ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති විදේශ ගමන් බලපත්‍ර හිමියන් සඳහා විදේශ සම්බන්ධතා අමාත්‍යාංශයේ සහය ලබා දෙන ද්වාරයයි.

2. කොළඹ 01, සෙලින්කෝ මන්දිරයෙහි පිහිටි කොන්සියුලර් අංශය, ලේඛන සත්‍යාපන අංශය, නැවත සියරට පැමිණාවීමේ අංශය, වන්දි අංශය, මරණ අංශය සහ විවිධ කටයුතු අංශය යන අංශවලින් සමන්විත වේ.

3. රජයේ ප්‍රතිපත්තියට අනුව, සේවා ඩිජිටල්කරණය සහ යාපනය සහ මාතර ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල පිහිටුවීම තුළින් ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශයන්හි ද අවශ්‍යතාවයෙන් යුත් පුද්ගලයින්ට කාර්යක්ෂම හා ඵලදායී ලෙස සේවා ලබා දීමට කොන්සියුලර් කටයුතු අංශය උත්සාහ දරයි. දෙවැනි කලාපීය කොන්සියුලර් කාර්යාලය 2019 පෙබරවාරි 15 වැනි දින විදේශ කටයුතු හා මුදල් අමාත්‍යවරුන් අතින් විවෘත කරන ලදී.

### ආ. 2019 දී සිදුවූ ප්‍රධාන වර්ධනයන්

4. 2017 පෙබරවාරි 6 වැනි දින විද්‍යුත් ලේඛන සත්‍යාපන පද්ධතිය (e-DAS) විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් දියත් කරන ලද අතර, එය 2019 ජනවාරි 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විදේශයන්හි පිහිටි සියලුම ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධ කරන ලදී. මෙම පද්ධතිය මඟින් මාර්ගගත හමුවීම් සඳහා පහසුකම් සපයන අතර, ලේඛන සත්‍යාපනය සඳහා මුදලින් කෙරෙන ගෙවීම්වලට අමතරව ණය සහ හර කාඩ්පත් හරහා සිදුකෙරෙන ගෙවීම් භාර ගනී.

5. අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ද සහය ඇතිව, මෙම අමාත්‍යාංශය විසින් ත්‍රිකුණාමලය, දඹුල්ල, අනුරාධපුර, පුත්තලම, මන්නාරම හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවල දී ඒකාබද්ධ කොන්සියුලර් ජංගම සේවා පවත්වන ලදී. විදේශ රැකියා අමාත්‍යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා විදේශ රැකියා නියුක්ති කාර්යංශය, මෙම අමාත්‍යාංශයේ කොන්සියුලර් කටයුතු අංශයේ නියෝජිතයින් ද සමඟ එක්ව මෙම ඒකාබද්ධ කොන්සියුලර් ජංගම සේවා සඳහා සහභාගී විය.

6. මෙම අමාත්‍යාංශය, 'රට වෙනුවෙන් එකට සිටිමු' දේශීය වැඩසටහන යටතේ, අම්පාර, මඩකලපුව, මුලතිවු, මොණරාගල, දිවුලපිටිය හා යාපනය යන ප්‍රදේශවල පැවති ජංගම සේවාවලට සහභාගී විය. විදේශ කටයුතු ලේකම් රවිනාථ ආර්යසිංහ මහතා මෙම වැඩසටහන යටතේ දිවුලපිටියේ පැවති ජංගම සේවාවට සහභාගී වෙමින් අමාත්‍යාංශයේ ප්‍රදර්ශන කුටිය නැරඹීමට පැමිණි අතර, ජනාධිපතිතුමාගේ ප්‍රගති සමාලෝචන රැස්වීමට ද සහභාගී විය.

7. මෙම අමාත්‍යාංශය විසින් මාතලේ දී පැවති 'රාජ්‍ය සේවය ගමට ගෙන යන ජනතා සේවය' දේශීය වැඩසටහන යටතේ මෙන්ම, අනුරාධපුර හා යාපනයේ දී පැවති 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' වැඩසටහන යටතේ ද ජංගම සේවා පවත්වන ලදී.

8. මෙම දිස්ත්‍රික්ක සහ අසල්වැසි ප්‍රදේශවල පුද්ගලයන්ට සපයන ලද සේවාවන් අතරට, විදේශ රැකියා සහ අධ්‍යාපනික ලියකියවිලි සහතික කිරීම, විදේශවල අතරමං වී සිටින ශ්‍රී ලාංකිකයන්ගේ පවුල්වලට ආධාර කිරීම, විදේශීය ප්‍රදේශවල දී සිදුවන උපත්, විවාහ හා මරණ ලියාපදිංචි කිරීම,

වන්දි ලබාගැනීමේ කටයුතුවල දී ආධාර කිරීම, පොලිස් නිෂ්කාශන සහතික ලබා ගැනීමට සහය වීම යනාදිය අයත් විය.

9. 2019 සැප්තැම්බර් 18-20 දිනවල මැලේසියාවේ දී පැවති 'ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු අංශ සඳහා වන මෙහෙයුම් අත්පොත යාවත්කාලීන කිරීම' පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා මෙම අංශය පහසුකම් සැපයීය.

**ඇ. ලේඛන සත්‍යාපන අංශය**

10. ලේඛන සත්‍යාපන අංශය, නව්‍ය ඩිජිටල් තාක්ෂණය භාවිත කරමින් විද්‍යුත් ලේඛන සහතික කිරීමේ පද්ධතිය (e-DAS) හරහා ලේඛන සහතික කිරීම සිදුකරයි.

11. 2019 ජනවාරි 01 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලසීමාව තුළ දී ලේඛන සත්‍යාපන අංශයට ලැබී ඇති මුළු ආදායම දළ වශයෙන් රු. 237,706,000.00 ක් වූ අතර, එම කාලසීමාව තුළ දී සත්‍යාපනය කරන ලද ලේඛන සංඛ්‍යාව දළ වශයෙන් 312,563 ක් විය.

12. 2019 ජනවාරි 01 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලසීමාව තුළ දී යාපනයේ ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලයට ලැබී ඇති මුළු ආදායම දළ වශයෙන් රු. 14,345,000.00 ක් වූ අතර, එම කාලසීමාව තුළ දී සත්‍යාපනය කරන ලද ලේඛන සංඛ්‍යාව දළ වශයෙන් 17,419 ක් විය.

13. 2019 පෙබරවාරි 15 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලසීමාව තුළ දී මාතර ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලයට ලැබී ඇති මුළු ආදායම දළ වශයෙන් රු. 1,091,000.00 ක් වූ අතර, එම කාලසීමාව තුළ දී සත්‍යාපනය කරන ලද ලේඛන සංඛ්‍යාව දළ වශයෙන් 1,345 ක් විය.

**ඈ. නැවත සියරට පැමිණවීමේ අංශය**

14. විවිධ හේතූන් රාශියක් නිසා විදේශ රටවල අතරමංව සිටින සහ අසරණව සිටින ශ්‍රී ලාංකිකයන් පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම නැවත සියරට පැමිණවීමේ අංශය වෙත පවරා තිබේ.

15. විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වීමකින් තොරව රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය ශ්‍රී ලාංකිකයන් නැවත සියරට පැමිණවීම සඳහා මෙම අංශය පහසුකම් සපයයි. 2019 වසරේ දී, විදේශ දූත මණ්ඩල/දූත කාර්යාලවලට ඍජුවම ලැබී ඇති පැමිණිලිවලට අමතරව, නැවත සියරට පැමිණවීම සඳහා සහය ඉල්ලා ළඟම ඥාතීන් විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි 706 ක් මෙම අංශය වෙත ලැබී ඇත.

16. විදේශ රටවල දී බන්ධනාගාරගතව සිටින ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් ඔවුන්ගේ ළඟම ඥාතීන් හෝ අදාළ දූත මණ්ඩල/දූත කාර්යාල විසින් ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අනුව, ඔවුන් නැවත සියරට පැමිණවීම සඳහා මෙම අංශය විසින් පහසුකම් සලසනු ලැබේ.

17. අදාළ විදේශ දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව, මිනිස් ජාවාරමට ගොදුරු වූ 290 දෙනෙකු ආරක්ෂිතව ආපසු ගෙන්වා ගැනීමට මෙම අංශය සහාය විය.

18. මෙම අංශය, නැවත ඇතුළත්කර ගැනීමේ සිද්ධි කළමනාකරණ පද්ධතිය (RCMS) යටතේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරන අතර, 2019 ඔක්තෝබර් 16-17 දිනවල දී යුරෝපා සංගම් රටවල් සඳහා බ්‍රසල්ස් හි දී පැවති නව විද්‍යුත් නැවත ඇතුළත්කර ගැනීමේ සිද්ධි කළමනාකරණ පද්ධතිය (e-RCMS) පිළිබඳ පුහුණු වැඩමුලුවක් සඳහා සහය විය.

**ඉ. වන්දි අංශය**

19. විදේශවල දී මියයන සහ විවිධ හේතූන් නිසා සිය නීතිමය හිමිකම් ලබා නොගෙන සියරටට පැමිණෙන ශ්‍රී ලාංකිකයන්ගේ වන්දි, රක්ෂණ, සේවය අවසන් කිරීම/විශ්‍රාම යාම පිළිබඳ නඩු හා ගැටලු සම්බන්ධයෙන් මෙම අංශය කටයුතු කරයි.

20. 2019 වසර තුළ දී ආසන්න වශයෙන් පවුල්/චින්දිතයන් 162 ක ගේ වන්දි/රුධිර මුදල් හා වෙනත් හිඟ මුදල් සම්බන්ධ නඩු සමථයකට පත් කිරීම තුළින් ශ්‍රී.ලං.රු. මිලියන 394 ක මුදලක් අය කර ගෙන ඇත.

21. වන්දි ලබාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන, මියගිය අයගේ ළඟම ඥාතීන්ට සහ වෙනත් අයට, භාෂා පරිවර්තන ඇතුළුව, අවශ්‍ය ආකෘතියට අනුව ලිපිලේඛන භාරදීම සඳහා අවශ්‍ය කොන්සියුලර් සහය හා උපදෙස් ලබා දෙනු ලැබේ.

22. විදේශවල දී සිදුවන ශ්‍රී ලාංකිකයන්ගේ මිනීමැරුම් හෝ හදිසි අනතුරු ආශ්‍රිත මරණ අවස්ථාවල දී ඔවුන්ගේ ළඟම ඥාතීන්ට තම හිමිකම් සුරක්ෂිත කර දීම සඳහා පියවර ගනු ලැබේ.

23. විදේශයන්හි දී වැටුප්/වෙනත් හිඟ මුදල් නොගෙවීම සම්බන්ධයෙන් සංක්‍රමණික ශ්‍රමිකයන්ගෙන් ලැබෙන පැමිණිලි සඳහා අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා පහසුකම් සලසනු ලැබේ.

**ඊ. මරණ අංශය**

24. විදේශයක දී මරණයක් සිදුවූ අවස්ථාවක දී, එම මරණකරුගේ නීත්‍යානුකූල ළඟම ඥාතියා හඳුණාගැනීම සහ විදේශ දූත මණ්ඩළ හා අදාළ අනෙකුත් පාර්ශ්ව සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව හැකි ඉක්මනින් එම මෘත දේහය මෙරටට ගෙන්වා ගැනීම, භූමදාන කිරීම හෝ ආදාහනය කිරීම සඳහා පහසුකම් සැලසීම මෙම අංශයේ වගකීම වේ.

25. විශේෂයෙන්ම මෘත දේහය ලබාගැනීම සඳහා පාර්ශ්ව කිහිපයක්ම ඉල්ලීම් කරන අවස්ථාවක දී, කරුණු ප්‍රවේශමෙන් සලකා බලා නිවැරදි පාර්ශ්වය තීරණය කිරීමෙන් පසුව, එම මෘත දේහය නැවත මෙරටට ගෙන්වා ගැනීම, භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම සඳහා කටයුතු කරන ලෙස මෙම අංශය විදේශ දූත මණ්ඩල වෙත දන්වයි.

26. විදේශවල දී මියයන ශ්‍රී ලාංකිකයන්ගේ ළඟම ඥාතීන් සොයා ගැනීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් පුවත්පත් දැන්වීම් පළකරනු ලැබේ.

27. සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ දී කොන්සියුලර් ආධාර පතමින් මෙම අමාත්‍යාංශය වෙත මරණ 480 ක් පිළිබඳව දන්වන ලද අතර, සහාය ඉල්ලීමකින් තොරව මරණ 77 ක් පිළිබඳව විදේශ දූත මණ්ඩල වෙත දැනුම්දෙන ලදී.

28. මෙම මරණ අංශය, මරණ සිදු වූ අවස්ථාවල දී මරණ සහතික ලබාගැනීම සඳහා පහසුකම් සලසන අතර, විදේශ රැකියා නියුක්ති කාර්යාංශයෙන් රක්ෂණ ගෙවීම් ලබා ගැනීම සඳහා ද සහය වෙයි.

29. විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී නොමැති හෝ මෘතදේහය මෙරටට ගෙන්වාගැනීම, භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම සඳහා වන වියදම් දරා ගැනීම නොහැකි ශ්‍රී ලාංකිකයෙකුගේ මරණයක් විදේශයක දී සිදු වූ විට, මෙම අංශය ඔවුන්ට සහය ලබා දෙයි. ලෙබනනයේ සහ ඩුබායිහි සිටි ශ්‍රී ලාංකිකයන් දෙදෙනෙකුගේ මරණ සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය දළ වශයෙන් ශ්‍රී.ලං.රු. 388,853/- ක මුදලක් වැය කොට තිබේ.

30. 2019 වසරේ දී ඩුබායි හි දී හා ග්‍රීසියේ දී මියගිය ශ්‍රී ලාංකිකයන් 6 දෙනෙකුගේ ළඟම ඥාතීන් සොයා ගැනීම පිණිස පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා ශ්‍රී.ලං.රු. 145,293/- මුදලක් වැය කරන ලදී.

ඇමුණුම I - රජයේ වියදම්

ඇමුණුම II - 2019 දී වාර්තා වූ මරණ සංඛ්‍යාව

## ළ. විවිධ කටයුතු අංශය

31. විදේශවල සිටින ශ්‍රී ලාංකිකයන්ගේ, කොන්සියුලර් අංශයේ අනෙකුත් අංශ යටතට නොගැනෙන කොන්සියුලර් සහාය සඳහා වන ඉල්ලීම් සම්බන්ධයෙන් මෙම අංශය මූලික වශයෙන් කටයුතු කරයි.

32. සමාලෝචනයට ලක්වන කාලසීමාව ඇතුළත දී, විදේශයන්හි දී හෝ ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු සීමාවෙන් පිටත දී අත්අඩංගුවට පත් වූ ධීවරයන් හා ධීවර යාත්‍රා සිද්ධි 107 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලද අතර, එම ධීවරයන් හා ධීවර යාත්‍රා මුදා ගැනීම සඳහා සහය ලබා දෙන ලදී.

33. ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම (HNRA) ක්‍රියාත්මක කිරීම පිළිබඳ ආංශික කමිටුව සඳහා, දූත මණ්ඩලවලින් ලබාගත් ලියාපදිංචි නොවූ සංක්‍රමණික ශ්‍රමිකයන් පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව මෙම අංශය මඟින් සකස් කරනු ලැබේ.

34. ශ්‍රී ලාංකිකයන් වාසය කළ හා සේවය කළ විදේශ රටවල් විසින් නිකුත් කරනු ලබන පොලිස් නිෂ්කාශන සහතික ලබාගැනීම සඳහා මෙම අංශය පහසුකම් සපයයි. මෙතෙක් අයදුම්කරුවන් වෙත භාර දී ඇති මුළු පොලිස් නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව 308 කි.

35. "ජනපතිට කියන්න" දුක්ගැනවිලි කළමනාකරණ වැඩසටහන යටතේ මෙම අංශය වෙත පැමිණිලි 25 ක් ලැබී ඇති අතර, එම දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.

36. තවද, ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන් සහ විදේශගත සිසු සිසුවියන් හා වෘත්තිකයන් සඳහා අනෙකුත් අංශවල විෂය පථයට ඇතුළත් නොවන කොන්සියුලර් සහය සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීම් 209 ක් පිළිබඳව මෙම අංශය විසින් කටයුතු කරන ලදී.

37. විදේශයන්හි දී උපත ලබන ළමුන් සඳහා උප්පැන්න සහතික නිකුත් කිරීමට මෙම අංශය පහසුකම් සපයන අතර, මේ පිළිබඳව ලැබුණු පැමිණිලි 80 ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත. විදේශවල දී ශ්‍රී ලාංකික පුරවැසියන් හට ලැබුණු දරුවන්ගේ උප්පැන්න සහතික 904 ක් ලබා දී තිබේ.

38. විදේශයන්හි දී අතුරුදන් වූ ඥාතීන් සිටිනා ස්ථාන පිළිබඳ කරන ලද පැමිණිලි 18 ක් සම්බන්ධයෙන් මෙම අංශය කටයුතු කරන ලදී.

39. විදේශ දූත මණ්ඩලවලින් ලැබුණු පුරවැසි සහතිකපත් 08 ක් අයදුම්කරුවන් වෙත ලබා දෙන ලද අතර, පැමිණිලි 18 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.

40. විදේශයන්හි දරුකමට හදාගත් අයගේ ජීව විද්‍යාත්මක/ස්වාභාවික දෙමව්පියන් පිළිබඳ තොරතුරු සඳහා වන ඉල්ලීම් සහ ඒ හා සමාන වෙනත් ඉල්ලීම් (දෙකක්) විදේශවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලින් මෙම අංශය වෙත ලැබුණු පසුව ඒ පිළිබඳව කටයුතු කරන ලදී.

**2019 ජනවාරි 01 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා ලබාදුන් කොන්සියුලර් සහය පිළිබඳ විස්තර**

| | |
|---|---|
| මුළු ලිපිලේඛන සංඛ්‍යාව | 331,327 |
| ලැබුණු මුළු මුදල් ප්‍රමාණය (සත්‍යාපනය) (රු.) | 253,1421,000 |
| වාර්තා වූ මරණ සංඛ්‍යාව | 480 |
| නැවත ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගන්නා ලෙස කරන ලද ඉල්ලීම් (සාමාන්‍ය සිදුවීම්) | 522 |
| නැවත සියරට පමුණුවන ලද සංඛ්‍යාව (සාමාන්‍ය) | 208 |
| නිකුත් කරන ලද පොලිස් නිෂ්කාශණ වාර්තා සංඛ්‍යාව | 246 |
| ඉදිරියට සම්ප්‍රේෂණය කිරීම සඳහා විදේශවල ශ්‍රී ලංකා දූත මණ්ඩලවලින් ලැබුණු අධ්‍යාපන සහතික සංඛ්‍යාව | 10 |
| විදේශ ගමන් බලපත්‍රවලට අදාළ කරුණු | 25 |
| උප්පැන්න ලියාපදිංචි කිරීම සඳහා වූ පැමිණිලි සංඛ්‍යාව | 80 |
| ප්‍රතිලාභ ලත් පවුල් සංඛ්‍යාව (වන්දි) | 162 |
| විදේශීය විශ්වවිද්‍යාල සහතික පත්‍ර සත්‍යාපනය | 240 |
| ගෙවන ලද මුළු වන්දි මුදල් (රු.) | 394,546,513.56 |
| විවිධ විමර්ශන (ලිඛිත) | 230 |
| සියරට පමුණුවන ලද ශ්‍රී ලාංකික ධීවරයින් සංඛ්‍යාව | 102 |
| කටයුතු කරන ලද විදේශීය පොලිස් නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව | 308 |
| මරණ දඩුවම් ලබාදීමේ සිද්ධීන් 21 කින් සියරට පැමිණ වූ සංඛ්‍යාව | 02 |
| විදේශවල දී සිදු වූ උප්පැන්න ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව | 904 |

**මානව දේහයන් භූමදානය හෝ ආදාහනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් කරන ලද ගෙවීම්**
**2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා**

| අංකය | මියගිය අයගේ නම | විදේශ ගමන් බලපත්‍ර අංකය | මරණයට හේතුව | මියගිය දිනය | දූත මණ්ඩලය | වියදම | | තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ශ්‍රී ලංකා රුපියල් | ඇ.එ.ජ. ඩොලර් | |
| 1 | වයි. ආර්. සීලවතී මහත්මිය | N3979238 | රෝගී වීමෙන් | 2019.01.22 | ලෙබනන් | 143,000 | 800.00 | භූමදාන කරන ලදී. |
| 2 | ලින්ඩා ප්‍රනාන්දු මහත්මිය | N4589257 | රෝගී වීමෙන් | 2019.05.10 | ඩුබායි | 245,853 | 1,389.00 | භූමදාන කරන ලදී. |
| | **එකතුව** | | | | | **388,853** | **2,189.00** | |

## 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා වාර්තා වූ මරණ සංඛ්‍යාව

| අංකය | දූත මණ්ඩලය | මරණ සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අබුඩාබි | 12 |
| 2 | ඕස්ට්‍රේලියාව | 8 |
| 3 | බහරේන් | 2 |
| 4 | බ්‍රසීලය | 2 |
| 5 | බෙල්ජියම | 1 |
| 6 | කාම්බෝජය | 1 |
| 7 | චීනය | 5 |
| 8 | සයිප්‍රසය | 1 |
| 9 | කැනඩාව | 2 |
| 10 | කියුබාව | 1 |
| 11 | ඩුබායි | 31 |
| 12 | ප්‍රංශය | 8 |
| 13 | ගැම්බියාව | 1 |
| 14 | ජර්මනිය | 6 |
| 15 | ග්‍රීසිය | 1 |
| 16 | ඉන්දියාව | 12 |
| 17 | ඉන්දුනීසියාව | 2 |
| 18 | ඉරාකය | 1 |
| 19 | ඊශ්‍රායෙලය | 2 |
| 20 | ඉතාලිය | 24 |
| 21 | ජපානය | 13 |
| 22 | ජෝර්දානය | 10 |
| 23 | සෞදි අරාබිය | 111 |
| 24 | කෙන්යාව | 1 |
| 25 | දකුණු කොරියාව | 10 |
| 26 | කුවේට් | 76 |
| 27 | ලෙබනනය | 17 |
| 28 | මැලේසියාව | 19 |
| 29 | මාලදිවයින | 7 |
| 30 | මැඩගස්කරය | 1 |
| 31 | මොරිෂස් | 1 |
| 32 | මියන්මාරය | 1 |
| 33 | ඕමාන් | 14 |
| 34 | කටාර් | 49 |
| 35 | රුමේනියාව | 1 |
| 36 | රුසියාව | 3 |
| 37 | සිංගප්පූරුව | 1 |
| 38 | ටිමෝර් | 1 |
| 39 | තුර්කිය | 1 |
| 40 | තායිලන්තය | 4 |
| 41 | වියට්නාමය | 1 |
| 43 | ස්වීඩනය | 1 |
| 44 | එක්සත් රාජධානිය | 8 |
| 45 | එක්සත් ජනපදය | 5 |
| 46 | නවසීලන්තය | 1 |
| මුළු ගණන | | 480 |

# නීති අංශය

## නීති අංශය

### නීති අංශයේ කාර්යය කටයුතු වල ප්‍රධාන අංශ පිළිබඳ පොදු විස්තරය

විදේශ සබඳතා අමාත්‍යාංශයේ නීති අංශය 1967 දී පිහිටුවන ලදී. නීති අංශයේ කාර්යය වනුයේ අමාත්‍යාංශයේ ලේකම් හරහා අමාත්‍යවරයාට, විදේශ සබඳතා අමාත්‍යාංශයේ අනෙකුත් අංශ, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩලවලට මෙන්ම වෙනත් අමාත්‍යාංශවලට ජාත්‍යන්තර නීතිය පිළිබඳ නීති උපදෙස් ලබා දීමයි. නීති අංශය, ශ්‍රී ලංකා රජයේ ගිවිසුම් තැන්පත්ගාරය ද වෙයි.

### මෙම අංශය විසින් උපදෙස් ලබාදෙන ප්‍රධාන විෂය ක්ෂේත්‍ර

සියලුම ප්‍රතිපත්ති තීරණවල නෛතික ස්වරූපයන් සම්බන්ධයෙන් නීති අංශය මඟින් උපදෙස් ලබාදෙන අතර විශේෂයෙන්ම දේශ භූමි අයිතීන් හා සීමා මායිම්, ගිවිසුම් සබඳතා හඳුනාගැනීම, රාජතාන්ත්‍රික මුක්තීන් හා වරප්‍රසාද සම්බන්ධයෙන් කාලයෙන් කාලයට පැන නඟින ජාත්‍යන්තර ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරයි.

නාවික කටයුතු, සිවිල් ගුවන් සේවා, ජාත්‍යන්තර වෙළඳාම, ආයෝජනය, සංචාර හා විගමනය ආදී පුළුල් පරාසයක විෂයන් ආවරණය කරමින් විදේශ ගනුදෙනුවල නියැලෙන අනෙකුත් සෑම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ජාත්‍යන්තර නීතියට අදාළව කරුණු සම්බන්ධයෙන් නීති අංශය විසින් උපදෙස් ලබාදෙයි. තවද උද්ර්පණය, අපරාධ සිවිල් හා වාණිජ කටයුතුවලදී අන්‍යොන්‍ය නීති ආධාර ලබා දීම, ද්විත්ව බදුකරණය වළක්වාගැනීම, ආයෝජනය, ආරක්ෂණය හා ප්‍රවර්ධනය, සිරකරුවන් හුවමාරු කරගැනීම, නැවත භාරගැනීම, සංක්‍රමණය, කම්කරු හා මිනිස් බලය හා සාගර නීතිය ආදිය සම්බන්ධයෙන් අධිකරණ සහයෝගීතා ගිවිසුම්වලට අදාළ සාකච්ඡා සඳහා කැඳවීම, සාකච්ඡා පැවැත්වීම හා ගිවිසුම්වල කටයුතු අවසන් කිරීමට අදාළ කටයුතුවල නියැලේ.

ශ්‍රී ලංකා විදේශ සේවයට අදාළ අමාත්‍යාංශයේ උපදෙස් මාලාව අර්ථකථනය කිරීම, විදේශවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් එළඹී ගිවිසුම් හා එකඟතාවන්, අපගේ දූත මණ්ඩල විසින් දේශීය කම්කරුවන් බඳවා ගැනීම, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල හා ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩලවල රාජ්‍යතාන්ත්‍රික හා කොන්සියුලර් වරප්‍රසාද හා මුක්තීන් ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් මෙම අංශයෙන් උපදෙස් ලබාගැනෙන විෂය ක්ෂේත්‍ර කිහිපයකි.

විදේශ සබඳතා අමාත්‍යාංශයේ තොරතුරු දැන ගැනීමේ පනත සම්බන්ධයෙන් නීති අංශය කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කරන අතර 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කරයි.

### සාගර නීතිය/ මහද්විපික තටක පිළිබඳ ශ්‍රී ලංකාවේ කරුණු ඉදිරිපත් කිරීම

1. මහද්විපික තටක සීමානිර්ණය පිළිබඳ කොමිෂන් සභාව (CLCS) 2009 මැයි 8 වන දින සිදුකරන ලද මහද්විපික තටකය පිළිබඳ ශ්‍රී ලංකාවේ කරුණු ඉදිරිපත් කිරීම සලකා බැලීම සඳහා අනුකමිටුවක් පත් කරන ලදී. මෙම ඉදිරිපත් කිරීම තහවුරු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වී ඇති අතර උප කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා නියෝජිතයින් සමඟ සාකච්ඡා වට 9ක් පවත්වා තිබේ. විදේශ සබඳතා අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ජාතික සාගර කටයුතු කමිටුව (NOAC) සිදු කිරීමට ඇති කටයුතු අවසන් කිරීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ මෙන්ම නීති අංශය සමඟ අඛණ්ඩව කටයුතු කරමින් සිටියි

2. ජාතික අධිකරණ බලසීමාවෙන් ඔබ්බට වූ ප්‍රදේශවල සමුද්‍රිය පෙව විවිධත්වය පිළිබඳ සම්මුතියක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා පැවැත්වූ 2 වන සහ 3 වන අන්තර් රාජ්‍ය සම්මන්ත්‍රණාවලදී නීති අංශය ශ්‍රී ලංකා රජය නියෝජනය කළ අතර එහිදී, ශ්‍රී ලංකාවේ ස්ථාවරය තහවුරු කළේය.

**ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතින්ගේ සම්මුතිය (UNCITRAL)**

ආයෝජක රාජ්‍ය ආරවුල් නිරවුල් කිරීම පිළිබඳ ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතින්ගේ සම්මුතියේ III වන ක්‍රියාකාරී කණ්ඩායම (ISDS)ට සහභාගි වූ අතර 37 වන සැසියේදී බේරුම්කරණ යාන්ත්‍රණයේ ප්‍රතිසංස්කරණ විකල්පයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ස්ථාවරය තහවුරු කරන ලදී

**ආයෝජන ප්‍රවර්ධන හා අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂා කිරීම පිළිබඳ ගිවිසුම**

**තුර්කිය සමඟ ආයෝජන  ප්‍රවර්ධනය හා සුරක්ෂා කිරීමේ ගිවිසුම**

කෙටිසන යොදන ලද පාඨය පිළිබඳ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කළ අතර අත්සන් තැබීමට පෙර ආදර්ශ ආයෝජන ප්‍රවර්ධන හා සුරක්ෂා කිරීමේ ගිවිසුම සැකසීමෙන් පසුව මෙම පාඨය සමාලෝචනය කිරීමට තීරණය කරන ලදී.

**බෙලාරුස් සමඟ ආයෝජන ප්‍රවර්ධන හා සුරක්ෂාකිරීමේ ගිවිසුම**

අර්ධ වශයෙන් සාකච්ඡා කරන ලද පාඨය පිළිබඳ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වූ අතර බෙලාරුස් සමඟ ඊළඟ සාකච්ඡා වටය පැවැත්වීමට පෙර, ආදර්ශ ආයෝජන ප්‍රවර්ධන හා සුරක්ෂා කිරීමේ ගිවිසුම සැකසීමෙන් පසුව මෙම පාඨය සමාලෝචනය කිරීමට තීරණය කරන ලදී.

**එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමඟ ආයෝජන ප්‍රවර්ධන හා සුරක්ෂා කිරීමේ ගිවිසුම**

අර්ධ වශයෙන් සාකච්ඡා කරන ලද පාඨය පිළිබඳව පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වූ අතර එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමඟ සාකච්ඡා පැවැත් වීමට පෙර, ආදර්ශ ආයෝජන ප්‍රවර්ධන හා සුරක්ෂා කිරීමේ ගිවිසුම සැකසීමෙන් පසුව මෙම පාඨය සමාලෝචනය කිරීමට තීරණය කරන ලදී.

**අන්තර් අමාත්‍ය කමිටුව**

නව ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුමක් සකස් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ, ආයෝජන මණ්ඩලයේ, කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ සහ විදේශ සබඳතා අමාත්‍යාංශයේ නීති හා ආර්ථික කටයුතු අංශවල නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා වැඩ ආරම්භ කරන ලදී.

**නිදහස් වෙළඳ ගිවිසුම (FTA) පිළිබඳ සාකච්ඡාව**

ඉන්දියාව (ETCA) තායිලන්ත සහ චීනය සමඟ ආයෝජන පරිච්ඡේද සාකච්ඡා කිරීමෙහි විදේශ සබඳතා අමාත්‍යාංශයේ නීති අංශයේ නියැලී සිටියි.

**ශ්‍රී ලංකා/ සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)**

හිටපු ජනාධිපතිවරයා විසින් පත් කරන ලද කමිටුව විසින් කරන ලද නිර්දේශ මත පදනම්ව, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබූ ස්ථාවර කමිටුවක් විසින් ගිවිසුම් පාඨය සමාලෝචනය කරන ලදී. මෙම සමාලෝචන ක්‍රියාවලිය සඳහා නීති අංශය ක්‍රියාකාරී සහභාගිත්වයක් ලබා දී තිබේ.

**ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)**

නීති අංශය, ආයෝජන පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ 5වන රැස්වීමේ මුලසුන දැරූ අතර ආයෝජන පිළිබඳ රාමු ගිවිසුම සමාලෝචනය කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

**ඉන්දියාව සමඟ ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුම(ETCA)**

11 වන සාකච්ඡා වටයට අනුකූලව, නීති අංශය ජාතික වෙළඳ කමිටු (NTC) රැස්වීමට විසඳීමට ඇති කාරණා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරය සකසා අවසන් කිරීම සඳහා යෙදවුම් ලබා දෙන ලදී.

**ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA)**

මෙම නියෝජිතායතනය සඳහා සීමිත වරප්‍රසාද සහ විනිර්මුක්තීන් ලබාදීම සඳහා සාකච්ඡා කරන ලදී.

**එක්සත් ජාතීන්ගේ විශේෂිත නියෝජිතායතන සහ වෙනත් ජාත්‍යන්තර සංවිධාන සමඟ තත්ත්ව ගිවිසුම්**

**හරිත දේශගුණය-**

ශ්‍රී ලංකාවේ ස්ථාවරය පිළිබඳව එකඟ වීම සඳහා පාර්ශවකරුවන්ගේ රැස්වීම් කිහිපයක් පවත්වන ලද අතර වගන්ති දෙකක් හැර පාඨයේ ඉතිරි කොටස පිළිබඳව වැඩකටයුතු අවසන් කරන ලදී.

**කෘෂි වනාත්තර පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය (ICRAF)**

පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ගිවිසුම් පාඨයේ වැඩ කටයුතු අවසන් කර ඇත.

**ඒජන්ස් ප්‍රැන්කයිස් ඩිවලොප්මන්ට් (AFC)**

ඒජන්ස් ප්‍රැන්කයිස් ඩිවලොප්මන්ට් (AFC) ශ්‍රී ලංකාවේ පිහිටුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ ප්‍රංශය අතර ඇති කර ගත් ගිවිසුම පිළිබඳ කටයුතු නීති අංශය විසින් හමාර කර තිබේ.

**එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවලි (UNSCRs) ක්‍රියාත්මක කිරීම සහ විදේශ ත්‍රස්ත සටන්කරුවන් (FTF) සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදය මැඩ පැවැත්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවලිය (CVE) ප්‍රකාශයට පත්කිරීම**

විදේශීය ත්‍රස්ත සටන්කරුවන් සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදය මැඩපැවැත්වීම පිළිබඳ ශ්‍රී ලංකාව විසින් අනුගමනය කළ යුතු ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියා පටිපාටින් සම්බන්ධ පිළිබඳව නීති අංශය දායකත්වය ලබාදී ඇති අතර, ජාතික හා ජාත්‍යන්තර විශේෂඥයින් සමඟ බොහෝ සංසදවලදී කටයුතු වල නියැලී තිබේ. බොහෝ ජාත්‍යන්තර සංවිධාන සහ ඕස්ට්‍රේලියාව සහ එක්සත් රාජධානිය ඇතුළු රටවල් විසින් සහාය ලබාදෙන බවට ප්‍රතිඥා ලබාදෙන ලදී.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවලිය 1373 සහ ඊට අදාළ අනෙක් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කර ඇති රෙගුලාසි යටතේ ත්‍රස්තවාදීන් සහ ත්‍රස්ත සංවිධාන ලැයිස්තුගත කිරීමේදී ද දායකත්වය ලබාදුනි.

**ජාත්‍යන්තර ත්‍රස්තවාදය**

ඉලක්කගත මූල්‍ය සම්බාධක පිළිබඳ ඉහළ මට්ටමේ අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණ කමිටුවේ පළමු රැස්වීමේහි හිටපු ගරු. විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සභාපතිත්වය ඉසිලූ අතර කමිටුවේ නිර්නේය විෂය සම්මත කරන ලදී.

ප්‍රචණ්ඩකාරී අන්තවාදීන් පුනරුත්ථාපනය කිරීම හා නැවත සමාජගත කිරීම තුළින් ප්‍රචණ්ඩකාරී අන්තවාදය වැළැක්වීම පිළිබඳ කලාපීය වැඩමුළුව නීති අංශය විසින් සංවිධානය කරන ලදී.

### උපායමාර්ගික වෙළඳ පාලන ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික කමිටුව

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවලිය 1540 ට අනුකූලව ශ්‍රී ලංකාවේ උපායමාර්ගික වෙළඳ පාලන ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික කමිටුවේ සාමාජිකයෙකු ලෙස නීති අංශය දායකත්වය ලබාදෙයි. 2019 ඔක්තෝම්බර් මාසයේ කැන්බරා හි පැවති ඒපීපී සම්මේලනයට නීති අංශය දායකත්වය ලබාදුණි.

### සංක්‍රමණය

2019 ඔක්තොම්බර් 11 වන දින කැන්බරා හි පැවති මිනිස් ජාවාරම සහ දේශ සීමා ඉක්මවමින් සිදුකරන වෙනත් සංවිධානාත්මක අපරාධ පිළිබඳ හයවන ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමට (JWG) නීති අංශය සහභාගි වී දායකත්වය ලබාදුනි.

ශ්‍රී ලංකාව සහ ස්විස්ටර්ලන්තය අතර සංක්‍රමණික හවුල්කාරිත්වය පිළිබඳ අවබෝධතා ගිවිසුම යටතේ විශේෂඥයින්ගේ පළමු රැස්වීම 2019 සැප්තැම්බර් මාසයේදී සංවිධානය කරන ලදී. කම්කරු, වෘත්තීය පුහුණුව, කලාපීය උපදේශන ක්‍රියාවලිය සහ සාමය ගොඩනැගීම හා ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය ඇතුළු කරුණු ගණනාවක් පිළිබඳව මෙහිදී අවධානය යොමු කරන ලදී.

### නැවත භාරගැනීම

ජෝර්පියාව සමඟ නැවත භාරගැනීමේ කෙටුම්පත් ගිවිසුමක් පිළිබඳ සාකච්ඡා අවසන් වූ අතර අත්සන් තැබීම සඳහා රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ එහි කටයුතු අවසන් කරන ලදි. බෙනලක්ස් රටවල්, ප්‍රංශය සහ ඉතාලිය වෙනුවෙන් නෙදර්ලන්තය සමඟ යුරෝපා සංගම්/ශ්‍රී ලංකා නැවත භාර ගැනීමේ ගිවිසුම සඳහා වන සන්ධානවල කටයුතු අවසන් කිරීම සඳහා වූ සාකච්ඡා,"වැරදියට නැවත භාරගැනීමකට අදාලව සුදුසු වගන්තියක් සම්බන්ධයෙන් එකඟතාවයට පත්වීමට යටත්ව පවත්වන ලදී." යුරෝපා සංගම්/ශ්‍රී ලංකා නැවත භාරගැනීමේ ගිවිසුම යටතේ පස්වන ඒකාබද්ධ නැවත භාරගැනීමේ කමිටු රැස්වීම සඳහා කටයුතු සම්බන්ධීකරණය කර 2019 මාර්තු මාසයේදී කොළඹ දී පවත්වන ලදි.

### සිරකරුවන් මාරු කිරීමේ ගිවිසුම

චෙක් ජනරජය සහ ශ්‍රී ලංකාව අතර වැරදිකරුවන් මාරු කිරීමේ ගිවිසුමේ පළමු වටයේ විශේෂඥ සාකච්ඡා 2019 මැයි මාසයේදී පවත්වන ලදී.

### බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානය (BIMSTEC)

2019 ඔක්තොම්බර් 10-11 දින වලදී කොළඹ දී පැවති බිම්ස්ටෙක් නිත්‍ය ක්‍රියාකාරී කමිටුවේ දෙවන රැස්වීමේදී නිරීක්ෂණ ලබාදීමෙන් නීති අංශය මැදිහත් විය. මෙම රැස්වීම, බිම්ස්ටෙක් ප්‍රඥප්තියේ හා බිම්ස්ටෙක් ලේකම් කාර්යාලය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර අවබෝධතා ගිවිසුමේ වැඩ කටයුතු අවසන් කිරීම පිළිබඳ සාකච්ඡා පැවැත්වීම සහ බිම්ස්ටෙක් හි අංශ සහ උප අංශ සමාලෝචනය සහ තාර්කිකරණය කිරීම සඳහා විය.

### ජාත්‍යන්තර මානුෂීය නීතිමය කරුණු

ආසියාවේ ජාත්‍යන්තර මානුෂීය නීති ජාතික කමිටුව සඳහා විශේෂඥවරුන් හුවමාරු රැස්වීම 2019 දෙසැම්බර් 15 වන දින බංගලාදේශයේ ඩකා නුවරදී පැවැත්විණි. ඉහත රැස්වීමට නීති අංශය සහභාගී වී ඇත.

2019 නොවැම්බර් 11 සිට 13 දක්වා ශ්‍රී ලංකාවේ පැවති ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ 9වන දකුණු ආසියානු කලාපීය සමුළුව, නීති අංශය විසින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) සමඟ එක්ව ශ්‍රී ලංකාවේ දී සංවිධානය කරන ලදී.

### ආසියානු අප්‍රිකානු නීති උපදේශන සංවිධානය (AALCO)

ආසියානු-අප්‍රිකානු නීති උපදේශන සංවිධානයේ පනස් අටවන වාර්ෂික සැසිය 2019 ඔක්තොම්බර් 21 සිට 25 දක්වා ටැන්සානියාවේදී පැවැත්විණි. ඉහත සැසිවාරයට නීති අංශය, නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සහභාගි වූ අතර එහිදී සාකච්ඡා කළ කරුණු වලට අදාළව ශ්‍රී ලංකාවේ බලපැවැත්වෙන නීති පිළිබඳව අවධාරණය කරන ලදී.

### තොරතුරු දැනගැනීමේ අයිතියට අදාළ ගැටලු

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ලද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් අයදුම්පත් 58 කට අදාළව 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විවිධ තොරතුරු සපයන ලදී.

### ද්විත්ව බදුකරණය වැලැක්වීමේ සහ මූල්‍ය මගහැරීම වැළැක්වීම පිළිබඳ ගිවිසුම (DTA)

### (අ) ශ්‍රී ලංකාව සහ මාලදිවයින

ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර මූල්‍ය මඟ හැරීම් වැළැක්වීමේ ගිවිසුම පිළිබඳ පළමු වටයේ සාකච්ඡා 2019 ජූලි 15 සිට 19 දක්වා කොළඹ දී පැවති අතර සාකච්ඡාවලදි නීති අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

### (ආ) ශ්‍රී ලංකාව හා හංගේරියාව

ශ්‍රී ලංකාව සහ හංගේරියාව අතර මූල්‍ය මඟහැරීම් වැලැක්වීමේ හා සම්බන්ධ ගිවිසුම සාකච්ඡා 2019 මැයි මාසයේදී කොළඹ දී පැවැත්විණි. මෙම සාකච්ඡා පැවැත්වීම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී.

### ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා අත්සන් තබන ලද ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්

| ගිවිසුමේ /අවබෝධතා ගිවිසුමේ නම | රට | අත්සන් තැබූ දිනය |
|---|---|---|
| වීසා බලපත්‍ර ලබාගැනීමෙන් නිදහස් කිරීමේ කරුණු | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මාලදිවයින ජනරජය අතර වීසා බලපත්‍ර පහසුකම් සැලසීම පිළිබඳ ගිවිසුම | මාලදිවයින | 2019. 09. 02 |
| අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ පිලිපීන ජනරජයේ උසස් අධ්‍යාපන කොමිෂන් සභාව අතර උසස් අධ්‍යාපනයේ අධ්‍යයන සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම | පිලිපීනය | 2019. 01. 16 |
| රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම | | |

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ගැම්බියා ජන රජය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ ගිවිසුම | ගැම්බියාව | 2019.05.10 |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ශාන්ත ලුසියා අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ ගිවිසුම | ශාන්ත ලුසියා | 2019. 07. 25 |
| දේශපාලන උපදේශනය ස්ථාපනය කිරීම | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ශාන්ත ලුසියා අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කිරීම පිළිබඳ ගිවිසුම | ශාන්ත ලුසියා | 2019.06.25 |
| ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ බාබඩෝස් අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ ගිවිසුම | බාබඩෝස් | 2019. 06. 28 |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ නිකරගුවා ජනරජය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය | නිකරගුවාව | 2019. 11.06 |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ පෝලන්ත ජනරජයේ විදේශ අමාත්‍යාංශය කටයුතු අතර දේශපාලන උපදේශන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම | පෝලන්තය | 2019. 11.06 |
| ද්විපාර්ශ්වික උපදේශන | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ කාම්බෝජ රාජධානියේ විදේශ කටයුතු හා ජාත්‍යන්තර සහයෝගිතා අමාත්‍යාංශය අතර ද්විපාර්ශ්වික උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුම | කාම්බෝජය | 2019. 08. 18 |
| ආරක්ෂක සහයෝගිතාව | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක අමාත්‍යාංශය සහ පිලිපීනයේ ජනරජයේ ජාතික ආරක්ෂක දෙපාර්තමේන්තුව අතර ආරක්ෂක හා හමුදා අධ්‍යාපනය සහ පුහුණුව සහ ආරක්ෂක හා හමුදා නියෝජිත කණ්ඩායම් හුවමාරුව පිළිබඳ අවබෝධතා ගිවිසුම | පිලිපීනය | 2019. 01. 16 |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක අමාත්‍යාංශය සහ මහජන චීන සමූහාණ්ඩුවේ ජාතික ආරක්ෂක අමාත්‍යාංශය අතර චීනය විසින් ශ්‍රී ලංකාවට හමුදා ආධාර ප්‍රදානය කිරීම පිළිබඳ සන්ධානය | චීනය | 2019. 05. 14 |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක අමාත්‍යාංශය සහ රුසියානු සමූහාණ්ඩුවේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය අතර සංස්ථා පිළිබඳ ගිවිසුම | රුසියානු සමූහාණ්ඩුව | 2019. 10. 23 |

# සාමාන්‍ය පාලන අංශය

## සාමාන්‍ය පාලන අංශය

### අ.හැඳින්වීම

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සහ දූත මණ්ඩල සේවක සංඛ්‍යාව හැරුණු විට අමාත්‍යාංශයේ පිරිස් පරිපාලනය සම්බන්ධ සියලු කටයුතු සඳහා වගකීම දරනු ලබන්නේ සාමාන්‍ය පාලන අංශය විසිනි. මෙම අංශය, වසර පුරා විවිධ මානව සම්පත් සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ.

ඉහත කරුණු හැරුණු විට, කාර්යාල පරිශ්‍ර සහ නිල නිවාස නඩත්තු කිරීම අමාත්‍යාංශයට සහ විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන කිරීම ගබඩා සහ වත්කම් භාණ්ඩ ලේඛන පාලනය නඩත්තු කිරීමට සැපයුම් සහ අමාත්‍යාංශය අයත් වාහන සමූහය කළමණාකරණය සහ උපයෝගිතා සේවා සැපයීමට අදාළ කටයුතු සිදුකරයි.

පාර්ලිමේන්තු හා කැබිනට් කටයුතු ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතන සමග ලිපි හුවමාරුව ද මෙම අංශය විසින් මෙහෙයවනු ලැබේ. මානව සම්පත්, ප්‍රසම්පාදනය, නඩත්තු කටයුතු, භාෂා පරිවර්තන කටයුතු, ප්‍රවාහන කටයුතු ලිපි බෙදාහැරීම, පුස්තකාලය, ලේඛනාගාරය සහ ගබඩාව මෙම සාමාන්‍ය පරිපාලන අංශය යටතට ගැනේ.

### ආ. මානව සම්පත් කළමනාකරණය

මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් ගත් කල, ආයතනික අරමුණු සපුරාලීම සඳහා අමාත්‍යාංශයේ සීමිත මානව සම්පත්වල ප්‍රශස්ත උපයෝගීතාව වැඩි දියුණු කිරීමට මෙම අංශය විසින් පහසුකම් සලසන ලදී. ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ හා මානව සම්පත් අංශය සමග එක්ව හා අනෙකුත් සියලුම අංශ සමග සාකච්ඡා කරමින් සාමාන්‍ය පාලන අංශය විසින් ආරම්භ කරන ලද අමාත්‍යාංශයේ සංවිධානාත්මක සැලැස්ම ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන මගින් සංවිධාන ව්‍යුහය හා ධූරාවලියෙහි එක් එක් ස්ථරවල පවතින සේවක සංඛ්‍යා පුනර්ජීවනය කිරීමේ අවශ්‍යතාවය ද අමාත්‍යාංශයීය විශේෂ අවශ්‍යතා සපුරාලීම සඳහා ඇතැම් ආයතනික තනතුරු නැවත හඳුන්වාදීමේ අවශ්‍යතාව ද පෙන්වා දී තිබේ. 2012 සිට පුළුල් මානව සම්පත් ප්‍රතිසංස්කරණ නොතිබූ හෙයින් ආයතනික මානව සම්පත සීමා සහිත සංඛ්‍යා වලින් පැවතීම හේතුවෙන්, ජාත්‍යන්තර කටයුතුවල ගතිකතාවයන් සපුරාලීම සම්බන්ධයෙන් සැලකිය යුතු පීඩනයක් හටගෙන ඇති බව සැලකිය යුතු කරුණකි. 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමේ දැක්ම ඇතිව, මෙම යෝජනා සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරමින් පවතී.

ජනාධිපති ලේකම් කාර්යාලය, අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ අදාළ වෙනත් බලධාරීන් විසින් පනවනු ලැබ ඇති රජයේ ප්‍රතිපත්ති හා රෙගුලාසිවලට අනුකූලව, ආයතනික කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශ සකස් කිරීමේදී සාමාන්‍ය පාලන අංශය සිය පුරෝගාමී කාර්යභාරය අඛණ්ඩව ඉටු කළේය.

පුරප්පාඩු වූ තනතුරුවලට බඳවාගැනීම, පුහුණුව හා සංවර්ධනය, අභ්‍යන්තර මාරුවීම්, විනය පාලනය සහ අමාත්‍යාංශයෙන් ඉවත්වීම (විශ්‍රාම ගැනීම සහ අමාත්‍යාංශයෙන් පිටතට ස්ථාන මාරුවීම් ඇතුලුව) ආදිය තුලින් සියලුම කාර්ය මණ්ඩල කාණ්ඩ (ශ්‍රී. ලං.වි. සේ නිලධාරීන් සහ දූත මණ්ඩල සේවක සංඛ්‍යාව හැර) පරිපාලනය කිරීමේ ක්‍රියාකාරී විෂය පථය ද මෙම අංශය විසින් මෙහෙයවනු ලබයි.

පුහුණුව හා සංවර්ධනය සම්බන්ධයෙන්, 2019 වර්ෂයේ දී, සාමාන්‍ය පාලන අංශය ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව ඉහළ නැංවීම, කාර්යාල පටිපාටිවල නිපුණතා වැඩි දියුණු කිරීම සහ අදාළ කාර්ය මණ්ඩල කාණ්ඩවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා වර්ධනය කිරීම යන අවශ්‍යතාවන්ට ප්‍රමුඛත්වය දී ඇත. ඒ අනුව, මෙම අංශය බණ්ඩාරනායක රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය සමග එක්ව නිලධාරීන් 66 දෙනෙකු සඳහා ඉංග්‍රීසි භාෂා පාඨමාලාවක් ද නිලධාරීන් 75 දෙනෙකු සඳහා මූලික හා උසස් පරිගණක සාක්ෂරතා පුහුණුව ද නිලධාරීන් 76 දෙනෙකු සඳහා මුදල්, ප්‍රසම්පාදන හා ආයතන කටයුතු යන අංශවල ධාරිතා සංවර්ධන වැඩසටහන් ද, පවත්වන ලද අතර කොන්සියුලර් අංශයේ නිලධාරීන් සඳහා මානව සම්පත් සංවර්ධනය පිලිබඳ වැඩමුලුවක්

පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී. මීට අමතරව විදෙස් රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කිරීම සඳහා තෝරාගෙන ඇති රියදුරන් සහ කාර්යාල සේවක සේවයේ නියුතු සේවකයින් 26 දෙනෙකු විදේශ රැකියා කොන්දේසි පිළිබඳව ඔවුන්ගේ දැනුවත්භාවය වැඩිකිරීම සඳහා හා දූත මණ්ඩලවල දී කණ්ඩායම් වශයෙන් සේවය කිරීමට බහුවිධ ශක්‍යතා ගොඩ නැගීම සඳහා ඔවුන්ගේ රාජකාරිවලට විශේෂයෙන් සැකසූ පුහුණුවක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දී ලබාදීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

පසුගිය වසරේ දී මෙන්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඒකාබද්ධ සේවාවේ ස්ථාන මැරුවීම් හරහා කාර්ය මණ්ඩල ප්‍රවර්ගවලින් බහුතරයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය හේතුවෙන්, ශක්නුවත් මානව සම්පත් ලබා ගැනීමේ දී අමාත්‍යාංශය සැලකිය යුතු සීමාවන් අත්විඳ ඇත. විකල්පයක් ලෙස, සාමාන්‍ය පාලන අංශය විසින් භාෂා පරිවර්තන වැනි අත්‍යවශ්‍ය සේවාවන් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් අබණ්ඩව ලබාගත් අතර විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින් සඳහා සීමාවාසික පුහුණුව සහ වෘත්තීය ඩිප්ලෝමාධාරීන් සඳහා කාර්මික පුහුණුව ලබා දීමෙන් මානව සම්පත් හිඟය ද අවම කරන ලදී.

**ඇ. නඩත්තු කටයුතු**

වසර 100 කට වැඩි ඉතිහාසයක් ඇති බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ඉදිකරන ලද ජනරජ ගොඩනැගිල්ලේ විදේශ කටයුතු අමාත්‍යාංශය ස්ථානගත කර ඇති හෙයින් එම ගොඩනැගිල්ල හොඳ තත්ත්වයේ තබා ගැනීම සඳහා නිසි හා ක්‍රමවත් නඩත්තු අවශ්‍ය වේ. 2019 වර්ෂයේ දී ජනරජ ගොඩනැගිල්ලේ ස්ථානගත කොට ඇති අමාත්‍යාංශයේ සමහර අංශ සහ පොදු ප්‍රදේශ අලුත්වැඩියා කිරීමට මෙම අංශය පියවර ගෙන තිබෙන අතර ඒ සඳහා රුපියල් මිලියන 46ක් වැය විය. 2019 වර්ෂයේ විශේෂ කාර්යයක් ලෙස, ආර්ථික කටයුතු අංශය යෝග්‍ය රාජකාරී පරිසරයක් තුල නැවත ස්ථාපිත කරන ලද්දේ ඉහළ මට්ටමේ පාර්ශවකරුවන් සමග අන්‍යොන්‍ය වශයෙන් කටයුතු කරමින් එහි කාර්ය කටයුතු සහ ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකරණ සංකල්පය මත පදනම්ව වෙළඳ හා වෙනත් ආර්ථික ක්ෂේත්‍රයන්හි ජාත්‍යන්තර සබඳතා වර්ධනයකර ගැනීමට හැකිවන පරිදිය. මෙම සම්පූර්ණ කාර්යය නිම කිරීම සඳහා වන මුලු පිරිවැය දළ වශයෙන් මිලියන 20කි.

ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ මගින් පමණක් නොව, කළමනාකරණය, වාර්තා තබාගැනීම සහ වාර්තා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් විසඳුම් ලබාදෙමින් ද අමාත්‍යාංශයේ යටි පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මෙම අංශය අවධානය යොමු කර ඇත. ඒ අනුව, නිරන්තරයෙන් නඩත්තු කරනු ලබන වැදගත් ලියකියවිලි සහ ලිපිගොනු ගබඩා කිරීම සඳහා අංශවල ඇලුමිනියම් කබඩ් පිරිසැකසුම් කිරීම සහ සවි කිරීම සඳහා මිලියන 3.1 ක් වියදම්කර ඇත. පැරණි වාර්තා, ලේඛන සහ ලිපිගොනු ගබඩා කර ඇති ලේඛනාගාර හා තොරතුරු ඒකකය සංවර්ධනය කිරීමට මෙම අංශය පියවර ගෙන ඇති අතර, ඒ සඳහා ද්‍රව්‍යමය හා ශ්‍රමික පිරිවැය රු.1.8කි.

අමාත්‍යාංශයට අයත් නිල නිවාස 20 අබණ්ඩව නඩත්තු කිරීමේ වැදගත්කම හඳුනා ගන්නා අතර මෙම අංශය විසින් නිවාස 15ක් අලුත්වැඩියා කිරීමේ කටයුතුවල නියැලී ඇත. මෙම කර්තව්‍ය සම්පූර්ණ කිරීම සඳහා අමාත්‍යාංශය විසින් දරනු ලබන සමස්ත පිරිවැය මිලියන 8.25කි. අමාත්‍යාංශයේ සියලුම අංශවල මනා ක්‍රියාකාරිත්වය සහ අබණ්ඩ සේවා සැපයීම සඳහා, කාර්ය මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන යන්ත්‍රෝපකරණ හා උපකරණ ප්‍රමිතගත තත්ත්වයෙන් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා, සියලුම තාක්ෂණික උපකරණ සහ යන්ත්‍ර ආවරණය කරමින් වාර්ෂික සේවා හා නඩත්තු ගිවිසුම් බලාත්මක කරන ලදී. මීට අමතරව නඩත්තු ඒකකය විසින් යන්ත්‍ර හා උපකරණවල දෝෂ මග හරවා ගැනීම සඳහා පහසුකම් සලසා ඇති අතර 2019 වසරේදී සමස්ත අලුත්වැඩියා කිරීමේ පිරිවැය මිලියන 3.1 කි.

**ඈ.ප්‍රසම්පාදනය හා භාණ්ඩ ලැයිස්තු පාලනය**

වර්ෂය ආරම්භයේ දී අමාත්‍යංශයේ සියලුම ප්‍රසම්පාදන අවශ්‍යතා පුරෝකථනය කරමින් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරන ලද අතර වසර පුරා අමාත්‍යාංශයට ප්‍රාග්ධන හා පුනරාවර්තන භාණ්ඩ සැපයීම සඳහා ප්‍රසම්පාදන කටයුතු 250ක් පමණ ක්‍රියාත්මක කරන ලදී. ප්‍රාග්ධනය සහ පුනරාවර්තන වියදම් හා සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සඳහා පිළිවෙලින් මිලියන 27ක් සහ මිලියන 28 කට වැඩි මුදලක් වැය කර ඇති බව ගණනය කරන ලදී. 2019 දී සාමාන්‍ය පාලන

අංශය විසින් විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා ප්‍රාග්ධන වත්කම් සැපයීමට ප්‍රසම්පාදන 50ක් ක්‍රියාත්මක කිරීමේ පහසුකම් සලසා ඇත. මේ සඳහා මිලියන 9ක් වැය විය.

මෙම අංශය යටතේ ගබඩා ඒකකය ක්‍රියාත්මක වන අතර එම ඒකකය අමාත්‍යාංශයේ අවශ්‍යතා සපුරාලීම සඳහා වත්කම් ලැබීම් සහ නිකුත් කිරීම් ඇතුලු ප්‍රාග්ධන සහ පුනරාවර්තන වත්කම් තොගය පවත්වාගෙන යයි.

### ඉ. පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩලයීය කටයුතු

අමාත්‍ය මණ්ඩලය සමඟ සිදුකරන කටයුතු දී සහ පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධීකරණ කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස ද සාමාන්‍ය පාලන අංශය කටයුතු කරයි. මේ සම්බන්ධයෙන්, මෙම අංශය අමාත්‍ය මණ්ඩලයීය සංදේශ 44 ක් සහ මෙම අමාත්‍යාංශයට යොමු කරන ලද පාර්ලිමේන්තු ප්‍රශ්න 08 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

### ඊ. සැපයුම් සහ වෙනත් සේවාවන්

අමාත්‍යාංශයට අයත් වාහන සමූහය කාර්යක්ෂමව නඩත්තු කිරීම තුළින් අමාත්‍යාංශයේ කාර්ය කටයුතුවල මනා ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සැලසීමට ගත හැකි සෑම පියවරක්ම මෙම අංශය විසින් අඛණ්ඩව ගෙන ඇත. වාහන අත්පත් කර ගැනීම, නඩත්තු කිරීම සහ බැහැර කිරීම මෙන්ම රියදුරන් කළමනාකරණය කිරීම සම්බන්ධ සියලු කටයුතු මෙම අංශය විසින් මෙහෙයවනු ලැබේ. මේ හැරුණු විට, විදේශ තානාපතිවරුන් හා මහ කොමසාරිස්වරුන්ගේ අක්තපත්‍ර ප්‍රදානය කිරීමේ උත්සව සඳහා අතිශයින් වැදගත් පුද්ගලයන්ගේ සහ වෙනත් විදේශීය නියෝජිත කණ්ඩායම් වල රාජ්‍ය සංචාර සහ සංචාර සඳහා යෝග්‍ය ප්‍රවාහන පහසුකම් සහ වෙනත් ඊට අදාළ සැපයුම් පහසුකම් සැලසීම මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ. 2019 වර්ෂය තුළ කොළඹ පැවැත්වූ අක්තපත්‍ර ප්‍රදානය කිරීමේ උත්සව, ප්‍රභූ සංචාර සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ විශාල සංඛ්‍යාවක් සඳහා පහසුකම් සලසා ඇත. 2018 දී අධික ලෙස භාවිතා කළ වාහන 06ක් සහ 2019 දී තවත් වාහන 10ක් බැහැර කර ඇති මෙම අංශය දැන් නව වාහන ගැනීමෙන් වාහන සමූහය අලුත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය සමග සාකච්ඡා කරමින් සිටියි.

### උ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ පද්ධති කලින් කලට දියුණු වී ඇති අතර වර්තමානයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වලින් බහුතරයක් එහි පරිණත මට්ටමට පැමිණි අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර මෙහෙයුම් සඳහා මෙන්ම පොදු මහජනතාව සඳහා ප්‍රශස්ත සහාය සේවාවක් ලබා දෙයි.

තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල ප්‍රධාන අංගයක් වන්නේ අමාත්‍යාංශ වෙබ් අඩවියයි. ශ්‍රී ලංකා සයිබර් ආරක්ෂාව පිළිබඳ මධ්‍යස්ථානයේ (SLCERT) නිර්දේශ මත පදනම්ව වෙබ් අඩවියේ ආරක්ෂාව තර කිරීම සඳහා, තොරතුරු තාක්ෂණ අංශය, සාමාන්‍ය අන්තර්ජාලය හරහා ඇතිවිය හැකි සයිබර් ප්‍රහාර වැලැක්වීමට වෙබ් යෙදවුම් ෆයර්වෝලයක් (WAF) ක්‍රියාත්මක කර ඇත. 2019 දී මෙම ෆයර්වෝලය හරහා අවහිර කරන ලද අහිතකර වෙබ් ඉල්ලීම් සංඛ්‍යාවේ සාමාන්‍ය අගය 38කි.

ජනරජ ගොඩනැගිල්ල, සෙලින්කෝ ගොඩනැගිල්ල සහ යාපනයේ සහ මාතර ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලවල අවසාන පරිශීලකයා, පද්ධති දත්ත සහ තොරතුරු ආරක්ෂා කිරීම සඳහා අමාත්‍යාංශයට ෆයර්වෝල් 5ක් තිබේ. අමාත්‍යාංශ ජාල ආරක්ෂා කර ඇති බව සහතික කිරීම සඳහා, නීති රීති සහ අන්තර්ජාල ප්‍රතිපත්ති අඛණ්ඩව වැඩිදියුණු කරමින් සිටියි.

භාණ්ඩ ලැයිස්තු වාර්තා ඩිජිටල්කරණය කිරීම සඳහා, මාර්ග ගත භාණ්ඩ වාර්තා කළමනාකරණ පද්ධතියක් සකසන ලද අතර දැනට එම පද්ධතියට දත්ත ඇතුළත් කරමින් සිටියි.

සම්පූර්ණ ජනරජ ගොඩනැගිල්ලට Wi-Fi පහසුකම ලබාදීම අමාත්‍යාංශයේ ප්‍රධාන අවශ්‍යතාවයක් විය. ගොඩනැගිලි ගෘහ නිර්මාණ ශිල්පය සහ එහි බිත්තවල ඝනකම හේතුවෙන් අමාත්‍යාංශයේ

මෙහෙයුම් සඳහා Wi-Fi සම්බන්ධතාව ශක්තිමත් නොවූ අතර 2019 වර්ෂයේ දී ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, පූර්ණ ආවරණය ලබාදෙන Wi-Fi විසඳුමක් ලබාදීමට සමත් විය.

### ඌ. පුස්තකාලය

අමාත්‍යාංශයීය පුස්තකාල පහසුකම වැඩිදියුණු කිරීමේ අදහසින්, සාමාන්‍ය පරිපාලන අංශය, ප්‍රතිපත්ති සැලසුම් පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය සමග සාකච්ඡා කර ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සකස් කරන ලද ප්‍රමිතීන් හඳුන්වාදීමටත්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් වරින් වර පවත්වනු ලබන පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්වල සහභාගී වීම තුළින් අමාත්‍යාංශයේ පුස්තකාලයාධිපතිනියට ඇගේ ධාරිතාවය වැඩි දියුණු කිරීමට සැලසීමටත් පියවර ගෙන තිබේ. සාමාන්‍ය පාලන අංශය, පුස්තකාලයේ වාර්තා පවත්වාගැනීම කළමණාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ශක්නුවත් තරුණ තරුණියන්ගේ ආයතනික අවශ්‍යතාව සපුරමින්, පුස්තකාලය සඳහා පුහුණුවන්නන් බඳවාගෙන ඔවුන්ගේ ප්‍රායෝගික කුසලතා වර්ධනය කර ගැනීමට ඉඩ සලසා දී තිබේ.

# මුදල් අංශය

## මුදල් අංශය

මුදල් අංශය - 2019

ශීර්ෂය : 112

මෙම අමාත්‍යාංශයේ කටයුතු කළමනාකරණය කිරීම හා මූල්‍ය සැලසුම් කිරීම සඳහා සහායක සේවා සැපයීම පිළිබඳ වගකීම මුදල් අංශය වෙත පැවරී ඇත. අමාත්‍යාංශයේ සහ විදේශවල ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල 67 ක මූල්‍ය ගනුදෙනුවලට අදාළව ගිණුම් දෙකක් මෙම අංශය මඟින් පවත්වාගෙන යන අතර, ඒවා මාසික හා වාර්ෂික පදනමින් මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කරනු ලැබේ.

2019 වසරේ දී සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්:-

- මෙම අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින වෙනත් ආයතනවල මූල්‍ය වගකීම් ඉටුකිරීම සඳහා විදේශ සබඳතා ලේකම්වරයාට හා ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියාට සහාය වීම.
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම, අයවැය සාකච්ඡාවලට සහභාගී වීම සහ ඒවා මහා භාණ්ඩාගාරයෙන් අනුමත කරවා ගැනීම.
- වියදම් ඒකක 68 ක් සඳහා අයවැය ප්‍රතිපාදන බෙදා හැරීම සහ ඒ අනුව ප්‍රගතිය නිරීක්ෂණය කිරීම.
- සියලුම ගෙවීම් සහ ඒවායෙහි වාර්තාකරණය මූල්‍ය රෙගුලාසි හා වෙනත් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව සිදු කෙරෙන බව සහතික කිරීම සඳහා, මෙම අමාත්‍යාංශයේ හා විදේශවල ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාලවල සමස්ත මූල්‍ය වාර්තාකරණ කටයුතු අධීක්ෂණය කිරීම.
- ලබා දී ඇති අයවැය ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් වියදම් පියවා ගැනීම පිණිස, අමම අමාත්‍යාංශයේ කටයුතු හා විදේශවල දූත මණ්ඩල/දූත කාර්යාල සඳහා මුදල් අග්‍රිමය විධිමත් පරිදි බෙදා හැරීම.
- මුදල් හා ගිණුම්කරණ කටයුතු විධිමත් කිරීමේ අරමුණින් යුතුව, විදේශ දූත මණ්ඩල/දූත කාර්යාල සඳහා අමාත්‍යාංශ චක්‍රලේඛ හරහා මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබේ.
- වියදම් ඒකක 68 ක මාසික හා වාර්ෂික ගිණුම් ඒකාබද්ධ කිරීම සහ 2019 මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.
- එම ආයතනවල කටයුතු සිදු කිරීම පිණිස ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාලවලට මුදල් ප්‍රේෂණය කිරීම සඳහා වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ගණනාවකට පහසුකම් සැලසීම.
- විවිධ අංග පැවැත්වීම පිණිස එම ආයතනවල අරමුදල් සාමාන්‍ය තැන්පතු ගිණුම හරහා විදේශ දූත මණ්ඩල/දූත කාර්යාලවලට ප්‍රේෂණය කිරීම සහ පිටතින් පැමිණෙන අරමුදල් ප්‍රේෂණ සාමාන්‍ය තැන්පතු ගිණුම හරහා සිදුකිරීම සඳහා අර්ධ රාජ්‍ය සංවිධාන ගණනාවකට (උදා: ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය) පහසුකම් සැලසීම.
- විගණන විමසුම්, විගණන රැස්වීම් සහ රැස්වීම් සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධතා පැවැත්වීම.

# 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

(රු.)

| අයවැය 2019 | | සටහන | තත්‍ය 2019 | තත්‍ය 2018 | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | | - | ඒඑසිඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 10,606,109,415 | 10,433,901,869 | ඒඑසිඒ-3 |
| | තැන්පතු | | 2,332,843,654 | 1,897,581,581 | ඒඑසිඒ-4 |
| 26,000,000 | අත්තිකාරම් ගිණුම් | | 46,734,753 | 45,851,607 | ඒඑසිඒ-5 |
| | වෙනත් ලැබීම් | | 2,731,432,749 | 3,741,111,453 | |
| **26,000,000** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **15,717,120,571** | **16,118,446,510** | |
| **26,000,000** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **15,717,120,571** | **16,118,446,510** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 12,130,766,400 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | | 7,240,445,122 | 6,452,857,210 | |
| 4,213,235,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | | 4,171,621,625 | 4,240,955,878 | ඒඑසිඒ-2(ii) |
| 622,326,200 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | | 617,125,066 | 387,167,357 | |
| - | පොළී ගෙවීම් | | | - | |
| 45,655,700 | වෙනත් පුනරාවර්තන වියදම් | | 33,722,420 | 59,675,280 | |
| **17,011,983,300** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **12,062,914,233** | **11,140,655,725** | |
| | **මූලධන වියදම්** | | | | |
| 612,801,100 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු | | 180,814,314 | 269,625,726 | |
| 173,984,900 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | | 169,843,624 | 968,426,096 | |
| 8,777,400 | ප්‍රාග්ධන මාරුකිරීම් | | 6,800,000 | 9,485,909 | ඒඑසිඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | | | - | |
| 3,796,000 | හැකියා වර්ධනය | | 3,795,641 | 5,678,290 | |
| 54,713,200 | වෙනත් මූලධන වියදම් | | 54,523,350 | 41,736,519 | |
| **854,072,600** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **415,776,929** | **1,294,952,540** | |
| **40,000,000** | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **2,276,757,380** | **2,055,305,066** | |
| | **තැන්පතු ගෙවීම්** | | 2,226,489,422 | 2,002,780,984 | ඒඑසිඒ-4 |
| 40,000,000 | **අත්තිකාරම් ගෙවීම්** | | 50,267,957 | 52,524,081 | ඒඑසිඒ-5 |
| **17,906,055,900** | **මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)** | | **14,755,448,542** | **14,490,913,331** | |
| **(17,880,055,900)** | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | **961,672,030** | **1,627,533,179** | |

# 2019 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2019 (රු.) | 2018 (රු.) |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | **ඒසීඒ-6** | 12,644,103,122 | 6,387,030,315 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | **ඒසීඒ-5/5(ඒ)** | 120,308,680 | 116,775,476 |
| මුදල් හා මුදල් සමාන දෑ | **ඒසීඒ-3** | 640,722,603 | 900,564,516 |
| **මුළු වත්කම්** | | **13,405,134,405** | **7,404,370,307** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | (377,607,411) | (274,786,384) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 12,644,103,122 | 6,387,030,315 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | **ඒසීඒ-4** | 497,916,091 | 391,561,859 |
| අග්‍රිම ශේෂය | **ඒසීඒ-3** | 640,722,603 | 900,564,516 |
| **මුළු වගකීම්** | | **13,405,134,405** | **7,404,370,307** |

**පිටු අංක..04..සිට ..78.. දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..79.. සිට ..123.. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.**

| | | |
|---|---|---|
| ..... | ..... | ..... |
| **ප්‍රධාන ගණන්දීමේ නිලධාරි** | **ගණන්දීමේ නිලධාරි** | **ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/** |
| **නම :** | **නම :** | **අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)** |
| **තනතුර :** | **තනතුර :** | **නම :** |
| **දිනය : 2020.05.15** | **දිනය : 2020.05.15** | **දිනය : 2020.05.15** |

# 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තත්‍ය | |
|---|---|---|
| | 2019 (රු.) | 2018 (රු.) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 16,113,371,074 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 2,691,133,111 | - |
| අග්‍රිම ලැබීම් | 9,750,096,951 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **12,441,230,062** | **16,113,371,074** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 11,445,789,167 | 13,681,153,796 |
| සහනාධාර සහ මාරුකිරීම් | 617,125,066 | 387,167,357 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 334,110,538 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | 14,122 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **12,397,024,771** | **14,068,335,275** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **44,205,291** | **2,045,035,799** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 16,525,426 | 5,089,558 |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **16,525,426** | **5,089,558** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 406,229,520 | 1,294,952,540 |
| අත්තිකාරම් ගෙවීම් | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **406,229,520** | **1,294,952,540** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(389,704,094)** | **(1,289,862,982)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **(345,498,803)** | **755,172,817** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 2,332,843,654 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **2,332,843,654** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 2,226,489,422 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **2,226,489,422** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **106,354,231** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **(239,144,572)** | **755,172,817** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **484,881,544** | **145,391,699** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **245,736,972** | **900,564,516** |

# අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය

## අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය

### අරමුණ

මෙම අමාත්‍යාංශයෙහි හා විදේශවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාලවල සහ මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වෙනත් ආයතනවල අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සහ සමස්ත කාර්යය සාධනය හා අනුකූලතාවය පිළිබඳ උසස්ම උපායමාර්ගික මගපෙන්වීම ලබා දීම.

### ප්‍රධාන කාර්යයන්:

1. විදේශ සබඳතා අමාත්‍යාංශය යටතේ පවතින සියලු ආකාරයේ අංශ හා ආයතනවල අභ්‍යන්තර විගණන පරීක්ෂණ පැවැත්වීම සහ විදේශ දූත මණ්ඩල/දූත කාර්යාලවල විගණන පරීක්ෂණ පැවැත්වීම.
2. ජාතික විගණන කාර්යාලය මඟින් නිකුත් කරන ලද විගණන විමසුම්වලට පිළිතුරු සම්පාදනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
3. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වල දී මතුවන ගැටළු පිළිබඳව සම්බන්ධීකරණය කිරීම සහ ඒවා නිවැරදි කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදු කිරීම.
4. විදේශ සබඳතා ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුතුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.
5. විදේශ සබඳතා ලේකම්වරයාගේ මඟ පෙන්වීම අනුව, විශේෂ පරීක්ෂණ පැවැත්වීම.

### 2019 වසර තුළ දී සිදුකරන ලද කටයුතු

1. මෙම අමාත්‍යාංශය හා විදේශ දූත මණ්ඩල/දූත කාර්යාල සම්බන්ධයෙන් විගණන විමසුම් 37 ක් මතු කිරීම.
2. විශේෂ පරීක්ෂණ පැවැත්වීම - නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට අයත් ශ්‍රී ලංකා බෞද්ධ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාව.
3. ක්‍රමවේද පාදක විගණනය
   අභ්‍යන්තර පාලනය හා ආයතනික පාලනයේ ඵලදායීතාවය තක්සේරු කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය ක්‍රමානුකූල හා විනයගරුක විගණන ප්‍රවේශයක් සපයයි.
   - සියලුම දූත මණ්ඩල/දූත කාර්යාල සඳහා බංකු ගිණුම් සැසැඳීමේ ප්‍රකාශන ලබා දීම (බැංකු ගිණුම් 106)
   - පිරිවැය හා ප්‍රතිලාභ තක්සේරු කිරීම මත පදනම්ව විදේශවල ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල සඳහා දේපළ අත්පත් කරගැනීම පිණිස යෝජනා ඉදිරිපත් කිරීම.
   - ශබ්ද විකාශන පද්ධති උපකරණ කුලී පදනම මත ලබා ගැනීම
   - මෙම අමාත්‍යාංශයේ මාසික සන්නිවේදන බිල්පත් පියවීම

### 4. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව සම්බන්ධ කරුණු

20019.03.06 වැනි දින පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී මතු කරන ලද කරුණු 11 සඳහා පිළිතුරු සම්පාදනය කිරීම සම්බන්ධීකරණය.

### 5. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම - 2019

පසුගිය වර්ෂය තුළ දී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් පවත්වා ඇති අතර, එම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල දී ගන්නා ලද තීරණ පිළිබඳව පසුවිපරම් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

6. සාමාන්‍ය විගණන විමසුම්වලට (29) පිළිතුරු සම්පාදනය කිරීම සඳහා සම්බන්ධීකරණය - ලබා දුන් පිළිතුරු 29.


විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාල
ඔටාවා
ටොරොන්ටෝ
නිව්යෝර්ක්
වොෂින්ටන්
ලොස්ඇන්ජලීස්
හවානා
බ්‍රසීලියා
ඔස්ලෝ
ස්ටොක්හෝම්
බර්ලින්
ඇම්ස්ටර්ඩෑම්
හේග්
වර්සෝ
මොස්කව්
ඉසල්ස්
ජිනීවා
බීරුට්
කරච්චි
ලන්ඩන්
අම්මාන්
පැරිස්
වියනා
අන්කාරා
බැග්ඩෑඩ්
මස්කට්
රාමල්ලා
ඉස්ලාමාබාද්
කුවේට්
කැම්මන්ඩු
මිලාන්
යැංගුන්
රෝමය
ටෙල් අවිව්
ටෝකියෝ
නිකොෂියා
ටෙහෙරාන්
කයිරෝ
බහරේන්
රියාද්
ඇෆ්ගනිස්තාන්
පේඛිං
දෝහා
බ්‍රසීලියා
හනෝයි
ඔමාන්
නවදිල්ලිය
චෙන්නයි
බැංකොක්
ඇඩිස් අබාබා
නයිරෝබි
සිංගප්පුරුව
ක්වාලාලම්පුර්
ජාකර්තා
මාලේ
වික්ටෝරියා
ප්‍රිටෝරියා
සිඩ්නි
කැන්බරා
මෙල්බර්න්
මහ කොමිසාරිස් කාර්යාල
තානාපති කාර්යාල
එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත කාර්යාල
කොන්සල් ජෙනරල් කාර්යාල
නියෝජ්‍ය මහ කොමිසාරිස් කාර්යාල
ශ්‍රී ලංකා නියෝජිත කාර්යාල
විදේශ කටයුතු අමාත්‍යාංශය
විදේශ කටයුතු අමාත්‍යාංශය
© comersis.com

## 2019 වසරේ දී එක් එක් දූතමණ්ඩල/දූත කාර්යාලවල ආදායම් වාර්තාව

| දූත මණ්ඩල අංකය | දූත මණ්ඩලය | රජයේ ගොඩනැගිලි කුලිය 2002-01-01 | වෙනත් පොළී 2002-02-99 | විදේශ ගමන් බලපත්‍ර හා වීසා 2003-02-07 | විභාග හා වෙනත් 2003-02-13 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 2003-02-14 | කොන්සියුලර් ගාස්තු 2003-02-99 | වෙනත් ලැබීම් 2003-99-00 | මධ්‍යම රජයේ වැන්දඹු හා අනත් දරු 2004-01-00 | පළාත් පාලන වැන්දඹු හා අනත් දරු 2004-02-00 | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම 2006-02-01 (වාහන) | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම 2006-02-02 (වෙනත්) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01A | කැන්බරා | | 23,400 | 22,499,022 | | 92,350 | 8,472,792 | 3,187,727 | 291,992 | 24,657 | | | 34,591,940 |
| 02A | සිඩ්නි | | 28,714 | 30,907,319 | | 479,828 | 12,268,705 | 1,719,846 | 220,810 | | | | 45,625,223 |
| 03A | කයිරෝ | | 17,575 | 2,828,181 | 611 | | 1,141,937 | 716,157 | 135,893 | | | | 4,840,354 |
| 04A | පැරිස් | | 39,662 | 181,403,038 | | | 23,190,270 | 5,755,000 | 427,161 | 33,425 | 299,824 | | 211,148,380 |
| 05A | හේග් | | 215,690 | 10,332,553 | | | 2,598,181 | 1,231,056 | 217,112 | | | | 14,594,591 |
| 06A | ටෝකියෝ | | 16,583 | 30,757,898 | | 1,382,417 | 17,722,622 | 2,818,126 | 236,014 | 17,829 | | | 52,951,489 |
| 07A | අම්මාන් | | 21,334 | 16,888,635 | | | 741,160 | 968,319 | 154,262 | | | | 18,773,710 |
| 08A | කත්මන්ඩු | | | 4,507,590 | 1,819 | | 345,573 | 14,005,440 | 133,980 | | | | 18,994,401 |
| 09A | බර්ලින් | | 8,500 | 34,642,953 | | | 3,127,520 | 3,792,227 | 165,435 | 68,011 | | | 41,804,646 |
| 10A | වියානා | | 29,835 | 3,506,542 | | 21,944 | 1,082,037 | 2,524,601 | 161,553 | | | | 7,326,512 |
| 11A | බීජිං | | 47,017 | 20,788,474 | | | 7,209,768 | 3,404,841 | 408,494 | 25,428 | 200,336 | | 32,084,358 |
| 12A | හවානා | | 5,010 | 88,693 | | | 229,067 | 710,226 | 100,065 | | | | 1,133,062 |

## 2019 වසරේ දී එක් එක් දූතමණ්ඩල/දූත කාර්යාලවල ආදායම් වාර්තාව

| දූත මණ්ඩල අංකය | දූත මණ්ඩලය | රජයේ ගොඩනැගිලි කුලිය 2002-01-01 | වෙනත් පොලී 2002-02-99 | විදේශ ගමන් බලපත්‍ර හා වීසා 2003-02-07 | විභාග හා වෙනත් 2003-02-13 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 2003-02-14 | කොන්සියුලර් ගාස්තු 2003-02-99 | වෙනත් ලැබීම් 2003-99-00 | මධ්‍යම රජයේ වැන්දඹු හා අනත් දරු 2004-01-00 | පළාත් පාලන වැන්දඹු හා අනත් දරු 2004-02-00 | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම 2006-02-01 (වාහන) | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම 2006-02-02 (වෙනත්) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 13A | ක්වාලාලම්පූර් | | 14,530 | 22,866,903 | | | 4,302,252 | 1,009,829 | 183,324 | | | | 28,376,839 |
| 14A | සිංගප්පූරුව | | 24,965 | 8,973,410 | | | 5,572,127 | 1,966,606 | 355,030 | | | | 16,892,138 |
| 15A | නිව්යෝක් | | 23,032 | 14,718,847 | | | 3,052,681 | 3,075,981 | 382,286 | | | | 21,252,828 |
| 16A | වොෂිංටන් | | 49,220 | 24,876,309 | | | 6,855,283 | 3,823,099 | 652,468 | 21,468 | | | 36,277,847 |
| 17A | ලොස්ඇන්ජලීස් | | 8,548 | 14,465,037 | | | 1,446,008 | 1,285,341 | 113,232 | | | | 17,318,166 |
| 18A | ඩකා | | 22,402 | 5,216,559 | 1,834 | | 1,601,760 | 763,332 | 119,889 | | | | 7,725,776 |
| 19A | මුම්බායි | | 17,016 | 1,308,404 | | | 1,530,041 | 813,817 | 138,726 | | | | 3,808,004 |
| 20A | නයිරෝබි | 452 | 45,223 | 1,087,887 | | | 449,199 | 699,976 | 107,566 | | | | 2,389,852 |
| 21A | යැන්ගොන් | 43,248 | 5,023 | 2,572,326 | | | 99,427 | 699,352 | 95,208 | 23,972 | | | 3,495,308 |
| 22A | ස්ටොක්හෝම් | | 14,297 | 10,788,825 | | | 2,491,764 | 2,031,822 | 235,956 | | | | 15,562,664 |
| 23A | බැංකොක් | | 28,259 | 4,051,862 | | | 2,050,851 | 7,113,182 | 236,269 | 46,375 | | | 13,526,798 |
| 24A | බ්‍රසල්ස් | | 24,734 | 4,607,369 | 698 | | 1,092,143 | 4,585,477 | 306,967 | | | | 10,617,388 |
| 25A | චෙන්නායි | | 41,635 | 10,140,155 | | | 31,829,587 | 3,286,846 | 591,651 | | | | 45,889,874 |
| 26A | ජකාර්තා | | 19,673 | 1,315,398 | 16,952 | | 534,699 | 1,075,691 | 228,541 | | | | 3,190,953 |
| 27A | මාලේ | | 28,335 | 5,401,290 | 1,240 | | 3,162,888 | 782,935 | 111,958 | 31,698 | | | 9,520,344 |
| 28A | පිජිව | | 21,858 | 66,387,232 | | | 16,768,799 | 3,867,060 | 589,523 | 16,774 | 10,489,216 | | 98,140,462 |
| 29A | අබුඩාබි | | 24,573 | 31,008,453 | | | 4,020,410 | 3,584,715 | 293,488 | | | | 38,931,639 |

2019 වසරේ දී එක් එක් දූතමණ්ඩල/දූත කාර්යාලවල ආදායම් වාර්තාව

| දූත මණ්ඩල අංකය | දූත මණ්ඩලය | රජයේ ගොඩනැගිලි කුලිය 2002-01-01 | වෙනත් පොලී 2002-02-99 | විදේශ ගමන් බලපත්‍ර හා වීසා 2003-02-07 | විභාග හා වෙනත් 2003-02-13 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 2003-02-14 | කොන්සියුලර් ගාස්තු 2003-02-99 | වෙනත් ලැබීම් 2003-99-00 | මධ්‍යම රජයේ වැන්දඹු හා අනත් දරු 2004-01-00 | පළාත් පාලන වැන්දඹු හා අනත් දරු 2004-02-00 | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම 2006-02-01 (වාහන) | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම 2006-02-02 (වෙනත්) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 30A | ඩුබායි | | 28,135 | 103,791,192 | 636 | | 17,047,096 | 1,644,086 | 217,692 | 22,613 | 849,599 | | 123,601,048 |
| 31A | ලන්ඩන් | | 49,714 | 68,789,367 | | | 93,876,573 | 3,584,744 | 634,767 | 36,611 | | | 166,971,776 |
| 32A | නවදිල්ලිය | 37,430 | 39,837 | 3,417,911 | | | 6,806,288 | 5,874,270 | 446,926 | 28,823 | | | 16,614,055 |
| 33A | සෝල් | | 32,395 | 20,042,067 | 1,800 | | 10,981,326 | 1,719,926 | 459,150 | | 296,800 | 493 | 33,533,957 |
| 34A | කුවේට් | | 33,321 | 176,844,220 | | | 30,742,174 | 1,707,925 | 729,124 | | | | 210,056,765 |
| 35A | රියාද් | | 19,416 | 77,207,164 | | | 2,874,898 | 2,241,193 | 410,785 | | | | 82,753,456 |
| 36A | මොස්කව් | | 33,835 | 1,174,188 | 1,949 | | 1,640,955 | 9,553,547 | 253,764 | | | | 12,658,238 |
| 37A | ඔටාවා | | 38,139 | 19,833,754 | | | 3,276,826 | 11,653,194 | 177,938 | | | | 34,979,850 |
| 38A | බැග්ඩෑඩ් | | 544 | 573,666 | | | 314,042 | 668,402 | 29,701 | | | | 1,586,355 |
| 39A | රෝමය | 465,566 | 54,006 | 114,109,927 | 2,222 | | 34,973,146 | 2,357,121 | 294,170 | | | | 151,790,591 |
| 40A | ඕමානය | | 20,455 | 20,075,011 | | | 5,700,092 | 1,150,923 | 329,091 | 25,408 | | | 27,300,980 |
| 41A | ඉස්ලාමාබාද් | | 9,944 | 1,412,701 | | | 1,058,287 | 1,196,203 | 231,797 | 24,874 | | | 3,933,806 |
| 42A | කරච්චි | | 12,005 | 1,355,189 | | | 600,270 | 543,808 | 113,984 | 23,262 | | | 2,648,519 |
| 43A | ජෙඩා | | 13,047 | 29,207,387 | | | 3,180,055 | 895,905 | 157,514 | | 532,646 | | 33,986,554 |
| 44A | කටාර් | | 13,451 | 115,775,160 | 1,463 | | 16,756,143 | 1,639,469 | 196,849 | | | | 134,382,536 |
| 45A | ප්‍රිටෝරියා | | 34,315 | 3,415,010 | | | 264,126 | 1,795,900 | 176,952 | | 1,242,865 | | 6,929,167 |
| 46A | බීරූට් | 2,313 | 29,656 | 16,115,672 | | | 949,631 | 1,562,299 | 241,505 | 28,069 | | | 18,926,831 |
| 47A | ටෙහෙරාන් | | 21,846 | 1,176,939 | | | 114,297 | 856,086 | 100,018 | | | 4,248 | 2,273,433 |

## 2019 වසරේ දී එක් එක් දූතමණ්ඩල/දූත කාර්යාලවල ආදායම් වාර්තාව

| දූත මණ්ඩල අංකය | දූත මණ්ඩලය | රජයේ ගොඩනැගිලි කුලිය 2002-01-01 | වෙනත් පොළී 2002-02-99 | විදේශ ගමන් බලපත්‍ර හා වීසා 2003-02-07 | විභාග හා වෙනත් 2003-02-13 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 2003-02-14 | කොන්සියුලර් ගාස්තු 2003-02-99 | වෙනත් ලැබීම් 2003-99-00 | මධ්‍යම රජයේ වැන්දඹු හා අනත් දරු 2004-01-00 | පළාත් පාලන වැන්දඹු හා අනත් දරු 2004-02-00 | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම 2006-02-01 (වාහන) | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම 2006-02-02 (වෙනත්) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 48A | මැනිලා | | 30,032 | 2,639,659 | | | 644,663 | 1,009,939 | 132,044 | | | | 4,456,337 |
| 49A | වෝර්සෝ | | 748,267 | 1,196,922 | | | 550,015 | 912,177 | 85,774 | 22,608 | | | 3,515,763 |
| 50A | ඔස්ලෝ | | 11,464 | 7,666,415 | | | 809,440 | 1,957,868 | 115,313 | | | | 10,560,500 |
| 51A | ෆ්‍රැන්ක්ෆර්ට් | | 10,670 | 48,535,310 | | | 1,375,692 | 1,424,562 | 229,395 | | | | 51,575,629 |
| 52A | තෙල්අවිව් | 8,008 | 9,305 | 10,123,976 | | | 3,508,973 | 1,159,541 | 140,803 | | | | 14,942,598 |
| 53A | ටොරොන්ටෝ | | 51,229 | 80,117,837 | | | 9,347,957 | 5,796,611 | 264,400 | | | | 95,578,035 |
| 54A | බ්‍රසිලියා | | 22,769 | 156,324 | | | 290,394 | 1,334,042 | 383,272 | | | | 2,186,802 |
| 55A | හැනෝයි | | 5,680 | 3,040,448 | | | 1,328,529 | 1,677,816 | 171,577 | | 218,400 | | 6,442,450 |
| 56A | රමල්ලා | | | 54,105 | | | 17,975 | 537,037 | 19,452 | | | | 628,568 |
| 57A | ෂැංහයි | | 10,868 | 4,077,877 | | | 2,407,163 | 2,840,796 | 84,417 | | | | 9,421,122 |
| 60A | ඇන්කාරා | | 10,304 | 829,319 | | | 780,413 | 1,174,207 | 238,218 | | | | 3,032,461 |
| 61A | ගුවංජෝ | | 19 | 5,495,223 | | | 522,493 | 852,559 | 145,902 | | | | 7,016,195 |
| 62A | මෙල්බර්න් | | 361,302 | 53,331,921 | | 1,931,759 | 19,671,179 | 1,475,840 | 147,226 | | | | 76,919,227 |
| 63A | මනමා | | 15,196 | 19,009,884 | | | 3,862,138 | 885,137 | 127,472 | 57,039 | | | 23,956,867 |
| 65A | අබුජා | | 495 | 345,143 | | | 916 | 640,389 | 126,614 | 24,850 | | | 1,138,408 |
| 66A | වික්ටෝරියා | | 2,617,378 | 1,076,882 | | | 288,910 | 630,112 | 22,054 | | | | 4,635,336 |
| 67A | කාබුල් | | | 1,093,797 | | | | 611,710 | 22,782 | | | | 1,728,289 |
| 68A | මිලාන් | | 15,117 | 84,368,519 | | 21,121 | 46,968,350 | 1,527,047 | 97,410 | | | | 132,997,564 |
| 69A | අඩිස්අබාබා | | 5,131 | 252,745 | | | 296,346 | 1,717,851 | 141,370 | | | | 2,413,442 |
| 70A | සයිප්‍රස් | | 621,935 | 5,865,106 | | | 12,682,020 | 660,459 | 79,418 | | | | 19,908,938 |
| **මුළු එකතුව** | | **557,018** | **5,897,864** | **1,692,531,100** | **31,224** | **3,929,419** | **501,499,339** | **160,769,327** | **15,371,496** | **603,797** | **14,129,685** | **4,741** | **2,395,325,010** |

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් සිදුකරන ලද කොන්සියුලර් කටයුතු
2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

| රට | දූත මණ්ඩලය | රැකියා වීසුම් | වීසා බලපත්‍ර නිකුත්කිරීම් | විදේශ ගමන් බලපත්‍ර නිකුත්කිරීම් | යාන්ත්‍රිකව සියවිය නොහැකි විදේශ ගමන් බලපත්‍ර | හැඳුනුම් සහතිකපත් නිකුත්කිරීම් | විදේශ ගමන් බලපත්‍ර පිටපත් සීරීම් | වීසා බලපත්‍ර අලුත්කිරීම් | සියරට පැමිණීම් | උප්පැන්න ලියාපදිංචි කිරීම් | විවාහ ලියාපදිංචි කිරීම් | මරණ ලියාපදිංචි කිරීම් | මේඛන සහතික කිරීම් | පොලිස් නිශ්කාශන වාර්තා | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඇෆ්ඝනිස්ථානය | කාබුල් | 0 | 254 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ඕස්ට්‍රේලියාව | කැන්බරා | 0 | 56 | 799 | 11 | 70 | 6 | 0 | 70 | 186 | 0 | 10 | 198 | 63 | 5 |
| ඕස්ට්‍රේලියාව | මෙල්බර්න් | 0 | 975 | 1667 | 108 | 25 | 51 | 0 | 5 | 459 | 0 | 5 | 599 | 162 | 1154 |
| ඕස්ට්‍රේලියාව | සිඩ්නි | 0 | 603 | 744 | 48 | 112 | 17 | 0 | 0 | 210 | 0 | 8 | 1471 | 83 | 0 |
| ඕස්ට්‍රියාව | වියානා | 0 | 319 | 59 | 4 | 0 | 3 | 0 | 4 | 15 | 2 | 0 | 162 | 5 | 0 |
| බහරේන් | මැනමා | 751 | 273 | 594 | 66 | 0 | 70 | 0 | 18 | 72 | 2 | 3 | 727 | 15 | 265 |
| බංගලාදේශය | ඩකා | 0 | 990 | 32 | 12 | 0 | 15 | 0 | 0 | 10 | 0 | 3 | 288 | 0 | 15 |
| බෙල්ජියම | බ්‍රසල්ස් | 0 | 371 | 42 | 9 | 15 | 0 | 0 | 0 | 8 | 1 | 0 | 133 | 0 | 3 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බ්‍රසීලය | බ්‍රසිලියා | 0 | 11 | 2 | 0 | 0 | 3 | 2 | 0 | 6 | 0 | 2 | 42 | 1 | 1 |
| කැනඩාව | ටොරොන්ටෝ | 0 | 1801 | 1140 | 76 | 0 | 38 | 0 | 51 | 114 | 1 | 4 | 1794 | 42 | 0 |
| කැනඩාව | ඔටාවා | 0 | 419 | 338 | 32 | 5 | 3 | 0 | 0 | 77 | 0 | 1 | 167 | 2 | 0 |
| චීනය | බෙයිජිං | 0 | 3380 | 49 | 3 | 0 | 5 | 2 | 0 | 26 | 1 | 4 | 1629 | 0 | 15 |
| චීනය | ගුවැන්ෂෝ | 0 | 821 | 0 | 3 | 0 | 0 | 3 | 0 | 0 | 1 | 0 | 127 | 0 | 0 |
| චීනය | ෂැංහයි | 0 | 591 | 4 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 337 | 0 | 0 |
| කියුබාව | හවානා | 0 | 3 | 2 | 2 | 0 | 0 | 3 | 0 | 1 | 0 | 0 | 63 | 0 | 0 |
| සයිප්‍රස් | නිකෝසියා | 1261 | 12 | 213 | 33 | 6 | 3 | 0 | 23 | 20 | 0 | 1 | 2958 | 1 | 0 |
| ඊජිප්තුව | කයිරෝ | 0 | 211 | 46 | 5 | 0 | 1 | 0 | 6 | 8 | 0 | 0 | 107 | 0 | 72 |
| ඉතියෝපියාව | අඩිස් අබාබා | 0 | 20 | 0 | 4 | 0 | 0 | 0 | 2 | 1 | 0 | 0 | 34 | 0 | 0 |
| ප්‍රංශය | පැරිස් | 0 | 978 | 4372 | 148 | 0 | 424 |  | 190 | 1144 | 0 | 33 | 864 | 19 | 2317 |
| ජර්මනිය | බර්ලින් | 0 | 1760 | 416 | 4 | 0 | 6 | 0 | 0 | 26 | 1 | 0 | 309 | 4 | 0 |
| ජර්මනිය | ෆ්‍රෑන්ක්ෆර්ට් | 0 | 818 | 1340 | 20 | 0 | 41 | 0 | 3 | 124 | 1 | 2 | 82 | 3 | 0 |
| ඉන්දියාව | නවදිල්ලිය | 0 | 2715 | 16 | 15 | 0 | 0 | 0 | 0 | 6 |  | 14 | 1063 | 0 | 0 |
| ඉන්දියාව | චෙන්නායි | 0 | 3726 | 1645 | 118 | 0 | 4 | 591 | 963 | 3166 | 12 | 21 | 4118 | 0 | 0 |
| ඉන්දියාව | මුම්බායි | 0 | 783 | 18 | 2 | 0 | 1 | 0 | 2 | 2 | 0 | 1 | 271 | 1 | 0 |
| ඉන්දුනීසියාව | ජකර්තා | 0 | 162 | 6 | 28 | 0 | 0 | 0 | 28 | 3 | 0 | 0 | 40 | 0 | 19 |
| ඉරානය | ටෙහ්රාන් | 0 | 215 | 1 | 17 | 0 | 0 | 2 | 25 | 1 | 0 | 0 | 8 | 0 | 0 |
| ඉරාකය | බැග්ඩෑඩ් | 0 | 61 | 0 | 0 | 0 | 0 | 8 | 0 | 0 | 0 | 0 | 35 | 0 | 0 |
| ඊශ්‍රායලය | ටෙල් අවිව් | 240 | 17 | 333 | 62 | 0 | 3 | 0 | 2 | 17 | 2 | 1 | 592 | 3 | 0 |
| ඉතාලිය | රෝමය | 0 | 82 | 3270 | 868 | 0 | 223 | 0 | 27 | 924 | 31 | 30 | 1938 | 63 | 3007 |
| ඉතාලිය | මිලාන් | 0 | 7 | 2783 | 735 | 0 | 298 | 0 | 0 | 823 | 36 | 18 | 1817 | 132 | 3604 |
| ජපානය | ටෝකියෝ | 0 | 694 | 828 | 187 | 25 | 21 | 0 | 12 | 289 | 55 | 11 | 1629 | 2 | 148 |
| ජෝර්දානය | අම්මාන් | 217 | 54 | 476 | 251 | 0 | 15 | 3 | 16 | 9 | 2 | 0 | 64 | 0 | 0 |
| කෙන්යාව | නයිරෝබි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| කොරියාව | සෝල් | 90 | 217 | 552 | 77 | 0 | 3 | 4 | 0 | 45 | 5 | 10 | 1671 | 18 | 0 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කුවේටය | කුවේට් | 29993 | 752 | 5356 | 2838 | 0 | 392 | 212 | 742 | 342 | 3 | 70 | 5353 | 3 | 769 |
| ලෙබනනය | බීරූට් | 437 | 16 | 525 | 82 | 0 | 17 | 0 | 122 | 33 | 0 | 9 | 130 | 10 | 0 |
| මැලේසියාව | ක්වාලාලම්පූර් | 0 | 115 | 440 | 691 | 0 | 13 | 0 | 113 | 60 | 21 | 23 | 411 | 0 | 0 |
| මාලදිවයින | මාලේ | 7729 | 266 | 101 | 67 | 0 | 1 | 0 | 0 | 11 | 0 | 0 | 493 | 0 | 0 |
| මියන්මාරය | යැන්ගූන් | 0 | 382 | 6 | 6 | 0 | 0 | 0 | 6 | 1 | 0 | 0 | 13 | 0 | 0 |
| නේපාලය | කත්මණ්ඩු | 0 | 1064 | 5 | 16 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 7 | 1 | 55 |
| නෙදර්ලන්තය | හේග් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| නයිජීරියාව | අබුජා | 0 | 26 | 5 | 3 | 0 | 0 | 0 | 3 | 2 | 0 | 2 | 3 | 0 | 0 |
| නෝර්වේ | ඔස්ලෝ | 0 | 331 | 133 | 8 | 0 | 9 | 0 | 6 | 44 | 0 | 0 | 103 | 0 | 0 |
| ඕමානය | මස්කට් | 5588 | 52 | 630 | 121 | 0 | 44 | 0 | 159 | 61 | 0 | 4 | 986 | 2 | 0 |
| පාකිස්ථානය | ඉස්ලාමාබාද් | 0 | 456 | 10 | 4 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 152 | 0 | 76 |
| පාකිස්ථානය | කරච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| පිලිපීනය | මැනිලා | 0 | 286 | 24 | 3 | 0 | 2 | 0 | 0 | 8 | 1 | 0 | 105 | 2 | 42 |
| පෝලන්තය | වොර්සෝ | 26 | 59 | 22 | 4 | 0 | 4 | 0 | 1 | 4 | 0 | 1 | 82 | 0 | 0 |
| පලස්තීන රාජ්‍යය | රාමල්ලා නගරය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 0 |
| කටාරය | ඩෝහා | 0 | 122 | 3467 | 1089 | 0 | 308 | 0 | 0 | 348 | 12 | 45 | 2606 | 2 | 577 |
| රුසියානු සමූහාණ්ඩුව | මොස්කව් | 1 | 248 | 6 | 14 | 16 | 0 | 0 | 1 | 9 | 0 | 1 | 629 | 3 | 6 |
| සවුදි අරාබිය | රියාද් | 344 | 239 | 2333 | 1400 | 0 | 82 | 0 | 176 | 131 | 0 | 78 | 506 | 57 | 0 |
| සවුදි අරාබිය | ජේඩා | 4 | 178 | 202 | 486 | 0 | 38 | 932 | 422 | 68 | 2 | 12 | 288 | 0 | 154 |
| සීෂෙල්ස් | වික්ටෝරියා | 11 | 7 | 35 | 51 | 0 | 0 | 35 | 75 | 10 | 0 | 2 | 54 | 1 | 0 |
| සිංගප්පූරුව | සිංගප්පූරුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| දකුණු අප්‍රිකාව | ප්‍රිටෝරියා | 0 | 106 | 16 | 7 | 0 | 9 | 74 | 0 | 18 | 0 | 2 | 32 | 14 | 0 |
| ස්වීඩනය | ස්ටොක්හෝම් | 0 | 683 | 204 | 13 | 0 | 3 | 5 | 0 | 32 | 0 | 1 | 122 | 4 | 0 |
| තායිලන්තය | බැංකොක් | 0 | 513 | 44 | 24 | 0 | 2 | 0 | 13 | 18 | 13 | 2 | 274 | 1 | 28 |
| තුර්කිය | අන්කාරා | 1 | 98 | 1 | 5 | 108 | 0 | 0 | 6 | 4 | 0 | 1 | 115 | 0 | 0 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | අබුඩාබි | 0 | 200 | 118 | 24 | 78 | 89 | 862 | 0 | 145 | 32 | 12 | 380 | 5 | 12 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | ඩුබායි | 0 | 646 | 3450 | 506 | 0 | 464 | 3298 | 376 | 405 | 0 | 30 | 563 | 47 | 362 |
| එක්සත් රාජධානිය | ලන්ඩන් | 0 | 2105 | 2806 | 389 | 0 | 241 | 703 | 47 | 738 | 0 | 5 | 1840 | 56 | 2285 |
| එක්සත් ජාතීන්ගේ සංවිධානය | ජිනීවා | 0 | 221 | 1731 | 130 | 0 | 57 | 0 | 266 | 366 | 0 | 5 | 1064 | 1 | 0 |
| එක්සත් ජාතීන්ගේ සංවිධානය | නිව්යෝර්ක් | 0 | 206 | 377 | 40 | 0 | 3 | 0 | 0 | 64 | 0 | 4 | 134 | 1 | 0 |
| එක්සත් ජනපදය | වොෂිංටන් | 0 | 887 | 575 | 51 | 26 | 26 | 0 | 25 | 165 | 0 | 9 | 583 | 3 | 335 |
| එක්සත් ජනපදය | ලොස්ඇන්ජලීස් | 0 | 214 | 278 | 46 | 0 | 0 | 0 | 3 | 59 | 0 | 4 | 35 | 0 | 0 |
| වියට්නාමය | හැනොයි | 0 | 340 | 15 | 1 | 0 | 6 | 0 | 0 | 3 | 0 | 1 | 217 | 4 | 0 |

# විගණකාධිපතිවරයාගේ සාරාංශ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. EHA/A/MFA/01/FS/2019/01 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2020 ජූනි 17 දින

ලේකම්,
විදේශ සබඳතා අමාත්‍යාංශය

**විදේශ සබඳතා අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

විදේශ සබඳතා අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ සබඳතා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට විදේශ සබඳතා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹුකරන බව මා දරන්නාවූ මතයවේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත්

විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.6.3(ආ). | සමාලෝචිත වර්ෂයේදී දූත මණ්ඩල 03 ක අපහරණය කරන ලද පිරිවැය වටිනාකම රු.13,875,228 ක් වූ වාහන 03 ක විකුණුම් වටිනාකම රු.2,156,731 ක් අපහරණ අගය ලෙසත්, තවත් අපහරණය කරන ලද වාහන 02 ක පිරිවැය වටිනාකම රු.7,648,500ක් ඇතුළත් නොකර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ අපහරණ වටිනාකම දක්වා තිබුණි.. | අපහරණය කරන ලද වාහන 05 සඳහා රු. 19,366,997 ක් වූ වටිනාකම ද අපහරණ අගය ලෙස හඳුනා ගත යුතු වීම. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### 1.6.1.1 ආදායම් නොවන ලැබීම්

සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් වෙනත් ලැබීම් රු.2,731,432,749 ක් වුවද, ශේෂ පිරික්සුමේ වෙනත් ලැබීම් රු. 2,667,447,127 ක් වශයෙන් දක්වා තිබුණි. එසේ වුවද එම ශේෂයට භාණ්ඩාගාරය විසින් ඇතුලත් කරන ලද අවසන් ජර්නල් සටහන් රු. 20,217,163 ක ගැලපීම හා 35-18 අග්‍රිම ගිණුමට ජර්නල් සටහන් මඟින් කරන ලද රු. 43,730,296 ක ගැලපීම් කිරීමෙන් පසුවත්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් රු. 238,163 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

#### 1.6.2.1 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ මාසික ගිණුම් සාරාංශවලට අනුව මුදලින් තැන්පතු ලැබීම් හා තැන්පතු ගෙවීම් පිළිවෙලින් රු. 2,184,223,119 ක් හා රු 2,107,779,187.ක් වුවද, 2019 ,දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ලැබීම් හා ගෙවීම් ලෙස පිළිවෙලින් රු.2,332,843,654 ක් හා රු. 2,226,489,422 ක් ලෙස දක්වා තිබුණි.

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් විදේශ දූත මණ්ඩල සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්ව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද එසේ කටයුතු නොකිරීම හේතුවෙන් වැය විෂයන් 13 ක් සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 51ක සිට සියයට 100 ක් දක්වා පරාසයකින් මුලු වටිනාකම රු.441,019,627 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණි. එසේම ඇස්තමේන්තුගත මුදල් ප්‍රතිපාදනයන්ට අමතරව වැය විෂයයන් 06 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු. 344,510,000 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි.

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයයන් 30ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය වූ එකතුව රු. 7,716,246 ක ප්‍රතිපාදනය රු. 81,835,422 කින් ඉක්මවා රු. 89,551,688 ක බැරකම් වලට එළඹ තිබුණි.

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දුන මණ්ඩලවල නොපිය වූ අත්තිකාරකම් ශේෂය රු. 365,063,523 ක් වූ අතර, එම ශේෂය තුල වර්ෂ 02 ක සිට වර්ෂ 28 ක් දක්වා වූ කාල පරාසයක ශේෂය රු. 301,986,504 ක් බව නිරීක්ෂණය විය.

ආ) රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට මියගිය, වැඩ තහනම් වූ, සේවය අවසන් කල හා සේවය හැර ගිය නිලධාරින්ගේ හිඟහිටි ණය ශේෂවල එකතුව රු. 2,036,618 ක් වූ අතර ඉන් වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂවල එකතුව රු. 1,167,642 ක් බව නිරීක්ෂණය විය.

ඇ) සමාලෝචිත වර්ෂයේ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමේ සඳහන් වර්ෂ 05 කට වැඩි හඳුනා නොගත් ණය ශේෂ ලෙස දක්වා ඇති එකතුව රු. 1,515,668 ක ණය ශේෂයන් අදාල නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) මූල්‍ය ප්‍රකාශවල 2019 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් පිළිබඳ ප්‍රකාශය අනුව එක් එක් තැන්පතු ගිණුම් අංක යටතේ භාණ්ඩාගාර පොත් අනුව ශේෂයන් හා අමාත්‍යාංශ පොත් අනුව ශේෂයන් අතර රු. 4,521,095 ක වෙනසක් පැවතුණි.

ආ) මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා පිළියෙල කල මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයන් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පතු ගිණුම්වල වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු රු. 8,851,391 ක් හා දුන මණ්ඩලවල වර්ෂ 02 ක් ඉක්මවූ ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් රු.28,498,689 ක් විය.

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

2019 දෙසැම්බර් 31 දිනට මාස 06 ඉක්මවූ රු. 55,385 ක චෙක්පත් 06 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

w. g. m. menike

**ඩබ්ලිව්.ජී.එන්. මැණිකේ**

**නියෝජ්‍ය විගණකාධිපති**

**විගණකාධිපති වෙනුවට**

පිටපත : අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව